

# විනය මහානිස්සය

## නම් සමන්තපාසාදිකා

## සවිස්තර ව්‍යාඛ්‍යාව.

### ප්‍රථම - ද්විතීය භාගය

සිරිවිසුද්ධ අරියවංසපාල මහානිකායකාරකාචරිය

තුඩුවේවත්තේ සිරිපඤ්ඤාසීහ මහාස්ථවිරපාදයන්

වහන්සේ විසින් ලියනලද

# විනයමහානිසසය

නම්

## සමන්තපාසාදිකා සවිස්තර ව්‍යාඛ්‍යාව.

**ප්‍රථම භාගය.**

කොස්ගොඩ ගොඩපිටියේ සිරිනිවෙසාරම වාසී

**කොස්ගොඩ සිරිවිසුද්ධි ස්ථවිරයන්වහන්සේ**

විසින්

**ලේඛක දෝෂාපහරණයෙන් ප්‍රතිසංස්කෘතයි.**

---

**විද්‍යෝදය මහාවිද්‍යාලයාධීශ්වර පණ්ඩිතශිරෝමණී**

**කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන**

කොළඹ නවකෝරළේ ප්‍රධාන සඞ්ඝනායක

මාහිමියානන් වහන්සේ විසින්

**සමාදරයෙන් ප්‍රතිගෘහීතයි.**

---

**එවට් හැන්රි ද සොයිසා සහ හැන්රි පීටර් ද සිල්වා**

යන මහතුන් විසින්

**කොළඹ මහාබෝධි මුද්‍රණාලයෙහි**

මුද්‍රාපිතයි.

ශ්‍රී: බු:· 2476

ක්‍රි: ව: 1933.

# SAMANTAPĀSĀDIKĀ

WITH A PARAPHRASE IN SINHALESE

ENTITLED

# VINAYAMAHĀNISSAYA.

BY

The late Venerable

TUDUWEWATTE SIRI PAÑÑĀSEEHA
MAHA THERO,

VOLUME I.

REVISED AND COMPILED BY

KOSGODA SIRI VISUDDHI THERO
*of Siriniwesaramaya, Godapitiya, Kosgoda.*

HIGHLY COMMENDED AND ACCEPTED BY

VEN'BLE KAHAWE SIRI SUMANGALA
RATANASĀRA MAHĀ THERO,
*Pradhana Nayaka of Western Province,*
*Principal, Vidyodaya Oriental College,*
*Maligakanda, Colombo.*

PUBLISHED BY

Peter Henry de Zoysa

AND

Henry Peter de Silva.

Printed at the

MAHA-BODHI PRESS, MALIGAKANDA, COLOMBO

B. E. 2476.
C. E. 1933.



සිරිවිසුද්ධ අරියවංසපාල ගණාචරිය

සිරිරතනතිස්සාභිධාන

අමරපුර සිරිසද්ධම්මවංස මහානිකායේ අනුනායක

මාහිමියානන් වහන්සේ

# PREFACE.

This volume, which we have much pleasure in placing before the public, is the first part of the Sinhalese paraphrase to *Samantapāsādika Aṭṭhakathā* written by Buddhaghosha, the erudite Pāli Commentator, who lived in the 10th century of the Buddhist Era. This commentary (aṭṭhakathā) deals with the entire Vinayapitaka, composed of Pārājika Pāli, Pāchittiya Pāli, Chullawagga Pāli, Mahawagga Pāli and Pariwāra Pāli, and may, therefore, be justly called a compendium of that pitaka. As may be expected of a person of his scholastic attainments, Buddhaghosha has culled and co-ordinated into his book the best of the Kurundiya, the Paccha-riya, and the Mahāaṭṭhakathā, the only Sinhalese commentaries to the Vinaya Pitaka extant in his day. In this treatise, he has, *inter alia*, traced the history of the Sangha of the Mahāvihāra Paraṃparā from his time back to the Buddha period. The information on which he based this historical review was supplied by the Bhikkhus of the Mahā Vihāra.

The Sinhalese paraphrase embodied in this volume was written about three score years ago by *Tuduwewatte Siri Paññā-seeha Mahā Thero* of Madampe in Galle District, on the invitation of *Siri Ratana Tissa Thero* of Siri Niwesārāmaya at Godapitiya in Kosgoda. *Siri Paññaseeha Mahā Thero* was a pupil of *Lankāgoda Siri Dhīrānanda Mahā Nāyaka Thero*, one of the greatest Pāli Scholars of his time. This paraphrase, which is his masterpiece, bears favourable comparison with the best works of the Polonnaruwa and Dambadeniya periods, and he is also the author of the following works:—Nāmabhedappakāsiniya, Paranjasadīpaniya, Uttamārtha-Sangraha, Nirwānapurawarnanā, Sīla Sandīpaniya, Māra Yuddhaya, Sansārachakraya and Ratanasūtrakāvyaya.

Having realised the inestimable service which the publication of this book is bound to render to the Sangha in particular, and to students of Buddhism in general, we invited *Kosgoda Siri Visuddhi Thero*, pupil of *Siri Ratana Tissa Anunāyaka Thero* of the Amarapura Sect, to revise and compile this work, and our grateful thanks

are due to him, and also to Talalle Ihalawela Siri Dhirānanda Dhammarakkhita Nāyaka Thero and Kosgoda Siri Sumana Thero, who assisted him in this task. Kosgoda Siri Sumedha Bhikkhu and Kosgoda Dhammawansa Bhikkhu, who transcribed the paraphrase from the original ola manuscript deserve our thanks.

*Kahawe Siri Sumangala Ratanasāra Nāyaka Mahā Thero*, Principal of the Vidyodaya Oriental College, Colombo, who has been pleased to accept the dedication of this volume, has highly commended it as being specially suitable for students preparing for the examinations conducted by the Oriental Studies Committee.

We intend, as time permits, to place before the public the remaining parts of the commentary with the paraphrase which is now undergoing revision.

Our thanks are due to the Maha Bodhi Press for having, under much inconvenience, turned out this volume expeditiously and well.

All rights of publication of this work are reserved to Dégiri Peter Henry de Zoysa of "Devagiri," Kosgoda, and every copy of this book will bear his signature.

**P. H. de Zoysa.**
**H. P. de Silva.**

*"Devagiri"*
*Kosgoda, March 25, 1933.*

# සංඥාපනය.

අට්ඨකථාචාර්ය්‍ය **අනුබුද්ධ බුද්ධඝොෂ මහාස්ථවිරපාදයන් වහන්සේ** විසින් පර්‍ය්‍යාප්ති- ප්‍රතිපත්ති- ප්‍රතිවෙධ යන ත්‍රිවිධ ශාසනාන්තර්ගත විනය පිටකය සංවර්ණිතවූ "සමන්තපාසාදිකා" නම් විනයාට්ඨකථාතොමෝ සම්බුද්ධශාසනයාගේ චිරජීවනය අනවරතයෙන් සිද්ධ කරන්නීය.

"විනයො නාම බුද්ධසාසනස්ස ආයු, විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති" යනුහෙයින් විනය සම්බුද්ධශාසනයාගේ ආයුෂය බව ද විනය පැවතිකල්හි සම්බුද්ධශාසනය පවත්නා බව ද මෙයින් සුව්‍යක්තයි.

අනවරාග්‍ර සංසාරදුඃඛසාගරාවතරණයෙන් අසඞ්ඛතධාතු ප්‍රතිලාභයට අසහායොපායමාර්ගයවූ සුවිශුද්ධ විශුද්ධිමාර්ගෝපගත ශීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂාවගේ ආදිමවූ ශීලයතෙමේ විනයයෙන් පරිපොෂණය වන්නේය.

තදුක්ත ශීලපාරිශුද්ධියෙන් සමාධිභාවනාව ද සමාධිභාවනාවෙන් විදර්ශනාභාවනාව ද විදර්ශනාභාවනාවෙන් නිර්වාණධර්මය ද ප්‍රතිලබ්ධ වන්නේය

එසේහෙයින් මහාකාශ්‍යප මහාක්ෂීණාශ්‍රවප්‍රමුඛ පඤ්චශතික මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් ප්‍රථම මහා සඞ්ගීතියෙහිදී පඤ්ච ග්‍රන්ථයකින් සමුපෙත විනයපිටකයතෙම පළමුකොට සඞ්ගායනාකරණලද්දේය.

තදාකාරයෙන් සඞ්ගීතිත්‍රයාරූඪ සකලවිනයපිටකය සංවර්ණිත වූ "සමන්තපාසාදිකා" නම් විනයාට්ඨකථා තොමෝ විනය මහාර්ණවාවතරණය කරනුවනට මහාර්ඝ නෞකාවක් වන්නීය

**"විනයමහානිස්සය"**
**නම්**
**සමන්තපාසාදිකා සවිස්තර**
**ව්‍යාඛ්‍යාව.**

කොස්ගොඩ ගොඩපිටියේ සිරිනිවෙසාරාම විහාරාධිපතිව වැඩවිසූ **"සිරිවිසුද්ධ අරියවංසපාල" සිරිරතනතිස්ස** මහාස්ථවිරපාදයන් වහන්සේගේ ආරාධනය පිළිගත් "සිරිවිසුද්ධ අරියවංසපාල මහානිස්සය කාරකාචරිය" තුඩුවේවත්තේ **සිරිපඤ්ඤාසීහ මහාස්ථවිරපාදයන්** වහන්සේ විසින් "සමන්තපාසාදිකා" නම් විනය මහ අටුවාවට මෙම සවිස්තර ව්‍යාඛ්‍යාව ලියනලදී.

**ගොඩපිටියේ සිරිරතනතිස්ස** මහාස්ථවිරයන් වහන්සේ වනාහි **ලඞ්කාගොඩ සිරිධීරානන්ද මහානායක** මහාස්ථවිරපාදයන්වහන්සේට

සහායව "අමරපුර සිරිසද්ධම්මවංස මහානිකාය පරිපාලනයෙහි නිරතවූ උන්වහන්සේට ඉක්බිති එම නිකාය භාරෝද්වහනය කළ යතිශ්‍රේෂ්ඨයන් අතර අග්‍රේසරද වූහ.

සවියාරාධනයෙන් කරණලද මෙම ව්‍යාඛ්‍යානයෙන් ප්‍රමුදිත තත්මහාස්ථවිරාරාධිත මහාසඞ්ඝයා වහන්සේ විසින් ව්‍යාඛ්‍යා කර්තෘවූ මහාස්ථවිරයන්වහන්සේට "මහානිස්සය කාරකාචරිය" යන ගරු නාමය ප්‍රදානය කරණලදි.

**ව්‍යාඛ්‍යා කර්තෘ වූ**
**තුඩුවේවත්තේ සිරි පඤ්ඤාසීහ**
**මහා ස්ථවිරයන් වහන්සේ.**

මූන්වහන්සේ වනාහි දකුණු ලක්දිව මාදම්පාතම් නිගමායතන තුඩුවේවත්ත නම් ප්‍රදෙශය නිජ ජන්මභූමි කොට ඇත්තෝ පැවිදිව කොළඹ දෙමටගොඩ ජයශෙඛරාරාමාධිපතිව වැඩවිසූ "අමරපුර සිරිසද්ධම්මවංසික මහානිකායේ ආදිකර්තෘභූත සිරිසද්ධම්මවංසපාල **ලඞ්කාගොඩ සිරි ධීරානන්දාභිධාන මහානායක මහාස්ථවිරපාදයන්** වහන්සේගේ ශිෂ්‍යභාවොපගතව ධර්මවිනය සඞ්ඛ්‍යාත ප්‍රවචනයෙහි හා තර්ක ව්‍යාකරණ ඡන්දෙලඞ්කාරාදි නානා භාෂා ශාස්ත්‍රයන්හි කොවිදවූවෝ විශෙෂයෙන් විනයපරිඥානයෙහි අප්‍රතිහත බුද්ධිමත් කෙනෙක් ද වූහ.

දහනව වෙනි ශතවර්ෂයේ මැද භාගයෙහි පමණ ලඞ්කාශාසනාවභාෂණය කළ කවිකොෂරින් අතර අද්විතීය වූ වැජඹුණු මූන්වහන්සේ විසින්–

සමන්තපාසාදිකා විනය මහ අටුවාවේ සවිස්තර ව්‍යාඛ්‍යාව, නාමභෙදප්පකාසිනිය, පරඤ්ජසදීපනිය, උත්තමාර්ථසඞ්ග්‍රහව, නිර්වාණපුර වර්ණනාව, ශීලසන්දීපනිය, මාරයුද්ධය, සංසාරචක්‍රය, රතනසූත්‍රකාව්‍යය යන මේ ග්‍රන්ථයෝ නිපදවනලදහ.

මොවුනතුරෙන් සමන්තපාසාදිකා විනයමහඅටුවාවේ ව්‍යාඛ්‍යාව අතිවිශාලවූවකි. ටීකාගත විස්තරයන් නොපිරිහෙළා අර්ථය ඇතුළත් කිරිමෙන් හා යොග්‍යස්ථානයන්හි ටීකාපාඨ පද විග්‍රහ වියරණ විදි ආදී ශාස්ත්‍රීය ක්‍රම පෙන්විමෙන්ද කරණලද මේ අරුත්වියතන පොළොන්නරු දඹදෙණි කාලයන්හිවූ කෘතීන් අනුගමනය කරණලද්දක් සේ පෙණේ.

මේසා විශාල ග්‍රන්ථ රත්නයකගේ ප්‍රාදුර්භාවයෙන් සිදුවියහැකි ශාස්ත්‍රීක විපුල ප්‍රයොජනය දැනගත් සම්බුද්ධ ශාසනොදයකාමී **පීටර් හැන්රි ද සොයිසා** සහ **හැන්රි පීටර් ද සිල්වා** යන මැතිතුමන් දෙපලගේ ආරාධනය පිළිගත් අපවිසින් අසමදවායයි කොස්ගොඩ ගොඩපිටියේ සිරිනිවෙසාරාමාධිපති සිරිවිසුද්ධ අරියවංසපාල ගණාචරිය

**සිරිරතනතිස්සාභිධාන** අමරපුර සිරිසද්ධම්මවංසික මහානිකායේ අනුනායක මාහිමියානන් වහන්සේගෙන් ලබනලද අවසරය පරිදි, මෙය ලේඛකදෝෂාපහරණයෙන් ප්‍රතිසංස්කරණයෙහි ව්‍යාපෘතවීමු

මෙය වනාහි කොළඹ විද්‍යෝදය මහාවිද්‍යාලයාධීශ්වර විශ්වජන ශේඛරායමානවූ කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන කොළඹ නව කෝරළේ ප්‍රධාන සඞ්ඝනායක මාහිමියානන් වහන්සේ විසින් සමාදරයෙන් ප්‍රතිග්‍රාහිතය. එය අපගේ ව්‍යාපාර සාඵල්‍යයට අසහාය හෙතුවන බැව් සගෞරව භක්ති පුරඃසරව පවසම්හ,

මෙම ව්‍යාඛ්‍යාවෙහි පෝර්මි දශයකින් යුත් කලාපයක් ශික්ෂාලඞ්කාර පරිවෙණාධිපති **විනයාචාර්ය රාජගුරු ශ්‍රී සුදර්ශන** නායක මහා ස්ථවිරපාදයන් වහන්සේ විසින් සංශොධන කරණයෙන් ප්‍රාක්ප්‍රකටී කෘතය.

පූජ්‍යෝත්තම ලඞ්කාගොඩ සිරි ධීරානන්දාභිධාන මහානායක මහාස්ථවිර පාදයන් වහන්සේගේ අනුශිෂ්‍යවූ කොළඹ දෙමටගොඩ ජයශේඛරාරාමාධිපති **කලල්ලේ ඉහලවෙල සිරිධීරානන්ද ධම්මරක්ඛිතා**භිධාන අමරපුර සිරිසද්ධම්මවංස මහානිකායේ කොළඹපලාතේ ප්‍රධාන සඞ්ඝ නායක මහාස්ථවිරයන් වහන්සේගෙන් මෙහි ඇතැම් කරුණු විනිශ්චය කරගැනීම පිළිබඳ බොහෝසෙයින් ආධාර ලැබුණුබැව් බුහුමන්පෙරටුව සිහිපත් කරවමු

මෙහි (ප්‍රෲෆ්) බැලීමෙහිදී අසමදෘචාර්ය නායක මාහිමිතුමන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූ **කොස්ගොඩ සිරිසුමන** ස්ථවිරපාදයන්වහන්සේ විසින් අපට සහායව බොහෝසේ ආධාර කරණලද බැව්ද, ගල්මංගොඩ ශ්‍රී සුදර්ශනාරාමාධිපති **ගල්මංගොඩ විමලසිරිතිස්ස** ස්ථවිරපාදයන් වහන්සේ වෙතින් ලැබුණු පුස්කොල පොත අපේ මේ ශාසනික කෘතියට ආධාරවූ බැව්ද කෘතඥතා පූර්වකව පවසමු.

ආධුනිකානුග්‍රහය සඳහා මේවරට බාහිරනිදානය අවසනට මුද්‍රණය කරවනලද නමුත් අවශේෂ කොටස් ද ක්‍රමයෙන් මුද්‍රණය කරවීමට කටයුතු පිළියෙල කරතිබෙන බැව්ද මෙහි සඳහන් කරමු.

හැටවසකට පමණ ඔබදී කරණලද මේ ව්‍යාඛ්‍යාවෙහි ලිපිදෙෂ ඉතාබොහෝවූහ. එය යථාශක්තීන් නිරාකරණය කොට ස්වල්පකාලයක් තුළදී ආධුනිකයන් අතට පමුණුවන්ට වීම අපට මහත් සතුටකි.

මෙහි අරුත් කියනලද්දේ පැරණි ක්‍රමයට අනුවය. පෙළ වචන කිහිපයක් එකවරට යොදා අරුත් කියනලද තැන්ද, සංස්කෘත වචන හා සිංහල වචන එකට මුසුකොට අරුත් දෙනලද තැන්ද- පටිපුච්ඡි- ආග- යනාදි පදයනට පුළුවුත්හ- කීහ- යනාදීන් පවසනලද තැන්ද බොහෝසේ දක්නාලැබෙති. එබඳු තැන් වත්මන් වහරට අනුරූසේ යොදන්නට අදහස් නොකොළෙමු.

මෙහි මැදභාගයෙහි පමණ– 1– 2– 3 යනාදීන් අඞ්කපරිපාටිය ප්‍රමාදයකින් වැටිතිබෙන හෙයින් ඒව නිසි අඞ්ක පරිශීලනය කරන්නන් විසින් යොදාගත යුතුය.

ශුද්ධිපත්‍රයක් සහ විස්තර පටුනක් පොත අවසානයෙහි යොදනවා ඇත. මෙය නැවත මුද්‍රණය කරවීමේ සම්පූර්ණ බලය **දේගිරි පීටර් හැන්රි ද සොයිසා** මහතාට මෙයින් පවරණලදි. මෙය ඉතා ටික කාලයක් තුළදී සකස්කරණ ලද්දකි. මෙහි අපගේ සහ වර්ණයොජකාදීන්ගේද ප්‍රමාදභ්‍රමාදියෙන් ජනිත යම් යම් දෙස් විද්‍යමාන වෙත්නම් එය අප වෙත දන්වා එවීමෙන් අප කෙරෙහි අනුකම්පා පරවශ වෙත්වා.

තවද මේ පොත ප්‍රයත්නාදර ඉතා ස්වල්ප කාලයකින් අතිසුන්දරව මුද්‍රණය කරදීම ගැන අපේ අවඞ්ක සතුතිය මහාබෝධි මුද්‍රණාලයේ මහතුන් වෙත නොමසුරුව පිරිනමම්හ.

**කොස්ගොඩ සිරිවිසුද්ධි ස්ථවිර.**
**K. Siri Visuddhi.**

**ශ්‍රී: බු: වර්ෂ 2475 ගෙවී මතු හවුරුදු**
**මීනරවි 12 භාග ශනි දින**
**කොස්ගොඩ ගොඩපිටියේ**
**සිරිනිවෙසාරාමයේදීය.**

# ශාසනාලයෙන් නිවේදනය කිරීමයි.

**විනය මහානිස්සය** නම්වූ සමන්තපාසාදිකා සවිස්තර ව්‍යාඛ්‍යාව දැනට අවුරුදු හැටකට පමණ පෙර ලක්දිව වැඩසිටි සිරිවිසුද්ධ අරියවංසපාල මහානිස්සයකාරකාචරිය **තුඩුවේවත්තේ සිරි පඤ්ඤාසීහ** මහාස්ථවිරපාදයන් වහන්සේ විසින් ලියනලද්දක් බව අසා දනිමු. එය සඟවා නොතබා විනයධර්මාභිලාෂීන් අතට දෙනු කැමැත්තෙන් මුද්‍රණය කරවනලද මේ කාණ්ඩයෙන් කොපි කිපයක් මමද බලා සතුටුවීමි. ඒ මහාස්ථවිරයන් වහන්සේ පාලි ධර්ම විනයාදිය සම්බන්ධයෙන් හොඳ දැනීමක් ඇති කෙනෙකු බව ස්වකීය කෘතියෙන් දත හැකි වේ.

මේවනාහි සවිස්තර ව්‍යාඛ්‍යානයෙකි. බොහෝ තන්හි ඒ ඒ පදයන්ගේ නිරුක්ති ආදියද දැක්වීමෙන් මනාසේ විස්තර කොට ලියා තිබේ. මෙය සඟවා නොතබා පළකරවා ලීමෙන් පාලි විනයාභිලාෂීන්ට මහත් ප්‍රයෝජනයක් වේයයි සිතමි.

මීට,

K. Ratanasara.

**විද්‍යෝදය පරිවෙණාධිපති නායකස්ථවිර.**

2476/1933 මාර්තු මස 25 දින
විද්‍යෝදය පිරිවෙණේදීය.

# සූචිපත්‍රය

# CONTENTS


| විෂය | පෘෂ්ඨාඞ්කය |
|---|---|
| බාහිරනිදානය | 1—238 |
| කාතීනාම සඞ්ගීතය | 1— 2 |
| අර්ථකථාප්‍රාරම්භගාථාව්‍යාඛ්‍යා | 1— 4 |
| ප්‍රථම මහාසඞ්ගීතිය | 16— 75 |
| දඹදිව ආචාර්‍ය්‍යපරම්පරාව | 76—146 |
| ද්විතීය මහාසඞ්ගීතිය | 76— 92 |
| තෘතීය මහාසඞ්ගීතිය | 93—145 |
| ලක්දිව ආචාර්‍ය්‍යපරම්පරාව | 147—150 |
| ප්‍රත්‍යන්තදේශයන්හි ශාසන ප්‍රතිෂ්ඨාපනය | 150—169 |
| මහෙන්ද්‍රස්ථවිරාගමනය | 170—186 |
| ලඞ්කා ශාසන ප්‍රතිෂ්ඨාපනය | 171—238 |
| මහාවිහාර ප්‍රතිග්‍රහණය | 188—194 |
| ධාතු ආගමනය | 196—204 |
| මහාබෝධි ආගමනය | 206—224 |
| මහාබෝධි ප්‍රතිෂ්ඨාපනය | 226—228 |

විනය මහානිස්සය නම්

ව්‍යාඛ්‍යා සහිත

# සමන්තපාසාදිකා විනය මහ අටුවාව.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං
කාලං කරොන්තො අතිදුක්කරානි,
ඛෙදං ගතො ලොකහිතාය නාථො
නමො මහාකාරුණිකස්ස තස්ස.

---

ඛන්ධනාම සඤ්ඤීතය.

ස මො ස මො යො ප ර මං සි වං සි වං
ග තො ග තො අ න් ර තො භ වං භ වං,
න යා න යෙ ස ත්ත ජ නං ම තං ම තං
න මෙ න මෙ සු ත්ත ම ම දු වං ද වං.

සු ස ණ්ඨි තා ය මග් ග තා භ වා භ වං
සු දෙ සි තං යං ජි න පො මි තං මි තං,
සු සා ධු කං ස ත්ත ම ල ප්ප භං ප භං
සු සං න මෙ ධ ම්ම ම නු ත්ත රං ත රං.

දු රා ස දං වා ස න වා සි තං සි තං
නි රා ක තං ස බ්බ හි මා ස වං ස වං,
ජි නො ර සං යං ගු ණ පී ව රං ව රං
න මෙ ග ණං තඤ්ච ග ණ ග්ග තං ග තං.

ගුණාතිසයයොගම්හි කතෙන රතනත්තයෙ,
හතන්තරායො හුත්වාන පණාමෙනප්පමාණියෙ.

සද්ධම්මවංසපාලාදි ධම්මක්ඛන්ධාභිධානිනො,
ගණිස්සරස්ස ථෙරස්ස සත්ථෙසු පාරදස්සිනො.

යො සිස්සො ඤාණාලඞ්කාරසිරිසුමන පදෙහි ච,
උපසොභිතනාමොසි ගණිදෙව පෙටකී යසො.

2 **අසම්බුධං බුධ නිසෙවිතං යං**
**භවාභවං ගච්ඡති ජීවලොකො,**
**නමො අවිජ්ජාදිකිලෙසජාල-**
**විධංසිනො ධම්මවරස්ස තස්ස.**

---

තස්ස'න්තෙවාසියො යො හි සීලාචාරගුණාකරො,
**සලඬකාගොඩ ථෙරොති** අවිසෙසෙන පාකටො.

**සධම්මවංසපාලො'ති** මජ්ඣෙ ආදෙ **සිරී**'ති ච,
**ධීරානන්දො**'ති අන්තෙහි තීහි සඞ්ඛතසව්හයො.

සඋත්තරෙ විනයවිනිච්ඡයෙ යථා
අත්ථප්පකාසි සකාසිහළාය,
සදෙසදෙසන්තරවිස්සුතං යථා
වන්දං දයාකඤ්ඤණසිලොකබන්ධං.

තමුත්තමං විවරණකාරකං අහං
නිස්සාය වුඩ්ඪිං ජිනසාසනෙ ගතො,
විහාය ආදෙ රචිතං පන'ඤ්ඤද
ගරූන පාදෙ සිරසා නමාමි.

සබ්බථා සබ්බසත්ථෙසු ථෙරෙන පාරදස්සිනා,
බුද්ධිනා බුද්ධඝොසෙන බුද්ධෙනී'ව මහිතලෙ.

අනප්පු'පරමෙ රම්මෙ විනයෙ විවිධෙ නයෙ,
පිටකෙ පටුභාවාය විනයට්ඨකථා කතා.

**සිරිරතන තිස්ස ථෙර** වරෙන පරමෙසිනා,
සරං අජ්ඣෙසිතො තත්ථ සාරං සාරගවෙසකො.

තොම්බු අඩකතියාදීසු සාලාති දීප විස්සුතා,
සාලෙය්‍යකාදි සුත්තෙසු සාලාති ච නිදස්සිතා.

හණ්ඩසාලාදිසාලාහි සාලරුක්ඛෙහි'ලඞ්කතා,
ගාමා ලඞ්කමනුප්පත්ත බ්‍රාහ්මණ්‍යජෙ කුලෙ.

ගාමෙ මහාධම්මපාල සාලාගාමිකසව්හයෙ;
ජාතො සුලද්ධනාමො යො **පඤ්ඤාසීහොති** සො අහං.

සාසනෙ පරම'ස්සාසං එසකානං මහෙසිනො
භික්ඛූනං මන්දබුද්ධීනං හිතත්ථාය හිතත්ථිනං.

ලීනත්ථෙසු ච සාරත්ථං ගහෙත්වාන අභාපයං,
රචයිස්සාමි තං සාධු සීහළානං නිරුත්තියා'ති.

3 ගුණෙහි යො සීලසමාධිපඤ්ඤා-
විමුත්තිඤාණප්පභුතීහි යුත්තො,
ඛෙත්තං ජනානං කුසලත්ථිකානං
තමරියසඞ්ඝං සිරසා නමාමි.

---

විනයසංවර්ණනාරම්භයෙහි රත්නත්‍රයට නමස්කාර කරණු කැමති ආචාර්‍ය්‍යවරතෙමේ භාග්‍යවත්හුගේ විශිෂ්ටගුණයොගසන්දර්ශනය පිණිස “**යො කප්පකොටීහිපි**”යි ආදි කීයේ

විශිෂ්ටගුණයොගයෙන් වනාහි වන්‍දනාර්හභාවය ද ප්‍රකාශකෙරේ, වන්‍දනාර්හයා කෙරෙහි කරණලද වන්‍දනාතොමෝ යථාභිප්‍රේතාර්ථය ද සිද්ධකරන්නීය.

සංවර්ණනාරම්භයෙහි රත්නත්‍රයට ප්‍රණාමකරණය යථාප්‍රතිඥත සංවර්ණනාවගේ අනන්තරායයෙන් නිමවීම පිණිසයයි දතයුත්තේය. එසේමැයි:

“**තස්සානුභාවෙන හතන්තරායො**”යි කියනලදී. රත්නත්‍රයට ප්‍රණාමකරණයෙන් වනාහි රාගාදිදෝෂවිගමනය වන හෙයින් ප්‍රඥාදි ගුණ උපදින හෙයින්, ආයුආදිය වර්ධනය වන හෙයින් පුණ්‍යාතිශය භාවාදියෙන් ම යථාප්‍රතිඥත සංවර්ණනාවගේ නිමවීම අන්තරායක් නැති ව වේමැයි. එහි පළමුකොට භාග්‍යවත්හට නමස්කාර කරනු කැමති ආචාර්‍ය්‍යවර තෙමේ:– “**යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං**”–පෙ–

**නමො මහාකාරුණිකස්ස තස්ස** යි කීයේ. මේ විනයදේශනාවගේ වනාහි කරුණා ප්‍රධානගුණ සමුත්ථිත බැවින් කරුණාව ප්‍රධානවූම ථොමනය ආරම්භකරණලදී. යම් මේ ආරම්භානුරූපස්තුතියක් කරණලද්දී වීද ඒතොමෝ ආචාර්‍ය්‍යයන්ගේ ප්‍රකෘතියයි, මෙහි කරුණාග්‍රහණයෙන් ප්‍රමාණකොට ගතනොහැකි ප්‍රභාවවත් සියලු බුද්ධගුණයෝ නය හෙයින් ගන්නාලදහයි දතයුත්තාහ. කුමක්හෙයින්ද යත්? ශේෂ බුද්ධගුණය තන්මූලක බැවිනි.

අන්තරාය විඝාතත්ථං මඞ්ගලාදීන මත්ථය,
තෙසං ගන්ථාන මාරම්භෙ පණාමාදීනි වුච්චරෙ”යිද.
සඤ්ඤා නිමිත්තං කත්තාච පරිමාණං පයොජනං,
සබ්බාගමස්ස පුබ්බෙව වත්තබ්බං වත්තුමිච්ඡතා”යිද.

මෙසේ ප්‍රවර්ති රත්නත්‍රය ප්‍රණාම, සංවර්ණනා ප්‍රකරණාභිධාන, අභිධෙය, කරණ ප්‍රකාර, නිමිත්ත, කර්තෘ, පරිමාණ, ප්‍රයොජනාදිය ද **යො කප්පකොටීහිපි** යනාදී මෙහි කීනයින් ප්‍රකාශිතයි.

එහි “රත්නත්‍රය” නම්:—

චිත්තීකතං මහග්ඝඤ්ච අතුලං දුල්ලභදස්සනං,
අනොමසත්ත පරිභොගං රතනං තෙන වුච්චති–යි.

4 ඉච්චෙව මච්චන්ත නමස්සනෙය්‍යං
නමස්සමානො රතනත්තයං යං,
පුඤ්ඤාභිසන්දං විපුලං අලත්ථං
තස්සානුභාවෙන හතන්තරායො.

---

තිදීශට සවභාවවූ

බුද්ධො සබ්බඤ්ඤුතඤ්ඤාණං ධම්මො ලොකුත්තරො නව,
සඞ්ඝො මග්ගඵලට්ඨො ච ඉච්චෙතං රතනත්තයං-යි

ප්‍රකාශිතප්‍රභෙදවූ **සර්‍වභවදුඃඛවිනිවාරණත්‍රිභුවනෛකප්‍රතිසරණ** වූ වස්තුත්‍රයයැ

එයට "ප්‍රණාමය" නම්: ප්‍රණාමක්‍රියානිෂ්පාදකචෙතනාය. **අභිධාන** නම්:- ප්‍රාරබ්ධසංවර්‍ණනායෙහි නම්. "**අභිධෙය**" නම් – සංවර්‍ණනාවගේ අර්ථයි. "**කරණ ප්‍රකාරය**" නම්:- ග්‍රන්ථකරණ ප්‍රභෙදයයි. "**නිමිත්ත**" නම්:- සංවර්‍ණනාව කිරීමට හේතුයි. "**කර්‍තෘ**" නම්:-සංවර්‍ණනාව කළ ආචාර්‍ය්‍යයෝයි "**පරිමාණ**" නම්:- ග්‍රන්ථ පරිච්ඡෙද ප්‍රමාණයයි.

"**ප්‍රයොජන**" නම්: ඒ සංවර්‍ණනායෙන් සාධ්‍යඵලයි. මෙහි අභිධාන කථනය වනාහි ව්‍යවහාර සැපය පිණිසය, අභිධෙයොද්භවසංවර්‍ණනායෙන් ප්‍රතිපාදනාභීයාගේ කථනය සංවර්‍ණනාවගේ ආරභිතව්‍ය ස්වභාව දර්‍ශනය පිණිසය, දන්නාලද අභිප්‍රෙතසාර්ථක සුකාරණාභිධෙය්‍ය ඇති සංවර්‍ණනාව සිහිකරන්නාවූ ජනයෝ ඇරඹියයුත්ත සිතත්යි. කරන ප්‍රකාර සන්දර්‍ශනය: ශ්‍රොතෘජනසමුත්සාහජනනය පිණිසය, අනාකුල අසංකීර්‍ණතාදි ප්‍රකාරයෙන් කරණලද සංවර්‍ණනාව ශ්‍රොතෘහු ශ්‍රවණොත්සාහ කෙරෙත්යි. නිමිත්ත කථනය: සිහිකරන්නාවූ ජනයන්ට සංවර්‍ණනායෙහි ගෞරව උපදනා පිණිසය, ප්‍රශස්තකාරණොත්පන්නමවූ සංවර්‍ණනායෙහි වනාහි ගෞරව දනවත්යි. කර්‍තෘකථනය: පුද්ගල ගරුකයාහට සංවර්‍ණනායෙහි ගෞරවය පුද්ගලවාරයෙන් නමුදු උපදවනා පිණිසය, ප්‍රමාණකථනය: අධ්‍යයනාදියෙහි යෙදුනවුන්ට ප්‍රීතිඋපදනා පිණිසය, සංවර්‍ණනා ශ්‍රවණයෙන් වනාහි ඔහු පහටුව කෙපමණද මේ ස්වල්පයයි නොබෝකලකින්ම නිමවන්නෙමුයයි අධ්‍යයනාදියෙහි යෙදී පවතිත්යි. ප්‍රයොජන කථනය: සංවර්‍ණනාධ්‍යයනයෙහි ශ්‍රොතෘජනයාගේ නියුක්තව පිණිසයයි දන්නේ.

මෙහි "**ප්‍රණාමය යොහපපතොම් භිපි** යනාදී ගාථාත්‍රයෙන් ප්‍රකාශිතය, "**අභිධානය: සංවණ්ණනං** යන්නෙන් හා මත්තෙහි **සමන්තපාසාදිකා නාම විනයසංවණ්ණනා** යන්නෙන් ප්‍රකාශිතය, "**අභිධෙය: සංවණ්ණනං** යන්නෙන් හා අර්ථ ප්‍රකාශකරණයෙන් ප්‍රකාශිතය, "**කරණප්‍රකාරය: සංවණ්ණනං තඤ්ච සමාරභන්තො තස්සා මහා අට්ඨකථං සරීරං** යනාදියෙන් ප්‍රකාශිතය, **බාහිරනිමිත්තය**

6 යස්මිං ඨිතෙ සාසන මට්ඨිතස්ස
පතිට්ඨිතං හොති සුසණ්ඨිතස්ස.
තං වණ්ණයිස්සං විනයං අමිස්සං
නිස්සාය පුබ්බාචරියානුභාවං

---

**අජ්ඣෙසනං බුද්ධසිරිව්හයස්ස ථෙරස්ස සම්මා සමනුස්සරන්තො** යන්තෙන් හා ආචාර්‍ය්‍යපාද තෙමේ තමන් විසින්ම අවශානයෙහි රචනා කරණලද:—

සුචිසීලසමාචාරං ථෙරං බුද්ධසිරිව්හයං,
යාමුද්දිසිත්වා ආරද්ධා ඉද්ධා විනයවණ්ණනා.

යන්තෙන් ප්‍රකාශිතය, **අබ්භන්තර නිමිත්තය** වනාහි: භික්ෂු භික්ෂුණී විෂයකොට ඇති කාරුණ්‍යය, ඔතොමෝ ආචාර්‍ය්‍යයන්ගේ සංවණ්ණනාරම්භයෙන් ම දන්නාලබා, **කත්තා: සංවණ්ණයිස්සං** යන්තෙන් හා අවශානයෙහි **විපුලවිසුද්ධබුද්ධිනා බුද්ධඝොසොති ගරූහි ගහිත නාමධෙය්‍යෙන ථෙරෙන කතා අයං සමන්තපාසාදිකා නාම විනය සංවණ්ණනා** යන්තෙන් ප්‍රකාශිතය, **පරිමාණය: විත්ථාරමග්ගඤ්ච සමාසයිත්වා** යන්තෙන් හා අවශානයෙහි **සමධික සත්තවීසති සහස්ස මත්තෙන තස්ස ගන්ථෙන යමත්තා සමන්තපාසාදිකා නාම** යන්තෙන් ප්‍රකාශිතය, ප්‍රයොජනය:

සංවණ්ණනා සීහළදීපකෙන
වාක්‍යෙන එසා පන සංඛටත්තා,
නකිඤ්චි අත්ථං අභිසම්භුණාති
දීපන්තරෙ භික්ඛුජනස්ස යස්මා;
තස්මා ඉමං පාළිනයානුරූපං
සංවණ්ණනං දානි **සමාරභිස්සං.**

යන්තෙන් ප්‍රකාශිතයි

1. **සො කප්ප කොටීහිපි** යනාදි, ප්‍රථමගාථායෙහි "**සො නාථො කප්ප කොටිහිපි අප්පමෙය්‍යං කාලං අතිදුක්කරානි කරොන්තො ලොකහිතාය ඛෙදං ගතො මහාකාරුණිකස්ස තස්ස නමො**"යි සම්බන්ධයි, **සො නාථො**, (විනෙය ජනයන්ට හිතසැපය ප්‍රාර්ථනාකරණ යම් සජීඥයෙක් තෙමේ; ("නාථතීති=නාථො, නාථති විනෙය්‍යගතෙ කිලෙසෙ උපතාපෙති, නාථතිවා-යාචති වෙනෙය්‍යෙ අත්තනො හිත කරණෙ යාචෙත්වාපි නියොජෙතීති=නාථො" යි විග්‍රහයි) **කප්පකොටීහිපි අප්පමෙය්‍යං කාලං,** කප්කොල ගණන් වශයෙන්ද (මෙපමණ කල්පකොටීහු යයි) ප්‍රමාණ කරන්ට නොහැකිකාලය මුළුල්ලෙහි; (මෙහි අපි ශබ්දයෙන් වර්ගණනින් කියනු කිම යයි දැක්වූයේය) **අති දුක්කරානි කරොන්තො,** (ආදර සහිතව සතතයෙන් පඤ්චමහා පරිත්‍යාගාදි) අතිදුෂ්කරයන් කරන්නේ; **ලොකහිතාය,** (අනවරාග්‍ර **සංසාර චා:තනදුඃඛයෙන් නිතර පෙළෙනලද සත්ත්වලොකයා ඒ දුකින්**

**6 කාමඤ්ච පුබ්බාචරියාසභෙහි**
**ඤාණම්බුනිද්ධොත මලාසයෙහි,**
**විසුද්ධ විජ්ජා පටිසම්භි දෙහි**
**සද්ධම්මසංවණ්ණනකොවිදෙහි**

---

මූද **නිර්වාණ** සුවයට භාග්‍ය කරන්නෙමියි මෙසේ) **සත්ත්වලොකයාහට** හිතකාරණය පිණිස; **ඛෙදං ගතො,** කායික ඛෙදයට එළඹියේද; (පරිශ්‍රමයට පැමිණියේද යන අර්ථයි.) **මහාකාරුණිකස්ස තස්ස,** (යමෙක් තෙමේ මහාකාරුණාවෙන් කම්පාවනලද හෘදය ඇති බැවින් ලොවට හිත පිණිස ඉතා දුෂ්කරක්‍රියායෙන් අනෙකප්‍රකාරවූ එබඳු දුක් අනුභව කොට ආයේද) මහත් කාරුණායෙහි නියුක්ත ඒ සර්වඥයාහට;

(කිරියති'ති කරුණා, දුක්ඛිතෙසු ව කිරියති පසාරියති'ති= කරුණා, කිණාති'ති වා=කරුණා, පරස්ස දුක්ඛෙ සති සාධූනං කම්පනං හදයඛෙදං කරොති'තිවා,=කරුණා, කම්ති සුඛං, තං රුන්ධතී'ති= කරුණා, කරුණාය නියුත්තො= කාරුණිකො; මහන්තො කාරුණිකො=මහාකාරුණිකො, තස්ස යී විග්‍රහයි.)

**නමො,** (ආත්මප්‍රසාදගෞරවාවහවූ උත්තමාඞ්ගය කරණකොට ගෙණ කටයුතු නමස්කාරය වේවා).

මෙසේ කරුණාමුඛය කරණකොට ගෙණ සැකෙවින් සියලු සර්වඥ ගුණයෙන් භාග්‍යවත්හට ස්තුති කොට දැන් ශ්‍රීසද්ධර්මයට ස්තුති කරණු පිණිස **අසම්බුද්ධං** යී ආදි කියේ.

මෙහි **"බුද්ධ නිසෙවිතං යං අසම්බුද්ධං ජීවලොකො භවා 'භවං ගච්ඡති අවිජ්ජාදිකිලෙසජාලවිද්ධංසිනො තස්ස ධම්මවරස්ස නමො"** යී සම්බන්ධයි.

2. බුද්ධනිසෙවිතං, (පාරමිතාගුණසුගන්ධයෙන් සුගන්ධග්‍රහණය කරවන ලද සර්වඥතාඥානය කරණකොට ගෙණ ප්‍රහාණකරණලද නසන ලද සවාසනාසකලක්ලෙශයන් ඇති මහාකරුණා සර්වඥතාඥානාදි අපරිමිත ගුණගණාධාර සන්තානයන් ඇති) බුදුරජහු විසින් ද ප්‍රත්‍යෙකබුද්ධ බුද්ධශ්‍රාවකයන් විසින්ද (ගොචරාසෙවන භාවනාසෙවනායෙන් සුදුසු පරිද්දෙන්) නිත්‍යසෙවනය කරණලද; (පරිභොගකරණ ලද්දවූය යන අර්ථයි.)

(එහි පර්‍ය්‍යාප්තිඵලනිර්වාණයෝ ගොචරාසෙවනවශයෙන් නිත්‍ය සෙවනය කරණලද්දාහුය. මාර්ගය වනාහි භාවනාසෙවනවශයෙන් ද ප්‍රත්‍යවෙක්ෂාඥානාදි වශයෙන්ද ගොචරාසෙවනවශයෙන් ද නිත්‍යසෙවනය කරණලද්දේ වේ.)

**7 සල්ලෙඛියෙ නො සුලභූපමෙහි**
**මහාවිහාරස්ස ධජූපමෙහි,**
**සංවණ්ණිතොයං විනයො නයෙහි**
**චිත්තෙහි සම්බුද්ධවරව්හයෙහි.**

---

යං, (සර්වඥප්‍රතිකාන්තවලොකොත්තර) යම් ශ්‍රීසද්ධර්මයෙක්; **අසම්බුද්ධං**, යථා ස්වභාවාවබොධය නොකිරීම හෙතු කොටගෙණ; ජීවලොකො සත්ත්වලොක තෙමේ; භවාභවං ගච්ඡති, (සුගතිදුර්ගති වශයෙන් ද හීනප්‍රණීතවශයෙන් ද) කුදුමහත් භවයෙන් භවයට යේද; අවිජ්ජාදිකිලෙසජාලවිද්ධංසිනො, අවිද්‍යාව ආදි කොට ඇති කෙලශජාලය විධ්වංසනයකරණ ශීලීවූ;

**'න වෙදෙති ධම්මානං යථාසභාවං නවිජානාතී'ති= අවිජ්ජා සා ආදි යෙසං තණ්හාදීනං තෙ යෙව කිලිස්සන්ති එතෙහි සත්තාති, කිලෙසා, තෙ යෙව ච සත්තානං විබාධනට්ඨෙන ජාලසදිසා'ති=ජාලං, තං විධංසෙති සබ්බසොව නාසෙති සීලෙනා'ති= අවිජ්ජාදිකිලෙසජාලවිධංසි තස්ස''** යි විග්‍රහයි.)

තස්ස ධම්මවරස්ස, (තමහට වැඩිතරම් එකකු නැති හෙයින් ප්‍රවරවූ) නිරුත්තර ඒ ධර්මයට;

**(''යථානුසිට්ඨං පටිපජ්ජමානෙ චතූසු අපායෙසු සංසාරදුක්ඛෙ ච අපතමානෙ ධාරෙතී 'ති==ධම්මො සො එව අත්තනො උත්තරිතරාභාවෙන වරො පවරො අනුත්තරො'ති==ධම්මවරො තස්ස''යි; විග්‍රහයි.) නමො, (උත්කෘෂ්ටප්‍රකාර) නමස්කාරය (වේවා).**

මෙසේ සංක්ෂෙපයෙන්ම සර්වධර්මගුණයෙන් යුත් ධර්මයට ස්තුති කොට දැන් ආර්‍ය්‍යසඞ්ඝයාට ස්තුති කරණු පිණිස **''ගුණෙහි''** යි ආදි කීයේ.

මෙහි **''සීලසමාධිපඤ්ඤාවිමුත්තිඤාණප්පභුතිහි ගුණෙහි යො යුත්තො කුසලත්ථිකානං ජනානං ඛෙත්තං තං අරියසඞ්ඝං සිරසා නමාමි''** යි සම්බන්ධයි.

3\. සීල, චතුපාරිශුද්ධි) ශීලය; සමාධි, (ප්‍රථමධ්‍යානාදි) සමාධිය; පඤ්ඤා, (මාර්ග) ප්‍රඥාවය; විමුත්ති, (ඵල)විමුක්තිය; ඤාණප්පභුතිහි, (ප්‍රත්‍යවෙක්ෂා) ඥානය ආදිකොට ඇති; ගුණෙහි ගුණයෙන්; යො, යම් ආර්‍ය්‍යසමූහයෙක් තෙමේ; යුත්තො, යුක්තවූයේද;

මෙහි ආදිශබ්දපර්‍ය්‍යායවූ පභුතිශබ්දයෙන් ෂඩභිඥා සිවුපිළිසිඹියා ආදීහු සඞ්ග්‍රහ කරණලදහයි දතයුතු. කුශලාර්ථික ජනයන්ගේ පුණ්‍යවෘද්ධියට ක්ෂෙත්‍රයක් සමානබැවින් **''ඛෙත්තං ජනානං කුසලත්ථිකානං''** යි ආදි කීයේ.)

8 සංවණ්ණනා සීහළදීපකෙන
වාක්‍යෙන එසා පන සඞ්ඛතත්තා,
න කිඤ්චි අත්ථං අභිසම්භුණාති
දීපන්තරෙ භික්ඛුජනස්ස යස්මා.

---

කුසලත්ථිකානං ජනානං, කුශලාර්ථීක ජනයන්ට; ඛෙත්තං, ක්‍ෂෙත්‍රයක් වැනිවූ;

(“ඛිත්තං බීජං මහප්ඵලභාවකරණෙන තායතී’ති= ඛෙත්තං”යි විග්‍රහයි. හේ පුබ්බණ්ණාපරණ්ණවිරූහණ භූමියයි. ඒ සමාන බැවින් ආර්‍ය්‍යසඞ්ඝතෙමේත් ක්‍ෂෙත්‍රයයි කියනු ලැබේ. මෙයින් ආර්‍ය්‍යසඞ්ඝයාගේ නිරුත්තර පින්කෙත්බව දැක්වූයේයි.)

තං අරියසඞ්ඝං, ඒ ආර්‍ය්‍යසඞ්ඝයා; සිරසා නමාමි, උත්තමාඞ්ගය කරණකොට ගෙණ නමස්කාර කෙරෙමි හෙවත් හිස කරණකොට ගෙණ වඳිමි.

**අරිය සඞ්ඝං** යන මෙහි “**ආරකත්තා කිලෙසෙහි අනයෙන ඉරියනතො=අරියා.** යි නිරුක්තිනයින් සිද්ධයි. නොහොත් “**සදෙවකෙන ලොකෙන සරණන්ති අරණීයතො උපගන්තබ්බතො උපගතානඤ්ච තදත්ථසිද්ධිතො= අරියා** යිද “**අරියානං සඞ්ඝො සමූහොති= අරියසඞ්ඝො**” යිද නොහොත් “**අරියො ච සො යථා වුත්තනයෙන සඞ්ඝො ච දිට්ඨිසීලසාමඤ්ඤෙන සංහතභාවතො’ති= අරියසඞ්ඝො තං අරියසඞ්ඝං**” යි වනු.

භාග්‍යවත්හට මැනභාගයෙහි බුද්ධ ධර්‍ම යන මේ රත්නවයගේ, සමධිගමය සඞ්ඝරත්නයට අයිතියයි ආර්‍ය්‍යසඞ්ඝයාගේ බොහෝ උපකාර ඇතිබව දක්වන්ට මෙහිම “සිරසා නමාමි” යි කියනලදැයි දතයුතු.

මෙසේ ගාථාත්‍රය කරණකොට ගෙණ සැකෙවින් සියලු ගුණය ප්‍රකාශකරණමුඛයෙන් රත්නත්‍රයට ප්‍රණාමනය කොට දැන් එයට යටත් ආකාරය යථාභිප්‍රෙත ප්‍රයොජනයන් පිරිනමන්නේ “**ඉච්චෙවම මච්චන්ත**” යනාදිය කී.

4. ඉච්චෙවං, මේ යථොක්තනයින්; අච්චන්ත, ඒකාන්තයෙන්; නමස්සනෙය්‍යං, නමස්කාරකටයුතුවූ; රතනත්තයං, (බුද්ධාදී රත්නත්‍රයට; නමස්සමානො, (කායවාඞ්මනස් යන මෙයින්) වඳින්නාවූ මම; විපුලං, මහත්වූ; යං පුඤ්ඤාභිසන්දං, යම් පුණ්‍යරාශියක්; අලත්ථං, ලද්දෙම්ද? තස්සානුභාවෙන, (යථොක්ත) ඒ පුණ්‍යරාශියගේ බලය කරණකොට ගෙණ; හතන්තරායො, (ප්‍රණාමප්‍රයොජනයෙහි උක්තවිධිය කරණකොටගෙණ) නසනලද දෘෂ්ටධාර්මිකාදි උපද්‍රව ඇති යෙමි.

(“**තං තං සම්පත්තිං විබන්ධනවසෙන සත්තසන්තානස්ස අන්තරෙ වෙමජ්ඣෙ එති ආගච්ඡතී’ති= අන්තරායො, දිට්ඨධම්මිකාදි අනත්ථො. පණාමපයොජනෙ වුත්තවිධිනා හතො විද්ධස්තො අන්තරායො උපද්දවො අස්සාති=හතන්තරායො**”යි විග්‍රහයි).

9 **තස්මා ඉමං පාළිනයානුරූපං**
**සංවණ්ණනං 'දානි සමාරභිස්සං**
**අජ්ඣෙසනං බුද්ධසිරිව්හයස්ස**
**ථෙරස්ස සම්මා සමනුස්සරන්තො**

---

මෙසේ රත්නත්‍රයට කරණලද පරමනිපච්චාකාරයෙහි ප්‍රයොජනය දක්වා දැන් යම් විනයපිටකයක් ප්‍රතිබද්ධ අර්ථවර්ණනාව කටැටි වීද ඒතාක් භාග්‍යවත්හුගේ ශාසනය මූලප්‍රතිෂ්ඨාභාවය දක්වා එයටද ප්‍රශංසා කරන්නේ "**යස්මිං ඨිතෙ**" යි ආදි කියේ.

*5.* අටඨිතස්ස, (කාමසුඛල්ලිකානුයොගඅත්තකිලමථානුයොගසඞ්ඛ්‍යාතඋභයාන්තයෙහි) නොසිටියාවූ; සුසණ්ඨිතස්ස, (අන්තද්වයවිරහිත මධ්‍යම ප්‍රතිපදාවෙහි) මනාකොට පිහිටි භාග්‍යවත්හුගේ; සාසනං, (අධිසීල අධිචිත්ත අධිප්‍රඥාසඞ්ඛ්‍යාත ශික්ෂාත්‍රය සඞ්ගෘහිත) ශාසනය; යස්මිං, යම් විනයපිටකයක්; ඨිතෙ, (පෙළවිසින් ද අරුත්විසින් ද අනූනව ලජ්ජිපුද්ගලයන් කෙරෙහි පවත්නා අර්ථයෙන්) සිටිකල්හි; පතිට්ඨිතං හොති, (එම ලජ්ජිපුද්ගලයන් කෙරෙහි පවත්නා අර්ථයෙන්) පිහිටියේ වේද, තං විනයං, ඒ විනය; අමිස්සං, (නිකායාන්තරලබ්ධියෙන්) අසම්මිශ්‍ර කොට; නිස්සාය පුබ්බාචරියානුභාවං, පූර්වාචාර්යවරයන් විසින් මනාකොට වර්ණනා කරණලද අර්ථකථාව නිසා (තමාගේ බලයෙන් නොවේය යන අභිප්‍රායයි) වණ්ණයිස්සං, වර්ණනා කරන්නෙමි.

පුරාණ අර්ථකථාවන් විද්‍යමානකල්හි නැවත විනයසංවර්ණනායෙහි කවර ප්‍රයොජනයෙක්දැයි යමෙක් තෙමේ විචාරා නම් ඔහට පුරාණාර්ථ කථායෙහි අනූනභාවය ද තමාගේ සංවර්ණනායෙහි ප්‍රයොජනය ද දක්වන්නේ "**කාමඤ්ච**" යනාදිය කී.

6–7. පුබ්බාචරියාසභෙහි, (කම්පා කොට ගත නොහැකි අර්ථයෙන් ද) උතුම් අර්ථයෙන් ද ආසභය යන නම්ලද (මහාකාශ්‍යප ස්ථවිරාදි) පූර්වාචාර්යයන් විසින්; කාමඤ්ච, එකාන්තයෙන්; අයං විනයො මේ විනයතෙම; සම්බුද්ධවරන්වයෙහි විනෙතබ්බ නයෙහි, භාග්‍යවත්හුගේ අභිප්‍රායානුගත විසිතුරු නයින්; සංවණ්ණිතො, යහපත්ව (අනූන කොට) වර්ණනා කරණලදී.

ඒ පූර්වාචාර්යවරයෝ කොබන්දෑ දැයි ඔවුන් දක්වන්ට "**ඤාණම්බු**" යනාදිය කී.

ඤාණම්බුනිද්ධොතමලාසවෙහි, අග්‍රමාර්ගඥාන සඞ්ඛ්‍යාත සලිලයෙන් ධෞතාලද්දාවූ (නිශ්ශෙෂවශයෙන්) ආයති අනුප්පත්ති ධර්මතාපාදන යෙන් ධෞතාලද්දාවූ විශොධනය කරණලද්දාවූ) (රාගාදිත්‍රිවිධ) මලය හා (කාමාශ්‍රවාදි) චතුරාශ්‍රවයන් ඇතියන් විසින්ය;

10 **සංවණ්ණනං තඤ්චසමාරභන්තො**
**තස්සා මහාඅට්ඨකථං සරීරං,**
**කත්වා මහාපච්චරියං තථෙව**
**කුරුන්දිනාමාදිසු විස්සුතාසු.**

---

"**අඞ්ගමඞ්ගඤාණසංඛාතෙන අම්බුනා සලිලෙන නිද්ධොතානි නිස්සසතො ආයතිං අනුප්පත්තිධම්මතාපාදනෙන ධොතානි වික්ඛාලිතානි විසොධිතානි රාගාදීනි තීනි මලානි කාමාසවාදයො චත්තාරො ආසවා යෙහි තෙ= ඤාණම්බුනිද්ධොතමලාසවා**" තෙහි යී වනු. ක්ෂීණාශ්‍රවභාවයෙහි ද මොහු ශුෂ්කවිදර්ශකයෝ නොවෙත්. යළි කෙබඳුවූද අනුභාවයෙන් යුක්තවූවෝ ද වෙත් යයි දක්වන්නේ "**විසුද්ධවිජ්ජා පටිසම්භිදෙහි**" යී කී.

විසුද්ධවිජ්ජාපටිසම්භිදෙහි, අත්‍යන්තපරිශුද්ධ ත්‍රිවිද්‍යාව හා සිව්පිළිසිඹියාව ද ඇතියන් විසින්ය;

("**විසුද්ධා අච්චන්තපරිසුද්ධා තිවිජ්ජා චතස්සො ච පටිසම්භිදා යෙසං තෙ= විසුද්ධවිජ්ජාපටිසම්භිදා- තෙහි.** යී විග්‍රහයි.)

මෙහි දිව්‍යචක්ෂුර්ඥානය පූර්වේනිවාසඥානය ආශ්‍රවක්ෂයකරඥානය යන මොහු ත්‍රිවිද්‍යාවෝය.

විපස්සනාඤාණමනොමයිද්ධි
ඉද්ධිප්පභෙදො පි ච දිබ්බසොතං,
පරස්ස චෙතොපරියායඤාණං
පුබ්බෙනිවාසානුගතඤ්ච ඤාණං;
දිබ්බඤ්ච චක්ඛාසවසඞ්ඛයො'ති
එතානි ඤාණානි ඉධ'ට්ඨවිජ්ජා- යී.

මෙසින් ප්‍රකාශිත අෂ්ටවිද්‍යාවය, අර්ථප්‍රතිසම්භිදා ධර්මප්‍රතිසම්භිදා නිරුක්තිප්‍රතිසම්භිදා ප්‍රතිභානප්‍රතිසම්භිදා යන මේ සිව්පිළිසිඹියාවෝය, එහි සංක්ෂෙපයෙන් හෙතුඵලයෙහි පැවති ඥානය අර්ථප්‍රතිසම්භිදාවය, හෙතුයෙහි පැවැති ඥානය ධර්මප්‍රතිසම්භිදාවය, හෙතු හෙතුඵලානුරූප ව්‍යවහාරයන්හි පැවැති ඥානය නිරුක්තිප්‍රතිසම්භිදාවය, මේ ඥානය මේ අර්ථද්‍යොතනය කෙරෙයි යන මේ ආකාරයෙන් යට කියනලද ත්‍රිවිධ ඥානයන්හි පැවැතිඥානය ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවයයි දතයුතු.

ප්‍රතිසම්භිදාප්‍රාප්තයන්ගෙන් තෝරා ගන්නාලද බැවින් සද්ධර්ම සංවර්ණනායෙහි ඔවුන්ගේ සමර්ථතාව දක්වන්නේ "**සද්ධම්මසංවණ්ණනකොවිදෙහි**" යී කී.

සද්ධම්ම සංවණ්ණනකොවිදෙහි, (පිටකත්‍රයසඞ්ඛ්‍යාත) සද්ධර්මසංවර්ණනායෙහි (සර්වප්‍රකාරයෙන්) අර්ථප්‍රකාශ කිරීමෙහි දක්ෂයන් විසින්ය; **සල්ලෙඛියෙ, ප්‍රමාණකරණලද පරිෂ්කාරවෘත්තියෙහි;**

11 විනිච්ඡයො අට්ඨකථාසු වුත්තො
යො යුත්තමත්ථං අපරිච්චජන්තො
තතොපි අන්තොගධථෙරවාදං
සංවණ්ණනං සම්ම සමාරභිස්සං.

12 තං මෙ නිසාමෙන්තු පසන්නචිත්තා
ථෙරා ච භික්ඛූ නවමජ්ඣිමා ච,
ධම්මප්පදීපස්ස තථාගතස්ස
සක්කච්ච ධම්මං පතිමානයන්තා.

---

'කිලෙසජාතං පරික්ඛාරබාහුල්ලං වා සල්ලිඛති තනුකං කරොති'ති= සල්ලෙඛො අපරිච්චජනාදිගුණසමූහො, සල්ලෙඛෙන නිබ්බත්තං= සල්ලෙඛියං තස්මිං සල්ලෙඛියෙ" යි විග්‍රහයි.

නොසුලභූපමෙහි, (සැහැල්ලු ප්‍රවෘත්තියෙන් අසවලුන් සමාන යයි) සුලභඋපමා නැතියන් විසින්ය; ("සල්ලෙඛපටිපත්තියා අසුකසදිසා'ති නත්ථි සුලභා උපමා එතෙසන්ති=නොසුලභූපමා තෙහි" යි විග්‍රහයි.

මහාවිහාරස්ස, මහාවිහාරයට; ධජූපමෙහි, (රථ ඇඳිනගැණිමට රථයෙහි බඳනාලද ධවජ මෙන් නොදන්නවුන්ට අසවල් අසවල් තෙරුන් විසින් වසනලද මහාවිහාරය නමැයි මෙසේ මහාවිහාරය ඇඳිනගැන්මට හෙතු බැවින්) මහාවිහාරයට ධවජවැනි උපමා ඇතියන් විසින්ය; සම්බුද්ධවරන්‍වයෙහි, සර්වඥශ්‍රෙෂ්ඨයා අනුගතවූ පූර්වාචාර්යවරයන් විසින්ය.

මෙසේ පුරාණාර්ථකථායෙහි අනුභාවය දක්වා දැන් තමන් වහන්සේගේ සංවර්ණනායෙහි ප්‍රයොජන විශෙෂය හා අබෙක්ෂකයාද දක්වනු පිණිස "සංවණ්ණනා" යී ආදි කියේ.

8. එසා සංවණ්ණනා, මේ සංවර්ණනාතොමෝ; සීහළදීපකෙන වාක්‍යෙන, හෙළදිව්වැසියන්ගේ භාෂාවෙන්; සංඛතත්තා පන, රචනා කරණලද බැවින් වනාහි; දීපන්තරෙ භික්ඛුජනස්ස, (සිංහලද්වීපයෙන්) අන්‍යද්වීපවාසී භික්ෂුසමූහයාගේ; කිඤ්චි අත්ථං, කිසිප්‍රයොජනයක්; යස්මා, යම් හෙයකින්; නාභිසම්භුනාති, සම්පාදනය නොකරුද;

9. තස්මා, එසේහෙයින්; ඉමං සංවණ්ණනං, මේ සංවර්ණනාව; පාළිනයානුරූපං, පාලික්‍රමයට අනුරූප කොට; (මගධ භාෂාවට පරිවර්තනය කොටයයි කියනලද්දේ වේ;) බුද්ධසිරිව්හයස්ස ථෙරස්ස, බුද්ධසිරි නම් තෙරහුගේ; අජ්ඣෙසනං, ආරාධනය; සම්මා සමනුස්සරන්තො, මනාකොට (ආදරයෙන්) අනුස්මරණය කොරෙමින්; හෘදයෙහි තබමින්ය යන අර්ථයි.) ඉදානි, දැන්; සමාරභිස්සං, මනාකොට ආරම්භ කරන්නෙමි.

13 බුද්ධෙන ධම්මො විනයො ච වුත්තො
යො තස්ස පුත්තෙහි තථෙව ඤාතො,
සො යෙහි තෙසං මතිමච්චජන්තා
යස්මා පුරෙ අට්ඨකථා අකංසු.

14 තස්මා හි යං අට්ඨකථාසු වුත්තං
තං වජ්ජයිත්වාන පමාද ලෙඛං,
සබ්බම්පි සික්ඛාසු සගාරවානං
යස්මා පමාණං ඉධ පණ්ඩිතානං.

---

දැන් තමන්වහන්සේගේ කරණප්‍රකාරය දක්වන්නේ "සංවණ්ණනං තඤ්ච" යි කියේ.

10–11. තඤ්ච සංවණ්ණනං, (දැන් කියනුලබන) මේද සංවණ්ණනාව; සමාරභන්තො, මනාකොට ආරම්භකරන්නාවූ මම; මහාඅට්ඨකථං, (සියලු අටුවාවන් අතුරෙන් මෙහි ගතයුතු හෙයින්) මහඅටුවාව; තස්සා, (දැන් කියනු ලබන) ඒ සංවණ්ණනාවගේ; සරීරං කත්වා, සිරුර කොට; මහා පච්චරියං, (පහුරෙහි ඉඳ කරණලද බැවින් එනම් ලද) මහා පච්චරියෙහිද; යො විනිච්ඡයො වුත්තො, යම් විනිශ්චයක් තෙමේ කියන ලද්දේ ද; තථෙව, එසේම; කුරුන්දිනාමාදිසු. විස්සුතාසු අට්ඨකථාසු, (වෙලුලි නම් විහාරයෙහිදී කරණලද බැවින්) කුරුන්දි නම්ලද අටුවාව ආදි (සැම තැන්හි) ප්‍රකට අටුවාවන්හි ද; යො විනිච්ඡයො වුත්තො, යම් විනිශ්චයක් කියන ලද්දේ ද; තතොපි, හෙදවිනිශ්චයෙන්; යුත්තමත්ථං අපරිච්චජන්තො, යුතුවූ අර්ථය නොහරිමින්; අන්තොගධ ථෙරවාදං, ස්ථවිරවාදයන් ද ඇතුළත් කොට; සංවණ්ණනං, සංවණ්ණනාව; සම්මා සමාරභිස්සං, මනාකොට ප්‍රාරම්භ කරන්නෙමි.

මෙසේ කරණප්‍රකාරය දක්වා දැන් ශ්‍රොතෘන් විසින් පිළිපැදිය යුතු විධිය දක්වන්නේ "තං මෙ" යනාදිය කී.

12. මෙ, මාගේ; තං, (දැන් ඒ කියනලද සංවණ්ණනාව; ධම්මප්පදීපස්ස තථාගතස්ස, ධර්ම නමැති ප්‍රදීපය ඇති (තථාගතත්වාදි ගුණයෙන් එනම් ලද) දසබලහුගේ; ධම්මං, ශාසනධර්මයට නොහොත් පාලිධර්මයට; සක්කච්චං, සකස්කොට; පටිමානයන්තා, පූජාකරණුවෝව; ථෙරා ච, (ස්ථිරශීලස්කන්ධාදියෙන් සමන්නාගත බැවින්) ථෙරවූද; නවා, (පැවිදිව නොබෝකල් ගිය බැවින්) නවකවූ ද; මජ්ඣිමා ච, (මධ්‍යයෙහි වූ බැවින්) මධ්‍යමවූද; භික්ඛූ, භික්ෂූනු; පසන්නචිත්තා, සථොකත නයින් ප්‍රයොජන සහිත බැවින් ද මතුයෙහි කියනලද විධියෙන් ප්‍රමාණ ඇති බැවින් ද අදහා ප්‍රීතිසෞමනස්‍යයෙන් යුත් සිත් ඇතියෝව ඊර්ෂ්‍යාවෙන් මඩනාලද සිත් නැතියෝව); නිසාමෙන්තු, ශ්‍රවණය කෙරෙත්වා.

15 තතො ච භාසන්තරමෙව හිත්වා
විත්ථාරමග්ගඤ්ච සමාසයිත්වා,
විනිච්ඡයං සබ්බමසෙසයිත්වා
තන්තික්කමං කිඤ්චි අවොක්කමිත්වා.

16 සුත්තන්තිකානං වචනානමත්ථං
සුත්තානුරූපං පරිදීපයන්ති,
යස්මා අයං හෙස්සති වණ්ණනාපි
සක්කච්ච තස්මා අනුසික්ඛිතබ්බා.

---

"ධම්මප්පදීපස්ස" යන මෙහි "**ධම්මොයෙව සත්තසන්තානෙසු මොහන්ධකාරවිධමනතො පදීපසදිසත්තා පදීපො අස්සාති ධම්මප්පදීපො-තස්ස ධම්මප්පදීපස්ස**," යි විග්‍රහයි.

දැන් තමන්වහන්සේගේ සංවර්ණනායෙහි ආගමනවිශුද්ධිය දක්වා ප්‍රමාණභාවය දක්වන්නේ 'බුද්ධෙන" යි ආදි කියේ.

13. බුද්ධෙන, (පරෝපදෙශ රහිතව ස්වයම්භූඥානයෙන් චතුස්සත්‍යාව බොධය කළ, භාග්‍යවත්හු විසින්; යො, යම්; ධම්මොච, සූත්‍රාභිධර්මයෙක්ද, විනයොච, සියලු විනයපිටකයෙක්ද; වුත්තො, (පාල්‍යර්ථයෙන්) වදාරණ ලද්දේද; (මෙපමණකින් සියලුම බුද්ධවචනය දක්වන ලද්දේ වේ.) සො, හේ; තස්ස, ඒ බුදුරජාණන් වහන්සේගේ; යෙහි පුත්තෙහි, (ධර්මසේනාපති ආදි) යම් පුත්‍රකෙනෙකුන් විසින්; තථෙව ඤාතො, (යම්සේ බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලද්දේද) එසේම (එකපදයකුදු එක අක්ෂරයකුදු නොනසා අභිප්‍රාය ද විකොපනය නොකොට) දන්නාලද්දේද; තෙසං, ඒ සර්වඥ පුත්‍රයන්ගේ; මතිමච්චජන්තා, අභිප්‍රාය නොහරිමින්; යස්මා, යම්හෙයකින්; පුරෙ, පූර්වයෙහි; අට්ඨකථා අකංසු, සිංහලාර්ථකථාචාර්‍ය්‍යයෝ මහාඅර්ථකථා මහාපච්චරි ආදී) අටුවා කළෝ ද.

14. තස්මාහි, ඒ (බුද්ධපුත්‍රයන්ගේ අභිප්‍රායවිකොපනය නොකොට පූර්වයෙහි අර්ථකථා යම් හෙයකින් කළෝද) එහෙයින්; ("හි" යනු හෙත්වර්ථයෙහි නිපාත මාත්‍රයෙක්ය) යං, යමක්; අට්ඨකථාසු වුත්තං, අර්ථකථාවන්හි කියන ලද්දේ ද; පමාදලෙඛං වජ්ජයිත්වාන, ප්‍රමාද ලියවිල්ල හැර; තං සබ්බම්පි, ඒ සියල්ල ද; (ප්‍රමාණවේ;)

(කවුරුන්ට ප්‍රමාණ වේ දැයි ඔවුන් දක්වන්ට "**සික්ඛාසු සගාරවානං ඉධපණ්ඩිතානං**" යි කී.

ඉධ, මේ ශාසනයෙහි; සික්ඛාසු සගාරවානං පණ්ඩිතානං, ශික්ෂාවන්හි ගෞරව සහිත පණ්ඩිතයන්ට; යස්මා, යම්හෙයකින්; පමාණං, ප්‍රමාණවේද;

ඉදින් අර්ථකථාවන්හි කියනලද සියල්ලම ප්‍රමාණ වේ නම් එසේ ඇත්කල්හි එහි ප්‍රමාදලියවිලිද ප්‍රමාණවන්නේය යන සැකය වළක්වන පිණිස "**වජ්ජයිත්වාන පමාදලෙඛං**" යි කී.

තත්‍ථ "තං වණ්ණයිස්සං විනයන්ති" වුත්තත්තා විනයො තාව වවත්‍ථපෙතබ්බො තෙනෙතං වුච්චති:- විනයො නාම ඉධ සකලං විනයපිටකං අධිප්පෙතං. සංවණ්ණනත්‍ථං පනස්ස අයං මාතිකා:-

**වුත්තං යෙන යදා යස්මා–ධාරිතං යෙන චාභතං,**
**යත්‍ථප්පතිට්ඨිතඤ්චෙත–මෙතං වත්වා විධිං තතො·**
**තෙනා'ති ආදිපාඨස්ස–අත්‍ථං නානප්පකාරතො,**
**දස්සයන්තො කරිස්සාමි–විනයස්සත්‍ථ වණ්ණනන්ති.**

---

මෙහි ප්‍රමාදලියවිල්ල නම් මෑතභාගයෙහි පුස්තකයන්හි නගන කාලයෙහි අපරාපයඩීව ලියන්නන් විසින් සිහිය නො එළවා අතික් තැනෙක්හි ලියයුත්ත අතික්තැනෙක්හි ලීම් ආදිවශයෙන් පැවැත්තේ ප්‍රමාද ලියවිල්ල නම, දූන් කියනුලබන්නාවූද සංවණ්ණනාතොමෝ හුදෙක් වචනමාත්‍රයකින්ම වෙන්වූ අර්‍ථ ඇතිහෙයින් වනාහි අර්‍ථකථාවම යයි දක්වන්ට "**තතො ච භාසන්තරමෙව**"යි ආදි කියේ.

15-16. තතොච, ඒ අර්‍ථකථායෙන්ද; භාසන්තරමෙව හිත්‍වා, සිංහලභාෂාව පමණක්ම හැර; විත්‍ථාරමග්ගඤ්ච සමාසයිත්‍වා, (පුරාණාර්‍ථ කථාවන්හි මතුයෙහි කියනලද්දද ගෙණවුත් ඒ ඒ තන්හි ප්‍රමාදවන ලද එබඳු) විස්තාරමාර්ගය සංක්ෂෙපකොට; විනිච්ඡයං සබ්බමසෙසයිත්‍වා, (අර්‍ථකථාවන්හි කියනලද ඒ ඒ) සියලුම විනිශ්චය ශෙෂ නොකොට; (ස්වල්පමාත්‍රයකුදු නොහැර යයි කියනලද්දේ වේ.) තන්තික්කමං කඤ්චි අවොක්කමිත්‍වා, කිසි පාළික්‍රමයක් නොයික්මවා; සුත්තන්තිකානං වචනානමත්‍ථං, "**වෙරඤ්ජකාණ්ඩාදීසු ආගතා ඣානකථාදි**" සූත්‍රවචනයන්ගේ යම් අර්‍ථයෙක් වේද ඒ අර්‍ථය; සුත්තානුරූපං, සූත්‍රයනට අනුරූප කොට; පරිදීපයන්ති, (සම්ප්‍රකාරයෙන්) දක්වන්නී; යස්මා, යම්හෙයකින්; අයං **සංවණ්ණනාපි**, මේ **සංවණ්ණනාතොමෝද**; හෙස්සති, (භාෂාන්තර පරිත්‍යාගාදිමාත්‍ර විශිෂ්ටතායෙන් අර්‍ථ හෙයින් භින්නනොව ප්‍රමාණ වන්නීද; තස්මා, එසේහෙයින්; සක්කච්චං, සකස් කොට; අනුසික්ඛිතබ්බාති, අනුව හික්මියයුත්තීයයි.

---

දූන් "සංවණ්ණයිස්සං විනයං"යි ප්‍රතිඥත බැවින් එපරිද්දෙන් විනයවණ්ණනාව කටැටිව සංවරවිනය ප්‍රහාණවිනයාදිවශයෙන් විනය බොහෝ බැවින් මෙහි **සංවණ්ණනා** කටයුතු භාවයෙන් පළමුකොට අභිප්‍රෙතවූ විනයව්‍යවස්ථා කටයුතුයයි දක්වනුයේ "**තත්‍ථ**" යනාදියකී. තත්‍ථ, (යථොක්ත) ඒ ගාථාවන්හි; "තං වණ්ණයිස්සං විනයන්ති" වුත්තත්තා, "**තං වණ්ණයිස්සං විනයං**" යී කියනලද බැවින්; තාව, පළමුකොට; විනයො, විනයතෙමේ; වවත්‍ථපෙතබ්බො, ව්‍යවස්ථා කටයුත්තේය හෙවත් නියම කටයුත්තේය

මෙහි "තාව" යන මෙයින් ප්‍රථමකොට විනයව්‍යවස්ථා කොට **පසුව ඒ විනයසංවණ්ණනාව කරන්නෙමි යී දක්වූයේය.)**

තත්‍ථ "වුත්තං යෙන යදා යස්මා" ති ඉදං තාව වචනං "තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරතී"ති එවමාදිවචනං සන්ධාය වුත්තං. ඉදංහි බුද්ධස්ස භගවතො අත්තපච්චක්ඛවචනං න හොති, තස්මා වත්තබ්බමෙතං. ඉදං වචනං කෙන වුත්තං? කදා වුත්ත ? කස්මා ච වුත්තන්ති? ආයස්මතා උපාලිත්ථෙරෙන වුත්තං තඤ්ච පන පඨමමහාසඞ්ගීතිකාලෙ, පඨමමහාසඞ්ගීති නාම චෙසා කිඤ්චාපි පඤ්චසතිකසඞ්ගීතික්ඛන්ධකෙ වුත්තා, නිදානකොසල්ලත්ථම්පන ධා'පි ඉමිනා නයෙන වෙදිතබ්බා.

---

තෙන, යම්හෙයකින් ව්‍යවස්ථා කටයුතුද ඒ හෙතුවෙන්; එතං, (විනයො නාම යනාදි) මේ (නියමවචනය) තෙම; වුච්චති, කියනු ලැබේ; විනයො නාම, විනය නම්; ඉධ, මෙහි; සකලං විනයපිටකං, සියලු විනයපිටකයතෙම; අධිප්පෙතං, අභිප්‍රාය කරණලදී; අස්ස, මේ විනය; සංවණ්ණනත්ථං පන, සංවණ්ණනා කරණුපිණිස වනාහි; අයං මාතිකා, මේ උදෙසීමයි.

(ඒ උද්දෙශය වනාහි නිර්දේශපදයන් උපදවනතන්හි සිටි බැවින් මාතෘව වැනිනුයි මාතෘකාවයයි කියනුලබායි.)

දැන් වර්ණනාකාතීව්‍ය අර්ථවත් මාතෘකාව තබා දක්වනුයේ "**වුත්තංයෙන**" යනාදිය කී.

යෙන, යම් පුද්ගලයකු විසින්; වුත්තං, ("**තෙන සමයෙන බුද්ධොභගවා වෙරඤ්ජායං විහරති**"යනාදි නිදානවචනයෙන් ප්‍රතිමණ්ඩිත වූ විනයපිටකය) කියනලද්දේද; යදා, යම් කාලයෙක්හි (කියන ලද්දේද;) යස්මා, යම් කරුණක් හෙතුකොටගෙණ (කියනලද්දේද;) ධාරිතං, (යමෙකු විසින්) ධරණලද්දේද; යෙන, යමෙකු විසින්; ආහතඤ්ච, ගෙණ එනලද්දේද; යත්ථ, යමෙකුන් කෙරෙහි; පතිට්ඨිතඤ්ච පිහිටනලද්දේද; එතං එතං විධිං වත්වා, මේ මේ විධිය කියා; තතො, ඉන්පසු; තෙනාති ආදිපාඨස්ස, තෙන යනාදි පාඨයාගේ; අත්ථං, අර්ථයතෙම; නානප්පකාරතො, නොයෙක් ප්‍රකාරයෙන්; දස්සයන්තො, දක්වනුයෙම්; විනයස්ස, විනය පිළිබඳ; අත්ථවණ්ණනං, අර්ථවර්ණනාව; කරිස්සාමි ඉති, කරන්නෙමි යි.

තත්ථ, ඒ මාතෘකාපදයන්හි; "**වුත්තං යෙන යදා යස්මා**"ති, "වුත්තං යෙන යදා යස්මා" යන; ඉදං වචනං, මේ වචනය; තාව, පළමුකොට; "**තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති**"ති "**තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති**" යන; එවමාදිවචනං සන්ධාය, මේ ආදි වචනය සඳහා; වුත්තං, කියනලදී; ඉදං, ("**තෙන සමයෙන බුද්ධො භගවා**," යනාදි) මේ වචනය; හි, යම් හෙයකින්; බුද්ධස්ස භගවතො, චතුස්සත්‍යඥත භාග්‍යවත්හුගේ; අත්තපච්චක්ඛවචනං න හොති, තමන්වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂකොට දෙසනලද වචනයක් නොවේද; තස්මා, එහෙයින්; වත්තබ්බං, කිය යුතුවූ; එතං ඉදං වචනං, ඒ මේ වචනයතෙම; කෙන, කවරෙකු විසින්; වුත්තං, කියනලද්දේද; කදා, කවර කලෙක්හි; වුත්තං, කියනලද්දේද; කස්මා ච, කුමක්හෙයින්; වුත්තනති, කියනලද්දේදැයි.

දැන් ප්‍රශ්නකාරණය කියා යථානුක්‍රමයෙන් යථොක්ත ප්‍රශ්න විසර්ජනය කරණුයේ "**ආයස්මතා**" යනාදිය කී.

## පඨම මහාසඞ්ගීති වණ්ණනා.

ධම්මචක්කප්පවත්තනඤ්හි ආදිං කත්වා යාව සුභද්දපරිබ්බාජකවිනයනා කතබුද්ධකිච්චෙ කුසිනාරායං උපවත්තනෙ මල්ලානං සාලවනෙ යමකසාලානමන්තරෙ විසාඛපුණ්ණමදිවසෙ පච්චූසසමයෙ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතෙ භගවති ලොකනාථෙ භගවතො පරිනිබ්බානෙ සන්නිපතිතානං සත්තන්නං භික්ඛුසතසහස්සානං සඞ්ඝ

---

ආයස්මතා, ආයුෂ්මත්වූ; උපාලිත්ථෙරෙන, උපාලිතෙරහු විසින්; වුත්තං, කියනලදී; තස්සා පන, හෙද වනාහි; පඨමමහාසඞ්ගීතිකාලෙ, ප්‍රථමමහාසඞ්ගීතිකාලයෙහිය; එසා ච පඨමමහාසඞ්ගීති නාම, මේද ප්‍රථමමහාසඞ්ගීතිතොමෝ නම්;

(මෙහි "ච" ශබ්දයතෙමේ මෙබඳු තන්හි කියයුත්තන් සම්පිණ්ඩනය කෙරේ. නොහොත් උපන්‍යාස අර්ථයයි දතයුතු.)

උපන්‍යසය නම්: වාක්‍යාරම්භයයි කියනු ලැබේ. මේ වනාහි ග්‍රන්ථකාරාදීන්ගේ ප්‍රකෘතියය, ඉදින් කිසිවක් කියා නැවත අනිකක් කියන්ට ඇරඹින්නන්ගේ "ච" ශබ්ද ප්‍රයොගය වේ.

**"විප්පකිණ්ණානං ධම්මවිනයානං සඞ්ගහෙත්වා ගායනං කථනං=සඞ්ගීති මහාවිසයත්තා පූජනීයත්තා ච මහතී සඞ්ගීතීති=මහාසඞ්ගීති, පඨමා මහාසඞ්ගීති= පඨමමහාසඞ්ගීති"**යි විග්‍රහයි.)

කිඤ්චාපි, කිසිසේත්; පඤ්චසතිකසඞ්ගීති, පඤ්චසතිකසඞ්ගීතිතොමෝ; ඛන්ධකෙ, ඛන්ධකයෙහි; වුත්තා, (මොනවට) කියනලද්ද; නිදානකොසල්ලත්ථං පන නිදානකෞශල්‍යය පිණිස වනාහි; ඉධාපි, මෙහිද; ඉමිනා නයෙන මේ නයින්; වෙදිතබ්බා, දතයුත්තී.

විනෙය ජනයන්ගේ මාර්ගඵලොත්පත්තියට හෙතුභූතම ක්‍රියා තොමෝ නිෂ්පර්‍යායයෙන් බුද්ධකෘත්‍යයයි "**ධම්මචක්කප්පවත්තනඤ්හි ආදිං කත්වා**"යි කී.

---

**පඨම මහාසඞ්ගීතිවණ්ණනා, ප්‍රථම මහාසඞ්ගීති වර්ණනාවයි.**

ධම්මචක්කප්පවත්තනං හි ආදිං කත්වා, ධර්මචක්‍රප්‍රවර්තනය ම ආදි කොට; යාව සුභද්දපරිබ්බාජකවිනයනා, සුභද්‍රපරිව්‍රාජකවිනයනය දක්වා; කතබුද්ධකිච්චෙ, නිමවනලද බුද්ධකෘත්‍ය ඇත්තාවූ; ලොකනාථෙ, ලොකනාථයකවූ; භගවති, භාග්‍යවත්හු; කුසිනාරායං, එනම් නුවර සමීපයෙහිවූ; මල්ලානං, මල්ලරජුන්ගේ; උපවත්තනෙ, උපවර්තන නම්වූ;(**"නගරං පවිසන්තා උය්‍යානතො උපවත්තන්ති ගච්ඡන්ති එතෙනා'ති=උපවත්තනං, තස්මිං"**යිවිග්‍රහයි )සාලවනෙ, සල්වෙනෙහි; යමකසාලානං අන්තරෙ, යමකසාලයන් අතුරෙහි; විසාඛපුණ්ණමදිවසෙ, වෛශාඛපෞර්ණමී දිනයෙහි; පච්චූසසමයෙ, ප්‍රාතඃ කාලයෙහි; අනුපාදිසෙසනිබ්බානධාතුයා, අනුපාදිශෙෂ නිර්වාණධාතුව කරණකොට ගෙණ; **"උපාදීයති කම්මකිලෙසෙහී'ති= උපාදි, තදෙව කම්මකිලෙසෙහි සහ අප්පහීනකාය සෙසො නත්ථි එත්ථ උපාදිසෙසා'ති=අනුපාදිසෙසා අනුපාදිසෙසා ච සා නිබ්බානධාතු චා'ති= අනුපාදිසෙසනිබ්බානධාතු, තාය"**යි විග්‍රහයි.

ථෙරො ආයස්මා මහාකස්සපො සත්තාහපරිනිබ්බුතෙ භගවති සුභද්දෙන බුඩ්ඪපබ්බජිතෙන "අලං ආවුසො මා සොචිත්ථ මා පරිදෙවිත්ථ සුමුත්තා මයං තෙන මහාසමණෙන උපද්දුතා ච හොම ඉදං වො කප්පති ඉදං වො න කප්පතී'ති ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාමා'' ති වුත්තවචනමනුස්සරන්තො. "ඨානං ඛො පනෙතං විජ්ජති යං පාපභික්ඛූ අතීතසත්ථුකං පාවචනන්ති මඤ්ඤමානා පක්ඛං ලභිත්වා න චිරස්සෙව සද්ධම්මං අන්තරධාපෙය්‍යුං, යාව ච ධම්මවිනයො තිට්ඨති තාව අනතීතසත්ථුකමෙව පාවචනං හොති, වුත්තං

---

පරිනිබ්බුතෙ, පිරිනිවිකල්හි; භගවතො, භාග්‍යවත්හුගේ; පරිනිබ්බාණෙ, පිරිනිවීම හෙතුකොට එතැන්හි; සන්නිපතිතානං, රැස්වූ; සත්තන්නං භික්ඛුසතසහස්සානං, සත්ලක්‍ෂයක් භික්‍ෂූන් අතුරෙන්; සඞ්ඝත්ථෙරෙ, සඞ්ඝස්ථවිරවූ;(**"සඞ්ඝස්ස ථෙරො ජෙට්ඨො=සඞ්ඝත්ථෙරො''**යි වනු. මෙහි සඞ්ඝශබ්දය තමා භික්ඛුසතසහස්සශබ්දාපෙක්‍ෂාවක් ඇති කල්හිද ගමකත්ව බැවින් ථෙරශබ්දය හා සමාසවේ, **"දෙවදත්තස්ස ගුරුකුලං''** යනු උදාහරණයි.) ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහාකාශ්‍යප තෙමේ; භගවති, භාග්‍යවත්හු; සත්තාහපරිනිබ්බුතෙ, සත්දවසක් ඉක්මගිය පරිනිර්වාණය ඇතිකල්හි; (භාග්‍යවත්හුගේ පරිනිර්වාණදිනය පටන් සත්දවසක් ඉක්මුනු කල්හියයි කියනලද්දේ වේ; **"සත්ත අහානි සමාහටානි=සත්තාහං, සත්තාහං පරිනිබ්බුතස්ස අස්සා'ති=සත්තාහපරිනිබ්බුතො, තස්මිං සත්තාහපරිනිබ්බුතෙ''** යි විග්‍රහයි.) සුභද්දෙන බුඩ්ඪපබ්බජිතෙන, සුභද්‍ර නම් වෘද්ධපැවිද්දහු විසින්; ආවුසො, ඇවැත්නි; අලං, කම්නැත්තේය; මා සොචිත්ථ, ශොකනොකරව්; මා පරිදෙවිත්ථ, විලාප නොකියව්; වො, තොපට; ඉදං කප්පති, මේ කැප වේ; වො, තොපට; ඉදං න කප්පතීති, මේ කැපනොවේයයි; උපද්දුතා ච හොම, උපද්‍රවලද්දුවෝද විමු; තෙන මහාසමණෙන, ඒ මහාශ්‍රමණයා කෙරෙන්; මයං, අපි; සුමුත්තා, මොනවට මිදුනෙමු; ඉදානි පන, දැන්වනාහි; මයං; අපි; යං ඉච්ඡිස්සාම, යමක් කැමතිවන්නමෝද; තං කරිස්සාම, හේ කරන්නෙමුය; යං නඉච්ඡිස්සාම, යමක් නොකමැතිවන්නෙමුද; තං නකරිස්සාමාති, හේ නොකරන්නෙමු යයි; වුත්තවචනං, කියනලද වචනය; අනුස්සරන්තො, අනුස්මරණය කරණුයේ; එතං පන, මේ වනාහි; ඨානං, හෙතුයෙක්; විජ්ජති ඛො, විද්‍යමාන ම වේ; (හේ කවරකාරුණෙක්දැයි **"යං පාපභික්ඛූ''** යනාදිය කී.) පාපභික්ඛූ, පාපභික්‍ෂූහු; යං, යම් කාරුණක් හෙතු කොට ගෙණ; අතීතසත්ථුකං පාවචනංති, ඉකුත්ව ගිය ශාස්තෘමත් ධර්මවිනයයි; මඤ්ඤමානා, හඟිමින්; පක්ඛං ලභිත්වා, (අලජ්ජි) පක්‍ෂයක් ලැබ; නචිරස්සෙව, නොබෝ කලකින්ම; සද්ධම්මං, සද්ධර්මය; අන්තරධාපෙය්‍යුං, අන්තර්ධාන කරන්නාහුද; යාව ච ධම්මවිනයො තිට්ඨති, යම්තාක් ධර්මවිනය (දෙක ලජ්ජීන්කෙරෙහි) සිටීද; තාව, ඒතාක්; අනතීතසත්ථුකමෙව පාවච

හෙතං භගවතා:-"යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා" ති යථානූනාහං ධම්මං ච විනයං ච සඞ්ගායෙය්‍යං යථයිදං සාසනං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං, යඤ්චාහං භගවතා: "ධාරෙස්සසි පන මෙ ත්වං කස්සප සාණානි පංසුකූලානි නිබ්බසනානී" ති වත්වා චීවරෙ සාධාරණ පරිභොගෙන චෙව "අහං භික්ඛවෙ යාවදෙව ආකඞ්ඛාමි විවිච්චෙව කාමෙහි -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරාමි, කස්සපොපි භික්ඛවෙ යාවදෙව ආකඞ්ඛති විවිච්චෙව කාමෙහි -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ

---

නනාති, නොඉක්මගිය ශාස්තෘමත් ධර්මවිනයයි; ආනන්ද, ආනන්දය; මයා, මාවිසින්, වො, තොපට; යො ධම්මො ච, යම් ධර්මයෙක් තෙමේද; විනයො ච, (යම්) විනයෙක් තෙමේ ද; දෙසිතො, දෙසනලද්දේද; පඤ්ඤත්තො, පණවනලද්දේද; සො, ඒ ධර්මවිනය දෙක; වො, තොපට; මමච්චයෙන, මාගේ ඇවෑමෙන්; සත්ථාති, ශාස්තෘ යයි; භගවතා, (පිරිනිවන් මඤ්චකයෙහි හොත්) භාග්‍යවත්හු විසින්; එතං, මේකාරණය; වුත්තංහි, වදාරණලදමැයි; යථා, යම් ප්‍රකාරයකින්; ඉදං සාසනං, මේ (ත්‍රිවිධ) ශාසනය; අද්ධනියං, අධ්‍වානක්‍ෂම වන්නේද; චිරට්ඨිතිකං අස්ස, චිරස්ථිතික වන්නේද; (එසේ) අහං, මම; ධම්මං ච, ධර්ම ද; විනයං ච, විනය ද; සඞ්ගායෙය්‍යං, සඞ්ගායනා කොළෙම්නම්; යථානූන, මැන වැයි; (දුන් සම්‍යක්සම්බුදුහු විසින් තමහට කරණලද අනුග්‍රහ විශෙෂය විභාගකරණුයේ **"යඤ්චාහං භගවතා"** යනාදිය කී.) භගවතා, භාග්‍යවත්හුවිසින්; කස්සප, කාශ්‍යපය; ත්වං පන, තෝ වනාහි; මෙ, මාගේ; නිබ්බසනානි, හැඳිනෘනානිම්; සාණානි පංසුකූලානි, (මලසිරුර වෙළා දමනලද තිඹක් පමණ පණුවන් පොළා ගන්නාලද) සණවැහැරිමයපාංශුකූලචීවරය; ත්වං පන, තෝ වනාහි; ධාරෙස්සසිති වත්වා, ධරන්නෙහි දැයි කියා; චීවරෙ, සිවුරෙහි; සාධාරණ පරිභොගෙන, (පිළිවෙත් පිරිම හෙතු කොට ගෙණ තමන්වහන්සේ හා) සාධාරණපරිභොගයෙන්; යඤ්ච, යම් ප්‍රකාරයකිනුදු; අහං, මම; අනුග්ගහිතො, අනුග්‍රහ කරණ ලද්දෙම්; (දුන් නවානුපූර්වවිහාර ෂඩභිඥදිප්‍රභෙද ඇති උත්තරිමනුෂ්‍යධර්මයෙහි තමන්වහන්සේ හා සමව තැබිමපිණිස භාග්‍යවත්හු වසින් වදාරණලද කස්සපසංයුත්ත යෙහි ආවාවූ පාළිය පෙය්‍යාල මුඛයෙන් හා ආදි ග්‍රහණයෙන් ද සංසන්දනය කොට දක්වනුයේ **"අහං භික්ඛවෙ"** යනාදිය වදාළේය.) භික්ඛවෙ, මහණෙනි; අහං, මම; යාවදෙව, යම්තාක්කල්; ආකඞ්ඛාමි, කැමතිවෙම්ද; (ඒතාක්කල්) කාමෙහි, කාමයන්කෙරෙන්, විවිච්චෙව, වෙන්ව ම; -පෙ- පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානයට; -පෙ- උපසම්පජ්ජ විහරාමි, පැමිණ වසමි; භික්ඛවෙ, මහණෙනි; කස්සපොපි, කාශ්‍යපතෙමේද; යාවදෙව, යම්තාක්කල්; ආකඞ්ඛති, කැමතිවේද; කාමෙහි, කාමයන්කෙරෙන්; විවිච්චෙව, වෙන්වම; -පෙ- උපසම්පජ්ජ

විහරතී"ති එවමාදිනා නයෙන නවානුපුබ්බවිහාරඡළභිඤ්ඤප්පභෙදෙ උත්තරිමනුස්සධම්මෙ අත්තනා සමසමට්ඨපනෙන ච අනුග්ගහීතො, තස්ස මෙ කිමඤ්ඤං ආණණ්‍යං භවිස්සති, නනු මං භගවා රාජා විය සකකවච ඉස්සරියානුප්පදානෙන අත්තනො කුලවංසප්පතිට්ඨාපකං පුත්තං සද්ධම්මවංසපතිට්ඨාපකො මෙ අයං භවිස්සතී'ති මන්ත්වා ඉමිනා අසාධාරණෙන අනුග්ගහෙන අනුග්ගහෙසී"ති චින්තයන්තො ධම්මවිනය සඞ්ගායනත්ථං භික්ඛූනං උස්සාහං ජනෙසි. යථාහ:-

"අථඛො ආයස්මා මහාකස්සපො භික්ඛූ ආමන්තෙසි: එකමිදාහං ආවුසො සමයං පාවාය කුසිනාරං අද්ධානමග්ගපටිපන්නො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහී"ති; සබ්බං සුභද්දකණ්ඩං විත්ථාරතො වෙදිතබ්බං තතො පරං ආහ:- "හන්දමයං

---

විහරතීති, පැමිණ වාසය කෙරේ යයි; එවමාදිනා නයෙන; මේ ආදි නයින්; නවානුපුබ්බවිහාරඡළභිඤ්ඤාදිභෙදෙ, නවානුපූර්වවිහාරෂඩභිඥාදි ප්‍රභෙද ඇත්තාවූ; උත්තරිමනුස්සධම්මෙ, උත්තරිමනුෂ්‍යධර්මයෙහි, අත්තනා සමසමට්ඨපනෙන ච, (නවානුපූර්වවිහාරෂඩභිඥභාවසාමාන්‍ය යෙන්) තමන් වහන්සේ හා සමව තැබීමෙන් ද; අනුග්ගහිතො, අනුග්‍රහ කරණලද්දෙමි; තස්ස මෙ, අනුග්‍රහකරණලද) ඒ මට; අඤ්ඤං කිං ආණණ්‍යං භවිස්සති, (ධර්මවිනය සඞ්ගායනාව හැර) අනික් කුමන ඉණ පලිබොධ මුක්තභාවයෙක් වන්නේද; භගවා, භාග්‍යවත්තෙමේ; සකකවචඉස්සරියානුප්පදානෙන, ස්වකීය සන්නාහ ඓශ්වර්‍ය්‍යානුප්‍රදානයෙන්; අත්තනො කුලවංසපතිට්ඨාපකං පුත්තං, තමන්ගේ කුලවංශය පිහිටුවන පුත්‍රයාට; රාජාවිය, රජහු මෙන්; මෙ, මාගේ; සද්ධම්මවංසපතිට්ඨාපකො, සද්ධර්මවංශය පිහිටුවන්නෙක්; අයං භවිස්සතීති මන්ත්වා, මෙතෙම වන්නේ යයි දැන; ඉමිනා අසාධාරණෙන අනුග්ගහෙන, මේ අසාධාරණ අනුග්‍රහයෙන්; මං, මට; අනුග්ගහෙසි නනූති, අනුග්‍රහ කොළේ නොවේ දැයි; චින්තයන්තො, (කාරුණ්‍ය) සිතමින්; ධම්මවිනයසඞ්ගායනත්ථං, ධර්මවිනය සඞ්ගායනා කරණු පිණිස; භික්ඛූනං, භික්ෂූන්ට; උස්සාහං ජනෙසි, උත්සාහ ඉපදවූයේය; යථාහ, මෙසේ කීයේ:-

අථඛො, ඉක්බිති; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහාකාශ්‍යප තෙමේ; භික්ඛූ ආමන්තෙසි, භික්ෂූන්ට ආමන්ත්‍රණය කොළේය; ආවුසො, ඇවැත්නි; අහං, මම; එකං සමයං, එක් කාලයෙක්හි; (ඉදං යනු නිපාත මාත්‍රයෙකි) මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, (සඞ්ඛ්‍යාමහන්තත්වයෙන් හා ගුණමහන්තත්වයෙන්) මහත්වූ භික්ෂුසඞ්ඝයා සමග; (එනම්) පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සද්ධිං, පන්සියයක් භික්ෂූන් සමග; පාවාය, පාවා නම් නුවරින් නික්ම; කුසිනාරං, කුසිනාරා නුවරෙහි; අද්ධාන මග්ගපටිපන්නොති, දීර්ඝමාර්ගයට පැමිණියෙමි යන; සබ්බං, සියලු; සුභද්දකණ්ඩං (පඤ්චසතිකක්ඛන්ධකයෙහි ආ) සුභද්‍රකාණ්ඩය; (මෙහි ගෙණ වුත්) විත්ථාරතො, විස්තරවශයෙන්; වෙදිතබ්බං, දතයුත්තේය;

ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාම, පුරෙ අධම්මො දිප්පති, ධම්මො පටිබාහියති, අවිනයො දිප්පති විනයො පටිබාහියති, පුරෙ අධම්මවාදිනො බලවන්තො හොන්ති ධම්මවාදිනො දුබ්බලා හොන්ති, අවිනයවාදිනො බලවන්තො හොන්ති විනයවාදිනො දුබ්බලා හොන්ති"ති, භික්ඛූ ආහංසු: "තෙනහි භන්තෙ ථෙරො භික්ඛූ උච්චිනතූති. ථෙරො සකලනවඞ්ගසත්ථුසාසනපරියත්තිධරෙ පුථුජ්ජනසොතාපන්නසකදාගාමිඅනාගාමිසුක්ඛවිපස්සකඛීණාසවභික්ඛූ අනෙකසතෙ අනෙකසහස්සෙ වජ්ජෙත්වා තිපිටකසබ්බපරියත්තිප්පභෙදධරෙ පටිසම්භිදාප්පත්තෙ මහානුභාවෙ යෙභුය්‍යෙන භග

---

තතො පරං, ඒ සුභද්‍රකාණ්ඩයෙන් පසු; ("සත්තං සුභද්දකණ්ඩං විත්ථාරතො වෙදිතබ්බං" යන මෙයින් "යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාම" යන මේ පර්‍ය්‍යන්ත වූ සුභද්‍රකාණ්ඩපාලිය දක්වා දත් සෙසු උත්සාහජනන ප්‍රකාරප්‍රවෘත්තපාලිය ම දක්වනුයේ "**හන්ද මයං ආවුසො**" යනාදිය කී.) ආවුසො, ඇවැත්නි; පුරෙ, (යම්තාක් අධර්මය තෙමේ ධර්මය ප්‍රතිබාහනය කරන්ට සමර්ථ වේද එසින්) පෙරටුව ම; අධම්මො, අධර්මය තෙම; දිප්පති, බබළන්නේය; ("පුරා වස්සති දෙවො" යනුයෙහි මෙන් පුරෙ, ශබ්දයොගය හා පවත්නා මේ අනාගතාර්ථයෙහි වර්තමාන ප්‍රයොග යයි දතයුත්තේය. සෙස්සෙහි ද මෙම නය වේ.) ධම්මො, ධර්මයතෙම; පටිබාහියති, ප්‍රතිබාහනය කරණු ලබන්නේය; අවිනයො, (සංවරවිනයාදීන්ට ප්‍රතිපක්ෂවූ) අවිනයතෙම; දිප්පති, බබළන්නේය; විනයො, (සංවරවිනයාදි) විනයතෙම; පටිබාහියති, ප්‍රතිබාහනය කරණු ලබන්නේය; පුරෙ, පෙර; අධම්මවාදිනො, අධර්මවාදීහු; බලවන්තො හොන්ති, බලවත් වන්නාහුය; ධම්මවාදිනො, ධර්මවාදීහු; දුබ්බලා හොන්ති දුර්වලවන්නාහුය; අවිනයවාදිනො, අවිනයවාදීහු; බලවන්තො හොන්ති, බලවත් වන්නාහුය; විනයවාදිනො, විනයවාදීහු; දුබ්බලා හොන්ති; දුර්වලවන්නාහුය; හන්ද, එබැවින්; මයං, අපි; ධම්මංච, ධර්මය ද; විනයඤ්ච, විනය ද; සඞ්ගායෙය්‍යාම ඉති, සඞ්ගායනාකරම්හයි; ආහ, කීයේ; භික්ඛූ, භික්ෂූහු; භන්තෙ, වහන්ස; තෙනහි, එසේවීනම්; ථෙරො, තෙරතෙමේ; භික්ඛූ, (සඞ්ගායනාවට සුදුසු) භික්ෂූන්; උච්චිනතූති, තෝරාගණීවායි; ආහංසු, කීහු; ථෙරො, තෙරතෙමේ; සකලනවඞ්ගසත්ථුසාසනපරියත්තිධරෙ, සියලු නවාඞ්ග ශාස්තෘ ශාසනපර්‍ය්‍යාප්තිධරවූ; පුථුජ්ජනසොතාපන්නසකදාගාමි අනාගාමිසුක්ඛවිපස්සකඛීණාසවභික්ඛූ, පෘථග්ජන ශ්‍රොත්‍රාපන්න සකෘදාගාමි අනාගාමි ශුෂ්කවිදර්ශක ක්ෂීණාශ්‍රව භික්ෂූන්; අනෙකසතෙ අනෙකසහස්සෙ ච, නොයෙක් සියගණන් ද නොයෙක් දහස්ගණන් ද; වජ්ජෙත්වා, හැර; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; භගවතා, භාග්‍යවත්හු විසින්; එතදග්ගං, ආරොපිතෙ, එතදග්‍රයට නගන ලද්දා වූ; තිපිටකසබ්බපරියත්තිප්පභෙදධරෙ, ත්‍රිපිටක සකල පර්‍ය්‍යාප්ති ප්‍රභෙදධරවූ; පටිසම්භිදාප්පත්තෙ, සිව්පිළිසිඹියාවට පැමිණි

වතා එතදග්ගං ආරොපිතෙ තෙවිජ්ජාදිභෙදෙ ඛීණාසවභික්ඛූයෙව එකූනපඤ්චසතෙ පරිග්ගහෙසි. යෙ සන්ධාය ඉදං වුත්තං:-"අථඛො ආයස්මා මහාකස්සපො එකෙනූනපඤ්ච අරහන්තසතානි උච්චිනි"ති.

කිස්ස පන ථෙරො එකෙනූනමකාසී'ති? ආයස්මතො ආනන්දත්ථෙරස්ස ඔකාසකරණත්ථං, තෙන හායස්මතා සහාපි විනාපි නසක්කා ධම්මසඞ්ගීති කාතුං, සො හායස්මා සෙඛො සකරණීයො තස්මා සහාපි නසක්කා, යස්මා පනස්ස කිඤ්චි දසබලදෙසිතං සුත්තගෙය්‍යාදිකං භගවතො අසම්මුඛා පටිග්ගහිතං නාම නත්ථි, තස්මා විනාපි. නසක්කා යදි එවං සෙඛොපි සමානො ධම්මසඞ්ගීතියා බහූපකාරත්තා ථෙරෙන උච්චිනිතබ්බො අස්ස.

---

යාවූ; මහානුභාවෙ, මහත් අනුභාව ඇත්තාවූ; තෙවිජ්ජාදි භෙදෙ; ත්‍රිවිද්‍යාදි භෙදවත්වූ; ඛීණාසවභික්ඛූයෙව, ක්ෂීණාශ්‍රව භික්ෂූන් ම; එකූන පඤ්චසතෙ, එකකින් උණු පන්සියයක් හෙවත් එකක් අඩු පන් සියයක්; පරිග්ගහෙසි, පරිග්‍රහ කොළේය; හෙවත් ගත්තේය; යෙ සන්ධාය, යම් භික්ෂු සමූහයක් ග්‍රහණය කොළේද ඒ සඳහා; **"අථඛො ආයස්මා මහාකස්සපො එකෙනූන පඤ්ච අරහන්තසතානි උච්චිනි"**යි ඉදං වුත්තං,(සඞ්ගීතික්ඛන්ධකයෙහි) මේ කියනලදී.

කිස්සපන, කුමක්හෙයින් වනාහි; ථෙරො, තෙරතෙමේ; එකෙන, එක කින්; ඌනං අකාසීති, අඩුකොළේදැයි; ආයස්මතො ආනන්දත්ථෙරස්ස, ආයුෂ්මත් අනඳ තෙරහට; ඔකාසකරණත්ථං, අවකාශ කරණ පිණිසය; තෙනහි ආයස්මතා සහාපි, එම ආයුෂ්මත්හු සමගද; විනාපි, වෙන්වද; ධම්මසඞ්ගීතිකාතුං, ධර්මසඞ්ගායනාව කරන්ට; නසක්කා, නොහැක්කේය; යංහි, යම් හෙයකින්; සො ආයස්මා, ඒ ආයුෂ්මත් තෙමේ; සෙඛො, ශෛක්ෂද; සකරණීයො, කෘත්‍යසහිතද; (**"සික්ඛතී'ති= සෙඛො, නොහොත් අරියාය ජාතියා තීසු සික්ඛාසු ජාතො= තත්ථ වා භවො'ති= සෙඛො, උපරිමග්ගත්තයකිච්චස්ස අපරියොසිතත්තා සහ කරණීයෙනා'ති= සකරණීයො,**" යි විග්‍රහයි.) තස්මා, එහෙයින්; සහාපි නසක්කා, එක්වද නොහැක්කේය; යස්මාපන, **යම්** හෙයකින් වනාහි; අස්ස, මොහු විසින්; දසබලදෙසිතං, දශබලහු විසින් දෙසනලද්දාවූ; සුත්තගෙය්‍යාදිකං, සූත්‍රගෙය්‍යාදිය; භගවතො අසම්මුඛා, භාග්‍යවත්හුගේ නොහමුවෙහි; කිඤ්චි, පටිග්ගහිතං නාම නත්ථි, කිසි පිළිගන්නා ලද්දක් නම් නැත්තේද; තස්මා එහෙයින්; විනාපි නසක්කා, වෙන්වද නොහැක්කේය; යදි එවං, මෙසේ වුවත්; සෙඛොපි සමානො, හික්මෙනුයේද; ධම්මසඞ්ගීතියා, ධර්මසඞ්ගායනාවට; බහූපකාරත්තා, බොහෝ උපකාර ඇති බැවින්; ථෙරෙන, තෙරහු විසින්; උච්චිනිතබ්බො **අස්ස**, තෝරාගතයුතු වන්නේය.

අථ කස්මා න උච්චිනිතොති? පරූපවාදවිවජ්ජනතො. ථෙරො හි ආයස්මන්තෙ ආනන්දෙ අතිවිය විස්සත්ථො අහොසි, තථාහි නං සිරස්මිං පලිතෙසු ජාතෙසුපි නවායං කුමාරකො මත්තමඤ්ඤාසී ති කුමාරකවාදෙන ඔවදති, සක්‍යකුලප්පසුතො චායමායස්මා තථාගතස්ස භාතා චූළපිතුපුත්තො, තත්‍රහි භික්ඛූ ඡන්දාගමනං විය මඤ්ඤමානා බහු අසෙක්ඛපටිසම්භිදප්පත්තෙ භික්ඛූ ඨපෙත්වා ආනන්දං සෙක්ඛපටිසම්භිදප්පත්තං ථෙරො උච්චිනීති උපවදෙය්‍යුං, තං පරූපවාදං පරිවජ්ජෙන්තො ආනන්දං විනා සඞ්ගීති න සක්කා කාතුං භික්ඛූනං යෙවානුමතියා ගහෙස්සාමීති නං න උච්චිනි. අථ සයමෙව භික්ඛූ ආනන්දස්සත්ථාය ථෙරං යාචිංසු යථාහ:–

---

අථ, එසේ ඇති කල්හි; කස්මා, කුමක් හෙයින්; න උච්චිනිතොති, තෝරා නොගන්නාලද්දේ දැයි; පරූපවාදවිවජ්ජනතො, පරූපවාදය දුරු කටයුතු හෙයිනි; ථෙරො හි, මහ කසුප්තෙරතෙමේ වනාහි; ආයස්මන්තෙ ආනන්දෙ, ආයුෂ්මත් අනඳතෙරුන් කෙරෙහි; අතිවිය විස්සත්ථො අහොසි, ඉතාම විශ්වාස කෙනෙක් වූයේය; තථාහි, එසේ මැයි; සිරස්මිං, හිසෙහි; පලිතෙසු ජාතෙසුපි, පැසුනු කෙස් හටගත් කල්හි පවා; අයං කුමාරකො, මේ කුමාරතෙමේ; මත්තං න අඤ්ඤාසීති, පමණ නොදත්තේ යයි; නං, ඒ අනඳ තෙරහට; කුමාරකවාදෙන ඔවදති, (තිසක් පමණ ඔහුවෙත විසූවන් සිවුරු හැර ගිය බැවින්) කුමාරවාදයෙන් කියා, ("න වායං කුමාරකො මත්තමඤ්ඤාසි" යන මෙහි වා ශබ්දය තෙම පද පූරණයෙහි නිපාත යයි දන්නේ.) අයං ආයස්මා ආනන්දෙ, මේ ආයුෂ්මත් ආනන්ද තෙමේ; සක්‍යකුලප්පසුතො ච, ශාක්‍යකුලප්‍රසූතද වූයේය; තථාගතස්ස, තථාගතයන්ගේ; භාතා, භ්‍රාතෘද වූයේය; චූළපිතුපුත්තො සුළුපියපුත්ද වූයේය; තත්‍රහි, මෙසේ ඇති කල්හි වනාහි; භික්ඛූ, භික්ෂූහු; ඡන්දාගමනං විය, ඡන්දය කරණකොටගෙණ නොකටයුතු කරන්නෙක් මෙන් යයි; මඤ්ඤමානා, හඟිමින්; බහු අසෙක්ඛපටිසම්භිදප්පත්තෙ භික්ඛූ ඨපෙත්වා, බොහෝ අශෛක්‍ෂප්‍රතිසම්භිදාවට පැමිණි භික්ෂූන් තබා; සෙක්ඛපටිසම්භිදප්පත්තං, ශෛක්‍ෂප්‍රතිසම්භිදාවට පැමිණියාවූ; ආනන්දං, ආනන්ද ස්ථවිරයා; ථෙරො, ස්ථවිර තෙමේ; උච්චිනීති, තෝරාගත්තේ යයි; උපවදෙය්‍යුං, උපවාද කරන්නාහු වීනම්; තං පරූපවාදං, ඒ පරූපවාදය; පරිවජ්ජෙන්තො, දුරුකරණුයේ; ආනන්දං විනා, ආනන්දයා හැර; සඞ්ගීතිකාතුං, සඞ්ගායනාව කරන්ට; නසක්කා, නොහැක්කේය; භික්ඛූනං යෙව අනුමතියා, භික්ෂූන්ගේම සංඥවෙන්; ගහෙස්සාමීති, ගන්නෙමියි; නං, ඒ අනඳතෙරහු; න උච්චිනි, තෝරා නොගත්තේය; අථ, ඉක්බිති; භික්ඛූ, භික්ෂූහු; සයමෙව; තුමූම; ආනන්දස්සත්ථාය, අනඳ තෙරහුගෙන් ප්‍රයොජන සඳහා; ථෙරං යාචිංසු, තෙරහට යාඥ කළාහුය; යථාහ, මෙසේ කීයේය;

භික්ඛූ ආයස්මන්තං මහාකස්සපං එතදවොචුං: අයං භන්තෙ ආයස්මා ආනන්දො කිඤ්චාපි සෙඛො අභබ්බො ඡන්දා දොසා භයා මොහා අගතිං ගන්තුං, බහු චානෙන භගවතො සන්තිකෙ ධම්මො ච විනයො ච පරියත්තො, තෙනහි භන්තෙ ථෙරො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනතූ"ති අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනි. එවං භික්ඛූනං අනුමතියා උච්චිනිතෙන තෙනායස්මතා සද්ධිං පඤ්චථෙරසතානි අහෙසුං. අථ ඛො ථෙරානං භික්ඛූනං එතද හොසි: "කත්ථ නු ඛො මයං ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාමා"ති අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: රාජගහං ඛො මහාගොචරං පහූතසෙනාසනං, යන්නූන මයං රාජගහෙ වස්සං වසන්තා ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාම, න අඤ්ඤෙ භික්ඛූ රාජගහෙ වස්සං

---

භික්ඛූ, භික්ෂූහු; ආයස්මන්තං මහාකස්සපං, ආයුෂ්මත් මහකාසුප් තෙරහට; භන්තෙ, වහන්ස; අයං ආයස්මා ආනන්දො, මේ ආයුෂ්මත් අනඳතෙමේ; කිඤ්චාපි, කිසිසේත්; සෙඛො, ශික්මෙන්නෙක්ය; ඡන්දා, ඡන්දයෙන්; දොසා, ද්වෙෂයෙන්; භයා, භයින්; මොහා, මොහයෙන්; අගතිං ගන්තුං, නොකටයුත්ත කරන්ට; අභබ්බො, භව්‍ය නොවේ; චන, එකාන්තයෙන්; අනෙන, මොහු විසින්; භගවතො සන්තිකෙ, භාග්‍යවත්හුගේ සමීපයෙහි; බහු බොහෝ; ධම්මො ච, ධර්මයද; විනයො ච, විනයද; පරියත්තො, හදුරණලද්දේය. (ඉගෙණගන්නාලද්දේය යන අර්ථයි.) තෙනහි, එසේහෙයින්; භන්තෙ, වහන්ස; ථෙරො, ස්ථවිරතෙමේ; ආයස්මන්තං ආනන්දම්පි, ආයුෂ්මත් ආනන්දයාද; උච්චිනතූති, තෝරාගණීවායි; එතං, මේ කාරණය; අවොචුං, කීවාහුය; අථ ඛො, ඉක්බිති; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහාකාශ්‍යප තෙමේ; ආයස්මන්තං ආනන්දම්පි ආයුෂ්මත් අනඳතෙරහු ද; උච්චිනි, තෝරාගත්තේය; එවං, මෙසේ; භික්ඛූනං අනුමතියා, භික්ෂූන්ගේ ආඥවෙන්; උච්චිනිතෙන, තෝරාගන්නාලද්දාවූ; තෙන ආයස්මතා සද්ධිං, ඒ ආයුෂ්මත්හු සමග; පඤ්චථෙරසතානි අහෙසුං, පන්සියයක් තෙරහු වූවාහුය; අථ ඛො, ඉක්බිති; ථෙරානං භික්ඛූනං, ස්ථවිරභික්ෂූන්ට; කත්ථනුඛො, කොතැන්හි වනාහි; මයං, අපි; ධම්මඤ්ච විනයඤ්ච, ධර්ම විනය; සඞ්ගායෙය්‍යාමාති, සඞ්ගායනා කරන්නමෝදැයි; එතං අහොසි, මේ පරිවිතර්කයෙක් වූයේය; අථ ඛො, ඉක්බිති; ථෙරානං භික්ඛූනං සථවිරභික්ෂූන්ට; එතං අහොයි, මෙබඳු පරිවිතර්කයෙක් වූයේය; (හේ කෙබඳුද යත්?) රාජගහං ඛො, රජගහව වනාහි; මහාගොචරං, මහත් භික්පිණිස හැසිරෙණ තැනෙක්ය; (**"ගාවො චරන්ති එත්ථා'ති= ගොචරො, ගොචරො විය'ති= ගොචරො-භික්ඛාචරණට්ඨානං සො මහන්තො අස්සා'ති=මහාගොචරං-තං"** යිවිග්‍රහයි.) පහූතසෙනාසනං. බොහෝ සෙනසුන් ඇත්තේය; මයං, අපි; රාජගහෙ, රජගහවෙහි; වස්සං වසන්තා, වස්වසමින්; ධම්මඤ්ච විනයඤ්ච, ධර්මවිනය; සඞ්ගායෙය්‍යාම, සඞ්ගායනා කරන්නෙමු නම්; අඤ්ඤෙ

උපගච්ඡෙය්‍යුන්ති. කස්මා පන තෙසං එතදහොසි? ඉදං අම්හාකං ථාවරකම්මං කොචි විසභාගපුග්ගලො සඞ්ඝමජ්ඣං පවිසිත්වා උක්කොටෙය්‍යාති, අථායස්මා මහාකස්සපො ඤත්තිදුතියෙන කම්මෙන සාවෙසි, තං සඞ්ගීතික්ඛන්ධකෙ වුත්තනයෙනෙව වෙදිතබ්බං.

අථ තථාගතස්ස පරිනිබ්බානතො සත්තසු සාධුකීළනදිවසෙසු සත්තසු ච ධාතුපූජාදිවසෙසු වීතිවත්තෙසු අඩ්ඪමාසො අතික්කන්තො ඉදානි ගිම්හානං දියඩ්ඪො මාසො සෙසො උපකට්ඨා වස්සූපනායිකාති මන්ත්වා මහාකස්සපත්ථෙරො රාජගහං ආවුසො ගච්ඡාමාති උපඩ්ඪං භික්ඛුසඞ්ඝං ගහෙත්වා එකං මග්ගං ගතො, අනුරුද්ධත්ථෙරොපි උපඩ්ඪං ගහෙත්වා එකං මග්ගං ගතො, ආනන්දත්ථෙරො පන භගවතො පත්තචීවර

---

භික්ඛූ, සෙසු භික්ෂූහු; රාජගහෙ, රජගහවෙහි; වස්සං න උපගච්ඡෙය්‍යුං වස් නොඑළඹෙන්නාහු නම්; යන්නූන ඉති, මැනවැයි කියායි; කස්මා පන, කුමක්හෙයින් වනාහි; තෙසං, ඒ තෙරුන්ට; එතං අහොසි, මෙබඳු පරිවිතර්කයෙක් වූයේදයත්; අම්හාකං, අපගේ; ඉදං ථාවරකම්මං, මේ චිරස්ථායී කෘත්‍යය; කොචි විසභාගපුග්ගලො, (සුභද්‍රයා සමාන) කිසි විෂභාගපුද්ගලයෙක්තෙම; සඞ්ඝමජ්ඣං පවිසිත්වා, සඟමැදට වැද; උක්කොටෙය්‍යාති, වළකාසිකියායි: අථ, ඉක්බිති; ආයස්මා මහාකස්සපො, ආෂ්මත් මහකසුප්තෙමේ; ඤත්තිදුතියකම්මෙන, ඥප්තිද්විතීය කර්මයෙන්; සාවෙසි, ඇස්වූයේය; තං, හේ කර්මයතෙම; සඞ්ගීතික්ඛන්ධකෙ, සඞ්ගීති ස්කන්ධකයෙහි; වුත්තනයෙනෙව, උක්තනයින්ම; වෙදිතබ්බං, දතයුත්තේය;

අථ, එකල්හි; තථාගතස්ස, තථාගතයන්ගේ; පරිනිබ්බානතො, පරිනිර්වාණයෙන්; සත්තසු සාධුකීළනදිවසෙසු, සප්තසාධුක්‍රීඩාදිනයද, සත්තසු ධාතුපූජාදිවසෙසු ච, ධාතුපූජා සත්දවසද; වීතිවත්තෙසු, ඉක්මුණුකල්හි; අඩ්ඪමාසො අතික්කන්තො, අඩමසෙක් ඉක්මූනේය; ඉදානි, දැන්; ගිම්හානං, ග්‍රීෂ්මඍතුව සම්බන්ධ; දියඩ්ඪො මාසො; ව්‍යදඞමසෙක් හෙවත් එක්මස් පහළොස්දිනයෙක්; සෙසො, ශෙෂවීය; මහාකස්සපත්ථෙරො, මහකසුප්තෙර තෙමේ; වස්සූපනායිකා, වස්එළඹෙන අවස්ථාව; ("**වස්සං උපනෙන්ති උපගච්ඡන්ති එත්ථා'ති=වස්සූපනායිකා**"යි විග්‍රහයි.) උපකට්ඨාති, ආසන්නයයි; මන්ත්වා, දැන; ආවුසො, ඇවැත්නි; රාජගහං ගච්ඡාමාති, රජගහවට යම්හයි; උපඩ්ඪං, භික්ඛුසඞ්ඝං ගහෙත්වා, අඩියක් භික්ෂුසඞ්ඝයා ගෙණ; එකං මග්ගං ගතො, (චාරිකාවෙහි හැසිර මහජනයා අස්වසනු පිණිස) එක්මගකින් ගියේය; අනුරුද්ධත්ථෙරොපි, අනුරුද්ධස්ථවිර තෙමේද; උපඩ්ඪං ගහෙත්වා, අඩියක්ගෙණ; එකං මග්ගං ගතො, (ඒ පිණිස) එක්මගකින් ගියේය; ආනන්දත්ථෙරො පන, ආනන්දස්ථවිරතෙමේ වනාහි; භගවතො, භාග්‍යවත්හුගේ; පත්තචීවරං ගහෙත්වා, පාසිවුරු ගෙණ; භික්ඛුසඞ්ඝපරිවුතො, භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරණලදුයේ; සාවත්ථිං ගන්ත්වා, සැවැත්

ගහෙත්වා භික්ඛුසඞ්ඝපරිවුතො සාවත්ථිං ගන්ත්වා රාජගහං ගන්තුකාමො. යෙන සාවත්ථි තෙන චාරිකං පක්කාමි. ආනන්දත්ථෙරෙන ගතගතට්ඨානෙ මහාපරිදෙවො අහොසි: භන්තෙ ආනන්ද කුහිං සත්ථාරං ඨපෙත්වා ආගතොසීති. අනුපුබ්බෙන පන සාවත්ථිං අනුප්පත්තෙ ථෙරෙ භගවතො පරිනිබ්බාණදිවසෙ විය මහාපරිදෙවො අහොසි, තත්‍රසුදං ආයස්මා ආනන්දො අනිච්චතාදිපටිසංයුත්තාය ධම්මියා කථාය තං මහාජනං සඤ්ඤාපෙත්වා ජෙතවනං පවිසිත්වා දසබලෙන වසිතගන්ධකුටියා ද්වාරං විවරිත්වා මඤ්චපීඨං නීහරිත්වා පප්ඵොටෙත්වා ගන්ධකුටිං සම්මජ්ජිත්වා මිලාතමාලාකචවරං ඡඩ්ඩෙත්වා මඤ්චපීඨං අතිහරිත්වා පුන යථාට්ඨානෙ ඨපෙත්වා භගවතො ඨිතකාලෙ කරණීයං වත්තං සබ්බමකාසි.

---

නුවරට ගොස්; රාජගහං ගන්තුකාමො, රජගහවට යනු කැමතියේ; සාවත්ථි, සැවැත්නුවර; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැන්හි; චාරිකං පක්කාමි, සැරි සැරූයේය; ආනන්දත්ථෙරෙන, ආනඳතෙරහු; ගතගතට්ඨානෙ ගියගියතන්හි; භන්තෙ, ආනන්ද, වහන්ස ආනඳය; සත්ථාරං, ශාස්තෲහු; කුහිං ඨපෙත්වා, කොතැන්හි තබා; ආගතොසීති, ආයෙහිදැයි; මහාපරිදෙවො අහොසි, මහත් විලාපයෙක් වූයේය; අනුපුබ්බෙන පන, පිළිවෙළින් වනාහි; සාවත්ථිං, සැවැත්නුවරට; ථෙරෙ, තෙරහු; අනුප්පත්තෙ පැමිණිකල්හි; භගවතො, භාග්‍යවත්හු; පරිනිබ්බාණ දිවසෙ විය, පිරිනිවි දිනයෙහි මෙන්; මහාපරිදෙවො අහොසි, මහත්විලාපයෙක් වූයේය; තත්‍රසුදං, ඒ සැවැත්නුවරෙහිදී; (සුදං යනු නිපාතමාත්‍රයකි) ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ; අනිච්චතාදිපටිසංයුත්තාය ධම්මියා කථාය, (සබ්බෙ සඞ්ඛාරා අනිච්චා යනාදි නයින් පැවති) අනිත්‍යතාදි ප්‍රතිසංයුක්ත ධර්ම කථාවෙන්; තං මහාජනං සඤ්ඤාපෙත්වා, ඒ මහජනයා මොනවට අස් වසා; ජෙතවනං පවිසිත්වා, ජෙතවනයට ප්‍රවිෂ්ටව; දසබලෙන වසිත ගන්ධකුටියා ද්වාරං විවරිත්වා, දසබුල්හු විසූ ගඳකිළිය (පරිභොග චෛත්‍ය යක් බැවින් වැඳ) දොර හැර; මඤ්චපීඨං නීහරිත්වා, ඇඳ පුටු පිටතට ගෙණ; පප්ඵොටෙත්වා, පොළාහෙලා; ගන්ධකුටිං සම්මජ්ජිත්වා, ගඳකිළිය හැමද; මිලාතමාලාකචවරං ඡඩ්ඩෙත්වා, මලානිකමල්කසළ හැරදමා; මඤ්චපීඨං අතිහරිත්වා, ඇඳපුටු කිළියතුළට ගෙණ; පුන, නැවත; යථාට්ඨානෙ ඨපෙත්වා, පළමු තුබූතැන (නොපාගා එහි) තබා; භගවතො ඨිතකාලෙ, භාග්‍යවත්හු සිටිකල්හි; කරණීයං සබ්බං වත්තං, කටයුතු සියලු (සෙනසුන්) වත්; අකාසි, කෙළේය.

(ඒ වත් කරණුයේද නහන කොටුව හැමද පැන් එළවා තැබීම් ආදී කාලයන්හි ගඳකිළියට ගොස් මාහිමි භාග්‍යවතුන් වහන්ස මේ නුඹවහන්සේ පැන්සනහනකාලය නොවේද මේ දහම් දෙසනකාලය

අථ ථෙරො භගවතො පරිනිබ්බාණතොපපභුති ඨානනිසජ්ජබහුලත්තා උස්සන්නධාතුකං කායං සමස්සාසෙතුං දුතියදිවසෙ ඛීරවිරෙචනං පිවිත්වා විහාරෙයෙව නිසීදි.

යං සන්ධාය සුභෙන මාණවෙන පහිතං මාණවකං එතදවොච:- "අකාලො ඛො මාණවක අත්ථිමෙ අජ්ජ භෙසජ්ජමත්තා පීතා, අප්පෙව නාම සෙවපි උපසඞ්කමෙය්‍යාමා"ති.

---

නොවේද මේ භික්ෂූන්ට අවවාදදෙන කාලය නොවේද මේ සිංහශය්‍යා වෙන් ශයනය කරණ කාලය නොවේද මේ මුවදෙනාකාලය නොවේදැයි යනාදී නයින් හඬමින් විලාපකියමින් ම ඒ වත් කෙළේය, එකල්හි එක්තරු දෙවතාවක් තොමෝ ඕහට වහන්ස ආනන්‍දස්ථවිරය නුඹවහන්සේ මෙසේ හඬමින් විලාපකියන කල්හි කෙසේ අන්‍යයෝ අස්වැසෙත්දැයි කියා සංවෙග ඉපදවූය, එකල්හි ඒ ආනන්‍දස්ථවිරතෙම ඒ දෙවතාවාගේ වචනයෙන් සංවෙගයට පැමිණී සිත් ඇතිව තැතිගෙණ තථාගතයන්ගේ පරිනිර්‍වාණයෙහි පටන් ස්ථාන නිෂද්‍යාබහුලතාවයෙන් උත්සන්න ධාතු ඇති ශරීරය මනාකොට අස්වසනු පිණිස ක්‍ෂීරවිරෙචනය පානය කෙළේය, දැන් ඒ දක්වනුයේ **"අථ ථෙරො"** යනාදිය කී).

අථ, ඉක්බිති; ථෙරෙ, ස්ථවිරතෙමේ; භගවතො පරිනිබ්බාණතොපපභුති, භාග්‍යවත්හු පිරිනිවි තැන්පටන්; ඨානනිසජ්ජබහුලත්තා, ස්ථානනිෂද්‍යා බහුල බැවින්; උස්සන්නධාතුකං කායං, රැස්වනලද (සෙම් පිත් ආදි) ධාතු ඇති කය; සමස්සාසෙතුං, සන්තර්පණය කරණු පිණිස; දුතියදිවසෙ, (දෙව්රම් වෙහෙරට පැමිණී දිනෙන්) දෙවෙනි දිනෙහි; ඛීරවිරෙචනං පිවිත්වා, ක්‍ෂීරවිරෙචනය පානය කොට; ("විරිචවති එතෙනාති= විරෙචනං, ඔසධපරිභාවිතං ඛීරමෙව විරෙචනං= ඛීරවිරෙචනං තං සී විග්‍රහයි) විහාරෙයෙව, වෙහෙරැම; නිසීදි, හුන්නේය.

යං සන්ධාය, යම් (භෛෂජ්‍ය පානයක් කෙළේද)ඒ සඳහා; සුභෙන මාණවෙන,(තමන් සිත උපන් සැකය පුලුවුත්නා පිණිස) සුභනම් මාණවකයා විසින්; පහිතං මාණවකං, එවනලද මාණවකයාහට; එතං අවොච, මේ වචනය කීයේය; මාණවක, මාණවකය; මෙ, මා විසින්; අජ්ජ, අද; භෙසජ්ජමත්තා පීතා, බෙහෙත් සුල්ලක් බොනලද්දී; අත්ථි, ඇති; අකාලො ඛො, (අද පටන්සුතු) කාලය නොවේ; සෙවපි, සෙටවත්; උපසඞ්කමෙය්‍යාම, එළඹෙන්නමෝ නම්; අප්පෙවනාම ඉති, මැනවැයි (කියායි).

දුතියදිවසෙ චෙතකත්ථෙරෙන පච්ඡාසමණෙන ගන්ත්වා සුභෙන මාණවෙන පුට්ඨො දීඝනිකායෙ සුභසුත්තං නාම දසමං සුත්තමභාසි.

අථ ථෙරො ජේතවනවිහාරෙ ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං කාරාපෙත්වා උපකට්ඨාය වස්සූපනායිකාය රාජගහං ගතො, තථා මහාකස්සපත්ථෙරො අනුරුද්ධත්ථෙරො ච සබ්බං භික්ඛුසඞ්ඝං ගහෙත්වා රාජගහමෙව ගතො.

තෙන ඛො පන සමයෙන රාජගහෙ අට්ඨාරස මහාවිහාරා හොන්ති, තෙ සබ්බෙ'පි ඡඩ්ඩිතපතිතඋක්ලාපා අහෙසුං. භගවතො හි පරිනිබ්බාණෙ සබ්බෙ භික්ඛූ අත්තනො අත්තනො

---

දුතියදිවසෙ, (විරේචනය කළ දිනෙන්) දෙවන දිනයෙහි; පච්ඡාසමණෙන, පසු ශ්‍රමණවූ; චෙතකත්ථෙරෙන, (චෙතියරට උපන් බැවින්) එනම්ලද ස්ථවිරයන් සමග; ගන්ත්වා, ගොස්; සුභෙන මාණවෙන, සුභ නම් මාණවකයා විසින්, පුට්ඨො, (**"කතමෙසානං ඛො භො ආනන්ද ධම්මානං සො භවං ගොතමො වණ්ණවාදී අහොසි"** යනාදීන්) විචාරණ ලද්දේ; දීඝනිකායෙ, දීඝනිකායයෙහි; සුභසුත්තං නාම, (**"තිණ්ණං ඛො මාණව ඛන්ධානං සො භගවා වණ්ණවාදී"** යනාදීන් ප්‍රකාශිත) සුභ සූත්‍රය නම්වූ; දසමං සුත්තං අභාසි, දසවන සූත්‍රය වදාළේය;

අථ, ඉක්බිති; ථෙරො, ස්ථවිරතෙමේ; ජේතවනවිහාරෙ, දෙව්රම් වෙහෙරෙහි; ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං කාරාපෙත්වා, සුන්බුන් තැන් අලුත්කිරීම කරවා; වස්සූපනායිකාය උපකට්ඨාය, වස් එළඹෙන අවස්ථාව ආසන්නවූකල්හි; රාජගහං ගතො, රජගහවට ගියේය; තථා, එසේ; මහාකස්සපත්ථෙරොච, මහකසුප් තෙරතෙමේද; අනුරුද්ධත්ථෙරො ච, අනුරුද්ධස්ථවිරතෙමේද; සබ්බං භික්ඛුසඞ්ඝං ගහෙත්වා, සියලු භික්ෂු සඞ්ඝයා ගෙණ; රාජගහං එව, රජගහවටම; ගතො, ගියේය;

තෙනඛො පන සමයෙන, එසමයෙහි වනාහි; රාජගහෙ, රජගහවෙහි; අට්ඨාරස මහාවිහාරා හොන්ති අටළොසක් මහාවිහාර වෙත්; තෙ සබ්බෙපි, ඒ සියල්ලෝම; ඡඩ්ඩිතපතිතඋක්ලාපා අහෙසුං, හරණ ලද්දාවූද පතිතවූද කසළ ඇතිවූවාහුය;

(භාග්‍යවත්හුගේ පරිනිර්වාණයට යන්නාවූ භික්ෂූන් විසින් හරණ ලද්දාහු එහෙයින්ම උපචිකාදීන් විසින් කනලද බැවින් එසේ මෙසේ පතනයවූවාහු ෆනාහමදිනලද බැවින් ආකීර්ණ කසළ ඇතිවූවාහුයයි මෙම අර්ථය දක්වනුයේ **"භගවතොහි"** යනාදිය කී) හි, යම්හෙයකින් භගවතො, භාග්‍යවත්හු; පරිනිබ්බාණෙ, පිරිනිවි කල්හි; සබ්බෙ භික්ඛූ, සියලු භික්ෂූහු; අත්තනො අත්තනො,

පත්තචීවරං ගහෙත්වා විහාරෙව පරිවෙණෙව ඡඩ්ඩෙත්වා අගමංසු. තත්‍ථ ථෙරා භගවතො වචනපූජනත්‍ථං තිත්‍ථියවාදපරිමොචනත්‍ථඤ්ච පඨමං මාසං ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං කරෙමාති චින්තෙසුං.

තිත්‍ථියාහි එවං වදෙය්‍යුං: සමණස්ස ගොතමස්ස සාවකා සත්‍ථරි ඨිතෙයෙව විහාරෙ පටිජග්ගිංසු, පරිනිබ්බුතෙ ඡඩ්ඩෙසුන්ති. තෙසං වාදපරිමොචනත්‍ථඤ්ච චින්තෙසුන්ති වුත්තං හොති

වුත්තම්පිචෙතං – "අථ ඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: භගවතා ඛො ආවුසො ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං වණ්ණිතං, හන්‍දමයං ආවුසො පඨමං මාසං ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං කරොම, මජ්ඣිමං මාසං සන්නිපතිත්වා ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිස්සාමා"ති.

තෙ දුතියදිවසෙ ගන්ත්වා රාජද්වාරෙ අට්ඨංසු. අජාතසත්තුරාජා ආගන්ත්වා වන්‍දිත්වා කිං භන්තෙ ආගතත්‍ථා'ති අත්තනා කත්තබ්බං

---

තමතමාගේ; පත්තචීවරං ගහෙත්වා, පාසිවුරු ගෙණ; විහාරෙව, විහාර යන්ද; පරිවෙණෙව, පිරිවෙන්ද; ("පරිච්ඡෙදවසෙන වෙදියති දිස්සතීති= පරිවෙණං තෙ"යි විග්‍රහයි.) ඡඩ්ඩෙත්වා, හැර; අගමංසු, ගියාහුය; (එහෙයින්) තත්‍ථ ඒ විහාරයන්හි; ථෙරා, තෙරහු; භගවතො වචනපූජනත්‍ථං, භාග්‍යවත්හුගේ වචනයට පුදනු පිණිසද; තිත්‍ථියවාද පරිමොචනත්‍ථඤ්ච, තීර්ථකවාදයෙන් මිදෙන පිණිසද; පඨමං මාසං, (වස්සාන ඍතුවගේ) ප්‍රථම මාසයෙහි; ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං කරෙමාති, සුන්බුන් තැන් පිළිදගුම් කරම්හයි; චින්තෙසුං, සිතූහු;

හි, යම්හෙයකින්; තිත්‍ථියා, තීර්ථකයෝ; සමණස්ස ගොතමස්ස, ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ; සාවකා, ශ්‍රාවකයෝ; සත්‍ථරිඨිතෙයෙව, ශාස්තෘහු සිටිකල්හිම; විහාරෙ. විහාරයන්; පටිජග්ගිංසු, පිළිදගුම් කළාහුය; පරිනිබ්බුතෙ, පිරිනිවිකල්හි; ඡඩ්ඩෙසුන්ති, හැරියෝයයි; එවං, මෙසේ; වදෙය්‍යුං, කියන්නාහුද; (එහෙයින්) තෙසං වාදපරිමොචනත්‍ථං ච, ඔවුන්ගේ වාද මිදීම පිණිසද; චින්තෙසුන්ති, සිතුවෝයයි; වුත්තං හොති, කියනලද්දේවේ.

"අථඛො ථෙරානං භික්ඛූනං එතදහොසි: භගවතා ඛො ආවුසො ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං වණ්ණිතං, හන්‍දමයං, ආවුසො පඨමං මාසං ඛණ්ඩඵුල්ලපටිසඞ්ඛරණං කරොම මජ්ඣිමං, මාසං සන්නිපතිත්වා ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිස්සාම"යි වුත්තම්පිචෙතං, මෙමැ කියනලදී;

තෙ, ඒ තෙරහු; දුතියදිවසෙ, (සුන්බුන් තැන් ප්‍රකෘතිමත් කරම්හයි සිතූ දිනයෙන්, දෙවන දිනයෙහි; ගන්ත්වා, ගොස්; රාජද්වාරෙ රජවාරය සමීපයෙහි; අට්ඨංසු, සිටියාහුය; අජාතසත්තුරාජා, අජසත්

කිච්චං පටිපුච්ඡි, ථෙරා අට්ඨාරසමහාවිහාරපටිසඞ්ඛරණත්ථාය හත්ථකම්මං පටිවෙදෙසුං, සාධු භන්තෙති රාජා හත්ථකම්මකාරකෙ මනුස්සෙ අදාසි, ථෙරා පඨමං මාසං සබ්බවිහාරෙපටිසඞ්ඛාරාපෙත්වා රඤ්ඤො ආරොචෙසුං "නිට්ඨිතං මහාරාජ විහාරපටිසඞ්ඛරණං, ඉදානි ධම්මවිනයසඞ්ගහං කරොමා"ති.

සාධු භන්තෙ විස්සත්ථා කරොථ. මය්හං ආණාචක්කං, තුම්හාකං ධම්මචක්කං හොතු, ආණාපෙථ මෙ භන්තෙ කිං කරොමීති ධම්මසඞ්ගහං කරොන්තානං භික්ඛූනං සන්නිසජ්ජට්ඨානං මහාරාජාති. කත්ථ කරොමි භන්තෙති. "වෙභාරපබ්බතපස්සෙ සත්තපණ්ණිගුහාද්වාරෙ කාතුං යුත්තං මහාරාජාති."

සාධු භන්තෙති ඛො රාජා අජාතසත්තු විස්සකම්මුනා නිම්මිත සදිසං සුවිභත්තභිත්තිථම්භසොපානං නානාවිධ මාලාකම්ම ලතාකම්ම

---

රජතෙම; ආගන්ත්වා, අවුත්; වන්දිත්වා, වැඳ; භන්තෙ, වහන්ස; කිං, කුමක්හෙයින්; ආගතත්ථාති, ආවාහුදැයි; අත්තනා, තමා විසින්; කාතබ්බකිච්චං, කටයුතු කෘත්‍යය; පටිපුච්ඡි, පුළුවුත්හ; ථෙරො, තෙරහු; අට්ඨාරසමහාවිහාරපටිසඞ්ඛරණත්ථාය, අටළොස් මහාවිහාරයන් අලුත්කිරීම පිණිස; හත්ථකම්මං, හස්තකර්මාන්තය; පටිවෙදෙසුං, පිළිදැන්වූහු; රාජා, රජතෙමේ; සාධු භන්තෙති, මැනව වහන්සැයි (කියා ; හත්ථකම්මකාරකෙ මනුස්සෙ, හස්තකර්මාන්ත කරණ මිනිසුන්; අදාසි, දුන්නේය; ථෙරා, තෙරහු; පඨමං මාසං, ප්‍රථම මාසයෙහි; සබ්බවිහාරෙ, සියලු විහාරයන්; පටිසඞ්ඛාරාපෙත්වා අලුත්කරවා; මහාරාජ, මහරජ; විහාරපටිසඞ්ඛරණං, විහාර අළුත්කිරිම; නිට්ඨිතං, නිමාවට ගියේය; ඉදානි දැන්; ධම්මවිනයසඞ්ගහං කරොමාති, ධර්මවිනය සඞ්ගායනා කරම්හයි; රඤ්ඤො, රදහට; ආරොචෙසුං, සැළකළෝ.

සාධු භන්තෙ, මැනව වහන්ස; විස්සත්ථා, නිරාශඞ්ක සිත් ඇතිව; කරොථ, කළමැනව; මය්හං, මාගේ; ආණාචක්කං, (අප්‍රතිහත වෘත්තියෙන් පවත්නා අණියෙන්) චක්‍රයයි නම්ලද අණ; තුම්හාකං, තුඹ වහන්සේලාගේ; ධම්මචක්කං, ධර්මචක්‍රය; හොතු, වේවා; භන්තෙ, වහන්ස; මෙ, මට; ආණාපෙථ, අණකළමැනව; කිං කරොමි ඉති, කුමක්කෙරෙම්දැයි; මහාරාජ, මහරජ; ධම්මසඞ්ගහං කරොන්තානං භික්ඛූනං, ධර්මසඞ්ගායනා කරණ භික්ෂූන්ට; සන්නිසජ්ජට්ඨානන්ති, රැස්ව හිඳිනට තැනෙක්යයි; භන්තෙ, වහන්ස; කත්ථ කරොමි ඉති, කොතැන්හි කෙරෙම්දැයි; මහාරාජ, මහරද; වෙභාරපබ්බතපස්සෙ, වෙභාරපර්වත පාර්ශ්වයෙහිවූ; සත්තපණ්ණිගුහාද්වාරෙ, සප්තපර්ණිගුහා ද්වාරයෙහි; කාතුං යුත්තන්ති, කරන්ට යුතුයයි (දැන්වූවාහුය.)

අජාතසත්තුරාජා, අජාසත් රජතෙමේ; සාධුභන්තෙති ඛො, මැනව වහන්සැයි කියා; විස්සකම්මුනා, විස්කම් දෙව්පුත්හු විසින්;

විචිත්තං අභිභවන්තමිව රාජභවනවිභූතිං අපහසන්තමිව දෙවවිමාන
සිරිං සිරියා නිකෙතමිව එකතිපාතතිත්ථමිව ච දෙවමනුස්සනයන
විහඞ්ගානං ලොකරාමණෙය්‍යකමිව සම්පිණ්ඩිතං දට්ඨබ්බසාරමණ්ඩං
මණ්ඩපං කාරාපෙත්වා විවිධකුසුමදාමොලම්බකවිනිග්ගලන්තචාරුවිතානං
රතනවිචිත්තමණිකොට්ටිමතලමිව ච නං නානාපුප්ඵූපහාරවිචිත්තසුපරි
නිට්ඨිතභූමිකම්මං බ්‍රහ්මවිමානසදිසං අලඞ්කරිත්වා තස්මිං මහාමණ්ඩපෙ
පඤ්චසතානං භික්ඛූනං අනග්ඝානි පඤ්චකප්පියපච්චත්ථරණසතානි
පඤ්ඤපෙත්වා දක්ඛිණභාගං නිස්සාය උත්තරාභිමුඛං ථෙරාසනං මණ්ඩප

---

නිම්මිත සදිසං, නිමවනලද්දක් සමානවූ; සුවිභත්තභිත්තිථම්භසොපා
නං, මොනවට විභාගකරණලද බිතුටැම්හිනි ඇති; නානාවිධමාලා
කම්මලතාකම්මවිචිත්තං, අනෙකප්‍රකාරවූ මලාකම් ලතාකම්යෙන් විසි
තුරුවූ; රාජභවනවිභූතිං, රාජභවනසම්පත්තිය; අභිභවන්තං ඉව,
මැඩපවත්වන්නක් වැනිවූ; දෙවවිමානසිරිං, දිව්‍යවිමානශ්‍රියට; අප
හසන්තං ඉව, අපහාස්‍යකරන්නක් වැනිවූ; සිරියානිකෙතං ඉව; ශ්‍රියා
වගේ විසීමට තැනක් වැනිවූ; දෙවමනුස්සනයන විහඞ්ගානං, දෙවි
මිනිසුන්ගේ නෙත්‍ර නමැති පක්ෂීන්ට; එකනිපාතන තිත්ථං ඉවච, පතන
යවන එක්තොටක් වැනිවූ; ලොකරාමණෙය්‍යකං, ලෙව්හි රමණීය
භාවය; සම්පිණ්ඩිතංවිය, මනාව පිඬුකළතැන් |වැනිවූ; (ඉදින් ලොක
යෙහි විද්‍යමාන සියලු රමණීයත්වය ගෙණවුත් එක්තැනෙක්හි රැස්
කළාක් වැනිවූයයි කියනලද්දේවෙ ) දඨබ්බසාරමණ්ඩං මණ්ඩපං කාරා
පෙත්වා, දක්නයුතුවූ සාරභූත (විශිෂ්ටතර අලඞ්කාර ඇති) මණ්ඩප
යක් කරවා; ("දඨබ්බසු සාරං= දඨබ්බසාරං, තතොපි දඨබ්බො දස්ස
නීයො සාරභූතො විසිඨතරො මණ්ඩො අලඞ්කාරො එතස්සාති=
දඨබ්බසාරමණ්ඩො, මණ්ඩං සුරියරස්මිං පාති නිවාරයතී'ති=මණ්ඩපො
තං"යි විග්‍රහයි.) විනිග්ගිලන්ත, නික්මෙන්නාක් වැනිවූ; විවිධ, අනෙක
ප්‍රකාරවූ; කුසුමදාමඔලම්බක, එල්බෙන මල්දමින් යුත්; චාරු විතානං,
යහපත් වියන ඇති; ("කුසුමදාමානි ච තානි ඔලම්බකානි චා'ති=
කුසුමදාම ඔලම්බකානි, තානි විවිධානි අනෙකප්පකාරානි විනිග්ගිලන්තං
වමෙන්තං නික්ඛාමෙන්තමිව චාරුසොභනං විතානං එත්ථා'ති= විවිධ
කුසුමදාමොලම්බකවිනිග්ගිලන්ත චාරුවිතානො, තං" යි විග්‍රහයි.)
රතනවිචිත්‍රමණිකොට්ටිම තලං ඉවච, රත්නින් විසිතුරුකොට මැණික්
ඔබනලද තලයක්ද වැනි; නානාපුප්ඵූපහාරවිචිත්‍රසුපරිනිඨිතභූමි
කම්මං, නොයෙක් පුෂ්පොපහාරයෙන් විසිතුරු කොට මොනවට
නිමවනලද භූමිකර්මාන්ත ඇතිව; නං, ඒ මණ්ඩපය; බ්‍රහ්මවිමාන
සදිසං අලඞ්කරිත්වා, බ්‍රහ්මවිමානයක් සමානව අලඞ්කාර කොට; තස්මිං
මහාමණ්ඩපෙ, ඒ මහාමණ්ඩපයෙහි; පඤ්චසතානං භික්ඛූනං පන්
සියයක් භික්ෂූන්ට; අනග්ඝානි, අනගිවූ; පඤ්චකප්පියපච්චත්ථරණ
සතානි, පන්සියයක් කැපපසතුරුණු; පඤ්ඤපෙත්වා, පණවා; දක්ඛිණ
භාගං, දක්ෂිණ භාගය ආශ්‍රයකොට; උත්තරාභිමුඛං, උතුරුදිගට;

මජ්ඣෙ පුරත්ථාභිමුඛං බුද්ධස්ස භගවතො ආසනාරහං ධම්මාසනං පඤ්ඤපෙත්වා දන්තඛචිතං බීජනිං චෙත්ථ ඨපෙත්වා භික්ඛුසඞ්ඝස්ස ආරොචාපෙසි:- "නිට්ඨිතං භන්තෙ මම කිච්චන්ති".

භික්ඛූ ආයස්මන්තං ආනන්දං ආහංසු:- "සෙව ආවුසො සන්නිපාතො ත්වඤ්ච සෙඛො සකරණීයො තෙන තෙ න යුත්තං සන්නිපාතං ගන්තුං, අප්පමත්තො හොහී"ති.

අථ ඛො ආයස්මා ආනන්දො සෙව සන්නිපාතො නඛො පන මෙතං පතිරූපං ස්වාහං සෙඛො සමානො සන්නිපාතං ගච්ඡෙය්‍යන්ති බහුදෙවරත්තිං කායගතාසතියා වීතිනාමෙත්වා රත්තියා පච්චූස

---

අභිමුඛ කොට; ථෙරාසනං, තෙරුන්ට; මණ්ඩපමජ්ඣෙ, මණ්ඩපමධ්‍යයෙහි; පුරත්ථාභිමුඛං, පූර්වදිශාභිමුඛ කොට; බුද්ධස්ස භගවතො, චතුස්සත්‍යඥාන භාග්‍යවත්හට; ආසනාරහං, අස්නට සුදුසුවූ; ධම්මාසනං පඤ්ඤපෙත්වා, ධර්මාශනයක් පණවා; එත්ථ, මෙහි; දන්තඛචිතං බීජනිං ඨපෙත්වා, දන්තමය විජිනිය තබා; භන්තෙ, වහන්ස; මම කිච්චං, මාගේ කෘත්‍යය; නිට්ඨිතන්ති, නිමවනලද්දේයයි; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාහට; ආරොචාපෙසි, සැළකරවූයේය.

භික්ඛූ, භික්ෂූහු; ආයස්මන්තං ආනන්දං, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයාහට; ආහංසු, මෙසේ කිවාහුය; ආවුසො, ඇවත; සෙව, සෙට; සන්නිපාතො, සන්නිපාතය වන්නේය; ත්වංච, තෝ වනාහි; සෙඛො, ශෛක්ෂයෙක්ය; සකරණීයො, කෘත්‍ය ඇත්තෙහිය; තෙන, එහෙයින්; තෙ, තා විසින්; සන්නිපාතං ගන්තුං, සන්නිපාත ස්ථානයට යන්ට; න යුත්තං, සුදුසු නොවන්නේය; අප්පමත්තො හොහි ඉති, අප්‍රමාදවෙවයි (කියායි).

අථ ඛො, ඉක්බිත්තෙන් වනාහි; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් අනඳ තෙමේ; සෙව සන්නිපාතො, සෙට සන්නිපාතය වන්නේය; සො අහං, (හේ) මම; සෙඛොසමානො, ශෛක්ෂවූයෙම්; සන්නිපාතං ගච්ඡෙය්‍යං, සන්නිපාතස්ථානයට යෙම් නම්; මෙ, මාගේ; තං පන, ඒ ගමන වනාහි; නඛො පතිරූපන්ති, සුදුසු නොවේයයි; බහුදෙවරත්තිං, බොහෝ රාත්‍රියෙහි; කායගතාසතියා, කායගතා සතියෙන්; වීතිනාමෙත්වා, කල්යවා; රත්තියා, රාත්‍රියගේ; පච්චූසසමයං, ප්‍රාතඃකාලයෙහි;

---

තස්මිං ඛොපන සමයෙ, එසමයෙහි වනාහි; එකච්චෙ භික්ඛූ, සමහර භික්ෂූහු; ආයස්මන්තං ආනන්දං සන්ධාය, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සඳහා; එවං ආහංසු, මෙසේ කීවාහුය; ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ, මේ භික්ෂුසඞ්ඝයා විෂයෙහි; එකො භික්ඛු, එක් භික්ෂුවක් තෙමේ; විස්සගන්ධං වායන්තො, දුගඳක් හමවමින්; චරතීති, හැසිරේයයි කියායි; ථෙරො, ස්ථවිරතෙමේ; තං සුත්වා, ඒ අසා; ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ, මේ භික්ෂුසඞ්ඝයා විෂයෙහි; විස්සගන්ධං වායන්තො, දුගඳක් හමමින්; අඤ්ඤො විචරණභික්ඛු නාම, අනික් හැසිරෙණ භික්ෂුවෙක් නම්; නත්ථි, නැත්තේය, අද්ධා, ඒකාන්තයෙන්; එතෙ, මේ භික්ෂූහු; මං සන්ධාය, මා සඳහා; වදන්තීති, කියත්යයි; සංවෙගං ආපජ්ජි, සංවේගයට; පැමිණියේය;—ව්‍යාඛ්‍යායෙහි පෙනේ.

සමයං චඞ්කමා ඔරොහිත්වා විහාරං පවිසිත්වා නිපජ්ජිස්සාමීති කායං ආවජ්ජෙසි, ද්වෙ පාදා භූමිතො මුත්තා, අප්පත්තඤ්ච සීසං බිම්බොහනං, එතස්මිං, අන්තරෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි.

අයංහි ආයස්මා චඞ්කමෙන බහිවීතිනාමෙත්වා විසෙසං නිබ්බත්තෙතුමසක්කොන්තො චින්තෙසි: නනු මං භගවා එතදවොච:- "කත පුඤ්ඤොසි ත්වං ආනන්ද පධානමනුයුඤ්ජ ඛිප්පං හොහි අනාසවො"ති බුද්ධානඤ්ච කථාදොසො නාම නත්ථි, මම අච්චාරද්ධං විරියං.

තෙන මෙ චිත්තං උද්ධච්චාය සංවත්තති, හන්දාහං විරියසමතං යොජෙමී"ති චඞ්කමා ඔරොහිත්වා පාදධොවනට්ඨානෙ ඨත්වා පාදෙ ධොවිත්වා විහාරං පවිසිත්වා මඤ්චකෙ නිසීදිත්වා ථොකං විස්සමිස්සාමීති

---

චඞ්කමා ඔරොහිත්වා, සක්මනින් බැස; විහාරං පවිසිත්වා, විහාරයට ප්‍රවිෂ්ටව; නිපජ්ජිස්සාමීති, හොවින්නෙමියි; කායං ආවජ්ජෙසි, කාය එලවූයේය; ද්වෙ පාදා, දෙපාදයෝ; භූමිතොමුත්තා, බිමින් මිදුනාහුය; සීසං, හිස; බිම්බොහනං, බිම්බොහනයට හෙවත් කොට්ටයට; අප්පත්තඤ්ච, නොපැමිණියේද වේ; එතස්මිංඅන්තරෙ, මේ අතරෙහි; අනුපාදාය,(තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් කිසි ධර්මයක්) නොගෙණ; ආසවෙහි, කෙලෙසුන් කෙරෙන්; චිත්තං විමුච්චි, සිත මිදුනේය; (සිත අර්හත් මාර්ගක්ෂණයෙහි කෙලෙසුන් කෙරෙන් මිදෙමින් ගොස් අර්හත්ඵල ක්ෂණයෙහි මිදුනේය යන අදහසයි).

අයංහි, මේ වනාහි; ආයස්මා, ආයුෂ්මත් තෙමේ; චඞ්කමෙන, සක්මනින්; බහි වීතිනාමෙත්වා, පිටත කල්යවා; විසෙසං නිබ්බත්තෙතුං, විශෙෂයක් උපදවන්ට; අසක්කොන්තො, නොහැකිවෙමින්; චින්තෙසි, (මෙසේ: සිතුයේය; මං, මට; භගවා, භාග්‍යවත්තෙම; ආනන්ද, ආනන්දය; ත්වං, තෝ; කතපුඤ්ඤොසි, කරණලද කුසල් ඇත්තෙහිය; පධානමනුයුඤ්ජ, වීර්යයෙහි යෙදෙව; (අර්හත්වාධිගමය පිණිස අනුයොග කරව යන අදහසයි) ඛිප්පං, වහා; අනාසවො හොහියි, ආශ්‍රවනැතියෙක් වෙවයි; එතං මේ කාරණය; අවොච නනු, වදාළේ නොවේද; බුද්ධානංච, බුදුවරයන්ගේද; කථාදොසො නාම නත්ථි, කථාවෙහි දොෂයෙක් හෙවත් අසත්‍යයෙක් නම් නැත්තේය; මම, මා විසින්; විරියං, වීර්යය; අතිආරද්ධං, අධිකවම පටගන්නා ලද්දේය.

තෙන එයින්; මෙ චිත්තං, මාගේ සිත; උද්ධච්චාය සංවත්තති, උද්ධතභාවය පිණිස පවතී; හන්ද, එබැවින්; අහං, මම; විරියසමතං යොජෙමීති, වීර්යයාගේ සමබවයොදමියි කියායි); චඞ්කමා ඔරොහිත්වා, සක්මනින් බැස; පාදධොවනට්ඨානෙ ඨත්වා, පාදෝනා තන්හි සිට; පාදෙ ධොවිත්වා, පාද ධොවනය කොට; විහාරං පවිසිත්වා, විහාරයට ප්‍රවිෂ්ටව; මඤ්චකෙ නිසීදිත්වා, ඇඳෙහි ඉඳ; ථොකං, මදක්; විස්සමිස්සාමීති,

කායං මඤ්චකෙ උපනාමෙසි වෙ පාදා භූමිතො මුත්තා, සීසං බිම්බොහනමසම්පත්තං, එතස්මිං අන්තරෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං, චතුඉරියාපථවිරහිතං ථෙරස්ස අරහත්තං

තෙන ඉමස්මිං සාසනෙ අනිපන්නො අනිසින්නො අට්ඨිතො අචඞ්කමන්තො කො භික්ඛු අරහත්තම්පත්තොති වුත්තෙ ආනන්දත්ථෙරොති වත්තුං වට්ටති.

අථ ථෙරා භික්ඛූ දුතියදිවසෙ කතභත්තකිච්චා පත්තචීවරං පටිසාමෙත්වා ධම්මසභායං සන්නිපතිතා.

ආනන්දත්ථෙරො පන අත්තනො අරහත්තප්පත්තිං ඤාපෙතුකාමො භික්ඛූහි සද්ධිං න ගතො, භික්ඛූ යථාවුඩ්ඪං අත්තනො අත්තනො

---

විධා සන්සිඳුවන්නෙමියි; කායං, කය; මඤ්චකෙ උපනාමෙසි, ඇඳට පැමිණවූයේය; වෙපාදා, දෙපාදයෝ; භූමිතො, බිමින්; මුත්තා, මිදුනාහුය; සීසං, හිස; බිම්බොහනං අසම්පත්තං, බිම්බොහනයට හෙවත් කොට්ටයට නොපැමිණියේය; එතස්මිං අන්තරෙ, මේ අතරෙහිදී; අනුපාදාය, තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් කිසි ධර්මයක්) නොගෙණ; ආසවෙහි, කෙලෙසුන් කෙරෙන්; චිත්තං, සිත; විමුත්තං, මිදුනේය; චතුඉරියාපථ විරහිතං, සතර ඉරියව්වෙන් වෙන්ව; ථෙරස්ස, තෙරහට; අරහත්තං, රහත් බව වූයේය.

තෙන, එසින්; ඉමස්මිං සාසනෙ, මේ සස්නෙහි; අනිපන්නො, නොහෝනේ; අනිසින්නො, නොහිඳිනුයේ; අට්ඨිතො, නොසිටිනුයේ; අචඞ්කමන්තො, සක්මන් නොකරණුයේ; කො භික්ඛු, කවර නම් භික්ෂුවක් තෙමේ; අරහත්තං පත්තොති, රහත්බවට පැමිණියේදැයි; වුත්තෙ, විචාළකල්හි; ආනන්දත්ථෙරොති, අනඳතෙර තෙමේ යයි; වත්තුංවට්ටති, කියන්ට වටී.

අථ, නැවත; ථෙරා භික්ඛූ, සථවිර භික්ෂූහු; දුතියදිවසෙ, (අනඳ තෙරහු රහත් බවට පැමිණි දිනයෙන්) දෙවන දවස්හි; කතභත්තකිච්චා; කරණලද භක්තකෘත්‍යය ඇතියෝ; පත්තචීවරං පටිසාමෙත්වා, පා සිවුරු තැන්පත්කොට තබා; ධම්මසභායං, ධර්ම සභාවට; සන්නිපතිතා, (පක්ෂය සම්බන්ධ පඤ්චමීදිනයෙහි) පැමිණියාහුය.

ආනන්දත්ථෙරො පන, අනඳතෙර තෙමේ වනාහි; අත්තනො, තමාගේ; අරහත්තප්පත්තිං ඤාපෙතුකාමො, (අනඳතෙර ශෛක්ෂ බැවින් ධර්මසඞ්ගායනාවට ගන්ට සුදුසු නොවූයේද බහුශ්‍රැත බැවින් ගන්නමෝ යයි සිතා උන් තෙරුන්ට දැන් මොහු රහත්බවට පැමිණියේ යයි සොම්නස් උපදවන පිණිසද අප්‍රමාද වෙවයි දුන් අවවාදය සඵලබව දක්වන පිණිසද අනානුපනායික නොකොට අග්ගඵලය ප්‍රකාශකිරීම භාග්‍යවත්හු විසින් වර්ණිත කරණලද බැවින්ද රහත්බවට පැමිණීම) හඟවනු කැමතිව; භික්ඛූහි සද්ධිං නගතො, භික්ෂූන් සමග නොගියේය;

පත්තාසනෙ නිසිදන්තා ආනන්දත්ථෙරසස ආසනං ඨපෙත්වා නිසීන්නා, තත්‍ථ කෙහිචාපි එත මාසනං කසසා'ති වුතෙත ආනන්දසසාති, ආනන්‍දො පන කුහිං ගතො'ති? තසමිං සමයෙ ථෙරො චින්තෙසි:- ඉදානි මයහං ගමනකාලො'ති තතො අත්තනො ආනුභාවං දසෙසන්තො පඨවියං නිමුජ්ජිත්වා අත්තනො ආසනෙ යෙව අත්තානං දසෙසසි. ආකාසෙනා ගන්ත්වා නිසිදී'ති'පි එකෙ.

---

භික්ඛූ, භික්ෂූහු; යථාවුඩ්ඪං, වෑඩ පිළිවෙළ නොඉක්මවා; අත්තනො අත්තනොපත්තාසනෙ, තම තමාගේ ප්‍රාප්ත අස්නෙහි; නිසීදන්තා, හිඳිනුවෝ; ආනන්දත්ථෙරසස, අනඳතෙරහට; ආසනංඨපෙත්වා, අස්නතබා; නිසින්නා, හුන්නාහුය; තත්‍ථ එහි; කෙහිචි, කිසිවෙක්හු හෙවත් මද්ධ්‍යම භාණකයෝ වනාහි; එතං ආසනං, මේ ආසනය; කසසාති වුතෙත, කාව රෙකුවදැයි විචාළකල්හි; ආනන්දසසාති, ආනන්දයාටයයි; ආනන්‍දො පන, අනඳතෙමේ වනාහි; කුහිං, ගතොති කොතැන්හි ගියේදැයි; තසමිං සමයෙ, ඒ කාලයෙහි; ථෙරො, ආනන්දස්ථවිරතෙමේ; ඉදානි, දැන්; මයහං ගමන කාලොති, මාගේ ගමනට කලැයි; චින්තෙසි, සිතූයේය; තතො, ඉන්පසු;අත්තනො ආනුභාවං දසෙසන්තො,තමාගේ අනුභාව දක්වමින්; පඨවියං නිමුජ්ජිත්වා, පොළොවෙහි ගිලී; අත්තනො ආසනෙ යෙව, තමාගේ අස්නෙහිම; අත්තානං දසෙසසි, තමා දැක්වූයේය; එකෙ, මද්ධ්‍යම (භාණකයින්ගෙන්ම) සමහරු; ආකාසෙනාගන්ත්වා, අහසින් අවුත්; නිසීදීතිපි, හුන්නේයයිද (කියත්); (දීඝභාණකයෝ වනාහි මෙසේ කියත්:— එකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙමේ රහත්ඵලයට පැමිණ දැන් වනාහි මම ධර්‍මසඞ්ගායනාව පිණිස වන් සඞ්ඝසන්නිපාත ස්ථානයට එළඹිමටි සුදුසුයෙමියි තුටුපහටු සිත් ඇතිව සිවුර එකාංශ කොට පොරවගෙණ බන්ධනයෙන් මුක්ත තල්ඵලයක් මෙන් පාණ්ඩුකම්බලියෙක්හි තබනලද දූරහම්ණියක් මෙන් පහවූ වලා ඇති අහස්ගත පුන්සඳ මෙන් බාලාකීරශ්මියෙන් විකසනය වනලද රෙනු පිඤ්ජර ගර්භපද්මයක් මෙන් ස්ර්‍යාකාරයෙන් පිරිසිදුව බබලනලද සශ්‍රික මුහුණින් යුක්තව තමාගේ අර්හත්ඵලප්‍රාප්තිය කියන්නාක් මෙන් ආයේය, එකල්හි ඔහු දැක ආයුෂ්මත් මහකාසුප්තෙරහට මෙබඳු සිතෙක් වූයේය, එකාන්තයෙන් රහත්බවට පැමිණි ආනන්දතෙමේ ස්ර්‍යාකාරයෙන් හොබනේය, ඉදින් අප භාග්‍යවත් සර්‍වඥයන් වහන්සේ ජීවත්වූයේ වීනම් එකාන්තයෙන් අද දවස්හි "සාධු සාධු ආනන්ද" යයි කියා මුව පියුම විදහා සාධුකාර දෙන්නේය, එබැවින් මේ ආනන්දයාහට ශාස්තෘහු විසින් දියයුතු සාධුකාරනාදය මම පවත්වමියි කියා "සාධු සාධු ආනන්දයෙනි"යි කියමින් තුන්යළක් සාධුකාර නාද පැවැත්වූයේ යයි කියාසි)

එවං නිසින්නෙ තස්මිං ආයස්මන්තෙ මහාකස්සපත්ථෙරෙ භික්ඛූ ආමන්තෙසි: ආවුසො කිං පඨමං සඞ්ගායාම ධම්මං වා විනයංවාති භික්ඛූ ආහංසු: "භන්තෙ මහාකස්සප විනයො නාම බුද්ධසාසනස්ස ආයු, විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති, තස්මා පඨමං විනයං සඞ්ගායාමා"ති.

කං ධුරං කත්වාති? ආයස්මන්තං උපාලින්ති, කිං ආනන්දො නප්පහොතී'ති?, නො නප්පහොති අපිච ඛො පන සම්මාසම්බුද්ධො ධරමානොයෙව විනයපරියත්තිං නිස්සාය ආයස්මන්තං උපාලිං එතදග්ගෙ ඨපෙසි: "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං විනයධරානං යදිදං උපාලි"ති තස්මා උපාලිත්ථෙරං පුච්ඡිත්වා විනයං සඞ්ගායාමා'ති තතො ථෙරෙ විනයං පුච්ඡනත්ථාය අත්තනාව අත්තානං සම්මන්නි, උපාලිත්ථෙරොපි විස්සජ්ජනත්ථාය සම්මන්නි, තත්‍රායං පාළි:-

---

තස්මිං ආයස්මන්තෙ, ඒ ආයුෂ්මත්හු; එවං නිසින්නෙ, මෙසේ හුන්කල්හි; මහාකස්සපත්ථෙරෙ, මහකසුප්තෙරතෙමේ; භික්ඛූ, ආමන්තෙසි, භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය; ආවුසො, ඇවැත්නි; කිං, කිමෙක්ද; පඨමං, පළමුකොට; ධම්මං වා සඞ්ගායාම, ධර්මය හෝ සඞ්ගායනා කරමුද; විනයං වාති, විනය හෝ සඞ්ගායනා කරමෝදැයි විචාළේය භික්ඛූ, ⁻ ක්ෂූහු; භන්තෙ මහාකස්සප, වහන්ස මහාකාශ්‍යපය; විනයො නාම, විනය නම්; බුද්ධසාසනස්ස, බුදුසස්නට; ආයු, ආයුෂය; විනයෙ ඨිතෙ, විනය සිටි කල්හි; සාසනං, සස්න; ඨිතං හොති, සිටියේ වේ; තස්මා, එහෙයින්; පඨමං, පළමුකොට; විනයං, විනය; සඞ්ගායාමාති, •සඞ්ගායනා කරමුයයි; ආහංසු, කීවාහුය.

• කං ධුරං කත්වාති, කවරක්හු ජ්‍යෙෂ්ඨකොටදැයි; ආයස්මන්තං උපාලින්ති, ආයුෂ්මත් උපාලියයි; කිං, කිමෙක්ද; ආනන්දො, ආනන්ද තෙමේ; නප්පහොතීති, නොහැක්කේදැයි; නො නප්පහොති, නො හැක්කේ නොවෙයි; අපිච ඛො පන, එතකුදුවුවත් වනාහි; සම්මා සම්බුද්ධො ධරමානො යෙව, සම්‍යක් සම්බුදුහු ජීවමානවූයේම; විනය පරියත්තිං නිස්සාය, විනය පර්‍යාප්තිය නිසා; ආයස්මන්තං උපාලිං, ආයුෂ්මත් උපාලීහු; එතදග්ගෙ, එතදග්‍රස්ථානයෙහි; ඨපෙසි, තුබූයේය; භික්ඛවෙ මහණෙනි; මම සාවකානං, මාගේ ශ්‍රාවකාවූ; විනයධරානං භික්ඛූනං, විනයධර භික්ෂූන්ගෙන්; යො අයං උපාලි, යම් මේ උපාලි යෙක් වේද; එසො, හෙතෙමේ; අග්ගොති, අග්‍රයයි (කියායි); තස්මා, එහෙයින්; උපාලිත්ථෙරං පුච්ඡිත්වා, උපාලිතෙරහු විචාරා; විනයං සඞ්ගායාමාති, විනය සඞ්ගායනා කරම්හයි; තතො, ඉන්පසු; ථෙරෙ, මහ කසුප්තෙරතෙමේ; විනයං පුච්ඡනත්ථාය, විනය විචාරණ පිණිස; අත්තනාව, තෙමේම; අත්තානං, තමා; සම්මන්නි, සම්මත කෙළේය; උපාලිත්ථෙරොපි, උපාලිස්ථවිර තෙමේද; විස්සජ්ජනත්ථාය, විසඳිම පිණිස; සම්මන්නි, සම්මත කෙළේය; තත්‍ර, එහි; **"අථඛො ආයස්මා මහාකස්සපො සඞ්ඝං ඤාපෙසි සුණාතුමෙ ආවුසො සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡෙය්‍යං"** යි, අයංපාළි, මේ පෙළයි;

අථඛො “ආයස්මා මහාකස්සපො සඞ්ඝං ඤාපෙසි: “සුණාතු මෙ ආවුසො සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යන්ති.” ආයස්මාපි උපාලි සඞ්ඝං ඤාපෙසි: “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යන්ති” එවං අත්තනාව අත්තානං සම්මන්නිත්වා ආයස්මා උපාලි උට්ඨායාසනා එකංසං චීවරං කත්වා ථෙරෙ භික්ඛූ වන්දිත්වා ධම්මාසනෙ නිසීදි: දන්තඛචිතං වීජනිං ගහෙත්වා.

තතො ආයස්මා මහාකස්සපො ථෙරාසනෙ නිසීදිත්වා ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡි: “පඨමං ආවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති? වෙසාලියං භන්තෙති, කං ආරබ්භාති? සුදින්නං කලන්දපුත්තං ආරබ්භාති, කිස්මිං වත්ථුස්මින්ති? මෙථුනධම්මෙති ”

---

ආයස්මා උපාලිපි, ආයුෂ්මත් උපාලි තෙමේද; **“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං”** යි සඞ්ඝං ඤාපෙසි, සඞ්ඝයාට අවබොධ කෙළේය; එවං, මෙසේ; අත්තනාව, තෙමේම; අත්තානං සම්මන්නිත්වා, තමා සම්මත කොට; ආයස්මා උපාලි ආයුෂ්මත් උපාලිතෙමේ; ආසනා උට්ඨාය, හුනස්නෙන් නැගිට; චීවරං එකංසං කත්වා, සිවුර එකාංශකොට; ථෙරෙ භික්ඛූ වන්දිත්වා, ස්ථවිරභික්ෂූන් වැඳ; දන්තඛචිතවීජනිං ගහෙත්වා, දත්මුවා විජිනියගෙණ; ධම්මාසනෙ නිසීදි, ධර්මාසනයෙහි හුන්නේය. (විජිනිය ගෙණය යන මෙහි විජිනිය ගැණීම නම් ධර්මකථිකයන්ගේ ධර්මතාවයයි දතයුත්තේය, භාග්‍යවත් තෙමේද දහම් දෙසනකල්හි ධර්මකථිකයන්ගේ ධර්මතාව දක්වන පිණිසම විසිතුරු විජිනිය ශ්‍රිහස්තයට ගෙණ මුව පියුම වසා දහම් දෙසන්නේය, සියලු ලොකයාහට අලඞ්කාරවූ සශ්‍රික මුඛ චන්ද්‍රමණ්ඩලය වසන පිණිස නොවේයයි දතයුත්තේය.)

තතො, ඉන්පසු; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහකසුප් තෙමේ; ථෙරාසනෙ නිසීදිත්වා, තෙරසුන හිඳ; ආයස්මන්තං උපාලිං, ආයුෂ්මත් උපාලීහු; විනයං පුච්ඡි, විනයවිචාළේය; ආවුසො උපාලි, ඇවත උපාලිය; භගවතා, භාග්‍යවත්හු විසින්; පඨමං පාරාජිකං, ප්‍රථම පාරාජිකාව; කත්ථ, කොතැන්හිදී; පඤ්ඤත්තන්ති, පණවනලද්දේදැයි; භන්තෙ, වහන්ස; වෙසාලියන්ති, විසාලාමහනුවරෙහිදීය; කං ආරබ්භාති, කවරකහු අරභයාදැයි; සුදින්නං කලන්දපුත්තං ආරබ්භාති, සුදින්න නම් කලන්ද පුත්‍රයා අරභයායයි; කිස්මිං වත්ථුස්මින්ති, කවර වස්තුවක් නිමිත්තකොටගෙණ දැයි; මෙථුනධම්මෙති, මෙවුන්දම නිමිතියයි (කියායි.)

අථඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං උපාලිං පඨමස්ස පාරාජිකස්ස වත්ථුම්පි පුච්ඡි නිදානම්පි පුච්ඡි පුග්ගලම්පි පුච්ඡි පඤ්ඤත්තිම්පි පුච්ඡි අනුපඤ්ඤත්තිම්පි පුච්ඡි ආපත්තිම්පි පුච්ඡි අනාපත්තිම්පි පුච්ඡි, යථා ච පඨමස්ස තථා දුතියස්ස තථා තතියස්ස තථා චතුත්ථස්ස පාරාජිකස්ස වත්ථුම්පි පුච්ඡි-පෙ- අනාපත්තිම්පි පුච්ඡි, පුට්ඨො පුට්ඨො උපාලිත්ථෙරො විස්සජ්ජෙසි.

තතො ඉමානි චත්තාරි පාරාජිකානි පාරාජික කණ්ඩං නාම ඉදන්ති සඞ්ගහං ආරොපෙත්වා ඨපෙසුං, තෙරසසඞ්ඝාදිසෙසානි තෙරසකන්ති ඨපෙසුං, ද්වෙ සික්ඛාපදානි අනියතානී'ති ඨපෙසුං, තිංසසික්ඛාපදානි නිස්සග්ගිය පාචිත්තියානීති ඨපෙසුං, ද්වෙ නවුති සික්ඛාපදානි පාචිත්තියානී'ති ඨපෙසුං, චත්තාරි සික්ඛාපදානි පාටිදෙසනියානී'ති ඨපෙසුං, පඤ්චසත්තතිසික්ඛාපදානි සෙඛියානී'ති ඨපෙසුං, සත්තධම්මෙ අධිකරණසමථා'ති ඨපෙසුං.

---

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහකාසුප්තෙමේ; ආයස්මන්තං උපාලිං, ආයුෂ්මත් උපාලීහු; පඨමස්ස පාරාජිකස්ස, ප්‍රථම පාරාජිකාවගේ; වත්ථුම්පි පුච්ඡි, වස්තුවද විචාළේය; නිදානම්පි පුච්ඡි, නිදානයද විචාළේය; පුග්ගලම්පි පුච්ඡි. පුහුල්හු ද විචාළේය; පඤ්ඤත්තිම්පි පුච්ඡි, ප්‍රඥපතියද විචාළේය; අනුපඤ්ඤත්තිම්පි පුච්ඡි, අනුප්‍රඥපතියද විචාළේය; ආපත්තිම්පි පුච්ඡි, ආපත්තියද විචාළේය; අනාපත්තිම්පි පුච්ඡි, අනාපත්තියද විචාළේය; පඨමස්ස ප්‍රථම පාරාජිකාවනමා; යථා ච, යම්සේද; තථා, එසේ; දුතියස්ස, දෙවන පාරාජිකාවගේ; තථා, එසේ; තතියස්ස, තුන්වන පාරාජිකාවගේ; තථා, එසේ; චතුත්ථස්ස පාරාජිකස්ස, සතරවනපාරාජිකාවගේ; වත්ථුම්පි පුච්ඡි, වස්තුවද විචාළේය; පෙ-අනාපත්තිම්පි පුච්ඡි, අනාපත්තියද විචාළේය; පුට්ඨො පුට්ඨො, විචාරණලදුයේ විචාරණලදුයේ; උපාලිත්ථෙරො, උපාලිස්ථවිරතෙමේ; විස්සජ්ජෙසි, විසර්ජනයකෙළේය;

තතො, ඉන්පසු; ඉමානි චත්තාරිපාරාජිකානි, මේ සතර පාරාජිකාවන්; ඉදං පාරාජිකකණ්ඩං නාමාති, මේ පාරාජික කාණ්ඩයනමැයි; සඞ්ගහං ආරොපෙත්වා, සංග්‍රහවට නගා; ඨපෙසුං, තැබුවාහුය; තෙරස සඞ්ඝාදිසෙසානි, තෙළෙස්සඞ්ඝාදිශෙෂයන්; තෙරසකන්ති, තෙරසකයයි; ඨපෙසුං, තැබුවාහුය; ද්වෙ සික්ඛාපදානි, ශික්ෂාපදවයක්; අනියතානීති ඨපෙසුං, අනියතයෝයි තැබුවාහුය; තිංසසික්ඛාපදානි, ශික්ෂාපද තිසෙක්; නිස්සග්ගියපාචිත්තියානීති, නිසගි පචිතිහුයයි; ඨපෙසුං තැබුවාහුය; ද්වෙනවුති සික්ඛාපදානි, දෙයානූවක් සිකපද; පාචිත්තියානීති ඨපෙසුං, පචිතිහුයයි තැබුවාහුය; චත්තාරි සික්ඛාපදානි, ශික්ෂාපද සතරක්; පාටිදෙසනීයානීති ඨපෙසුං, පාටිදෙසනීයයෝයි තැබුවාහුය; පඤ්චසත්තතිසික්ඛාපදානි, සිකපද පන්සැත්තෑවෙක්; සෙඛියානීති ඨපෙසුං, ශෛක්ෂයෝයයි තැබුවාහුය; සත්තධම්මෙ, සප්තධර්මයන්; අධිකරණසමථාති ඨපෙසුං, අධිකරණ සමථයෝයයි තැබුවාහුය.

එවං මහාවිභඞ්ගං සඞ්ගහං ආරොපෙත්වා භික්ඛුනීවිභඞ්ගෙ අට්ඨ සික්ඛාපදානි පාරාජිකකණ්ඩං නාම ඉදන්ති ඨපෙසුං, සත්තරස සික්ඛාපදානි සත්තරසකානි ඨපෙසුං, තිංසසික්ඛාපදානි නිස්සග්ගියපාචිත්තියානී'ති ඨපෙසුං, ඡසට්ඨිසතසික්ඛාපදානි පාචිත්තියානී'ති ඨපෙසුං, අට්ඨසික්ඛාපදානි පාටිදෙසනියානී'ති ඨපෙසුං, පඤ්චසත්තති සික්ඛාපදානි සෙඛියානී'ති ඨපෙසුං, සත්තධම්මෙ අධිකරණසමථාති ඨපෙසුං,

එවං භික්ඛුනී විභඞ්ගං සඞ්ගහං ආරොපෙත්වා එතෙනෙව උපායෙන ඛන්ධකපරිවාරෙ'පි ආරොපෙසුං,

එවමෙතං සඋභතොවිභඞ්ගඛන්ධකපරිවාරං විනයපිටකං සඞ්ගහමාරූළ්හං සබ්බං මහාකස්සපත්ථෙරො පුච්ඡි, උපාලිත්ථෙරො විස්සජ්ජෙසි, පුච්ඡාවිස්සජ්ජනපරියොසානෙ පඤ්චඅරහන්තසතානි සඞ්ගහං ආරො

---

එවං, මෙසේ; මහාවිභඞ්ගං, මහාවිභඞ්ගය; සඞ්ගහං ආරොපෙත්වා, සඞ්ග්‍රහවට නඟා; භික්ඛුනීවිභඞ්ගෙ, භික්ෂුණීවිභඞ්ගයෙහි; අට්ඨසික්ඛාපදානි, සිකපද අටක්; ඉදං පාරාජිකකණ්ඩං නාමාති, මේ පාරාජිකකාණ්ඩය නමැයි; ඨපෙසුං, තැබූවාහුය; සත්තරසසික්ඛාපදානි, සතළොසක් සිකපද; සත්තරසකානි ඨපෙසුං, සප්තදශකයයි තැබූවාහුය; තිංසසික්ඛාපදානි, තිසක් සික්ෂාපද; නිස්සග්ගිය පාචිත්තියානීති. තිසඟි පචිතිහු යයි; ඨපෙසුං, තැබූවාහුය; ඡසට්ඨි සතසික්ඛාපදානි, එක්සිය සසැටක් සිකපදයෝ; පාචිත්තියානීති ඨපෙසුං, පචිතිහු යයි තැබූවාහුය; අට්ඨසික්ඛාපදානි, අටක් සිකපදයෝ; පාටිදෙසනීයානීති ඨපෙසුං, ප්‍රාතිදෙශනීයයෝයයි තැබූවාහුය; පඤ්චසත්තතිසික්ඛාපදානි, පන්සැත්තෑවක් සිකපද; සෙඛියානීති ඨපෙසුං, ශෛක්‍ෂයෝ යයි තැබූවාහුය; සත්තධම්මෙ, සතක් ධම්; අධිකරණසමථාති ඨපෙසුං, අධිකරණ සමථයෝ යයි තැබූවාහුය;

එවං, මෙසේ; භික්ඛුනීවිභඞ්ගං, භික්ෂුණීවිභඞ්ගය, සඞ්ගහං ආරොපෙත්වා; සඞ්ග්‍රහවට නඟා; එතෙනෙව උපායෙන, මෙම උපාය යෙන්; ඛන්ධකපරිවාරෙපි, ඛන්ධකපරිවාරයන් ද; ආරොපෙසුං, නැඟුවාහුය;

එවං, මෙසේ; සඞ්ගහං ආරූළ්හං, සඞ්ග්‍රහවට නැඟුවාවූ; එතං සඋභතො විභඞ්ග ඛන්ධකපරිවාරං, මේ උභතො විභඞ්ගඛන්ධකපරිවාරය සහිතවූ; සබ්බං විනයපිටකං, සියලු විනයපිටකය; මහාකස්සපත්ථෙරො, මහකසුප්තෙරතෙමේ; පුච්ඡි, විචාළේය; උපාලිත්ථෙරො, උපාලි ස්ථවිරතෙමේ; විස්සජ්ජෙසි. විසඳූයේය; පුච්ඡාවිස්සජ්ජනපරියොසානෙ, පෘච්ඡාවිසර්ජන පර්‍ය්‍යවසානයෙහි; පඤ්චඅරහන්තසතානි, පන්සියයක් රහත්හු; සඞ්ගහං ආරොපිතනයෙනෙව, සඞ්ග්‍රහවට

පිත නයෙනෙ'ව ගණසජ්ඣායමකංසු, විනයසඞ්ගහාවසානෙ උපාලි ථෙරො දන්තඛචිතං වීජනිං නික්ඛිපිත්වා ධම්මාසනා ඔරොහිත්වා බුඩ්ඪෙ භික්ඛූ වන්දිත්වා අත්තනො පත්තාසනෙ නිසීදි.

---

නැගූ නියායෙන්ම; ගණසජ්ඣායං අකංසු, ගණසජ්ඣායනාකොළෝ; විනයසඞ්ගහාවසානෙ, විනයසඞ්ග්‍රහාවශානයෙහි; උපාලිථෙරො, උපාලි ස්ථවිරතෙමේ; දන්තඛචිතවීජනිං නික්ඛිපිත්වා දන්තමය විජිනිය තබා; ධම්මාසනා ඔරොහිත්වා, ධර්මාසනයෙන් බැස; බුඩ්ඪෙ භික්ඛූ වන්දිත්වා, වෘද්ධ භික්ෂූන් වැඳ; අත්තනො පත්තාසනෙ, තමහට ප්‍රාප්ත අස්නෙහි; නිසීදි, හුන්නේය;

(කිමෙක්ද? **වත්ථුමපි සුචඤි** යනාදීන් විචාරණලද මේ ප්‍රථම පාරාජික පාළියෙහි කිසි පහකට යුත්තක් හෝ ප්‍රක්‍ෂෙප කටයුත්තක් හෝ නුවූයේය; චතුස්සත්‍යඥෙත භාග්‍යවත්හුගේ භාෂිතයෙහි පහකට යුත්තක් හෝ බහාලිය යුත්තක් හෝ නැත්තේය, සර්ඥවරයෝ වනාහි එක් ව්‍යඤ්ජනයකුදු නිරර්ථකව අධික කොට හෝ ඌනව හෝ යම් කිසි දෙශනාවක් නො කරණ සේක, ශ්‍රාවකයන්ගේද දෙව තාවන්ගේද භාෂිතයෙහි පහකටයුත්තද බහාලිය යුත්තද ඇති වන්නේය, ඒ පහකටයුත්ත ධර්මසඞ්ග්‍රාහක ස්ථවිරයෝ පහකළාහුය, බහාලිය යුත්තද මෙහි බහාලුවාහුය, මෙසේ පහකටයුත්ත පහකොට, බහාලිය යුත්ත ප්‍රක්‍ෂෙප කොට මේ ප්‍රථම පාරාජිකාවයයි තැබුවාහුය, මේ ප්‍රථම පාරාජිකාව සඞ්ග්‍රහවට නැගූකල්හි පන්සියයක් රහත්හු සඞ්ග්‍රහකරණලද නියායෙන්ම ගණසජ්ඣායනා කළාහුය. **"තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති"** යනාදීන් ඔවුන්ගේ සජ්ඣායනාරම්භකාලයෙහිම සාධුකාර දෙන්නියක් මෙන් මහාපෘථිවි තොමෝ ජලපොළොව කෙළවරකොට කම්පා වූවාය, මෙම නියායෙන්ම සෙසු පාරාජිකාවෝද සඞ්ග්‍රහවට නගා මේ පාරාජිකකාණ්ඩයයි තැබුවාහුය, මෙසේ තෙළෙස් සඞ්ඝාදිසෙසයෝද තෙරසකය යනාදිය කියා විස්සක් අධිකකොට ඇති දෙසියයක් ශික්‍ෂාපදයන් මහාවිභඞ්ග යයි කිතීනය කොට තැබුවාහුය, මහාවිභඞ්ගාවශානයෙහිද පෙරනයින්ම මහපොළොව කම්පාවූය.

(ඉන්පසු භික්‍ෂුණී විභඞ්ගයෙහි ශික්‍ෂාපද අටක් පාරාජික කාණ්ඩය නමැයි යනාදිය කියමින් තුන්සිය සතරක් සිකපද භික්‍ෂුණී විභඞ්ග යයි කිතීනය කොට මේ උභතො විභඞ්ගය නම් සුසැටක් බණවරින් යුක්තයයි තැබුවාහුය, උභතො විභඞ්ගාවශානයෙහිද උක්ත නයින්ම මහපොළොව කම්පාවූය, මෙම උපායයෙන් අසූබණවරක් පමණවූ ඛන්ධකයද පස්විසි බණවරක් පමණවූ පරිවාරයද සඞ්ග්‍රහවට නගා මේ විනය පිටකය නමැයි තැබුවාහුය, විනයපිටකය උපාලි ස්ථවිරයන් වහන්සේගේ නිශ්‍රිතයන් කියවයි කියා උපාලිස්ථවිරයන් වහන්සේට පාවාදුන්නාහුයයි මෙහි නොකියනලද විශෙෂය මෙසේ දතයුත්තේය);

විනයං සඞ්ගායිත්වා ධම්මං සඞ්ගායිතුකාමො ආයස්මා මහාකස්සපො භික්ඛූ පුච්ඡි: ධම්මං සඞ්ගායන්තෙහි කං පුග්ගලං ධුරං කත්වා ධම්මො සඞ්ගායිතබ්බො'ති. භික්ඛූ: ආනන්දත්ථෙරං ධුරං කත්වාති ආහංසු. අථඛො ආයස්මා මහාකස්සපො සඞ්ඝං ඤාපෙසි:- "සුණාතු මෙ ආවුසො සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහ ආනන්දං ධම්මං පුච්ඡෙය්‍ය"න්ති, අථඛො ආයස්මා ආනන්දො සඞ්ඝං ඤාපෙසි:- "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍ය"න්ති.

අථඛො ආයස්මා ආනන්දො උට්ඨායාසනා එකංසං චීවරං කත්වා ථෙරෙ භික්ඛූ වන්දිත්වා ධම්මාසනෙ නිසීදි, දන්තඛචිතං බීජනිං ගහෙත්වා. මහාකස්සපත්ථෙරො ආනන්දත්ථෙරං ධම්මං පුච්ඡි: බ්‍රහ්මජාලං ආවුසො ආනන්ද කත්ථ භාසිතන්ති, අන්තරාච භන්තෙ

---

(මෙසේ විනය පිටකය සඞ්ග්‍රහවට නගා සූත්‍රාන්තපිටකය සඞ්ගායනා කළාහුය; දැන් ඒ දක්වනුයේ "**විනයං සඞ්ගායිත්වා**" යනාදිය කී.) විනයං සඞ්ගායිත්වා, විනය සඞ්ගායනා කොට; ධම්මං සඞ්ගායිතුකාමො, ධර්‍මය සඞ්ගායනා කරණු කැමතිවූ; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහ කසුප්තෙමේ; ධම්මං සඞ්ගායන්තෙහි, ධර්‍මය සඞ්ගායනා කරන්නාවුන් විසින්; කං පුග්ගලං ධුරං කත්වා, කවර පුද්ගලයෙක් ජ්‍යෙෂ්ඨකොට; ධම්මො, ධර්‍මය තෙමේ; සඞ්ගායිතබ්බොති, සඞ්ගායනා කටයුත්තේදැයි; භික්ඛූපුච්ඡි, භික්ෂූන් විචාළේය; භික්ඛූ, භික්ෂූහු; ආනන්දත්ථෙරං ධුරං කත්වාති, අනඳතෙරහු ජ්‍යෙෂ්ඨකොටයයි; ආහංසු කීවාහුය; අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා, මහාකස්සපො, ආයුෂ්මත් මහකසුප්තෙමේ; **(සුණාතු මෙ ආවුසො සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං යි)** සඞ්ඝං ඤාපෙසි, සඞ්ඝයාට දැන්වූයේය; අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා, ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ; **(සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍යං යි)** සඞ්ඝං ඤාපෙසි, සඞ්ඝයාට දැන්වූයේය;

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ; ආසනා උට්ඨාය, හුනස්නෙන් නැගිට; චීවරං එකංසං කත්වා, සිවුර ඒකාංශකොට; ථෙරෙ භික්ඛූ වන්දිත්වා, ස්ථවිර භික්ෂූන් වැඳ; දන්තඛචිතංබීජනිං ගහෙත්වා, දත්මුවා විජිනිය ගෙණ; ධම්මාසනෙ නිසීදි, ධර්‍මාසනයෙහි හුන්නේය; මහාකස්සපත්ථෙරො, මහාකාශ්‍යප ස්ථවිරතෙමේ; ආවුසො ආනන්ද, ඇවත ආනන්දය; බ්‍රහ්මජාලං බ්‍රහ්ම ජාලය; කත්ථ, කොතැන්හිදී; භාසිතන්ති, වදාරණලද්දේදැයි; ආනන්දත්ථෙරං, අනඳතෙරහු; ධම්මංපුච්ඡි, ධර්‍මය විචාළේය; භන්තෙ, වහන්ස;

රාජගහං අන්තරා ච නාලන්දං රාජාගාරකෙ අම්බලට්ඨිකායන්ති, කං ආරබ්භා' ති? සුප්පියඤ්ච පරිබ්බාජකං බ්‍රහ්මදත්තඤ්ච මාණවකන්ති.

අථඛෝ ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං බ්‍රහ්මජාලස්ස නිදානම්පි පුච්ඡි පුග්ගලම්පි පුච්ඡි, සාමඤ්ඤඵලං පනාවුසො ආනන්ද කත්ථ භාසිතන්ති, රාජගහෙ භන්තෙ ජීවකම්බවනෙති, කෙන සද්ධින්ති? අජාතසත්තුනා වෙදෙහිපුත්තෙන සද්ධින්ති.

අථඛෝ ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං සාමඤ්ඤඵලස්ස නිදානම්පි පුච්ඡි පුග්ගලම්පි පුච්ඡි, එතෙනෙව

---

අන්තරා ච රාජගහං, රජගහවට අතරද; අන්තරා ච නාලන්දං, නාලන්දාවට අතරද; අම්බලට්ඨිකායං, එනම් රජෝද්‍යානයෙහි; රාජාගාරකෙති, (රජහුගේ ක්‍රීඩාපිණිස කරණලද) රාජගෘහයෙහිදීයයි; කං ආරබ්භාති, කවරක්හු අරබයාදැයි; සුප්පියඤ්ච පරිබ්බාජකං, සුප්පිය නම් පරිබ්‍රාජකයාද; බ්‍රහ්මදත්තං ච මාණවකන්ති, බ්‍රහ්මදත්ත නම් තරුණ පුරුෂයාද අරබයා යයි;

අථඛෝ, ඉක්බිත්තෙන්; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහකසුප්තෙමේ, ආයස්මන්තං ආනන්දං, ආයුෂ්මත් අනඳතෙරහු; බ්‍රහ්මජාලස්ස, බ්‍රහ්මජාලයගේ; නිදානම්පිපුච්ඡි, නිදානයද විචාළේය; පුග්ගලම්පිපුච්ඡි, පුද්ගලයා ද විචාළේය; ආවුසො ආනන්ද, ඇවත ආනන්දය; සාමඤ්ඤඵලං පන, ශ්‍රාමණ්‍යඵලය වනාහි; කත්ථ භාසිතන්ති, කොතැන්හිදී වදාරණලද්දේදැයි; භන්තෙ, වහන්ස; රාජගහෙ, රජගහනුවරෙහි; ජීවකම්බවනෙති, ජීවකයාගේ අඹඋය නෙහිදීයයි; කෙනසද්ධින්ති, කවරෙකු සමගදැයි; අජාතසත්තුනා, අජාත ශත්‍රුවූ; වෙදෙහිපුත්තෙන සද්ධින්ති, වෙදෙහි නම් දේවියගේ පුත්‍රයා සමගයයි. (මේ තෙමෙ වනාහි කොසොල්රජහුගේ දුහිතෘවගේ පුත්‍රයෙක් නුවූයේය, විදෙහරජහුගේ දුහිතෘවගේ පුත්‍රයෙක් වූයේය, ඔතොමෝ වෙදසඞ්ඛ්‍යාත ඥානයෙන් යුක්තහෙයින් වෙදෙහ නම් දෙවි යයි ප්‍රකට වූවාය, "වෙදෙන ඤාණසඞ්ඛාතෙන ඊහති ඝටති වායමතී'ති= වෙදෙහි, වෙදෙහියා පුත්තො=වෙදෙහි පුත්තො තෙන"යී විග්‍රහයි). (මෙහි වනාහි පෙර මෙන් "කං ආරබ්භ"යී නොකියා "කෙනසද්ධිං" යී කුමක් හෙයින් කියනලද්දේද යත්? මේ සූත්‍රයෙහිදී රජහු විසින්ද "යථානුඛො ඉමානි පුථුසිප්පායතනානි" යනාදී කිසිආකාරයකින් කියනලද ප්‍රවෘත්ති ඇත්තේය. එහෙයින් යයි දතයුත්තේය).

අථඛෝ, ඉක්බිත්තෙන්; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහකසුප්තෙරතෙමේ; ආයස්මන්තං ආනන්දං, ආයුෂ්මත් අනඳතෙරහු; සාමඤ්ඤඵලස්ස, ශ්‍රාමණ්‍යඵලයගේ; නිදානම්පි පුච්ඡි, නිදානයද විචාළේය; පුග්ගලම්පිපුච්ඡි, පුද්ගලයාද විචාළේය; එතෙනෙව

උපායෙන පඤ්චනිකායෙ පුච්ඡි. පඤ්චනිකායා නාම: දීඝනිකායො මජ්ඣිමනිකායො සංයුත්තනිකායො අඞ්ගුත්තරනිකායො ඛුද්දක නිකායො'ති.

තත්‍ථ ඛුද්දක නිකායො නාම:- චත්තාරො නිකායෙ ඨපෙත්වා අවසෙසං බුද්ධවචනං, තත්‍ථ විනයො ආයස්මතා උපාලිත්ථෙරෙන විස්සජ්ජිතො. සෙසඛුද්දකනිකායො චත්තාරො ච නිකායා ආනන්ද ත්ථෙරෙන.

---

උපායෙන, මෙම උපායයෙන්; පඤ්චනිකායෙ, (දීඝිනිකායාදි) පස් නිකායයන්; පුච්ඡි, විචාළේය; පඤ්චනිකායා නාම, පස්නිකායයෝ නම්; දීඝනිකායො, දීඝිනිකායය; මජ්ඣිමනිකායො, මධ්‍යමනිකායය; සංයුත්තනිකායො සංයුත්තනිකායය; අඞ්ගුත්තරනිකායො, අඞ්ගුත්තර නිකායය; ඛුද්දකනිකායොති, ඛුද්දකනිකායයයි (ඛුද්දකනිකායනම් සෙසුනිකායයන් මෙන් අප්‍රකට බැවින් සෙස්ස තබා ඛුද්දක නිකාය ප්‍රකට කොට දක්වනුයේ **තත්‍ථ ඛුද්දකනිකායො නාම** යනාදිය කී).

තත්‍ථ, ඒ නිකායයන් අතුරෙන්; ඛුද්දකනිකායො නාම, ඛුද්දක නිකාය නම්; චත්තාරො නිකායෙ ඨපෙත්වා, සතරනිකාය හැර; අව සෙසං බුද්ධවචනං, සෙසු බුද්ධවචනයයි; තත්‍ථ, ඒ ඛුද්දකනිකායයෙහි; විනයො, විනයතෙම; ආයස්මතා උපාලිත්ථෙරෙන, ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් විසින්; විස්සජ්ජිතො, විසඳනලද්දේය; සෙසඛුද්දක නිකායොච, සෙසු ඛුද්දකනිකායද; චත්තාරො නිකායා ච, සතර නිකායයෝද; ආනන්දත්ථෙරෙන, ආනඳතෙරහු විසින් (විසඳන ලද්දෝය).

(මෙම උපායයෙන් පඤ්චනිකායම සඞ්ගායනා කෙළේය යන මෙහි මෙම ක්‍රමය දතයුතු; හේ කෙසේදයත්? උක්තනයින් බ්‍රහ්මජාල සූත්‍රයාගේ පෘච්ඡාවිසර්ජනාවශානයෙහි පන්සියයක් රහත්හු සජ්ඣායනා කළාහුය පූර්වෝක්ත නයින්ම පෘථිවිකම්පා වූයේය, මෙසේ බ්‍රහ්මජාලයද සඞ්ගායනා කොට ඉන්පසු "සාමඤ්ඤඵලං පන ආවුසො ආනන්ද කත්‍ථ භාසිතං" යනාදීන් පෘච්ඡාවිසර්ජනානුක්‍රමයෙන් බ්‍රහ්මජාලය සමග තෙළෙස් සූත්‍රාන්ත ධර්මයන් සඞ්ගායනා කොට මේ ශීලස්කන්ධ වර්ගය නමැයි කීර්තනය කොට තැබූවාහුය, එයට අනතුරුව මහාවර්ගය එයට අනතුරුව පාථිකවර්ගයයි මෙසේ වර්ගත්‍රයකින් ප්‍රතිමණ්ඩිතවූ සූතිස් සූත්‍රයකින් යුත් සූසැටක් පමණ බණවරින් යුත් පාළිය සඞ්ගායනා කොට මේ දීඝනිකාය නමැයි කියා ඇවත ආනන්දය තොපගේ නිශ්‍රිතයන්ට කියවයි කියා ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්ට පාවා දුන්නාහුය).

තදෙතං සබ්බම්පි බුද්ධවචනං රසවසෙන එකවිධං, ධම්මවිනය වසෙන දුවිධං, පඨමමජ්ඣිමපච්ඡිමවසෙන තිවිධං, තථා පිටකවසෙන, නිකායවසෙන පඤ්චවිධං, අඞ්ගවසෙන නවවිධං, ධම්මක්ඛන්ධවසෙන චතුරාසීතිසහස්සවිධන්ති වෙදිතබ්බං.

කථං රසවසෙන එකවිධං? යං හි භගවතා අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣිත්වා යාව අනුපාදිසෙසාය නිබ්බානධාතුයා

---

ඉන්පසු අසූවක් පමණ බණවරින් යුත් මධ්‍යම නිකාය සඞ්ගායනා කොට දම්සෙනෙවි සැරියුත් තෙරහුගේ නිශ්‍රිතයන්ට කියවයි කියා සැරියුත් තෙරහට පාවාදුන්නාහුය, ඉන්පසු බණවර සියයක් පමණ ඇති සංයුත්තනිකාය සඞ්ගායනා කොට ස්වාමීන්වහන්ස! නුඹ වහන්සේගේ නිශ්‍රිතයන්ට කියවයි කියා මහකසුප් තෙරහට පාවාදුන්නාහුය. ඉන්පසු එක්සියවිසි බණවරක් පමණ ඇති අඞ්ගුත්තර නිකාය සඞ්ගායනාකොට තොපගේ නිශ්‍රිතයන්ට කියවයි කියා අනුරුද්ධ ස්ථවිරයන්ට පාවාදුන්නාහුය. ඉන්පසු,

ධම්මසඞ්ගණී විභඞ්ගඤ්ච කථාවත්ථුඤ්ච පුග්ගලං,
ධාතුයමකපට්ඨානං අභිධම්මොති වුච්චති–සී

මෙසේ වර්ණනාකරණලද සියුම්වූ ඥනයට ගොදුරුවූ පෙළ සඞ්ගායනා කළාහුය, පූර්වෝක්ත නයින්ම පෘථිවිකම්පාවද වූයේයයි දතයුතු. මෙසේ නිමිත්ත ප්‍රයොජන කාල දෙශ කාරක කරණප්‍රකාරයෙන් ප්‍රථම මහාසඞ්ගායනාව දක්වා දැන් ව්‍යවස්ථා කරණලද ධර්මවිනය යන්හි නානාප්‍රකාර කෞශල්‍යය පිණිස එකවිධාදි ප්‍රභෙදය දක්වන්ට **තදෙතං සබ්බම්පි** යනාදිය කී.)

තදෙතං සබ්බම්පි බුද්ධවචනං, ඒ මේ සියලුම බුද්ධවචනතෙම; රසවසෙන, රසවශයෙන්; එකවිධං, එක් ප්‍රකාරයක් (වේ); ධම්මවිනය වසෙන, ධර්මවිනය වශයෙන්; දුවිධං හොති, දෙවැදෑරුම්වේ; පඨම මජ්ඣිමපච්ඡිමවසෙන, ප්‍රථමමධ්‍යමපශ්චිමවශයෙන්; තිවිධං, තුන්ප්‍රකාර (වේ); පිටකවසෙන, පිටකවශයෙන්; තථා, එසේ; (තුන්ප්‍රකාරයෙක් වේ); නිකායවසෙන, නිකායවශයෙන්; පඤ්චවිධං, පස්වැදෑරුම් (වේ); අඞ්ගවසෙන, අඞ්ගවශයෙන්; නවවිධං, නවවැදෑරුම්වේ; ධම්මක්ඛන්ධ වසෙන, ධර්මස්කන්ධවශයෙන්; චතුරාසීතිසහස්සවිධන්ති, සුවාසූදහසක් ප්‍රකාර (වේ)යයි; වෙදිතබ්බං දතයුතු;

රසවසෙන, රසවශයෙන්; එකවිධං, එක්වැදෑරුම්වූයේ; කථං, කෙසේද; යංහි, යම්කාලයෙක්හි; භගවතා, භාග්‍යවත්හු විසින්; අනුත්තරං සම්මාසම්බොධිං, (අනාවරණ ඥනපදස්ථාන මාර්ගඥනය මාර්ගඥනපදස්ථාන අනාවරණ ඥනය යන) උතුම් සම්‍යක් සම්බොධිය; අභිසම්බුජ්ඣිත්වා, මොනවට දැන; අනුපාදිසෙසාය නිබ්බානධාතුයා,

පරිනිබ්බායති, එත්ථන්තරෙ පඤ්චචත්තාළීසවස්සානි දෙවමනුස්සනාග යක්ඛාදයො අනුසාසන්තෙන පච්චවෙක්ඛන්තෙන වා වුත්තං සබ්බං තං එකරසං විමුත්තිරසමෙව හොති, එවං රසවසෙන එකවිධං. කථං ධම්ම විනයවසෙන දුවිධං? සබ්බමෙවෙතං ධම්මො ච විනයො චාති සඞ්ඛං ගච්ඡති.

තත්ථ විනයපිටකං විනයො, අවසෙසං බුද්ධවචනං ධම්මො, තෙනෙ වාහ:– "යන්නූන මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාමා"ති, "අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍ය"න්ති ච, එවං ධම්මවිනයවසෙන දුවිධං.

කථං පඨමමජ්ඣිමපච්ඡිමවසෙන තිවිධං? සබ්බමෙව හිදං පඨම බුද්ධවචනං මජ්ඣිමබුද්ධවචනං පච්ඡිමබුද්ධවචනන්ති තිප්පභෙදං හොති. තත්ථ:—

---

අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන්; යාවපරිනිබ්බායති, යම්කලෙක පිරිනිවිද; එත්ථන්තරෙ, මේ අතරෙහි; පඤ්චචත්තාළීසවස්සානි, පන් සාළිස් අවුරුද්දක් මුලුල්ලෙහි; දෙවමනුස්සනාගයක්ඛාදයො, දිව්‍ය මනුෂ්‍යනාගයක්ෂාදීහු; අනුසාසන්තෙනවා, අනුශාසනාකරන්නාවූද; පච්චවෙක්ඛන්තෙනවා, (ප්‍රවෘත්ති ධර්මය උදනාදිවශයෙන්) ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූද භාග්‍යවත්හු විසින්; වුත්තං, වදාරණලද්දවූ; තං සබ්බං, ඒ සියල්ල; එකරසං, එකරසවූ; විමුත්තිරසමෙව හොති, විමුක්තිරසයම වේ; රසවසෙන, රසවශයෙන්; එකවිධං, එක්වැදෑරුම්වූයේ; එවං, මෙසේයි; ධම්මවිනයවසෙන, ධර්මවිනය වශයෙන්; දුවිධං, දෙවැදෑරුම් වූයේ; කථං, කෙසේද; එතං සබ්බං එවච, මේ සියල්ලම; ධම්මො ච, ධර්මයද; විනයො චාති, විනයදයි; සඞ්ඛං ගච්ඡති, සඞ්ඛ්‍යාවටයේ; (කිසිසේත් අවිශෙෂයෙන් සියලුම බුද්ධවචනය කෙලෙස් හික්මවන හෙයින් විනයනම, අවවාදනුශාසනය පරිද්දෙන් පිළිපදින්නවුන් අපායපතනාදියෙන් වලක්වා දරණහෙයින් ධර්මයද වේ. මෙසේ මෙහි අභිමත ධර්මවිනය නිර්ධාරණය කරණු පිණිස "**තත්ථ විනයපිටකං**"යි ආදි කීයේ.)

තත්ථ, එහි; විනයපිටකං, විනයපිටකයතෙම; විනයො, විනය නම්වේ; අවසෙසං බුද්ධවචනං, සෙසු බුද්ධවචනයතෙම; ධම්මො, ධර්මය නම් වේ; ("යන්නූන මයං ආවුසො ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායෙය්‍යාම අහං උපාලිං විනයං පුච්ඡෙය්‍යං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං"යී ද, තෙනෙවාහ, එහෙයින්ම කී; ධම්මවිනයවසෙන, ධර්මවිනයවශයෙන්; දුවිධං, දෙවදෑරුම්වූයේ; එවං, මෙසේයි;

පඨමමජ්ඣිමපච්ඡිමවසෙන, ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන්; තිවිධං, තුන්ප්‍රකාරවූයේ; කථං, කෙසේද; ඉදං සබ්බං එවහි, මේ සියල්ලම වනාහි; පඨම බුද්ධවචනං, ප්‍රථම බුද්ධවචනය; මජ්ඣිමබුද්ධවචනං මධ්‍යම බුද්ධවචනය; පච්ඡිමබුද්ධවචනන්ති, පශ්චිම බුද්ධවචනයයි; තිප්ප භෙදං හොති, ත්‍රිප්‍රභෙද වේ; තත්ථ, එහි;

**"අනෙකජාතිසංසාරං-සන්ධාවිස්සං අනිබ්බිසං,**
**ගහකාරකං ගවෙසන්තො-දුක්ඛා ජාති පුනප්පුනං.**
**ගහකාරක දිට්ඨොසි-පුන ගෙහං න කාහසි,**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා-ගහකූටං විසඞ්ඛිතං**
**විසඞ්ඛාරගතං චිත්තං-තණ්හානං ඛයමජ්ඣගා"ති**

ඉදං පඨම බුද්ධවචනං. කෙචි- "යදා හවෙ පාතුභවන්ති ධම්මා"ති ඛන්ධකෙ උදානගාථං ආහු එසා පන පාටිපදදිවසෙ සබ්බඤ්ඤුභාවප්පත්තස්සසොමනස්සමයඤාණෙන පච්චයාකාරං පච්චවෙක්ඛන්තස්ස උප්පන්නා උදානගාථාති වෙදිතබ්බා.

---

පුනප්පුනං, නැවත නැවත; ජාති, ඉපදීම; දුක්ඛා, (ජරාදිය නිසා) දුක්වන්නීය; (එහෙයින්) ගහකාරකං ගවෙසන්තො, (දුකටම කාරණාවූ පඤ්චස්කන්ධ නැමති) ගෘහය කරණ (තෘෂ්ණා නමැති) වඩුවා සොයමින්; අනිබ්බිසං, අවිෂයව හෙවත් (ඔහු හැඳින ගැනීමට කාරණාවූ) සම්‍යක්සම්බොධිඥානය අවබොධ නොව; අනෙකජාති, නොයෙක්ජාති සඞ්ඛ්‍යාතවූ; සංසාරං සංසාරවෘත්ත යෙහි; හෙවත් ස්කන්ධපරම්පරාව මුලුල්ලෙහි; සන්ධාවිස්සං, දිවඇවිද් දෙමි. ගහකාරක (පඤ්චස්කන්ධ නැමති) ගෘහය කරන්නාවූ (තෘෂ්ණා නැමති වඩුව; දිට්ඨොසි, 'අද දවස් සර්‍වඥතාඥානය මුදුන්පැමිණීමෙන් තෝ) දක්නාලද්දෙහිය; පුන, නැවත; ගෙහං (පඤ්චස්කන්ධ නමැති මාගේ) ගෘහය; නකාහසි, කොටගත නොහැකිවන්නෙහිය;

කාරුණු කිමයත්? තෙ, තාගේ; සබ්බා ඵාසුකා භග්ගා, සියලු ගෘහසම්භාර (කෙලෙස්නමැති දඬුපත්) (ආර්‍ය්‍යමාර්ගඥානයෙන්) බිඳ දමන ලදහුය; ගහකූටං, (ආත්මභාව නමැති) ගෘහයට මුදුන්වූ (අවිද්‍යා නමැති) මඩුල්ලතෙම; විසඞ්ඛිතං, කඩා සුණුවිසුණු කරණලද්දේය; චිත්තං, (දැන් මාගේ) චිත්තයතෙම; විසඞ්ඛාරගතං, විසංස්කාරවූ නිර්‍වාණ යට පැමිණියේය; (එහෙයින්) තණ්හානං ඛයං, (සියලු) තෘෂ්ණා වන්ගේ ක්‍ෂයකිරීම්සඞ්ඛ්‍යාත රහත්බවට; අජ්ඣගාති, පැමිණියේයයි (මෙතෙහි කොළේය;)

ඉදං පඨම බුද්ධවචනං, මේ ප්‍රථම බුද්ධවචනය නම්වේ; (මේ වනාහි ධර්‍මපදභාණකයන්ගේ මතයයි.) කෙචි, කිසිවෙක්හු හෙවත් ඛන්ධකභාණකයෝ; ඛන්ධකෙ, ඛන්ධකයෙහි; යදා හවෙ පාතුභවන්ති ධම්මාති, යදා හවෙ පාතුභවන්ති ධම්මා යන; උදානගාථං ආහු, උදාන ගාථාව (ප්‍රථම බුද්ධවචනයයි) කීහු; ("යදා හවෙ පාතුභවන්ති ධම්මාති" යන මෙහි ඉති ශබ්දයතෙමේ ආද්‍යර්ථයි; එයින් "යදා හවෙපාතු භවන්ති ධම්මා ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස, අථස්ස කඞ්ඛා ව පයන්ති සබ්බා යතො පජානාති සහෙතුධම්මං" යනාදි ගාථාත්‍රය සඞ්ග්‍රහ කෙරේ.) එසා පන, මේ උදානගාථා තොමෝ වනාහි; සබ්බඤ්ඤුභාවප්පත්තස්ස, සර්‍වඥබවට පැමිණියාවූ; සොමනස්සමය ඤාණෙන, සෞමනස්‍ය සම්ප්‍රයුක්ත ඥානය කාරණකොට ගෙණ;

යම්පන පරිනිබ්බාණකාලෙ අභාසි:– "හන්ද දානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථා"ති ඉදං පච්ඡිමබුද්ධවචනං, උභින්නමන්තරෙ යං වුත්තමෙතං මජ්ඣිම බුද්ධවචනන්ති. එවං පඨමමජ්ඣිම පච්ඡිමවසෙන තිවිධං. කථං පිටක වසෙන තිවිධං? සබ්බම්පි හෙතං විනයපිටකං සුත්තන්තපිටකං අභිධම්ම පිටකන්ති තිප්පභෙදමෙව හොති, තත්ථ පඨමසඞ්ගීතියං සඞ්ගීතඤ්ච අසඞ්ගීතඤ්ච සබ්බම්පි සමොධානෙත්වා උභයානි පාතිමොක්ඛානි වෙ විභඞ්ගානි වාවීසතිඛන්ධකානි සොළසපරිවාරාති ඉදං විනයපිටකං නාම.

---

පච්චයාකාරං පච්චවෙක්ඛන්තස්ස, ප්‍රත්‍යයාකාරය ප්‍රත්‍යවෙක්ෂා කරණුවට; පාටිපදදිවසෙ, පෑළවිය දිනෙහි; උප්පන්නා, උපන්නාවූ; උදානගාථාති, උදානගාථා තොමෝයයි; වෙදිතබ්බා, දතයුත්තීය; (මෙහි වනාහි "අනෙකජාති සංසාරං" යනාදීන් දක්වනලද ගාථාවය භාග්‍යවත්හු) විසින් අනොනාජපපන වශයෙන් ප්‍රථමකොට සිතින් දෙශනාකරණලද බැවින් ධම්පදභාණකමතයද "යදා හවෙ පාතුභවන්ති ධම්මා" යනාදීන් ප්‍රකාශිත ගාථාත්‍රය මූව පියුම පොබයා පළමුකොට දෙව්මිනිස්නට වැඩ සඳහා දෙසනලද බැවින් ඛන්ධක භාණක මතයද ඔවුනොවුන්ට විරුද්ධ නොවෙයි දතයුතු.)

පරිනිබ්බාණකාලෙ, පරිනිර්වාණකාලයෙහි; භික්ඛවෙ, මහණෙනි; ඉදානි, දැන්; වො, තොපට; හන්ද, එබැවින්; ආමන්තයාමි, දන්වමි; (ඇව බොධ කරවමි යන අර්ථයි.) සඞ්ඛාරා, සංස්කාරයෝ; වයධම්මා, විනාශ ස්වභාව ඇත්තාහුය; අප්පමාදෙන, අප්‍රමාදයෙන්; සම්පාදෙථාති, සම්පාදනය කරව්යයි; යං පන, යමක් වනාහි; අභාසි, වදාළේද; ඉදං පච්ඡිම බුද්ධවචනං, මේ පශ්චිම බුද්ධවචනය නම්වේ; උභින්නමන්තරෙ, දෙකොටස අතුරෙහි; යං වුත්තං, යමක් වදාරණලද්දේද; එතං මජ්ඣිම බුද්ධ වචනං, මෙ මධ්‍යම බුද්ධවචනය නම් වේ; පඨමමජ්ඣිම පච්ඡිමවසෙන, ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන්; තිවිධං, තුන්ප්‍රකාරවූයේ; එවං, මෙසේයි; පිටකවසෙන, පිටකවශයෙන්; තිවිධං, තුන්ප්‍රකාරවූයේ; කථං, කෙසේද; එතං සබ්බම්පිහි, මේ සියල්ලම; විනයපිටකං, විනය පිටකය; සුත්තන්තපිටකං, සූත්‍රාන්තපිටකය; අභිධම්මපිටකන්ති, අභිධර්ම පිටකයයි; තිප්පභෙදං එවහොති, භෙදත්‍රයෙක්ම වේ; තත්ථ, එහි; පඨමසඞ්ගීතියං, ප්‍රථමසඞ්ගීතියෙහිදී; සඞ්ගීතඤ්ච, සඞ්ගායනා කරණ ලද්දාවූද; අසඞ්ගීතඤ්ච, සඞ්ගායනා නොකරණලද (සඞ්ගීතික්ඛන්ධක කථාවත්ථු ප්‍රකරණාදී) වූද; සබ්බම්පි සමොධානෙත්වා, සියල්ලම එක් කොට; උභයානි පාතිමොක්ඛානි, (භික්ෂු භික්ෂුණී වශයෙන්) ප්‍රාති මොක්ෂවයය; වෙ විභඞ්ගානි, භික්ෂු භික්ෂුණී වශයෙන්ම විභඞ්ගවයය; වාවීසතිඛන්ධකා, (මහාවග්ග චූලවග්ගයන්හි) ආවාවූ දෙවිසිඛන්ධකයෝය; සොළසපරිවාරාති, ෂොඩශපරිවාරයෝය යන; ඉදං, මේ; විනයපිටකං

බ්‍රහ්මජාලාදි චතුත්තිංසසුත්තන්තසඞ්ගහො දීඝනිකායො, මූලපරියාය සුත්තාදි දියඩ්ඪසතද්වෙසුත්තන්තසඞ්ගහො මජ්ඣිම නිකායො, ඔඝතරණ සුත්තාදිසත්තසුත්තසහස්සසත්තසතද්වාසට්ඨිසුත්තන්තසඞ්ගහො සංයුත්ත නිකායො චිත්තපරියාදාන සුත්තාදිනවසුත්තසහස්ස පඤ්චසතසත්ත පඤ්ඤාසසුත්තසඞ්ගහො අඞ්ගුත්තරනිකායො, ඛුද්දකපාඨ ධම්මපද උදාන ඉතිවුත්තක සුත්තනිපාත විමානවත්ථු පෙතවත්ථු ථෙරගාථා ථෙරීගාථා ජාතක නිද්දෙස පටිසම්භිදා අපදාන බුද්ධවංස චරියාපිටකවසෙන පණ්ණරසභෙදෙ ඛුද්දකනිකායො'ති, ඉදං සුත්තන්තපිටකං නාම.

---

නාම, විනයපිටකය නම් වේ; මෙහි සොළොස් පරිවාරය යනු "මේථුන ධම්මපතිසෙවන පච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තං" යනාදි නයින් කියනලද පඤ්ඤත්තිවාරය, ආපත්තිවාරය, විපත්තිවාරය, සඞ්ගහවාරය, සමුට්ඨානවාරය, අධිකරණවාරය, සමථවාරය, සමුච්චයවාරය යන අෂ්ටවාරයෝද; එයට අනතුරුව "මේථුන ධම්මපතිසෙවන පච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තං"යි මෙසේ ප්‍රත්‍ය මාත්‍ර විශෙෂයෙන් නැවත කියනලද අෂ්ටවාරයෝ යයි මේ ෂොඩශපරිවාරයන්ගේ වශයෙන් සහ භික්ඛු විභඞ්ගයෙහිද ආ සොළොස් පරිවාරයෙන්ද උපලක්ෂිත බැවින් ෂොළසපරිවාරයයි කියනු ලැබේ.)

බ්‍රහ්මජාලාදි, බ්‍රහ්මජාලසූත්‍රය ආදිකොට ඇති; චතුත්තිංසසුත්තන්ත සඞ්ගහො, සූතිස් සූත්‍රයන්ගේ සඞ්ග්‍රහය ඇත්තේ; දීඝනිකායො, දීඝ නිකාය නම් වේ; (බ්‍රහ්මජාලසුත්තාදීනි චතුත්තිංස සුත්තානි සඞ්ගය්හන්ති එත්ථ එතෙනා'ති= බ්‍රහ්මජාලසුත්තාදිචතුත්තිංසසුත්තන්තසඞ්ගහො (නො හොන්) වුත්තප්පමාණානං සුත්තානං සඞ්ගහො එතස්සා'ති බ්‍රහ්මජාලාදි චතුත්තිංසසුත්තන්තසඞ්ගහො" යි විග්‍රහයි. සෙස්සෙහිද මෙසේම දත යුත්තාහුය, මූලපරියායසුත්තාදි, මූලපරියායසූත්‍රය ආදීවූ; දියඩ්ඪ සතද්වෙසුත්තන්තසඞ්ගහො, එකසිය පණස්දෙකක් සූත්‍රයන්ගේ සඞ්ග්‍රහය ඇතියේ; මජ්ඣිමනිකායො, මධ්‍යමනිකාය නම් වේ; ඔඝතරණසුත්තාදි, ඔඝතරණසූත්‍රය ආදීවූ; සත්තසුත්තසහස්ස, සත්දහසක් සූත්‍රයන්ගේ; සත්තසතද්වාසට්ඨි සුත්ත, සත්සිය දෙසැටක් සූත්‍රයන්ගේ; සඞ්ගහො, සඞ්ග්‍රහය ඇතියේ; සංයුත්තනිකායො, සංයුත්තනිකාය නම් වේ; චිත්ත පරියාදානසුත්තාදි, චිත්තපරියාදාන සූත්‍රය ආදිකොට ඇති; නවසුත්ත සහස්ස, සූත්‍රනවදහසක් හා; පඤ්චසතසුත්ත, පන්සියයක් සූත්‍ර හා; පඤ්ඤාසසුත්තසඞ්ගහො, සූත්‍ර පණසකගේ සඞ්ග්‍රහය ඇතියේ; අඞ්ගුත්තර නිකායො, අඞ්ගුත්තරනිකාය නම් වේ; ඛුද්දකපාඨ, ඛුද්දකපාඨය; ධම්ම පද ධම්පදය; උදාන, උදානය; ඉතිවුත්තක, ඉතිවුත්තකය; සුත්තනිපාත, සූත්‍රනිපාතය; විමානවත්ථු, විමානවස්තුවය; පෙතවත්ථු, ප්‍රේතවස්තුවය; ථෙරගාථා, ථෙරගාථාය; ථෙරීගාථා ථෙරීගාථාය; ජාතක, ජාතකය; නිද්දෙස, නිර්දේශය; පටිසම්භිදා, ප්‍රතිසම්භිදාවය; අපදාන, අපදානය; බුද්ධවංස, බුද්ධවංශය; චරියාපිටකවසෙන, චර්‍ය්‍යාපිටකය යන මොවුන්ගේ වශයෙන්; පණ්ණරසභෙදෙ, පසළොස් ප්‍රභෙදයෙක් ඇතියේ; ඛුද්දක නිකායොති, ඛුද්දකනිකායයයි; ඉදං සුත්තන්තපිටකං නාම, මේ සූත්‍රාන්ත පිටකය නම් වේ.

ධම්මසඞ්ගණී විභඞ්ගො ධාතුකථා පුග්ගලපඤ්ඤත්ති කථාවත්ථු යමකං පට්ඨානන්ති ඉදං අභිධම්මපිටකං නාම. තත්ථ:-

**විවිධවිසෙසනයත්තා-විනයනතො චෙව කායවාචානං,**
**විනයත්ථවිදූහි අයං-විනයො විනයො'ති අක්ඛාතො.**

විවිධා හි එත්ථ පඤ්චවිධපාතිමොක්ඛුද්දෙස පාරාජිකාදි සත්ත ආපත්තික්ඛන්ධමාතිකා විභඞ්ගාදිප්පභෙදනයා, විසෙසභූතා ච දළ්හීකම්ම සිපිලීකරණප්පයොජනා අනුපඤ්ඤත්තිනයා, කායිකවාචසික අජ්ඣාචාරනිසෙධනතො චෙස කායං වාචඤ්ච විනෙති, තස්මා විවිධනයත්තා විසෙසනයත්තා කායවාචානඤ්ච විනයනතො විනයො'ති අක්ඛාතො. තෙනෙතමෙතස්ස වචනත්ථකොසල්ලත්ථං වුත්තං:—

---

ධම්මසඞ්ගණී, ධම්මසඞ්ගණීයය; විභඞ්ගො, විභඞ්ගය; ධාතුකථා, ධාතුකථාවය; පුග්ගලපඤ්ඤත්ති, පුද්ගලප්‍රඥප්තිය; කථාවත්ථු, කථාවස්තුවය; යමකං, යමකය; පට්ඨානන්ති, පට්ඨානයයි; ඉදං අභිධම්ම පිටකං නාම, මේ අභිධර්මපිටකය නම් වේ; තත්ථ, ඒ පිටකත්‍රයෙහි;

විවිධ, අනෙකප්‍රකාරවූ; විසෙසනයත්තා, විශෙෂනයඇති බැවින්ද; කායවාචානං, කායා වක් දෙක; විනයනතො චෙව, හික්මවන හෙයින්ද; විනයත්ථවිදූහි, විනයාර්ථ දන්නවුන් විසින්; අයං විනයො, මේ විනයතෙම; විනයොති අක්ඛාතො, විනය යයි ප්‍රකාශ කරණලද්; (විවිධ විසෙසනයත්තා යන මේ ආදි ගාථාවෙහි අර්ථය විභාගකරණ්නෙය් විවිධාහි යනාදිය කී).

විවිධාහි, අනෙකප්‍රකාර වශයෙන්; එත්ථ, මෙහි; පඤ්චවිධ පාතිමොක්ඛුද්දෙස, පඤ්චවිධ ප්‍රාතිමොක්ෂොද්දෙශය; පාරාජිකාදි සත්ත ආපත්තික්ඛන්ධ, පාරාජිකාදි සප්තආපත්තිස්කන්ධය; මාතිකාවිභඞ්ගාදිප්පභෙදනයා, මාතෘකා විභඞ්ගාදීප්‍රභෙදනය යන මෙයින්ද; විසෙසභූතා ච, විශෙෂවද; දළ්හීකම්මසිපිලීකරණප්පයොජනා, (යථාක්‍රම ලොකවද්‍ය ශික්ෂාපදයන්හි) දළ්හීකර්මයොජනයද (ප්‍රඥප්ති වද්‍ය සිකපදයන්හි) සිපිලීකරණ ප්‍රයොජනයද ඇත්තාවූ; අනුපඤ්ඤත්තිනයා;අනුප්‍රඥප්තිනයින්ද; කායිකවාචසික අජ්ඣාචාරනිසෙධනතොච, කායික වාචසික අධ්‍යාචාර වලක්වන හෙයින්ද; එස, මේ විනය තෙමේ; කායංවාචං ච විනෙති කය හා වචනය හික්මවයි; තස්මා, එහෙයින්; විවිධනයත්තා, නොයෙක් නය ඇති බැවින්ද; විසෙසනයත්තා, විශෙෂනයඇති බැවින්ද; කායවාචානඤ්චවිනයනතො, කය හා වචනය හික්මවන හෙයින්ද; විනයොති අක්ඛාතො, විනයයයි කියනලදී; තෙන, ("විවිධනයත්තා" යනාදි) ඒ හෙතුයෙන්; එතං, (විවිධ විසෙසනයත්තං" යනාදි) මේ ගාථාවචනය; එතස්ස, මේ විනයගේ; වචනත්ථ කොසල්ලත්ථං' වචනාර්ථ කෞශල්‍යය පිණිස;

**"විවිධවිසෙසනයත්තා-විනයනතො චෙව කායවාචානං,**
**විනයත්ථවිදූහි අයං-විනයො විනයො'ති අක්ඛාතො"ති.**

ඉතරම්පන :—

**අත්ථානං සූචනතො සුවුත්තතො සවනතො ච සූදනතො,**
**සුත්තාණා සුත්තසභාගතො ච සුත්තං සුත්තන්ති අක්ඛාතං.**

තංහි අත්තත්ථපරත්ථාදිභෙදෙ අත්ථෙ සූචෙති, සුවුත්තා චෙත්ථ අත්ථා වෙනෙය්‍යජ්ඣාසයානුලොමෙන වුත්තත්තා, සවති චෙතං අත්ථෙ සස්සමිව ඵලං, පසවතී'ති වුත්තං හොති; සූදති චෙතං ධෙනුවිය ඛීරං, පග්ඝරතී'ති වුත්තං හොති; සුට්ඨු ච නෙ තායති, රක්ඛතී'ති වුත්තං හොති; සුත්තසභාගඤ්චෙතං, යථාහි තච්ඡකානං සුත්තං පමාණං හොති එවමෙතම්පි විඤ්ඤූනං,

---

"විවිධ විසෙසනයත්තා විනයනතො චෙ'ව කායවාචානං,
විනයත්ථවිදූහි අයං විනයො විනයො'ති අක්ඛාතො" යි

වුත්තං, කියනලදී.

ඉතරං පන, අනික හෙවත් සූත්‍රය වනාහි; අත්ථානං සූචනතො, අර්ථයන් ප්‍රකාශකරණ හෙයින්ද; සුවුත්තතො, මොනවට කියනලද හෙයින්ද; සවණතොච, අර්ථයන් ප්‍රසවය කරණ හෙයින්ද; සූදනතො, අර්ථයන් වගුරුවන හෙයින්ද; සුත්තාණා, මොනවට රක්නා හෙයින්ද; සුත්තසභාගතො ච, සූත්‍රය හෙවත් හුය සමාන හෙයින්ද; සුත්තං, සූත්‍රයතෙම; සුත්තන්ති අක්ඛාතං, සූත්‍රයයි කියනලදී;

(දැන් "අත්ථානං සූචනතො" යනාදි ගාථාවෙහි අර්ථය පහළකරණුයේ **තංහි** යනාදිය කී.)

තං හි, ඒ වනාහි; අත්තත්ථපරත්ථාදිභෙදෙ අත්ථෙ, ආත්මාර්ථ පරාර්ථාදි ප්‍රභෙද අර්ථයන් හා (ආදි සදින් ගෘහිතව්‍ය දෘෂ්ටධාර්මික සාම්පරායික ලෞකික ලොකොත්තරාදි අර්ථයන්); සූචෙති, ප්‍රකාශ කෙරේ; එත්ථ, මෙහි; අත්ථා, අර්ථයෝ; වෙනෙය්‍යජ්ඣාසයානුලොමෙන, වෙනෙයජනාධ්‍යාසයානුලොමයෙන්; වුත්තත්තා, වදාරණලද බැවින්; සුවුත්තා ච මොනවට වදාරණලද්දාහුද වෙති; එතං, මේ සූත්‍රය තෙම; අත්ථෙ, යථොක්තාර්ථයන්; සවති ච, ප්‍රසවයද කෙරේ; සස්සං, ශස්‍යය; ඵලං ඉව, ඵලය මෙන්; පසවතීති ප්‍රසවය කෙරේයයි; වුත්තං හොති, කියන ලද්දේ වේ; එතං, මේ සූත්‍රයතෙම; සූදතිච, වැගිරවීමද කෙරේ; ධෙනු, දෙන්තොමෝ; ඛීරං විය, කිරිමෙන්; පග්ඝරතීති, වගුරුවායයි; වුත්තං, හොති; කියනලද්දේ වේ; සුට්ඨුච, මනාකොටද;නෙ, ඒ අර්ථයන්; තායති, පාලනය කෙරේ; රක්ඛතීති වුත්තං හොති, රකීයයිකියන ලද්දේවේ; එතං, මේ සූත්‍රයතෙම; සුත්තසභාගඤ්ච, හුයසමානදවේ;(සූත්‍ර සභාගතාවම දක්වනුයේ **යථාහි** යනාදිය කී.) යථා හි, යම්සේ වනාහි;

යථාච සුත්තෙන සඞ්ගහිතානි පුප්ඵානි නවිකිරීයන්ති නවිද්ධංසියන්ති එවමෙතෙන සඞ්ගහිතා අත්ථා, තෙනෙතමෙතස්ස වචනත්ථකොසල්ලත්ථං වුත්තං:—

**“අත්ථානං සූචනතො සුවුත්තතො සවනතො ච සූදනතො,**
**සුත්තාණා සුත්තසභාගතොච සුත්තං සුත්තන්ති අක්ඛාතන්ති.**

ඉතරෙ පන:-

**යං එත්ථ වුඩ්ඪිමන්තො-සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා,**
**වුත්තාධිකා ච ධම්මා-අභිධම්මො තෙන අක්ඛාතො.**

---

තච්ඡකානං, වඩුවන්ගේ; සුත්තං, කළුනූල; පමාණං හොති, (තත් අනුසාරයෙන් සස්නාහෙයින්) ප්‍රමාණවේද; එතම්පි, මේ සූත්‍රය තෙමේද; විඤ්ඤූනං, නැණැතියන්ට; එවං, එසේයි;

(යම්සේ **දැළිනූල** ගසා සංඥ කළකල්හි ගතයුත්තද හැරිය යුත්තද පැණේද. එසේම විවාදයක් උපන් කල්හි සූත්‍රය එළවූ මාත්‍රයෙක්හි මේ ගතයුතුය මේ හැරියයුතුයයි පණ්ඩිතයන්ට ප්‍රකටව වැටහෙන බැවින් මේ සූත්‍රයද නැණැතියන්ට පමණ වේය යන අර්ථයි. දැන් අනික්කාරණයකින් සූත්‍රසභාගත්වය දක්වනුයේ යථාච යනාදිය කී.)

යථා ච, යම්සේ වනාහි; සුත්තෙන සඞ්ගහිතානි පුප්ඵානි, හුයින් සඞ්ග්‍රහකරණලද; පුෂ්පයෝ; නවිකිරීයන්ති, විසිරෙණු නොලබත්ද; නවිධංසියන්ති, විධ්වංසනය වනු නොලබත්ද; එවං, එසේ, එතෙන, මේ සූත්‍රය කරණකොට ගෙණ; අත්ථා, අර්ථයෝ; සඞ්ගහිතා, සඞ්ග්‍රහ කරණලද්දාහුය; තෙන, (‘අත්ථානං සූචනතො” යනාදි) ඒ හෙතුයෙන්; එතං, (“අත්ථානං සූචනතො” යනාදි) මේ ගාථාවචනය; එතස්ස, මේ සූත්‍රයගේ; වචනත්ථකොසල්ලත්ථං, වචනාර්ථකෞශල්‍යය පිණිස:-

අත්ථානං සූචනතො සුවුත්තතො සවනතො ච සූදනතො,
සුත්තාණා සුත්තසභාගතො ච, සුත්තං සුත්තන්ති අක්ඛාතං-යී

වුත්තං, කියනලදී.

ඉතරෙ පන, අන්‍යවූ අභිධර්මිය තෙමේ වනාහි; යං, යම් හෙයකින්; එත්ථ, මේ අභිධර්මයෙහි; වුඩ්ඪිමන්තො, වෘද්ධිමත් ධර්මයෝ; සලක්ඛණා, ස්වලක්ෂණධර්මයෝ; පූජිතා පූජිතධර්මයෝ; පරිච්ඡින්නා, පරිච්ඡින්නධර්මයෝ; වුත්තාධිකා ච ධම්මා, උක්තාධිකධර්මයෝද වෙති; තෙන, එහෙයින්; අභිධම්මො අක්ඛාතො, අභිධර්මයයි කියනලදී;

අයං හි අභිසද්දො වුද්ධි සලක්ඛණ පූජිත පරිච්ඡින්නාධිකෙසු
දිස්සති. යථාහෙස "බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති" ති
ආදිසු වුඩ්ඪියං ආගතො. "යා තා රත්තියො අභිඤ්ඤාතා අභි
ලක්ඛිතා" ති ආදිසු සලක්ඛණෙ. "රාජාභිරාජා මනුජින්දො" ති ආදිසු
පූජිතෙ. 'පටිබලො විනෙතුං අභිධම්මෙ අභිවිනයෙ" ති ආදිසු
පරිච්ඡින්නෙ, අඤ්ඤමඤ්ඤසඞ්කර විරහිතෙ ධම්මෙ ච විනයෙ චා' ති
වුත්තං හොති. "අභික්කන්තෙන වණ්ණෙනා" ති ආදිසු අධිකෙ. එත්ථ ච
"රූපූපපත්තියා මග්ගං භාවෙති, මෙත්තාසහගතෙන චෙතසා එකං

---

අයං අභිසද්දො හි, මේ අභිශබ්දය තෙමේ වනාහි; වුඩ්ඪිසලක්ඛණ
පූජිත පරිච්ඡින්න අධිකෙසු දිස්සති, වෘද්ධි සවලක්ෂණ පූජිත පරිච්ඡින්න
අධික යන මේ අර්ථයන්හි පැණේ; තථාහි, එසේමැයි; එසො, මේ
අභිශබ්දය තෙමේ; මෙ, මාගේ; බාළ්හා, දැඩිවූ; දුක්ඛා වෙදනා, දුක්ඛ
වෙදනාවෝ; අභික්කමන්ති ඉති ආදිසු, වැඩෙත්ය යනාදි තන්හි;
වුඩ්ඪියං, වෘද්ධියෙහි; ආගතො, පැවැත්තේය; යා තා රත්ති
යො, යම් ඒ රාත්‍රීහු; අභිඤ්ඤාතා, ප්‍රකටයහ; අභිලක්ඛිතාති ආදිසු,
අභිලක්ෂිතයහ යනාදී තන්හි; සලක්ඛණෙ, සවලක්ෂණයෙහි (පැවැත්
තේය); මනුජින්දො, මනුජේන්ද්‍රතෙම; රාජාභි රාජාති ආදිසු, රජුන්
විසින් පිදියයුතු රජය යනාදි තන්හි; පූජිතෙ, පූජනීයාකෙරෙහි
•පැවැත්තේය; අභිධම්මෙ, (සවප්නාන්තයෙන් වන ශුක්විසර්ජය තිම්ති
අනාපත්තිභාවයෙහි පවා අකුශලචේතනාව ලැබේය යනාදීන් විනය
ප්‍රඥප්තිය පිළිබඳ සඞ්කර විරහිත) අභිධර්මයෙහි; අභිවිනයෙ, (රන් රිදී
මසුකහවණු නොපිළිගතයුතුයයි කියනුයේ විනයෙහි හික්මෙනුයේ
නම, මෙසේ පිළිගන්නාහට පචිත්තිය මෙසේ දුෂ්කෘතයයි කියනුයේ
අභිවිනයෙහි හික්මෙනුයේ නමැයි කියත්, එහෙයින් රන්රිදී
මසුකහවණු අතුරෙන් සොරසිත කරණකොටගෙණ පරසතුවූවක්
ගන්නාහට වස්තුවූ පරිද්දෙන් පරිජි තුලසි දුකුළාවන් අතුරෙන්
එක්තරා එකක්ය, භාණ්ඩාගාරික ශීර්ෂයෙන් ගන්නාහට පචිත්තිය, තමා
සඳහා ගන්නාහට නිස්සග්ගිපචිත්තිය, කෙවලව ලොලතාව කරණකොට
ගෙණ ගන්නාහට අනාමර්ශ දුෂ්කෘතය, රූපිය ඡඩ්ඩක සම්මත
ලද්දහට අනාපත්තියයි මෙසේ) සඞ්කරවිරහිත විනයෙහි; විනෙතුං,
හික්මවන්ට; පටිබලොති ආදිසු, පොහොසත්ය යනාදි තන්හි;
පරිච්ඡින්නෙ, පිරිසිඳීමෙහි . (පැවැත්තේය); අඤ්ඤමඤ්ඤසඞ්කර
විරහිතෙ අන්‍යොන්‍යසඞ්කර විරහිතවූ; ධම්මෙ ච, ධර්මයෙහිද; විනයෙ
චාති, විනයෙහි දැයි; වුත්තං හොති, කියනලද්දේවේ; අභික්කන්තෙන
වණ්ණෙනාති ආදිසු, කාන්තියෙන් අධිකවූ වර්ණයෙන්ය යනාදි තන්හි;
අධිකෙ, අධිකයෙහි (පැවැත්තේය); එත්ථ ච, මේ අභිධර්මයෙහිද; රූපූප
පත්තියා, රූපලොකොත්පත්තිය පිණිස; මග්ගං භාවෙති මාර්ගය වඩාය;
මෙත්තාසහගතෙන චෙතසා, මෛත්‍රී සහගතවූ සිතින්; එකං දිසං

දිසං ඵරිත්වා විහරති"ති ආදිනානයෙන වුඩ්ඪිමන්තො'පි ධම්මා වුත්තා. "රූපාරම්මණං වා සද්දාරම්මණං වා" ති ආදිනා නයෙන ආරම්මණාදීහි සල්ලක්ඛණීයත්තා සලක්ඛණාපි. 'සෙක්ඛා ධම්මා අසෙක්ඛා ධම්මා ලොකුත්තරා ධම්මා" ති ආදිනා නයෙන පූජිතාපි, පූජාරහා' ති අධිප්පායො. "ඵස්සො හොති වෙදනා හොතී" ති ආදිනා නයෙන සභාවපරිච්ඡින්නත්තා පරිච්ඡින්නාපි. "මහග්ගතා ධම්මා අප්පමාණා ධම්මා අනුත්තරා ධම්මා" ති ආදිනානයෙන අධිකා'පි ධම්මා වුත්තා. තෙනෙතමෙතස්ස වචනත්ථකොසල්ලත්ථං වුත්තං:-

**"යං එත්ථ වුඩ්ඪිමන්තො-සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා,**
**වුත්තාධිකා ච ධම්මා-අභිධම්මො තෙන අක්ඛාතො"ති**

යම්පනෙත්ථ අවිසිට්ඨං තං:-

---

ඵරිත්වා විහරතීති ආදිනා නයෙන, එක්දිශාවෙක්හි පතුරුවා වෙසේය යනාදි නයින්; වුඩ්ඪිමන්තාපි, (භාවනා ස්ඵරණ වෘඩියෙන්) වෘඩිමත්වූද; ධම්මා, ධර්මයෝ; වුත්තා, කියනලද්දාහුය; රූපාරම්මණං වා, රූපාරම්මණය හෝ; සද්දාරම්මණං වාති, ශබ්දාරම්මණය හෝය යන; ආදිනා නයෙන, ආදිනයින්; ආරම්මණාදීහි, අරමුණුආදීන් කරණකොට ගෙණ; සල්ලක්ඛණීයත්තා, හැඳිනිය යුතු බැවින්; සලක්ඛණාපි, සවලක්ෂණවූද; සෙක්ඛා ධම්මා, ශෛක්ෂධර්මයෝය; අසෙක්ඛා ධම්මා, අශෛක්ෂ ධර්මයෝය; ලොකුත්තරධම්මාති, ලොකොත්තර ධර්මයෝය යන; ආදිනා නයෙන, ආදි නයින්; පූජිතාපි, පුදනලද්දාහුද; පූජාරහාති, පූජාහියෝය යන; අධිප්පායො, අභිප්‍රායයි; ඵස්සො, ස්පර්ශයතෙම; හොති, වේ; වෙදනා, වෙදනාතොමෝ; හොතීති ආදිනා නයෙන වන්නිය යනාදි නයින්; සභාව පරිච්ඡින්නත්තා, (ස්පර්ශනාදි) ස්වභාව යෙන් පිරිසිඳු බැවින්; පරිච්ඡින්නාපි, පිරිසිඳියාවූම; මහග්ගතා ධම්මා, මහද්ගත ධර්මයෝය; අප්පමාණා ධම්මා, අප්‍රමාණ ධර්මයෝය; අනුත්තර ධම්මාති, අනුත්තරධර්මයෝය යන; ආදිනා නයෙන, ආදි නයින්; අධිකාපිධම්මා, අධිකවූද ධර්මයෝ; වුත්තා, කියනලද්දාහුය; තෙන, ("යං එත්ථ වුඩ්ඪිමන්තො" යනාදි) ඒ හෙතුයෙන්; එතං, (යං එත්ථ වුඩ්ඪිමන්තො" යනාදි) මේ වචනය; එතස්ස, මේ අභිධර්මයාගේ; වචනත්ථ කොසල්ලත්ථං, වචනාර්ථකෞශල්‍යය පිණිස:-

යං එත්ථ වුඩ්ඪිමන්තො සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා,
වුත්තාධිකා ච ධම්මා අභිධම්මො තෙන අක්ඛාතො-යි.

වුත්තං, කීයනලදී.

එත්ථ, අන්‍යොන්‍ය විශිෂ්ටවූ හෙවත් අසාධාරණවූ විනයාදි මේ තුන්කොටසුන් අතුරෙහි; යං පන, (සමානවූ) යමක් වනාහි; අවිසිට්ඨං, විශිෂ්ටනුවූයේද හෙවත් සාධාරණවූයේද; තං, ඒ පිටක ශබ්දය තෙම;

**පිටකං පිටකත්ථවිදූ-පරියත්තිභාජනත්ථතො ආහු,**
**තෙන සමොධානෙත්වා-තයො'පි විනයාදයො ඤෙය්‍යා.**

පරියත්තිපිහි "මා පිටකසම්පදානෙනා"ති ආදිසු පිටකන්ති වුච්චති; "අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුදාලපිටකං ආදාය" ති ආදිසු යං කිඤ්චි භාජනම්පි තස්මා:-

**"පිටකං පිටකත්ථවිදූ-පරියත්ති භාජනත්ථතො ආහු,**
**තෙන සමොධානෙත්වා-තයො'පි විනයාදයො ඤෙය්‍යා"ති.**

තෙන එවං දුවිධත්ථෙන පිටකසද්දෙන සහ සමාසං කත්වා විනයොච සො පිටකංච පරියත්තිභාවතො තස්ස තස්ස අත්ථස්ස භාජනතො චා'ති= විනයපිටකං, යථා වුත්තෙනෙව නයෙන සුත්තං ච තං පිටකං චා'ති=සුත්තපිටකං අභිධම්මො ච සො පිටකං චා'ති= අභිධම්මපිටකන්ති එවමෙතෙ තයො'පි විනයාදයො ඤෙය්‍යා. එවං ඤත්වා ච පුනපි තෙසෙව පිටකෙසු නානප්පකාරකොසල්ලත්ථං:-

---

පිටකං, පිටකශබ්දය; පිටකත්ථවිදූ, පිටකාර්ථයන් දන්නෝ; පරියත්ති භාජනත්ථතො, පර්‍ය්‍යාප්තියට භාජනය යන අර්ථයෙන් ආහු, කීහු; තෙන, ඒපිටකශබ්දයහා; සමොධානෙත්වා, එක්කොට; විනයාදයො තයොපි, විනය ආදි තුණද; ඤෙය්‍යා, දතයුත්තාහුය; පරියත්තිපිහි, පර්‍ය්‍යාප්තිතොමෝ වනාහි; මාපිටකසම්පදානෙනාති ආදිසු, පාළි සම්පද වශයෙන් නොගණිවාය යනාදි තන්හි; පිටකන්ති වුච්චති, පිටකයයි කියනුලැබේ; අථ, නැවත; පුරිසො, පුරුෂයෙක්තෙමේ; කුදාලපිටකං ආදායාති ආදිසු, උදලුලක් හා පෙට්ටියක් ගෙණය යනාදි තන්හි; යං කිඤ්චි භාජනම්පි, යම්කිසි බඳුනක්ද (කියනු ලැබේ); තස්මා, එහෙයින්:—

පිටකං පිටකත්ථවිදූ පරියත්ති භාජනත්ථතො ආහු,
තෙන සමොධානෙත්වා තයො'පි විනයාදයො ඤෙය්‍යා-යි

කීහු;

එවං, මෙසේ; දුවිධත්ථෙන, ද්විවිධාර්ථයෙන්; තෙන පිටකසද්දෙන සහ, ඒ පිටකශබ්දය සමග; සමාසං කත්වා, සමාස කොට; විනයොච, විනයවූයේද; සො, හේමය; පිටකඤ්ච, පිටකය වූයේද හේමයයි; පරියත්තිභාවතො, පර්‍ය්‍යාප්ති භාවයෙන්; තස්ස තස්ස අත්ථස්ස, ඒ ඒ අර්ථයට; භාජනතො චාති, භාජනවූ හෙයින් යයි; විනයපිටකං, විනය පිටකය නම; යථාවුත්තෙනෙව නයෙන, යථොක්තමවූ නයින්; සුත්තඤ්ච, සූත්‍රය වූයේද; තං, හේමය; පිටකං චාති, පිටකය වූයේද හේමයයි; සුත්තපිටකං, ඒ නම; අභිධම්මොච, අභිධර්මය වූයේද; සො, හේමය; පිටකං චාති, පිටකය වූයේද හේමයයි; අභිධම්මපිටකන්ති, අභිධර්මපිටකයයි; එවං, මෙසේ; එතෙ විනයාදයො තයොපි, මේ විනයාදි තුණම; ඤෙය්‍යා, දතයුත්තාහුය; එවං ඤත්වාච, මෙසේ දැනද; පුනපි, නැවතත්; තෙසු එව පිටකෙසු, එම පිටකයන්හි; නානප්පකාරකොසල්ලත්ථං, නානාප්‍රකාර කෞශල්‍යය පිණිස;

**දෙසනාසාසනකථා-භෙදං තෙසු යථාරහං,**
**සික්ඛාපහාණගම්භීර-භාවඤ්ච පරිදීපයෙ.**

**පරියත්තිභෙදං සම්පත්තිං-විපත්තිඤ්චාපි යං යහිං,**
**පාපුණාති යථා භික්ඛු-තම්පි සබ්බං විභාවයෙති.**

තත්‍රා'යං පරිදීපනා විභාවනාච: එතානි හි තීනි පිටකානි යථාක්කමං ආණාවොහාරපරමත්ථදෙසනා යථාපරාධයථානුලොම යථාධම්මසාසනානි සංවරාසංවරදිට්ඨිවිනිවෙඨන නාමරූපපරිච්ඡෙදකථාතිච වුච්චන්ති. එත්ථහි විනයපිටකං ආණාරහෙන භගවතා ආණාබාහුල්ල . තා දෙසිතත්තා ආණාදෙසනා. සුත්තපිටකං වොහාරකුසලෙන භගවතා වොහාරබාහුල්ලතො දෙසිතත්තා වොහාරදෙසනා. අභිධම්මපිටකං පරමත්ථකුසලෙන භගවතා පරමත්ථ බාහුල්ලතො දෙසිතත්තා පරමත්ථ

---

තෙසු; ඒ පිටකයන් අතුරෙහි; දෙසනා (භෙදං), දෙශනානානත්වයද; සාසන(භෙදං,) සාසනනානත්වයද; කථාභෙදං, කථා නානත්ව යද යන; සික්ඛා, ශික්ෂාවන්ද; පහාණ, ප්‍රහාණයන්ද; ගම්භිරභාව [illegible], ගැඹුරුබවද; යථාරහං, සුදුසු පරිද්දෙන්; පරිදීපයෙ, දක්වම්.

යහිං, යම් විනයාදියෙක්හි; පරියත්තිභෙදං, පය්‍ර්‍යාප්තිය පුහුණු කාරණ භෙදයකටද; සම්පත්තිං, සම්පත්තියකටද; විපත්තිඤ්ච, විපත්තිය කටද යන; යං, යමකට; අපි, නැවත; භික්ඛු, මහණතෙමේ; යථා, පාපුණාති, යම්සේ පැමිණේද; තං සබ්බම්පි, ඒ සියල්ලද; විභාවයෙ, දක්වම්;

තත්‍ර, එහි; අයං පරිදීපනා, මේ පරිදීපනයද; විභාවනා ච, විභාවනයද වන්නීය; එතානි තීනි පිටකානි හි, මේ තුන්පිටකය වනාහි; යථාක්කමං, පිළිවෙළින්; ආණාවොහාරපරමත්ථදෙසනා, ආඥාව්‍යවහාර පරමාර්ථදෙශනාවෝය; යථාපරාධයථානුලොමයථාධම්ම සාසනානි, යථාපරාධයථානුලොම , යථාධර්මශාසනයෝය; සංවරාසංවරදිට්ඨිවිනි වෙඨනනාමරූපපරිච්ඡෙද කථාතිච, සංවරාසංවර දෘෂ්ටිවිනිවේඨනනාම රූපපරිච්ඡෙදකථාවෝයයි; වුච්චන්ති, කියනුලැබෙත්; එත්ථ හි, මෙහි වනාහි; විනයපිටකං, විනයපිටකයතෙම; ආණාරහෙන, ආණාහිමිවූ හෙවත් ඇණවීමට සුදුසුවූ; භගවතා, භාග්‍යවත්හු විසින්; ආණා බාහුල්ලතො දෙසිතත්තා, ආණාබාහුල්‍යයෙන් දෙසනලද බැවින්; ආණාදෙසනා, ආණාදෙශනාවය; සුත්තපිටකං, සූත්‍රපිටකය; වොහාර කුසලෙන, ව්‍යවහාරයෙහි දක්‍ෂවූ; භගවතා, භාග්‍යවත්හු විසින්; වොහාරබාහුල්ලතො දෙසිතත්තා, ව්‍යවහාරබාහුල්‍යයෙන් දෙසනලද බැවින්; වොහාරදෙසනා, ව්‍යවහාරදෙශනාවය; අභිධම්මපිටකං, අභිධර්මපිටකය තෙම; පරමත්ථකුසලෙන, පරමාර්ථයෙහි දක්‍ෂවූ; භගවතා භාග්‍යවත්හු විසින්; පරමත්ථබාහුල්ලතො දෙසිතත්තා, පරමාර්ථ බාහුල්‍යයෙන් දෙශනාකරණලද බැවින්; පරමත්ථදෙසනාති වුච්චති,

දෙසනාති වුච්චති. තථා පඨමං යෙ තෙ පචුරපරාධා සත්තා තෙ යථාපරාධං එත්ථ සාසිතා'ති යථාපරාධ සාසනං, දුතියං අනෙකජ්ඣා සයානුසයචරිතාධිමුත්තිකා සත්තා යථානුලොමං එත්ථ සාසිතා'ති යථානුලොමසාසනං, තතියං ධම්මපුඤ්ජමත්තෙ අහං මමා'ති සඤ්ඤිනො, සත්තා යථාධම්මං එත්ථ සාසිතාති යථාධම්මසාසනන්ති වුච්චති. තථා පඨමං අජ්ඣාචාරපටිපක්ඛභූතො සංවරාසංවරො එත්ථ කථිතොති සංවරාසංවරකථා, දුතියං වාසඞ්දිට්ඨි පටිපක්ඛභූතා දිට්ඨිවිනිවෙඨනා එත්ථ කථිතා'ති දිට්ඨිවිනිවෙඨනකථා, තතියං රාගාදිපටිපක්ඛභූතො නාමරූපපරිච්ඡෙදො එත්ථ කථිතො'ති නාමරූපපරිච්ඡෙද කථා'ති වුච්චති.

---

පරමාර්ථදෙශනාවයයි කියනුලබා; තථා, එසේ; පඨමං, ප්‍රථමවූ විනය පිටකයතෙම; යෙ තෙ පචුරපරාධා සත්තා, (සෙය්‍යසක සච්චිරාදී) යම් ඒ දෙෂබහුල සත්ත්වයෝ වෙත්ද; ("පචුරො බහුකො බහුලො අපරාධො දොසො වීතික්කමො යෙසං තෙ=පචුරපරාධා"යි විග්‍රහයි.) තෙ එව්හු; යථාපරාධං, අපරාධවූ පරිද්දෙන්; එත්ථ, මේ විනය පිටකයෙහි ලා; සාසිතාති, අනුශාසනා කරණලද්දහුයයි; යථාපරාධ සාසනං, යථාපරාධශාසනය; දුතියං, දෙවනවූ සූත්‍රපිටකයතෙම; අනෙක, නොයෙක්; අජ්ඣාසයානුසයචරිතාධිමුත්තිකා සත්තා, ආසයය අනුශයය චරිතය අධිමුක්තිය යන මෙහි තියුක්තසත්ත්වයෝ; යථානු ලොමං, අනුලොම්වූ පරිද්දෙන්; එත්ථ, මේ සූත්‍රපිටකයෙහිලා; සාසිතාති, අවවාදකරණලද්දහුයයි; යථානුලොමසාසනං, යථානුලොමශාසනය; තතියං, තුන්වනුවූ අභිධර්මපිටකය තෙමේ; ධම්මපුඤ්ජමත්තෙ, ධර්ම සමූහ මාත්‍රයෙහි; අහං මමාති සඤ්ඤිනො,(දෘෂ්ටිමානතෘෂ්ණා වශයෙන්) මමය මාගේයයි සංඥා ඇත්තාවූ; සත්තා, (යම් ඒ) සත්ත්වයෝ වෙත්ද ඔව්හු; යථා ධම්මං, ධර්මස්වභාවයට අනුරූප පරිද්දෙන්; එත්ථ, මේ අභිධර්මපිටකයෙහි ලා; සාසිතාති, අනුශාසනාකරණ ලද්දහුයයි; යථා ධම්මසාසනන්ති, යථාධර්මශාසනයයි; වුච්චති, කියනුලැබේ; තථා, එසේ; පඨමං, ප්‍රථමවූ විනයපිටකය තෙම; අජ්ඣාචාරපටිපක්ඛභූතො, අද්‍යා චාර සඞ්ඛ්‍යාත ව්‍යතික්‍රමයට ප්‍රතිපක්ෂවූ; සංවරා සංවරො, කුඩා මහත් සංවරයතෙම; එත්ථ, මේ විනයපිටකයෙහි ලා; කථිතොති, කියන ලද්දේයයි; සංවරාසංවරකථා, සංවරාසංවර කථාවය; දුතියං, දෙවනවූ සූත්‍රපිටකය තෙම;වාසඞ්දිට්ඨිපටිපක්ඛභූතා,දෙසැටදෘෂ්ටියට ප්‍රතිපක්ෂවූ; දිඪිවිනිවෙඨනා, දෘෂ්ටිමුක්තිතොමෝ; එත්ථ, මේ සූත්‍රපිටකයෙහි ලා; කථිතාති, කියන ලදුයයි; දිට්ඨිවිනිවෙඨනකථා, දෘෂ්ටිවිනිවේඨනකථාය; තතියං, තුන්වනුවූ අභිධර්මපිටකය තෙම; රාගාදිපටිපක්ඛභූතො, රාගා දීන්ට ප්‍රතිපක්ෂවූ; නාමරූපපරිච්ඡෙදො, නාමරූපපරිච්ඡෙදය තෙම; එත්ථ, මේ අභිධර්මපිටකයෙහි ලා; කථිතොති, වදාරණ ලද්දේයයි; නාම රූපපරිච්ඡෙද කථාවයයි; වුච්චති, කියනුලබ.

තිසු පිච එතෙසු තිසෙසා සික්ඛා තීනි පහානානි චතුබ්බිධො ච ගම්භීරභාවො වෙදිතබ්බො. තථාහි විනයපිටකෙ විසෙසෙන අධිසීල සික්ඛා වුත්තා, සුත්තපිටකෙ අධිචිත්තසික්ඛා, අභිධම්මපිටකෙ අධිපඤ්ඤ සික්ඛා. විනයපිටකෙ ච වීතික්කමප්පහානං කිලෙසානං වීතික්කමපටිපක්ඛත්තා සීලස්ස, සුත්තපිටකෙපරියුට්ඨානප්පහානං පරියුට්ඨානපටිපක්ඛත්තා සමාධිස්ස, අභිධම්මපිටකෙ අනුසයප්පහානං අනුසයපටිපක්ඛත්තා පඤ්ඤාය, පඨමෙ ච තදඞ්ගප්පහානං කිලෙසානං, ඉතරෙසු වික්ඛම්භනසමුච්ඡෙදප්පහානානි. පඨමෙ ච දුච්චරිත සංකිලෙසස්ස පහානං, ඉතරෙසු තණ්හාදිට්ඨිසඞ්කිලෙසානං. එකමෙකස්මිඤ්චෙත්ථ චතුබ්බිධො'පි ධම්මත්ථ දෙසනා පටිවෙධගම්භීරභාවො වෙදිතබ්බො.

---

එතෙසු තිසු, මේ පිටකත්‍රයෙහි; අපිච, අතිකතුදු ඇත්තේය; තිසෙසා සික්ඛා, ත්‍රිවිධ ශික්ෂාවෝද; තීනි පහානානි, ත්‍රිවිධ ප්‍රහාණයෝද; චතුබ්බිධො ගම්භීරභාවො ච, චතුර්විධ ගම්භීරභාවයද; වෙදිතබ්බො, දතයුත්තේය; තථාහි, එසේමැයි; විනයපිටකෙ, විනයපිටකයෙහි; විසෙසෙන, වෙසෙසින්; අධිසීලසික්ඛා, අධිශීලශික්ෂාතොමෝ; සුත්තපිටකෙ, සූත්‍රපිටකයෙහි; අධිචිත්තසික්ඛා, අධිචිත්තශික්ෂාතොමෝ; අභිධම්මපිටකෙ, අභිධර්මපිටකයෙහි;අධිපඤ්ඤසික්ඛා, අධිප්‍රඥශික්ෂාතොමෝ; වුත්තා, වදාරණලදු; විනයපිටකෙ ච, විනයපිටකයෙහි; සීලස්ස, ශීලය; වීතික්කමපටිපක්ඛත්තා, ව්‍යතික්‍රමප්‍රතිපක්ෂ බැවින්; කිලෙසානං, සංක්ලෙශ ධර්මයන්ගේ (කායවචීචාරයෙන් යම් ව්‍යතික්‍රමයෙක් ඇත්තේද);වීතික්කමප්පහානං, (ඒ) ව්‍යතික්‍රමයන්ගේ ප්‍රහාණය; (කියනලදී); සුත්තපිටකෙ සූත්‍රපිටකයෙහි; සමාධිස්ස, සමාධිය; පරියුට්ඨානපටික්ඛත්තා, සිතෙහි කුශලප්‍රවෘත්තිය මැඬ පවත්වා සිටීම ප්‍රතිපක්ෂ බැවින්; පරියුට්ඨානප්පහානං, (චිත්තසන්තානයෙහි උත්පත්ති වශයෙන් පැවති කෙලසුන්ගේ) පරියුට්ඨානප්‍රහාණය (කියනලදී); අභිධම්මපිටකෙ, අභිධර්මපිටකයෙහි; පඤ්ඤාය, ප්‍රඥාව; අනුසයපටිපක්ඛත්තා (කාමරාගාදි) සන්තානුශය ප්‍රතිපක්ෂ බැවින්; අනුසයප්පහානං, සන්තානුශයාගේ ප්‍රහාණය (කියනලදී); පඨමෙ, ප්‍රථමවූ විනයපිටකයෙහි; කිලෙසානං, කෙලෙසුන්ගේ; තදඞ්ගප්පහානං, ඒ ඒ අකුශලාඞ්ගයන්ගේ ප්‍රහාණය (කියනලදී); ඉතරෙසු, (සූත්‍රාභිධර්මසඞ්ඛ්‍යාත) අනික්පිටකදෙකෙහි; වික්ඛම්භනසමුච්ඡෙදප්පහානානි, විෂ්කම්භණප්‍රහාණ සමුච්ඡේදප්‍රහාණයෝ (කියනලදහු) පඨමෙච, ප්‍රථමවිනයපිටකයෙහි;දුච්චරිතසඞ්කිලෙසස්ස පහානං, දුශ්චරිත සංක්ලෙශ ප්‍රහාණය (කියනලදී); ඉතරෙසු, අනික්පිටකදෙක්හි; තණ්හාදිට්ඨිසංකිලෙසානං, තෘෂ්ණාදෘෂ්ටිසංක්ලෙශයන්ගේ ප්‍රහාණය(කියනලදී) එත්ථ ච එකමෙකස්මිං, මේ පිටකත්‍රය අතුරෙන් එක් එක පිටකයෙක්හිද; අපි, නැවත; චතුබ්බිධො, සතර වැදෑරුම්වූ; ධම්මත්ථදෙසනාපටිවෙධ ගම්භීරභාවො, ධර්මාර්ථදෙශනාප්‍රතිවෙධගම්භීරභාවයතෙම; වෙදිතබ්බො, දතයුත්තේය;

තත්‍ථ ධම්මොති පාළි; අත්‍ථොති තස්සායෙව අත්‍ථො.; දෙසනාති තස්සා මනසා වවත්‍ථාපිතාය පාළියා දෙසනා; පටිවෙධොති පාළියා පාළිඅත්‍ථස්ස ච යථාභූතාවබොධො තීසුපි චෙතෙසු එතෙ ධම්මත්‍ථදෙසනාපටිවෙධා යස්මා සසාදීහි විය මහාසමුද්දො මන්දබුද්ධීහි දුක්ඛොගාහා අලබ්භනෙය්‍යපතිට්ඨා ච, තස්මා ගම්භීරා එවං එකමෙකස්මිං එත්‍ථ චතුබ්බිධොපි ගම්භීරභාවො වෙදිතබ්බො.

අපරො නයො:- ධම්මොති හෙතු- වුත්තං හෙතං:- "හෙතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා" ති. අත්‍ථොති හෙතුඵලං, වුත්තං හෙතං:- "හෙතුඵලෙ ඤාණං අත්‍ථපටිසම්භිදා"ති. දෙසනාති පඤ්ඤත්ති, යථා ධම්මං ධම්මාභිලාපොති අධිප්පායො. පටිවෙධොති අභිසමයො; සො ච

---

තත්‍ථ, එහි; ධම්මොති, ධර්‍මය නම්; පාළි, (පර්‍ය්‍යාප්තිධර්‍ම) පාළියයි; අත්‍ථොති, අර්‍ථය නම්; තස්සායෙව අත්‍ථො, ඒ පර්‍ය්‍යාප්තිධර්‍ම පාලියගේම අර්‍ථයයි; දෙසනාති, දෙශනාව නම්; මනසා වවත්‍ථාපිතාය, (භාග්‍යවත්හු විසින් සිතින් ව්‍යවස්ථා කරණලද්දාවූ; තස්සාපාළියා, ඒ පාළියගේ; දෙසනා, දෙශනාතොමෝය; පටිවෙධොති, ප්‍රතිවෙධය නම්; පාළියා, පෙළෙහිද; පාළිඅත්‍ථස්ස ච, පාලිඅර්‍ථයාගේද; යථාභූතාවබොධො, ස්වභාවාවබොධයයි; එතෙසු තීසු පිච, මේ පිටකත්‍රයයන්හිද; එතෙ ධම්මත්‍ථදෙසනාපටිවෙධා, මේ ධර්‍මාර්‍ථදෙශනා ප්‍රතිවෙධයෝ; යස්මා, යම්හෙයකින්; මහාසමුද්දො, මහාසමුද්‍රයතෙම; සසාදීහි විය, සසාදීන් විසින් මෙන්; මන්දබුද්ධීහි, (ප්‍රඥපටුත්වයක් නැත්තාවූ) මන්ද බුද්ධීන් විසින්; දුක්ඛොගාහා, දුකසේ බැසගතහැක්කාහ; අලබ්භනෙය්‍යපතිට්ඨා ච, නොලැබියහැකි පිහිටද ඇත්තාහුය; තස්මා, එහෙයින්; ගම්භීරා, ගැඹුරුහ; එවං, මෙසේ; එත්‍ථ, මේ තුන්පිටකයෙහි; එකමෙකස්මිං, එකඑක පිටකයෙක්හි; චතුබ්බිධොපි ගම්භීරභාවො, සතර වැදෑරුම්වූ ගම්භීරභාවයතෙමේ; වෙදිතබ්බො, දතයුත්තේය;

අපරො නයො, අනික්ක්‍රමයෙක් කියනු ලැබේ; ධම්මොති, ධර්‍මය නම්; හෙතු, හෙතුවය; හෙතුම්හි ඤාණං ධම්මපටිසම්භිදාති, හෙතුවෙහි ඥානය ධර්‍මප්‍රතිසම්භිදාවයයි; එතං වුත්තං හි, මෙය වදාරණලද මැයි; අත්‍ථො ඉති, අර්‍ථයනම්; හෙතුඵලං, හෙතුවගේ ඵලයයි; හෙතුඵලෙ ඤාණං අත්‍ථපටිසම්භිදාති, හෙතුඵලයෙහි ඥානය අර්‍ථප්‍රතිසම්භිදාවයයි; එතං වුත්තං හි, මෙය වදාරණලදමැයි; දෙසනාති, දෙශනාව නම්; පඤ්ඤත්ති, ප්‍රඥප්තියයි; යථා ධම්මං, ධර්‍මයවූ පරිද්දෙන්; ධම්මාභිලාපොති, අර්‍ථව්‍යඤ්ජනවශයෙන් අවිපරීතාභිලාපය යනු; අධිප්පායො, අභිප්‍රාවය; පටිවෙධොති, ප්‍රතිවෙධය නම්; අභිසමයො, අභිසමයයි හෙවත් මනාවූ ප්‍රතිවෙධයයි; සො ච, ඒ අභිසමයද; ලොකියොලොකුත්තරො, ලෞකිකලොකොත්තරයයි(කියනු ලැබේ;) විසයතො, (ලෞකිකය ධර්‍මාර්‍ථාදීන් ආලම්බනයවම පවත්නා) විෂයහෙයින්; අසම්මොහතො ච, (ලොකොත්තරය වනාහි නිර්‍වාණ

ලොකියො ලොකුත්තරෙ විසයතො අසම්මොහතො ච අත්ථානුරූපං ධම්මෙසු ධම්මානුරූපං අත්ථෙසු පඤ්ඤත්තිපථානුරූපං පඤ්ඤත්තීසු අවබොධො.

ඉදානි යස්මා එතෙසු පිටකෙසු යං යං ධම්මජාත මත්ථජාතං වා යො චායං යථා යථා ඤාපෙතබ්බො අත්ථො සොතූනං ඤාණස්ස අභිමුඛො හොති තථා තථා තදත්ථජොතිකා දෙසනා, යො චෙත්ථ අවිපරීතාවබොධ සඞ්ඛාතො පටිවෙධො, සබ්බමෙතං අනුපචිතකුසල සම්භාරෙහි දුප්පඤ්ඤෙහි සසාදීහි මහාසමුද්දො විය දුක්ඛොගාහං අලබ්භනෙය්‍යපතිට්ඨඤ්ච, තස්මා එවම්පි එකමෙකස්මිං එත්ථ චතුබ්බිධොපි ගම්භීරභාවො වෙදිතබ්බො එත්තාවතා ච:-

---

රම්මණතාවයෙන් ආලම්බණය නොවනුයේම තද්විෂයමොහවිධ්වංශන යෙන්) අසම්මොහය වනහෙයින්ද; ධම්මෙසු, කාරණයන්හි; අත්ථානුරූපං, කාර්‍ය්‍යානුරූප වශයෙන්ද; අත්ථෙසු, කාර්‍ය්‍යානුරූපයන්හි; ධම්මානුරූපං, කාරණානුරූප වශයෙන්ද; පඤ්ඤත්තීසු, (ෂඩ්විධනාම) ප්‍රඥප්තීන් අතුරෙන්; පඤ්ඤත්තිපථානුරූපං, ප්‍රඥප්තිපථානුරූපවශ යෙන්ද; අවබොධො, අවබොධයයි (කියනු ලැබේ.) (දැන් යථොක්ත ධර්මාදිහෙතුවෙන් පිටකයන්ගේ ගම්භීරභාවය දක්වනු පිණිස **"ඉදානි යස්මා එතෙසු පිටකෙසු"** යනාදිය කී.)

ඉදානි, දැන්; යස්මා, යම්හෙයකින්; එතෙසු පිටකෙසු, මේ පිට කයන්හි; ධම්මජාතං වා, කාරණාප්‍රභෙදවූ හෝ කාරණාවූම හෝ; අත්ථජාතං වා, කාරිය ප්‍රභෙදවූ හෝ කාරිමවූ හෝ; යං යං, යමක් යමක් වේද; යො චායං, යම් මේ; යථා යථා, යම් යම්සේ; ඤාපෙතබ්බො අත්ථො, හැඟවියයුතු අර්ථයෙක්තෙමේ; සොතූනං, ශ්‍රොතෲන්ගේ; ඤාණස්ස අභිමුඛො හොති, ඥනයට අභිමුඛ වේද; තථා තථා, එසේ එසේ; තදත්ථජොතිකා දෙසනා, ඒ අර්ථය ප්‍රකාශකරණ දෙශනාවෙක් ඇත්තීද; එත්ථ, මේ පිටකත්‍රයෙහි; යො ච අවිපරීතාවබොධසඞ්ඛාතො පටිවෙධො, මේ ධර්මාර්ථදෙශනාවන් අතුරෙන් යම් අවිපරීතාව බොධසඞ්ඛ්‍යාත ප්‍රතිවෙධයෙක් ඇත්තේද; එතං සබ්බම්පි, මේ සියල්ලම අනුපචිතකුසලසම්භාරෙහි, රැස් නොකරණලද කුශලසම්භාරයන් ඇත්තාවූ; දුප්පඤ්ඤෙහි, දුෂ්ප්‍රාඥයන් විසින්; සසාදීහි, සසාදීන් විසින්; මහාසමුද්දො විය, මහමුහුද මෙන්; දුක්ඛොගාහං, බැසියනොහැක්කේය; (ධර්මාර්ථදෙශනා ප්‍රතිවෙධය නොහැක්කේය යන අර්ථයි); අලබ්භනෙය්‍ය පතිට්ඨඤ්ච, ලැබියනොහැකි පිහිටද ඇත්තේය; තස්මා, එහෙයින්; එවම්පි, මෙසේද; එත්ථ, මේ තුන්පිටකය අතුරෙන්; එකමෙකස්මිං, එකඑක පිටකයෙක්හි; චතුබ්බිධොපි, ගම්භීරභාවො, සිව්වැදෑරුම්දවූ ගම්භීරභාවයතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; එත්තාවතාච, මෙපමණකින්ද;

**"දෙසනාසාසනකථා-භෙදං තෙසු යථාරහං,**
**සික්ඛාපහාණගම්භීර-භාවඤ්ච පරිදීපයෙ."**

ඉති අයං ගාථා වුත්තත්ථා හොති.

**"පරියත්තිභෙදං සම්පත්තිං-විපත්තිඤ්චාපි යං යහිං,**
**පාපුණාති යථා භික්ඛු-තම්පි සබ්බං විභාවයෙ."**

ඉති එත්ථ පන තීසු පිටකෙසු තිවිධො පරියත්තිභෙදො දට්ඨබ්බො. තිස්සො හි පරියත්තියො: අලගද්දූපමා නිස්සරණත්ථා භණ්ඩාගාරික පරියත්තීති,

තත්ථ දුග්ගහිතා උපාරම්භාදිහෙතුපරියාපුතා අලගද්දූපමා, යං සන්ධාය වුත්තං:- "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො අලගද්දත්ථිකො

---

දෙසනාසාසන-පෙ-ඉති, දෙසනාසාසන-පෙ-යන; අයං ගාථා, මේ ගාථාතොමෝ; වුත්තත්ථා හොති, කියනලද අර්ථ ඇතිවන්නිය; (වුත්තො සංවණ්ණිතො අත්ථො අස්සාති= වුත්තත්ථා යි විග්‍රහයි )

පරියත්තිභෙදං සම්පත්තිං-විපත්තිඤ්චාපි යං යහිං,
පාපුණාති යථා භික්ඛු-තම්පි සබ්බං විභාවයෙ.

යන මේ ගාථාතොමෝද උක්තාර්ථයයි දතයුතු.

එත්ථ පන, මෙහි වනාහි; තීසු පිටකෙසු, ත්‍රිපිටකයෙහි; තිවිධො පරියත්තිභෙදො, ත්‍රිප්‍රකාර පර්‍ය්‍යාප්තිභෙදයතෙම; දට්ඨබ්බො, දතයුත් තේය; පරියත්තියො, පර්‍ය්‍යාප්තිහු; තිස්සො හි, තුණෙක්මය; අලගද්දූපමා, අලගර්ද්‍දොපමපර්‍ය්‍යාප්තිය; නිස්සරණත්ථා, නිස්සරණාර්ථපර්‍ය්‍යාප්තිය; භණ්ඩාගාරිකපරියත්තීති, භාණ්ඩාගාරිකපර්‍ය්‍යාප්තියයි කියායි; ("අල ගද්දස්ස ගහණං, උපමා එතිස්සාති=අලගද්දූපමා"යි විග්‍රහයි. ආශිවිෂ තෙමේ අලගද්දයයි කියනු ලැබේ. "ගදය" යනු විෂයට නමෙකි, "අලං පරියත්තො පරියාපුණ්ණො ගදො අස්ස="යි අනුනාසිකලොපය කොට දකාරාගමයද කොට අලගද්දො යි කියනුලැබේ. නොහොත් "අලං ජීවිතහරණෙ සමත්ථො ගදො අස්සාති=අලගද්දො, අලගද්දස්ස ගහණං උපමා එතිස්සාති=අලගද්දූපමා යි"ද විග්‍රහයි "අලගද්දගහණූපමා"යි කියයුත්තෙහි "වීණාවාදනං=වීණා" යනාදියෙහි මෙන් මධ්‍යපදලොපය කොට **අලගද්දූපමා** යි කියනලදී.) (නිස්සරණං අත්ථො පයොජනං එතිස්සාති=නිස්සරණත්ථා සා" යිද භණ්ඩාගාරෙ නියුත්තො= භණ්ඩාගාරිකො, භණ්ඩාගාරිකො විය= භණ්ඩාගාරිකො, ධම්මරතනානුපාලකො; අඤ්ඤං අත්ථං අනපෙක්ඛිත්වා භණ්ඩාගාරිකස්සෙව සතො පරියත්ති=භණ්ඩාගාරිකපරියත්ති යිද විග්‍රහයි.)

තත්ථ, එහි; දුග්ගහිතා, නොමනාව ග්‍රහණය කරණලද්දවූ; උපාරම්භාදිහෙතු, උපාරම්භාදිය (හෙවත් පර්‍ය්‍යාප්තිය නිසා මෙරමා හට ගැරහීම් ආදිය) හෙතුකොටගෙණ; යා පරියාපුතා, පුහුණුකරණලද යම් පර්‍ය්‍යාප්තියෙක් ඇත්තීද; අයං, මෝතොමෝ; අලගද්දූපමා,

අලගද්දගවෙසී අලගද්දපරියෙසනං චරමානො, සො පස්සෙය්‍ය මහන්තං අලගද්දං, තමෙනං භොගෙ වා නඞ්ගුට්ඨෙ වා ගණ්හෙය්‍ය, තස්ස සො අලගද්දො පටිපරිවත්තිත්වා හත්ථෙ වා බාහාය වා අඤ්ඤතරස්මිං වා අඞ්ගපච්චඞ්ගෙ ඩංසෙය්‍ය, සො තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං, තං කිස්ස හෙතු? දුග්ගහිතත්තා භික්ඛවෙ අලගද්දස්ස.

එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චෙ මොඝපුරිසා ධම්මං පරියාපුණන්ති සුත්තං-පෙ-වෙදල්ලං. තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං න උපපරික්ඛන්ති, තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්ථං අනුපපරික්ඛතං න නිජ්ඣානං ඛමන්ති, තෙ උපාරම්භානිසංසා

---

අලගද්දූපමා නම් වන්නීය; යං සන්ධාය, යම් (නොමනාවූ පර්‍යාප්ති ග්‍රහණයක් ඇත්තේද) එ සඳහා; භික්ඛවෙ, සසරභය දක්නෙනි; සෙය්‍යථාපි, යම්සේ; අලගද්දත්ථිකො, ආශීවිෂයකු ඕනෑවූ; අලගද්ද ගවෙසී, ආශීවිෂයකු ගවෙෂණයකරණ ශීලිවූ; අලගද්දපරියෙසනං චරමානො, ආශීවිෂයකු සෙවීමෙහි හැසිරෙණුවූ, පුරිසො, පුරුෂයෙක්තෙමේ වේද; සො, හෙතෙමේ; මහන්තං අලගද්දං, මහත් ආශීවිෂයකු; පස්සෙය්‍ය, දක්නේද; තමෙනං, ඔහු; භොගෙවා, ශරීරය හෝ; නඞ්ගුට්ඨෙවා, නගුට හෝ; ගණ්හෙය්‍ය, අල්වාගන්නේද; සො අලගද්දො, ඒ ආශිවිෂ තෙමේ; පටිපරිවත්තිත්වා, හැරී; තස්ස, ඔහුගේ; හත්ථෙවා, (මණිබන්ධය පටන් අගතිය දක්වා එය අතර) අත හෝ; බාහාය වා, (ඒ හැර සෙසු) බාහුව හෝ; වා, නොහොත්; අඤ්ඤතරස්මිං අඞ්ගපච්චඞ්ගෙ, එක්තරා ශරීරාවයවයක්; ඩංසෙය්‍ය, දෂ්ටකරන්නේද; සො, ඒ පුරුෂතෙමේ; තතො නිදානං, ඒ (දෂ්ට කිරීම) කරණකොටගෙණ; (තං හත්ථාදිසු ඩසනං නිදානං, කාරණං එතස්සා'ති= තං නිදානං යී කියයුත්තෙහි "තතො නිදානං"යී පූර්වපද යෙහි ප්‍රථමායෙහි තිස්සක්කවචනය කොට ඔහු ලොප් නොකොට නිදේශය කළේයි.) මරණං වා, මරණයට හෝ; මරණමත්තං වා දුක්ඛං, මරණ සමාන දුකට හෝ; නිගච්ඡෙය්‍ය, පැමිණෙන්නේය; තං කිස්ස හෙතු, එයට හෙතුකවරේද? භික්ඛවෙ, මහණෙනි; අලගද්දස්ස, ආශී විෂයා; දුග්ගහිතත්තා, නොමනාව ග්‍රහණය කරණලද බැවිනි;

භික්ඛවෙ, මහණෙනි; එවමෙව ඛො, එපරිද්දෙන්ම; ඉධ, මේ සස්නෙහි; එකච්චෙ මොඝපුරිසා, සමහර තුච්ඡපුරුෂයෝ; ධම්මං, පාලිධර්මය; (එනම්) සුත්තං, සූත්‍රය;-පෙ-වෙදල්ලං, වෙදල්ලය; පරියාපුණන්ති, ඉගෙණගණිත්ය (සජ්ඣායනා හෝ කෙරෙත්ය වාචොද්ගත කෙරෙමින් දරත්යයි කියනලද්දේ වේ;) තෙ, ඒ තුච්ඡපුරුෂයෝ; තං ධම්මං පරියාපුණිත්වා, ඒ පාලිධර්මය පුහුණුකොට; පඤ්ඤාය, තම තමන්ගේ ප්‍රඥවෙන්; තෙසං ධම්මානං, ඒ දමුන්ගේ; අත්ථං න උපපරික්ඛන්ති, යථාභූතාර්ථය නොහොත් ප්‍රයොජනාර්ථය පරීක්ෂා නො කෙරෙත්; පඤ්ඤාය, ප්‍රඥවෙන්; අත්ථං අනුපපරික්ඛතං, යථාභූතාර්ථය

චෙව ධම්මං පරියාපුණන්ති ඉතිවාදප්පමොක්ඛානිසංසා ච, යස්ස චත්ථාය ධම්මං පරියාපුණන්ති තඤ්චස්ස අත්ථං නානුභොන්ති, තෙසං තෙ ධම්මා දුග්ගහිතා දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු? දුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මාන”න්ති.

යා පන සුග්ගහිතා සීලක්ඛන්ධාදිපාරිපූරිං යෙව ආකඞ්ඛමානෙන පරියාපුතා න උපාරම්භාදිහෙතු, අයං නිස්සරණත්ථා. යං සන්ධාය වුත්තං:- “තෙසං තෙ ධම්මා සුග්ගහීතා දීඝරත්තං හිතාය සුඛාය

---

නොහොත් ප්‍රයොජනාර්ථය පරීක්‍ෂා නොකරණුවූ; තෙසං, ඔවුන්ගේ; තෙ ධම්මා, ඒ ධර්මයෝ; න නිජ්ඣානං ඛමන්ති, චින්තනයකොට ප්‍රඥවෙන් දැක බබුලුවාගතයුත්තාහු නොවෙත්; තෙ, ඒ කුත්සිතපුරුෂයෝ; උපාරම්භානිසංසාචෙව, පර්‍යාප්තිය නිසා පරහට ගැරහීම ආනිසංස කොට ගැණීම ඇත්තාහුද; ඉතිවාදප්පමොක්ඛානිසංසා ච, මෙසේ පර්‍යාප්තිය කාරණකොටගෙණ වාදයෙන් මිදීම ආනිසංසකොට ඇතිවද; ධම්මං පරියාපුණන්ති, ධර්මය පුහුණු කෙරෙත්; යස්ස අත්ථාය, යම් අර්ථයක් පිණිස; ධම්මං පරියාපුණන්ති, ධර්මය පුහුණු කෙරෙත්ද; අස්ස, මේ ධර්මයගේ; තං ච අත්ථං නානුභොන්ති. (ශීලපරිපූරණාදි අර්ථසඞ්ඛ්‍යාත) ඒ ප්‍රයොජනය නොවිඳිත්; තෙසං, ඔවුන් විසින්; තෙ ධම්මා, ඒ ධර්මයෝ; දුග්ගහිතා, නොමනාව ග්‍රහණය කරණලද්දාහු; දීඝරත්තං, බොහෝ කාලයක් මුලුල්ලෙහි; අහිතාය, අහිතපිණිස; දුක්ඛාය, දුක්පිණිස; සංවත්තන්ති පවතිත්; තං කිස්ස හෙතු, එයට හේතු කවරේද? භික්ඛවෙ, මහණෙනි; ධම්මානං, ධර්මයන්; දුග්ගහිතත්තාති, නොමනාව ග්‍රහණය කරණලද බැවින් යයි; වුත්තං, (අලගද්දොපම සූත්‍රයෙහි) වදාරණලදී. (අලගද්දොපම සූත්‍රාර්ථකථායෙහි මෙසේ කියනලදී. හේ කෙසේද? යමෙක් තෙමේ වනාහි චීවරාදි ප්‍රත්‍යයයන් ලබන්නෙමියි හෝ සිව්පිරිස් මධ්‍යයෙහි; මා දැන ගන්නාහු යයි හෝ ලාභසත්කාරකිත්ති හෙතුකොටගෙණ බුද්ධවචනය පුහුණු කෙරේද හේ අලගද්දපර්‍යාප්තිය නම, බුද්ධවචනය මෙසේ පුහුණුකිරීමට වඩා නිදගැණීම අතිශයින් උතුම්යයි කියායි).

යා පන, යම් පර්‍යාප්තියක් තොමෝ වනාහි; සීලක්ඛන්ධාදිපාරිපූරිං යෙව, ශීලස්කන්ධාදීන්ගේ පිරීමම; ආකඞ්ඛමානෙන, කැමතිවන්නහු විසින්; පරියාපුතා, පුහුණු කරණලදද; න උපාරම්භාදිහෙතු, (පර්‍යාප්තිය නිසා) පරහට ගැරහීම් ආදිය හෙතුකොටගෙණ (පුහුණු නොකරණ ලද්දීද); සුග්ගහිතා, (ඕ තොමෝ) මොනවට ග්‍රහණය කරණලද්දීය; අයං, මෝ තොමෝ; නිස්සරණත්ථා, සංසාරමුක්තිය ප්‍රයොජන කොට ඇත්තී නම; යං සන්ධාය, (මොනවට ග්‍රහණය කරණලද) යම් පර්‍යාප්තියක් ඇත්තේද ඒ සඳහා; තෙසං, ඔවුන් විසින්; සුග්ගහිතා, මොනවට ග්‍රහණය කරණලද්දාවූ; තෙ ධම්මා, ඒ ධර්මයෝ; දීඝරත්තං, බොහෝ කාලයක් මුලුල්ලෙහි; හිතාය,

සංවත්තන්ති. තං කිස්ස හෙතු, සුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මාන”න්ති. යම්පන පරිඤ්ඤාතක්ඛන්ධො පහීණකිලෙසො භාවිතමග්ගො පටිවිද්ධා කුප්පො සච්ඡිකතනිරොධො ඛීණාසවො කෙවලං පවෙණිපාල නත්ථාය වංසානුරක්ඛණත්ථාය පරියාපුණාති, අයං භණ්ඩාගාරික පරියත්තීති.

විනයෙ පන සුප්පටිපන්නො භික්ඛු සීලසම්පත්තිං නිස්සාය තිස්සො විජ්ජා පාපුණාති තාසං යෙවච තත්ථ පභෙදවචනතො, සුත්තෙ සුප්පටිපන්නො සමාධිසම්පදං නිස්සාය ඡළභිඤ්ඤා පාපුණාති

---

හිත පිණිස; පුඛාය, සැපපිණිස; සංවත්තන්ති, පවතිත්; තං කිස්ස හෙතු, එයට හේතුකවරේද? භික්ඛවෙ, මහණෙනි, ධම්මානං, ධර්මයන්; සුග්ගහිතත්තාති, මොනවට ග්‍රහණය කරණලද බැවින්යයි; වුත්තං, (අලගද්දෝපමසූත්‍රයෙහි) වදාරණලදි; යම්පන, යම් පයර්‍ය්‍යාප්තියක් වනාහි; පරිඤ්ඤාතක්ඛන්ධො, (දුක් දැනීම හෙතුකොටගෙණ) දන්නාලද ස්කන්ධ ඇත්තාවූ; පහීණකිලෙසො, සමුදය ප්‍රහාණයෙන් ප්‍රහාණකරණ ලද කෙලෙසුන් ඇත්තාවූ; භාවිතමග්ගො, වඩනලද මාර්ගය ඇත්තාවූ; පටිවිද්ධාකුප්පො, ප්‍රතිවෙධකරණලද අහීත්ඵලය ඇත්තාවූ; සච්ඡිකත නිරොධො, ක්‍ෂාත් කරණලද නිරොධය ඇත්තාවූ; ඛීණාසවො, ක්‍ෂීණා ශ්‍රවතෙමේ; කෙවලං, කෙවලව; පවෙණිපාලනත්ථාය, ප්‍රවෙණිසඞ්ඛ්‍යාත ධර්මසන්තතිය පාලනය කරණපිණිස; වංසානුරක්ඛණත්ථාය, (චතුස්සත්‍ය ඥත භාග්‍යවත්හුගේ) වංශය රක්නා පිණිස; පරියාපුණාති, පුහුණු කෙරේ; අයං, මේතොමෝ; භණ්ඩාගාරිකපරියත්තීති, භණ්ඩාගාරික පයර්‍ය්‍යාප්තියයි; (දූන් වනාහි තුන්පිටකයෙහි සම්පත්ති විපත්තිහු සුදුසු පරිද්දෙන් නිර්ධාරණය කොට දක්වනුයේ “විනයෙ පන” යනාදිය කී.)

විනයෙ පන, විනයපිටකයෙහි වනාහි; සුප්පටිපන්නො භික්ඛු, සුප්‍රතිපන්න භික්‍ෂුතෙමේ; සීලසම්පත්තිං නිස්සාය, ශීලසම්පත්තිය නිසා; තිස්සො විජ්ජා පාපුණාති, ත්‍රිවිද්‍යාවට පැමිණේ; තාසං යෙවච, ඒ ත්‍රිවිද්‍යාවන්ගේම; තත්ථ, ඒ විනය පිටකයෙහි; පභෙදවචනතො, ප්‍රභෙදවචන ඇතිහෙයිනි; (මෙහි තාසංයෙව යන තන්හි එව යන අවධාරණය ෂඩභිඥ සිව්පිළිසිඹියාවන්ගේ ප්‍රභෙදකථනයක් විනයෙහි නැතිබව සඳහා කියනලදී, වෙරඤ්ජ කාණ්ඩයෙහි ත්‍රිවිද්‍යාව විභාග කරණලදු); සුත්තෙ; සූත්‍රපිටකයෙහි; සුප්පටිපන්නො, සුප්‍රතිපන්න භික්‍ෂුතෙමේ; සමාධිසම්පදං නිස්සාය, සමාධිසම්පත්තිය නිසා; ඡළභිඤ්ඤාපාපුණාති, ෂඩභිඥවන්ට පැමිණේ, තාසං යෙවච, ඒ ෂඩභිඥවන්ගේම; තත්ථ, ඒ සූත්‍රපිටකයෙහි; පභෙද වචනතො, ප්‍රභෙදවචන ඇතිහෙයිනි; (මෙහි තාසං යෙව යන තන්හි එව යන අවධාරණය සිව්පිළිසිඹියාව අපෙක්‍ෂාකොට කියනලදී,

තාසං යෙව ච තස්ස පභෙදවචනතො, අභිධම්මෙ සුප්පටිපන්නො පඤ්ඤාසම්පදං නිස්සාය චතස්සො පටිසම්භිදා පාපුණාති තාසඤ්ච තත්ථෙව පභෙද වචනතො,

එවමෙතෙසු සුප්පටිපන්නො යථාක්කමං ඉමං විජ්ජාත්තයඡළභිඤ්ඤාචතුපටිසම්භිදාභෙදං සම්පත්තිං පාපුණාති. විනයෙ පන දුප්පටිපන්නො අනුඤ්ඤාතසුඛසම්ඵස්සඅත්ථරණපාපුරණාදිඵස්සසාමඤ්ඤතො පටික්ඛිත්තෙසු උපාදින්නඵස්සාදිසු අනවජ්ජසඤ්ඤී හොති, වුත්තම්පි හෙතං:-

---

ෂඩභිඥාවන්හිම ත්‍රිවිද්‍යාව ඇතුළත් බැවිනි). අභිධම්මෙ, අභිධර්මපිටකයෙහි; සුප්පටිපන්නො, සුපිළිපන් භික්ෂු තෙමේ; පඤ්ඤාසම්පදං නිස්සාය, ප්‍රඥාසම්පත්තිය නිසා; චතස්සො පටිසම්භිදා පාපුණා'ති, සිව්පිළිසිඹියාවන්ට පැමිණේ; තාසඤ්ච, ඒ සිව්පිළිසිඹියාවන්ගේද; තත්ථෙව, ඒ අභිධර්මපිටකයෙහිම; පභෙදවචනතො ප්‍රභෙදවචන ඇති හෙයිනි;

(මෙහි තාසඤ්ච යන තන්හි ච ශබ්දයෙන් සෙස්සන්ද ඒ අභිධර්මපිටකයෙහි ඇති බව දක්වයි.)

එවං, මෙසේ; එතෙසු, මේ තුන්කොටසෙහි; සුප්පටිපන්නො, සුපිළිපන් මහණ තෙමේ; යථාක්කමං, පිළිවෙළින්; ඉමං විජ්ජාත්තයඡළභිඤ්ඤාචතුපටිසම්භිදාභෙදසම්පත්තිං, මේ ත්‍රිවිද්‍යාෂඩභිඥාචතුෂ්ප්‍රතිසම්භිදාභෙදසම්පත්තියට; පාපුණාති, පැමිණේ; විනයෙ පන, විනයෙහි වනාහි; දුප්පටිපන්නො, දුෂ්ප්‍රතිපන්න මහණ තෙමේ; අනුඤ්ඤාතසුඛසම්ඵස්සඅත්ථරණපාපුරණාදිඵස්සසාමඤ්ඤතො, (භාග්‍යවත්හු විසින්) අනුඥාතසුඛස්පර්ශය ඇති ආස්තරණපාපුරණාදී (අකාමීජයන්ගේ)ස්පර්ශය සාමාන්‍ය හෙයින්; පටික්ඛිත්තෙසු, ප්‍රතික්ෂෙප කරනලද්දාවූ; උපාදින්නඵස්සාදිසු, (මාගීයෙන් මාගී ප්‍රතිපාදන) උපාදින්නස්පර්ශාදීන් විෂයෙහි; අනවජ්ජසඤ්ඤී හොති, නිරවද්‍යසංඥා ඇත්තේ වේ; වුත්තං හෙතං, (අරිට්ඨ නම් භික්ෂුව විසින්) මෙම කියන ලදී.

(ඒ අරිට්ඨ භික්ෂුතෙමේ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේය, ධර්මකථිකය, කර්මක්ලෙශ විපාක උපවාද ආඥා ව්‍යතික්‍රම වශයෙන් පස්වැදෑරුම් අන්තරායිකයන් අතුරෙන් විනයෙහි අදක්ෂ බැවින් ව්‍යතික්‍රමාන්තරාය හැර සෙසු අන්තරායයන් දුන්නේය, එසේහෙයින් රහසිගතව මෙසේ සිතුයේය:-මේ අගාරිකයෝ පඤ්චකාමයන් පරිභොග කරන්නාහු සොවාන් සකෘදාගාමි අනාගාමි වෙත්, භික්ෂුහුද මන වඩන්නාවූ ඇසටවිෂයවූ රූපයන් දකිත්, එසේම මනොහර ශබ්දශ්‍රවණය කෙරෙත්, ගන්ධයන් ආඝ්‍රාණය කෙරෙත්, රසයන් අනුභව කෙරෙත් ස්පර්ශයන් ස්පෘශනයකෙරෙත්, මෘදුවූ ආස්තරණ පාපුරණාදීහු පරිභොග කෙරෙත්, මේසියල්ල වටනේය, ස්ත්‍රීන්ගේ! රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශය කුමක් හෙයින් නොවටනේද, ස්ත්‍රීන්ගේ මේ පස්කම් කොටස්ද වටිත්යයි නිරවද්‍යවූ ප්‍රත්‍යය පරිභොග රසය හා සාවද්‍ය කාමගුණ පරිභොගරසය සංසන්දනය කොට සවඤ්ජනරූප පරිභොගයද නිවඤ්ජනරූපපරිභොගයද

"තථාහං භගවතා ධම්මං දෙසිතං අජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති. තතො දුස්සීලභාවං පාපුණාති.

සුත්තෙ දුප්පටිපන්නො "චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා"ති ආදිසු අධිප්පායං අජානන්තො දුග්ගහිතං ගණ්හාති,

---

එකක් කොට දළවැහැරි සමග ඉතා සියුම් හුයක් ගටන්නාක් මෙන්, අබැටක් සමග මහමෙරසමාන බවට එළවන්නාක් මෙන්, ලාමක දෘෂ්ටියක් උපදවා භාග්‍යවත්හු විසින් මහමුහුද බඳින්නාක් මෙන්, මහොත්සාහයෙන් ප්‍රථම පාරාජිකාව පණවනලද්දීය. මෙහි දොසෙක් නැත්තේයයි සර්වඥතාඥනය සමග ප්‍රතිවිරුද්ධ වෙමින් විශාරද ඥනය ප්‍රතිබාහනය කරමින් ආර්‍ය මාර්ගයෙහි කණුකටු ආදිය ප්‍රක්ෂේප කරමින් මෛථුන ධර්මයෙහි දොසෙක් නැත්තේයයි තිලොකතිලක අප භාග්‍යවත්හුගේ ආඥ චක්‍රයෙහි ප්‍රහාර දුන්නේය. එහෙයින් **තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි** යනාදිය ඔහු විසින් කියනලදී.)

තථා, එසේ; අහං, මම; භගවතා, භාග්‍යවත්හු විසින්; දෙසිතං ධම්මං, දෙසනලද ධර්මය; අජානාමි, දනිමි; යථා, මෙසේයි; ඉමෙ, අන්තරායිකා ධම්මා, ස්වර්ගමොක්ෂයට අන්තරායකර මේ ධර්මයෝ; භගවතා, භාග්‍යවත්හු විසින්; වුත්තා, වදාරණලද්දාහුය; තෙ, ඒ ධර්මයෝ; පටිසෙවතො, සෙවුනාහුට; අන්තරායාය, අන්තරාය පිණිස; නාලන්ති, සමර්ථ නොවෙත්යයි කියායි; තතො, ඒ (නිරවද්‍යසංඥ) හෙතුයෙන් (ව්‍යතික්‍රමය කොට) දුස්සීලභාවං පාපුණාති, දුශ්ශීල බවට පැමිණේ; (මෙහි "අන්තරායිකා" යනු තං තං සම්පත්තියා විබන්ධනවසෙන සත්තසන්තානස්ස අන්තරෙ වෙමජ්ඣෙ එති ආගච්ඡතීති= අන්තරායො තස්මිං, අන්තරායෙ නියුත්තා අන්තරායං වා ඵලං අරහන්ති අන්තරායස්ස වා කරණසීලාති= අන්තරායිකා යි ගත්තේ, ස්වර්ගමොක්ෂයට අන්තරාය කරහයි කියන ලද්දේවේ, ඔහුදු කර්ම කෙලශ, විපාක, උපවාද, ආඥ ව්‍යතික්‍රම වශයෙන් පස්වැදෑරුම් වෙත්, ඔවුන්ගේ විස්තර කථාව පසු අරිෂ්ටශික්ෂාපදයෙහි පහලවන්නීය.)

සුත්තෙ, සූත්‍ර පිටකයෙහි; දුප්පටිපන්නො, දුෂ්ප්‍රතිපන්න භික්ෂු තෙමේ; "චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා"ති ආදිසු "චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා (ලොකස්මිං කතමෙ චත්තාරො? අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය, පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය)" යනාදි තන්හි; අධිප්පායං අජානන්තො, (මේ පුද්ගලදෙශනාව්‍යවහාර වශයෙන්ය පරමාර්ථ වශයෙන් නොවෙයි මෙසේ භාග්‍යවත්හුගේ) අදහස නොදන්නේ; දුග්ගහිතං ගණ්හාති, නොමනාවූ විපරීතගැණීමක් ග්‍රහණය කෙරේ; (චතුස්සත්‍යඥත භාග්‍යවත්හුගේ දෙශනා තොමෝ

යං සන්ධාය වුත්තං:- "අත්තනා දුග්ගහිතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛති අත්තානඤ්ච ඛණති බහුඤ්ච අපුඤ්ඤං පසවතී"ති. තතො මිච්ඡාදිට්ඨිතං පාපුණාති. අභිධම්මෙ දුප්පටිපන්නො ධම්මචින්තං අතිධාවන්තො අචින්තෙය්‍යානිපි චින්තෙති, තතො චිත්තක්ඛෙපං පාපුණාති.

වුත්තං හෙතං:- "චත්තාරිමානි භික්ඛවෙ අචින්තෙය්‍යානි නචින්තෙතබ්බානි යානි චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස

---

සම්මුතිදෙශනාවය පරමාර්ථදෙශනාව යයි කියා දෙවැදෑරුම් වන්නීය, එහි "පුග්ගලො සත්තො ඉත්ථි පුරිසො ඛත්තියො බ්‍රාහ්මණො දෙවො මාරො" යනාදි මේ සම්මුතිදෙශනාව වන්නිය. අනිච්චං දුක්ඛං අනත්තා ඛන්ධා ධාතුයො ආයතනා සතිපට්ඨානා යනාදින් පරමාර්ථ දෙශනාවවන්නීය; එහි භාග්‍යවත්තෙමේ සම්මුති වශයෙන් කරණලද දෙශනාව අසා අර්ථප්‍රතිවෙධ කොට මොහය හැර නිර්වාණාධිගමය කරන්ට සමර්ථවූවන්ට සම්මුතිදෙශනාව කෙරේ, පරමාර්ථ වශයෙන් කරණලද දෙශනාව අසා අර්ථය ප්‍රතිවෙධය කොට මොහය හැර නිර්වාණාධිගමය කරන්ට සමර්ථවූවන්ට පරමාර්ථදෙශනාව කෙරේයයි දතයුතු.

මේ දක්වනු සඳහා:—

දුවෙ සච්චානි අක්ඛාසි-සම්බුද්ධො වදතං වරො,
සම්මුතිං පරමත්ථඤ්ච-තතියං නුපලබ්භති.

යනුද කීයේය.

යං සන්ධාය, යම් (නොමනාවූ විපරීතග්‍රහණයක් ඇත්තේද) ඒ සඳහා; අත්තනා දුග්ගහිතෙන, තමා විසින් දුර්ගෘහිත ධර්මයෙන් නො හොත් තමාගේ විපරීතග්‍රහණය කරණකොට ගෙණ; අම්හෙචෙව, අපටද; අබ්භාචික්ඛති, ගර්හා කෙරේ; අත්තානඤ්ච, තමාගේද; ඛණති, (කුශලමූලය) කණී; බහුං අපුඤ්ඤඤ්ච පසවතීති, බොහෝ අපුණ්‍යද ප්‍රසවය කෙරේයයි; වුත්තං, වදාරණලද්දේය; තතො මිච්ඡාදිට්ඨිතං පාපුණාති, ඒ නොමනාවූ විපරීතග්‍රහණය හෙතුකොටගෙණ මිථ්‍යා දෘෂ්ටිකබවට පැමිණේ; අභිධම්මෙ, අභිධර්මයෙහි; දුප්පටිපන්නො, දුෂ්ප්‍රතිපන්නමහණ තෙමේ; ධම්මචින්තං අතිධාවන්තො, ධර්මස්වභාවයෙහි ලා චින්තනය ඉක්මවා පවත්වනුයේ; අචින්තෙය්‍යානිපි, සිතිය නො හැකියන්ද; චින්තෙති, සිතයි; තතො චිත්තක්ඛෙපං පාපුණාති, එයින් චිත්තොත්ක්ෂෙපයට පැමිණේ;

භික්ඛවෙ, මහණෙනි; අචින්තෙය්‍යානි, සිතිය නොහැක්කාවූ; ඉමානි චත්තාරි, (බුද්ධවිෂය ධ්‍යානවිෂය කර්මවිපාකය ලොකවිෂය යන) මේ සතර; නචින්තෙතබ්බානි, නොසිතිය යුත්තාහුය; යානි, යම් ඒ සතර කරුණ; චින්තෙන්තො, සිතනුයේ; උම්මාදස්ස, උන්මාදයට; විඝාතස්ස,

භාගී අස්සා"ති. එවමෙතෙසු දුප්පටිපන්නො යථාක්කමෙන ඉමං දුස්සීලභාවමිච්ඡාදිට්ඨිතා චිත්තක්ඛෙපප්පභෙදං විපත්තිං පාපුණාතීති. එත්තාවතා:-

**"පරියත්තිභෙදං සම්පත්තිං-විපත්තිඤ්චාපි යං යහිං,**
**පාපුණාති යථා භික්ඛු-තම්පි සබ්බං විභාවයෙ."**

ඉති අයම්පි ගාථා වුත්තත්ථා හොති. එවම්පි නානප්පකාරතො පිටකානි ඤත්වා තෙසං වසෙනෙතං බුද්ධවචනං තිවිධන්ති ඤාතබ්බං.

කථං නිකායවසෙන පඤ්චවිධං? සබ්බමෙව චෙතං දීඝනිකායො මජ්ඣිමනිකායො සංයුත්තනිකායො අඞ්ගුත්තරනිකායො ඛුද්දකනිකායොති පඤ්චප්පභෙදං හොති. තත්ථ කතමො දීඝනිකායො? තිවග්ගසඞ්ගහිතානි බ්‍රහ්මජාලාදීනි චතුත්තිංසසුත්තානි.

---

දුකට; භාගී අස්සාති, හිමිවන්නේයයි; එතං, මේ කරුණ; වුත්තං හි වදුරණලදමැයි; එවං, මෙසේ; එතෙසු, මොවුන් අතුරෙහි; දුප්පටිපන්නො, දුෂ්ප්‍රතිපන්නවූයේ; යථාක්කමෙන, පිළිවෙළින්; දුස්සීලභාවමිච්ඡාදිට්ඨිතා, දුශ්ශීලභාවය මිථ්‍යාදෘෂ්ටිතාවය; චිත්තක්ඛෙපප්පභෙදං, චිත්තාක්ෂෙපය යන ප්‍රභෙද ඇති; ඉමං විපත්තිං පාපුණාතීති, මේ විපත්තියට පැමිණෙන්නේයයි; එත්තාවතාව, මෙපමණකින්;

පරියත්තිභෙදං සම්පත්තිං-විපත්තිඤ්චාපි යං යහිං,
පාපුණාති යථා භික්ඛු-තම්පි සබ්බං විභාවයෙ-යන.

අයම්පි ගාථා, මේ ගාථාතොමෝද; වුත්තත්ථා හොති උක්තාර්ථය ඇතිවන්නීය; එවම්පි, මෙසේද; නානප්පකාරතො පිටකානි ඤත්වා, නානාප්‍රකාරයෙන් පිටකයන් දැන; තෙසං වසෙන, ඔවුන්ගේ වශයෙන්; එතං බුද්ධවචනං, මේ බුද්ධවචනය තෙම; තිවිධන්ති, තුන්ප්‍රකාරයයි; ඤාතබ්බං, දතයුත්තේය;

නිකායවසෙන, නිකාය වශයෙන්; පඤ්චවිධං, පස්ප්‍රකාරවූයේ; කථං, කෙසේද? එතං සබ්බං එවච, මේ සියල්ලම; දීඝනිකායො, දීඝනිකායයැ; මජ්ඣිමනිකායො, මධ්‍යමනිකායයැ; සංයුත්තනිකායො, සංයුක්තනිකායයැ; අඞ්ගුත්තරනිකායො, අඞ්ගුත්තරනිකායයැ; ඛුද්දකනිකායොති, ඛුද්දකනිකාය යයි කියා; පඤ්චප්පභෙදං හොති, පස් ප්‍රභෙදයෙක් වේ; තත්ථ, එහි; දීඝනිකායො, දීඝනිකාය තෙමේ; කතමො, කවරේද? තිවග්ගසඞ්ගහිතානි, (ශීලස්කන්ධවර්ගී මහාවර්ගී පාථිකවර්ගී සඞ්ඛ්‍යාත) වර්ගත්‍රයකින් සඞ්ග්‍රහ කරණලද්දවූ; බ්‍රහ්මජාලාදීනි, බ්‍රහ්මජාලය ආදිවූ; චතුත්තිංස සුත්තානි, සූතිස් සූත්‍රයෝය;

**චතුත්තිංසෙව සුත්තන්තා–තිවග්ගො යස්ස සඞ්ගහො,**
**එස දීඝනිකායොති–පඨමො අනුලොමිකො.**

කස්මා පනෙස දීඝනිකායොති වුච්චති? දීඝප්පමාණානං සුත්තානං සමූහතො නිවාසතො ච, සමූහනිවාසා හි නිකායොති වුච්චන්ති, "නාහං භික්ඛවෙ අඤ්ඤං එකනිකායම්පි සමනුපස්සාමි එවං චිත්තං, යථයිදං භික්ඛවෙ තිරච්ඡානගතා පාණා "පොණික නිකායො චික්ඛල්ලිකනිකායො" ති එවමාදීනි චෙත්ථ සාධකානි සාසනතො ච ලොකතොච, එවං සෙසානම්පි නිකායභාවෙ වචනත්ථො වෙදිතබ්බො.

කතමො මජ්ඣිමනිකායො? මජ්ඣිමප්පමාණානි පඤ්චදසවග්ගසඞ්ගහානි මූලපරියායසුත්තාදීනි දියඩ්ඪසතං ද්වෙ ච සුත්තානි.

---

යස්ස, යම් නිකායකගේ; චතුත්තිංසෙව සුත්තන්තා, (සූත්‍රගණනින්) සූතිසෙක්ම සූත්‍රවෙත්ද; තිවග්ගො සඞ්ගහො, සඞ්ග්‍රහ වශයෙන් වර්ග තුනෙක් වේද; අනුලොමිකො, අර්ථයන්ට අනුලොම්වූ නොහොත් අවිරුද්ධවූ; පඨමො ප්‍රථමවූ; එසො, මෙතෙමේ; දීඝනිකායොති, දීර්ඝනිකායයයි;

කස්මා පන; කුමක්හෙයින් වනාහි; එසො, මේ තෙමේ; දීඝනිකායොති වුච්චති, දීර්ඝනිකාය යයි කියනු ලැබේද; දීඝප්පමාණානං සුත්තානං, දීර්ඝප්‍රමාණ සූත්‍රයන්ගේ; සමූහතො; ච, සමූහ වශයෙන්ද; නිවාසතො ච, නිවාස වශයෙන්ද (කියනලදී); සමූහනිවාසාහි, සමූහ නිවාසයෝ වනාහි; [නිකායොති, වුච්චන්ති, නිකාය යයි කියනුලැබෙත්; භික්ඛවෙ, මහණෙනි; අහං, මම; එවං චිත්තං, මෙසේ විසිතුරුවූ; අඤ්ඤං එකනිකායම්පි, අනික් එකසමූහයකුදු; නසමනුපස්සාමි, නොදක්නෙමි; භික්ඛවෙ, මහණෙනි, යථයිදං තිරච්ඡානගතා පාණා, යම්සේ මේ තිර්‍යග්ගතප්‍රාණීහු වෙත්ද; පොණිකනිකායො චික්ඛල්ලිකනිකායොති, පොණිකනිකායයැ චික්ඛල්ලිකනිකායයැයි; (පොණිකනිකාය නම් පොණික ක්‍ෂත්‍රියයෝය, චික්ඛල්ලික නිකාය නම් චික්ඛල්ලික ක්‍ෂත්‍රියයෝ යයි දතයුතු) එත්ථ, මෙහි; සාසනතො ච, ශාසන (ව්‍යවහාර) වශයෙන්ද; ලොකතොච, ලොකව්‍යවහාරවශයෙන්ද; එවමාදීනි, මේ ආදීහු; සාධකානි, සාධකයහ හෙවත් උදාහරණයහ (ප්‍රමාණයැ යන අර්ථයි); එවං, මෙසේ; සෙසානම්පි, සෙස්සන්ගේ පවා; නිකායභාවෙ, නිකාය භාවයෙහි; වචනත්ථො, වචනාර්ථය තෙම; වෙදිතබ්බො, දතයුත්තේය; (මෙහි ප්‍රථම උදාහරණය ශාසනව්‍යවහාරවශයෙන්ද දෙවන උදාහරණය ලොකව්‍යවහාර වශයෙන්ද සාධකයහයි දතයුතු).

මජ්ඣිමනිකායො, මධ්‍යමනිකායතෙමේ; කතමො, කවරේද? මජ්ඣිමප්පමාණානි, මධ්‍යමප්‍රමාණවූ; පඤ්චදසවග්ගසඞ්ගහානි, (මූලපරියාය වර්ගාදි) පසළොස්වර්ගයකින් සඞ්ග්‍රහය ඇත්තාවූ; මූලපරියාය සුත්තාදීනි, මූලපරියාය සූත්‍රය ආදිවූ; දියඩ්ඪසතං ද්වෙච සුත්තානි, එක්සිය දෙපණස් සූත්‍රයෝය;

**දියඩ්ඪසතසුත්තන්තා-මෙව සුත්තානි යත්ථ සො,**
**නිකායො මජ්ඣිමො පඤ්ච-දසවග්ගපරිග්ගහො.**

කතමො සංයුත්තනිකායො? දෙවතාසංයුත්තාදිවසෙන ඨිතානි ඔඝතරණ සුත්තාදීනි සත්තසුත්තසහස්සානි සත්ත ච සුත්තසතානි ද්වාසට්ඨි ච සුත්තානි.

**සත්තසුත්තසහස්සානි-සත්තසුත්තසතානි ච,**
**ද්වාසට්ඨිචෙව සුත්තන්තා-එසො සංයුත්තසඞ්ගහො.**

කතමො අඞ්ගුත්තර නිකායො? එකෙකඅඞ්ගාතිරෙකවසෙන ඨිතානි චිත්තපරියාදානාදීනි නවසුත්තසහස්සානි පඤ්චසුත්තසතානි සත්තපණ්ණාසඤ්ච සුත්තානි.

**නවසුත්තසහස්සානි-පඤ්චසුත්තසතානි ච,**
**සත්තපඤ්ඤාසසුත්තානි-සඞ්ඛා අඞ්ගුත්තරෙ අයං.**

---

යත්ථ යම්නිකායයෙක්හි; දියඩ්ඪසතසුත්තන්තා මෙව සුත්තානි, එක්සියපණස්දෙකක් සූත්‍ර වෙත්ද; පඤ්චදසවග්ගපරිග්ගහො, පස ළොස් වර්ගයකින් සඞ්ගෘහිතවූ; සො නිකායො, ඒනිකාය තෙමේ; මජ්ඣිමො, මධ්‍යමනිකාය නම් වේ;

සංයුත්තනිකායො, සංයුත්තනිකායතෙම; කතමො, කවරේද? දෙවතාසංයුත්තාදිවසෙන ඨිතානි, දෙවතාසංයුත්තාදිවශයෙන් සිටියාවූ; ඔඝතරණසුත්තාදීනි, ඔඝතරණසූත්‍රය ආදිවූ; සත්තසුත්තසහස්සානි, සත්දහසක්ද සූත්‍ර, සත්ත ච සුත්තසතානි, සත්සියයක්ද සූත්‍ර; ද්වාසට්ඨිච සුත්තානි, දෙසැටක්ද සූත්‍රයෝය;

සත්තසුත්තසහස්සානි, සත්දහසක් සූත්‍රද; සත්තසුත්තසතානි ච, සත්සියයක් සූත්‍රද; ද්වාසට්ඨිචෙව සුත්තන්තා, දෙසැටක් සූත්‍ර දැයි; එසො සංයුත්තසඞ්ගහො, මේ සංයුත්තනිකායගේ සඞ්ග්‍රහයයි;

අඞ්ගුත්තරනිකායො, අඞ්ගුත්තරනිකාය තෙම; කතමො, කවරේද? එකෙකඅඞ්ගාතිරෙකවසෙන, එකඑකඅඞ්ගයක්හුගේ වැඩිවශයෙන්; ඨිතානි, සිටියාවූ; චිත්තපරියාදානාදීනි, චිත්තපරියාදානසූත්‍රය ආදිවූ; නවසුත්තසහස්සානි, නවදහසක් සූත්‍රය; පඤ්චසුත්තසතානි, පන්සියයක් සූත්‍රය; සත්තපණ්ණාසඤ්ච සුත්තානි, සත්පණසක්ද සූත්‍රයෝය.

නවසුත්තසහස්සානි, නවදහසක් සූත්‍රද; පඤ්චසුත්තසතානි ච, පන්සියයක් සූත්‍රද; සත්තපඤ්ඤාස සුත්තානි, සත්පණසක් සූත්‍රද වෙත්; අඞ්ගුත්තරෙ, අඞ්ගුත්තරනිකායයෙහි; අයං සඞ්ඛා, මේ ගණනයි.

කතමො ඛුද්දකනිකායො? සකලං විනයපිටකං අභිධම්මපිටකං ඛුද්දකපාඨාදයො ච පුබ්බෙ නිදස්සිතා පඤ්චදස භෙදා ඨපෙත්වා චත්තාරො නිකායෙ අවසෙසං බුද්ධවචනන්ති.

**ඨපෙත්වා චතුරො පෙතෙ-නිකායෙ දීඝආදිකෙ,**
**තදඤ්ඤං බුද්ධවචනං-නිකායො ඛුද්දකො මතො'ති.**

එවං නිකායවසෙන පඤ්චවිධං. කථං අඞ්ගවසෙන නවවිධං, සබ්බමෙව හිදං සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලන්ති නවප්පභෙදං හොති.

තත්‍ථ උභතො විභඞ්ග නිද්දෙස ඛන්ධක පරිවාරා සුත්තනිපාතෙ මඞ්ගලසුත්ත රතනසුත්ත නාලකසුත්ත තුවටකසුත්තානි, අඤ්ඤම්පි ච සුත්තනාමකං තථාගතවචනං සුත්තන්ති වෙදිතබ්බං, සබ්බම්පි සගාථකං

---

ඛුද්දකනිකායො, ඛුද්දකනිකායතෙමේ, කතමො, කවරේද? සකලං විනයපිටකං, සියලු විනයපිටකයද; අභිධම්මපිටකං, අභිධර්ම පිටකයද; චත්තාරො නිකායෙ ඨපෙත්වා, සිව්නිකාය හැර; පුබ්බෙ නිදස්සිතා, (සූත්‍රපිටකනිර්දේශයෙහි) පෙර දක්වනලද්දාවූ; පඤ්චදස භෙදා, පසළොස් ප්‍රභෙදවූ; ඛුද්දකපාඨාදයො ච, ඛුද්දකපාඨාදීහුද; අවසෙසං බුද්ධවචනන්ති, සෙසු බුද්ධවචනය යන මොහුයි;

දීඝආදිකෙ, දීඝනිකාය ආදිවූ; එතෙ චතුරොපි නිකායෙ ඨපෙත්වා, මේ නිකාය සතරම හැර; තදඤ්ඤං බුද්ධවචනං, එයින් අන්‍යවූ බුද්ධවචනයතෙමේ; ඛුද්දකො නිකායොති, ඛුද්දකනිකායයයි; මතො, දන්නාලදී.

නිකායවසෙන, නිකාය වශයෙන්; පඤ්චවිධං, පස්ප්‍රකාර වූයේ එවං, මෙසේයි; අඞ්ගවසෙන, අඞ්ගවශයෙන්; නවවිධං, නවවැදෑරුම් වූයේ; කථං, කෙසේද; සබ්බමෙවහිදං, සියලුම මේ බුද්ධවචනය වනාහි; සුත්තං, සූත්‍රය; ගෙය්‍යං, ගෙය්‍යය; වෙය්‍යාකරණං, වෙය්‍යාකරණය; ගාථා, ගාථාය; උදානං, උදානය; ඉතිවුත්තකං, ඉතිවුත්තකය; ජාතකං, ජාතකය; අබ්භුතධම්මං, අද්භුතධර්මය; වෙදල්ලන්ති, වෙදල්ලයයි කියා; නවප්පභෙදං හොති, නවප්‍රභෙදයෙක්වේ; (දූන් සූත්‍රාදිනවාඞ්ගයන් විභාගකොට දක්වනුයේ **තත්‍ථ උභතො විභඞ්ග නිද්දෙස ඛන්ධක පරිවාරා** යනාදිය කී.)

තත්‍ථ, එහි; උභතොවිභඞ්ග, උභතොවිභඞ්ගය; නිද්දෙස, ක්‍ෂුල්ල නිර්දේශ මහානිර්දේශය; ඛන්ධක, ඛන්ධකය; පරිවාරා, පරිවාරය යන මොහුද; සුත්තනිපාතෙ, සූත්‍රනිපාතයෙහි; මඞ්ගලසුත්ත, මඞ්ගලසූත්‍රය; රතනසුත්ත, රතනසූත්‍රය; නාලකසුත්ත, නාලකසූත්‍රය; තුවටක සුත්තානි, තුවටකසූත්‍රය යන මොහුද; අඤ්ඤම්පි ච, අන්‍යවූද සුත්ත නාමකං තථාගතවචනං, සූත්‍ර නම් ඇත්තාවූ තථාගතවචනයෙක්වේද; (ඒ සියල්ල) සුත්තන්ති, සූත්‍රයයි; වෙදිතබ්බං, දතයුත්තේය; සබ්බම්පි

සුත්තං ගෙය්‍යන්ති වෙදිතබ්බං, විසෙසෙන සංයුත්තකෙ සකලොපි සගාථකවග්ගො, සකලං අභිධම්මපිටකං නිග්ගාථකං සුත්තං යඤ්ච අඤ්ඤම්පි අට්ඨහි අඞ්ගෙහි අසඞ්ගහිතං බුද්ධවචනං තං වෙය්‍යාකරණන්ති වෙදිතබ්බං. ධම්මපදං ථෙරගාථා ථෙරීගාථා සුත්තනිපාතෙ නොසුත්තනාමිකා සුද්ධිකගාථා ච ගාථාති වෙදිතබ්බා.

සොමනස්සඤාණමයිකගාථාපටිසංයුත්තා ද්වෙඅසීතිසුත්තන්තා උදානන්ති වෙදිතබ්බං. “වුත්තං හෙතං භගවතා” ති ආදිනයප්පවත්තා ද්වාදසුත්තරසතසුත්තන්තා ඉතිවුත්තකන්ති වෙදිතබ්බං. අපණ්ණකජාතකාදීනි පඤ්ඤාසාධිකානි පඤ්චජාතකසතානි ජාතකන්ති වෙදිතබ්බං. “චත්තාරොමෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතාධම්මා ආනන්දෙ” ති ආදිනයප්පවත්තා සබ්බෙ'පි අච්ඡරියබ්භුතධම්මපටිසංයුත්තා සුත්තන්තා

---

සගාථකං සුත්තං, සියලුම ගාථාසහිත සූත්‍රය; ගෙය්‍යන්ති වෙදිතබ්බං, ගෙය්‍යයයි දතයුත්තේය; විසෙසෙන, විශෙෂයෙන්; සංයුත්තකෙ, සංයුත්තකයෙහි; සකලොපි සගාථකවග්ගො, සියලුම සගාථකවර්ගයයි; සකලං අභිධම්මපිටකං, සියලු අභිධර්මපිටකය; නිග්ගාථකං සුත්තං, ගාථාවිරහිත සූත්‍රය; අඤ්ඤම්පි, අන්‍යවූද; අට්ඨහි අඞ්ගෙහි අසඞ්ගහිතං, අෂ්ටාඞ්ගයෙන් සඞ්ගෘහිතනොවූ; යඤ්චබුද්ධවචනං, යම් බුද්ධවචනයක් ඇත්තේද; තං, හේ; වෙය්‍යාකරණන්ති, වෙය්‍යාකරණයයි; වෙදිතබ්බං, දතයුත්තේය; ධම්මපදං, ධම්මපදය; ථෙරගාථා, ථෙරගාථාය; ථෙරිගාථා, ථෙරිගාථාය; සුත්තනිපාතෙ, සූත්‍රනිපාතයෙහි; නොසුත්තනාමිකා, සූත්‍රනාමනැත්තාවූ; සුද්ධිකගාථා ච, සුද්ධිකගාථාවෝද; ගාථාති, ගාථායයි; වෙදිතබ්බා, දතයුත්තීය; (දැන් උදානය ස්වරූපවශයෙන් ව්‍යවස්ථාකරණුයේ **සොමනස්ස ඤාණමයික ගාථා පටිසංයුත්තා** යී ආදි කීයේ)

සොමනස්සඤාණමයිකගාථාපටිසංයුත්තා, සෞමනස්‍යඥානමයිකවූ හෙවත් සොම්නස් හා පැවති ඥානයෙන් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්තවූ; ද්වෙඅසීතිසුත්තන්තා, දෙඅසූවක් සූත්‍රාන්තයෝ; උදානන්ති, උදානයයි; වෙදිතබ්බං, දතයුත්තේය; වුත්තං හෙතං භගවතාති ආදිනයප්පවත්තා, වුත්තං හෙතං භගවතා යනාදි නයින් පැවැත්තාවූ; ද්වාදසුත්තරසතසුත්තන්තා, දොළසක් අධිකකොට ඇති සියයක් සූත්‍රාන්තයෝ; ඉතිවුත්තකන්ති, ඉතිවුත්තකයයි වෙදිතබ්බං, දතයුත්තේය; අපණ්ණකජාතකාදීනි, අපණ්ණකජාතකය ආදිකොට ඇති; පඤ්ඤාසාධිකානි පඤ්චජාතකසතානි, පණසක් අධිකකොට ඇති පන්සියයක් ජාතකයෝ; ජාතකන්ති, ජාතකයයි; වෙදිතබ්බං, දතයුත්තේය; චත්තාරොමෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතාධම්මා ආනන්දෙති ආදිනයප්පවත්තා, චත්තාරොමෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතාධම්මා ආනන්දෙ යනාදිනයින් පැවැත්තාවූ; සබ්බෙපි, සියලුම; අච්ඡරියබ්භුතධම්මපටිසංයුත්තා, ආශ්චර්‍ය්‍ය අද්භුතධර්මප්‍රතිසංයුක්තවූ; සුත්තන්තා, සූත්‍රයෝ;

අබ්භුතධම්මන්ති වෙදිතබ්බං. චූළවෙදල්ල මහාවෙදල්ල සම්මාදිට්ඨි සක්කපඤ්හ සඞ්ඛාරභාජනිය මහාපුණ්ණම සුත්තාදයො සබ්බෙපි වෙදඤ්ච තුට්ඨිඤ්ච ලද්ධා ලද්ධා පුච්ඡිතසුත්තන්තා වෙදල්ලන්ති වෙදිතබ්බං. එවං අඞ්ගවසෙන නවවිධං.

කථං ධම්මක්ඛන්ධවසෙන චතුරාසීතිසහස්සවිධං? සබ්බමෙවහෙතං බුද්ධවචනං:-

**ද්වාසීති බුද්ධතො ගණ්හිං-ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීතිසහස්සානි-යෙ මෙ ධම්මා පවත්තිනො ති.**

---

අබ්භුතධම්මන්ති, අද්භුතධර්මයයි; වෙදිතබ්බං, දතයුත්තේය; චූළවෙදල්ල, (විසාඛ නම් උපාසකයා විසින් විචාරණලදුව ධර්මදින්නා නම් භික්ෂුණිය විසින් කථනයකරණලද) චූළවෙදල්ල සූත්‍රය; මහාවෙදල්ල, (මහාකොට්ඨිතස්ථවිරයන් විසින් විචාරණලදුව ආයුෂ්මත් සැරියුත් තෙරහු විසින් කථනයකරණලද) මහාවෙදල්ලසූත්‍රය; සම්මාදිට්ඨි, භික්ෂූන් විසින් විචාරණලදුව එම සැරියුත් තෙරහු විසින් කථනයකරණලද සම්මාදිඨිසූත්‍රය; සක්කපඤ්හ, (සක්දෙව් රජහු විසින් විචාරණලදුව භාග්‍යවත්හු විසින් දෙසනලද සක්කපඤ්හසූත්‍රය; සඞ්ඛාරභාජනිය, සඞ්ඛාරභාජනියසූත්‍රය; මහාපුණ්ණමසුත්තන්තාදයො, (එක්තරා භික්ෂුවක් විසින් විචාරණලදුව භාග්‍යවත්හු විසින් වදාරණලද) මහාපුණ්ණමසූත්‍රය ආදීවූ; සබ්බෙපි, සියලුම; වෙදඤ්ච, ඥනයද; තුට්ඨිඤ්ච, (ධර්මදෙශනාව අසා "සාධු අයෙ‍්‍යා සාධාවුසො යනාදීන්; අනුමොදනා වශයෙන් පැවති) සොම්නස් සහිත ප්‍රීතියද; ලද්ධා ලද්ධා, ලැබ ලැබ; පුච්ඡිතසුත්තන්තා, විචාරණලදුව වදාරණලද සූත්‍රාන්තයෝ; වෙදල්ලන්ති; වෙදල්ලයයි; වෙදිතබ්බං, දතයුත්තේය; අඞ්ගවසෙන, අඞ්ගවශයෙන්; නවවිධං, නවවැදෑරුම්වූයේ; එවං, මෙසේයි. (මෙසේ අඞ්ගවශයෙන් සියලුම බුද්ධවචනය විභාගකොට දූන් ධර්මස්කන්ධවශයෙන් විභජනය කටැටිව **කථං ධම්මක්ඛන්ධවසෙන** යි ආදි කියේ.) ධම්මක්ඛන්ධවසෙන, ධර්මරාශිවශයෙන්; චතුරාසීතිසහස්සවිධං, සුවාසූදහසක් ප්‍රකාරවූයේ; කථං, කෙසේද; සබ්බං එව, සියලුම; එතඤ්ච බුද්ධවචනං, මේද බුද්ධවචනය;

ද්වාසීතිං සහස්සානි, දෙයාසූදහසක් ධර්මස්කන්ධය; බුද්ධතො ගණ්හිං, බුදුන්කෙරෙන් ගත්තෙම්ය හෙවත් උද්ග්‍රහණය කෙළෙම්ය; ද්වෙසහස්සානි, දෙදහසක් ධර්මස්කන්ධයන්; භික්ඛුතො ගණ්හිං, භික්ෂූන් කෙරෙන් ගත්තෙම්ය; (ධර්මසෙනාපති ආදීන් විසින් දෙසනලද දෙදහසෙක් ධර්මස්කන්ධයන් ඔවුන් කෙරෙන් උද්ග්‍රහණය කෙළෙම්ය යන අර්ථයි) යෙ ධම්මා, යම් ධර්මයෝ; මෙ, මාගේ හෘදයෙහි; පවත්තිනො, පැවැත්තාහුද; චතුරාසීතිසහස්සානීති; (ඒ ධර්මයෝ) සුවාසූදහසෙක් යයි; (මෙද භාග්‍යවත්හු ජීවමානකාලයෙහි උද්ග්‍රහණය කරණලද ධර්මස්කන්ධයන්ගේ වශයෙන් කියනලදි, භාග්‍යවත්හු පිරිනිවිකල්හි

එවං පරිදීපිතධම්මක්ඛන්ධවසෙන චතුරාසීතිසහස්සප්පභෙදං හොති. තත්‍ථ එකානුසන්ධිකං සුත්තං එකො ධම්මක්ඛන්ධො, යං අනෙකානුසන්ධිකං තත්‍ථ අනුසන්ධිවසෙන ධම්මක්ඛන්ධගණනා, ගාථාබන්ධෙසු පඤ්හපුච්ඡනං එකො ධම්මක්ඛන්ධො, විස්සජ්ජනං එකො, අභිධම්මෙ එකමෙකං තිකදුකභාජනං එකමෙකඤ්ච චිත්තවාරභාජනං එකමෙකො ධම්මක්ඛන්ධො, විනයෙ අත්‍ථි වත්‍ථු අත්‍ථි මාතිකා අත්‍ථි පදභාජනීයං

---

වනාහි අනඳතෙරෙහු විසින් දෙසනලද සුභසූත්‍රය ගොපකමොග්ගල්ලාන සූත්‍රය තෘතිය සඞ්ගීතියෙහිදී මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන් විසින් කථනයකරණලද කථාවස්තුප්‍රකරණයාගේද වශයෙන් ධර්මස්කන්ධයන්ගේ සුවාසූදහසකට වඩා අධිකබව දතයුතු.)

එවං පරිදීපිතධම්මක්ඛන්ධවසෙන, (ගොපක මෞද්ගල්‍යායන බ්‍රාහ්මණයා විසින් ආනන්දය නුඹවහන්සේ බහුශ්‍රැතය බුද්ධශාසනයෙහි ප්‍රකටය භාග්‍යවත්හු විසින් දෙසනලද කොපමණ ධර්මයෝ නුඹවහන්සේ විසින් ධරණලද්දහුදැයි විචාරණලදුව ඔහුට ප්‍රතිවචන දෙන්නාවූ අනඳතෙරහු විසින්) මෙසේ ද්වාසීතිං බුද්ධතො ගණ්හිං යනාදීන් දක්වනලද ධර්මස්කන්ධයන්ගේ වශයෙන්) චතුරාසීතිසහස්සප්පභෙදං හොති, සුවාසූදහසක් ප්‍රභෙද වේ; තත්‍ථ, එහි; එකානුසන්ධිකං සුත්තං, එක්අනුසන්ධියක් ඇත්තාවූ සතිපට්ඨානසූත්‍රාදිය; එකො ධම්මක්ඛන්ධො, එක්ධර්මස්කන්ධයෙක් වේ; (එහි සතිපට්ඨානසූත්‍රය "එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා" යනාදීන් සතර සතිපට්ඨානයන් ආරම්භකොට ඔවුන්ගේම විභාගය දැක්වීම් වශයෙන් ප්‍රවෘත්ත බැවින් එකානුසන්ධිකයයි කියනු ලැබේ.)

අනෙකානුසන්ධිකං, නොඑක් අනුසන්ධි ඇත්තාවූ; (පරිනිබ්බාණ සූත්‍රය ආදිවූ) යං, යම් සූත්‍රයෙක් වේද; තත්‍ථ, එහි; අනුසන්ධිවසෙන, අනුසන්ධිවශයෙන්; ධම්මක්ඛන්ධගණනා, ධර්මස්කන්ධයන්ගේ ගණන (වෙත්;) (එහි පරිනිර්වාණසූත්‍රය නානාස්ථානයන්හි නොඑක් ධර්මදෙශනාවන්ගේ වශයෙන් පැවති බැගින් අනෙකානුසන්ධිකයයි කියනුලැබේ.) ගාථාබන්ධෙසු, ගාථාබන්ධයන්හි; පඤ්හපුච්ඡනං, (කති ඡින්දෙ කති ජහෙ යනාදි නයප්‍රවෘත්ති) ප්‍රශ්නවිචාරීම; එකො ධම්මක්ඛන්ධො, එක් ධර්මස්කන්ධයෙක් නම් වේ; විස්සජ්ජනං, (පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ යනාදි නයප්‍රවෘත්ති) විසර්ජනය තෙම; එකො, එක්ධර්මස්කන්ධයෙක් වේ; අභිධම්මෙ, අභිධර්මයෙහි; එකමෙකං, එක එක; තිකදුකභාජනං, (ධර්මසඞ්ගණියෙහි නික්ෂේපකාණ්ඩ අට්ඨකථා කාණ්ඩ වශයෙන්) තිකභාජනය දුකභාජනය; එකමෙකඤ්ච, එකඑකද; චිත්තවාරභාජනං, (චිත්තොත්පාද කාණ්ඩවශයෙන්) චිත්තවාරභාජනය; එකමෙකො ධම්මක්ඛන්ධො, එක එක ධර්මස්කන්ධයෙක් නම් වේ; විනයෙ, විනයෙහි; වත්‍ථු අත්‍ථි, සුදින්නකාණ්ඩාදිය ඇත්තේය; මාතිකා අත්‍ථි, (යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො යනාදීන් ඒ ඒ අධ්‍යාචාරය

අත්ථි අනන්තරාපත්ති අත්ථි අනාපත්ති අත්ථි තිකපරිච්ඡෙදො, තත්ථ එක මෙකො කොට්ඨාසො එකමෙකො ධම්මක්ඛන්ධොති වෙදිතබ්බො, එවං ධම්මක්ඛන්ධවසෙන චතුරාසීතිසහස්සවිධං.

එවමෙතං අභෙදතො රසවසෙන එකවිධං භෙදතො ධම්ම විනයාදිවසෙන දුවිධාදිභෙදං බුද්ධවචනං සඞ්ගායන්තෙන මහාකස්සප පමුඛෙන වසීගණෙන අයං ධම්මො අයං විනයො ඉදං පඨමබුද්ධවචනං ඉදං මජ්ඣිමබුද්ධවචනං ඉදං පච්ඡිමබුද්ධවචනං ඉදං විනයපිටකං ඉදං සුත්තන්තපිටකං ඉදං අභිධම්මපිටකං අයං දීඝනිකායො-පෙ-අයං ඛුද්දක

---

නිමිත්තකොට ගෙණ පණවනලද ශික්ෂාපද සඞ්ඛ්‍යාත) මාතෘකාව ඇත්තීය; පදභාජනියං අත්ථි (ඒ ඒ ශික්ෂාපදයන්ගේ **යො පනා ති, යො යාදිසො** යනාදි නයප්‍රවෘත් විභජනසඞ්ඛ්‍යාත) පදභාජනිය ඇත් තේය; අනන්තරාපත්ති අත්ථි, ("පටිලාතං උක්ඛිපති ආපත්ති දුක්කටස්ස" යනාදීන් සිකපද අතුරෙහි මොනවට පණවනලද) අනන්තරාපත්ති ඇත්තේය; අනාපත්ති අත්ථි, ("අනාපත්ති අජානන්තස්ස අසාදි යන්තස්ස උම්මත්තකස්ස ඛිත්තචිත්තස්ස වෙදනට්ටස්ස ආදිකම්මි කස්ස" යනාදි නයප්‍රවෘත් අනාපත්තිවාරය ඇත්තේය; තිකපරිච්ඡෙදො අත්ථි, ("දසාහාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී නිස්සග්ගියං පාචිත්තියං, දසාහාතික්කන්තෙ වෙමතිකො නිස්සග්ගියං පාචිත්තියං, දසාහා තික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී නිස්සග්ගියං" යනාදී නයප්‍රවෘත්) තිකපරිච්ඡෙද ඇත්තේය; තත්ථ, එහි; එකමෙකො කොට්ඨාසො, එක එක කොටසෙක් තෙම; එකමෙකො ධම්මක්ඛන්ධොති, එක එක ධර්මස්කන්ධයෙක්යයි; වෙදිතබ්බො, දතයුත්තේය; ධම්මක්ඛන්ධ වසෙන, ධර්මස්කන්ධවශයෙන්; චතුරාසීති සහස්සවිධං, සුවාසූදහස් වැදෑ රුම්වූයේ; එවං, මෙසේයි;

එවං, මෙසේ; අභෙදතො, අභෙදයෙන්; රසවසෙන, රසවශ යෙන්; එකවිධං, එක්වැදෑරුම්වූ; භෙදතො, භෙදයෙන්; ධම්මවිනයාදි වසෙන, ධර්මවිනයාදි වශයෙන්; දුවිධාදිභෙදං, ද්විප්‍රකාරාදිභෙදවූ; එතං බුද්ධවචනං, මේ බුද්ධවචනය තෙම; සඞ්ගායන්තෙන, සඞ්ගායනා කරණුවූ; මහාකස්සපපමුඛෙන, මහාකසුප්පෙරටුවූ; වසීගණෙන, වසීගණයා විසින්; අයං ධම්මො, මේ ධර්මයෑ; අයං විනයො, මේ විනයයෑ; ඉදං පඨමබුද්ධවචනං මේ ප්‍රථම බුද්ධවචනයෑ; ඉදං මජ්ඣිමබුද්ධවචනං, මේ මධ්‍යමබුද්ධවචනයෑ; ඉදං පච්ඡිමබුද්ධවචනං, මේ පශ්චිමබුද්ධවචනයෑ; ඉදං විනයපිටකං, මේ විනයපිටකයෑ; ඉදං සුත්තන්තපිටකං, මේ සූත්‍රපිට කයෑ; ඉදං අභිධම්මපිටකං, මේ අභිධර්මපිටකයෑ; අයං දීඝනිකායො, මේ දීර්ඝනිකායයෑ; -පෙ-අයං ඛුද්දකනිකායො, මේ ඛුද්දකනිකායයෑ;

නිකායො, ඉමානි සුත්තාදීනි නවඞ්ගානි ඉමානි චතුරාසීති ධම්මක්ඛන්ධ සහස්සානීති ඉමං පභෙදං වවත්ථපෙත්වාව සඞ්ගීතං,

න කෙවලං එත්තකමෙව අඤ්ඤම්පි උද්දානසඞ්ගහ වග්ගසඞ්ගහ පෙය්‍යාලසඞ්ගහ එකනිපාත දුකනිපාත ආදි නිපාතසඞ්ගහ සංයුත්ත සඞ්ගහ පණ්ණාසකසඞ්ගහාදිමනෙකවිධං තීසු පිටකෙසු සන්දිස්සමානං සඞ්ගහප්පභෙදං වවත්ථපෙත්වා එවං සත්තහි මාසෙහි සඞ්ගීතං, සඞ්ගීති පරියොසානෙ චස්ස ඉදං මහාකස්සපත්ථෙරෙන දසබලස්ස සාසනං

---

ඉමානි සුත්තාදීනි, මේ සූත්‍රාදීහු; නවඞ්ගානි, අඞ්ග නවයෙක් වෙත්; ඉමානි, මේ සූත්‍රාදීහු; චතුරාසීතිධම්මක්ඛන්ධසහස්සානීති, සුවාසූදහසක් ධර්මස්කන්ධයෝයයි; ඉමං පභෙදං වවත්ථපෙත්වාව, මේ ප්‍රභෙදය ව්‍යවස්ථාකොටම; සඞ්ගීතං, (බුද්ධවචනය) සඞ්ගායනා කරණලද්දේය;

න කෙවලං එත්තකං එව, කෙවලව මෙපමණක්ම සඞ්ගායනා කරණලද්දේ නොවේ; අඤ්ඤම්පි, අන්‍යවූද; උද්දානසඞ්ගහ, (ප්‍රථම පාරාජිකාදීන් අතුරෙහි අවාවූ විනීතවත්ථු ආදිය සංක්ෂෙපවශයෙන් ධර්මසඞ්ග්‍රාහකයන් විසින් **මක්කටීවජ්ජිපුත්තා** යනාදීන් දක්වනලද) උද්දානසඞ්ග්‍රහගාථාය; වග්ගසඞ්ගහ, (ශීලස්කන්ධවර්ගී මූලපරියාය වර්ගීවශයෙන් සඞ්ග්‍රහකරණලද) වර්ගීසඞ්ග්‍රහවය;· පෙය්‍යාලසඞ්ගහ, (උත්තරිමනුෂ්‍යධර්මපෙය්‍යාල චක්‍රපෙය්‍යාලාදීන්ගේ ව්‍යවස්ථාපන වශයෙන්) පෙය්‍යාලසඞ්ග්‍රහවය; එකනිපාත දුකනිපාත ආදි, (අඞ්ගුත්තරනිකාය යෙහි) එකනිපාත දුකනිපාත ආදීවූ; නිපාතසඞ්ගහ, නිපාතසඞ්ග්‍රහවය; සංයුත්තසඞ්ගහ, (සංයුත්තනිකායෙහි දෙවතාසංයුක්තාදි වශයෙන්) සංයුක්තසඞ්ග්‍රහවය; පණ්ණාසකසඞ්ගහාදි, (මධ්‍යමනිකාදියෙහි මූල පණ්ණාසකාදි වශයෙන්) පණ්ණාසකසඞ්ග්‍රහව ආදි; අනෙකවිධං, අනෙකප්‍රකාරවූ; තීසු පිටකෙසු සන්දිස්සමානං, තුන්පිටකයන්හි දක්නාලද්දාවූ; සඞ්ගහප්පභෙදං, සඞ්ග්‍රහප්‍රභෙදය; වවත්ථපෙත්වා, ව්‍යවස්ථා කොට; එවං, මෙසේ; සත්තහි මාසෙහි, සත්මසකින්; සඞ්ගීතං, සඞ්ගායනා කරණලද්දේය; අස්ස, මේ බුද්ධවචනයාගේ; සඞ්ගීතිපරියොසානෙව, සඞ්ගීතිපර්‍ය්‍යවසානයෙහිද; මහාකස්සපත්ථෙරෙන, මහකසුප් තෙරහු විසින්; දසබලස්ස, දසබුල්හුගේ; ඉදං සාසනං, මේ සස්න; පඤ්චවස්සසහස්සපරිමාණං කාලං, පන්දහසක් හවුරුදු පමණකල්; පවත්තනසමත්ථං කතන්ති, පැවතීමට සමර්ථකරණලද්දේයයි; සඤ්ජාතප්පමොදා, උපන් ප්‍රමොද්‍ය ඇතිව; අයං මහාපඨවී, මේ මහාපෘථිවි තොමෝ; සාධුකාරං දදමානා විය, සාධුකාර දෙන්නියක් මෙන්; උදකපරියන්තං කත්වා, ජලය කෙළවරකොට; අනෙකප්පකාරං නොයෙක් ආකාරයෙන්; සඞ්කම්පි, (උඩට උඩට යමින්) මනාකොට කම්පාවූය; සම්පකම්පි, (උඩට යටට යෙමින්) මනාකොට කම්පාවූය;

පඤ්චවස්සසහස්සපරිමාණං කාලං පවත්තන සමත්ථං කතන්ති සඤ්ජාතප්පමොදා සාධුකාරං විය දදමානා අයං මහාපඨවී උදකපරියන්තං කත්වා අනෙකප්පකාරං සඞ්කම්පි සම්පකම්පි සම්පවෙධි අනෙකානිච අච්ඡරියානි පාතුරහෙසුන්ති.

**අයං පඨමමහාසඞ්ගීති නාම-**

යා ලොකො:—

**සතෙහි පඤ්චහි කතා-තෙන පඤ්චසතාති ච,**
**ථෙරෙහෙව කතත්තා ච-ථෙරිකාති පවුච්චතීති.**

**පඨම මහාසඞ්ගීති නිට්ඨිතා.**

---

සම්පවෙධි, (සිව්දිසාවන්හි යමින්) මොනවට චලනයවූය; අනෙකානිච අච්ඡරියානි, (අසුරුගැසිමට යුතුවූ මල්වෂිආදී) අනෙකප්‍රකාරවූ ආශ්චර්‍ය්‍යයෝ; පාතුරහෙසුන්ති, පහළවූවාහුයය;

අයං, මේ; පඨමහාසඞ්ගීතිනාම, ප්‍රථමමහාසඞ්ගීති නම් වන්තීය;

ලොකෙ, ලෙව්හි; යා, යම් (ඒ ප්‍රථම මහා) සඞ්ගායනාවක් තොමෝ;

පඤ්චහි සතෙහි, (මහාකාශ්‍යපස්ථවිරාදී) පන්සියයක් රහතුන් විසින්; කතා, කරණලද්දද; තෙන, ඒ කරණකොට; පඤ්චසතාතිච, පඤ්චසතා යයිද; ථෙරෙහි එව, තෙරුන් විසින්මැ; කතත්තා, කරණලද බැවින්; ථෙරිකාතිච, ථෙරිකා යයිද; පවුච්චති, කියනුලබා යයි.

**පඨමමහාසඞ්ගීති, ප්‍රථමමහාසඞ්ගායනාතොමෝ;**
**නිට්ඨිතා, නිමියාය.**

ඉමිස්සා පඨමමහාසඞ්ගීතියා වත්තමානාය විනයං පුච්ඡන්තෙන ආයස්මතා මහාකස්සපෙන 'පඨමං ආවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්ත''න්ති එවමාදිවචනපරියොසානෙ ''වත්ථුම්පි පුච්ඡි නිදානම්පි පුච්ඡි පුග්ගලම්පි පුච්ඡී''ති එත්ථ නිදානෙ පුච්ඡිතෙ තං නිදානං ආදිතොප්පභුති විත්ථාරෙන්තො යෙන ච පඤ්ඤත්තං යස්මා ච පඤ්ඤත්තං සබ්බමෙතං කථෙතුකාමෙන ආයස්මතා උපාලිත්ථෙරෙන වුත්තං: ''තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරතී''ති සබ්බං වත්තබ්බං, එවමිදං ආයස්මතා උපාලිත්ථෙරෙන වුත්තං, තඤ්ච පන පඨමමහාසඞ්ගීතිකාලෙ වුත්තන්ති වෙදිතබ්බං.

එත්තාවතාච ''ඉදං වචනං කෙන වුත්තං කදා ච වුත්ත''න්ති එතෙසං පදානං අත්ථො පකාසිතො හොති.

---

(මෙසේ ප්‍රථම මහාසඞ්ගායනාව දක්වා යම් අවියක් සඳහා ඕතොමෝ මෙහි දක්වන ලද්ද නිගමන වශයෙන් ඒ දක්වනුයේ ඉමිස්සා යී ආදි කී.)

ඉමිස්සා පඨමමහාසඞ්ගීතියා පවත්තමානාය පන, මේ ප්‍රථම මහා සඞ්ගායනාව පවත්නා කල්හි වනාහි; විනයං පුච්ඡන්තෙන, විනය විචාරන්නාවූ; ආයස්මතා මහාකස්සපෙන, ආයුෂ්මත් මහකසුප් තෙරහු විසින්; පඨමං, පළමුකොට; ආවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති එවමාදිවචනපරියොසානෙ, ආවුසො උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තං යන මේ ආදිවචනයන්ගේ කෙළවරෙහි; වත්ථුම්පි පුච්ඡි නිදානම්පි පුච්ඡි පුග්ගලම්පි පුච්ඡීති එත්ථ, වත්ථුම්පි පුච්ඡි නිදානම්පි පුච්ඡි පුග්ගලම්පි පුච්ඡි යන මෙහි; නිදානෙ පුච්ඡිතෙ, නිදානය විචාළකල්හි; තං නිදානං, ඒ නිදානය; ආදිතොප්පභුති, මුල පටන්; විත්ථාරෙන්තො, විස්තර කොට; යෙන ච පඤ්ඤත්තං, යමෙකු විසින් පණවනලද්දේද; යස්මා ච පඤ්ඤත්තං, යම් හෙයකින් පණවනලද්දේද; එතං සබ්බං කථෙතුකාමෙන, මේ සියල්ල කියනු කැමතිවූ; ආයස්මතා උපාලිත්ථෙරෙන, ආයුෂ්මත් උපාලිතෙරහු විසින්; වුත්තං, කියනලදී; තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරතීති, ''තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති'' යී; සබ්බංවත්තබ්බං, සියල්ල කිය යුත්තේය; එවං, මෙසේ; ඉදං, මේ කථනය; ආයස්මතා උපාලිත්ථෙරෙන, ආයුෂ්මත් උපාලිතෙරහු විසින්; වුත්තං, කියනලදී; තඤ්ච පන, හෙද වනාහි; පඨමමහාසඞ්ගීතිකාලෙ, ප්‍රථම මහාසඞ්ගායනාකාලයෙහි; වුත්තං ඉති, කියන ලද්දේයයි; වෙදිතබ්බං, දතයුත්තේය;

එත්තාවතාච, මෙපමණකින්ද; ඉදං වචනං, මේ වචනය; කෙන වුත්තං, කවරක්හු විසින් කියනලද්දේද; කදාච වුත්තන්ති, කවර කාලෙක්හි කියනලද්දේදැයි; එතෙසං පදානං, මේ පදයන්ගේ; අත්ථො, අර්ථය තෙමේ; පකාසිතො හොති, ප්‍රකාශකරණ ලද්දේවේ;

ඉදානි "කස්මා වුත්ත"න්ති එත්ථ වුච්චතෙ: යස්මා අයමායස්මා උපාලි ආයස්මතා මහාකස්සපත්ථෙරෙන නිදානං පුට්ඨො තස්මා තෙන තං නිදානං ආදිතොප්පභුති විත්ථාරෙතුං වුත්තන්ති. එවම්දං ආයස්මතා උපාලිත්ථෙරෙන පඨමමහාසඞ්ගීතිකාලෙ වදන්තෙනාපි ඉමිනා කාරණෙන වුත්තන්ති වෙදිතබ්බං.

එත්තාවතා ච "වුත්තං යෙන යදා යස්මා"ති ඉමෙසං මාතිකාපදානං අත්ථො පකාසිතො හොති.

ඉදානි "ධාරිතං යෙන චාභතං, යත්ථප්පතිට්ඨිතඤ්චෙතමෙතං වත්වා විධිං තතො"ති එතෙසං අත්ථප්පකාසනත්ථං ඉදං වුච්චති, තම්පනෙතං: "තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරතී"ති එවමාදිවචනපතිමණ්ඩිතනිදානං විනයපිටකං කෙන ධාරිතං කෙනාභතං කත්ථප්පතිට්ඨිතන්ති, වුච්චතෙ:

---

ඉදානි, දැන්; කස්මා, කුමක්හෙයින්; වුත්තන්ති, කියනලද්දේදැයි; එත්ථ වුච්චතෙ, මෙහි කියනුලැබේ; යස්මා, යම් හෙයකින්; අයං ආයස්මා, උපාලි, මේ ආයුෂ්මත් උපාලිතෙමේ; ආයස්මතා මහාකස්සපත්ථෙරෙන, ආයුෂ්මත් මහකසුප්තෙරහු විසින්; නිදානං, නිදානය; පුට්ඨො, විචාරණ ලද්දේද; තස්මා, එහෙයින්; තෙන, ඔහු විසින්; තං නිදානං, ඒ නිදානය; ආදිතොප්පභුති, මුල පටන්; විත්ථාරෙතුං, විස්තරකරණ පිණිස; වුත්තන්ති, කියන ලද්දේයයි; එවං, මෙසේ; ඉදං, මේ විස්තරය; පඨමමහාසඞ්ගීතිකාලෙ, ප්‍රථම මහාසඞ්ගීතිකාලයෙහි; වදන්තෙනාපි, කියන්නාවූද; ආයස්මතා උපාලිත්ථෙරෙන, ආයුෂ්මත් උපාලිතෙරහු විසින්; ඉමිනා කාරණෙන, මේ කාරණය කරණකොට; වුත්තන්ති, කියන ලද්දේයයි; වෙදිතබ්බං, දතයුත්තේය.

එත්තාවතාච, මෙපමණකින්ද; වුත්තං යෙන යදා යස්මා'ති, වුත්තං යෙන යදා යස්මා යන; මාතිකාපදානං, මේ මාතෘකා පදයන්ගේ; අත්ථො, අර්ථයතෙම; පකාසිතො හොති, ප්‍රකාශකරණලද්දේ වේ.

ඉදානි, දැන්; "ධාරිතං යෙන චාභතං යත්ථප්පතිට්ඨිතං චෙතමෙතං වත්වා විධිං තතො" යන එතෙසං, මොවුන්ගේ; අත්ථප්පකාසනත්ථං, අර්ථය ප්‍රකාශකරණු පිණිස; ඉදං වුච්චති, මේ කියනුලැබේ; තං පනෙතං, ඒ මේ කථනය වනාහි; තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරතීති "තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති" යන; එවමාදි වචනපතිමණ්ඩිත නිදානං විනයපිටකං, මේ ආදි වචනයන්ගෙන් ප්‍රතිමණ්ඩිතවූ නිදානය ඇති විනයපිටකයතෙම; කෙන ධාරිතං, කවරක්හු විසින් දරණලද්දේද; කෙනාභතං, කවරක්හු විසින් ගෙණඑන ලද්දේද; කත්ථප්පතිට්ඨිතංති, කවරෙකු කෙරෙහි පිහිටියේදැයි; වුච්චතෙ, කියනු ලැබේ;

ආදිතො තාව ඉදං භගවතො සම්මුඛා ආයස්මතා උපාලිත්ථෙරෙන ධාරිතං, තස්ස සම්මුඛතො අපරිනිබ්බුතෙ තථාගතෙ ඡළභිඤ්ඤාදිභෙදෙහි අනෙකෙහි භික්ඛුසහස්සෙහි පරිනිබ්බුතෙ තථාගතෙ මහාකස්සපපමුඛෙහි ධම්මසඞ්ගාහකත්ථෙරෙහි.

"කෙනාභත"න්ති? ජම්බුදීපෙ තාව උපාලිත්ථෙරමාදිං කත්වා ආචරියපරම්පරාය යාව තතියසඞ්ගීති තාව ආභතං. තත්‍රායං ආචරියපරම්පරා:-

**උපාලි දාසකො චෙව-සොණකො සිග්ගවො තථා,**
**තිස්සො මොග්ගලිපුත්තො-ච පඤ්චෙතෙ විජිතාවිනො.**
**පරම්පරාය විනයං-දීපෙ ජම්බුසිරිව්හයෙ,**
**අච්ඡිජ්ජමානං ආනෙසුං-තතියො යාව සඞ්ගහො.**

---

ආදිතො, ආදියෙහිදී; තාව, පළමුකොට; ඉදං, මේ විනයපිටකය තෙම; භගවතො සම්මුඛා, භාග්‍යවත්හුගේ හමුයෙන්; ආයස්මතා උපාලිත්ථෙරෙන, ආයුෂ්මත් උපාලිතෙරහු විසින්; ධාරිතං, ධරණ ලද්දේය; තස්ස සම්මුඛතො, ඒ උපාලිතෙරහුගේ හමුයෙන්; තථාගතෙ අපරිනිබ්බුතෙ, තථාගතයන් පිරිනොනිවිකල්හි; ඡළභිඤ්ඤාදිභෙදෙහි, ෂඩභිඥාදිප්‍රභෙද ඇති; අනෙකෙහි භික්ඛුසහස්සෙහි, නොඑක් දහස් ගණන් භික්ෂූන් විසින් (ධරණලද්දේය); තථාගතෙ පරිනිබ්බුතෙ, තථාගතයන් පිරිනිවිකල්හි; මහාකස්සපපමුඛෙහි, මහකසුප් ප්‍රමුඛවූ; ධම්මසඞ්ගාහකත්ථෙරෙහි, ධර්මසඞ්ග්‍රාහක ස්ථවිරයන් විසින් (ධරණ ලද්දේය ;

කෙනාභතන්ති, කවරෙකු විසින් ගෙණ එනලද්දේදැයි; ජම්බුදීපෙ, ජම්බුද්වීපයෙහි; (තාවයනු නිපාතමාත්‍රයෙකි) උපාලිත්ථෙරමාදිං කත්වා, උපාලි ස්ථවිරයන් ආදි කොට; ආචරියපරම්පරාය, ආචාර්‍ය්‍යපරම්පරාව විසින්; යාවතතියසඞ්ගීති, යම්තාක් තෘතීයසඞ්ගායනාවද; තාව, ඒතාක්; ආභතං, ගෙණඑන ලද්දේය; තත්‍ර, එහි; අයං ආචරියපරම්පරා, මේ ආචාර්‍ය්‍යපරම්පරාවයි;

උපාලි, උපාලිස්ථවිරතෙමේද; දාසකො චෙව, දාසකස්ථවිර තෙමේද; සොණකො, සොණක ස්ථවිරතෙමේද; සිග්ගවො, සිග්ගව ස්ථවිරතෙමේද; තථා, එසේ; තිස්සොමොග්ගලිපුත්තොච, තිස්ස නම් මොග්ගලිපුත්තස්ථවිරතෙමේද යන; විජිතාවිනො, ජයගන්නාලද සියලු කෙලෙසුන් ඇත්තාවූ; එතෙපඤ්ච, මේ පස්තෙරහු;

පරම්පරාය, පරම්පරා වශයෙන්; විනයං, විනය; ජම්බුසිරිව්හයෙදීපෙ, ජම්බුද්වීපයෙහි; අච්ඡිජ්ජමානං, නොසිඳිනුලද්දක් කොට; යාවතතියො සඞ්ගහො, තෘතීයසඞ්ගායනාව දක්වා; ආනෙසුං, ගෙණාවාහුය;

ආයස්මාහි උපාලි ඉමං විනයවංසං විනයතන්තිං විනයපවෙණිං භගවතො සම්මුඛා උග්ගහෙත්වා බහුන්නං භික්ඛූනං හදයෙ පතිට්ඨාපෙසි,

තස්ස හායස්මතො සන්තිකෙ විනයං උග්ගහෙත්වා විනයෙ පකතඤ්ඤුතං පත්තෙසු පුග්ගලෙසු පුථුජ්ජනසොතාපන්නසකදාගාමි අනාගාමිනො ගණපථං වීතිවත්තා, ඛීණාසවානං සහස්සමෙකං අහොසි,

දාසකත්ථෙරොපි තස්සෙව සද්ධිවිහාරිකො අහොසි. සො උපාලිත්ථෙරස්ස සම්මුඛා උග්ගහෙත්වා තථෙව විනයං වාචෙසි, තස්සාපි

---

ආයස්මාහි උපාලි, ආයුෂ්මත් උපාලිතෙමේ වනාහි; ඉමං, මේ; විනයවංසං, විනයවංශය; විනයතන්තිං, විනයපෙළ; විනයපවෙණිං, විනයප්‍රවෙණිය; භගවතො සම්මුඛා, භාග්‍යවත්හුගේ හමුයෙන්; උග්ගහෙත්වා, ඉගෙණ; බහුන්නං භික්ඛූනං, බොහෝභික්ෂූන්ගේ; හදයෙ, හෘදයෙහි; පතිඨාපෙසි, පිහිටවූයේය;

තස්සහි ආයස්මතො සන්තිකෙ, එම ආයුෂ්මත්හුගේ සමීපයෙහි; විනයං උග්ගහෙත්වා, විනය ඉගෙණ; විනයෙ, විනයෙහි; පකතඤ්ඤුතං පත්තෙසු, ව්‍යක්ත බවට පැමිණියාවූ; පුග්ගලෙසු, පුද්ගලන් අතුරෙන්; පුථුජ්ජනසොතාපන්නපකදාගාමිඅනාගාමිනො, පෘථග්ජන සෝවාන් සකෘදාගාමි අනාගාමිහු; ගණනපථං, සඞ්ඛ්‍යාපථය; වීතිවත්තා, ඉක්මෙවුවාහුය; ඛීණාසවානං, රහතුන්ගෙන්; එකං සහස්සං අහොසි, එක් දහසෙක් වූයේය;

දාසකත්ථෙරොපි, දාසක ස්ථවිර තෙමේද; තස්සෙව, ඒ උපාලි ස්ථවිරයන්ගේම; සද්ධිවිහාරිකො අහොසි, සද්ධිවිහාරිකයෙක් වූයේය;

(දාසක ස්ථවිරතෙම උපාලි ස්ථවිරයන් වහන්සේගේ සද්ධිවිහාරිකවූයේ කෙසේදයත්?:—

විසාලාමහනුවර **දාසක** නම් එක් බමුණුකුමාරයෙක් තෙමේ තමන් ආචාර්‍ය්‍යයන් සමීපයෙහි තුන්සියයක් අතවැසියන්ට ජ්‍යෙෂ්ඨයෙක්ව ශිල්ප ඉගෙණගණුයේ, දෙලොස් හැවිරිදි ඇතිවම වෙදත්‍රයයෙහි පරතෙරට පැමිණවසනුයේ, එක් දවසක් අතැවැසියන් විසින් පිරිවරණලදුව වාලුකාරාමයෙහි වසන උපාලිතෙරහු කරා පැමිණ ත්‍රිවෙදයෙහි ග්‍රන්ථිස්ථානයන් විචාළේය, එකල උපාලිස්ථවිරතෙමේ ඔහු විසින් විචාරණලද සියල්ල ප්‍රකාශකොට තමාද **"නාමය"** සඳහා එක්පැනයක් විචාරණුයේ, මාණවකය! එක් ධර්මයක් තෙමේ සියලු ධර්මයන්හි පතනය වේ, මාණවකය! සියලු ධර්මයෝ එක් ධර්මයෙක්හි රැස්වෙත්, මාණවකය! ඒ ධර්මය කවරේදැයි විචාළේය.

ඒ මාණවකතෙමේත් ප්‍රශනයෙහි අර්ථ නොදනුයේ ප්‍රව්‍රජිතය! මේ කිමෙක්දැ"යි. විචාළේය. මාණවකය! "මේ බුද්ධමන්ත්‍රය නම, ඊන්වහ්! මටත් දෙන්ට හැකිදැ"යි? මාණවකය! අප විසින් ගන්නාලද ප්‍රව්‍රජ්‍යාව ගන්නෙක්හටදෙන්ට හැකියයි කිකල්හි මැනව ප්‍රව්‍රජිතය"යි

ආයස්මතො සන්තිකෙ උග්ගහෙත්වා විනයෙ පකතඤ්ඤුතං පත්තා පුථුජ්ජනාදයො ගණනපථං වීතිවත්තා, ඛීණාසවානං සහස්සමෙව අහොසි.

සොනකත්ථෙරො පන දාසකත්ථෙරස්ස සද්ධිවිහාරිකො අහොසි, සොපි අත්තනො උපජ්ඣායස්ස දාසකත්ථෙරස්ස සම්මුඛා උග්ගහෙත්වා

---

කියා මාණවකතෙමේ එම වචනය පිළිගෙණ තමාගේ දෙමවුපියන් ගුරුවරයන්ට කියා තුන්සියයක් අතැවැසියන් සමග තෙරහු වෙත පැවිදිව පරිපූර්ණවිසිවයස් ඇතියේ උපසම්පදාව ලැබ රහත්බවට පැමිණියේය. ස්ථවිරතෙමේ ඔහු ධුරකොට රහතුන් දහසකට පිටකත්‍රය පුහුණු කරවූයේය. උපාලි ස්ථවිරයන්ට දාසක ස්ථවිරතෙමේ සද්ධිවිහාරිකයෙක්වූ පරිදි මෙසේ දතයුතු.)

සො, ඒ දාසකස්ථවිරතෙමේ; උපාලිත්ථෙරස්ස සම්මුඛා, උපාලි ස්ථවිරයන්ගේ හමුයෙන්; උග්ගහෙත්වා, ඉගෙණ; තථෙව, එසේම; විනයං වාචෙසි, විනය කියවූයේය; තස්සාපි ආයස්මතො සන්තිකෙ, හෙද ආයුෂ්මත්හුගේ සමීපයෙහි; උග්ගහෙත්වා, ඉගෙණ; විනයෙ, විනයෙහි; පකතඤ්ඤුතං පත්තා, ව්‍යක්තබවට පැමිණියාවූ; පුථුජ්ජනාදයො, පෘථග්ජනාදීහු; ගණනපථං වීතිවත්තා, සඞ්ඛ්‍යාපථය ඉක්මෙවූවාහුය; ඛීණාසවානං, රහතුන්ගෙන්; සහස්සං එව අහොසි, දහසෙක්ම වූයේය;

සොනකත්ථෙරො පන, සොනකස්ථවිරතෙම වනාහි; දාසකත්ථෙරස්ස, දාසකස්ථවිරයන් වහන්සේගේ; සද්ධිවිහාරිකො අහොසි සද්ධිවිහාරිකයෙක් වූයේය;

(සොනකස්ථවිරයන් වහන්සේ දාසකස්ථවිරයන්ට සද්ධිවිහාරිකවූ පරිදි කිසේයත්?:—

ඒ සොනක ස්ථවිරතෙමේ කසීරට එක්වෙළෙඳෙකුට පුත්‍රයෙක්ව පසළොස් හැවිරිදිවූයේ එක් කාලයෙක්හි මවුපියන් සමග වෙළඳාම් පිණිස රජගහනුවරට ගියේ, තවත් පණස්පස් දෙනෙක් ළදරුවන් සමග වෙළුවනාරාමයට ගොස් එහි පිරිස් සහිත දාසකස්ථවිරයන් වහන්සේ දැක, ඉතා ප්‍රසන්නවූයේ ප්‍රව්‍රජ්‍යාවට යාච්ඤාකොට තෙරහු විසින් මවුපියන්ට කියා පැවිදි වෙවයි කී කල්හි මවුපියන්ගේ සමීපයට ගොස් ඒ බව සැලකොට ඔවුන් නොකැමතිවූ කල්හිද ආහාරූපච්ඡේදය කොට හිඳ මවුපියන් අනුදන්වා සෙසු ළදරුවන් පනස්පස්දෙනාද සමග තෙරහු වෙත පැවිදිව ලබනලද උපසම්පදා ඇතිව රහත්බවට පැමිණියේය, ස්ථවිරතෙමේ ඔහට සියලුම බුද්ධවචනයන් ඉගැන්වූයේය, හෙතෙමේද ගණජ්‍යෙෂ්ඨයෙක්ව බොහෝ භික්ෂූන්ට ධර්මවිනය පුහුණුකරවූයේය. සොනකස්ථවිරතෙමේ දාසකස්ථවිරයන්ට සද්ධිවිහාරිකවූ පරිදි මෙසේ දතයුතු )

තථෙව විනයං වාචෙසි, තස්සාපි ආයස්මතො සන්තිකෙ උග්ගහෙත්වා විනයෙ පකතඤ්ඤුතං පත්තා පුථුජ්ජනාදයො ගණනපථංවීතිවත්තා, ඛීණාසවානං සහස්සමෙව අහොසි.

සිග්ගවත්ථෙරොපි සොනකත්ථෙරස්ස සද්ධිවිහාරිකො ථෙරස්ස සන්තිකෙ විනයං උග්ගහෙත්වා අරහත්තසහස්සස්ස ධුරග්ගාහො අහොසි,

---

සොපි, ඒ සොනක ස්ථවිරතෙමේද; අත්තනො උපජ්ඣායස්ස, තමාගේ උපාධ්‍යායවූ; දාසකත්ථෙරස්ස සම්මුඛා, දාසක ස්ථවිරයන්ගේ හමුයෙන්; උග්ගහෙත්වා, ඉගෙණ; තථෙව, එසේම; විනයං වාචෙසි, විනයකියවූයේය; තස්සාපි ආයස්මතො සන්තිකෙ, හෙද ආයුෂ්මත්හුගේ සමීපයෙහි; උග්ගහෙත්වා, ඉගෙණ; විනයෙ, විනයෙහි; පකතඤ්ඤුතං පත්තා, ව්‍යක්තබවට පැමිණියාවූ; පුථුජ්ජනාදයො, පෘථග්ජනාදීහු; ගණනපථං, සඞ්ඛ්‍යාපථය; වීතිවත්තා, ඉක්මෙවුවාහුය; ඛීණාසවානං, රහතුන්ගෙන්; සහස්සං එව අහොසි, දහසෙක්ම වූයේය;

සිග්ගවත්ථෙරොපි. සිග්ගවස්ථවිරතෙමේද; සොනකත්ථෙරස්ස, සොනක ස්ථවිරයන්ගේ; සද්ධිවිහාරිකො, සද්ධිවිහාරිකයෙක් වූයේ;

(සිග්ගවස්ථවිරතෙමේ සොනක ස්ථවිරයන්ට සද්ධිවිහාරිකවූ පරිදි කිසේයයත්?:

හෙතෙමේ වනාහි පැලළුප්නුවර සිග්ගව නම් අමාත්‍යපුත්‍රයෙක්ව තුන් සෘතූන්ට සුදුසුවූ තුන්පහයෙහි සම්පත් අනුභවකරණුයේ එක් දවසක් තමාගේ යහළුවූ චණ්ඩවජ්ජි සිටුපුත්‍රයා සමග පිරිවර සහිතව කුක්කුටාරාමයට ගොස් එහි නිරොධසමාපත්තියට සමවැද හුන් සොනක ස්ථවිරයන් දැක නමස්කාර කොට තමා සමග කථානොකරන්නේයයි දැන, ස්වාමීනි කිමෙක්ද? සොනක ස්ථවිරයන් වහන්සේ මා හා සමග කථා නොකෙරේදැයි භික්ෂූන්ගෙන් විචාරා සමාපත්තියට සමවන්නාහු කථා නොකෙරෙත්යයි භික්ෂූන් විසින් කියනලද්දේ, ස්වාමීන්වහන්ස! සමවතින් නැගිටීදැ"යි නැවත විචාළ කල්හි කරුණු දන්වා පිරිවර සහිත ඔහුගේ උපනිශ්‍රයසම්පත්තිය දැක භික්ෂූන්ගේ වචනයෙන් නිරොධ සමවතින් නැගිටි සොනක ස්ථවිරයන් වහන්සේ දැක, ස්වාමීන්වහන්ස! කවර කාරණයකින් මා සමග කථානොකෙළේදැයි විචාරා තෙරහු විසින් කුමාරය! අනුභව කටයුත්තක් අනුභව කෙළෙමි"යි කී කල්හි ස්වාමීන්වහන්ස! අප ලවාද ඒ අනුභව කරවන්ට හැකිවන්නේදැයි විචාරා අපවැනියන් කොට අනුභවකරවන්ට හැකියයි කියනලද්දේ, ඒ බව මවුපියන්ට ආරෙචනය කොට ඔවුන් විසින් අනුදන්නා ලදුයේ තමාගේ යහළුවූ චණ්ඩවජ්ජි නම් සිටුපුත්‍රයා හා පුරුෂයන් පන්සියයක් සමග සොනක ස්ථවිරයන් වහන්සේ වෙත පැවිදිව උපසම්පද

තස්ස පනායස්මතො සන්තිකෙ උග්ගහෙත්වා විනයෙ පකතඤ්ඤුතං පත්තා පුථුජ්ජනසොතාපන්නසකදාගාමිඅනාගාමිනොපි ඛීණාසවාපි එත්තකානි සතානීතිවා එත්තකානි සහස්සානීතිවා අපරිච්ඡින්නා අහෙසුං, තදා කිර ජම්බුදීපෙ අතිමහාභික්ඛුසමූහො අහොසි. මොග්ගලිපුත්තතිස්සත්ථෙරස්ස පන ආනුභාවො තතියසඞ්ගීතියං පාකටො භවිස්සති. එවමිදං විනයපිටකං ජම්බුදීපෙ තාව ඉමාය ආචරියපරම්පරාය යාව තතියසඞ්ගීති තාව ආභතන්ති වෙදිතබ්බං.

දුතියසඞ්ගීතිවිජානනත්ථං පන අයමනුක්කමො වෙදිතබ්බො. යදා හි:-

---

වූයේය. එහි සිග්ගවද චණ්ඩවජ්ජිද යන දෙදෙනාවහන්සේගේ උපාධ්‍යායවූ සොනක ස්ථවිරයන් වහන්සේගේ සමීපයෙහිම ධර්මවිනය පුහුණුකොට මෑතභාගයෙහි ෂඩභිඥවූවාහුයයි. ඒ සිග්ගව ස්ථවිරයන් වහන්සේ සොනක ස්ථවිරයන්ගේ සද්ධිවිහාරිකවූ පරිදි මෙසේ දතයුතු.)

ථෙරස්ස සන්තිකෙ, සොනක ස්ථවිරයන් වහන්සේගේ සමීපයෙහි; විනයං උග්ගහෙත්වා, විනය ඉගෙණ; අරහන්ත සහස්සස්ස, රහතුන් දහසකට; ධුරග්ගාහො අහොසි, ප්‍රධාන ග්‍රාහියෙක් වූයේය; (සියල්ලන්ට ජ්‍යෙෂ්ඨශ්‍රේෂ්ඨව ගත්තේයයි කියන ලද්දේ වේ.) තස්සායස්මතො පන, ඒ ආයුෂ්මත්හුගේ වනාහි; සන්තිකෙ, සමීපයෙහි; උග්ගහෙත්වා, ඉගෙණ; විනයෙ, විනයයෙහි; පකතඤ්ඤුතං පත්තා, ව්‍යක්තබවට පැමිණියාවූ; පුථුජ්ජනසොතාපන්නසකදාගාමි අනාගාමිනොපි, පෘථග්ජන සෝවාන් සකෘදාගාමි අනාගාමිහුද; ඛීණාසවාපි, රහත්හුද; එත්තකානිසතානීතිවා, මෙපමණසියයයි හෝ; එත්තකානිසහස්සානීතිවා, මෙපමණදහසැයි හෝ; අපරිච්ඡින්නා අහෙසුං, පරිච්ඡෙදයක් නොවූවාහුය; තදා කිර, ඒ කාලයෙහි වනාහි; ජම්බුදීපෙ, දඹදිවෙහි; අතිමහාභික්ඛුසමූහො අහොසි, ඉතා මහත්වූ භික්ෂු සමූහය වූයේය; මොග්ගලිපුත්තතිස්සත්ථෙරස්ස පන, මොග්ගලිපුත්ත තිස්ස ස්ථවිරයන්ගේ වනාහි; ආනුභාවො, අනුභාවය තෙම; තතිය සඞ්ගීතියං, තෘතීය සඞ්ගීතියෙහි; පාකටො භවිස්සති, ප්‍රකටවන්නේය; එවං, මෙසේ; ඉදං විනයපිටකං, මේ විනයපිටකය තෙම; ජම්බුදීපෙ, දඹදිවෙහි; තාව, පළමුකොට; ඉමාය ආචරියපරම්පරාය. මේ ආචාර්‍ය්‍යපරම්පරාව විසින්; යාව තතිය සඞ්ගීති, යම්තාක් තෘතීය සඞ්ගායනාවද; තාව ඒතාක්; ආභතන්ති, ගෙණඑන ලද්දේයයි; වෙදිතබ්බං, දතයුත්තේය;

දුතියසඞ්ගීතිවිජානනත්ථං පන, දෙවනසඞ්ගායනාව දැනගන්නා පිණිස වනාහි; අයං අනුක්කමො, මේ පිළිවෙළතෙම; වෙදිතබ්බො, දතයුත්තේය; යදා හි, යම්කලෙක්හි වනාහි;

**සඞ්ගායිත්වාන සද්ධම්මං - ජොතයිත්වාච සබ්බධි**
**යාව ජීවිතපරියන්තං - ඨත්වා පඤ්චසතාපි තෙ.**
**ඛීණාසවා ජුතිමන්තො - ථෙරා කස්සපආදයො,**
**ඛීණස්නෙහපදීපාව - නිබ්බායිංසු අනාලයා.**

අථානුක්කමෙන ගච්ඡන්තෙසු රත්තින්දිවෙසු වස්සසතපරිනිබ්බුතෙ භගවති වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ වෙසාලියං:-"කප්පති සිඞ්ගිලොණකප්පො, කප්පති ද්වඞ්ගුලකප්පො, කප්පති ගාමන්තරකප්පො, කප්පති ආවාසකප්පො, කප්පති අනුමතිකප්පො, කප්පති ආචිණ්ණකප්පො, කප්පති අමථිතකප්පො, කප්පති ජලොගිං පාතුං, කප්පති

---

සද්ධම්මං, සද්ධර්මය; සඞ්ගායිත්වාන, සඞ්ගායනා කොට; සබ්බධි, සැමතන්හි; ජොතයිත්වා ච, (එම සද්ධර්මය) බබුළුවා ද; ඛීණාසවා, ක්ෂය කරණලද ආශ්‍රවයන් ඇත්තාවූ; ජුතිමන්තො, ප්‍රඥාලොකයෙන් යුක්තවූ; (මහත් ආනුභාව ඇත්තාවූය යන අර්ථයි). අනාලයා, ආලය නැත්තාවූ; කස්සපආදයො, කසුප්තෙර ආදීවූ; පඤ්චසතාපි තෙ ථෙරා, පන්සියයක්ද ඒ තෙරහු; යාවජීවිතපරියන්තං ඨත්වා, ජීවිතාන්තය දක්වා සිට; ඛීණස්නෙහපදීපා ඉව, ක්ෂයවූ තෙල් ඇති ප්‍රදීපයන් මෙන්; නිබ්බායිංසු, අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවියාහුය;

අථ, ඉක්බිත්තෙන්; රත්තින්දිවෙසු, ගච්ඡන්තෙසු, රෑදවල් ඉක්මෙනකල්හි; භගවති භාග්‍යවත්හු; වස්සසතපරිනිබ්බුතෙ, පිරිනිවීමෙන් වසිසියයක් ඉක්මුණුකල්හි; වෙසාලිකා, විසාලා මහනුවරවාසීවූ; වජ්ජිපුත්තකා භික්ඛූ, වැදූරට කුලපුත්‍රවූ භික්ෂූහු; වෙසාලියං, විසාලාමහනුවරෙහි; "සිඞ්ගිලොණකප්පො කප්පති, ශෘඞ්ගයෙන් ලුණුපරිහරණය කොට (අලොණකපිණ්ඩපාතය සමග පරිභොගකරන්ට) කැපවේ; (සන්නිධිය නොකෙරේය" යන අභිප්‍රායයි); ද්වඞ්ගුලකප්පො කප්පති, විඟුල්කල්පය කැපවේ; (දෑඟුල් ඡායාව ඉකුත්කල්හි විකාලයෙහි භොජනය අනුභවකරන්ට කැපය යන අර්ථයි); ගාමන්තරකප්පො කප්පති, ග්‍රාමාන්තරකල්පය කැපවේ; (ග්‍රාමාන්තරයට යන්නෙමියි පවරණලද්දහු විසින් අනතිරික්ත භොජනය අනුභවකරන්ට කැපය" යන අර්ථයි;) ආවාසකප්පො කප්පති, ආවාසකල්පය කැපවේ; (එකසීමාවෙහි නොයෙක් සෙනසුන්හි වෙන් වෙන්ව උපොෂිතාදි සඞ්ඝකර්මකරන්ට වටීය" යන අර්ථයි) අනුමතිකප්පො කප්පති, අනුමති කල්පය කැපවේ; (නොආවුන් නැවත ආකල්හි ඔවුන්ගේ අනුමතිය හෙවත් ඡන්දය ගන්නෙමුයයි; ඔවුන් නො ආකල්හිද, වර්ගකර්මය කොට පසුව අනුමතිගන්ට කැපය වර්ගකර්ම නොවෙයි යන අභිප්‍රායි) ආචිණ්ණකප්පො කප්පති, ආචීර්ණකල්පය කැපවේ; (ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්ගේ ධාර්මිකාවූ හෝ අධාර්මිකාවූහෝ ආචීර්ණය කැපය" යන අර්ථයි හේ වනාහි ධාර්මිකාය කැපය වේ අධාර්මිකාය අකැපයයි දතයුතු) අමථිතකප්පො කප්පති, අමථිතකල්පය

අදසකං නිසීදනං, කප්පති ජාතරූපරජත"න්ති ඉමානි දසවත්ථූනි දීපෙසුං. තෙසං සුසුනාගපුත්තො කාළාසොකො නාම රාජා පක්ඛො අහොසි

තෙන ඛො පන සමයෙන ආයස්මා යසො කාකණ්ඩක පුත්තො වජ්ජීසු චාරිකං චරමානො වෙසාලිකා කිර වජ්ජිපුත්තකා භික්ඛූ වෙසාලියං දසවත්ථූනි දීපෙන්ති'ති සුත්වා නඛොපනෙතං පතිරූපං ය්වාහං දසබලස්ස සාසනවිපත්තිං සුත්වා අප්පොස්සුක්කො භවෙය්‍යං, හන්දාහං අධම්මවාදිනො නිග්ගහෙත්වා ධම්මං දීපෙමීති චින්තෙන්තො යෙන වෙසාලි තදවසරි. තත්‍රසුදං ආයස්මා යසො කාකණ්ඩකපුත්තො වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං,

---

කැපවේ; (යම්කිසිරයක් අනුභව කරණලදුව පවරන ලද්දහු විසින් අනතිරික්ත භොජනය බුදින්ට කැපය යන අදහසි). ජළොගිං පාතුං කප්පති, තරුණසුරාවපානයකරන්ට කැපවේ; මද සම්භාරයන් එක් කොට කරණලද මත්බවට නොපැමිණියාවූ තරුණ සුරාව පානය කරන්ට කැපය යන අභිප්‍රායයි) අදසකං නිසීදනං කප්පති, දවලලූහැති නිසීදනය කැපවේ; ජාතරූපරජතං කප්පති. රන් රිදී මසු කහවණු පිළිගන්ට කැපයයි; ඉමානි දසවත්ථූනි දීපෙසුං, මේ දශවස්තූන් ප්‍රකාශ කළෝ; තෙසං. ඒ වැදූරට කුලපුත්‍ර මහණුන්ට; සුසුනාගපුත්තො සුසුනාගපුත්‍රවූ; කාලාසොකො නාම රාජා, කාලාසොක නම් රජතෙමේ; පක්ඛො අහොසි, පක්ෂවූයේය;

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; කාකණ්ඩක පුත්තො, කාකණ්ඩක නම් බමුණුහුගේ පුත්‍රවූ; ආයස්මා යසො, ආයුෂ්මත් යසස්ථවිරතෙමේ; වජ්ජීසු. වැදූරටෙහි; චාරිකංචරමානො, චාරිකාවෙහි හැසිරෙණුයේ; වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ කිර, විසාලාමහනුවරවාසී වජ්ජිපුත්‍රක භික්ෂූහු වනාහි; වෙසාලියං, විසාලා මහනුවරෙහි දසවත්ථූනි දීපෙන්තීති සුත්වා, දශවස්තූන් ප්‍රකාශ කෙරෙත්ය යනු අසා; යො අහං ඒ මම; දසබලස්ස සාසනවිපත්තිං සුත්වා. දසබලුන්හුගේ ශාසනවිපත්තිය අසා; අප්පොස්සුක්කො භවෙය්‍යං, අල්පොත්සාහ වන්නෙම්ද; එතං පන, මේ වනාහි; නඛොපතිරූපං, සුදුසු නොවේ; හන්ද, එබැවින්; අහං, මම; අධම්මවාදිනො නිග්ගහෙත්වා අධර්මවාදීන්ට නිග්‍රහ කොට; ධම්මං දීපෙමීති, ධර්මය දීපනය කෙරෙමියි; චින්තෙන්තො, සිතනුයේ; වෙසාලි, විසාලාමහනුවර තොමෝ; යෙන, යම්දිශාභාගයකින් පැමිණියයුත්තිද; තදවසරි, ඒ දිශාභාගයෙන් පැමිණියේය; තත්‍රසුදං, එහි; කාකණ්ඩකපුත්තො, කාකණ්ඩකපුත්‍රවූ; ආයස්මායසො, ආයුෂ්මත් යසස්ථවිරතෙමේ; වෙසාලියං, විසාලාමහනුවර; මහවනෙ, මහවෙනෙහි; කූටාගාරසාලායං, කූටාගාරශාලාවෙහි; විහරති, වෙසේ;

තෙන ඛො පන සමයෙන වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ තදහුපොසථෙ කංසපාතිං උදකෙන පූරෙත්වා මජ්ඣෙ භික්ඛුසඞ්ඝස්ස ඨපෙත්වා ආගතෙ වෙසාලිකෙ උපාසකෙ එවං වදන්ති: "දෙථාවුසො සඞ්ඝස්ස කහාපණම්පි අඩ්ඪම්පි පාදම්පි මාසකරූපම්පි භවිස්සති සඞ්ඝස්ස පරික්ඛාරෙන කරණීය"න්ති සබ්බං තාව වත්තබ්බං,/ යාව ඉමාය පන විනයසඞ්ගීතියා සත්ත භික්ඛුසතානි අනූනානි අනධිකානි අහෙසුං, තස්මායං දුතිය සඞ්ගීති සත්තසතිකාති වුච්චතීති.

එතස්මිං ච සන්නිපාතෙ ද්වාදසභික්ඛුසතසහස්සානි සන්නිපතිංසු ආයස්මතා යසෙන සමුස්සාහිතා, තෙසං මජ්ඣෙ ආයස්මතා රෙවතෙන පුට්ඨෙන සබ්බකාමිත්ථෙරෙන විනයං විස්සජ්ජෙන්තෙන තානි දසවත්ථූනි විනිච්ඡිතානි අධිකරණං වූපසමිතං.

---

තෙනඛොපන සමයෙන, එසමයෙහි වනාහි; වෙසාලිකා විසාලා මහනුවරෙහිවූ; වජ්ජිපුත්තකා භික්ඛූ, වජ්ජිපුත්‍රක භික්ෂූහු; තදහුපොසථෙ, ඒ උපොෂිත දිනයෙහි; කංසපාතිං, රන්තලියක්; උදකෙන පූරෙත්වා, ජලයෙන් පුරවා; භික්ඛුසඞ්ඝස්සමජ්ඣෙ ඨපෙත්වා, භික්ෂුසඞ්ඝයා මධ්‍යයෙහි තබා; ආගතෙ, ආවාවූ; වෙසාලිකෙ උපාසකෙ, විසාලා මහනුවර උපාසකයන්ට; එවං වදන්ති, මෙසේ කියත්; හේ කෙසේද? ආවුසො, ඇවැත්නි; සඞ්ඝස්ස, සඞ්ඝයාට; කහාපණම්පි, කහවණුද; අඩ්ඪම්පි, අඩකහවණුද; පාදම්පි, කහවණුයෙන් සතරවනභාගයද; මාසකරූපම්පි, මසුද; දෙථ, දුනමැනව; සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; පරික්ඛාරෙන කරණීයං, පරිෂ්කාරයෙන් කෘත්‍යය; භවිස්සතීති, වන්නේයයි කියායි; සබ්බංතාවවත්තබ්බං, (සත්තසතිකක්ඛන්ධකයෙහි ආ) සියල්ල මෙහි ගෙණහැරදක්වා කිය යුත්තේය; යාව, යම්හෙයකින්; ඉමාය විනයසඞ්ගීතියා පන, මේ විනයසඞ්ගීතියෙහි වනාහි; අනූනානි අනධිකානි, අඩුවැඩිනොවූ; සත්තභික්ඛුසතානි අහෙසුං, සත්සියයක් භික්ෂූහු වූවාහුද; තස්මා, එහෙයින්; අයං දුතියසඞ්ගීති, මේ දෙවන සඞ්ගායනාව තොමෝ; සත්තසතිකාති, සත්තසතිකාවයයි; වුච්චතීති, කියනු ලබායි;

එතස්මිං ච සන්නිපාතෙ, මේ සන්නිපාතයෙහිද; ආයස්මතා යසෙන, ආයුෂ්මත් යසස්ථවිරයන් විසින්; සමුස්සාහිතා, මොනවට උත්සාහ කරණලද්දවූ, ද්වාදසභික්ඛුසතසහස්සානි, දොළොස් ලක්ෂයක් භික්ෂූහු; සන්නිපතිංසු, රැස්වූවාහුය; තෙසං මජ්ඣෙ, ඔවුන්ගේ; මධ්‍යයෙහි; ආයස්මතා රෙවතෙන, ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් විසින්; පුට්ඨෙන, විචාරණලද්දාවූ; විනයවිස්සජ්ජෙන්තෙන, විනය විසර්ජනා කරන්නාවූ; සබ්බකාමිත්ථෙරෙන, සබ්බකාමී තෙරහු විසින්; තානිදසවත්ථූනි, ඒ දශවස්තූහු; විනිච්ඡිතානි, විනිශ්චය කරණලද්දාහුය; අධිකරණංවූපසමිතං; අධිකරණයව්‍යුපශමනය කරණලද වූයේය;

අථ ථෙරා පුන ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිස්සාමාති තිපිටකධරෙ පත්තපටිසම්භිදෙ සත්තසතෙ භික්ඛූ උච්චිනිත්වා වෙසාලියං වාලුකාරාමෙ සන්නිසීදිත්වා මහාකස්සපත්ථෙරෙන සඞ්ගායිතසදිසමෙව සබ්බං සාසනමලං සොධෙත්වා පුන පිටකවසෙන නිකායවසෙන අඞ්ගවසෙන ධම්මක්ඛන්ධවසෙන ච සබ්බං ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිංසු. අයං සඞ්ගීති අට්ඨහි මාසෙහි නිට්ඨිතා. යා ලොකෙ:-

**සතෙහි සත්තහි කතා-තෙන සත්තසතාති ච,**
**පුබ්බෙකතං උපාදාය-දුතියාති ච වුච්චතීති.**

---

අථ, එකල්හි; ථෙරා, තෙරහු; පුන, නැවත; ධම්මඤ්ච, ධර්‍මයද; විනයඤ්ච, විනයද; සඞ්ගායිස්සාමාති, සඞ්ගායනා කරන්නෙමුයයි; තිපිටකධරෙ, ත්‍රිපිටකධරවූ; පත්තපටිසම්භිදෙ, ප්‍රාප්තප්‍රතිසම්භිද ඇත්තාවූ; සත්තසතෙ භික්ඛූ, සත්සියයක් භික්ෂූන්; උච්චිනිත්වා, තෝරා; වෙසාලියං, විසාලාමහනුවරෙහි; වාලුකාරාමෙ, වාලුකාරාමයෙහි; සන්නිසීදිත්වා, රැස්ව හිඳ; සබ්බං සාසනමලං සොධෙත්වා, සියලු ශාසනමලය ශුද්ධකොට; පුන, නැවත; පිටකවසෙන, පිටකවශයෙන්ද; නිකායවසෙන, නිකායවශයෙන් ද; අඞ්ගවසෙන, අඞ්ගවශයෙන්ද; ධම්මක්ඛන්ධවසෙන ච, ධර්‍මස්කන්ධවශයෙන්ද; සබ්බං, සියලු; ධම්මඤ්ච, ධර්‍මයද; විනයඤ්ච, විනයද; මහාකස්සපත්ථෙරෙන, මහකසුප්තෙරහු විසින්; සඞ්ගායිතසදිසමෙව, සඞ්ගායනාකරණලද්ද සමානකොටම; සඞ්ගායිංසු, සඞ්ගායනාකළෝ; අයං, සඞ්ගීති, මේ සඞ්ගීතිතොමෝ; අට්ඨහි මාසෙහි අටමසකින්; නිට්ඨිතා, නිමවනලදු; යා, යම් සඞ්ගායනාවක් ඇත්තීද; ඕ තොමෝ)

සත්තහි සතෙහි, සත්සියයක් රහතන් විසින්; කතා, කරණලදද; තෙන, ඒ කාරණය කාරණකොටගෙණ; සත්තසතාතිච, සත්තසතායයිද; පුබ්බෙකතං උපාදාය, පෙරකරණලද ප්‍රථමමහාසඞ්ගායනාව කරණකොටගෙණ; දුතියාතිච, විතීයාවයයිද; ලොකෙ, ලෙව්හි; වුච්චති ඉති, කියනුලබායයිද;

සාපන අයංසඞ්ගීති, ඒ මේ දෙවනසඞ්ගායනාතොමෝ වනාහි, යෙහි ථෙරෙහි, යම්තෙරුන් විසින්; සඞ්ගීතා, සඞ්ගායනාකරණලද්දීද; තෙසු, ඒ සඞ්ගීතිකාරකතෙරුන් අතුරෙන්; විස්සුතා, (ගණජ්‍යෙෂ්ඨ බැවින් අටනමක් සැමතන්හි) ප්‍රසිද්ධවූවාහුය; (ඒ සන්නිපාතයෙහි අටනමක්ම ගණපාමොක් තෙරහු වූවාහුය;)

(ඔවුන් අතුරෙන්ද වාසභගාමී සුමන යන දෙතෙරහු අනුරුද්ධ ස්ථවිරයන්ගේ සද්ධිවිහාරිකයෝය, සෙස්සෝ ආනන්ද ස්ථවිරයන්ගේ

සා පනායං:—

**යෙහි ථෙරෙහි සඞ්ගීතා-සඞ්ගීති තෙසු විස්සුතා,**
**සබ්බකාමී ච සාළ්හො ච-රෙවතො ඛුජ්ජසොභිතො.**

**යසො ච සාණසම්භූතො-එතෙ සද්ධිවිහාරිකා,**
**ථෙරා ආනන්දථෙරස්ස-දිට්ඨපුබ්බා තථාගතං.**

**සුමනො වාසභගාමී ච-ඤෙය්‍යා සද්ධිවිහාරිකා,**
**ද්වෙ ඉමෙ අනුරුද්ධස්ස-දිට්ඨපුබ්බා තථාගතං**

**දුතියො පන සඞ්ගීතො-යෙහි ථෙරෙහි සඞ්ගහො,**
**සබ්බෙපි පන්නභාරා තෙ-කතකිච්චා අනාසවාති.**

**අයං දුතියසඞ්ගීති.**

---

සද්ධිවිහාරිකයෝය, මේ සියලුම අටමහතෙරහු පෙර භාග්‍යවත්හු දුටුවෝය. දැන් ඒ තෙරුන් ස්වරූපයෙන්ද දක්වනුයේ **සබ්බකාමීය** කියා:–)

සබ්බකාමී ච, සබ්බකාමීතෙමේද; සාළ්හො ච, සාළ්හතෙමේද; රෙවතො, රෙවතතෙමේද; ඛුජ්ජසොභිතො, ඛුජ්ජසොභිතතෙමේද; යසො ච, යසතෙමේද; සාණසම්භූතො, සාණදෙශවාසී සම්භූතතෙමේද යන; එතෙ ථෙරා, මේ තෙරහු ආනන්දථෙරස්ස, අනඳතෙරහුගේ; සද්ධිවිහාරිකා, සද්ධිවිහාරිකයෝය; තථාගතං, තථාගතයනු; දිට්ඨ පුබ්බා, පෙර දක්නාලද්දෝය;

සුමනො, සුමනනම් තෙරතෙමේද; වාසභගාමී ච, වාසභගාමී නම් තෙරතෙමේද යන; ඉමෙ ද්වෙ, මේ දෙතෙරහු; අනුරුද්ධස්ස, අනුරුද්ධ ස්ථවිරයන්ගේ; සද්ධිවිහාරිකා, සද්ධිවිහාරිකයෝය; තථාගතං, තථාගතයනු; දිට්ඨපුබ්බා, පෙර දක්නාලද්දෝයයි; ඤෙය්‍යා, දතයුත්තාහුය;

යෙහි ථෙරෙහි, යම් තෙරුන් විසින්; දුතියො සඞ්ගහො පන, දෙවන සඞ්ගායනාව වනාහි; සඞ්ගහීතො, සඞ්ගායනා කරණලද්දේද; තෙ සබ්බෙපි, ඒ සියල්ලෝම; පන්නභාරා, පතනයවනලද ස්කන්ධභාර ඇත්තෝය; කතකිච්චා, (සතරමාගීය කරණකොට චතුස්සත්‍යයන්හි කටයුතුවූ පරිඥන ප්‍රහාණසාක්‍ෂාත්ක්‍රියා භාවනාසඞ්ඛ්‍යාත) සොළසවිධ කෘත්‍යය කරණලද්දෝය; අනාසවාති, අශ්‍රවවිරහිතයෝයය;

**අයං දුතියසඞ්ගීති, මේ ද්විතීය සඞ්ගායනාවයි.**

---

එවම්මං දුතියසඞ්ගීතිං සඞ්ගායිත්වා තෙ ථෙරා උප්පජ්ජිස්සති නුඛො අනාගතෙපි සාසනස්ස එවරූපං අබ්බුදන්ති ඔලොකයමානා ඉදං අද්දසංසු: ඉතො වස්සසතස්ස උපරි අට්ඨාරසමෙ වස්සෙ පාටලිපුත්තෙ ධම්මාසොකො නාම රාජා උප්පජ්ජිත්වා සකලජම්බුදීපෙ රජ්ජං කාරෙස්සති, සො බුද්ධසාසනෙ පසීදිත්වා මහන්තං ලාභසක්කාරං පවත්තයිස්සති, තතො තිත්ථියා ලාභසක්කාරං පත්ථයමානා සාසනෙ පබ්බජිත්වා සකං සකං දිට්ඨිං පරිදීපෙස්සන්ති, එවං සාසනෙ මහන්තං අබ්බුදං උප්පජ්ජිස්සතීති.

අථතෙසං එතදහොසි:- කින්නුඛො මයං එතස්මිං අබ්බුදෙ උප්පන්නෙ සම්මුඛා භවිස්සාම න භවිස්සමාති. අථ සබ්බෙව තදා අත්තනො අසම්මුඛභාවං ඤත්වා කොනුඛො තං අධිකරණං වූපසමෙතුං

---

එවං, මෙසේ; තෙථෙරා, ඒ තෙරහු; ඉමං දුතියසඞ්ගීතිං සඞ්ගායිත්වා, මේ දෙවන සඞ්ගායනාව සඞ්ගායනාකොට; අනාගතෙපි, අනාගතයෙහිද; සාසනස්ස, සස්නට; එවරූපං අබ්බුදං, මෙබඳු උපද්‍රවයක්; උප්පජ්ජිස්සතිනුඛො, උපදින්නේදැයි; ඔලොකයමානා, බලනුවෝ; ඉදං, මේ වක්ෂ්‍යමාන නිදර්‍ශනය; අද්දසංසු, දුටුවාහුය; ඉතො, මෙයින්; වස්සසතස්ස උපරි, අවුරුදු සියයකින් මත්තෙහි; අට්ඨාරසමෙ වස්සෙ, අටළොස්වන වර්‍ෂයෙහි; පාටලිපුත්තෙ, පැළලුප් නුවරෙහි; ධම්මාසොකො නාම රාජා, ධර්‍මාශොකනම් රජෙක්තෙමේ; උප්පජ්ජිත්වා, ඉපිද; සකලජම්බුදිපෙ සියලු දඹදිවෙහි; රජ්ජං කාරෙස්සති, රාජ්‍යය කරවන්නේය; සො, ඒ රජතෙමේ; බුද්ධසාසනෙ පසීදිත්වා, බුදුසස්නෙහි පැහැද; මහන්තං ලාභසක්කාරං මහත් ලාභසත්කාරය; පවත්තයිස්සති පවත්වන්නේය; තතො, එහෙයින්; තිත්ථියා, තීර්ථකයෝ; ලාභසක්කාරං පත්ථයමානා, ලාභසත්කාර ප්‍රාර්ථනාකරනුවෝ; සාසනෙ, සස්නෙහි; පබ්බජිත්වා, පැවිදිව; සකං සකං දිට්ඨිං, තමතමන්ගේ දෘෂ්ටිය; පරිදීපෙස්සන්ති, ප්‍රකාශකරන්නාහුය; එවං, මෙසේ; සාසනෙ, සස්නෙහි මහන්තං අබ්බුදං, මහත් උපද්‍රවයක්; උප්පජ්ජිස්සතීති, උපදින්නේයයි කියායි;

අථ, එකල්හි; තෙසං, ඒ තෙරුන්ට; එතදහොසි, මෙබඳු සිතෙක් වූයේය; (කෙබඳු සිතෙක්ද?) කින්නුඛො, කිමෙක්ද; මයං, අපි; එතස්මිං අබ්බුදෙ, මේ අර්බුදය; උප්පන්නෙ, උපන්කල්හි; සම්මුඛා භවිස්සාම, හමුවන්නමෝද; න භවිස්සාමාති, නොවන්නමෝදැයි කියායි; අථ, ඉක්බිති; සබ්බෙව, සියල්ලෝම; තදා, එකල්හි; අත්තනො, තමතමන්ගේ; අසම්මුඛභාවං ඤත්වා, නොහමුබව දැන; කොනුඛො, කවරෙක්තෙමේ වනාහි; තං අධිකරණං, ඒ අධිකරණය; වූපසමෙතුං,

සමත්ථො භවිස්සතීති සකලමනුස්සලොකඤ්ච ඡකාමාවචරදෙවලොකඤ්ච ඔලොකෙන්තා න කඤ්චි දිස්වා බ්‍රහ්මලොකෙ තිස්සං නාම මහාබ්‍රහ්මානං අද්දසංසු පරිත්තායුකං උපරි බ්‍රහ්මලොකූපපත්තියා භාවිතමග්ගං, දිස්වාන තෙසං එතදහොසි: සචෙ මයං එතස්ස බ්‍රහ්මුනො මනුස්සලොකෙ නිබ්බත්තනත්ථාය උස්සාහං කරෙය්‍යාම, අද්ධා එස මොග්ගලිබ්‍රාහ්මණස්ස ගෙහෙ පටිසන්ධිං ගහෙස්සති, තතො ච මන්තෙහි පලොභිතො නික්ඛමිත්වා පබ්බජිස්සති,

සො එවං පබ්බජිත්වා සකලබුද්ධවචනං උග්ගහෙත්වා අධිගතපටිසම්භිදො හුත්වා තිත්ථියෙ මද්දිත්වා තං අධිකරණං විනිච්ඡිනිත්වා සාසනං පග්ගණ්හිස්සතීති. තෙ බ්‍රහ්මලොකං ගන්ත්වා තිස්සං මහාබ්‍රහ්මානං එතදවොචුං: ඉතො වස්සසතස්ස උපරි අට්ඨාරසමෙ වස්සෙ

---

ව්‍යපශමනයකරන්ට; සමත්ථො භවිස්සතීති, සමර්ථයෙක් වන්නේදැයි; සකලමනුස්සලොකඤ්ච, සියලු මනුෂ්‍යලොකයද; ඡ කාමාවචරදෙවලොකඤ්ච, ෂට්කාමාවචර දෙව්ලොවද; ඔලොකෙන්තා, බලනුවෝ; න කඤ්චි දිස්වා, කිසිවෙක්හු නොදැක; බ්‍රහ්මලොකෙ, බඹලොවෙහි; පරිත්තායුකං, ස්වල්ප ආයුෂ ඇත්තාවූ; උපරි බ්‍රහ්මලොකූපපත්තියා, මතු බ්‍රහ්මලොකොත්පත්තිය පිණිස; භාවිතමග්ගං, වඩනලද ධ්‍යානය ඇත්තාවූ; 'තිස්සං'' නාම මහාබ්‍රහ්මානං, තිස්ස නම් මහබඹහු; අද්දසංසු, දුටුවාහුය; දිස්වාන, දැක; තෙසං, ඒ තෙරුන්ට; එතදහොසි, මෙබඳු සිතෙක් වූයේය; කෙබඳු සිතෙක්දයත්; සචෙ, ඉදින්; මයං, අපි; මනුස්සලොකෙ, මිනිස්ලොවෙහි; එතස්ස බ්‍රහ්මුනො, මේ බ්‍රහ්මයාගේ; නිබ්බත්තනත්ථාය, ඉපදීම පිණිස; උස්සාහං කරෙය්‍යාම, උත්සාහ කරමෝ නම්, (වත) මැනව; අද්ධා, ඒකාන්තයෙන්; එසො, මේතෙමේ; මොග්ගලිබ්‍රාහ්මණස්ස ගෙහෙ, (ලොකසම්මත අපුත්‍රක) මොග්ගලිබ්‍රාහ්මණයාගේ ගෙයි; පටිසන්ධිං ගහෙස්සති, (බැමිණියගේ කුසෙහි) පිළිසිඳ ගන්නේය; තතො ච, එයින්ද; මන්තෙහි, මන්ත්‍රහෙතුකොටගෙණ; පලොභිතො, පොළඹවනලදුයේ; නික්ඛමිත්වා, නික්ම; පබ්බජිස්සති, පැවිදිවන්නේය;

සො, හෙතෙමේ; එවං, මෙසේ ඇතිකල්හි; පබ්බජිත්වා, පැවිදිව; සකල බුද්ධවචනං උග්ගහෙත්වා, සියලු බුද්ධවචනය ඉගෙණ; අධිගතපටිසම්භිදො හුත්වා, පැමිණෙනලද ප්‍රතිසම්භිදා ඇතියෙක්ව; තිත්ථියෙ මද්දිත්වා, තීර්ථකයන් මැඩ; තං අධිකරණං විනිච්ඡිනිත්වා, ඒ අධිකරනය විනිශ්චයකොට; සාසනං පග්ගණ්හිස්සතීති, සස්නට ප්‍රග්‍රහකරන්නේයයි කියායි; තෙ, ඒ තෙරහු; බ්‍රහ්මලොකං ගන්ත්වා, බඹලොවට ගොස්; තිස්සං මහාබ්‍රහ්මානං, තිස්ස නම් මහබඹහුට; එතං, මේ වක්‍ෂ්‍යමානය; අවොචුං, සැළකළාහුය; සප්පුරිස, සත්පුරුෂය; ඉතො, මෙයින්; වස්සසතස්ස උපරි, වර්ෂසියයකින් මත්තෙහි; අට්ඨාරසමෙ වස්සෙ,

සාසනෙ මහන්තං අබ්බුදං උප්පජ්ජිස්සති, මයඤ්ච සකලං මනුස්සලොකං ඡ කාමාවචරදෙවලොකඤ්ච ඔලොකයමානා කඤ්චි සාසනං පග්ගහෙතුං සමත්ථං අදිස්වා බ්‍රහ්මලොකං විචිනන්තා භවන්තං අද්දසාම, සාධු සප්පුරිස මනුස්සලොකෙ නිබ්බත්තිත්වා දසබලස්ස සාසනං පග්ගණ්හිතුං පටිඤ්ඤං දෙහීති. එවං වුත්තෙ මහාබ්‍රහ්මා අහං කිර සාසනෙ උප්පන්නං අබ්බුදං සොධෙත්වා සාසනං පග්ගහෙතුං සමත්ථො භවිස්සාමීති හට්ඨපහට්ඨො උදග්ගුදග්ගො හුත්වා සාධූති පටිස්සුණිත්වා පටිඤ්ඤං අදාසි. ථෙරා බ්‍රහ්මලොකෙ තං කරණීයං තීරෙත්වා පුන පච්චාගමිංසු.

තෙන ඛො පන සමයෙන සිග්ගවත්ථෙරො ච චණ්ඩවජ්ජිත්ථෙරො ච වෙපි නවකා හොන්ති දහරභික්ඛූ තිපිටකධරා පත්තපටිසම්භිදා ඛීණාසවා, තෙ තං අධිකරණං න සම්පාපුණිංසු ථෙරා–තුම්හෙ

---

අටලොස්වන වර්ෂයෙහි; සාසනෙ, සස්නෙහි; මහන්තං අබ්බුදං උප්පජ්ජිස්සති, මහත් උපද්‍රවයක් උපදින්නේය; මයඤ්ච, අපිද; සකලංමනුස්සලොකං, සියලු මිනිස්ලොවද; ඡකාමාවචරදෙවලොකඤ්ච, ෂට්කාමාවචර දිව්‍යලොකයද; ඔලොකයමානා, බලන්නුවෝ; සාසනං පග්ගහෙතුං, සස්නට ප්‍රග්‍රහකරන්ට; කඤ්චිසමත්ථං අදිස්වා, කිසිසමර්ථයෙක් නොදැක; බ්‍රහ්මලොකං විචිනන්තා, බඹලොව පරීක්‍ෂාකරණ්නුවෝ; භවන්තං, පින්වත්හු; අද්දසාම, දුටුම්හ; සාධු සප්පුරිස, මැනව සත්පුරුෂය; මනුස්සලොකෙ නිබ්බත්තිත්වා, මිනිස්ලොවෙහි ඉපිද; දසබලස්ස, දශබලධාරිවූ භාග්‍යවත්හුගේ; සාසනං පග්ගණ්හිතුං, සස්නට ප්‍රග්‍රහකරන්ට; පටිඤ්ඤං දෙහීති, ප්‍රතිඥාදුනමැනවයි කියායි; එවං වුත්තෙ, මෙසේ කියනලදකල්හි; මහාබ්‍රහ්මා, මහබඹතෙමේ; අහං කිර, මම වනාහි; සාසනෙ, සස්නෙහි; උප්පන්නං අබ්බුදං, උපන් අර්බුදය; සොධෙත්වා, ශුද්ධකොට; සාසනං පග්ගහෙතුං, සස්නට ප්‍රග්‍රහකරන්ට; සමත්ථො භවිස්සාමීති, සමර්ථයෙක් වන්නෙමියි; හට්ඨපහට්ඨො, (සිත පිනාවීම් වශයෙන්) නැවත නැවත සතුටුවූයේ; උදග්ගුදග්ගො හුත්වා, (ශරීරවිකාරොත්පාදන ප්‍රීතිවශයෙන්)මොනවට උද්‍ගතවූයෙක්ව;සාධූති, මැනවැයිකියා; පටිස්සුණිත්වා, ප්‍රතිවචනදී; පටිඤ්ඤං අදාසි, ප්‍රතිඥා දුන්නේය; ථෙරා, තෙරහු; බ්‍රහ්මලොකෙ, බඹලොවෙහි; තං කරණීයං තීරෙත්වා, ඒ කෘත්‍යය තීරණයකොට; පුන, නැවත; පච්චාගමිංසු, හැරී ආවාහුය;

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; සිග්ගවත්ථෙරො ච, සිග්ගවස්ථවිරතෙමේද; චණ්ඩවජ්ජිත්ථෙරො ච, චණ්ඩවජ්ජිස්ථවිරතෙමේද යන; වෙපි, දෙදෙනම; නවකා හොන්ති, නවකයෝ වෙත්; තිපිටකධරා, තෙවළාදරවූ; පත්තපටිසම්භිදා, ප්‍රාප්ත ප්‍රතිසම්භිදා ඇත්තාවූ; ඛීණාසවා, ක්‍ෂීණාශ්‍රවවූ; දහරභික්ඛූ, ළදරුභික්‍ෂූහු වෙද්ද; තෙ, එවුහු;

ආවුසො අම්හාකං ඉමස්මිං අධිකරණෙ නො සහායකා අහුවත්ථ, තෙන වො ඉදං දණ්ඩකම්මං හොතු, තිස්සො නාම බ්‍රහ්මා මොග්ගලි බ්‍රාහ්මණස්ස ගෙහෙ පටිසන්ධිං ගණ්හිස්සති, තං තුම්හාකං එකො නීහරිත්වා පබ්බජෙතු එකො බුද්ධවචනං උග්ගණ්හාපෙතූති වත්වා සබ්බෙපි යාවතා යුකං ඨත්වා–

> සබ්බකාමිප්පභුතයො–තෙපිථෙරා මහිද්ධිකා,
> අග්ගික්ඛන්ධාවලොකස්මිං–ජලිත්වා පරිනිබ්බුතා.
>
> දුතියං සඞ්ගහං කත්වා–විසොධෙත්වාන සාසනං,
> අනාගතෙපි කත්වාන–හෙතුංසද්ධම්මසුද්ධියා.

---

තං අධිකරණං, (වජ්ජිපුත්‍රකයන් විසින් උපදවනලද) ඒ අධිකරණය; (විනිශ්චයකරන්ට) නසම්පාපුණිංසු, නොපැමිණියාහුය; ථෙරා, තෙරහු; ආවුසො, ඇවැත්නි; තුම්හෙ, තෙපි; ඉමස්මිං අධිකරණෙ, මේ අධිකරණයෙහි; අම්හාකං, අපට; නොසහායකා අහුවත්ථ, සහාය නොවූවහුය; තෙන, ඒ කාරණයෙන්; වො, තොපට; ඉදං දණ්ඩකම්මං හොතු, මේ දඬුවම වේවා; තිස්සොනාම බ්‍රහ්මා, තිස්ස නම් බඹ තෙමේ; මොග්ගලිබ්‍රාහ්මණස්ස ගෙහෙ, මොග්ගලි බ්‍රාහ්මණයාගේ ගෘහයෙහි; (බැමිණිය ඉග කුසෙහි) පටිසන්ධිං ගණ්හිස්සති, පිළිසිඳගන්නේය; තං, ඔහු; තුම්හාකං, තොපගෙන්; එකො, එකෙක් තෙමේ; නීහරිත්වා, ගෙණවුත්; පබ්බාජෙතු, පැවිදිකරුවා; එකො, එකෙක් තෙමේ; බුද්ධවචනං උග්ගණ්හාපෙතූති වත්වා, බුද්ධවචනය උගන්වායි කියා; සබ්බෙපි, සියලුම;

සබ්බකාමිප්පභුතයො, සබ්බකාමී තෙර ආදිකොට ඇති; මහිද්ධිකා, මහත් සෘද්ධි ඇත්තාවූ; තෙථෙරාපි, ඒ තෙරහුද; ලොකස්මිං, ලෙව්හි; අග්ගික්ඛන්ධාව, වහ්නිස්කන්ධයන් මෙන්; ජලිත්වා, දිලිහී; යාවතා යුකංඨත්වා, ආයුප්‍රමාණ සිට; පරිනිබ්බුතා, පිරිනිවියාහුය; (කුමක් කොට ඒ තෙරහු පිරිනිවියාහුදැයි, ඒ දක්වනු සඳහා "දුතියසඞ්ගහං කත්වා"යි ආදි කී;)

දුතියසඞ්ගහං කත්වා, දෙවනසඞ්ගායනාව කොට; සාසනං විසොධෙත්වාන, සස්න විශෙෂයෙන් පිරිසිදුකොට; අනාගතෙපි, අනාගතයෙහි පවා; සද්ධම්මසුද්ධියා, සදහම් ශුද්ධියට; හෙතුං කත්වාන, හේතුවක් කොට (පිරිනිවියාහුය.) (දූන්මෙසේ මහත් අනුභාව ඇති තෙරහු පවා අනිත්‍යතාවයගේ වසඟයට ගියාහුය; අන්‍යයෝ ඒ අනිත්‍යතාවයගේ වසඟයටයාම කියනුම කිම්දැයි සංවෙගය උපදවා, අවවාදකරණුයේ කීණාසවායි ආදි කී;)

**ඛීණාසවාවසිප්පත්තා-පභින්න පටිසම්භිදා,**
**අනිච්චතාවසංථෙරා-තෙපි නාම උපාගතා.**

**එවං අනිච්චතං ජම්මිං-ඤත්වාදුරභි සම්භවං,**
**තං පත්තුං වායමෙධීරො-යංනිච්චං අමතං පදන්ති.**

**එත්තාවතා සබ්බාකාරෙන දුතියසඞ්ගීති**
**වණ්ණනා නිට්ඨිතා.**

---

ඛීණාසවා, ක්‍ෂයකරණලද ආශ්‍රවයන් ඇත්තාවූ; වසිප්පත්තා, ආවජ්ජනාදීන්ගේ වසභයට පැමිණියාවූ; පභින්නපටිසම්භිදා, ප්‍රභෙද ප්‍රතිසම්භිදා ඇත්තාවූ; තෙ ථෙරාපි, ඒ තෙරහුපවා, අනිච්චතාවසං, අනිත්‍යතාවගේ අසිතිබවට; උපාගතානාම, සමීපගතවූවෝ නම් වෙත්; හෙවත් පැමිණියාහු නම් වෙත්;

ජම්මිං, ලාමකවූ; දුරභිසම්භවං, මැඩපවත්වන්නට නොහැකිවූ; අනිච්චතං, අනිත්‍යබව; එවං ඤත්වා, මෙසේ දැන; යං, යමක්; නිච්චං, නිත්‍යවේද; තං අමතංපදං, ඒ නිර්‍වාණපදය කරා; පත්තුං, එළඹෙන්ට; ධීරො, ප්‍රඥවත්තෙමේ; වායමෙථ වෑයාම් කෙරේයයි;

එත්තාවතා, මෙපමණකින්; සබ්බාකාරෙන, සර්‍වප්‍රකාරයෙන් (කියයුතු කිමක් ශෙෂනොකොට) වණ්ණනා, වර්‍ණනාකරණ ලද්දවූ; දුතියසඞ්ගීති, දෙවන සඞ්ගායනා තොමෝ; නිට්ඨිතා, නිමවනලදු වන්නීය.

**දෙවන සඞ්ගායනාවයි.**

---

# විනයමහානිස්සයනම්

### ව්‍යාඛ්‍යා සහිත

# සමන්තපාසාදිකා විනය මහඅටුවාව.

## ii භාගය.

තිස්සොපි ඛො මහාබ්‍රහ්මා බ්‍රහ්මලොකා චවිත්වා මොග්ගලි බ්‍රාහ්මණස්ස ගෙහෙ පටිසන්ධිං අග්ගහෙසි. සිග්ගවත්ථෙරෙපි තස්ස පටිසන්ධිග්ගහණතොපපභූති සත්තවස්සානි බ්‍රාහ්මණස්ස ගෙහං පිණ්ඩාය පාවිසි, එකදිවසම්පි උළුඞ්කමත්තං වා යාගුං කටච්ඡුමත්තං වා භත්තං නාලත්ථ. සත්තන්නං පන වස්සානං අච්චයෙන එකදිවසං අතිච්ඡථ භන්තෙති වචනමත්තං අලත්ථ. තං දිවසමෙව බ්‍රාහ්මණොපි

---

(දූත් එයට අනතුරුව තෘතීය සඞ්ගායනාව මුලපටන් විස්තර කොට දක්වනසේක්, **"තිස්සොපි ඛො මහාබ්‍රහ්මා බ්‍රහ්මලොකතො චවිත්වා මොග්ගලිබ්‍රාහ්මණස්ස ගෙහෙ පටිසන්ධිං අග්ගහෙසි"**යි ආදි කියේ.) තිස්සොපි ඛො මහාබ්‍රහ්මා; තිස්ස නම් මහාබ්‍රහ්මතෙමේ වනාහි; බ්‍රහ්මලොකා චවිත්වා, බඹලොවින් චුතව; මොග්ගලිබ්‍රාහ්මණස්සගෙහෙ, (ලොකසම්මතවූ අපුත්‍රක) මෞද්ගල්‍යායන නම් බමුණුහුගේ ගෘහයෙහි; පටිසන්ධිං අග්ගහෙයි; පිළිසිඳ ගත්තේය, (එනම් බ්‍රාහ්මණයාගේ ගෘහයෙහි බැමිණිය කුස පිළිසිඳ ගත්තේය යන අර්ථයි. ගෘහය වනාහි තන්නිශ්‍රය බැවින් නිශ්‍රය නිශ්‍රිතව්‍යවහාරයෙන් **"මඤ්චා උක්කුට්ඨිං කරොන්ති සබ්බො ගාමො ආගතො"** යනාදියෙහිමෙන් ගෘහයෙහි පිළිසිඳ ගත්තේයයි කියනලදී). සිග්ගවත්ථෙරෙපි, සිග්ගවස්ථවිර තෙමේද; තස්ස, ඔහුගේ; පටිසන්ධිග්ගහණතොපපභූති, ප්‍රතිසන්ධිග්‍රහණය පටන්; සත්තවස්සානි, සත්අවුරුද්දක් මුළුල්ලෙහි; බ්‍රාහ්මණස්ස ගෙහං (තිස්සනම්) බමුණුහුගේ ගෙට; පිණ්ඩාය පාවිසි; පිඬු පිණිස පිවිසි; එකදිවසම්පි, එකදවසකුදු; උළුඞ්කමත්තං යාගුං වා, හෙණෙස්සක් පමණ කැඳ හෝ; කටච්ඡුමත්තං භත්තංවා, සැන්දක්පමණ බත් හෝ; නාලත්ථ, නොලදී; සත්තන්නං වස්සානං අච්චයෙන පන, සත්අවුරුද්දකගේ ඇවෑමෙන් වනාහි; එකදිවසං, එක්දවසක්; භන්තෙ, වහන්ස! අතිච්ඡථ ඉති, ඉක්මවා කැමතිවුව මැනවැයි; (මෙහි භික්ෂාව නොලබන්නෙහිය මෙයින් අන්තැනකට ගොස්, භික්ෂාපර්යෙෂණය කරව යන අර්ථයි.) වචනමත්තං, වචනමාත්‍රයක්; අලත්ථ, ලදී; තං දිවසමෙව, එදවස්හිම; බ්‍රාහ්මණොපි, බමුණු තෙමේත්;

බහිද්ධා කිඤ්චිකරණීයං කත්වා ආගච්ඡන්තො පටිපථෙ ථෙරං දිස්වා "හො පබ්බජිත අම්හාකං ගෙහමගමත්ථා"ති ආහ. ආම බ්‍රාහ්මණ අගමිම්හා'ති. "අපි කිඤ්චි ලභිත්ථා"ති? "ආම බ්‍රාහ්මණ ලභිම්හා'ති. සො ගෙහං ගන්ත්වා පුච්ඡි: තස්ස පබ්බජිතස්ස කිඤ්චි අදත්ථා'ති. නකිඤ්චි අදම්හා'ති. බ්‍රාහ්මණො දුතියදිවසෙ ඝරද්වාරෙ යෙව නිසීදි අජ්ජ පබ්බජිතං මුසාවාදෙන නිග්ගණ්හිස්සාමී'ති. ථෙරො දුතියදිවසෙ බ්‍රාහ්මණස්ස ඝරද්වාරං සම්පත්තො, බ්‍රාහ්මණො ථෙරං දිස්වාව එවමාහ - තුම්හෙ හීයො අම්හාකං ගෙහෙ කිඤ්චි අලද්ධායෙව ලභිම්හා'ති අවොචුත්ථ, වට්ටති නුඛො තුම්හාකං මුසාවාදො'ති? ථෙරො ආහ - මයං බ්‍රාහ්මණ තුම්හාකං ගෙහෙ සත්තවස්සානි අතිච්ඡථා'ති වචනමත්තම්පි අලභිත්වා හීයො අතිච්ඡථා'ති වචනමත්තං ලභිම්හ, අථෙතං පටිසන්ථාරං උපාදාය එවමවොචුම්හා'ති. බ්‍රාහ්මණො චින්තෙසි, ඉමෙ

---

බහිද්ධා කිඤ්චි කරණීයං කත්වා, පිටත කිසිකෘත්‍යයක් කොට ආගච්ඡන්තො, එනුයේ; පටිපථෙ, පෙරමගදී; ථෙරං දිස්වා, තෙරහු දැක; (ඒ බමුණු තෙමේ තමාගේ ගෘහයෙහි භික්ෂාලාභය නොකාමැති වනුයේ **හො පබ්බජිත** යනාදිය කීයේ) හො පබ්බජිත, පින්වත් පැවිද්ද; අම්හාකංගෙහං, අපගේ ගෘහයට; අගමිත්ථාති, වනිදූයි; ආහ, විචාළේය; ආමබ්‍රාහ්මණ, එසේය බමුණ; අගමිම්හාති, ගියෙමුයි; අපි කිඤ්චි ලභිත්ථාති, කිසිවක් ලද්දෙහිදූයි; ආම බ්‍රාහ්මණ ලභිම්හාති, එසේය බමුණ ලැබුයෙමුයි කීවේය; සො, ඒ බමුණු තෙමේ; ගෙහං ගන්ත්වා, ගෙට ගොස්; තස්ස පබ්බජිතස්ස, ඒ පැවිද්දහට; කිඤ්චි අදත්ථාති පුච්ඡි, කිසිවක් දුන්නාහුදූයි (ගෘහවැසියන්) විචාළේය; නකිඤ්චි අදම්හාති, කිසිවක් නුදුනුමහයි කීහු; බ්‍රාහ්මණො, බමුණුතෙමේ; දුතියදිවසෙ, දෙවනදිනෙහි; ඝරද්වාරෙයෙව, ගෙදර සමීපයෙහිදීම; අජ්ජ, අද; පබ්බජිතං පැවිද්ද; මුසාවාදෙන, මුසාවාදයෙන්; නිග්ගණ්හිස්සාමීති, නිග්‍රහ කරන්නෙමි කියා; නිසීදි, හුන්නේය; ථෙරො, ස්ථවිරතෙම; දුතියදිවසෙ, දෙවන දවසෙහි; බ්‍රාහ්මණස්ස, බමුණාගේ; ඝරද්වාරං, ගෙදොරට; සම්පත්තො, පැමිණියේය; බ්‍රාහ්මණො, බමුණු තෙමේ; ථෙරං දිස්වාව, තෙරහු දැකම; තුම්හෙ, නුඹවහන්සේ; හීයො, ඊයේ; අම්හාකං ගෙහෙ, අපගේ ගෘහයෙහිදී; කිඤ්චි අලද්ධායෙව, කිසිවක් නොලදින්ම ලභිම්හාති, අවොචුත්ථ,ලැබුයෙමුයි කීයෙහිය;තුම්හාකං, නුබවහන්සේලාට; මුසාවාදො, මුසාවාදය තෙම; වට්ටති නු ඛොඉති, වටනේද්‍ෙහෝයි; එවං ආහ, මෙසේ කී; ථෙරො, ස්ථවිරතෙමේ; බ්‍රාහ්මණ, බමුණ මයං, අපි; තුම්හාකං ගෙහෙ, නොපගේ ගෘහයෙහිදී; සත්තවස්සානි, සත්අවුරුද්දක් මුලුල්ලෙහි; අතිච්ඡථ ඉති, ඉක්මවා කැමතිවූව මැනවැ යන; වචනමත්තම්පි, වචනමාත්‍රයකුදු; අලභිත්වා, නොලැබ; හීයො, ඊයේ; අතිච්ඡථ ඉති, ඉක්මවා කැමතිවූව මැනව යන; වචනමත්තං, වචනමාත්‍රයක්; ලභිම්හ, ලැබුයෙමු; (අථ යනු වචනාරම්භයෙහි නිපාතය.) එතං පටිසන්ථාරං උපාදාය, මේ ප්‍රතිසන්ථාරය කාරණකොට

පටිසන්ථාරමත්තම්පි ලභිත්වා ලභිම්හාති පසංසන්ති, අඤ්ඤං කිඤ්චි ඛාදනීයං භොජනීයං ලභිත්වා කස්මා නප්පසංසන්තී'ති පසීදිත්වා අත්තනො අත්ථාය පටියාදිතභත්තතො කටච්ඡුභික්ඛං තදූපියඤ්ච ව්‍යඤ්ජනං දාපෙත්වා ඉමං භික්ඛං සබ්බකාලං තුම්හෙ ලභිස්සථා'ති ආහ. සො පුනදිවසතොප්පභුති උපසඞ්කමන්තස්ස ථෙරස්ස උපසමං දිස්වා භිය්‍යොසොමත්තාය පසීදිත්වා ථෙරං නිච්චකාලං අත්තනො ඝරෙ භත්තවිස්සග්ගකරණත්ථාය යාචි. ථෙරො අධිවාසෙත්වා දිවසෙ දිවසෙ භත්තකිච්චං කත්වා ගච්ඡන්තො ථොකථොකං බුද්ධවචනං කථෙත්වා ගච්ඡති. සොපි බො මාණවකො සොළසවස්සුද්දෙසිකො යෙව තිණ්ණං වෙදානං

---

ගෙන; එවං අවොචුම්හාති ආහ, මෙසේ කීයෙමුයි කීය. බ්‍රාහ්මණො; බමුණුතෙමේ; චින්තෙසි, මෙසේ සිතී; ඉමෙ පටිසන්ථාරමත්තං ලභිත්වාපි, මේ ශ්‍රමණහු පිළිසඳර මාත්‍රයක් ලැබද; ලභිම්හාති පසංසන්ති, ලදුම්හයි පසසත්; අඤ්ඤං කිඤ්චි ඛාදනීයං භොජනීයං ලභිත්වා, අන්කිසි ඛාද්‍ය භොජ්‍යයක් ලැබ; කස්මා නප්පසංසන්තීති, කුමක්හෙයින් ප්‍රසංශා නොකරද්දැයි; පසීදිත්වා, පැහැද; අත්තනො අත්ථාය, තමහට ප්‍රයොජන පිණිස; පටියාදිතභත්තතො, සම්පාදනය කොට තබනලද බතින්; කටච්ඡුභික්ඛං, හැන්දක් බත්ද; තදූපියඤ්ච ව්‍යඤ්ජනං, එයට අනුරූප ව්‍යඤ්ජනද; දාපෙත්වා, දෙවා; ඉමං භික්ඛං, මේ භික්ෂාව; සබ්බකාලං, හැමකල්හි; තුම්හෙ, තුබවහන්සේ; ලභිස්සථ ඉති, ලබන්නාහුයයි; ආහ, කී; සො, හේ බමුණුතෙමේ; පුනදිවසතොප්පභුති, දෙවනදින පටන්; උපසඞ්කමන්තස්ස, එලඹෙන්නාවූ; ථෙරස්ස, තෙරහුගේ; උපසමං දිස්වා, (කායචිත්ත) ව්‍යපශමනය (නැවත නැවත) දැක; (දැනගැනය යන අර්ථයි.) **"ඉරියාපථවූපසමසඤ්ඤස්සනෙන හිතං නිබන්ධනො චිත්තස්ස සොතිසො පවත්ති උපසමො විඤ්ඤායතී"**ති. යනු) සාරාර්ථදීපනී ටීකායි) භිය්‍යොසොමත්තාය පසීදිත්වා, නැවත නැවත වෙසෙසින් අධිකතරව පැහැද; ථෙරං, තෙරහු; නිච්චකාලං, නිතිකාල්; අත්තනො ඝරෙ, තමාගේ ගෘහයෙහි; භත්තවිස්සග්ගකරණත්ථාය, බත්කිස කරණු වස්; යාචි, අයැදී; ථෙරො, ස්ථවිරතෙමේ; අධිවාසෙත්වා, පිළිගෙන; දිවසෙ දිවසෙ, **දවසක්** දවසක් පාසා; භත්තකිච්චං කත්වා, බත්කිස කොට; ගච්ඡන්තො, යනුයේ; ථොකථොකං බුද්ධවචනං, මද මද බුද්ධ වචන; කථෙත්වා ගච්ඡති, කියායේ;

සොපිබො මාණවකො, ඒ මාණවක තෙමේද, සොළසවස්සුද්දෙසිකොයෙව, සොළොස්වස් ඇතිවූයේම; **"සොළසවස්සො"ති උද්දිසිතබ්බො වොහරිතබ්බො'ති=සොළසවස්සුද්දෙසො, සොයෙව සොළසවස්සුද්දෙසිකො** නොහොත් **සොළසවස්සො'තිවා, උද්දිසිතබ්බං, අරහතීති=සොළසවස්සුද්දෙසිකො, සොළසවස්සානි'තිවා 'උද්දිසිතබ්බානි අස්සාති=සොළසවස්සුද්දෙසිකො, සොළසවස්සො'ති උද්දෙසොවා අස්ස අත්ථීති=සොළසවස්සුද්දෙසිකො**'යි විග්‍රහයි. **තිණ්ණං** වෙදානං (ඍග්වෙද යජුර්වේද සාමවෙද සංඛ්‍යාත) ත්‍රිවෙදයන්ගේ (ප්‍රගුණ

පාරගූ අහොසි. බ්‍රහ්මලොකතො ආගතසුද්ධසත්තස්ස ආසනෙ වා සයනෙ වා අඤ්ඤො කොචි නිසජ්ජිතා වා නිපජ්ජිතා වා නත්‍ථි. සො යදා ආචරිය ඝරං ගච්ඡති, තදාස්ස මඤ්චපීඨං සෙතෙන වත්‍ථෙන පටිච්ඡාදෙත්‍වා ලග්ගෙත්‍වා ඨපෙනති.

ථෙරො චින්තෙසි: සමයොදානි මාණවකං පබ්බාජෙතුං චිරඤ්ච මෙ ඉධාගච්ඡන්තස්ස නච කාචි මාණවකෙන සද්ධිං කථා උප්පජ්ජති හන්‍ද දානි ඉමිනා උපායෙන පල්ලඞ්කං නිස්සාය උප්පජ්ජිස්සතීති. ගෙහං ගන්ත්‍වා යථා තස්මිං ගෙහෙ ඨපෙත්‍වා මාණවකස්ස පල්ලඞ්කං අඤ්ඤං න කිඤ්චි ආසනං දිස්සති, තථා අධිට්ඨාසි. බ්‍රාහ්මණස්ස ගෙහෙ ජනො ථෙරං දිස්වා අඤ්ඤං කිඤ්චි ආසනං අපස්සන්තො, මාණවකස්ස පල්ලඞ්කං අත්‍ථරිත්‍වා අදාසි. නිසීදි ථෙරො පල්ලඞ්කෙ. මාණවකොපි ඛො තං ඛණං යෙව ආචරියඝරා ආගම්ම ථෙරං අත්තනො පල්ලඞ්කෙ නිසින්නං දිස්වා

---

භාවකරණ වශයෙන්) පාරගූ අහොසි, පාරප්‍රාප්තවූයේය; බ්‍රහ්මලොකතො ආගතසුද්ධසත්තස්ස, බඹලොවින් ආ ශුද්ධසත්ත්‍වයාගේ; ආසනෙවා, අස්නෙහි හෝ; සයනෙවා, යහන්හි හෝ; නිසජ්ජිතාවා, හිඳිනාවූ හෝ; නිපජ්ජිතාවා, හෝනාවූ හෝ; අඤ්ඤො කොචි නත්‍ථි, අන්කිසිවෙක් නැත්තේය; සො, තෙතෙමේ; යදා, යම්කලෙක්හි; ආචරියඝරං ගච්ඡති. ඇදුරාගේගෙටයේද; තදා, එකල්හි; අස්ස, ඔහුගේ; මඤ්චපීඨං, හැඳපුටු; සෙතෙන වත්‍ථෙන පටිච්ඡාදෙත්‍වා, සුදුවතකින්වසා; ලග්ගෙත්‍වා, එල්වා; ඨපෙනති, තබත්.

ථෙරො, සත්‍ථවිරතෙම; චින්තෙසි, මෙසේ සිතී; ඉදානි, දැන්; මාණවකං පබ්බාජෙතුං, මාණවකයා පැවිදිකරන්ට; සමයො, කාලයවේ; චිරංච, චිරාත් කාලයක් මුළුල්ලෙහිද; ඉධ ආගච්ඡන්තස්ස, මෙහි එන් නාවූ; මෙ, මාගේ; මාණවකෙන සද්ධිං, මාණවකයා සමග; කාචිකථා කිසිත් කථාවක්තොමෙෝ; නච උප්පජ්ජති, නොම උපනී; (මෙහිකාලාමඡීණයනොකොට "උප්පජ්ජි"යි කියයුතෙතහි ක්‍රියාවිපය්‍ය්‍යාස වශයෙන් වර්තමානකාලප්‍රයොග කෙළේයයි දතයුත්තේය) හන්‍ද, එබැවින්; ඉදානි, දැන්; ඉමිනා උපායෙන, මේඋපායෙන්; පල්ලඞ්කං නිස්සාය, පලඟ හෙවත් හිඳියයුතු අස්නනිසා; උප්පජ්ජිස්සති'ති, කථාවක් උපදින්නී යසි; ගෙහං ගන්ත්‍වා, ගෙටගොස්; තස්මිං ගෙහෙ, ඒ ගෘහයෙහි; මාණවකස්ස පල්ලඞ්කං ඨපෙත්‍වා, මාණවකයාගේ පලඟහැර; අඤ්ඤං කිඤ්චි ආසනං, අන්කිසි අස්නක්; යථානදිස්සති, සම්සේ නොපෙනේද; තථා අධිට්ඨාසි, එසේ ඉටුයේය; බ්‍රාහ්මණස්ස ගෙහෙ, බමුණුහුගේ ගෘහයෙහි; ජනො, ජනතෙමේ, ථෙරං, දිස්වා තෙරහුදැක, අඤ්ඤං කිඤ්චි ආසනං අපස්සන්තො, අන්කිසි අස්නක් නොදක්නාසේක්; මාණවකස්ස, මාණවකයාගේ; පල්ලඞ්කං අත්‍ථරිත්‍වා, පය්‍ය්‍යඞ්කය අතුරා; අදාසි, දුනි; ථෙරො, සත්‍ථවිරතෙමේ; පල්ලඞ්කෙ, පය්‍ය්‍යඞ්කයෙහි; නිසීදි, හුන්නේය; මාණවකොපිඛො, මාණවකතෙමේද වනාහී; තං ඛණඤ්ඤෙව, එකෙණෙහිම; ආචරියඝරා ආගම්ම, ඇදුරුගෙයින් අවුත්, අත්තනොපල්ලඞ්කෙ,

කුපිතො, අනත්තමනො "කො මම පල්ලඞ්කං සමණස්ස පඤ්ඤපෙසී"ති" ආහ. ථෙරො භත්තකිච්චං කත්වා වූපසන්තෙ[1] මාණවකස්ස චණ්ඩික්කභාවෙ එවමාහ:- "කිං පන ත්වං මාණවක කිඤ්චි මන්තං ජානාසී"ති. මාණවො- "භො පබ්බජිත මයි දානි මන්තෙ අජානන්තෙ අඤ්ඤෙ කො ජානිස්සන්තී"ති වත්වා ථෙරං පුච්ඡි:- "තුම්හෙ පන මන්තං ජානාථා"ති, පුච්ඡ මාණව පුච්ඡිත්වා සක්කා ජානිතුන්ති. අථ ඛො මාණවො තීසු වෙදෙසු සනිඝණ්ඩුකෙටුභෙසු සාක්ඛරප්පභෙදෙසු ඉතිහාසපඤ්චමෙසු යානි යානි ගණ්ඨිට්ඨානානි යෙසං නයං නෙව අත්තනා

---

තමාගේ පයඞ්කයෙහි; තිසින්නං, හුන්නාවූ; ථෙරං දිස්වා තෙරහු දැක; කුපිතො, කිපිසිත් ඇතියේ, අනත්තමනො, නොසතුටුසිත් ඇතියේ; මම පල්ලඞ්කං, මාගේ පලඟ සමණස්ස, ශ්‍රමණයාහට, කො, කවරෙක් තෙමේ පඤ්ඤපෙසීති, පැනවූයේදැයි; ආහ, විචාළේය; ථෙරො, ස්ථවිර තෙමේ; භත්තකිච්චං කත්වා, භත්තකෘත්‍යය කොට; මාණවකස්ස මාණවකයාගේ චණ්ඩික්කභාවෙ, තද්බව, වූපසන්තෙ ව්‍යුපශමනයවූකල්හි; මාණවක, මාණවකය; කිංපන, කිමෙක්ද; ත්වං, තෝ; කිඤ්චි මන්තං කිසිවේදයක්; ජානාසීති, දන්නෙහිදැයි, එවං ආහ, මෙසේ විචාළේය; මාණවො, මාණවකතෙමේ; භො පබ්බජිත, භවත් පැවිද්ද; ඉදානි, දැන් මන්තෙ, වෙදය; මයි අජානන්තෙ, මා නොදන්නාකල්හි අඤ්ඤෙ කො, අන් කවරහු; ජානිස්සන්තීති වත්වා, දන්නාහුදැයි කියා; තුම්හෙපන, නුඹවහන්සේ වනාහි; මන්තං, වේදය; ජානාථාති, දන්නහුදැයි; ථෙරං; තෙරහු; පුච්ඡි, විචාළේය. පුච්ඡ මාණව, විචාරව මාණවකය; පුච්ඡිත්වා ජානිතුං සක්කාති, (තමන් ප්‍රාදෙශිකඥනයෙහි සිටිය බැවින්) විචාරා දැනගන්ට හැකියයි කීයේය;) අථ ඛො, එකල්හි වනාහි; මාණවො, මාණවකතෙමේ. සනිඝණ්ඩුකෙටුභෙසු. (වෘක්ෂාදීන්ගේ වෙවචනප්‍රකාශකපර්යායනාමානුරූපශාස්ත්‍රසංඛ්‍යාත) නිඝණ්ඩුශාස්ත්‍රය හා (ක්‍රියා කල්ප විකල්ප ප්‍රකාශක කවීන්ට ප්‍රයොජනවත්)කෙටුභ ශාස්ත්‍රයද සහිතවූ; **"වචීභෙදාදිලක්ඛණා කිරියා කප්පීයති විකප්පීයති එතෙනාති= කිරියාකප්පො, සො පන වණ්ණපදබන්ධපදත්ථාදිවිභාගතො බහුවිකප්පොති කිරියාකප්පවිකප්පොති** දක්වන **අනවසෙසපරියාදානතො ගමෙන්තො පූරෙතීති=කෙටුභං සහ නිඝණ්ඩුනා කෙටුභෙන ච සනිඝණ්ඩුකෙටුභා, තෙසු" විග්‍රහයි,** සාක්ඛරප්පභෙදෙසු, අක්ෂර ප්‍රභෙද (ශික්ෂාව හා නිරුක්තියද) සහිතවූ; **"ඨානකරණාදිවිභාගතො නිබ්බචනවිභාගතො ච අක්ඛරා පභෙදීයන්ති එතෙනාති=අක්ඛරප්පභෙදො සහ අක්ඛරප්පභෙදෙනාති-සාක්ඛරප්පභෙදා, තෙසු සාක්ඛරප්පභෙදෙසු"යි** විග්‍රහයි ඉතිහාසපඤ්චමෙසු,(පෙරකියනලද භාරතාදී කථාවන්ගෙන් යුක්තවූ) ඉතිහාසශාස්ත්‍රය පස්වැනිකොටඇති; (**"අථබ්බණවෙද චතුත්ථං කත්වා ඉතිහ ආස ඉති ආසාති දුතියවචන පටිසංයුත්තො පොරාණකථා සඞ්ඛාතො ඉතිහාසො පඤ්චමො එතෙසන්ති=ඉතිහාස පඤ්චමා තෙසු**"යි, විග්‍රහයි,) තිසු වෙදෙසු, වෙදත්‍රයෙහි, යානි යානි ගණ්ඨිට්ඨා

---

1 වූපසන්තො-මුද්‍රිත.

පස්සති නාපි ආචරියො අද්දස, තෙසු තෙසු ථෙරං පුච්ඡි. ථෙරො පකතියාපි තිණ්ණං වෙදානං පාරගූ, ඉදානිපන පටිසම්භිදප්පත්තො, තෙනස්ස නත්ථි තෙසං පඤ්හානං විස්සජ්ජනෙ භාරොති, තාවදෙව තෙසං පඤ්හෙ විස්සජ්ජෙත්වා මාණවං ආහ:- මාණව අහං තයා බහුං පුච්ඡිතො, අහම්පිදානි තං එකං පඤ්හං පුච්ඡාමි, ව්‍යාකරිස්සසි මෙති. ආම භො පබ්බජිත පුච්ඡ ව්‍යාකරිස්සාමීති ථෙරො චිත්තයමකෙ ඉමං පඤ්හං පුච්ඡි:-"යස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, තස්ස චිත්තං නිරුජ්ඣිස්සති නුප්පජ්ජිස්සති, යස්සවා පනචිත්තං නිරුජ්ඣිස්සති නුප්පජ්ජිස්සති, තස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣතී'ති;

මාණවො උද්ධං වා අධො වා සරිතුං[1] අසක්කොන්තො, කිං නාම භො පබ්බජිත ඉදන්ති ආහ. "බුද්ධමන්තො නාමායං මාණවා"ති.

---

නාති, යම් යම් ග්‍රන්ථස්ථාන කෙනෙක් වෙද්ද; තෙසං, ඒ ග්‍රන්ථස්ථානයන්ගේ; නයං ක්‍රමය; අත්තනා නෙව පස්සති, තමන් නොදක්නේමය; අස්ස ඔහුගේ; ආචරියොපි, ඇදුරුතෙමේත්; න අද්දස, නුදුටුයේය; තෙසු තෙසු, ඒ ඒ තැනින්; ථෙරං, තෙරහු; පුච්ඡි, විචාළේය; ථෙරො ස්ථවිරතෙමේ; පකතියාපි, පියවින්ම; තිණ්ණං වෙදානං, ත්‍රිවෙදයන්ගේ පාරගූ, පරතෙරට පැමිණියේය; ඉදානි පන, දැන් වනාහි; පටිසම්භිදප්පත්තො, පිළිසිඹියාවට පැමිණියේය; තෙන, එහෙයින්; අස්ස, මේ තෙරහට; තෙසං පඤ්හානං, ඒ ප්‍රශ්නයන්ගේ; විස්සජ්ජනෙ, විසඳීමෙහි, භාරො නත්ථීති, බරෙක් නැත්තේය"යි; තාවදෙව, එකෙණෙහිම; තෙසං පඤ්හෙ විස්සජ්ජෙත්වා ඒ ප්‍රශ්නයන් විසඳා; මාණව, මාණවකය; තයා, තාවිසින්; අහං මම; බහුං, බොහෝ; පුච්ඡිතො, විචාරණලද්දෙම්; අහම්පි, මමද; ඉදානි, දැන්; ත්වං, තා; එකං පඤ්හං, එක් පැනයක් පුච්ඡාමි, විචාරමි; මෙ, මට; ව්‍යාකරිස්සසීති; ප්‍රකාශකරවයි; මාණවං, මාණවකයාහට; ආහ, කීය; භො පබ්බජිත, පින්වත් ප්‍රව්‍රජිතය; පුච්ඡ, විචාරව; ආම ව්‍යාකරිස්සාමීති (සියලුම පෘච්ඡාවෝ වෙදයෙහිම ඇතුලත් යයි සලකමින්) එසේය ප්‍රකාශකරන්නෙමියි කීයේය; ථෙරො, ස්ථවිරතෙමේ; යස්ස, (චුති චිත්තයෙන් යුක්තවූ) යම් ක්ෂීණාශ්‍රවයෙකුගේ; චිත්තං, සිත, උප්පජ්ජති, (උත්පාදක්ෂණ සමඞ්ගීතාවයෙන්) උපදීද; නනිරුජ්ඣති. නිරොධක්ෂණයට නොපැමිණි බැවින් නිරුධනොවේද;තස්ස චිත්තං, (එතැන් පටන්) ඒ පුද්ගලයාගේ සිත, නිරුජ්ඣිස්සති, නිරුද්ධවන්නේද; නුප්පජ්ජිස්සති, නූපදනේද: යස්සවා පන චිත්තං, යමෙකුගේ සිතවනාහී; නිරුජ්ඣිස්සති, (භඞ්ගක්ෂණයට පැමිණ) නිරුද්ධ වන්නේද; නුප්පජ්ජිස්සති, භඞ්ගයෙන් පසුභාගයෙහි තමන් හෝ අනිකෙක් හෝ) නූපදනේද; තස්ස චිත්තං, ඔහුගේ සිත;උප්පජ්ජති, උපදීද; න නිරුජ්ඣතීති, නිරුද්ධනොවේදැයි; චිත්තයමකෙ, චිත්ත යමකයෙහි; ඉමංපඤ්හං මේප්‍රශ්නය; පුච්ඡි. විචාළේය

මාණවො, මාණවකතෙමේ; උද්ධංවා අධොවා සරිතුං. පූර්වපදය හා පරපදය සොයාද අර්ථය පිරිසිඳින්ට; අසක්කොන්තො, නොහැකිවනුයේ: භොපබ්බජිත. පින්වත් පැවිද්ද; ඉදංකිංනාමාති, මේකිනම්දැයි ආහ,

---

1 හරිතුං=සමහර.

සක්කා පනායං භො මයාමපි දාතුන්ති? සක්කා මාණව අම්හෙහි ගහිතපබ්බජ්ජං ගණ්හන්තස්ස දාතුන්ති. තතො මාණවො මාතාපිතරො උපසඞ්කමිත්වා ආහ, අයං පබ්බජිතො බුද්ධමන්තං නාම ජානාති, තඤ්ච අත්තනො සන්තිකෙ අපබ්බජිතස්ස දෙති, අහං එතස්ස සන්තිකෙ පබ්බජිත්වා මන්තං උග්ගණ්හිස්සාමීති. අථස්ස මාතාපිතරො "පබ්බජිත්වාපි නො පුත්තො මන්තෙ ගණ්හාතු, ගහෙත්වා පුනාගමිස්සතී"ති. මඤ්ඤමානා "ගණ්හපුත්තා"ති අනුජානිංසු. ථෙරො දාරකං පබ්බාජෙත්වා ද්වත්තිංසාකාරකම්මට්ඨානං තාව ආචික්ඛි සො තත්ථ පරිකම්මං කරොන්තො න චිරස්සෙව සොතාපත්තිඵලෙ පතිට්ඨාසි. තතො ථෙරො චින්තෙසි. සාමණෙරො සොතාපත්තිඵලෙ පතිට්ඨිතො අභබ්බොදානි සාසනතො නිවත්තිතුං, සචෙ පනස්සාහං කම්මට්ඨානං වඩ්ඪෙත්වා කථෙය්‍යං, අරහත්තං පාපුණෙය්‍ය, අප්පොස්සු

---

විචාළේය; මාණව, මාණවකය; අයං බුද්ධමන්තො නාම ඉති, මේ බුද්ධමන්ත්‍රයනමැයි කියේය. භො පින්වත අයං, මේමන්ත්‍රය තෙමේ; මයාමපි, මටත්; දාතුංසක්කාති දෙන්ට හැකිදැයි; මාණව, මාණවකය, අම්හෙහි අප විසින්; ගහිතං, ගන්නාලද; පබ්බජ්ජං. ප්‍රව්‍රජ්‍යාව; ගණ්හන්තස්ස, ගන්නක්හට, දාතුංසක්කාති; දෙන්ටහැකියයි; තතො. ඉන්පසු මාණවො, මාණවකතෙමේ; මාතා පිතරො උපසඞ්කමිත්වා, මව්පියන්කරා එළඹ; අයං පබ්බජිතො, මේ පැවිදිතෙමේ; බුද්ධමන්තං ජානාතිනාම, බුද්ධමන්ත්‍රයක් දන්නේනම; අත්තනො සන්තිකෙ, තමා වෙතැ; අපබ්බජිතස්ස, පැවිදි නුවූවෙක්හට; තඤ්ච දෙති, නොමදෙන්නේය; අහං මම; එතස්ස සන්තිකෙ පබ්බජිත්වා, මොහුගේ සමීපයෙහි පැවිදිව; මන්තං උග්ගණ්හිස්සාමීති, මන්ත්‍රය උගන්නෙමියි; ආහ, කිය; අථ, එකල්හි, අස්ස මාතාපිතරො, ඔහුගේ මව්පිය දෙදන; නො පුත්තො, අපගේ පුත්‍රතෙමේ; පබ්බජිත්වාපි, පැවිදිවද; මන්තෙ ගණ්හාතු" මන්ත්‍රයන් ගනීවා, ගහෙත්වා, ගෙන; පුන ආගමිස්සති'ති නැවත එන්නේයයි; මඤ්ඤමානා, සිතමින්; ගණ්හ පුත්තාති, ගනුව පුත්‍රයයි; අනුජානිංසු, අනුදත්හු; ථෙරො, ස්ථවිරතෙමේ; දාරකං පබ්බාජෙත්වා, ළදරුවා පැවිදිකරවා, ද්වත්තිංසාකාරකම්මට්ඨානං, (අත්ථි ඉමස්මිං කායෙ යනාදිවූ) ද්වත්තිංසාකාරකර්මස්ථානය; තාව ආචික්ඛි, (මන්ත්‍රයට මේ උපචාරයයි පළමුකොට කීයේය;) සො, හෙතෙම; තත්ථ, එහි; පරිකම්මං කරොන්තො, පිරියම් කරනුයේ; නචිරස්සෙව, නොබෝකලකින්ම; සොතාපත්ති ඵලෙ පතිට්ඨාසි, සෝවාන් පෙලෙහි පිහිටියේය; තතො, ඉන්පසු; ථෙරො ස්ථවිරතෙමේ, සාමණෙරො, හෙරණතෙම; සොතාපත්තිඵලෙ පතිට්ඨිතො, සෝවාන් පෙලෙහි පිහිටියේය; දානි, දැන්; සාසනතො, සස්නෙන්; නිවත්තිතුං, පහවන්ට; අභබ්බො, අභව්‍යවේ; අස්සපන, මේ හෙරණ හට වනාහි, අහං, මම; කම්මට්ඨානං, කර්මස්ථානය; වඩ්ඪෙත්වා; (මතුමාර්ගීය පිණිස) වඩා; සචෙ කථෙය්‍යං, ඉදින් කියෙම් නම්; අරහත්තං පාපුණෙය්‍ය, රහත් බවට පැමිණෙන්නේය; බුද්ධ වචනං ගහෙතුං, බුද්ධ වචනය ග්‍රහණය

කො භවෙය්‍ය බුද්ධවචනං ගහෙතුං, සමයොදානි තං චණ්ඩවජ්ජිත්ථෙරස්ස සන්තිකං පෙසෙතුන්ති" තතො තං ආහ එහි ත්වං සාමණෙර ථෙරස්ස සන්තිකං ගන්ත්වා බුද්ධවචනං උග්ගණ්හ, මම වචනෙන ආරොග්‍යං පුච්ඡ, එවඤ්ච වදෙහි උපජ්ඣායො මං භන්තෙ තුම්හාකං සන්තිකං පහිණීති කො . නාමො තෙ උපජ්ඣායොතිච වුත්තෙ සිග්ගවත්ථෙරොනාම භන්තෙ'ති වදෙය්‍යාසි, අහං කො නාමොති වුත්තෙ එවං වදෙය්‍යාසි, මම උපජ්ඣායො භන්තෙ තුම්හාකං නාමං ජානාතීති, එවං භන්තෙති ඛො තිස්සො සාමණෙරො ථෙරං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා, අනුපුබ්බෙන චණ්ඩවජ්ජිත්ථෙරස්ස සන්තිකං ගන්ත්වා වන්දිත්වා එකමන්තං අට්ඨාසි. ථෙරො සාමණෙර කුතො ආගතොසීති ආහ. උපජ්ඣායො මං භන්තෙ තුම්හාකං සන්තිකං පහිණීති, කො නාමො තෙ උපජ්ඣායොති සිග්ගවත්ථෙරො නාම භන්තෙති අහං කොනාමොති. මම

---

කරන්ට; අප්පොස්සුක්කො භවෙය්‍ය, (රහත් භාවයෙන් කළ කෘත්‍යය ඇතිහෙයින්) අල්පොත්සාහ ඇතිවන්නේය; තං, ඔහු චණ්ඩවජ්ජිත්ථෙරස්ස සන්තිකං, එනම් තෙරවෙතට; පෙසෙතුං, යවන්ට; ඉදානි, දැන්; සමයොති, කාලයවේයයි; චින්තෙසි, සිතී, තතො, ඉන්පසු; තං, ඒ හෙරණහට; සාමණෙර, හෙරණ, ත්වං, තෝ, එහි, එව; ථෙරස්ස සන්තිකං ගන්ත්වා; තෙරහුගේ සමීපයටගොස්, බුද්ධවචනං, බුද්ධවචනය; උග්ගණ්හ, උගනුව; මම වචනෙන, මාගේ වචනයෙන්; ආරොග්‍යං නිරෝගිභාවය; පුච්ඡ, විචාරව, භන්තෙ, වහන්ස උපජ්ඣායො, උපාධ්‍යායතෙමේ, මං, මා; තුම්හාකං සන්තිකං, නුඹවහන්සේ සමීපයට; පහිණීති, එවූයේයයි; එවඤ්චවදෙහි, මෙසේද කියව; තෙ උපජ්ඣායො, තොපගේ උපාධ්‍යායතෙමේ; කොනාමොතිච වුත්තෙ, කිනම්දැයි විචාළකල්හි; භන්තෙ, වහන්ස; සිග්ගවත්ථෙරොනාමොති, සිග්ගවස්ථවිරනමැයි; වදෙය්‍යාසි, කියව; අහං, මම; කොනාමොති වුත්තෙ, කිනම්දැයි විචාළකල්හි; භන්තෙ, වහන්ස; මම උපජ්ඣායො, මාගේ උපාධ්‍යායතෙමේ; තුම්හාකං නාමං, නුඹවහන්සේගේ නාමය; ජානාති, දනී; එවං වදෙය්‍යාසීති, මෙසේ කියවයි; ආහ, කී; තිස්සො සාමණෙරො, තිස්ස නම් හෙරණතෙමේ; එවං භන්තෙති ඛො, එසේය වහන්සැයි කියා; ථෙරං, තෙරහු; අභිවාදෙත්වා, මනාකොට වැඳ; පදක්ඛිණං කත්වා, පැදකුණුකොට; අනුපුබ්බෙන, පිළිවෙළින්; චණ්ඩවජ්ජිත්ථෙරස්ස සන්තිකං ගන්ත්වා, චණ්ඩවජ්ජිස්ථවිරයන්ගේ වෙත ගොස්; වන්දිත්වා, වැඳ; එකමන්තං අට්ඨාසි, එකත්පසෙක සිටියේය; ථෙරො, ස්ථවිරතෙමේ; සාමණෙර, සාමණෙරය; කුතො ආගතොසීති, කොයිසිට ආයෙහිදැයි; පුච්ඡි, විචාළේය; සාමණෙරො, සාමණෙර තෙමේ; භන්තෙ, වහන්ස; උපජ්ඣායො, උපාධ්‍යායතෙමේ; මං, මා; තුම්හාකං සන්තිකං, නුඹවහන්සේගේ සමීපයට; පහිණීති, එවූයේයයි; ආහ, කීය; තෙ උපජ්ඣායො, තොපගේ උපාධ්‍යායතෙමේ; කොනාමොති, කිනම්දැයි; භන්තෙ, වහන්ස; සිග්ගවත්ථෙරොනාමොති, සිග්ගවස්ථවිරනමැයි; අහං, මම; කොනාමොති, කිනම්දැයි; භන්තෙ,

උපජ්ඣායො භන්තෙ තුම්හාකං නාමං ජානාති. පත්තචීවරං දානි පටිසාමෙහීති. සාධු භන්තෙති සාමණෙරො පත්තචීවරං පටිසාමෙත්වා පුනදිවසෙ පරිවෙණං සම්මජ්ජිත්වා උදකදන්තපොනං උපට්ඨපෙසි. ථෙරො සම්මජ්ජිතට්ඨානං පුන සම්මජ්ජි, තං උදකං ඡඩ්ඩෙත්වා අඤ්ඤං උදකං ආහරි, තඤ්ච දන්තකට්ඨං අපනෙත්වා අඤ්ඤං දන්තකට්ඨං ගණ්හි. එවං සත්තදිවසානි කත්වා සත්තමෙ දිවසෙ පුන පුච්ඡි. සාමණෙරො පුනපි පුබ්බෙ කථිතසදිසමෙව කථෙසි. ථෙරො සො වතායං බ්‍රාහ්මණොති සඤ්ජානිත්වා කිමත්ථං ආගතොසීති ආහ. බුද්ධවචනං උග්ගණ්හනත්ථාය භන්තෙති. ථෙරො උග්ගණ්හදානි සාමණෙරාති වත්වා පුනදිවසතොප්පභුති බුද්ධවචනං පට්ඨපෙසි. තිස්සො සාමණෙරොව හුත්වා ඨපෙත්වා විනයපිටකං සබ්බං බුද්ධවචනං උග්ගණ්හි

---

වහන්ස; මම උපජ්ඣායො, මාගේ උපාධ්‍යායතෙමේ; තුම්හාකං නාමං, තුඹවහන්සේගේ නාමය, ජානාතීති, දනියයි කියේය; ඉදානි, දැන්; පත්තචීවරං, පාසිවුරු; පටිසාමෙහීති, තැන්පත් කරවයි; සාමණෙරො, සාමණෙරතෙමේ; සාධුභන්තෙති, යහපත වහන්සැයි කියා; පත්තචීවරං පටිසාමෙත්වා, පාසිවුරු තැන්පත් කොට තබා; පුනදිවසෙ, දෙවන දවස්හි; පරිවෙණං සම්මජ්ජිත්වා, පිරිවෙනහැමද; උදකදන්තපොනං, පැන් දැහැටි; (“**දන්ත පුනන්ති විසොධෙන්ති එතෙනාති=දන්තපොනං. උදකංච දන්තපොනංච= උදකදන්තපොනං තං**”යි විග්‍රහයි.) උපට්ඨපෙසි, පරිභොගය පිණිස එළවාතැබුයේය; ථෙරො, සත්විරතෙමේ; සම්මජ්ජිතට්ඨානං, හැමදිතැන; පුනසම්මජ්ජි, නැවත හැමැන්දේය; තං උදකං ඡඩ්ඩෙත්වා, ඒ පැන්දමා; අඤ්ඤං උදකං, ආහරි, අනික් පැනක් ගෙනායේය; තං දන්තකට්ඨංච අපනෙත්වා, ඒ දැහැටිද පහකොට; අඤ්ඤං දන්තකට්ඨං ගණ්හි, අන්‍ය දන්තකාෂ්ඨයෙක් ගත්තේය; එවං සත්තදිවසානිකත්වා, (සත්විරතෙමේ හෙරණහුගේ ක්‍ෂාන්ති වීර්‍ය්‍යාදි ගුණය විමසනු පිණිස) මේ ප්‍රකාරයෙන් සත්දවසක්කොට; සත්තමෙ දිවසෙ, සත්වනදිනෙහි; පුනපුච්ඡි, නැවත විචාළේය; සාමණෙරො, සාමණෙරතෙමේ; පුනපි, නැවතද; පුබ්බෙ කථිත සදිසමෙව, පෙර කියනලද්ද සදෘශවම; කථෙසි, කිය; ථෙරො, සත්විරතෙමේ; වත, ඒකාන්තයෙන්; සො අයං, ඒ මේ තෙමේ; බ්‍රාහ්මණොති සඤ්ජානිත්වා, බ්‍රාහ්මණයෙක්යයි හැඳින; කිමත්ථං, කුමක් පිණිස; ආගතොසීති ආහ, ආයෙහිදැයි විචාළේය; භන්තෙ, වහන්ස; බුද්ධවචනං, බුද්ධවචනය; උග්ගණ්හනත්ථාය ඉති, උගන්නා පිණිසයයි කිය; ථෙරො, සත්විරතෙමේ; සාමණෙර, හෙරණ; ඉදානි, දැන්; උග්ගණ්හ ඉති, උගනුවයි; වත්වා, කියා; පුනදිවසතොප්පභුති, දෙවනදවස පටන්; බුද්ධවචනං, බුද්ධවචනය; පට්ඨපෙසි, උගන්වන්ට ආරම්භකොළේය; තිස්සො, තිස්සතෙමේ; සාමණෙරොහුත්වාව, සාමණෙරවම; විනය පිටකං ඨපෙත්වා, විනයපිටකය තබා; (විනයපිටකය තබා යනු මෙහි

සද්ධිං අට්ඨකථාය, උපසම්පන්නකාලෙ පන අවස්සිකොව සමානො තිපිටකධරො අහොසි. ආචරියුපජ්ඣායා මොග්ගලිපුත්තතිස්සත්ථෙරස්ස හත්ථෙ සකලං බුද්ධවචනං පතිට්ඨාපෙත්වා යාවතායුකං ඨත්වා පරිනිබ්බායිංසු. මොග්ගලිපුත්තතිස්සත්ථෙරොපි අපරෙන සමයෙන කම්මට්ඨානං වඩ්ඪෙත්වා අරහත්තං පත්වා බහූනං ධම්මවිනයං වාචෙසි.

තෙන ඛො පන සමයෙන බින්දුසාරස්ස රඤ්ඤො එකසතපුත්තා අහෙසුං. තෙ සබ්බෙ අසොකො අත්තනා සද්ධිං එකමාතිකං තිස්සකුමාරං ඨපෙත්වා ඝාතෙසි. ඝාතෙන්තො ච චත්තාරි වස්සානි අනභිසිත්තොව රජ්ජං කාරෙත්වා චතුන්නං වස්සානං අච්චයෙන තථාගතස්ස

---

හෙරණුන්ට විනය පුහුණුකිරීම චාරිත්‍රයක් නොවන්නේය; එහෙයින් විනයපිටකය තබා සෙසු බුද්ධවචනය උද්ග්‍රහණය කරපුයේයයි ත්‍රිවිධ ගණ්ඨිපදයෙහිම කියනලදී.) **අට්ඨකථාය සද්ධිං**, අටුවා කථාව සමග; **සබ්බං** බුද්ධවචනං, සියලු බුද්ධවචනය; උග්ගණ්හි, උද්ග්‍රහණයකොළේයි; උපසම්පන්නකාලෙ පන, උපසපන්වූ කල්හි වනාහි; අවස්සිකොයෙව, සමානො, (උපසම්පදාවූ තැන් පටන්) අපරිපූර්ණවූ එක්වසක් ඇතිවම; **("වස්සං අස්ස අත්ථීති= වස්සිකො නවස්සිකො= අවස්සිකොයි"** විග්‍රහයි.) තිපිටකධරො අහොසි, තෙවළාදරවූයේය; ආචරියුපජ්ඣායා, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ; මොග්ගලිපුත්තතිස්සත්ථෙරස්ස, මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන්ගේ; හත්ථෙ, අතෙහි; සකලං බුද්ධවචනං, සියලු බුද්ධවචනය; පතිට්ඨාපෙත්වා, පිහිටුවා; යාවතායුකං ඨත්වා, යම් පමණ ආයුෂද එපමණ සිට; පරිනිබ්බායිංසු, (දුඃඛවමින් මුක්තව) පිරිනිවන් පෑවාහුය; (මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන්ගේ ළැයෙහි පිහිටුවනලද බුද්ධවචනය අතෙහි පිහිටුවනලදැයි ව්‍යවහාරවශයෙන් කියනලදී.) මොග්ගලිපුත්තතිස්සත්ථෙරොපි, මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරතෙමේද; අපරෙන සමයෙන, අන්‍යකාලයෙක්හි; කම්මට්ඨානං වඩ්ඪෙත්වා, කමටහන් වඩා; අරහත්තං පත්වා, රහත්බවට පැමිණියේ; බහූනං, බොහෝනට; ධම්මවිනයං, ධර්මවිනය; වාචෙසි, කියවූයේය.

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; බින්දුසාරස්ස රඤ්ඤො, බින්දුසාර රජහුගේ; එකසතපුත්තා අහෙසුං, එක්සියයක් පුත්‍රයෝවූවාහුය; (**'එකඤ්ච සතඤ්ච=එකසතං, එකෙනාධිකෙන වා සතං=එකසතං කො.''** යි විග්‍රහයි.) අසොකො, අශොක කුමාරතෙමේ, අත්තනා සද්ධිං, තමා සමග; එකමාතිකං, එකමාතෘකවූ හෙවත් තමන්ගේ සහෝදරවූ; (**එකා මාතා අස්සාති=එකමාතිකො, තං**''යි විග්‍රහයි.) තිස්සකුමාරං ඨපෙත්වා, තිස්සකුමාරයා තබා; තෙ සබ්බෙ, ඒ සියල්ලන්; ඝාතෙසි, නැසූයේය; ඝාතෙන්තො, ඝාතනයකරනුයේ; චත්තාරි වස්සානි, සිව්වර්ෂයක්; අනභිසිත්තොව, අභිෂෙකනොකරන ලදුවම; රජ්ජං කාරෙත්වා, රජයකරවා; චතුන්නං වස්සානං අච්චයෙන, සිව්වර්ෂයකගේ ඇවෑමෙන්; තථාගතස්ස, තථාගතයන් වහන්සේගේ;

පරිනිබ්බාණතො ද්වින්නං වස්සසතානං උපරි අට්ඨාරසමෙ වස්සෙ සකලජම්බුදීපෙ එකරජ්ජාභිසෙකං පාපුණි. අභිසෙකානුභාවෙන චස්ස ඉමා රාජිද්ධියො ආගතා: මහාපථවියා හෙට්ඨා යොජනප්පමාණෙ ආණා පවත්තති තථා උපරි ආකාසෙ, අනොතත්තදහතො අට්ඨහි කාජෙහි සොළසපානීයඝටෙ දිවසෙ දිවසෙ දෙවතා ආහරන්ති යතො සාසනෙ උප්පන්නසද්ධො හුත්වා අට්ඨඝටෙ භික්ඛුසඞ්ඝස්ස අදාසි, ද්වෙ ඝටෙ සට්ඨිමත්තානං තිපිටකධරභික්ඛූනං, ද්වෙ ඝටෙ අග්ගමහෙසියා අසන්ධිමිත්තාය, චත්තාරො ඝටෙ අත්තනා පරිභුඤ්ජි, දෙවතා එව හිමවන්තෙ නාගලතා දන්තකට්ඨං නාම අත්ථි සිනිද්ධං මුදුකං රසවන්තං තං දිවසෙදිවසෙ ආහරන්ති, යෙන රඤ්ඤොච මහෙසියාච සොළසන්නඤ්ච නාටකසහස්සානං සට්ඨිමත්තානං ච භික්ඛුසහස්සානං දෙවසිකං දන්තපොනකිච්චං නිප්පජ්ජති දෙවසිකමෙව තස්ස දෙවතා අගදමලකං

---

පරිනිබ්බාණතො, පරිනිර්වාණයෙන්; ද්වින්නං වස්සසතානං; දෙසියවර්ෂයකාගේ; උපරි, මත්තෙහි; අට්ඨාරසමෙ වස්සෙ, අටළොස්වන වර්ෂයෙහි; සකලජම්බුදීපෙ, සියලු ජම්බුද්වීපයෙහි; එකරජ්ජාභිසෙකං, එකාධිපති වශයෙන් කරනුලබන්නාවූ අභිෂේකයට; පාපුණි, පැමිණියේය අභිසෙකානුභාවෙන ච, අභිෂේකානුභාවයෙන්ද; අස්ස, මේ රජහට; ඉමා රාජිද්ධියො, මේ රාජභාවානුගත ප්‍රභාවයෝතුමූ; ආගතා, පැමිණියාහුය; මහාපථවියා, මහාපෘථිවියෙන්; හෙට්ඨා, යට; යොජනප්පමාණෙ, යොදුනක් පමණ තන්හි; ආණාපවත්තති, අණපවත්නීය; උපරිආකාසෙ, මතු අහසෙහි; තථා, එසේයි; අනොතත්තදහතො, අනවතප්තවිලින්; අට්ඨහිකාජෙහි, අටකදකින්; සොළසපානීයඝටෙ, පැන්කළ සොළසක්; දිවසෙ දිවසෙ, දවසක් දවසක්පාසා; දෙවතා, දේවතාවෝතුමූ; ආහරන්ති, ගෙනඑත්; සාසනෙ උප්පන්නසද්ධො හුත්වා, සස්නෙහි උපන් සැදැහැ ඇතියෙක්ව; යතො, යම් ඒ සොළොස් පැන්කලයෙන්; අට්ඨඝටෙ, කළඅටක්, භික්ඛුසඞ්ඝස්ස, භික්සඟනට; අදාසි, දේ; ද්වෙඝටෙ, දෙකළයක්; සට්ඨිමත්තානං, සැටක් පමණවූ; තිපිටකධරභික්ඛූනං, තෙවළාදර භික්ෂූන්ටද; ද්වෙඝටෙ, දෙකලයක්; අසන්ධිමිත්තාය, අසන්ධිමිත්‍රානම්වූ; අග්ගමහෙසියා, අගමෙහෙසියටද දේ; චත්තාරොඝටෙ, කළසතරක්; අත්තනා පරිභුඤ්ජි, තමන් පරිභොගකොරේ; හිමවන්තෙ, හිමවතෙහි; සිනිද්ධං, සිනිඳුවූ; මුදුකං, මොළොක්වූ; රසවන්තං, රසවත්වූ; නාගලතාදන්තකට්ඨං, යම්නාලිය දැහැටියෙක්; අත්ථිනාම, ඇත්තේ නම්වේද; තං, ඒ දැවටුව; දෙවතාඑව, දෙවතාවෝ තුමූම; දිවසෙ දිවසෙ, දවසක් දවසක්පාසා ආහරන්ති, ගෙනඑත්; යෙන, යම් දැහැටියෙක්; රඤ්ඤොච, රජහුගේද; මහෙසියාච, මෙහෙසියගේද; සොළසන්නං නාටකසහස්සානඤ්ච සොළොස් දහසක් නෘත්‍ය ස්ත්‍රීන්ගේද; සට්ඨිමත්තානං භික්ඛුසහස්සානංච, සැටදහසක් පමණ භික්ෂූන්ගේද; දන්තපොනකිච්චං, දැවටු කෘත්‍යය; දෙවසිකං, දවස්පතා; නිප්පජ්ජති, නිපදනේය; දෙවසිකං එව,

අගදහරීටකං සුවණ්ණවණ්ණංච ගන්ධරසසම්පන්නං අම්බපක්කංච ආහරන්ති, තථා ඡද්දන්තදහතො පඤ්චවණ්ණං නිවාසනපාපුරණං පීතකවණ්ණං හත්ථපුඤ්ඡනපටකං දිබ්බංච පානකං ආහරන්ති, දෙවසිකමෙව පනස්ස අනුලෙපනගන්ධං පාරුපනත්ථාය අසුත්තමයිකං සුමනපුප්ඵපටං මහාරහඤ්ච අඤ්ජනං නාගභවනතො නාගරාජානො ආහරන්ති, ඡද්දන්තදහෙච උට්ඨිතස්ස සාලිනො නව වාහසහස්සානි දිවසෙ දිවසෙ සුවා ආහරන්ති, මූසිකා නිත්ථුසකණෙ කරෙන්ති

---

දවස්පතාම; තස්ස, ඒ රජහට; සුවණ්ණවණ්ණං, රන්වන්වූ; අගදමලකඤ්ච, ස්වල්පයකින්ද ශරීරශොධනාදියට සමර්ථ සියලු දෙස්හරණාවූ) ඖෂධාමලකද; අගදහරීටකං,ච (එසේමවූ) බෙහෙත් අරළුද; ගන්ධරසසම්පන්නං, සුගන්ධයෙන් හා රසයෙන් යුක්තවූ; අම්බපක්කඤ්ච, අඹපක්ද; දෙවතා, දෙවතාවෝ; ආහරන්ති, ගෙනඑත්; ඡද්දන්තදහතො, සැදෑත්විලවෙතපිහිටාතිබෙනලදකල්පවෘක්ෂයන්ගෙන් දෙහෝ නොහොත් දෙව්විමන්වලින් හෝ; පඤ්චවණ්ණං, පඤ්චවර්ණයෙන් යුක්තවූ; නිවාසන පාපුරණං, හඳනා පොරොණා වස්ත්‍රද; පීතකවණ්ණං රන්වන්වූ; හත්ථපුඤ්ඡන පටකං, අත්පිස්නා පටද; දිබ්බංපානකංච, දිව්‍යමය (ඵලරසයෙන් සම්පාදනය කරණලද) පානයන්ද; තථා ආහරන්ති, එසේ ගෙනඑත්; දෙවසිකං එව, දවස්පතාම, අස්සපන, ඒ රජහට වනාහි; (නොයෙක් සුවඳ ඇත්තාවූ)අනුලෙපන ගන්ධං, ශරීරානුලෙප සුගන්ධයන්ද; පාරුපනත්ථාය, පාරුපනය පිණිස; අසුත්තමයිකං, (කප්රුකින් උපන් දිවදුහුල් හෙයින්) හුයින්නොකරණලද; සුමනපුප්ඵපටං, (සැමතන්හි සියුම් සියුම්ව උද්ගත පුෂ්පයන් ඇති හෙයින්) සුමනපුෂ්පපටයයි නම්ලද එනම් වස්ත්‍රයන්ද; මහාරහං, මාහැගිවූ; අඤ්ජනංච, අඳුන්ද; (**එත්ථ චතස්සො මුට්ඨියො එකො කුඩුබො, චත්තාරො කුඩුබා එකො පත්ථො, චත්තාරො පත්ථා එකො ආළ්හකො, චත්තාරො ආළ්හකා එකං දොණං, චත්තාරි දොණානි එකා මානිකා, චතස්සො මානිකා එකා ඛාරි, වීසති ඛාරිකා එකො වාහො** කියනලදී.) නාගභවනතො, නාගභවනයෙන්; නාගරාජානො, නාරජහු; ආහරන්ති, ගෙනඑත්; ඡද්දන්තදහෙච සැදෑත්විලෙහිම; උට්ඨිතස්ස සාලිනො, සයංජාතවූ හෙවත් තෙමේමවූ හැල් සම්බන්ධ; (සමුදායාර්ථය අපෙක්ෂාකොට මෙහි සාලිනො''යි එකවචනය කියනලදී, සාලීන්ගේ යන අර්ථයි, එකවචන ප්‍රයොගකරණලද මෙසේවූ සෙසු තන්හිදු මෙම නයින් දතයුත්තේය;) නවවාහසහස්සානි, වාහනවදහසෙක්; දිවසෙ දිවසෙ, දවස්පතා; සුවා, ගිරව්; ආහරන්ති, ගෙනඑත්; (මෙහි **සතරමිටෙක් එක් කුඩුබයෙක්නම් වේ, සතර කුඩුබයෙක් එක්පතෙක් නම්වේ සතරපතෙක් එක්ලාස්සෙක් නම්වේ, සතරලාස්සෙක් එක් ද්‍රොණයෙක්නම්වේ, සතරද්‍රොණයෙක් එක්මානිකාවෙක් නම්වේ, සිව්මානිකාවෙක් එක්ඛාරියෙක් නම්වේ, සිව්ඛාරියෙක් එක්වාහයෙක් නමැයි දතයුත්තේය. මෙම දක්වනු සඳහා සාරාර්ථදීපනීනම් ටීකා**

එකොපි ඛණ්ඩතණ්ඩුලො න හොති, රඤ්ඤො සබ්බට්ඨානෙසු අයමෙව තණ්ඩුලො පරිභොගං ගච්ඡති, මධුමක්ඛිකා මධුං කරොන්ති, කම්මාරසාලාදීසු අච්ඡා කූටං පහරන්ති, කරවීකසකුණා ආගන්ත්වා මධුරස්සරං විකූජන්තා රඤ්ඤො බලිකම්මං කරොන්ති, ඉමාහි ඉද්ධීහි සමන්නාගතො රාජා එකදිවසං සුවණ්ණසඞ්ඛලිකබන්ධනං පෙසෙත්වා චතුන්නං බුද්ධානං අධිගතරූපදස්සනං කප්පායුකං කාලං නාගරාජානං ආනයිත්වා සෙතච්ඡත්තස්ස හෙට්ඨා මහාරහෙ පල්ලඞ්කෙ නිසීදපෙත්වා අනෙකසතවණ්ණෙහි ජලජථලජපුප්ඵෙහි සුවණ්ණපුප්ඵෙහි ච පූජං කත්වා සබ්බාලඞ්කාරපතිමණ්ඩිතෙහි ච සොළසහි නාටකසහස්සෙහි සමන්තතො පරික්ඛිපිත්වා අනන්තඤාණස්ස තාව මෙ සද්ධම්මවරචක්ක

---

වෙහි එත්ථ චතස්සොමුට්ඨියො එකො කුඩුවො, චත්තාරො කුඩුවා එකො පත්ථො, චත්තාරො පත්ථා එකො ආළ්හකො, චත්තාරො ආළ්හකා එකං දොණං, චත්තාරි දොණානි එකා මානිකා, චතස්සො මානිකා එකා ඛාරි, වීසතිඛාරිකා එකො වාහො"යි කියනලදී.)මූසිකා, මීයෝ; නිප්ඵුසක රණං කරොන්ති, කුඩුනැතිකිරීම කෙරෙත්;

එකොපි, එකකුදු; ඛණ්ඩතණ්ඩුලො න හොති, කඩසහලෙක් නොවේ; රඤ්ඤො, රජහුගේ; සබ්බට්ඨානෙසු, හැමතන්හි; අයමෙව තණ්ඩුලො, මෙම සහල්; පරිභොගං ගච්ඡති, පරිභොගයටයේ; මධුමක්ඛිකා, මීමැස්සෝ; මධුං කරොන්ති, (අවුත් සම්පස්ථානයෙහි) මී කෙරෙත්; කම්මාරසාලාදීසු, කඹුරුසල් ආදියෙහි; අච්ඡා, වලස්සු; කූටං පහරන්ති, කුළුගසත්; කරවීකසකුණා, කුරවිකොවුල්ලෝ; ආගන්ත්වා, අවුත්; මධුරස්සරං විකූජන්තා, මිහිරිසවර විකූජනය කොරෙමින්; රඤ්ඤො, රජහුගේ; බලිකම්මං කරොන්ති, (සම්ප්‍රාප්ත බලිකර්මකාරක රටවැසියන් මෙන් මිහිරි **සවරයෙන්** ගායනාකෙරෙමින්) බලිකර්මකෙරෙත්; ඉමාහි ඉද්ධීහි, මේ සෘද්ධියෙන්; සමන්නාගතො රාජා, යුක්තරජතෙමේ; එකදිවසං, එක්දවසක්; සුවණ්ණසඞ්ඛලිකබන්ධනං පෙසෙත්වා, රන්සැකිල්ල යවා; (**"සුවණ්ණසඞ්ඛලිකාමෙව බන්ධනං=සුවණ්ණසඞ්ඛලිකබන්ධනං"** යි විග්‍රහයි.) චතුන්නං බුද්ධානං (කකුසන්ධාදී) සතර බුදුවරයන්ගේ; අධිගතරූපදස්සනං, ප්‍රතිලබ්ධ රූපදර්ශනය ඇති; කප්පායුකං, කල්පායුෂ්කවූ; කාලං නාගරාජානං, කාලනම් නාරදහු; ආනයිත්වා, ගෙන්වා; සෙතච්ඡත්තස්ස හෙට්ඨා, ශ්වෙතච්ඡත්‍රයයට; මහාරහෙ පල්ලඞ්කෙ, මාහැඟි පර්‍ය්‍යඞ්කයෙහි; නිසීදපෙත්වා, හිඳුවා; අනෙකසතවණ්ණෙහි, නොයෙක් සියගණන් වර්ණ ඇති; ජලජථලජ පුප්ඵෙහි ච, දියෙහි හා ගොඩෙහි උපන් මලින්ද; සුවණ්ණපුප්ඵෙහි ච, රන්මලින්ද; පූජංකත්වා පුදකොට; සබ්බාලඞ්කාර පතිමණ්ඩිතෙහි, සර්වාලඞ්කාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ; සොළසහි නාටක සහස්සෙහි ච, සොළොස් දහසක් නළඟනන් ලවාද; සමන්තතො, හාත්පසින්; පරික්ඛිපිත්වා, වටකරවා; (තාවයනු පදපූරණාර්ථයෙහි නිපාතමාත්‍රයෙක) මෙ, මාගේ; අනන්තඤාණස්ස, අපරියන්තඥාණයක්

වත්තිනො සම්මාසම්බුද්ධස්ස රූපං ඉමෙසං අක්ඛීනං ආපාථං කරොහීති වත්වා තෙන නිම්මිතං । සකලසරීරෙ විප්පකිණ්ණපුඤ්ඤප්පභාවනිබ්බත්තාසීති අනුබ්‍යඤ්ජනපතිමණ්ඩිතද්වත්තිංසමහාපුරිසලක්ඛණ සස්සිරීකතාය විකසිතකමලුප්පලපුණ්ඩරීකපතිමණ්ඩිතමිව සලිලතලං තාරාගණරස්මිජාලවිසරවිප්ඵුරිතසොභාසමුජ්ජලමිව ගගනතලං නීලපීතලොහිතාදිභෙදවිචිත්‍රවණ්ණරංසිවිනද්ධබ්‍යාමප්පභාපරික්ඛෙපවිලාසිතාය සඤ්ඣාප්පභානුරාගඉන්දධනුවිජ්ජුලතාපරික්ඛිත්තමිව කනකගිරිසිඛරං නානාවිරාගවිමලකෙතුමාලාසමුජ්ජලිතචාරුමත්ථකසොභං නයනරසායනමිව බ්‍රහ්මදෙවමනුජනාගයක්ඛගණානං බුද්ධරූපං පස්සන්තො

---

ඇත්තාවූ; සද්ධම්මවරචක්කවත්තිනො, සද්ධර්මවරචක්‍රවර්තීවූ; සම්මාසම්බුද්ධස්ස, සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේගේ; රූපං, රූපය; ඉමෙසං, මොවුන්ගේ; අක්ඛීනං, ඇසින්ට; ආපාථං කරොහීති වත්වා, ගොදුරුකරවයි කියා; තෙන, ඒ නාරදහු විසින්; නිම්මිතං, මවනලද; බ්‍රහ්මදෙවමනුජනාගයක්ඛගණානං, බ්‍රහ්මදිව්‍ය මනුෂ්‍ය නාග යක්ෂ සමූහයන්ට; නයනරසායනං ඉව, නෙත්‍රරසායනයක් වැනිවූ; සකල සරීරෙ, සියලු සිරුරෙහි; විප්පකිණ්ණං, විප්‍රකීර්ණවූ හෙවත් විසුරුණාවූ; පුඤ්ඤප්පභාවනිබ්බත්තං, පුණ්‍යප්‍රභාවයෙන් උපන්නාවූ; අසීති අනුබ්‍යඤ්ජන පතිමණ්ඩිතං (තම්බනඛ තුඞ්ගනඛාදි) අසූඅනුව්‍යඤ්ජනයෙන් ප්‍රතිමණ්ඩිතවූ; වත්තිංසමහාපුරිසලක්ඛණං, (සුප්‍රතිෂ්ඨිතපාදතලාදි) දෙතිස්මහාපුරුෂලක්ෂණයගේ; සස්සිරීකතාය, සශ්‍රීකතාවයෙන්; විකසිත, විකසනයවනලද; කමලුප්පල පුණ්ඩරීක පතිමණ්ඩිතං, රක්ත පද්මනිලොත්පලාදී උත්පලයෙන්ද; ශ්වෙතපද්මසඞ්ඛ්‍යාත පුණ්ඩරීකයෙන්ද හාත්පසින් සජීතවූ; සලිලතලං ඉව, ජලතලාවක් මෙන්ද; තාරාගණරස්මිජාලවිසර, සෑමතන්හි විප්‍රකීර්ණවූ තාරකා සමූහයාගේ රශ්මිකදම්බයෙන්; විප්ඵුරිතසොභාසමුජ්ජලං, බබලනු ලබන්නාවූ කාන්තියෙන් දිලිසෙනලද; ගගනතලං ඉව, අහස්තලය මෙන්ද; නීලපීතලොහිතාදි භෙදං, නීල පීත ලොහිතාදි ප්‍රභෙද ඇති; විචිත්‍රවණ්ණරංසි, විසිතුරුවන් රැසින්; විනද්ධ, වෙළඳනාලද; හෙවත් හිවනලද; ව්‍යාමප්පභාපරික්ඛෙපවිලාසිතාය, ව්‍යාමප්‍රභාවයෙන් වට කරනලද විලාසය ඇති බැවින්; සඤ්ඣාප්පභානුරාග, සන්ධ්‍යාකාලයෙහි ජාතහිරුරැසින්ද; ඉන්දධනුවිජ්ජුලතා, ඉඳුසැව්වෙන් හා විදුලියෙන්ද; පරික්ඛිත්තං, වටකරණලද; කනකගිරිසිඛරං ඉව, රන්පව්කුළය මෙන්ද; නානාවිරාග, නොයෙක් වර්ණයෙන්; විමල, නිර්මලවූ; කෙතුමාලාසමුජ්ජලිත, ශීර්ෂයෙන් නික්ම හිසමතුයෙහි රාශිභූතව දෘශ්‍යමාන රශ්මිකදම්බයෙන් මනාකොට දිලිසෙනලද; චාරු, මනොඥවූ; මත්ථකසොභං, මස්තකශොභාව ඇති; බුද්ධරූපං, බුදුරුව; පස්සන්තො, දකිමින්; සත්තදිවසානි, (මේ ධර්මාශොක රජතෙමේ ප්‍රීතිසෞමනස්‍යයෙන් නිරාහාරව) සත්දවසක් මුළුල්ලෙහි සිට; අක්ඛිපූජං නාම අක්ෂිපූජාවක්නම්; අකාසි, කෙළේය; රාජා කිර, රජතෙමේ වනාහි;

සත්තදිවසානි අක්ඛිපූජං නාම අකාසි. රාජා කිර අභිසෙකං පාපුණිත්වා තීනියෙව සංවච්ඡරානි බාහිරකපාසණ්ඩං පරිගණ්හි, චතුත්ථෙ සංවච්ඡරෙ බුද්ධසාසනෙ පසීදි.

තස්ස කිර පිතා බින්දුසාරො බ්‍රාහ්මණභත්තො අහොසි. සො බ්‍රාහ්මණානඤ්ච බ්‍රාහ්මණජාතියපාසණ්ඩානඤ්ච පණ්ඩරඞ්ගපරිබ්බාජකාදීනං සට්ඨිසහස්සමත්තානං නිච්චභත්තං පට්ඨපෙසි. අසොකොපි පිතරා පවත්තිතදානං අත්තනො අන්තෙපුරෙ තථෙව දදමානො එකදිවසං සීහපඤ්ජරෙ ඨිතො තෙ උපසමපරිබාහිරෙන ආචාරෙන භුඤ්ජමානෙ අසංයතින්ද්‍රියෙ අවිනීතඉරියාපථෙ දිස්වා චින්තෙසි: ඊදිසං දානං උපපරික්ඛිත්වා යුත්තට්ඨානෙ දාතුං වට්ටතී ති. එවං චින්තෙත්වා අමච්චෙ ආහ. ගච්ඡථ භණෙ අත්තනො අත්තනො සාධුසම්මතෙ සමණබ්‍රාහ්මණෙ අන්තෙපුරං

---

අභිසෙකං පාපුණිත්වා, අභිෂෙකයට පැමිණ; තීනිසංවච්ඡරානිඑව, තුන්අවුරුද්දක් මුළුල්ලෙහිම; බාහිරකපාසණ්ඩං, බාහිරකවූ පාෂණ්ඩයන්; (**"බාහිරකස්ස වෙදිනා හි සමයවාද සත්තානං තණ්හාපාසං දිට්ඨිපාසඤ්ච ඩෙනති ඔඩෙඩනතීති= බාහිරකපාසණ්ඩා තං"** යි විග්‍රහයි.) පරිගණ්හි, විමසමින් සංග්‍රහ කොළේය; චතුත්ථෙ සංවච්ඡරෙ, සතරවනවර්ෂයෙහි; බුද්ධසාසනෙ, බුදුසස්නෙහි; පසීදි, පැහැදුනේය;

තස්සකිර, ඔහුගේ වනාහි; පිතා බින්දුසාරො, පියවූ බින්දුසාර රජතෙමේ; බ්‍රාහ්මණභත්තො අහොසි, (තමන් පිය චන්ද්‍රගුප්ත රජකාලයෙහි පටන්) බමුණන් කෙරෙහි දෘඪමිත්‍රයෙක් වූයේය; සො, ඒ රජතෙමේ; සට්ඨිසහස්සමත්තානං, සැටදහසක් පමණ; බ්‍රාහ්මණානංච, බ්‍රාහ්මණයන්ටද; බ්‍රාහ්මණජාතියපාසණ්ඩානංච, බ්‍රාහ්මණජාති ඇති පාෂණ්ඩයන්ටද; පණ්ඩරඞ්ග පරිබ්බාජකාදීනං පණ්ඩරඞ්ග පරිබ්‍රාජකාදීන්ටද; නිච්චභත්තංපට්ඨපෙසි, නිබඳබතක් තැබූයේය; අසොකො, අශෝකරජතෙමේ; පිතරාපවත්තිතං පියරජහු විසින් පවත්වනලද; දානං, දානය; අත්තනො අන්තෙපුරෙ තමාගේ අන්තඃපුරයෙහිදී; තථෙව, එසේම; දදමානො, දෙනුයේ; එකදිවසං, එක්දවසක්; සීහපඤ්ජරෙඨිතො, මහාවාතපානය වෙත සිටියේ; උපසම පරිබාහිරෙන, උපශමය රහිතවූ; ආචාරෙන, ආචාරයෙන්; භුඤ්ජමානෙ, අනුභවකරන්නාවූ; අසංයතින්ද්‍රියෙ, නොසන්සුන් ඉඳුරන් ඇති; අවිනීතඉරියාපථෙ, අශික්ෂිතවූ ඊර්‍ය්‍යාපථයන් ඇති; තෙ දිස්වා, ඔවුන්දුටු; ඊදිසංදානං, මෙබඳුදානය; උපපරික්ඛිත්වා, නැවත නැවත සොයා; යුත්තට්ඨානෙ, යුක්තස්ථානයෙක්හි; දාතුංවට්ටතීති දෙන්නට වටීයයි; චින්තෙසි, සිතී; එවංචින්තෙත්වා, මෙසේ සිතා; අමච්චෙ ඇමතියන්ට; භණෙ, සගයෙනි; ගච්ඡථ, යවමැනව; අත්තනොඅත්තනො, තම තමන්ගේ; සාධුසම්මතෙ, මැනවයි සම්මතකරණලද; සමණබ්‍රාහ්මණෙ, මහණබමුණන්; අන්තෙපුරං, ඇතුල්පුරයට; අභිහරථ, ගෙනඑව්; දානං

අභිහරථ. දානං දස්සාමාති අමච්චා සාධුදෙවාති රඤ්ඤො පටිස්සුත්වා තෙ තෙ පණ්ඩරඞ්ගපරිබ්බාජකාජීවකනිගණ්ඨාදයො ආනෙත්වා ඉමෙ මහාරාජ අම්හාකං අරහන්තොති” ආහංසු. අථ රාජා අන්තෙපුරෙ උච්චාවචානි ආසනානි පඤ්ඤපෙත්වා ආගච්ඡන්තූති වත්වා ආගතාගතෙ ආහ: අත්තනො අත්තනො පතිරූපෙ ආසනෙ නිසීදථාති. තෙ එකච්චෙ භද්දපීඨකෙසු එකච්චෙ ඵලකපීඨකෙසු නිසීදිංසු. තං දිස්වා රාජා නත්ථි තෙසං අන්තො සාරොති ඤත්වා තෙසං අනුරූපං ඛාදනීයං භොජනීයං දත්වා උය්‍යොජෙසි.

එවං ගච්ඡන්තෙ කාලෙ එකදිවසං රාජා සීහපඤ්ජරෙ ඨිතො අද්දස නිග්‍රොධසාමණෙරං රාජඞ්ගණෙන ගච්ඡන්තං දන්තං ගුත්තං සන්තින්ද්‍රියං ඉරියාපථසම්පන්නං. කො පනායං නිග්‍රොධො නාම? බින්දුසාර රඤ්ඤො ජෙට්ඨපුත්තස්ස සුමනරාජකුමාරස්ස පුත්තො.

---

දස්සාමාති, දන්දෙමුයයි කීහ; අමච්චා, ඇමතියෝ; (**“අමා සහ භවන්ති කිච්චෙසූති=අමච්චා”** යි විග්‍රහයි.) සාධුදෙවාති, මැනව දේවයිනියි; රඤ්ඤො, රජහුගේ; පටිස්සුත්වා, වචනය අසා; තෙතෙ පණ්ඩරඞ්ග පරිබ්බාජකාජීවකනිගණ්ඨාදයො, ඒ ඒ පණ්ඩරඞ්ගපරිව්‍රාජකාජීවකනිගණ්ඨාදීන්; ආනෙත්වා, පමුණුවා; මහාරාජ, මහරජ, ඉමෙ අම්හාකං අරහන්තොති; මේ අපගේ රහත්හුයයි; ආහංසු, කීහු; අථ, එකල්හි; රාජා, රජතෙමේ; අන්තෙපුරෙ, ඇතුළුපුරයෙහි, උච්චාවචානි ආසනානි, කුඩාමහත් අසුන් පඤ්ඤපෙත්වා, පනවවා; ආගච්ඡන්තූති වත්වා, එත්වායි කියා; ආගතාගතෙ, ආආවුන්ටම; අත්තනො අත්තනො, තම තමන්ට; පතිරූපෙආසනෙ, සුදුසු අස්නෙහි; නිසීදථාති හුනමැනවයි; ආහ, කීහ; තෙ, එවුහු; එකච්චෙ සමහරහු; භද්දපීඨකෙසු, භද්‍රපීඨක යන්හිද; එකච්චෙ, සමහරු; ඵලකපීඨකෙසු, ඵලකපීඨ යන්හිද; නිසීදිංසු, හුන්නාහුය; රාජා, රජතෙමේ; තංදිස්වා ඒදැක; තෙසං අන්තො සාරොනත්ථීති ඤත්වා, ඔවුන්ගේ ඇතුලත ශීලාදිගුණසාර යෙක් නැතැයි දැන; තෙසං අනුරූපං, ඔවුන්ට සුදුසුවූ; ඛාදනීයං භොජනීයං, ඛාද්‍යභොජ්‍යයන්; දත්වා, දී; උය්‍යොජෙසි, යැවී.

එවං ගච්ඡන්තෙකාලෙ, මෙසේ කල් ඉකුත්වන කල්හි; එකදිවසං, එකදිනයක; රාජා, රජතෙමේ; සීහපඤ්ජරෙ ඨිතො, සිහපඤ්ජරය වෙතැ සිටියේ රාජඞ්ගණෙන, රාජනිවෙශනචාරයෙහි විවෘතකරණලද භූමිප්‍රදෙශයෙන්; (**“අඞ්ගන්ති තත්ථ ඨිතානං අතිසුන්දරතාය අභිව්‍යඤ්ජතීති=අඞ්ගණං තෙන”** යි විග්‍රහයි.) ගච්ඡන්තං, යන්නාවූ; දන්තං, (ක්ලෙශ චලනය රහිතසිත් ඇති බැවින් දමනය වනලද්දාවූ; ගුත්තං, (නිත්‍යප්‍රත්‍යුපස්ථිතසත්‍යාරක්ෂතාවය ඇති බැවින්) ගුප්තවනලද්දාවූ; සන්තින්ද්‍රියං, සන්හුන් ඉඳුරන් ඇත්තාවූ; (**“චක්ඛාදි ඉන්ද්‍රියානං සන්තතාය සන්තින්ද්‍රියං”** යි විග්‍රහයි.) ඉරියාපථසම්පන්නං, ප්‍රාසාදික ඊර්‍ය්‍යාපථයෙන් යුක්තවූ; නිග්‍රොධසාමණෙරං, නිග්‍රොධ නම් හෙරණහු; අද්දස, දිටී; අයං නිග්‍රොධො නාම, මේ නිග්‍රොධ තෙමේ නම්; කොපන, කවරෙක්ද; බින්දුසාරරඤ්ඤො, බින්දුසාරරජහුගේ; ජෙට්ඨපුත්තස්ස, දෙටුපුත්වූ; සුමනරාජකුමාරස්ස, සුමනනම් රදකුමරහුගේ; පුත්තො, පිත්වූයේය;

තත්‍රායං ආනුපුබ්බිකථා:-

බින්දුසාර රඤ්ඤො කිර දුබ්බලකාලෙයෙව අසොකකුමාරො අත්තනා ලද්ධං උජ්ජෙනිරජ්ජං පහාය ආගන්ත්වා සබ්බං නගරං අත්තනො හත්ථගතං කත්වා සුමනං නාම රාජකුමාරං අග්ගහෙසි. තං දිවසමෙව සුමනස්ස රාජකුමාරස්ස සුමනා නාම රාජදෙවී පරිපුණ්ණගබ්භා අහොසි.

සා අඤ්ඤාතකවෙසෙන නික්ඛමිත්වා අවිදූරෙ අඤ්ඤතරං චණ්ඩාලගාමං සන්ධාය ගච්ඡන්තී ජෙට්ඨකචණ්ඩාලස්ස ගෙහතො අවිදූරෙ අඤ්ඤතරස්මිං නිග්‍රොධරුක්ඛෙ අධිවත්ථාය දෙවතාය ඉතො එහි සුමනෙති වදන්තියා සද්දං සුත්වා තස්සා සමීපං ගතා, දෙවතා අත්තනො ආනුභාවෙන එකං සාලං නිම්මිනිත්වා එත්ථ වසාහීති පාදාසි. සා තං සාලං පාවිසි. ගතදිවසෙ යෙව ච පුත්තං විජායි. සා තස්ස නිග්‍රොධදෙවතාය පරිග්ගහිතත්තා නිග්‍රොධොත්වෙව නාමං අකාසි.

---

තත්‍ර, එහි; අයං ආනුපුබ්බිකථා, මේ පිළිවෙල කථාතොමෝයි.

බින්දුසාරරඤ්ඤොකිර, බින්දුසාරරජහුගේ වනාහි; දුබ්බල කාලෙයෙව, දුර්වලකාලයෙහිම; අසොකකුමාරො, (බින්දුසාරරජහුගේ එක්සියයක්පුත්‍රයන් අතුරෙහි මෞරියවංශජධර්මදේවියගේ අසොකය තිස්සය යන නම් ඇති දෙපුතුන් මධ්‍යයෙහි දෙටු) අශෝක කුමාර තෙමේ; අත්තනාලද්ධං, තමාවිසින් ලබනලද; උජ්ජෙනිරජ්ජං පහාය, උජ්ජේනිරාජ්‍යය හැර; ආගන්ත්වා, අවුත්; සබ්බං නගරං, සියලුනුවර; අත්තනො හත්ථගතං කත්වා තමාඅත්පත් කොට; සුමනං නාම රාජකුමාරං, සුමනනම් රාජකුමාරයා; අග්ගහෙසි, අල්වාගත්තේය; තං දිවසං එව, එදවස්හිම; සුමනස්ස රාජකුමාරස්ස, සුමනරාජකුමාරයාගේ; සුමනානාමරාජදෙවි, සුමන නම් රාජදේවීතොමෝ; පරිපුණ්ණගබ්භා අහොසි, පරිපූර්ණ ගර්භය ඇත්තිය;

සා, ඕතොමෝ; අඤ්ඤාතකවෙසෙන, අප්‍රසිද්ධවෙශයකින්; නික්ඛමිත්වා, නික්ම; අවිදූරෙ, නුදුරුතන්හි; අඤ්ඤතරං චණ්ඩාලගාමං සන්ධාය, එක්තරා සැඬොල්ගමක් සඳහා; ගච්ඡන්තී, යන්නී; ජෙට්ඨක චණ්ඩාලස්ස, දෙටු සැඬොලහුගේ; ගෙහතො, ගෙයින්; අවිදූරෙ, නුදුරු තැන; අඤ්ඤතරස්මිං නිග්‍රොධරුක්ඛෙ, එක්තරා න්‍යග්‍රොධ වෘක්ෂයෙක්හි, අධිවත්ථාය, අධිගෘහීතවූ; ඉතො එහි සුමනෙති, මෙසේ එව සුමනාවයයි; වදන්තියා, කියන්නාවූ; දෙවතාය, එක්දෙවතාවක්හුගේ සද්දං සුත්වා, ශබ්දය අසා; තස්සා සමීපං, ඈයවෙතට; ගතා, ගියා; දෙවතා, දෙවතාතොමෝ; අත්තනො ආනුභාවෙන, තමාගේ අනුභාවයෙන්; එකං සාලං නිම්මිනිත්වා එක්පායක් නිමවා; එත්ථවසාහීති, මෙහිවසවයි කියා; පාදාසි, පාවාදුනී; සා, ඕතොමෝ; තං සාලං, ඒ පහයට; පාවිසි, පිවිසි; ගතදිවසෙයෙවච, ගියදවස්හිම; පුත්තං විජායි, පුත්‍රයෙක් වැදීය. සා, ඕතොමෝ; නිග්‍රොධදෙවතාය, නිග්‍රොධදෙවතාවා විසින්; පරිග්ගහිතත්තා, පරිග්‍රහලද බැවින්; තස්ස, ඒ කුමරහට; නිග්‍රොධොතු එව, න්‍යග්‍රොධයයි කියාම, නාමංඅකාසි, නමක් කොළේය.

ජෙට්ඨකචණ්ඩාලො දිට්ඨදිවසතොපපභුති තං අත්තනො සාමිධීතරං විය මඤ්ඤමානො නිබද්ධවට්ටං පට්ඨපෙසි. රාජධීතා තත්ථ සත්තවස්සානි වසි. නිග්‍රොධකුමාරොපි සත්තවස්සිකො ජාතො තදා මහාවරුණත්ථෙරො නාම එකො අරහා දාරකස්ස හෙතුසම්පදං දිස්වා විහරමානො සත්තවස්සිකො දානි දාරකො කාලො නං පබ්බාජෙතුන්ති චින්තෙත්වා රාජධීතාය ආරොචාපෙත්වා නිග්‍රොධකුමාරං පබ්බාජෙසි. කුමාරො ඛුරග්ගෙයෙව අරහත්තං පාපුණි.

සො එකදිවසං පාතොව සරීරං ජග්ගෙත්වා ආචරියුපජ්ඣායවත්තං කත්වා පත්තචීවරමාදාය මාතුඋපාසිකාය ගෙහද්වාරං ගච්ඡාමීති නික්ඛමි.

මාතුනිවෙසනට්ඨානං චස්ස දක්ඛිණද්වාරෙන නගරං පවිසිත්වා නගරමජ්ඣෙන ගන්ත්වා පාචීනද්වාරෙන නික්ඛමිත්වා ගන්තබ්බං හොති

---

ජෙට්ඨකචණ්ඩාලො, දෙටුසැඬොල් තෙමේ; දිට්ඨදිවසතොපපභුති, දුටුදින පටන්; තං, ඒ රාජදේවිය; අත්තනො සාමිධීතරංවිය, තමාගේ ස්වාමිදුහිතෘවමෙන්; මඤ්ඤමානො, හඟිමින්; නිබද්ධවට්ටං, (එකදවසකට මෙපමණයයි) නියමකොට තබනලද වැටුප්; පට්ඨපෙසි, තැබූය; රාජධීතා, රාජදුහිතෘතොමෝ; තත්ථ, එහි; සත්තවස්සානි වසි, සත්වසක්විසී; නිග්‍රොධකුමාරොපි, නිග්‍රොධකුමාර තෙමේද; සත්තවස්සිකොජාතො, සත්වෂීයක් ඇතිවූයේවේ; තදා, එකල්හි; මහාවරුණත්ථෙරො නාම, මහාවරුණස්ථවිර නම්වූ; එකො අරහා, එක්රහත් නමක් තෙමේ; දාරකස්ස, ළදරුවාගේ; හෙතුසම්පදං දිස්වා, රහත්බවට උපනිශ්‍රයවූ කුසල සම්පත්තිය දැක; විහරමානො, වසනුයේ; දාරකො, ළදරුතෙමේ; ඉදානි, දැන්; සත්තවස්සිකො, සත්හවුරුදු ඇතිවූයේය; නං, ඔහු; පබ්බාජෙතුං, පැවිදිකරවන්ට; කාලො ඉති, කලැයි; චින්තෙත්වා, සිතා රාජධීතාය, රජදුවට; ආරොචාපෙත්වා, සැලකරවා; නිග්‍රොධකුමාරං, න්‍යග්‍රොධකුමාරයා; පබ්බාජෙසි, පැවිදි කෙළේය; කුමාරො, කුමාරතෙමේ; ඛුරග්ගෙයෙව, කරකම් පිරියතැම; අරහත්තං පාපුණි, රහත්බවට පැමිණියේය.

සො, හෙතෙමේ; එකදිවසං, එක්දවසක්; පාතොව, උදෑසනම; සරීරං ජග්ගෙත්වා, (මුඛධොවනාදි)ශරීර පරිකර්මකොට; ආචරියුපජ්ඣායවත්තං කත්වා, ආචාර්‍ය්‍ය උපාධ්‍යායවත්කොට; පත්තචීවරංආදාය, පාසිවුරුගෙණ; මාතුඋපාසිකාය ගෙහද්වාරං, මාතෘඋපාසිකාවගේ ගෙදෙරට ගච්ඡාමීති, යමැයි; නික්ඛමි, නික්මුනේය.

අස්ස, මොහුගේ; මාතුනිවෙසනට්ඨානඤ්ච, මව වසනතැනටද; දක්ඛිණද්වාරෙන නගරං පවිසිත්වා, දකුණු දෙරින් නුවරට පිවිස; නගරමජ්ඣෙන ගන්ත්වා, නුවරමැදින් ගොස්; පාචීනද්වාරෙන නික්ඛමිත්වා, පැලදෙරින්නික්ම; ගන්තබ්බංහොති, යායුත්තේවේ; තෙනවසමයෙන,

තෙන ච සමයෙන අසොකො ධම්මරාජා පාචීනදිසාභිමුඛො සීහපඤ්ජරෙ චඞ්කමති තංඛණංයෙව නිග්‍රොධො රාජඞ්ගණං සම්පාපුණි සන්තින්ද්‍රියො සන්තමානසො යුගමත්තං පෙක්ඛමානො.

තෙනවුත්තං:-

"එකදිවසං සීහපඤ්ජරෙ ඨිතො අද්දස නිග්‍රොධං සාමණෙරං රාජඞ්ගණෙන ගච්ඡන්තං දන්තං ගුත්තං සන්තින්ද්‍රියං ඉරියාපථසම්පන්නන්ති. දිස්වා පනස්ස එතදහොසි: අයං ජනො සබ්බොපි වික්ඛිත්තචිත්තො භන්තමිගපටිභාගො අයං පන දරකො අවික්ඛිත්තො අතිවියස්ස ආලොකිතවිලොකිතං සම්මිඤ්ජනපසාරණං ච සොභති.

අද්ධා එතස්ස අබ්භන්තරෙ ලොකුත්තරධම්මො භවිස්සතීති රඤ්ඤො සහදස්සනෙනෙව සාමණෙරෙ චිත්තං පසීදි. පෙමං සණ්ඨාති.

---

එසමයෙහි වනාහි; අසොකො ධම්මරාජා, අසෝක දහම් රජතෙමේ; පාචීනදිසාභිමුඛො, පැලදෙසට අභිමුඛවූයේ;සීහපඤ්ජරෙ, සීහපඤ්ජරය සමීපයෙහි; චඞ්කමති, අපරාපයෘීව සක්මන් කෙරේ; තංඛණංයෙව, එකෙණෙහිම; නිග්‍රොධො, නිග්‍රොධහෙරණ තෙමේ; සන්තින්ද්‍රියො, සන්හුන් ඉඳුරන් ඇතියේ; සන්තමානසො, සන්හුන් සිත්ඇතියේ; යුගමත්තංපෙක්ඛමානො, වියදඬුපමණ තැන් බලනුයේ; රාජඞ්ගණං, රාජාඞ්ගණයට; සම්පාපුණි, පැමිණියේය.

"එකදිවසං සීහපඤ්ජරෙ ඨිතො අද්දස නිග්‍රොධං සාමණෙරං රාජඞ්ගණෙන ගච්ඡන්තං දන්තං ගුත්තං සන්තින්ද්‍රියං ඉරියාපථසම්පන්නන්ති" එකදිවසං -පෙ- ඉරියාපථසම්පන්නං"යි.

**තෙනවුත්තං**:-එසේ හෙයින් කියනලදී.

දිස්වාපන, දැකවනාහි; අස්ස, මේරජහට; එතදහොසි, මෙබඳු සිතෙක් වූයේය; සබ්බොපි අයංජනො, (රාජාඞ්ගණයෙහි හැසිරෙන් නාවූ) සියලුම මේ ජනතෙමේ; වික්ඛිත්තචිත්තො, විකෂෙප සිත්ඇත්තේය; භන්තමිගපටිභාගො, අනවස්ථිත බැවින් කායචාපල්‍යයෙන් යුක්තහෙයින් භ්‍රාන්තමෘගයන් වැනිය; අයංදරකො පන, මේ ළදරු තෙමේ වනාහි; අවික්ඛිත්තො, අවිකෂෙප සිත් ඇතියේවේ; අස්ස, මොහුගේ; ආලොකිතවිලොකිතං, ඉදිරිබැලීම හා අනුදික් බැලීමද; සම්මිඤ්ජන පසාරණඤ්ච, පතීසංකොචනය හා ඔවුන්ගේම ප්‍රසාරණයද; අතිවිය සොභති, ඉතාමහොබී;

අද්ධා, එකාන්තයෙන්; එතස්ස අබ්භන්තරෙ, මොහුගේ අබතුරු; ලොකුත්තරධම්මො භවිස්සතීති, (සෙසු ජනයන් කෙරෙහි අවිද්‍යමානවූ) විශිෂ්ට ධර්මයෙක් ඇතිවන්නේයයි; රඤ්ඤො, රජහුගේ; සහදස්සනෙනෙව, දර්ශනයසමගම; සාමණෙරෙ, හෙරණහු කෙරෙහි; චිත්තංපසීදි, හිතපැහැදුනේය; පෙමංසණ්ඨාති, ප්‍රේමය උපන්නේය;

කස්මා? පුබ්බෙ කිර පුඤ්ඤකරණකාලෙ එස රඤ්ඤො ජෙට්ඨභාතා වානිජකො අහොසි.

වුත්තම්පිචෙතං:-

පුබ්බෙව සන්නිවාසෙන - පච්චුප්පන්න හිතෙන වා
එවං තං ජායතෙ පෙමං - උප්පලංව යථොදකෙ.

අථ රාජා සඤ්ජාතපෙමො සබහුමානො එතං සාමණෙරං පක්කොසථාති අමච්චෙ පෙසෙසි. තෙ අතිචිරායන්තීති පුන ද්වෙතයො පෙසෙසි තුරිතං ආගච්ඡතූති. සාමණෙරො අත්තනො පකතියායෙව අගමාසි. රාජා පතිරූපමාසනං ඤත්වා නිසීදථාති ආහ. සො ඉතො චිතො ච විලොකෙත්වා නත්ථිදානි අඤ්ඤෙ භික්ඛූති සමුස්සිත සෙතච්ඡත්තං

---

කස්මා කුමක් හෙයින්දයත්? පුබ්බෙකිර, පෙරවනාහි; පුඤ්ඤකරණකාලෙ, පින්කරණ කල්හි; එසො, මේහෙරණතෙමේ; රඤ්ඤො, රජහුගේ; ජෙට්ඨභාතා වානිජකො අහොසි, දෙට්ටුබෑ මී වෙළඳවූයේය; වුත්තම්පිචෙතං, මේකියනලදී;

පුබ්බෙ, අතීතජාතියෙහි, සන්නිවාසෙනවා, සහවාසයෙන්හෝ (පුබ්බෙවාසි කියයුතෙනහි ගාථා බන්ධන වශයෙන් ඡන්දස් පිණිස හ්‍රස්ව කෙළේයි) පච්චුප්පන්නහිතෙනවා, වර්තමානභවයෙහි හිතවරණයෙන් හෙවත් දූන්හිතෙසිව හැසිරීමෙන් හෝ; එවං, මෙසේ (මේදෙකරුණෙන්;) තංපෙමං, (ස්නෙහසංඛ්‍යාත) ඒ ප්‍රේමය තෙම; ජායතෙ, උපදී; කුමක්මෙන්ද; උදකෙ, ජලයෙහි; උප්පලංවා, උපුල් හා සෙසු දියදූ පියුම් ආදිය; යථා, යම්සේද එසේයි.

(මෙහිදු උප්පලං වා කියයුත්තෙහි පෙරසේම කියනලද ක්‍රමයෙන් හ්‍රස්වකරණලද වා ශබ්දයෙන් නොකියනලද සෙසු ජලජ කුසුමයෝ සම්පිණ්ඩනය කෙරෙත් උත්පලාදි පත්මයතෙම ජලයෙහි උපදිනුයේ ජලය හා කලලය යන දෙකරුනෙන් උපදනේය එසේම ප්‍රේමයද යථොක්තදෙකාරණයෙන් උපදින්නේය යනු අභිප්‍රායි.)

අථ, නැවත; රාජා, රජතෙමේ; සඤ්ජාතපෙමො, උපන්ප්‍රේම ඇතියේ; සබහුමානො, බුහුමන් ඇතියේ; එතං සාමණෙරං මේ ශ්‍රාමණෙරයා; පක්කොසථ ඉති, කැඳවව්යයි; අමච්චෙපෙසෙසි, ඇමතියන් යැව්වේය; තෙ, එව්හු; අතිචිරායන්තීති, ඉතාකල්යත්යයි; පුන, නැවත; ද්වෙතයො, දෙතුන්දෙනෙක්හු; තුරිතං ආගච්ඡතූති, වහාඑත්වායි කියා; පෙසෙසි, යැව්වේය; සාමණෙරො, හෙරණතෙමේ; අත්තනො පකතියායෙව, තමාගේ පියවින්ම; අගමාසි, ගියේය; රාජා, රජතෙමේ; පතිරූපං ආසනං ඤත්වා, සුදුසු අස්නක් දැන; නිසීදථාති ආහ, හුනමැනවයි කීහ; සො, හෙතෙමේ; ඉතො චිතොච විලොකෙත්වා, එසේ මෙසේදබලා; ඉදානි, දැන්; අඤ්ඤෙ භික්ඛූ, සෙසු භික්ෂූහු; නත්ථීති, නැත්තාහුයයි; සමුස්සිතසෙතච්ඡත්තං, මොනවට නගනලද සේසත

රාජපල්ලඞ්කං උපසඞ්කමිත්වා පත්තගහණත්ථාය රඤ්ඤො ආකාරං දස්සෙසි. රාජා තං පල්ලඞ්කසමීපං උපගච්ඡන්තං එව දිස්වා චින්තෙසි: අජ්ජෙව දානි අයං සාමණෙරො ඉමස්ස ගෙහස්ස සාමිකො භවිස්සතීති. සාමණෙරො රඤ්ඤො හත්ථෙ පත්තං දත්වා පල්ලඞ්කං අභිරුහිත්වා නිසීදි.

රාජා අත්තනො අත්ථාය සම්පාදිතං සබ්බං යාගුඛජ්ජකභත්තවිකතිං උපනාමෙසි. සාමණෙරො අත්තනො යාපනීයමත්තකමෙව සම්පටිච්ඡි. භත්තකිච්චාවසානෙ රාජා ආහ, සත්ථාරා තුම්හාකං දින්නොවාදං ජානාථාති.

ජානාම මහාරාජ එකදෙසෙනාති. තාත මය්හම්පි නං කථෙහීති. සාධු මහාරාජාති, රඤ්ඤො අනුරූපං ධම්මපදෙ අප්පමාදවග්ගං අනුමොදනත්ථාය අභාසි. රාජා පන “අප්පමාදො අමතපදං, පමාදො මච්චුනො

---

ඇත්තාවූ; රාජපල්ලඞ්කං උපසඞ්කමිත්වා, රාජපර්‍ය්‍යඞ්කය කරා එළඹ; පත්තගහණත්ථාය, පාත්‍රයගන්නාපිණිස; රඤ්ඤො, රජහට; ආකාරං දස්සෙසි, ආකාරයක් දැක්වූයේය; රාජා, රජතෙමේ, පල්ලඞ්කසමීපං, පර්‍ය්‍යඞ්කය සමීපයට; උපගච්ඡන්තං එව, එළඹෙන්නාවූම; තංදිස්වා, ඔහු දැක; අජ්ජෙව, අදම; ඉදානි, දැන්; අයං සාමණෙරො, මේ හෙරණ තෙමේ; ඉමස්සගෙහස්ස, මේ ගෘහයට; සාමිකොභවිස්සතිති, ස්වාමියෙක් වන්නේයයි; චින්තෙසි, සිතී; සාමණෙරො හෙරණතෙමේ; රඤ්ඤො, රජහුගේ; හත්ථෙ, අතට; පත්තංදත්වා, පාත්‍රයදී; පල්ලඞ්කං අභිරුහිත්වා, පලඟට යහපත්ව නැගී; නිසීදි, හුනී;

රාජා, රජතෙමේ; අත්තනො අත්ථාය, තමහට ප්‍රයෝජන පිණිස; සම්පාදිතං, සපයනලද; සබ්බංයාගුඛජ්ජකභත්තවිකතිං, සියලු කැඳ කැවිලියෙන් යුත් භක්තවිකෘතිය; උපනාමෙසි, එළවී; සාමණෙරො, හෙරණතෙමේ; අත්තනොයාපනීයමත්තකංඑව, තමහට යැපියයුතු පමණක්ම; සම්පටිච්ඡි, පිළිගත්තේය; භත්තකිච්චාවසානෙ, බත්කිස කෙළවර; රාජා, රජතෙමේ; සත්ථාරා, ශාස්තෘහුවිසින්; තුම්හාකං, නුඹවහන්සේට; දින්නොවාදං, දුන් අවවාදයෙක්; ජානාථාති, දන්නුදැයි; ආහ, විචාළේය

මහාරාජ, මහරද; එකදෙසෙන, එක්දෙසකින්; ජානාමීති, දනිමියි කීහ; තාත, පින්වත; මය්හම්පි, මටද; නං, ඒ අවවාදය කථෙහිති කියවයි කීයේය; සාධුමහාරාජාති, මැනව මහරජැයි; ධම්මපදෙ, දහම් පෙදෙහි, රඤ්ඤො අනුරූපං, රදහට සුදුසුවූ; අප්පමාදවග්ගං, අප්‍රමාද වර්ගය; අනුමොදනත්ථාය, අනුමොදනාව පිණිස; අභාසි, කථනය කෙළේ; රාජාපන, රජතෙමේ වනාහි; අප්පමාදො, (සතිඅවිප්‍රවාස සඞ්ඛ්‍යාත නිත්‍යෝපස්ථිත සිහියෙන් යුත්) අප්‍රමාදය තෙමේ; (“**පමජ්ජති එතෙනාති=පමාදො, නපමාදො=අප්පමාදො**” යි විග්‍රහයි,) අමතපදං, (නිර්වාණයයි කියන) අමෘතාධිගමයට කාරණෙක්වේ; පමාදො, මුට්ඨස්සති සංඛ්‍යාත සිහියෙන් යුත්) ප්‍රමාදය තෙමේ; මච්චුනො පදංති, මරණයට

පදං''ති සුත්වාව අඤ්ඤතං තාත පරියොසාපෙහීති ආහ. අනුමොද නාවසානෙ අට්ඨ තෙ තාත ධුරභත්තානි දම්මීති ආහ.

සාමණෙරො ආහ: එතානි අහං උපජ්ඣායස්ස දම්මි මහාරාජාති. කො අයං තාත උපජ්ඣායො නාමාති? වජ්ජාවජ්ජං දිස්වා චොදෙතා සාරෙතා මහාරාජාති. අඤ්ඤානිපි තෙ තාත අට්ඨ දම්මීති. එතානි ආචරියස්ස දම්මි මහාරාජාති. කො අයං තාත ආචරියො නාමාති? ඉමස්මිං සාසනෙ සික්ඛිතබ්බකධම්මෙසු පතිට්ඨාපෙතා මහාරාජාති සාධු තාත අඤ්ඤානිපි තෙ අට්ඨ දම්මීති. එතානි භික්ඛුසඞ්ඝස්ස දම්මි මහාරාජාති. කො අයං තාත භික්ඛුසඞ්ඝො නාමාති? යං නිස්සාය මහාරාජ අම්හාකං ආචරියුපජ්ඣායානඤ්ච මමඤ්ච පබ්බජ්ජා ච උපසම්පදා චාති. රාජා භීයොසොමත්තාය තුට්ඨචිත්තො ආහ:- අඤ්ඤානිපි තෙ තාත අට්ඨ

---

පමුණුවන්නේයයි; සුත්වාව, අසාම; තාත, පින්වත; අඤ්ඤතං, මෙප මණකින් මාවිසින් දන්නාලදී; පරියොසාපෙහිති, කෙලවර කරවයි; ආහ, කීහ; අනුමොදනාවසානෙ, අනුමොදනාවසානයෙහි; තාත, පින්වත; තෙ, නුබවහන්සේට; අට්ඨධුරභත්තානි නිත්‍ය බත් අටෙක්; දම්මීති ආහ, දෙමැයිකීහ.

(''පනීතතාය විසිට්ඨානි භත්තානීති=ධුරභත්තානි තං සබ්බානං සඞ්ඝා දාතබ්බභත්තානීතිවා=ධුරභත්තානි''යි විග්‍රහයි) සාමණෙරො, හෙරණතෙමේ; මහාරාජ මහරද; එතානි, මේ නිත්‍යබත්අට; අහං, මම; උපජ්ඣායස්ස, උපාධ්‍යායයාහට, දම්මිතිආහ, දෙමැයිකීහ; තාත, පින්වත; අයං මේ; කොඉති, කවරෙක්දැයි; මහාරාජ, මහරද; වජ්ජාවජ්ජං දිස්වා (කුඩා මහත්) වරදද (සම්‍යක් ප්‍රතිපත්ති සංඛ්‍යාත) නිවරදද දැක; චොදෙතා, චොදනාකරනුයේ; සාරෙතා, සිහිකරවනුයේ; උපජ්ඣායොනාම ඉති, උපාධ්‍යාය නමැයි කීහ; තාත, පින්වත; තෙ, නුබවහන්සේට; අඤ්ඤම්පි, අනිකුදු; අට්ඨ, නිත්‍යබත් අටෙක්; දම්මීති, දෙමියිකීහ; මහාරාජ, මහාරද; එතානි, මේ නිත්‍යබත්අට; ආචරියස්ස දම්මීති, ඇදුරුහට දෙමැයිකී;තාත, පින්වත; අයං, මේ; කො, කවරෙක්ද; මහාරාජ, මහරද; ඉමස්මිං සාසනෙ, මේ සස්නෙහි; සික්ඛිතබ්බකධම්මෙසු, හික්මියයුතුදහම්හි; පතිට්ඨාපෙතා, පිහිටවනුයේ; ආචරියො නාමාති, ආචාර්‍ය්‍ය නමැයිකීහ. සාධුතාත, මැනව පින්වත; තෙ, නුබවහන්සේට; අඤ්ඤානිපි, අනිකුදු; අට්ඨ, නිත්‍යබත් අටෙක්; දම්මීති, දෙමැයිකී; මහාරාජ, මහරජ; එතානි, මේ නිත්‍යබත් අට; භික්ඛුසඞ්ඝස්ස දම්මීති, බික් සඟහට දෙමියි; තාත, පින්වත; අයං, මේ; කො, කවරෙක්ද; මහාරාජ, මහරජ; අම්හාකං, අපගේ; ආචරියුපජ්ඣායානඤ්ච; ආචාර්‍ය්‍ය උපාධ්‍යාය යන්වද; මමඤ්ච, මටද; යංනිස්සාය, යමෙක්නිසා; පබ්බජ්ජාච, ප්‍රව්‍රජ්‍යාවද; උපසම්පදාච, උපසම්පදාවද ලැබේද; භික්ඛුසඞ්ඝොනාම ඉති, ඒ බික් සඟනමැයි; රාජා, රජතෙමේ; භීයොසොමත්තාය, නැවත නැවත

දම්මීති. සාමණෙරො සාධූති සම්පටිච්ඡිත්වා පුනදිවසෙ ද්වත්තිංසභික්ඛූ ගහෙත්වා රාජන්තෙපුරං පවිසිත්වා භත්තකිච්චමකාසි රාජා අඤ්ඤෙපි ද්වත්තිංසභික්ඛූ තුම්හෙහි සද්ධිං යෙව භික්ඛං ගණ්හන්තූති එතෙනෙව උපායෙන දිවසෙ දිවසෙ වඩ්ඪාපෙන්තො සට්ඨිසහස්සානං බ්‍රාහ්මණ පරිබ්බාජකාදීනං භත්තං උපච්ඡින්දිත්වා අන්තොනිවෙසනෙ සට්ඨිසහස්සානං භික්ඛූනං නිච්චභත්තං පට්ඨපෙසි.

නිග්‍රොධත්ථෙරෙ ගතෙනෙව පසාදෙන. නිග්‍රොධත්ථෙරොපි රාජානං සපරිසං තීසුසරණෙසු පඤ්චසුච සීලෙසු පතිට්ඨාපෙත්වා බුද්ධසාසනෙ පොථුජ්ජනිකෙන පසාදෙන' අචලප්පසාදං කත්වා පතිට්ඨාපෙසි. පුන රාජා අසොකාරාමං නාම මහාවිහාරං කාරාපෙත්වා සට්ඨිසහස්සානං භික්ඛූනං නිච්චභත්තං පට්ඨපෙසි. සකලජම්බුදීපෙ චතුරාසීතියා නගරසහස්සෙසු චතුරාසීතිවිහාරසහස්සානි කාරාපෙසි චතුරාසීති

---

වෙසෙසින් අධිකතරව; තුට්ඨචිත්තො, තුටුසිත් ඇතියේ; තාත, පින්වත; තෙ, නුඹවහන්සේට; අඤ්ඤම්පි, අනිකුදු; අට්ඨ, දූරබත් අටෙක්; දම්මීති ආහ, දෙමැයි කීහ; සාමණෙරො, හෙරණතෙමේ; සාධූති සම්පටිච්ඡිත්වා, මැනවයි පිළිගෙන; පුනදිවසෙ, දෙවනදවසෙහි; ද්වත්තිංසභික්ඛූ ගහෙත්වා, දෙතිසක් භික්ෂූන්ගෙණ; රාජන්තෙපුරං රාජාන්තඃපුරයට; පවිසිත්වා, පිවිස; භත්තකිච්චං අකාසි, බත්කිසකොළේය; රාජා, රජතෙමේ; අඤ්ඤෙපිද්වත්තිංස භික්ඛූ, අනිකුදු දෙතිස් භික්ෂූහු; තුම්හෙහිසද්ධිංයෙව, නුඹවහන්සේලා සමගම; භික්ඛංගණ්හන්තූති, භික්ෂාග්‍රහණය කෙරෙත්වායි කීයේය; එතෙනෙව උපායෙන, මෙම උපායෙන්; දිවසෙ දිවසෙ; දවසක් දවසක් පාසා; වඩ්ඪාපෙන්තො; විගුණ විගුණව වඩනුයේ; සට්ඨිසහස්සානං බ්‍රාහ්මණපරිබ්බාජකාදීනං, සැටදහසක් බ්‍රාහ්මණ පරිබ්‍රාජකාදීන්ගේ; භත්තං උපච්ඡින්දිත්වා, භක්තොපච්ඡේදයකොට; නිග්‍රොධත්ථෙරෙ, නිග්‍රොධස්ථවිරයන් කෙරෙහි; ගතෙනෙව පසාදෙන, කරනලද වූම පැහැදීම කාරණකොටගෙණ; අන්තොනිවෙසනෙ, ඇතුළු නිවෙස් නෙහි; සට්ඨිසහස්සානං භික්ඛූනං, සැටදහසක් භික්ෂූන්ට; නිච්චභත්තං, නිතිබත; පට්ඨපෙසි, එළවූයේය.

නිග්‍රොධත්ථෙරොපි, නිග්‍රොධස්ථවිරතෙමේද; සපරිසං, පිරිස් සහිතවූ; රාජානං, රජහු; තීසුසරණෙසු, තිසරණයෙහිද; පඤ්චසු සීලෙසු, පඤ්චශීලයෙහිද; පතිට්ඨාපෙත්වා පිහිටුවා; බුද්ධසාසනෙ, බුදුසස්නෙහි; පොථුජ්ජනිකෙන පසාදෙන, පෘථග්ජනිකා භාවානුරූප පැහැදීමෙන්; අචලප්පසාදං කත්වා, නිසල පැහැදුමකොට; පතිට්ඨාපෙසි, පිහිටවූයේය; පුන, නැවත; රාජා, රජතෙමේ; අසොකාරාමං නාම, අශොකාරාමය නම්වූ; මහාවිහාරං කාරාපෙත්වා, මහත් විහාරයක් කරවා; සට්ඨිසහස්සානං භික්ඛූනං, සැටදහසක් භික්ෂූන්ට; නිච්චභත්තං, නිතිබත; පට්ඨපෙසි, එළවූයේය; සකලජම්බුදීපෙ, සියලු දඹදිවෙහි; චතුරාසීතියා නගරසහස්සෙසු, සුවාසූදහසක් නුවරවලෑ; චතුරාසීතිසහස්ස චෙතියපතිමණ්ඩිතානි, සුවාසූදහසක් චෛත්‍යයෙන්

සහස්ස චෙතියපතිමණ්ඩිතානි, ධම්මෙනෙව නො අධම්මෙන. එකදිවසං කිර රාජා අසොකාරාමෙ මහාදානං දත්වා සට්ඨිසහස්සභික්ඛුසඞ්ඝස්ස මජ්ඣෙ නිසජ්ජ සඞ්ඝං චතූහි පච්චයෙහි පවාරෙත්වා ඉමං පඤ්හං පුච්ඡි: භන්තෙ භගවතා දෙසිතධම්මො නාම කිත්තකො හොතීති?

අඞ්ගතො මහාරාජ නව අඞ්ගානි, ඛන්ධතො චතුරසීතිධම්මක්ඛන්ධසහස්සානීති. රාජා ධම්මෙ පසීදිත්වා එකමෙකං ධම්මක්ඛන්ධං එකෙකවිහාරෙන පූජෙස්සාමීති එකදිවසමෙව ඡන්නවුතිකොටිධනං විස්සජ්ජෙත්වා අමච්චෙ ආණාපෙසි: එථ භණෙ එකමෙකස්මිං නගරෙ එකමෙකං විහාරං කාරාපෙන්තා චතුරසීතියා නගරසහස්සෙසු චතුරසීති විහාරසහස්සානි කාරාපෙථාති.

සයඤ්ච අසොකාරාමෙ අසොකමහාවිහාරත්ථාය නවකම්මං පට්ඨපෙසි. සඞ්ඝො ඉන්දගුත්තත්ථෙරං නාම මහිද්ධිකං මහානුභාවං ඛීණාසවං නවකම්මා

---

විභූෂිතවූ; චතුරාසීති විහාරසහස්සානි, සුවාසූදහසක් විහාරයන්; ධම්මෙනෙව, දැහැමින්ම; කාරාපෙසි, කරවූයේය; නො අධම්මෙන, අධර්මයෙන් නොවේ.

(කියනලද අර්ථයම විස්තරවශයෙන් ප්‍රකාශකරණු සඳහා එකදිවසං කිරයි ආදිකියේ) එකදිවසං, එක්දවසක්; රාජාකිර, රජ තෙම වනාහි; අසොකාරාමෙ, අශොකාරාමයෙහි; මහාදානං දත්වා, සාටකයුගල ඡත්‍රොපාහනාදියෙන්යුත් මහාදනක් දී; සට්ඨිසහස්ස සැටදහසක් (සංඛ්‍යාතවූ;) භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසඟහුගේ; මජ්ඣෙ නිසජ්ජ, මැදහිඳ; සඞ්ඝං, සඞ්ඝයා; චතූහි පච්චයෙහි පවාරෙත්වා, සිව්පසයෙන් පවරා; භන්තෙ, වහන්ස; භගවතා දෙසිතධම්මො භාග්‍යවත්හු විසින් දෙසනලද ධර්මයතෙමේ; කිත්තකො හොතීති, කොපමණ වේදැයි; ඉමං පඤ්හං පුච්ඡි, මේ පැනය පුළුවුත්හ;

මහාරාජ, මහරද; අඞ්ගතො, අඟවසයෙන්; නව අඞ්ගානිව, නවයෙක් අඟදවෙත්; ඛන්ධතො, ස්කන්ධවශයෙන්; චතුරාසීතිධම්මක්ඛන්ධසහස්සානීති, සුවාසූදහසක් ධර්මස්කන්ධයෝ වෙත්යයි කී; රාජා, රජ තෙමේ; ධම්මෙ පසීදිත්වා, දහම්හි පැහැද; එකමෙකං ධම්මක්ඛන්ධං, එකි එකීධර්මස්කන්ධයකට; එකෙකවිහාරෙන, එකිඑකී වෙහෙරකින්; පූජෙස්සාමීති, පුදන්නෙමියි; එකදිවසං එව, එකදවසම; ඡන්නවුතිකොටිධනං, විස්සජ්ජෙත්වා සයානූකෙළක් ධනවිසඳ; අමච්චෙ, ඇමතියන්ට; භණෙ, සගයෙනි; එථ, අවමැනව; එකමෙකස්මිං නගරෙ, එකිඑකීනුවරෙක්හි; එකමෙකං විහාරං කාරාපෙන්තා, එකිඑකී වෙහෙරක් කරවන්නාවූ; චතුරාසීතියා නගරසහස්සෙසු, සුවාසූදහසක් නුවරවල්හි; චතුරාසීති විහාරසහස්සානි, සුවාසූදහසක් විහාරයන්; කාරාපෙථාති, කරවියයි; ආණාපෙසි, ඇණවූයේය.

සයඤ්ච, තෙමේත්; අසොකාරාමෙ, අශොකාරාමයෙහි; අසොකමහාවිහාරත්ථාය, අශොකමහාවිහාරය පිණිස, නවකම්මංපට්ඨපෙසි, කර්මාන්ත පටන්ගත්තේය; සඞ්ඝො, සඞ්ඝතෙමේ; මහිද්ධිකං, මහත්

ධිට්ඨායකං අදාසි. ථෙරො යං යං කම්මං න නිට්ඨාති, තං තං අත්තනො ආනුභාවෙන නිට්ඨාපෙසි. එවම්පි තීහි සංවච්ඡරෙහි විහාරකම්මං නිට්ඨාපෙසි. එකදිවසමෙව සබ්බනගරෙහි පණ්ණානි ආගමිංසු. අමච්චා රඤ්ඤො ආරොචෙසුං නිට්ඨිතානි දෙව චතුරාසීතිවිහාරසහස්සානීති. රාජා නගරෙ භෙරිං චරාපෙසි: ඉතො සත්තන්නං දිවසානං අච්චයෙන විහාරමහො භවිස්සති, සබ්බෙ අට්ඨ සීලඞ්ගානි සමාදියිත්වා අන්තොනගරෙච බහිනගරෙච විහාරමහං පටියාදෙන්තූති.

තතො සත්තන්නං දිවසානං අච්චයෙන සබ්බාලඞ්කාරභූසිතාය අනෙකසතසහස්සසඞ්ඛාය චතුරඞ්ගිණියා සෙනාය පරිවුතො දෙවලොකෙ අමරවතියා රාජධානියා සිරිතො අධිකතරසස්සිරිකං විය නගරං

---

සෘද්ධි ඇත්තාවූ; මහානුභාවං, මහත් අනුභාව ඇත්තාවූ; ඛීණාසවං, ක්ෂයකරණලද ආශ්‍රවයන් ඇත්තාවූ; ඉන්දගුත්තත්ථෙරං නාම, ඉඳුගුත් නම් තෙර; නවකම්මාධිට්ඨායකං, නවකර්මවිදහන්නෙක් හෙවත් නවකර්මාන්තවිධාන කරන්නෙක්කොට; අදාසි, දුනි; ථෙරො, ස්ථවිරතෙමේ; යංයංකම්මංනනිට්ඨාති. යම් යම් කර්මාන්තයක් නොනිමේද තං තං, ඒ ඒ කර්මාන්තය; අත්තනො ආනුභාවෙන, තමාගේ අනුභාවයෙන්; නිට්ඨාපෙසි, නිමවූයේය; එවම්පි, මෙසේම; තීහි සංවච්ඡරෙහි, තුන්වසකින්; විහාරකම්මං නිට්ඨාපෙසි, විහාරකර්මාන්තය නිමවූයේය; එකදිවසං එව, එකදවසම; සබ්බනගරෙහි, සියලු නුවරින්; පණ්ණානි ආගමිංසු, පත්ගෙනාවාහුය; අමච්චා, ඇමතියෝ; දෙව, දෙවයිනි; චතුරාසීති විහාරසහස්සානි, සුවාසූදහසක් විහාරයන්; නිට්ඨිතානීති, නිමවූවාහුයයි; රඤ්ඤො, රජහට; ආරොචෙසුං, සැලකළාහුය; රාජා, රජතෙමේ; ඉතො, මෙයින්; සත්තන්නං දිවසානං අච්චයෙන, සත්දවසගේ ඇවෑමෙන්; විහාරමහො භවිස්සති, විහාරපූජාව වන්නේය; සබ්බෙ, සියල්ලෝ; අට්ඨසීලඞ්ගානිසමාදියිත්වා, අෂ්ටඋපොෂිතාඞ්ග ශීලයන් සමාදන්ව; අන්තොනගරෙච, ඇතුළුනුවරෙහිද; බහිනගරෙච, පිටනුවරෙහිද; විහාරමහං පටියාදෙන්තූති,වෙහෙරපුද පිළියෙළකරත්වායි කියා; නගරෙ, නුවර; භෙරිඤ්චරාපෙසි, බෙරහැසිරවූයේය;

තතො, එයින්; සත්තන්නං දිවසානං අච්චයෙන, සත්දවසගේ ඇවෑමෙන්; සබ්බාලඞ්කාර භූසිතාය, (සමාදන් නොවනලද උපොෂිතාඞ්ගය ඇතියන්ගේ වශයෙන්) සර්වාලඞ්කාරයෙන් භූෂිතවූ, අනෙකසතසහස්සසඞ්ඛාය, නොයෙක් සියදහස්ගණන්; චතුරඞ්ගිණියා සෙනායපරිවුතො, සිව්රඟසෙනඟවිසින් පිරිවරණලදුයේ; දෙවලොකෙ, දෙව්ලොවැ; අමරවතියා රාජධානියා, තව්තිසා දෙව්නුවර; සිරිතො, ශ්‍රියාවට වඩා; අධිකතර සස්සිරිකංවිය, අධිකතරවූ සශ්‍රිකයන්මෙන්; නගරං, නුවර; කාතුකාමෙන, කරණුකැමතිවූ; උස්සාහජාතෙන,

කාතුකාමෙන උස්සාහජාතෙන මහාජනෙන අලඞ්කතපටියත්තනගරං අනුවිචරන්තො විහාරං ගන්ත්වා භික්ඛුසඞ්ඝස්ස මජ්ඣෙ අට්ඨාසි.

තස්මිං ච ඛණෙ සන්නිපතිතා අසීතිභික්ඛුකොටියො අහෙසුං. භික්ඛුණීනඤ්ච ඡන්නවුතිසතසහස්සානි. තත්ථ ඛීණාසවභික්ඛූයෙව සතසහස්සසඞ්ඛා අහෙසුං. තෙසං එතදහොසි. සචෙ රාජා අත්තනො අධිකාරං අනවසෙසං පස්සෙය්‍ය, අතිවිය බුද්ධසාසනෙ පසීදෙය්‍යාති. තතො ලොකවිවරණං නාම පාටිහාරියං අකංසු. රාජා අසොකාරාමෙ ඨිතොව චතුද්දිසා අනුවිලොකෙන්තො සමන්තතො සමුද්දපරියන්තං ජම්බුදීපං පස්සති චතුරාසීතිඤ්ච විහාරසහස්සානි උළාරාය විහාරමහාපූජාය විරොචමානානි සො තං විභූතිං පස්සමානො උළාරෙන පීතිපාමොජ්ජෙන සමන්නාගතො

---

උත්සාහය උපන්නාවූ; මහාජනෙන, මහාජනයා විසින්; අලඞ්කත පටියත්තං, අලඞ්කාරකොට පිළියෙළකරණලද්දාවූ; නගරං, නුවරෙහි; අනුවිචරන්තො, හැසිරෙමින්; විහාරං ගන්ත්වා, විහාරයට ගොස්; භික්ඛුසඞ්ඝස්සමජ්ඣෙ, භික්සඟමැද; අට්ඨාසි, සිටියේය.

තස්මිඤ්චඛණෙ, එකෙණෙහිද; අසීතිභික්ඛුකොටියො, අසූකෙළක් භික්ෂූහු; සන්නිපතිතා අහෙසුං, රැස්වූවාහුය; භික්ඛුණීනඤ්ච, භික්ෂුණීන්ගෙන්ද; ඡන්නවුතිසතසහස්සානි, සයානුලක්ෂයක් රැස්වූවාහු වෙත්; තත්ථ, එහි; ඛීණාසවභික්ඛූයෙව, ක්ෂීණාශ්‍රවභික්ෂූහුම; සතසහස්සසඞ්ඛා අහෙසුං, ලක්ෂගණන් වූවාහුය; තෙසං, ඔවුන්ට; එතදහොසි, මෙබඳු සිතෙක්වී; රාජා, රජතෙමේ; අත්තනො, තමාගේ; අධිකාරං, අධිකක්‍රියාව; අනවසෙසං, ඉතුරුනොකොට; සචෙ පස්සෙය්‍ය ඉදින් දක්නේනම්; බුද්ධසාසනෙ, බුදුසස්නෙහි; අතිවිය පසීදෙය්‍යාති, ඉතාම පහදනේයයි කියායි; තතො, එයින්; ලොකවිවරණං නාම පාටිහාරියං අකංසු,

(මේ භික්ෂූහු වනාහි ධර්මාශොකරජතෙමේ අශොකාරාමයෙහි සිට සිව්දික් බලනුයේ හාත්පසින් මුහුද කෙළවරකොට ඇති දඹදිව සමග උළාරවූ විහාරමහාපූජාවෙන් බබලනලද සුවාසූදහසක් විහාර යම්සේ දකීද එසේ ඉටා) ලොකවිවරණ නම් පෙළහරක් කළාහුය;(“**ලොකවිවරණං නාම පාටිහාරියං අකංසූති එත්ථ අනෙකසතසහස්ස සඞ්ඛස්ස ඔකාසලොකස්ස සන්නිවාසිනො සත්තලොකස්ස ච විවටභාවකරණපාටිහාරියං ලොකවිවරණං නාම**” යනු සාරත්ථදීපනී ටීකායි.)

රාජා, රජතෙමේ; අසොකාරාමෙ ඨිතොව, අශොකාරාමයෙහි සිටියේම; චතුද්දිසා අනුවිලොකෙන්තො, සිව්දික් බලනුයේ; සමන්තතො, හාත්පසින්; සමුද්දපරියන්තං ජම්බුදීපං, මුහුද කෙළවරකොට ඇති දඹදිව; පස්සති, දකී; උළාරායවිහාරමහාපූජාය, උදාරවූ විහාර මහා (සඞ්ඛ්‍යාත) පූජායෙන්; විරොචමානානි, බබලන්නාවූ; චතුරාසීති විහාරසහස්සානි, සුවාසූදහසක් විහාරයන්; පස්සති, දකී; සො,

අත්ථිපන අඤ්ඤස්සපි කස්සචි එවරූපං පීතිපාමුජ්ජං උප්පන්නපුබ්බන්ති චින්තෙන්තො භික්ඛුසඞ්ඝං පුච්ඡි: භන්තෙ අම්හාකං නාථස්ස දසබලස්ස සාසනෙ කො මහාපරිච්චාගං පරිච්චජි, කස්ස පරිච්චාගො මහන්තොති වදන්ති.

භික්ඛුසඞ්ඝො මොග්ගලිපුත්තතිස්සත්ථෙරස්ස භාරං අකාසි. ථෙරො ආහ: මහාරාජ දසබලස්ස සාසනෙ පච්චයදායකො නාම තයා සදිසො ධරමානෙපි තථාගතෙ න කොචි අහොසි තවෙව පරිච්චාගො මහන්ති.

රාජා ථෙරස්ස වචනං සුත්වා උළාරෙන පීතිපාමොජ්ජෙන නිරන්තරං ඵුටසරීරො හුත්වා චින්තෙසි: නත්ථි කිර මයා සදිසො පච්චයදායකො, මය්හං කිර පරිච්චාගො මහා, අහං කිර දෙය්‍යධම්මෙන සාසනං පග්ගණ්හාමි, කිං පනාහං එවං සති සාසනස්ස දායාදො හොමි නහොමීති.

---

ඒ රජතෙමේ; තං විභූතිං පස්සමානො, ඒසම්පත්තිය දකිමින්; උළාරෙන පීතිපාමොජ්ජෙන, උදාරප්‍රීතිප්‍රමොද්‍යයෙන්; සමන්නාගතො, යුක්ත වූයේ; අඤ්ඤස්ස කස්සචිපි, අන්කිසිවක්හටත්; උප්පන්නපුබ්බං, පෙර උපන්නාවූ; එවරූපං පීතිපාමොජ්ජං පන, මෙබඳු ප්‍රීතිප්‍රමොද්‍ය යක් වනාහි; අත්ථීති, ඇත්තේදැයි; චින්තෙන්තො, සිතමින්; භන්තෙ, වහන්ස; අම්හාකං, අපගේ; දසබලස්ස, දශබලධාරීවූ; නාථස්ස, ලොක ස්වාමිහුගේ; සාසනෙ, සස්නෙහි; කො, කවරෙක්තෙමේ; මහා පරිච්චාගං, මහත් පරිත්‍යාගයෙක්; පරිච්චජි, පරිත්‍යාගකෙළේ ; කස්ස පරිච්චාගො, කවරක්හුගේ පරිත්‍යාගයතෙමේ; මහන්තොති, මහත්යයි; වදන්තීති, කියත්දැයි; භික්ඛුසඞ්ඝං පුච්ඡි, භික්සඟහු පුළුවුත්හ.

භික්ඛුසඞ්ඝො, භික්ෂුසඞ්ඝතෙමේ; මොග්ගලිපුත්තතිස්සත්ථෙරස්ස, මොග්ගලිපුත්තතිස්ස තෙරහට; භාරං අකාසි, භාරකෙළේය; ථෙරො, ස්ථවිරතෙමේ; මහාරාජ, මහරද; දසබලස්ස සාසනෙ, දශබලධාරිහුගේ බුදුසස්නෙහි; තයාසදිසො, තා හා සමවූ; පච්චයදායකො, පසදෙන්නාවූ; කොචි නාම, කිසිවෙක් නම්; තථාගතෙ ධරමානෙපි, තථාගතයන් ජීවමානකල්හිත්; න අහොසි, නූයේය; තවෙව, තොපගේම; පරිච්චාගො, පරිත්‍යාගයතෙමේ; මහන්ති මහත්යයි; ආහ, කී;

රාජා, රජතෙමේ; ථෙරස්ස, තෙරහුගේ; වචනං සුත්වා, වචන ශ්‍රවණය කොට; උළාරෙන පීතිපාමොජ්ජෙන, උදාරවූ ප්‍රීතිප්‍රමොද්‍ය යෙන්; නිරන්තරං, නිරතුරුව; ඵුටසරීරො හුත්වා, පුසනායවනලද ශරීරය ඇතිව; මයාසදිසො පච්චයදායකො කිර, මා හා සදෘශවූ ප්‍රත්‍යය දායකයෙක් වනාහි; නත්ථි, නැත; මය්හං කිර, මාගේ වනාහි; පරිච්චා ගො, පරිත්‍යාගයතෙමේ; මහා, මහත්වූයේය; අහං කිර, මම වනාහි; දෙය්‍යධම්මෙන, දෙය්‍යධර්මයෙන්; සාසනං පග්ගණ්හාමීති, සස්නට සඞ්ග්‍රහකරන්නෙමියි; කිං, කිමෙක්ද; අහං පන, මම වනාහි; එවං සති, මෙසේ ඇතිකල්හි; සාසනස්ස, සස්නට; දායාදො හොමි න හොමීති, නෑයෙක් වෙම්ද නොවෙම්දැයි; (ඇතුළත්වෙම්ද නොවෙම්දැයි; යන අර්ථයි;) චින්තෙසි, සිතී.

තතො භික්ඛුසඞ්ඝං පුච්ඡි: භවාමි නුඛො අහං භන්තෙ සාසනස්ස දායාදොති. තතො මොග්ගලිපුත්තතිස්සත්ථෙරො රඤ්ඤො ඉදං වචනං සුත්වා රාජපුත්තස්ස මහින්දස්ස උපනිස්සයසම්පත්තිං සම්පස්සමානො සචෙ අයං කුමාරො පබ්බජිස්සති සාසනස්ස අතිවිය වුඩ්ඪි භවිස්සතීති චින්තෙත්වා රාජානං එතදවොච: නඛො මහාරාජ එත්තාවතා සාසනස්ස දායාදො හොති, අපිචඛො පච්චයදායකොති වා උපට්ඨාකොති වා සඞ්ඛං ගච්ඡති, යොපි හි මහාරාජ පථවිතො යාව බ්‍රහ්මලොකපරිමාණං පච්චයරාසිං දදෙය්‍ය, සොපි සාසනෙ දායාදොති සඞ්ඛං න ගච්ඡතීති.

අථ කථං චරහි භන්තෙ සාසනස්ස දායාදො හොතීති? යොහි කොචි මහාරාජ අඩ්ඪො වා දලිද්දො වා අත්තනො ඔරසං පුත්තං පබ්බාජෙති, අයං වුච්චති මහාරාජ දායාදො සාසනස්සාති.

---

තතො, එහෙයින්; භන්තෙ, වහන්ස; අහං, මම; සාසනස්ස, සස්නට; දායාදොභවාමිනුඛොති, නෑයෙක් වෙම්දැයි; භික්ඛුසඞ්ඝං, භික්‍ෂුසඞ්ඝයා; පුච්ඡි විචාළේය; තතො, ඉන්පසු; මොග්ගලිපුත්තතිස්සත්ථෙරො, මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරතෙමේ; රඤ්ඤො, රජහුගේ; ඉදං වචනං සුත්වා, මේ වචනය අසා; රාජපුත්තස්ස, රජපුත්වූ; මහින්දස්ස, මහෙන්ද්‍ර කුමාරයාගේ; උපනිස්සයසම්පත්තිං, උපනිශ්‍රය සම්පත්තිය; සම්පස්සමානො, දකිනුයේ; අයං කුමාරො, මේ කුමාරතෙමේ; සචෙ පබ්බජිස්සති, ඉදින් පැවිදිවන්නේද; සාසනස්ස, සස්නට; අතිවියවුඩ්ඪි භවිස්සතීති චින්තෙත්වා, ඉතාම වෘද්ධිවන්නේයයි සිතා; මහාරාජ, මහරද; සාසනස්ස, සස්නට; එත්තාවතා, මෙපමණකින්; නඛො දායාදො හොති, නොමදායාද වේ; අපිචඛො, එතකුදුවුවත්; පච්චයදායකොතිවා, ප්‍රත්‍යයදායකයෙක්යයිහෝ; උපට්ඨාකොතිවා, උපස්ථායකයෙක් යයි හෝ සඞ්ඛංගච්ඡති, සඞ්ඛ්‍යාවට යේ; මහාරාජ, මහරද; යොපි, යමෙක් තෙමේ වනාහි; යාව පථවිතො, පෘථිවියපටන්; බ්‍රහ්මලොකපරිමාණ පච්චයරාසිං, බඹලොව පමණ ප්‍රත්‍යයසමූහයෙක්, දදෙය්‍ය, දෙන්නේ නම්; සොපි, හෙතෙමෙත්; සාසනෙ, සස්නෙහි; දායාදොති, නෑයෙක් යයි; සඞ්ඛං න ගච්ඡති, සඞ්ඛ්‍යාවට නොයෙයි; රාජානං, රජහට; එතං මේ වචනය; අවොච, කී;

භන්තෙ, වහන්ස; සාසනස්ස, සස්නට; කථඤ්චරහි, කෙසේ වනාහි; දායාදොහොතීති, ඇතුළත්වේදැයි; මහාරාජ, මහරද; අඩ්ඪොවා, ආඪ්‍යවූ හෝ; දලිද්දොවා, දිළිඳුවූ හෝ; යොකොචි, යම්කිසිවෙක් තෙමේ; අත්තනො, තමාගේ; ඔරසං පුත්තං, ඖරසපුත්‍රයෙක්; "**උරසි හදයෙ ජාතං විශාති=ඔරසං කං**" විග්‍රහයි.) හි, යම්හෙයකින්; පබ්බාජෙති, පැවිදිකරවාද; (එහෙයින්) මහාරාජ, මහරද; අයං, මේතෙමේ; සාසනස්ස, සස්නට; දායාදොති, ඇතුලත්යයි; වුච්චතීති, කියනු ලැබේනුයි;

එවං වුත්තෙ අසොකො රාජා අහං කිර එවරූපං පරිච්චාගං කත්වාපි නෙව සාසනස්ස දායදභාවං පත්තොසීන්ති සාසනෙ දායාදභාවං පත්ථයමානො ඉතොචිතොච විලොකෙත්වා අද්දස මහින්දං කුමාරං අවිදූරෙ ඨිතං, දිස්වා පනස්ස එතදහොසි: කිඤ්චාපි අහං ඉමං කුමාරං තිස්සකුමාරස්ස පබ්බජිතකාලතොප්පභුති ඔපරජ්ජෙ පතිට්ඨාපෙතුකාමො, අථඛො ඔපරජ්ජතොපි පබ්බජ්ජාව උත්තමාති. තතොකුමාරං අහ: සක්ඛිස්සසි ත්වං තාත පබ්බජිතුන්ති? කුමාරො පන පකතියාපි තිස්සකුමාරස්ස පබ්බජිතකාලතොප්පභුති පබ්බජිතුකාමොව, රඤ්ඤොවචනං සුත්වා අතිවියපාමොජ්ජජාතො හුත්වා ආහ: පබ්බජාමි දෙව, මං පබ්බාජෙත්වා තුම්හෙ සාසනෙ දායාද හොථාති

තෙනච සමයෙන රාජධීතා සඞ්ඝමිත්තාපි තස්මිංයෙව ඨානෙ ඨිතා හොති. තස්සා ච සාමිකො අග්ගිබ්‍රහ්මා නාම කුමාරො උපරාජෙන තිස්සකුමාරෙන සද්ධිං පබ්බජිතො හොති රාජා තං දිස්වා ආහ: ත්වම්පි

---

එවං වුත්තෙ, මෙසේ කීකල්හි; අසොකොරාජා අසෝකරද තෙමේ; අහං කිර, මම වනාහි; එවරූප පරිච්චාගං කත්වාපි, මෙබඳුවූ පරිත්‍යාගයකොටද සාසනස්ස, සස්නට; දායාදභාවං, ඇතුල්බවට; නෙව පත්තොසීන්ති, නොපැමිණියේවෙමියි; සාසනෙ දායාදභාවං පත්ථයමානො සස්නෙහි ඥාතිභාවය ප්‍රාර්ථනාකරණුයේ; ඉතොචිතොච විලොකෙත්වා ඔබිමොබද බලා; අවිදූරෙඨිතං, නුදුරුතැන සිටියාවූ; මහින්දං කුමාරං, මිහිඳුකුමරු; අද්දස, දිටී; දිස්වා, දැක; කිඤ්චාපි, කිසිසේත්; අහං, මම්; තිස්සකුමාරස්ස, තිස්සකුමාරයාගේ; පබ්බජිතකාලතොප්පභුති, පැවිදි කල්පටන්; ඉමං කුමාරං, මේ කුමාරයා; ඔපරජ්ජෙපතිට්ඨාපෙතුකාමො, යුවරාජ්‍යයෙහි පිහිටවනුකැමතිවූයෙම්; අථඛො, එතකුදුවුවත්; ඔපරජ්ජතොපි, යුවරාජ්‍යයටද වඩා; පබ්බජ්ජාච, ප්‍රව්‍රජ්‍යාතොමෝම; උත්තමාති, උතුම්වන්නීයයි; අස්ස, ඒ රජහට; එතං අහොසි, මෙබඳු සිතෙක්වී; තතො, ඉන්පසු; තාත, පුත; ත්වං, තෝ; පබ්බජිතුං, පැවිදිවන්ට; සක්ඛිස්සසි, හැක්කෙහිදැයි; කුමාරං, කුමරහු; ආහ, විචාළේය; කුමාරොපන, කුමාරතෙමේ වනාහි; පකතියාපි, පියවින්ම; තිස්සකුමාරස්ස පබ්බජිතකාලතොප්පභුති, තිස්සකුමාරයාගේ පැවිදිකාලයෙහි පටන්; පබ්බජිතුකාමොව, පැවිදිවනු කැමතිවම; රඤ්ඤොවචනං සුත්වා, රජහුගේ වචනය අසා; අතිවියපාමොජ්ජජාතොහුත්වා, අධිකවූම උපන් ප්‍රමොද්‍යය ඇත්තෙක්ව; දෙව, දෙවයිනි; පබ්බජාමි, පැවිදිවෙමි; මං පබ්බාජෙත්වා, මා පැවිදිකරවා; තුම්හෙ, ඔබ; සාසනෙ දායාදහොථාති ආහ, සස්නට ඇතුලත්වුව මැනවයි කීහ;

තෙනච සමයෙන, එසමයෙහිද; රාජධීතාසඞ්ඝමිත්තාපි, රාජදුහිතෘවූ සඞ්ඝමිත්‍රාතොමෝද; තස්මිංයෙව ඨානෙ, එතැන්හිම; ඨිතා හොති, සිටියාවී; තස්සාච සාමිකො අග්ගිබ්‍රහ්මානාම කුමාරො, ඒ කුමරියගේද සැමිවූ අග්ගිබ්‍රහ්මකුමරු තෙමේ; උපරාජෙන තිස්සකුමාරෙන සද්ධිං

අම්ම පබ්බජිතුං සක්ඛිස්සසීති? සාධු තාත සක්කොමීති. රාජා පුත්තානං මනං ලභිත්වා පහට්ඨචිත්තො භික්ඛුසඞ්ඝං එතදවොච: භන්තෙ ඉමෙ දාරකෙ පබ්බාජෙත්වා මං සාසනෙ දායාදං කරොථාති.

සඞ්ඝො රඤ්ඤො වචනං සම්පටිච්ඡිත්වා කුමාරං මොග්ගලිපුත්තතිස්සත්ථෙරෙන උපජ්ඣායෙන මහාදෙවත්ථෙරෙන ච ආචරියෙන පබ්බාජෙසි. මජ්ඣන්තිකත්ථෙරෙන ආචරියෙන උපසම්පාදෙසි. තදා කිර කුමාරො පරිපුණ්ණවීසතිවස්සොව හොති. සො තස්මිං යෙව උපසම්පදමණ්ඩලෙ සහපටිසම්භිදාහි අරහත්තං පාපුණි. සඞ්ඝමිත්තායපි රාජධීතාය ආචරියා ආයුපාලිත්ථෙරී නාම, උපජ්ඣායා පන ධම්මපාලිත්ථෙරී නාම අහොසි.

තදා සඞ්ඝමිත්තා අට්ඨාරසවස්සා හොති. තං පබ්බජිතමත්තං තස්මිං යෙව සීමාමණ්ඩලෙ සික්ඛාය පතිට්ඨාපෙසුං. උභින්නං පබ්බජිතකාලෙ

---

යුවරදවූ තිස්සකුමාරයා හා සැටුව; පබ්බජිතො හොති, පැවිදි වූයේවේ; රාජා, රජතෙමේ; තං දිස්වා, ඒ කුමරිය දැක; අම්ම, දියනියෙනි; ත්වම්පි පබ්බජිතුං සක්ඛිස්සසීති ආහ, තීද පැවිදිවන්ට හැකියෙහි දැයි විචාළේය; සාධු තාත සක්කොමීති, මැනවැයි පියානෙනි හැකියෙමියි; රාජා, රජතෙමේ; පුත්තානං මනං ලභිත්වා, පුතුන්ගේ සිත ලැබ; (**"පුත්තා ච ධීතා ච=පුත්තා"**යි මෙසේ එකශෙෂ නයින් කියනලදැයි දතයුත්තේය.) පහට්ඨචිත්තො, පහටුසිත් ඇතියේ; භන්තෙ, වහන්ස; ඉමෙ දාරකෙ පබ්බාජෙත්වා, මේ දරුවන් පැවිදිකරවා; සාසනෙ, ශාසනෙහි; මං දායාදං කරොථාති, මා ඇතුළත්කර මැනවයි; භික්ඛුසඞ්ඝං, භික්ෂුසඞ්ඝයාට; එතදවොච, මේවචනය කී;

සඞ්ඝො, සඞ්ඝතෙමේ; රඤ්ඤොවචනං සම්පටිච්ඡිත්වා, රජහුගේ වචනය පිළිගෙණ; කුමාරං, කුමාරයා; මොග්ගලිපුත්ත තිස්සත්ථෙරෙන උපජ්ඣායෙන, මොග්ගලිපුත්ත තිස්සස්ථවිරයන් උපාධ්‍යාය කොට; මහාදෙවත්ථෙරෙනච ආචරියෙන, මහාදෙවස්ථවිරයන්ද ආචාර්‍ය්‍යකොට; පබ්බාජෙසි, පැවිදිකරවී; මජ්ඣන්තිකත්ථෙරෙන ආචරියෙන, එනම් තෙර ආචාර්‍ය්‍යකොට; උපසම්පාදෙසි, උපසපන් කරවී; තදාකිර, එකල්හි වනාහි; කුමාරො, කුමාරතෙමේ; පරිපුණ්ණවීසති වස්සොව හොති, පරිපූර්ණ විසිවස් ඇතියේමවේ; සො, හෙතෙමේ; තස්මිං උපසම්පදමණ්ඩලෙ යෙව, ඒ උපසම්පදාමණ්ඩල යෙහිදීම; සහ පටිසම්භිදාහි, පිළිසිඹියාව සමග; අරහත්තං පාපුණි, රහත් බවට පැමිණියේය; සඞ්ඝමිත්තාය රාජධීතායපි, සඞ්ඝමිත්නම් රජ දුවටද; ආචරියා ආයුපාලිත්ථෙරී නාම, ආචාර්‍ය්‍යවූවා ආයුපාලස්ථවිරා නම් විය; උපජ්ඣායා පන ධම්මපාලිත්ථෙරී නාම අහොසි, උපාධ්‍යායවූවා වනාහී ධර්‍මපාලිස්ථවිරා නම්වී;

තදා එකල්හි; සඞ්ඝමිත්තා, සඞ්ඝමිත්‍රා තොමෝ; අට්ඨාරස වස්සා, හොති, අටළොස්වස් ඇතිවන්නීය; තං පබ්බජිත මත්තං, ප්‍රව්‍රජ්‍යාමාත්‍රයක් ඇති ඒ කුමරිය; තස්මිං සීමාමණ්ඩලෙ යෙව සික්ඛාය

රාජා ඡබ්බස්සාභිසෙකො හොති. අථ මහින්දත්ථෙරො උපසම්පන්නකාලතොප්පභුති අත්තනො උපජ්ඣායස්සෙව සන්තිකෙ ධම්මඤ්ච විනයඤ්ච පරියාපුණන්තො ද්වෙපි සඞ්ගීතියො ආරූළ්හං තිපිටකසඞ්ගහිතං සාට්ඨකථං සබ්බං ථෙරවාදං තිණ්ණං වස්සානං අබ්භන්තරෙ උග්ගහෙත්වා අත්තනො උපජ්ඣායස්ස අන්තෙවාසිකානං සහස්සමත්තානං භික්ඛූනං පාමොක්ඛො අහොසි.

තදා අසොකො ධම්මරාජා නවවස්සාභිසෙකො, හොති. රඤ්ඤො පන අට්ඨවස්සාභිසෙකකාලෙයෙව කුන්තපුත්තතිස්සත්ථෙරො ව්‍යාධිපටිකම්මත්ථං භික්ඛාචාරවත්තෙන ආහිණ්ඩන්තො පසතමත්තං

---

පතිට්ඨාපෙසුං, ඒ සීමා මලුවෙහිදීම (සික්ඛාසම්මුතියදී පාණාතිපාතා වෙරමණී යන මේ සිකපදය ආදිකොට ඇති විකාලභොජනා වෙරමණීයනමේ සිකපදයපය්‍යීන්තකොට ඇති ෂට්ශික්ෂාවෙහි සමාදම් කරවීම් වශයෙන්) ශික්ෂාවෙහි පිහිටවූවාහුය; උභින්නංපබ්බජිතකාලෙ, දෙදෙනාගේ පැවිදිකාලයෙහි; රාජා, රජතෙමේ; ඡබ්බස්සාභිසෙකො හොති, ෂඩ්වර්ෂයක් අභිෂෙක ඇතියේවේ; (අභිෂෙකලත් තැන්පටන් ඉකුත් ෂඩ්වර්ෂයක් ඇතියේ වෙයි කියනලදී; "ඡබ්බස්සා අභිසෙකතො අස්සාති=ඡබ්බස්සාභිසෙකො"යි විග්‍රහයි; අථ, ඉක්බිති; මහින්දත්ථෙරො මිහිඳුතෙර තෙමේ; උපසම්පන්න කාලතොප්පභුති, උපසපන්කල් තැන්පටන්; අත්තනො, තමාගේ; උපජ්ඣායස්සෙව සන්තිකෙ, උපාධ්‍යායයා වෙතම; ධම්මඤ්ච විනයඤ්ච පරියාපුණන්තො, ධර්මවිනය පුහුණු කරණුයේ; ද්වෙපි සඞ්ගීතියො ආරූළ්හං, සඞ්ගීතිද්වයට නැගූ; සබ්බං ථෙරවාදං, (මහාකාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ මහාස්ථවිරයන්ගේ වාදය හෙයින් එනම් ලද) සියලු ථෙරවාද ඇති; සාට්ඨකථං, අටුවා කථාසහිතවූ; සඞ්ගීතං, සඞ්ග්‍රහකරණලද්දාවූ; තිපිටකං, ත්‍රිපිටකය; තිණ්ණංවස්සානං අබ්භන්තරෙ, තෙවසක් ඇතුලත; උග්ගහෙත්වා, උද්ග්‍රහණයකොට; අත්තනො, තමාගේ; උපජ්ඣායස්ස, උපාධ්‍යායයාගේ; සහස්සමත්තානං අන්තෙවාසිකානං භික්ඛූනං, දහසක් පමණ අතවැසි භික්ෂූන්ගෙන්; පාමොක්ඛො අහොසි, ජ්‍යෙෂ්ඨයෙක්වූයේය;

තදා, එකල්හි; අසොකො ධම්මරාජා, අසෝකදහම් රජතෙමේ; නවවස්සාභිසෙකො හොති, අභිෂෙකයෙන් නවවර්ෂඇතියේවේ, ("නවවස්සානි අභිසෙකතො අස්සාති=නවවස්සාභිසෙකො"විග්‍රහයි;) රඤ්ඤොපන, රජහුගේවනාහී; අට්ඨවස්සාභිසෙක කාලෙයෙව, අටවයස්වූ අබිසෙස් ඇතිකල්හිම; කුන්තපුත්තතිස්සත්ථෙරො, කුන්තපුත්තතිස්ස ස්ථවිරතෙමේ; (මෙහි කුන්තපුත්තතිස්සත්ථෙරො යනුවෙන් කුන්ත සකුණීනම්වූ කිඳුරු ජතිඇති එක් කිඳුරඟනකගේකුසෙහි සංනයකාළාවූ මනුෂ්‍යයෙක්හට දාවූ රජහුවිසින් පොෂ්‍යකරණලදුයේ කුන්තපුත්ත තිස්ස ස්ථවිරනමැයි ත්‍රිවිධගණ්ඨිපදයෙහි කියනලදී) ව්‍යාධිපටිකම්මත්ථං ව්‍යාධිපිළියම් පිණිස; භික්ඛාචාරවත්තෙන, (විශපත් දෙවුසොහොවුරු

සප්පිං අලභිත්වා ව්‍යාධිබලෙන පරික්ඛීණායුසඞ්ඛාරො භික්ඛුසඞ්ඝං අප්පමාදෙන ඔවදිත්වා ආකාසෙ පල්ලඞ්කෙන නිසීදිත්වා තෙජොධාතුං සමාපජ්ජිත්වා පරිනිබ්බායි.

රාජා තං පවත්තිං සුත්වා ථෙරස්ස සක්කාරං කත්වා මයි නාම රජ්ජං කාරෙන්තෙ එවං භික්ඛූනං පච්චයා දුල්ලභාති නගරස්ස චතූසු ද්වාරෙසු පොක්ඛරණියො කාරාපෙත්වා භෙසජ්ජස්ස පූරාපෙත්වා දාපෙසි.

තෙන කිර සමයෙන පාටලිපුත්තස්ස චතූසු ද්වාරෙසු චත්තාරිසතසහස්සානි සභායං සතසහස්සානි දිවසෙ දිවසෙ පඤ්චසතසහස්සානි රඤ්ඤො උප්පජ්ජන්ති. තතො රාජා නිග්‍රොධත්ථෙරස්ස දෙවසිකං සතසහස්සං විස්සජ්ජෙති, බුද්ධස්ස චෙතියෙ ගන්ධමාලාදීහි පූජනත්ථාය

---

තිස්ස තෙරුන් විසින් ඇණවුම්ලද එම කුනනාපුතුවූ සුමිත්‍ර ස්ථවිර තෙමේ) භික්ෂාචාරවතින්; ආහිණ්ඩන්තො, ඇවිදිනුයේ; පසතමත්තං සප්පිං අලභිත්වා, අතලොස්සක් පමණ සර්පිනොලැබ; ව්‍යාධිබලෙන, ව්‍යාධිබලයෙන්; පරික්ඛීණායුසඞ්ඛාරො, පිරිහුණු ආයුස සංස්කාර ඇතියේ; භික්ඛුසඞ්ඝං, භික්ෂුසඞ්ඝයාට; අප්පමාදෙන ඔවදිත්වා, (අපවැනියන්වද මෙසේ ප්‍රත්‍යයෙන් දුර්ලභයහ තෙපි ලබනලද ප්‍රත්‍යය ඇතිකල්හි අප්‍රමාදව මහණදම් කළමැනවයි මෙසේ) අප්‍රමාදයෙන් අවවාදදී; ආකාසෙ, අහස්හි; පල්ලඞ්කෙන නිසීදිත්වා, පය්‍යඞ්කයෙන්හිඳ; (මේ ඉත්ථම්භූත ලක්ෂණයෙහි කරණවචනයනම්) තෙජොධාතුං සමාපජ්ජිත්වා තෙජොධාතු කසිණාරම්මණධ්‍යානයට සමවැද; පරිනිබ්බායි, පිරිණිවියේය;

රාජා, රජතෙමේ; තං පවත්තිං සුත්වා, ඒ ප්‍රවෘත්තිය අසා; ථෙරස්ස සක්කාරං කත්වා, තෙරහුගේ ධාතු සත්කාරකොට; මයිනාම රජ්ජං කාරෙන්තෙ මා නම් රාජ්‍යයකරවනකල්හි; එවං, මෙසේ; භික්ඛූනං, භික්ෂූන්ට; පච්චයා දුල්ලභාති, ප්‍රත්‍යය දුර්ලභයයි; නගරස්ස චතුසුද්වාරෙසු, නුවර සතරදොරටුයෙහි; පොක්ඛරණියො කාරාපෙත්වා, (එක එක ද්වාරයෙක්හි සතර සතර බැගින්) පුෂ්කරණීන් කරවා; භෙසජ්ජස්සපූරාපෙත්වා, (එක එක පුෂ්කරණියෙක්හි සර්පිමධුඵාණිත සකුරු යන මේ) භෛෂජ්‍යයෙන් පුරවා; දාපෙසි, සඟනට දෙවූයේය;

තෙනසමයෙනකිර, එසමයෙහි වනාහී; පාටලිපුත්තස්සචතුසු ද්වාරෙසු, පැලළුප් නුවර සිව්දෙරින්; චත්තාරිසතසහස්සානි, සාරලක්ෂයෙක්ද; සභායං (නුවරමැද විනිශ්චය) ශාලාවෙන්; සතසහස්සානි, සියදහසෙක්දුයි; දිවසෙ දිවසෙ, දවසක් දවසක්පාසා; පඤ්චසතසහස්සානි, (රටින් උපදින අයහැර) පන්ලක්ෂයෙක්; රඤ්ඤො, රජහට; උප්පජ්ජන්ති, උපදිත්; තතො, ඒ යථොක්තපන්ලක්ෂයෙන්; රාජා, රජතෙමෙ; නිග්‍රොධත්ථෙරස්ස, නිග්‍රොධස්ථවිරයන්ට; දෙවසිකං, දවස් පතා; සතසහස්සං, සියදහසෙක්; විස්සජ්ජෙති, විසර්ජනයකරයි;

සතසහස්සං, ධම්මස්ස සතසහස්සං, තං ධම්මධරානං බහුස්සුතානං චතුපච්චයත්ථාය උපනීයති, සඞ්ඝස්ස සතසහස්සං, චතූසු වාරේසු භෙසජ්ජත්ථාය සතසහස්සං, එවං සාසනෙ උළාරෙ ලාභසක්කාරෙ නිබ්බත්තෙ.

තිත්ථියා පරිහීනලාභසක්කාරා අන්තමසො ඝාසච්ඡාදනම්පි අලභන්තා ලාභසක්කාරං පත්ථයමානා සාසනෙ පබ්බජිත්වා සකානි සකානි දිට්ඨිගතානි අයං ධම්මො අයං විනයොති දීපෙන්ති.

පබ්බජ්ජං අලභමානාපි සයමෙව මුණ්ඩෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා විහාරෙසු විචරන්තා උපොසථම්පි පවාරණම්පි සඞ්ඝකම්මම්පි ගණකම්මම්පි පවිසන්ති, භික්ඛූ තෙහි සද්ධිං උපොසථං න කරොන්ති. තදා මොග්ගලිපුත්තතිස්සත්ථෙරො උප්පන්නං ඛො ඉදං අධිකරණං තං

---

බුද්ධස්සචෙතියෙ, බුදුන්ගේ චෛත්‍යයෙහි; ගන්ධමාලාදිහි පූජනත්ථාය, ගඳමල් ආදියෙන් පුදනුපිණිස; සතසහස්සං, සියක්දහසෙක්ය; ධම්මස්ස, ධර්මයට; සතසහස්සං, සියක්දහසෙක්ය; තං, ඒ සියදහස; බහුස්සුතානං ධම්මධරානං චතුපච්චයත්ථාය, බහුශ්‍රැත ධර්මධරයන්ගේ සිව්පසය පිණිස; උපනීයති, එළවනු ලැබෙ; සඞ්ඝස්ස සතසහස්සං, සඟහට සියක්දහසෙක්ය; චතූසුවාරේසු, සිව්දෙරෙහි; භෙසජ්ජත්ථාය, බෙහෙත් පිණිස; සතසහස්සානි, සියදහසෙක්යයි; එවං, මෙසේ; සාසනෙ, සස්නෙහි; උළාරලාභසක්කාරෙ, උදාරවූ ලාභසත්කාරයතෙම; නිබ්බත්තෙ, උපන;

(**"ලබ්භති පාපුණීයතීති=ලාභො. සක්කච්චං කාතබ්බො දාතබ්බොති=සක්කාරො.** නොහොත් **ලාභොඑව සක්කාරො=ලාභසක්කාරො"**යි විග්‍රහයි.)

තිත්ථියා, තීර්ථකයෝ; පරිහීනලාභසක්කාරා, පිරිහුණුලාභ සත්කාර ඇතියහු; අන්තමසො, අධමාන්තයෙන්; ඝාසච්ඡාදනම්පි අලභන්තා, කෑම් ඇඳිම් පමණද නොලබනුවෝ; ලාභසක්කාරං පත්ථයමානා, ලාභසත්කාර ප්‍රාර්ථනාකරනුවෝ; සාසනෙ පබ්බජිත්වා, සස්නෙහි පැවිදිව; අයං ධම්මො අයං විනයොති, මේ ධර්මය මේ විනයයි; සකානි සකානි දිට්ඨිගතානි දීපෙන්ති, සවකීය සවකීය දෘෂ්ටි ප්‍රකාශ කෙරෙත්; (දෘෂ්ටියගේ ගහණමාත්‍රයෙක්ය යන අර්ථයි.)

(**"ගූථගතං මුත්තගතං සඞ්ඛාරගතං"** යනාදියෙහි මෙන් මෙහිදු "දිට්ඨියෙව දිට්ඨිගතං" යි කියනලදී;)

පබ්බජ්ජං අලභමානා, ප්‍රව්‍රජ්‍යාව නොලබනුවෝ; සයමෙව, තෙමේම; මුණ්ඩෙත්වා, හිසමුඩුකොට; කාසායානිවත්ථානි අච්ඡාදෙත්වා, කාෂායවස්ත්‍රහැද; විහාරෙසු, විහාරයන්හි; විචරන්තා, හැසිරෙමින්; උපොසථම්පි, උපොෂිතයටද; පවාරණම්පි, පවුරුණටද; සඞ්ඝකම්මම්පි, සඞ්ඝකර්මයටද; ගණකම්මම්පි, ගණකර්මයටද; පවිසන්ති, ප්‍රවිෂ්ටවෙත්; භික්ඛූ, භික්ෂූහු; තෙහිසද්ධිං උපොසථං න කරොන්ති, ඔවුන් සමග පොහෝ නොකෙරෙත්; තදා, එකල්හි; මොග්ගලිපුත්තතිස්සත්ථෙරො,

නචිරස්සෙව කක්ඛළං භවිස්සති, නඛොපනෙතං සක්කා ඉමෙසං මජ්ඣෙ වසන්තෙන වූපසමෙතුන්ති. මහින්දත්ථෙරස්ස ගණං නීයාදෙත්වා අත්තනා ඵාසුකවිහාරෙන විහරිතුකාමො අහොගඞ්ගපබ්බතං අගමාසි

තෙපිඛො තිත්ථියා භික්ඛුසඞ්ඝෙන ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන නිග්ගය්හමානාපි ධම්මවිනයානුලොමාය පටිපත්තියා අසණ්ඨහන්තා අනෙකරූපං සාසනස්ස අබ්බුදඤ්ච මලඤ්ච කණ්ටකඤ්ච සමුට්ඨාපෙසුං, කෙචි අග්ගිං පරිචරන්ති, කෙචි පඤ්චාතපෙ තප්පන්ති, කෙචි ආදිච්චං අනුපරිවත්තන්ති, කෙචි ධම්මඤ්ච විනයඤ්ච වොභින්දිස්සාමාති පග්ගණ්හිංසු. තදා භික්ඛුසඞ්ඝො න තෙහි සද්ධිං උපොසථං වා පවාරණං වා අකාසි.

---

මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරතෙමේ; ඉදානි, දැන්; ඉදං අධිකරණං උප්පන්නං, මේ අධිකරණයෙක් උපන්නේය; තං න චිරස්සෙව කක්ඛළං භවිස්සති, ඒ අධිකරණය තෙම නොබෝකලකින්ම කර්කශවන්නේය; එතං, මේ අධිකරණය තෙමේ; ඉමෙසං මජ්ඣෙවසන්තෙන, මොවුන්ගේ මධ්‍යයෙහි වසන්නාහු විසින්; වූපසමෙතුං පන, ව්‍යපශමනය කරන්ට වනාහි; නඛොසක්කාති, නොමහැකියයි; මහින්දත්ථෙරස්සගණං නීයාදෙත්වා, මිහිඳුතෙරහට ගණයාපාවාදී; අත්තනා ඵාසුකවිහාරෙන, විහරිතුකාමො, තමහටසැපවූ විහරණයකින් කල්යවනු කැමතිව; අහොගඞ්ගපබ්බතං අගමාසි, එනම් පව්වකරා ගියේය;

තෙපිඛො තිත්ථියා, ඒ තීර්ථකයෝද වනාහි; භික්ඛුසඞ්ඝෙන, භික්සඟහු විසින්; ධම්මෙන, විද්‍යමානවස්තුවෙන්; විනයෙන, චොදනාවෙන් සාරණයෙන්; සත්ථුසාසනෙන, ඤත්තිසම්පත්ති අනුසාවනසම්පත්ති යෙන්; නිග්ගය්හමානාපි, (උක්ඛෙපනීයාදී කර්මවශයෙන්) නිග්‍රහකරණු ලබනුවෝද; ධම්මවිනයානුලොමායපටිපත්තියා, ධර්මවිනය දෙකට අනුලොම්වූ පිළිවෙතෙහි; අසණ්ඨහන්තා, නොසිටිනුවෝ; සාසනස්ස, සස්නට; අනෙකරූපං, අනෙකප්‍රකාරවූ; අබ්බුදඤ්ච, (එයින් නස්නා අර්ථ ඇති;) අර්බුදයද; මලඤ්ච, (කිලිටිබැව් කරණ අර්ථ ඇති) මලයද; කණ්ටකඤ්ච, (විදිනා අර්ථයෙන්) කණ්ටකයද; සමුට්ඨාපෙසුං, ඉපදෙව්වාහුය; කෙචි අග්ගිං පරිචරන්ති, කිසිවෙක්හු (වහ්නිහෝමයන්මෙන්) ගිනිපුදත්; කෙචිපඤ්චාතපෙ තප්පන්ති, කිසිවෙක්හු (සතරතැනක ගිනිදල්වා එහිමැදසිට සූර්යතාපයෙන්) තැවෙත්; කෙචි ආදිච්චං අනුපරිවත්තන්ති, කිසිවෙක්හු (උදයකාලයෙහි පටන් සූර්යයාබලමින් අස්තඞ්ගමය දක්වා හිරුට) අභිමුඛව පරිවර්තනය වෙත්; කෙචි, කිසි වෙක්හු; ධම්මඤ්චවිනයඤ්ච, ධර්මවිනය; වොභින්දිස්සාමාතිපග්ගණ්හිංසු, අනවස්ථිතකොට නසන්නමෝයයි තැත්කළාහුය; තදා, එකල්හි; භික්ඛුසඞ්ඝො, භික්ෂුසඞ්ඝතෙමේ; තෙහි සද්ධිං, ඔවුන් කැටුව; උපොසථං වා, උපොෂිතයද; පවාරණං වා, පවුරුණද; න අකාසි, නොකෙළේය;

අසොකාරාමෙ සත්තවස්සානි උපොසථො උපච්ඡිජ්ජි. රඤ්ඤොපි එතමත්ථං අරොචෙසුං. රාජා එකං අමච්චං ආණාපෙසි:- විහාරං ගන්ත්වා අධිකරණං වූපසමෙත්වා උපොසථං කාරාපෙහීති, අමච්චො රාජානං පටිපුච්ඡිතුං අවිසහන්තො අඤ්ඤෙ අමච්චෙ උපසඞ්කමිත්වා ආහ: රාජා මං විහාරං ගන්ත්වා අධිකරණං වූපසමෙත්වා උපොසථං කාරාපෙහීති පහිණි,

කථං නු ඛො අධිකරණං වූපසමමතීති. තෙ ආහංසු: මයං එවං සල්ලක්ඛෙම යථා නාම පච්චන්තං වූපසමෙන්තා චොරෙ ඝාතෙන්ති එවමෙවං යෙ උපොසථං න කරොන්ති තෙ මාරාපෙතුකාමො රාජා භවිස්සතීති. අථ සො අමච්චො විහාරං ගන්ත්වා භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා ආහ: අහං රඤ්ඤා උපොසථං කාරාපෙහීති පෙසිතො, කරොථදානි භන්තෙ උපොසථන්ති. භික්ඛූ න මයං තිත්ථියෙහි සද්ධිං උපොසථං කරොමාති ආහංසු.

---

අසොකාරාමෙ, අශොකාරාමයෙහි; සත්තවස්සානි, සත්අවුරුද්දක්; උපොසථො, උපොෂිතයතෙමේ; උපච්ඡිජ්ජි, අතිශයින් සිඳුනේවී; රඤ්ඤොපි, රජහටද; එතමත්ථං, අරොචෙසුං, මේ බවසැළ කළෝ; රාජා, රජතෙමේ; එකං අමච්චං, එක ඇමතියෙක්හට; විහාරං ගන්ත්වා, විහාරයට ගොස්; අධිකරණං වූපසමෙත්වා, අධිකරණය ව්‍යුපශමනයකොට; උපොසථං කාරාපෙහීති, උපොෂිතයකරවයි; ආණාපෙසි, අණකරවී; අමච්චො, ඇමතිතෙමේ; රාජානං පටිපුච්ඡිතුං අවිසහන්තො, රජපිළිවිසිනට නොහැකිවූයේ; අඤ්ඤෙ අමච්චෙ උපසඞ්කමිත්වා, අනික් ඇමතියන්කරා එළඹ; ආහ, කියේය; රාජා, රජතෙමේ; මං, මා; විහාරං ගන්ත්වා, විහාරයටගොස්; අධිකරණං වූපසමෙත්වා, අධිකරණය ව්‍යුපශමනයකොට; උපොසථං කාරාපෙහීති, උපොෂිතය කරවයි; පහිණි, යැවී;

කථන්නුඛො අධිකරණං වූපසමමතීති, කෙසේ අධිකරණය ව්‍යුපශමනයවේදැයි; තෙ, ඒ ඇමතියෝ; ආහංසු, කිවාහු; මයං, අපි; එවං සල්ලක්ඛෙම, මෙසේ සලකම්හ; පච්චන්තං, ප්‍රත්‍යන්තය; වූපසමෙන්තා, ව්‍යුපශමනයකරණ්නුවෝ; යථා නාමචොරෙඝාතෙන්ති, යම්සේචොරඝාතනය කෙරෙත්ද; එවමෙව, එපරිද්දෙන්ම; යෙ උපොසථං න කරොන්ති, යමෙක්තුමූ උපොෂිතය නොකෙරෙත්ද; තෙ, එව්හු; රාජා, රජතෙමේ; මාරාපෙතුකාමො භවිස්සති, මරවනු කැමතිවන්නේයයි; ආහංසු, කිහු; අථ, ඉක්බිත්තෙන්; සො අමච්චො, ඒ ඇමතිතෙමේ; විහාරං ගන්ත්වා, වෙහෙරට ගොස්; භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා, බික්සඟහු රැස්කරවා; අහං, මම; රඤ්ඤා, රජහු විසින්; උපොසථං කාරාපෙහීති, උපොෂිතය කරවයි; පෙසිතො, එවනලද්දෙමි; භන්තෙ, වහන්ස; ඉදානි උපොසථං කරොථාති, දැන් උපොෂිතයකරව්යයි; ආහ, කියේය; භික්ඛූ, භික්ෂූහු; මයං, අපි; තිත්ථියෙහිසද්ධිං, තීර්ථකයන් සමග; උපොසථං න කරොමාති ආහංසු, පෝය නොකරම්හයි කිහු;

අමච්චො ථෙරාසනතො පට්ඨාය අසිනා සීසානි පාතෙතුං ආරද්ධො, අද්දසා ඛො තිස්සත්ථෙරො තං අමච්චං තථා විප්පටිපන්නං. තිස්සත්ථෙරො නාම න යො වා සො වා රඤ්ඤො එකමාතිකො භාතා තිස්සකුමාරො නාම, තං කිර රාජා පත්තාභිසෙකො ඔපරජ්ජෙ ඨපෙසි, සො එකදිවසං වනචාරං ගතො අද්දස මහන්තං මිගසඞ්ඝං චිත්තකීළාය කීළන්තං.

දිස්වාන'ස්ස එතදහොසි: ඉමෙ තාව තිණභක්ඛා මිගා එවං කීළන්ති. ඉමෙ පන සමණා රාජකුලෙ පණීතානි භොජනානි භුඤ්ජිත්වා මුදුකාසු සෙය්‍යාසු සයමානා කීව මනාපං කීළිතං න කීළිස්සන්තීති. සො තතො ආගන්ත්වා ඉමං අත්තනො විතක්කං රඤ්ඤො ආරොචෙසි.

රාජා අට්ඨානෙ කුක්කුච්චායිතං කුමාරෙන හන්ද තං එවං සඤ්ඤාපෙස්සාමීති එකදිවසං කෙනචි කාරණෙන කුද්ධො විය හුත්වා එහි

---

අමච්චො, ඇමතිතෙමේ; ථෙරාසනතොපට්ඨාය, තෙරසුනපටන්; අසිනා, කඩුවකරණකොටගෙණ; සීසානිපාතෙතුං ආරද්ධො, හිස්සිඳිනට ඇරඹුයේය; තිස්සත්ථෙරො, තිස්ස ස්ථවිරතෙමේ; තථාවිප්පටිපන්නං, එසේ විපිළිපන්; තං අමච්චං අද්දසාඛො, ඒ ඇමතියා දුටුයේමය; තිස්සත්ථෙරොනාමාති, තිස්ස ස්ථවිරතෙමේ නම්; යොවාසොවාන, යම් ඒ කෙනෙක්නොවන්නේය; රඤ්ඤො, රජහුගේ; එකමාතිකොභාතා, ඒකමාතෘකභ්‍රාතෘවූ; තිස්සකුමාරොනාම, තිස්සකුමාරනම; තං කිර, ඔහු වනාහි; පත්තාභිසෙකොරාජා, ප්‍රාප්තාභිෂෙකරජතෙමේ; ඔපරජ්ජෙ ඨපෙසි, යුවරාජ්‍යයෙහි තැබුයේය; සො, හෙතෙමේ; එකදිවසං, එක් දවසක්; වනචාරං ගතො, වෙනෙහි හැසිරීමටගියේ; චිත්තාය කීළාය, චිත්තක්‍රීඩායෙන්; කීළන්තං, කෙළින්නාවූ; මහන්තං මිගසඞ්ඝං අද්දස, මහත්වූ මෘගසමූහයක්; දිටී;

දිස්වාන, දැක; ඉමෙ මිගා, මේ මෘගයෝ; තිණභක්ඛා, යම්තාක්, කල් තෘණ බුදිත්ද (ඒතාක්කල්;) එවං කීළන්ති, මෙසේ ක්‍රීඩාකෙරෙත්; ඉමෙ සමණා පන, මේ ශ්‍රමණයෝ වනාහි; රාජකුලෙ, රජකුලෙහි; පණීතානි භොජනානි භුඤ්ජිත්වා, ප්‍රණීත භොජනයන් අනුභව කොට; මුදුකාසුසෙය්‍යාසු, මොලොක් යහන්හි; සයමානා, සැතපෙන්නාවූ; කීවමනාපං කීලිතං, කිනම් මනාපක්‍රීඩාවක්; න කීළිස්සන්තීති, ක්‍රීඩානොකරන්නාහුදැයි; අස්ස, මේ යුවරදහට; එතදහොසි, මෙබඳු සිතෙක්වී; සො, හෙතෙමේ; තතො ආගන්ත්වා, එයින් අවුත්; අත්තනො ඉමං විතක්කං, තමාගේ මේ විතර්කය; රඤ්ඤො ආරොචෙසි, රජහට ආරොචනය කෙළේය;

රාජා, රජතෙමේ; කුමාරෙන, කුමාරයා විසින්; අට්ඨානෙ, නොකරුණෙහි; කුක්කුච්චායිතං, කුකුස්කරණලදී; හන්ද, එබැවින්; තං එවං සඤ්ඤාපෙස්සාමීති, ඔහු මෙසේ අවබොධකරවන්නෙමියි; එකදිවසං, එක්දවසක්; කෙනචිකාරණෙන, කිසිකරුණකින්; කුද්ධොවියහුත්වා

සත්තදිවසෙ රජ්ජං සම්පටිච්ඡ තතො තං ඝාතෙස්සාමීති මරණභයෙන තජ්ජෙත්වා තමත්ථං සඤ්ඤාපෙසි. සො කිර කුමාරො සත්තමෙ මං දිවසෙ මාරෙස්සතීති න චිත්තරූපං නහායි නභුඤ්ජි නසුපි, අතිවිය ලූඛසරීරො අහොසි.

තතො නං රාජා පුච්ඡි: කිස්ස ත්වං එවරූපො ජාතොති? මරණභයෙන දෙවාති. අරෙ ත්වං නාම පරිච්ඡින්නමරණං සම්පස්සමානො විස්සත්ථො න කීළසි, භික්ඛූ අස්සාස පස්සාසූපනිබද්ධං මරණං පෙක්ඛමානා කථං කීළිස්සන්තීති. තතොපපභුති කුමාරො සාසනෙ පසීදි.

සො පුන එකදිවසං මිගවං නික්ඛමිත්වා අරඤ්ඤෙ අනුවිචරමානො අද්දස යොනකමහාධම්මරක්ඛිතත්ථෙරං අඤ්ඤතරෙන හත්ථිනාගෙන සාලසාඛං ගහෙත්වා බීජියමානං නිසින්නං, දිස්වා පාමුජ්ජජාතො

---

කිපියෙක් මෙන්ව; එහි, එව; සත්තදිවසෙ, සත්දවසකට; රජ්ජං සම්පටිච්ඡ, රාජ්‍යය පිළිගනුව; තතො, ඉන්පසු; නං, තා; ඝාතෙස්සාමීති, ඝාතනයකරන්නෙමියි; මරණභයෙන, මරණබියෙන්; තජ්ජෙත්වා, තැතිගන්වා; තමත්ථං සඤ්ඤාපෙසි, (කුකුස්කරණලද) ඒ අර්ථය අවබොධකරවී; සොකිර කුමාරො, ඒ කුමාරතෙමේ වනාහි; සත්තමෙ දිවසෙ, සත්වැනි දවස්හි; මං මාරෙස්සතීති, මා මරවන්නාහුයයි; චිත්තරූපං, චිත්තානුරූපව; (යම්සේ කැමතිද එසේයයි කියනලදී.) න නහායි නොනැයේය; න භුඤ්ජි, අනුභව නොකෙළේය; න සුපි, ශයනය නොකෙළේය; අතිවිය ලූඛසරීරො අහොසි, ඉතාම රූක්‍ෂශරීරය ඇතිවූයේය;

තතො, ඉන්පසු; රාජා, රජතෙමේ; කිස්ස, කවරහෙතුවකින්; ත්වං, තෝ; එවරූපොජාතොති, මෙබඳුවූයෙහිදැයි; නං, ඔහු; පුච්ඡි, විචාළේය; මරණභයෙන දෙවාති, මරණබියෙන්ය දේවයිනි; අරෙ ත්වං නාම පරිච්ඡින්නමරණං සම්පස්සමානො, තොළුතෝ (සත්දව සින්) පිරිසිඳිනලද මරණය දක්නෝ; විස්සත්ථො, නිරාසඞ්කසිත් ඇතියේ (මරණසඞ්කාරහිතවූ නිර්භය ඇතියේයි කියනලදී) න කීළසි, ක්‍රීඩා නොකෙරෙහිද; අස්සාසපස්සාසූපනිබද්ධං මරණං, (මරණසතියෙහි අනුව යෙදෙන හෙයින්) ආශ්වාස ප්‍රශ්වාස ප්‍රවෘත්තිකාලය) ප්‍රතිබද්ධමරණය; පෙක්ඛමානාභික්ඛූ, බලනභික්‍ෂූහු; කථං කීළිස්සන්තීති, කෙසේ ක්‍රීඩා කරන්නාහුදැයි; තතොපපභුති, එතැන්පටන්; කුමාරො, කුමාරතෙමේ; සාසනෙ පසීදි, සස්නෙහි පැහැදුනේවී;

සො, හෙතෙමේ; පුන, නැවත; එකදිවසං, එක්දවසක්; මිගවං නික්ඛමිත්වා, මෘගඝාතනය පිණිස (වෙනෙහි මෘගපරෙයීෂණයට හැසිරෙමියි) නික්ම; අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; අනුවිචරමානො, අනුව හැසිරෙනුයේ; අඤ්ඤතරෙන හත්ථිනාගෙන, එක්තරා හස්තිනාගයෙක් විසින්; (අභිනාගාදීන් කෙරෙන් වෙසෙසනු පිණිස හත්ථිනාගොයි කියනලදී) සාලසාඛංගහෙත්වා, සාලසාඛාවක් ගෙණ; බීජියමානං,

චින්තෙසි: කදා නු බො අහම්පි අයං මහාථෙරො විය පබ්බජෙය්‍යං, සියා නු බො සො දිවසොති.

ථෙරො තස්සා,සයං විදිත්වා තස්ස පස්සන්තස්සෙව ආකාසෙ උප්පතිත්වා අසොකාරාමෙ පොක්ඛරණියා උදකතලෙ ඨත්වා චීවරඤ්ච උත්තරාසඞ්ගඤ්ච ආකාසෙ ලග්ගෙත්වා නහායිතුං ආරද්ධො.

කුමාරො ථෙරස්සානුභාවං දිස්වා අතිවිය පසන්නො අජ්ජෙව පබ්බජිස්සාමීති නිවත්තිත්වා රඤ්ඤො ආරොචෙසි: පබ්බජිස්සාමහං දෙවාති. රාජා අනෙකප්පකාරං යාචිත්වාපි තං නිවත්තෙතුං අසක්කොන්තො. අසොකාරාමගමනීයං මග්ගං අලඞ්කාරාපෙත්වා කුමාරං ඡණවෙසං ගාහාපෙත්වා අලඞ්කතාය සෙනාය පරිවාරාපෙත්වා විහාරං නෙසි.

---

විජිතිය සලකුණු ලබමින්; නිසින්නං, හුන්නාවූ; යොනකමහාධම්මරක්ඛිතත්ථෙරං, යොනක (විෂයෙහි ජාතවූ මෙහි අවුත් පැවිදිවනලද) ධම්මරක්ඛිත නම්ලද මහතෙරහු; අද්දස, දිටී; දිස්වා, දැක; පාමුජ්ජජාතො, ප්‍රමුදිතවූයේ; කදානුබො, කවරකලෙක; අයං මහාථෙරොවිය, මේ මහ තෙරහු මෙන්; පබ්බජෙය්‍යං, පැවිදිවන්නෙම්ද; සොදිවසො සියානුබොති, ඒ දිනයක් වන්නේවිදූසි; චින්තෙසි, සිතූයේය;

ථෙරො, ස්ථවිර තෙමේ; තස්සආසයංවිදිත්වා, ඔහුගේ අදහස දැන; පස්සන්තස්සෙවතස්ස, බලසිටින්නාවූ ඔහට අනදරකොට (ඔහු බලාසිටියදීම යන අර්ථයි) ආකාසෙඋප්පතිත්වා, අහසට පැන නැගී; අසොකාරාමෙ, අශොකාරාමයෙහි; පොක්ඛරණියා, පුෂ්කරණියෙහි; උදකතලෙ ඨත්වා, ජල තලායෙහි සිට; චීවරඤ්චඋත්තරාසඞ්ගඤ්ච, සිවුරද උතුරු සළුවද; ආකාසෙලග්ගෙත්වා, අහසෙහි (කායබන්ධනය ඇද එහි යථොක්ත සිවුරු) එල්වා; නහායිතුං ආරද්ධො, නාන්ට පටන්ගත්තේය;

(ප්‍රකෘතිස්වරූපය විජහනය කොට කුමාරස්වරූප ආදිය දැක්වීම් සංඛ්‍යාත විකුර්වණඍද්ධි ප්‍රාතිහාර්‍යය ගිහීන්ට දැක්වීම ශික්ෂාපද ප්‍රඥප්ති වශයෙන් වැලකූයේ මුත් අධිෂ්ඨානඍද්ධිය ප්‍රතික්ෂෙපකළ බැවින් මෙසේ අධිෂ්ඨාන ඍද්ධිය දැක්වූයේය;)

කුමාරො, කුමාරතෙමේ; ථෙරස්සආනුභාවංදිස්වා, තෙරහුගේ අනුභාවය දැක; අතිවියපසන්නො, ඉතාම ප්‍රසන්නවූයේ; අජ්ජෙව, අදම; පබ්බජිස්සාමීතිනිවත්තිත්වා, පැවිදිවන්නෙමියි නැවතී; දෙව, දේවයෙනි; අහං, මම; පබ්බජිස්සාමීති, පැවිදිවන්නෙමියි; රඤ්ඤොආරොචෙසි, රජහට සැළකෙළේ; රාජා, රජතෙමේ; අනෙකප්පකාරං යාචිත්වා, අනෙකප්‍රකාරයෙන් අයද; තංනිවත්තෙතුංඅසක්කොන්තො, ඔහු නවත්වන්ට නොහැකිවනසේක්; අසොකාරාම ගමනීයං මග්ගං, අශොකාරාමයට යායුතු මඟ; අලඞ්කාරාපෙත්වා, අලඞ්කාර කරවා; කුමාරං, කුමාරයා; ඡණවෙසංගාහාපෙත්වා, තුෂ්ටිජනක වෙශය ගන්වා (ඡණවෙසං යන්නෙන් උත්සව වෙශය යන අර්ථයි) අලඞ්කතායසෙනායපරිවාරාපෙත්වා, අලඞ්කාර කරණලද සෙනග විසින් පිරිවරා; විහාරංනෙසි, විහාරයට පැමිණවී;

යුවරාජා කිර පබ්බජිස්සතීති සුත්වා බහූ භික්ඛූ පත්තචීවරානි පටියාදෙසුං. කුමාරො පධානඝරං ගන්ත්වා මහාධම්මරක්ඛිතත්ථෙරස්සෙව සන්තිකෙ පබ්බජි සද්ධිං පුරිස සතසහස්සෙන. කුමාරස්ස පන අනුපබ්බජිතකානං ගණනපරිච්ඡෙදො නත්ථි, කුමාරො රඤ්ඤො චතුවස්සාභිසෙක කාලෙ පබ්බජිතො.

අථඤ්ඤොපි රඤ්ඤො භාගිනෙය්‍යො සඞ්ඝමිත්තාය සාමිකො අග්ගිබ්‍රහ්මා නාම කුමාරො අත්ථි, සඞ්ඝමිත්තා තස්ස එකමෙව පුත්තං විජායි, සොපි යුවරාජා පබ්බජිතොති සුත්වා රාජානං උපසඞ්කමිත්වා අහම්පිදෙව පබ්බජිස්සාමීති යාචි. පබ්බජ තාතාති ච රඤ්ඤා අනුඤ්ඤාතො තං දිවසමෙව පබ්බජි.

**එවං අනුපබ්බජිතො-උළාරවිභවෙන ඛත්තිය ජනෙන,**
**රඤ්ඤො කණිට්ඨභාතා-තිස්සත්ථෙරොති විඤ්ඤෙය්‍යො.**

---

යුවරාජා, යුවරජතෙම වනාහි; පබ්බජිස්සතීති සුත්වා, පැවිදි වන්නේයයි අසා; බහූභික්ඛූපත්තචීවරානිපටියාදෙසුං, (අනාකල්හි චීවරාදීන්ගේ පයෙෂීෂණය දුෂ්කරයයි) බොහෝ භික්ෂූහු පාසිවුරු සම්පාදනය කළෝ; කුමාරො, කුමරතෙමේ; පධානඝරංගන්ත්වා, (භාවනානුයොග වශයෙන්) වීර්‍ය්‍යාරම්භයට අනුරූප සෙනස්නට ගොස්; මහාධම්මරක්ඛිතත්ථෙරස්සෙවසන්තිකෙ, මහාධර්‍මරක්‍ෂිත ස්ථවිරයන්ගේම වෙතැ; පුරිසසතසහස්සෙන සද්ධිං, ලක්‍ෂයක් පුරුෂයන් සමග; පබ්බජි, පැවිදිවූයේය; කුමාරස්සඅනුපබ්බජිතානං පන, කුමාරයා අනුව ගොස් පැවිදිවූවන්ගේ වනාහි; ගණනපරිච්ඡෙදො නත්ථි, ගණන් පරිච්ඡේදයක් නැත්තේය; කුමාරො, කුමරතෙමේ; රඤ්ඤො, රජහුගේ; චතුවස්සාභිසෙකකාලෙ, සිව්වරුස අබිසෙස් ඇති කල්හි; පබ්බජිතො, පැවිදි වූයේවේ;

අථ, ඉක්බිති; අඤ්ඤොපි, අනිකුදු; රඤ්ඤොභාගිනෙය්‍යො, රජහුගේ බූහුනන් පුත්‍රවූ; සඞ්ඝමිත්තායසාමිකො, සඞ්ඝමිත්‍රාවගේ ස්වාමිවූ; අග්ගිබ්‍රහ්මානාමකුමාරො අත්ථි, අග්ගිබ්‍රහ්ම නම් කුමාරයෙක් ඇත්තේය; සඞ්ඝමිත්තා, සඞ්ඝමිත්‍රා තොමෝ; තස්ස, ඔහු නිසා; එකමෙවපුත්තං විජායි, එකම පුත්‍රයෙක් වැදීය; සොපි, හෙතෙමේද; යුවරාජාපබ්බජිතොති සුත්වා, යුවරජතෙම පැවිදි වූයේයයි අසා; රාජානංඋපසඞ්කමිත්වා, රදකරා එළඹ; දෙව, දේවයෙනි; අහම්පි, මමද; පබ්බජිස්සාමීති යාචි, පැවිදිවන්නෙමියි අයදී; පබ්බජතාතාතිචරඤ්ඤාඅනුඤ්ඤාතො, පැවිදිවෙව පින්වතැයි රජහු විසින් අනුදන්නාලදුයේ; තංදිවසංඑව, එදවස්හිම; පබ්බජි, පැවිදිවී;

එවං, මෙසේ; අනුපබ්බජිතො උළාරවිභවෙනඛත්තියජනෙන, උදාරසම්පත් ඇති ක්‍ෂත්‍රිය ජනයා හා අනුවගොස් පැවිදිවූ; රඤ්ඤොකණිට්ඨභාතා, රජහුගේ කණිෂ්ඨභ්‍රාතෘවූයේ; තිස්සත්ථෙරොති විඤ්ඤෙය්‍යො, තිස්සස්ථවිර තෙමේයයි දතයුත්තේය.;

සො තං අමච්චං තථාවිප්පටිපන්නං දිස්වා චින්තෙසි: න රාජා ථෙරෙ මාරාපෙතුං පහිණෙය්‍ය, අද්ධා ඉමස්සෙවෙතං අමච්චස්ස දුග්ගහිතං භවිස්සතීති ගන්ත්වා සයං තස්ස ආසන්නෙ ආසනෙ නිසීදි. සො ථෙරං සඤ්ජානිත්වා සත්ථං නිපාතෙතුං අවිසහන්තො ගන්ත්වා රඤ්ඤො ආරොචෙසි: අහං දෙව උපොසථං කාතුං අනිච්ඡන්තානං එත්තකානං නාම භික්ඛූනං සීසානි පාතෙසිං, අථ අය්‍යස්ස තිස්සත්ථෙරස්ස පටිපාටි සම්පත්තා කින්ති කරොමීති.

රාජා සුත්වාව අරෙ කිං පන ත්වං මයා භික්ඛූ ඝාතෙතුං පෙසිතොති. තාවදෙව සරීරෙ උප්පන්නදාහො හුත්වා විහාරං ගන්ත්වා ථෙරෙ භික්ඛූ පුච්ඡි: අයං භන්තෙ අමච්චො මයා අනාණත්තොව එවං අකාසි, කස්ස නු ඛො ඉමිනා පාපෙන භවිතබ්බන්ති. එකච්චෙ ථෙරා- අයං "තව වචනෙන අකාසි තුය්හෙ තං පාප"න්ති ආහංසු, එකච්චෙ "උභින්නම්පි වො එතං පාප"න්ති ආහංසු.

---

සො, ඒ සථ්විරතෙමේ; තථා විප්පටිපන්නං තං අමච්චංදිස්වා, එසේ විපිළිපන් ඒ ඇමතියා දැක; රාජා, රජතෙමේ; ථෙරෙමාරෙතුං, තෙරුන් මරවන්ට; නපහිණෙය්‍ය, නො එවන්නේය; අද්ධා, ඒකාන්තයෙන්; ඉමස්ස අමච්චස්සඑවඑතංදුග්ගහීතංභවිස්සතීති, මේ ඇමතිහුගේම මේ කුත්සිත ග්‍රහණයෙක් වන්නේයයි; චින්තෙසි, සිතූයේය; ගන්ත්වා, (එසේ සිතාසෘඩියෙන්) ගොස්; සයං, තෙමේ; තස්ස ආසන්නෙ ආසනෙ, ඔහු සමීප අස්නෙහි; නිසීදි, හුනි; සො, හෙතෙමේ; ථෙරංසඤ්ජානිත්වා, තෙරහු ඇඳින; සත්ථං නිපාතෙතුං අවිසහන්තො, කඩුව හෙළන්ට නොහැක්කේ; ගන්ත්වා, ගොස්; දෙව, දේවයෙනි; උපොසථංකාතුං අනිච්ඡන්තානං, පොහෝය කරන්ට නොකැමැතිවන්නාවූ; එත්තකානං නාමභික්ඛූනං, මෙපමණ භික්ෂූන්ගේ; අහං, මම; සීසානිපාතෙසිං, හිස් පතනය කෙළෙමි; අථ, ඉක්බිති; අය්‍යස්සතිස්සත්ථෙරස්ස, ආර්‍ය්‍යතිස්ස සථ්විරයහට; පටිපාටිසම්පත්තා, පිළිවෙළ පැමිණියා; කිං කරොමීති, කුමක් කෙරම්දැයි; රඤ්ඤොආරොචෙසි, රජහට අභිමුඛව සැළකෙළේය;

රාජා, රජතෙමේ; සුත්වාව, අසාම; අරෙ, කොල; කිංපන, කිමෙක්ද; ත්වං, තෝ; මයා, මා විසින්; භික්ඛූඝාතෙතුංපෙසිතොති, භික්ෂූහු ඝාතනය කරණු පිණිස යවන ලද්දේදැයි; තාවදෙව, එකෙණෙහිම; අස්සසරීරෙ, ඔහුගේ ශරීරයෙහි; උප්පන්නදාහො හුත්වා, උපන්දාහ ඇතිව; විහාරං ගන්ත්වා, වෙහෙරට ගොස්; භන්තෙ, වහන්ස; අයං අමච්චො, මේ ඇමතිතෙමේ; මයා අනාණත්තො, මා විසින් නො අණවනලදුවම; එවංඅකාසි, මෙසේකෙළේය; කස්සනුඛො, කවරක්හට වනාහි; ඉමිනා, මෙයින්; පාපෙනභවිතබ්බන්ති, පාපයක් වියයුතුදැයි; ථෙරෙභික්ඛූපුච්ඡි, සථ්විර භික්ෂූන් විචාළේය; එකච්චෙ ථෙරා, සමහර තෙරහු; අයං, මේ තෙමේ; තවවචනෙන, තාගේ වචනයෙන්; අකාසි, කෙළේය; තුය්හං එතං පාපන්ති ආහංසු, තට මේ පාපයයි කීහු; එකච්චෙ, සමහර තෙරහු; වො උභින්නම්පි, තෙපි දෙදෙනාටම; එතං පාපන්ති ආහංසු, මේ පාපයයි කීහු;

එකාවෙව එවමාහංසු: කිං පන තෙ මහාරාජ අත්‍ථි චිත්තං අයං ගන්ත්‍වා භික්ඛු ඝාතෙතූති. නත්‍ථි භන්තෙ කුසලා ධිප්පායො අහං පෙසෙසිං, සමග්ගො භික්ඛුසඞ්ඝො උපොසථං කරොතූති. සචෙ ත්‍වං කුසලා ධිප්පායො, නත්‍ථි තුය්හං පාපං, අමච්චස්සෙවෙතං පාපං හොති.

රාජා වෙළහක ජාතො ආහ: අත්‍ථි නු඼ො භන්තෙ කොචි භික්ඛු මමෙතං වෙළහකං ඡින්දිත්‍වා සාසනං පග්ගහෙතුං සමත්‍ථොති? අත්‍ථි මහාරාජ මොග්ගලිපුත්තතිස්සත්ථෙරො නාම,සො තෙ ඉමං වෙළහකං ඡින්දිත්‍වා සාසනං පග්ගණ්හිතුං සමත්‍ථොති. රාජා තදහෙව චත්තාරො ධම්මකථිකෙ එකෙකං භික්ඛුසහස්ස පරිවාරං චත්තාරො ච අමච්චෙ එකෙකං පුරිස සහස්ස පරිවාරං ථෙරං ගණ්හිත්‍වා ආගච්ඡථාති පෙසෙසි. තෙ ගන්ත්‍වා රාජා පක්කොසතීති ආහංසු.

---

එකාවෙව, සමහර තෙරහු; එවං, මෙසේ; ආහංසු, කීවාහුය; මහාරාජ, මහරජ; කිංපන, කිමෙක්ද; තෙ, තාගේ; අයං, මේ තෙමේ; ගන්ත්‍වා, ගොස්; භික්ඛු ඝාතෙතූති, භික්ෂූන් ඝාතනය කරවායි; චිත්තං අත්‍ථි, සිතෙක් ඇත්තේද; නත්‍ථි, භන්තෙ, නැත වහන්ස; කුසලා ධිප්පායො, මනා අදහස් ඇතිසේක්; අහං, මම; සමග්ගො භික්ඛුසඞ්ඝො, සමගි භික්ෂුසඞ්ඝ තෙමේ; උපොසථංකරොතූති, උපොෂිතය කරාවායි; පෙසෙසිං, යැවූයෙමි; ත්‍වං, තෝ; සචෙ කුසලාධිප්පායො, ඉදින් මනා අදහස් ඇතිසේක් නම්; තුය්හං පාපං නත්‍ථි, තට පාපයෙක් නැත්තේය; අමච්චස්ස එව එතං පාපං හොති ඇමතියාහටම මේ පාපයයි (කීහු.)

රාජා, රජතෙමේ; වෙළහකජාතො, (මේ භික්ෂූහු එක මාගීයකින් නො යෙත්යයි) සංසයට පැමිණියේ; භන්තෙ, වහන්ස; මම, මාගේ; එතං වෙළහකං ඡින්දිත්‍වා, මේ සැකය සිඳ; සාසනං පග්ගහෙතුං, සස්නට බලදෙන්ට; කො භික්ඛු සමත්‍ථො, කිනම් භික්ෂුවක් තෙම සමර්‍ථවේද; අත්‍ථිනුඛොති, (එබඳුම සමර්‍ථ කෙනෙක්) ඇත්තේදැයි; ආහ, විචාළේය; අත්‍ථි මහාරාජ මොග්ගලිපුත්තතිස්සත්ථෙරො නාම, ඇත මහරද මොග්ගලිපුත්තතිස්සස්ථවිර නමක් තෙමේ; සො, හෙතෙම; තෙ, තොපගේ; ඉමං වෙළහකං ඡින්දිත්‍වා, මේ සැකය සිඳ; සාසනං පග්ගණ්හිතුං, සසුන ප්‍රග්‍රහණය කරන්ට; සමත්‍ථොති, සමර්‍ථයෙක්යයි කීහු; රාජා, රජතෙමේ; තදහෙව, එදවස්හිම; එකෙකං භික්ඛුසහස්සපරිවාරං, එකෙක් එකෙක් හට එක එක දහස පිරිසිඳි භික්ෂූන් පිරිවරකොට; චත්තාරො ධම්මකථිකෙ, ධර්‍මකථිකභික්ෂූහු සතරනමෙක්ද; එකෙකං පුරිසසහස්සපරිවාරං, එකෙක් එකෙක් හට එක එක දහස පිරිසිඳි පුරුෂයන් පිරිවර කොට ඇති; චත්තාරො ච අමච්චෙ, ඇමතියන් සතරදෙනෙක්ද; ථෙරං ගණ්හිත්‍වා, ආගච්ඡථාති, තෙරහු කැඳවාගෙණ එවූයයි; පෙසෙසි, යැවී; තෙ, ඔව්හු; ගන්ත්‍වා, ගොස්, රාජා පක්කොසතීති ආහංසු, රජතෙමේ කැඳවායයි කීහු.

ථෙරො නාගච්ඡි. දුතියම්පි ඛො රාජා අට්ඨධම්මකථිකෙ අට්ඨ ච අමච්චෙ සහස්ස සහස්ස පරිවාරෙයෙව පෙසෙසි- රාජා භන්තෙ පක්කොසතීති වත්වා ගණ්හිත්වාව ආගච්ඡථාති.

තෙ තථෙව ආහංසු. දුතියම්පි ථෙරො නාගච්ඡි. රාජා ථෙරෙ පුච්ඡි: අහං භන්තෙ තික්ඛත්තුං පහිණිං, කස්මා ථෙරො නාගච්ඡතීති? රාජා පක්කොසතීති වුත්තත්තා මහාරාජ නාගච්ඡති, එවං පන වුත්තෙ ආගච්ඡෙය්‍ය: සාසනං භන්තෙ ඔසීදති අම්හාකං සාසනං පග්ගණ්හනත්ථාය සහායකා හොථාති.

අථ රාජා තථා වත්වා සොළසධම්මකථිකෙ සොළසච අමච්චෙ සහස්ස පහස්ස පරිවාරෙ පෙසෙසි. භික්ඛූ ච පටිපුච්ඡි: මහල්ලකො නුඛො භන්තෙ ථෙරො දහරො නුඛොති? මහල්ලකො මහාරාජාති. වය්හංවා

---

ථෙරො, ස්ථවිරතෙමේ; නාගච්ඡි, (අනනුරූප යාචනාවයයි) නොආයේය; දුතියම්පිඛො, දෙවනවටද; රාජා, රජතෙමේ; සහස්ස සහස්ස පරිවාරෙයෙව, දහස දහස පිරිවර ඇතිවම; අට්ඨධම්මකථිකෙ, අටදෙනෙකු ධර්මකථිකයන්ද; අට්ඨඅමච්චෙච, අටදෙනෙකු ඇමතියන්ද; භන්තෙ, වහන්ස; රාජා පක්කොසතීති වත්වා, රජතෙමේ කැඳවායයි කියා; ගණ්හිත්වාව ආගච්ඡථාති, ගෙණමඑව්යයි; පෙසෙසි, යැවී;

තෙ, එව්හු; තථෙව ආහංසු, එසේම කීහු; දුතියම්පි, දෙවනවටද; ථෙරො, තෙරතෙමේ; නාගච්ඡි, නොආයේවේ; රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; අහං, මම; තික්ඛත්තුං පහිණිං, දෙවරක් යැවූයෙමි; කස්මා, කුමක් හෙයින්; ථෙරො නාගච්ඡතීති, තෙරතෙම නොඒදැයි; ථෙරෙ පුච්ඡි, තෙරුන් විචාළේය; මහාරාජ, මහරද; රාජා පක්කොසතීති වුත්තත්තා, රජතෙමේ කැඳවායයි කී හෙයින්; නාගච්ඡති, නොඑන්නේය; භන්තෙ සාසනං ඔසීදති, වහන්ස සස්න පසුබසී; අම්හාකං සාසනං පග්ගණ්හනත්ථාය, අපගේ සසුන ප්‍රග්‍රහණය කරණු පිණිස; සහායකා හොථාති, සහායවව්යයි; එවං වුත්තෙ පන, මෙසේ කී කල්හි වනාහි ආගච්ඡෙය්‍ය, එන්නේය;

අථ, ඉක්බිති; රාජා, රජතෙමේ; තථා වත්වා, එසේ කියා; සහස්ස සහස්සපරිවාරෙ, දහස දහස පිරිවරකොට ඇති; සොළසධම්මකථිකෙ, සොළසක් ධර්මකථික භික්ෂූන්ද; සොළසඅමච්චෙච, සොළසක් ඇමතියන්ද; පෙසෙසී, යැවී; රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; ථෙරො, තෙරතෙමේ; මහල්ලකොනුඛො, මහළුද; දහරොනුඛොති, ළදරුදැයි; භික්ඛූ පටිපුච්ඡි, භික්ෂූන් පිළිවිසී; මහල්ලකොමහාරාජාති, මහළුය මහ රජයි කීහු; භන්තෙ, වහන්ස; වය්හංවා, (මණ්ඩප සදිස පුවරුවෙන් වසා

සිවිකං වා අභිරුහිස්සති භන්තෙති? නාභිරුහිස්සති මහාරාජාති. කුහිං භන්තෙ ථෙරො වසතීති? උපරිගඞ්ගාය මහාරාජාති.

රාජා ආහ: තෙනහි භන්තෙ නාවාසඞ්ඝාටං බන්ධිත්වා තත්ථ ථෙරං නිසීදාපෙත්වා ද්වීසුපි තීරෙසු ආරක්ඛං සංවිධාය ථෙරං ආනෙථාති. භික්ඛූ ච අමච්චා ච ථෙරස්ස සන්තිකං ගන්ත්වා රඤ්ඤො සාසනං ආරොචෙසුං.

ථෙරො සුත්වා යං ඛො අහං මූලතො පට්ඨාය සාසනං පග්ගණ්හිස්සාමීති පබ්බජිතොම්හි, අයං දානි මෙ සො කාලො අනුප්පත්තො’ති චම්මඛණ්ඩං ගණ්හිත්වාව උට්ඨහි. අථ ථෙරො සෙව පාටලිපුත්තං සම්පාපුණිස්සතීති රත්තිභාගෙ රාජා සුපිනං අද්දස. එවරූපො සුපිනො අහොසි: සබ්බසෙතො හත්ථිනාගො ආගන්ත්වා රාජානං සීසතො පට්ඨාය පරාමසිත්වා දක්ඛිණහත්ථෙ අග්ගහෙසි.

---

කරණලද සකට විශෙෂ සඞ්ඛ්‍යාත) වය්හයානාවකට හෝ; සිවිකංවා, අභිරුහිස්සති, එනම් යානාවකට හෝ නැගෙන්නේදැයි; මහාරජ, මහරද; නාභිරුහිස්සතීති, නොනැගෙන්නේයයි; භන්තෙ, වහන්ස; ථෙරො, තෙරතෙමේ; කුහිං වසතීති, කොතන වෙසේදැයි; මහාරජ, මහරද; උපරිගඞ්ගායාති, ගඟමතු භාගයෙහියයි (කිහු.)

රාජා, රජතෙමේ; භන්තෙ, සගයෙනි; තෙනහි, එසේවීනම්; නාවාසඞ්ඝාටං බන්ධිත්වා, එකටසඞ්ඝණයකොට නැවබැඳ; (**“එකට්ඨනාවා”ති ඤෙය්‍යො; යො හි ඔරතො පාරං පතති ගච්ඡතීති=පොතො, සත්තෙ නෙතීති=නාවාසී** වනු.) තත්ථ ථෙරං නිසීදාපෙත්වා, එහි තෙරහු හිඳුවා; ද්වීසුපි තීරෙසු, දෙගංඉවුරෙහිද; ආරක්ඛංසංවිධාය, (ශාසන ප්‍රත්‍යර්ථිකයන්ගේ බොහෝ බැවින්) මනාව ආරක්ෂාව විධානයකොට; ථෙරං ආනෙථාති, තෙරහු ගෙණෙවුයයි; ආහ, කීහ; භික්ඛූ ච අමච්චා ච, භික්ෂූහුද ඇමතියෝද; ථෙරස්ස සන්තිකං ගන්ත්වා, තෙරහුවෙත ගොස්; රඤ්ඤො, රජහුගේ; සාසනං ආරොචෙසුං, හසුන සැළකළෝ.

ථෙරො, ස්ථවිරතෙමේ; සුත්වා, අසා; යං, යම්හෙයකින්; අහං ඛො, මම වනාහි; මූලතොපට්ඨාය, මූල පටන්; සාසනං පග්ගණ්හිස්සාමීති, ශාසනප්‍රග්‍රහණය කරන්නෙමියි; පබ්බජිතොම්හි, පැවිදිවූයෙම්ද; ඉදානි, දැන්; මෙ, මට; සො අයං කාලො අනුප්පත්තොති, ඒ මේ කාලය පැමිණියේයයි; චම්මඛණ්ඩං ගණ්හිත්වාව උට්ඨහි, සම්කඩගෙණම නැගිටියේය; අථ, එකල්හි; ථෙරො, තෙරතෙම; සෙව, සෙට; පාටලිපුත්තං, පැලලුප් නුවරට; සම්පාපුණිස්සතීති, පැමිණෙන්නේයයි; රත්තිභාගෙ, රාත්‍රිභාගයෙහි; රාජා, රජතෙමේ; සුපිනං අද්දස, ස්වප්නයක් දුටුයේය; (කෙබඳු ස්වප්නයෙක්දයත්) එවරූපො සුපිනො අහොසි, මෙබඳු ස්වප්නයෙක් වූයේ වේ; සබ්බසෙතො හත්ථිනාගො, සර්වාඞ්ග ධවලවූ මහත් හස්තියෙක් තෙම; ආගන්ත්වා, අවුත්; රාජානං, රජහු; සීසතොපට්ඨාය පරාමසිත්වා, හිසපටන් පිරිමැද; දක්ඛිණහත්ථෙ අග්ගහෙසි, දකුණත ගති;

පුන දිවසෙ රාජා සුපිනජ්ඣායකෙ පුච්ඡි: මයා එවරූපො සුපිනො දිට්ඨො, කිං මෙ භවිස්සතීති? එකො තං මහාරාජ සමණනාගො දක්ඛිණහත්ථෙ ගණ්හිස්සතීති ආහ.

රාජා තාවදෙව ථෙරෙ ආගතොති සුත්වා ගඞ්ගාතීරං ගන්ත්වා නදිං ඔතරිත්වා අබ්භුග්ගච්ඡන්තො ජාණුමත්තෙන උදකෙ ථෙරං සම්පාපුණිත්වා ථෙරස්ස නාවාතො ඔතරන්තස්ස හත්ථං අදාසි. ථෙරො රාජානං දක්ඛිණ හත්ථෙ අග්ගහෙසි. තං දිස්වා අසිග්ගාහකා ථෙරස්ස සීසං පාතෙස්සාමාති කොසතො අසිං අබ්බාහිංසු. කස්මා? එතං කිර චාරිත්තං රාජකුලෙසු: යො රාජානං හත්ථෙ ගණ්හාති තස්ස අසිනා සීසං පාතෙතබ්බන්ති.

රාජා ඡායංයෙව දිස්වා ආහ: පුබ්බෙපි අහං භික්ඛූසු විරද්ධකාරණා අස්සාදං න වින්දාමි, මා ඛො ථෙරෙ විරජ්ඣිත්ථාති. ථෙරො පන කස්මා

---

රාජා, රජතෙමේ; මයා, මා විසින්; එවරූපො සුපිනො දිට්ඨො, මෙබඳු ස්වප්නයක් දක්නා ලද්දේය; කිංමෙහවිස්සතීති, කුමක් මට වන්නේදැයි; පුනදිවසෙ, දෙවන දිනයෙහි; සුපිනජ්ඣායකෙ පුච්ඡි, ස්වප්න හඳුරන්නන් පුළුවුත්හ; එකො, එකෙක්තෙමේ; මහාරාජ, මහරද; සමණනාගො, ශ්‍රමණනාගයෙක්තෙම; තං දක්ඛිණහත්ථෙ ගණ්හිස්සතීති, තොපගේ දකුණත ගන්නේයයි; ආහ, කීයේය;

රාජා, රජතෙමේ; තාවදෙව ථෙරෙ ආගතොති සුත්වා, එකෙණෙහිම තෙරතෙමේ ආයේයයි අසා; ගඞ්ගාතීරං ගන්ත්වා, ගංතෙරට ගොස්; නදිං ඔතරිත්වා අබ්භුග්ගච්ඡන්තො, ගඟට බැස ඉහළට යනුයේ; ජාණුමත්තෙන උදකෙ, දන පමණ දියෙහිදී; ථෙරං සම්පාපුණිත්වා, තෙරහුකරා පැමිණ; නාවාඔතරන්තස්ස ථෙරස්ස, නැවෙන් බස්නා තෙරහට; හත්ථංඅදාසි අත දුනි; ථෙරො, ස්ථවිරතෙමේ; රාජානං, රජහුගේ; දක්ඛිණහත්ථෙඅග්ගහෙසි, දකුණුඅත ගතී; තං දිස්වා, ඒ දැක; අසිග්ගාහකා, අසිග්‍රාහකයෝ; ථෙරස්ස සීසංපාතෙස්සාමාති, තෙරහුගේ හිස සිඳින්නෙමුයි; කොසතො අසිං අබ්බාහිංසු, කොෂයෙන් කඩුව ආකර්ෂණය කළෝ; කස්මා, කුමක් හෙයින්ද යත්; යො, යමෙක්තෙම; රාජානං හත්ථෙ ගණ්හාති, රජහුගේ හස්තග්‍රහණය කරාද; තස්ස සීසං, ඔහුගේ හිස; අසිනා පාතෙතබ්බන්ති, කඩුවෙන් හෙළිය යුත්තේයයි; රාජකුලෙසු, රදකුලයෙහි; එතං කිර චාරිත්තං, මේ චනාහි සිරිතෙක්වේ;

රාජා, රජතෙමේ; ඡායං එව දිස්වා, ඡායාවක්ම දැක; අහං, මම; පුබ්බෙ, පෙරද; භික්ඛූසු විරද්ධ කාරණා, භික්‍ෂූන් කෙරෙහි වැරදිව කළ කරුණ හේතුකොටගෙණ; අස්සාදං නවින්දාමි, අස්වැසීමක් නොවිඳිමි; ථෙරෙ, තෙරහු කෙරෙහි; මා ඛො විරජ්ඣිත්ථාති, නොවරදවව්යයි කීහ; ථෙරොපන, ස්ථවිරතෙමේ වනාහි; කස්මා, කුමක්හෙයින්; රාජානං

රාජානං භන්තෙ අග්ගහෙසීති? යස්මා රඤ්ඤා පක්ඛං පුච්ඡනත්ථාය පක්කොසාපිතො, තස්මා අන්තෙවාසිකො මෙ අයන්ති අග්ගහෙසි.

රාජා ථෙරං අන්තො උය්‍යානං නෙත්වා බාහිරතො තික්ඛත්තුං පරිවාරාපෙත්වා ආරක්ඛං ඨපෙත්වා සයමෙව ථෙරස්ස පාදෙ ධොවිත්වා තෙලෙන මක්ඛෙත්වා ථෙරස්ස සන්තිකෙ නිසීදිත්වා පටිබලො නු ඛො ථෙරො මම කඞ්ඛං ඡින්දිත්වා උප්පන්නං අධිකරණං වූපසමෙත්වා සාසනං පග්ගණ්හිතුන්ති වීමංසනත්ථාය අහං භන්තෙ එකං පාටිහාරියං දට්ඨුකාමොති ආහ.

කතමං පාටිහාරියං දට්ඨුකාමොසි මහාරාජාති? පඨවිකම්පනං භන්තෙති. සකල පඨවිකම්පනං දට්ඨුකාමොසි මහාරාජ උදාහු පදෙස පඨවිකම්පනන්ති? කතරං පනෙත්ථ භන්තෙ දුක්කරන්ති? කිං නු ඛො මහාරාජ කංසපාතියා උදකපුණ්ණාය සබ්බං උදකං කම්පෙතුං දුක්කරං

---

භන්තෙ අග්ගහෙසීති, රජහු හස්තග්‍රහණය කෙළේදැයි; යස්මා, යම් හෙයකින්; රඤ්ඤා, රජහු විසින්; පක්ඛං පුච්ඡනත්ථාය, පැණයක් පුළුවුස්නා පිණිස; පක්කොසාපිතො, කැඳවනලදුයේද; තස්මා, එහෙයින්; මෙ, මාගේ; අයං අන්තෙවාසිකොති, මේ අතවැසියෙක්යයි; අග්ගහෙසි, හස්තග්‍රහණය කෙළේය;

රාජා, රජතෙමේ; ථෙරං, තෙරහු; අන්තො උය්‍යානං නෙත්වා, තමාගේ උයනට පමුණුවා; බාහිරතො තික්ඛත්තුං පරිවාරාපෙත්වා, උයනට පිටතින් තුන්වරක් පිරිවරවා; ආරක්ඛං ඨපෙත්වා, අරකුන් තබා; හෙවත් ආරක්ෂා තබා; සයමෙව, තෙමේම; ථෙරස්ස, තෙරහුගේ; පාදෙ ධොවිත්වා, පාදධොවනයකොට; තෙලෙන මක්ඛෙත්වා, තෙලින් මකා; (තෙල් ගල්වා යන අර්ථයි) ථෙරස්ස සන්තිකෙ නිසීදිත්වා, තෙරවෙතහිඳ; ථෙරො, සථවිරතෙමේ; මම කඞ්ඛං ඡින්දිත්වා, මගේ සැකයසිඳ, උප්පන්නං අධිකරණං වූපසමෙත්වා, උපන් අධිකරණය ව්‍යපශමනයකොට; සාසනං පග්ගණ්හිතුං, ශාසනප්‍රග්‍රහණයකරන්ට; 'පටිබලො නු ඛොති, ප්‍රතිබල ඇත්තේදැයි; වීමංසනත්ථාය, විමසනු පිණිස; භන්තෙ, වහන්ස; අහං, මම; එකං පාටිහාරියං, එක් පෙළහරක්; දට්ඨුකාමොති ආහ, දක්නා කැමැත්තෙමියි කීය;

මහාරාජ, මහරද; කතරං පටිහාරියං දට්ඨුකාමොසි, කිනම් පෙළහරක් දක්නා කැමැත්තෙහිදැයි; පඨවිකම්පනං භන්තෙති, පෘථිවි කම්පාවය වහන්සැයි; මහාරාජ, මහරද; සකලං පඨවිකම්පනං දට්ඨුකාමොසි, සියලු පෘථිවිකම්පාව දක්නා කැමතියෙහිද; උදාහු, නොහොත්; පදෙස පඨවි කම්පනන්ති, ප්‍රදෙශ පෘථිවිචලනය දක්නා කැමතියෙහිදැයි (විචාළේය;) භන්තෙ, වහන්ස; එත්ථ පන, මෙයින් වනාහි; කතරං දුක්කරන්ති, කවරක් දුෂ්කරදැයි; කිං නු ඛො මහාරාජ, කිමෙක්ද මහරද; උදකපුණ්ණාය කංසපාතියා, දියපිරුණු ලොහො තලියෙක්හි; සබ්බං උදකං කම්පෙතුං, සියලු ජලය කම්පාකරන්ට; දුක්කරං, දුෂ්කරද; උදාහු

උදහු උපඩ්ඪන්ති? උපඩ්ඪං භන්තෙති. එවමෙවඛො මහාරාජ පදෙස පඨවිකම්පනං දුක්කරන්ති. තෙනහි භන්තෙ පදෙස පඨවිකම්පනං පස්සිස්සාමාති.

තෙනහි මහාරාජ සමන්තතො යොජනෙ යොජනෙ පුරත්ථිමාය දිසාය එකෙන චක්කෙන සීමං අක්කමිත්වා රථො තිට්ඨතු, දක්ඛිණාය දිසාය වීහි පාදෙහි සීමං අක්කමිත්වා අස්සො තිට්ඨතු, පච්ඡිමාය දිසාය එකෙන පාදෙන සීමං අක්කමිත්වා පුරිසො තිට්ඨතු, උත්තරාය දිසාය උපඩ්ඪභාගෙන සීමං අක්කමිත්වා එකා උදකපාති තිට්ඨතූති. රාජා තථා කාරාපෙසි.

ථෙරො අභිඤ්ඤාපාදකං චතුත්ථජ්ඣානං සමාපජ්ජිත්වා තතො උට්ඨාය රාජා පස්සතූති යොජනප්පමාණං පඨවි චලනං අධිට්ඨාසි.

---

උපඩ්ඪන්ති, නොහොත් අඩියෙක්දැයි; උපඩ්ඪංභන්තෙති, අඩෙක්ය වහන්සැයි; මහාරාජ, මහරද; එවමෙවඛො, එපරිද්දෙන්ම; පදෙස පඨවිකම්පනංදුක්කරන්ති, ප්‍රදෙශ පෘථිවිකම්පාවදුෂ්කරයයි; භන්තෙ, වහන්ස; තෙනහි, එසේවීනම්; පදෙසපඨවිකම්පනං පස්සිස්සාමාති, ප්‍රදෙශපෘථිවි චලනය දක්නෙමුයයි;

මහාරාජ, මහරද; තෙනහි, එසේවීනම්; සමන්තතො, හාත්පසින් යොජනෙ යොජනෙ, යොත්තක් යොත්තක් පාසා; පුරත්ථිමායදිසාය, පෙරදිග; එකෙනචක්කෙන, එක්සකකින්; සීමංඅක්කමිත්වා, සීමාව ඈක්ම; රථො තිඨතු, රථයක්තෙම සිටීවා; දක්ඛිණායදිසාය, දකුණුදිග; විහිපාදෙහි සීමංඅක්කමිත්වා, දෙපයකින් සීමාව මිරිකා; අස්සොතිට්ඨතු, අසෙක්තෙම සිටීවා; පච්ඡිමායදිසාය, පශ්චිමදිශාවෙහි; එකෙනපාදෙන, ඒක්පයකින්; සීමංඅක්කමිත්වා, සීමාව පාගා; පුරිසොතිට්ඨතු, පුරුෂයෙක් සිටීවා; උත්තරායදිසාය, උතුරුදිසාවෙහි; උපඩ්ඪභාගෙන, අඩකොටසක්; සීමංඅක්කමිත්වා, සීමාව ආක්‍රමණය කොට; එකාඋදකපාතී තිට්ඨතූති, එක්දියතලියක් තොමෝ සිටීවායි කී; රාජා, රජතෙමේ; තථාකාරාපෙසි, එසේ කරවී;

ථෙරො, ස්ථවිරතෙමේ; අභිඤ්ඤාපාදකංචතුත්ථජ්ඣානං සමාපජ්ජිත්වා, අභිඤ්ඤාවට ප්‍රතිෂ්ඨාභූතචතුර්ථධ්‍යානයට සමවැද; තතො වුට්ඨාය, එයින් නැගිට; රාජා, රජතෙමේ; පස්සතූති, ඒ දකීවායී; යොජනප්පමාණං පඨවිචලනං අධිට්ඨාසි, (විකුබ්බනඍද්ධිය නොවන බැවින්) යොත්තක් පමණ පෘථිවි චලනය අධිෂ්ඨාන කොළේය;

පුරත්ථිමාය දිසාය රඨස්ස අන්තොසීමාය ඨිතො පාදෙව චලි, ඉතරො න චලි. එවං දක්ඛිණ පච්ඡිමදිසාසු අස්සපුරිසානං අන්තොසීමාය ඨිත පාදංයෙව චලිංසු උපඩ්ඪුපඩ්ඪං සරීරඤ්ච. උත්තරාය දිසාය උදකපාතියාපි අන්තොසීමාය ඨිතං උපඩ්ඪභාගගතමෙව උදකං චලි. අවසෙසං නිච්චලමහොසීති.

රාජා තං පාටිහාරියං දිස්වා සක්ඛිස්සතිදානි ථෙරො .සාසනං පග්ගණ්හිතුන්ති නිට්ඨං ගන්ත්වා අත්තනො කුක්කුච්චං පුච්ඡි: අහං භන්තෙ එකං අමච්චං "විහාරං ගන්ත්වා අධිකරණං වූපසමෙත්වා උපොසථං කාරාපෙහී"ති පහිණිං. සො විහාරං ගන්ත්වා එත්තකෙ භික්ඛූ ජීවිතා වොරොපෙසි. එතං පාපං කස්ස හොතීති? කිම්පන තෙ මහාරාජ අත්ථි චිත්තං අයං විහාරං ගන්ත්වා භික්ඛූ ඝාතෙතූති? නත්ථි භන්තෙ සචෙ තෙ මහාරාජ නත්ථි එවරූපං චිත්තං, නත්ථි තුය්හං පාපන්ති.

---

පුරත්ථිමාය දිසාය, පූර්වදිශාවෙහි; රඨස්ස, රඨයාගේ; අන්තොසීමාය ඨිතොව, ඇතුලත සීමාවෙහි සිටියාමවූ; පාදෙ, රියසක; චලි, සැලුනේය; ඉතරො, අනික්රියසක; න චලි, නොසෙල්වුනේය; එවං, මෙසේ; දක්ඛිණපච්ඡිමදිසාසු, දකුණුපැසුළු දෙදිසාවන්හි; අස්සපුරිසානං, අශ්ව පුරුෂයන්ගේ; අන්තොසීමායඨිතපාදංයෙව, ඇතුළත සීමාවෙහි සිටි පාදයෝමද උපඩ්ඪුපඩ්ඪංසරීරඤ්ච, අඩ අඩ ශරීරද; චලිංසු, චලනය වූහු; උත්තරායදිසායඋදකපාතියාපි, උතුරුදිගදියතලියෙහිද; අන්තො සීමාය ඨිතං, සීමාවතුල සිටියාවූ; උපඩ්ඪභාගගතමෙව උදකං චලි, අඩ කොටසක්ම උදකචලනය වූයේය; අවසෙසං නිච්චලං, අහොසීති, සෙස්ස නිශ්චලවූයේයයි;

රාජා, රජතෙමේ; තංපාටිහාරියං දිස්වා, ඒ පෙළහරදැක; ඉදානි, දැන්; ථෙරො, ස්ථවිරතෙමේ; සාසනං පග්ගණ්හිතුංසක්ඛිස්සතීති, ශාසනය ප්‍රග්‍රහණය කරන්ට හෙවත් සස්නට සඞ්ග්‍රහකරන්ට, හැකිවන්නේයයි; නිට්ඨං ගන්ත්වා, නිමාවටගොස්; අත්තනොකුක්කුච්චං පුච්ඡි, තමාගේ කුකුසවිචාළේය; භන්තෙ, වහන්ස; විහාරංගන්ත්වා, වෙහෙරටගොස් අධිකරණං වූපසමෙත්වා, අධිකරණයව්‍යපශමනය කොට උපොසථං කාරාපෙහීති, පොහොයකරවයි; අහං, මම; එකං අමච්චං පහිණිං, එක්ඇමතියෙක් යැව්යෙමි; සො, හෙතෙම; විහාරං ගන්ත්වා, වෙහෙරටවැද; එත්තකෙභික්ඛූ ජීවිතා වොරොපෙසි මෙපමණ භික්ෂූන් ජීවිතයෙන් තොරකෙළේය; එතං පාපංකස්සහොතීති, මේ පාපයතෙම කවරෙක්හට වේදැයි; මහාරාජ, මහරද; කිංපන, කිම වනාහි; අයං, මේතෙමේ; විහාරංගන්ත්වා, වෙහෙරටගොස්; භික්ඛූඝාතෙතූති, භික්ෂූන්ඝාතනයකරාවායි; තෙචිත්තං අත්ථිති තොපගේ සිතෙක් ඇත්තේදැයි; නත්ථිභන්තෙ, නැතවහන්ස; මහාරාජ, මහරද; තෙ එවරූපං චිත්තං සචෙනත්ථි, තට බෙඳුසිතෙක් ඉදින්නැත්තේද; තුය්හංපාපං නත්ථි, තටපවෙක් නැත්තේයයි;

අථ ථෙරො රාජානං එතමත්ථං ඉමිනා සුත්තෙන සඤ්ඤාපෙසි: "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා"ති තමෙව වත්ථුං පරිදීපෙතුං තිත්තිරජාතකං ආහරි. අතීතෙ මහාරාජ දීපකතිත්තිරො තාපසං පුච්ඡි:-

**"ඤාතකො නො නිසින්නොති-බහු ආගච්ඡති ජනො,**
**පටිච්ච කම්මං ඵුසති-තස්මිං මෙ සඞ්කතී මනොති"**

තාපසො ආහ: අත්ථි පන තෙ චිත්තං මම සද්දෙන ච රූපදස්සනෙන ච ආගතත්තා එතෙ පක්ඛිනො බජ්ඣන්තු වා හඤ්ඤන්තු වාති?

---

අථ, එකල්හි; ථෙරො, ස්ථවිරතෙමේ; රාජානං, රජහට; එතමත්ථං, මේ කරුණ; ඉමිනා සුත්තෙන සඤ්ඤාපෙසි, (භාග්‍යවත්හු විසින් දෙසනලද) මේ සුතුරෙන් හැඟවී; භික්ඛවෙ, මහණෙනි; අහං, මම; චෙතනා, චෙතනාව හෙතුකොටගෙණ; කම්මං වදාමි, කුශලාකුශලකර්මය කියමි; චෙතයිත්වා, චෙතනාවපවත්වා; කායෙන වචසා මනසා, කවිසි සිතින් හෙවත් කයින්වචසින් මනසින්; කම්මං කරොති, කර්මය කෙරේ, තමෙව වත්ථුංපරිදිපෙතුං, ඒ කරුණදක්වනු පිණිස; තිත්තිරජාතකංආහරි, තිත්තිරජාතකය ගෙණහැරදක්වී; මහාරාජ, මහරද; අතීතෙ, අතීතභවයෙහි; දීපකතිත්තිරො, (තමා හුන්බව ප්‍රකාශ කරණහෙයින්) මෙසේ ලබනලද නම ඇතිතිත්තිර තෙමේ;

නොඤාතකො නිසින්නොති, අපගේ නෑයෙක් හුනීයයි; බහු ජනො ආගච්ඡති, බොහෝවූ මේ වටුසමූහතෙමේ එන්නේය; පටිච්ච, මානිසා, කම්මංඵුසති, මේ ප්‍රාණඝාත කර්මයලබා; තස්මිං, එහි; මේ, මාගේ; මනොසඞ්කතීති, සිතසැකයෙක්යයි;

(වහන්ස මම ශබ්ද කරණ කල්හි බෙහෝ වටුසමූහයා අවුත් දැල බැඳේ, එකල්හි වැදිතෙමේ ඔවුන් ජීවිතක්‍ෂයට පමුණුවයි, මම ශබ්ද නොකෙළෙම් නම් තිත්තිරසමූහයා නොඑන්නේය; ප්‍රාණඝාතයෙහි පාපභීරුකතාවයෙන් ශබ්දනොකොට හුන්කල්හි වැදිතෙමේ වේණුසලාකයකින් මාගේ ශ්‍රීවයට ප්‍රහාරදේ එයින් දුක්ඛවේදනාව ඉපිද මා මොරගාමි මෙහි පාපකර්මය මාකරුපැමිණේදැයි කියා) තාපසං පුච්ඡි, තවුසා විචාළේය;

තාපසො, තවුසානෝ; මමසද්දෙනච, මාගේ ශබ්දයෙන්ද; රූපදස්සනෙනච, රූ දැකීමෙන්ද; ආගතත්තා, අවුත් එතෙපක්ඛිනො, මෙපක්‍ෂීහු; බජ්ඣන්තුවා, බැඳෙත්වායි හෝ, හඤ්ඤන්තුවාති; නසිත්වායි හෝ; තෙපනචිත්තං අත්ථිති, තොපගේවනාහි සිතෙක් ඇත්තේදැයි

නත්ථි භන්තෙති තිත්තිරො ආහ. තතො නං තාපසො සඤ්ඤාපෙසි: සචෙ තෙ නත්ථි චිත්තං නත්ථි පාපං, චෙතයන්ත මෙව හි කම්මං ඵුසති නාචෙතයන්තං–

**"න පටිච්ච කම්මං ඵුසති–මනො චෙ නප්පදුස්සති,**
**අප්පොස්සුක්කස්ස භද්‍රස්ස–න පාපමුපලිප්පතී"ති.**

එවං ථෙරො රාජානං සඤ්ඤාපෙත්වා තත්ථෙව රාජුය්‍යානෙ සත්ත දිවසානි වසන්තො රාජානං සමයං උග්ගණ්හාපෙසි. රාජා සත්තමෙ දිවසෙ අසොකාරාමෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා සාණිපාකාරං පරික්ඛිපාපෙත්වා සාණිපාකාරන්තරෙ නිසින්නො එකලද්ධිකෙ එකලද්ධිකෙ භික්ඛූ එකතො එකතො කාරෙත්වා එකමෙකං භික්ඛුසමූහං පක්කොසාපෙත්වා පුච්ඡි: කිං වාදී සම්මාසම්බුද්ධොති?

---

ආහ, විචාළේය; නත්ථිභන්තෙති, නැත වහන්සැයි, තිත්තිරො, තිත්තිරතෙමේ; ආහ, කීය; තතො, ඉන්පසු; තාපසො, තවුස්තෙමේ; නං, ඔහු; සඤ්ඤාපෙසි, හැඟවී; තෙ චිත්තං සචෙ නත්ථි, තාගේ එබඳුසිතෙක් ඉදින් නැත්තේද; පාපං නත්ථි, පවෙක් නැත; චෙතයන්තමෙවහි, සිතන්නාහටම; කම්මං ඵුසති, කර්‍මයලැබේ; නචෙතයන්තං, නොසිතන්නාහට (කර්‍මයනොලැබේ.)

මනො, සිත; නප්පදුස්සතිචෙ, දූෂ්‍යනොවේ නම්; කම්මංපටිච්ච, කර්‍මයනිසා; න ඵුසති, නොවිඳී; අප්පොස්සුක්කස්ස, නිරාලයවූ; භද්‍රස්ස, පිරිසිදු සත්ත්වයාහට; පාපං, පාපයෙක්; න උපලිප්පති, නොඇලේයි; (මහරජ තොපගේ ප්‍රාණඝාත චෙතනාවක් නැතිබැවින් ඒ පාපය තොපකරු නොපැමිණේයයි යනුභාවයි).

එවං, මෙසේ; ථෙරො, තෙරතෙමේ; රාජානං සඤ්ඤාපෙත්වා, රජහු අවබොධකරවා; තත්ථෙව|රාජුය්‍යානෙ, එතනමරාජොද්‍යාන යෙහි; සත්තදිවසානි වසන්තො, සත්දවසක් වසනසේක්; රාජානං, රජහට; සමයං උග්ගණ්හාපෙසි, සම්‍යක්සම්බුද්ධයන්ගේ ලබ්ධිය ඉගැන්වූයේය; රාජා, රජතෙමේ; සත්තමෙදිවසෙ, සත්වනදවස්හි; අසොකාරාමෙ භික්ඛුසඞ්ඝංසන්නිපාතාපෙත්වා, අශොකාරාමයට භික්සඟහු රැස්කරවා; සාණිපාකාරං පරික්ඛිපාපෙත්වා, තිරපවුරකින් හාත්පසින් වටකරවා; (යම්නතිරපවුරකින් හාත්පසින් වටකරවාය යනඅර්ථයහෝ දතයුත්තේය) සාණිපාකාරන්තරෙ, නිසින්නො, තිරපවුරතුල හුන් සේක්; එකලද්ධිකෙ එකලද්ධිකෙ භික්ඛූ, සමානලබ්ධික සමානලබ්ධික භික්ෂූන්; එකතො එකතො, කාරෙත්වා, එක එකටකරවා; එකමෙකං භික්ඛුසමූහං, එක එක භික්ෂු සමූහයා; පක්කොසාපෙත්වා, කැඳවවා; සම්මාසම්බුද්ධො, සම්‍යක් සම්බුද්ධතෙමේ; කිංවාදීති, කුමනවාද ඇතියේදැයි; පුච්ඡි, විචාළේය; (**"කිංවදති සීලෙනාති=කිංවාදී"** නොහොත් **"කො නාම වාදො=කිංවාදො" සො එතස්ස අත්ථීති=කිංවාදී"යි** විග්‍රහයි;)

තතො සස්සතවාදිනො "සස්සතවාදී"ති ආහංසු. එකච්ච සස්සතිකා-:පෙ:-අන්තානන්තිකා-:පෙ:-අමරාවික්ඛෙපිකා-:පෙ:-අධිච්ච සමුප්පන්නිකා-:පෙ:-සඤ්ඤීවාද-:පෙ:-අසඤ්ඤීවාද-:පෙ:-නෙවසඤ්ඤී නාසඤ්ඤීවාද-:පෙ:-උච්ඡෙදවාද-:පෙ:-දිට්ඨධම්මනිබ්බාණවාද "දිට්ඨ ධම්මනිබ්බාණවාදී"ති ආහංසු.

---

තතො, එයින්; සස්සතවාදිනො, (තමන්ද ලෝකයාද) ශාශ්වතකොට කියන සුල්ලහු; (**සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච වදන්ති පඤ්ඤපෙන්ති සීලෙනාති= සස්සත වාදිනො,** නොහොත් **වදන්ති එතෙනාති=වාදො, සස්සතොවාදො= සස්සතවාදො; සො එතෙසමත්ථීති සස්සතවාදිනො"**යි ගන්නේ;) සස්සතවාදිනි ආහංසු, ශාශ්වතවාදීහුයයිකීහු; එකච්චසස්සතිකා, සත්ත්වයන් කෙරෙහිහෝ සංස්කාරයන්හි හෝ සමහරක් ශාශ්වතයයි වාද ඇත්තාහු; (**එකච්චං සස්සතං එතස්සාති= එකච්චසස්සතො එකච්චසස්සතවාදො සො එතෙසමත්ථීති= එකච්චසස්සතිකා"**යි ගන්නේ;) අන්තානන්තිකා, අන්තය අනන්තය අන්තානන්තය නෙව නන්තය නානන්තය යන මේ පස අරභයාපැවතිවාද ඇත්තාහු; (**"අමතිගච්ඡති එත්ථ සභාවො ඔසානන්ති අන්තො, අනන්තොච අන්තානන්තොච=අන්තානන්තො; අන්තානන්තං එතෙසමත්ථීති=අන්තා නන්තිකා"**යි විග්‍රහයි.) අමරාවික්ඛෙපිකා, (අමරනම් මත්ස්‍ය ජාතියමෙන් ග්‍රහණයට නුසුදුසුවූ :අනෙකප්‍රකාරයෙන් වික්ෂෙපකරවන හෙයින්) අමරාවික්ෂෙපනම් වාද ඇත්තාහු; (**නමරතීති න උපච්ඡිජ්ජතීති=අමරා; සා සා එවම්පි මෙ නො තථාති පි මෙ නො අඤ්ඤථාතිපි මෙ නො නොතිපි මෙ නො නො නොතිපි මෙ නොති එවං පවත්තවාද වසෙන පරියන්තරහිතා දිට්ඨිගති තස්ස දිට්ඨියෙව වාචාච, එවම්පි මෙ නොති ආදිනා විවිධො නානප්පකාරෙ ඛෙපො පරවාදීනං ඛිපනං=වික්ඛෙපො අමරාය දිට්ඨියා වාචායවා වික්ඛෙපො=අමරාවික්ඛෙපො; සො එතෙස මත්ථීති=අමරා වික්ඛෙපිකා;** නොහොත් **අමරාය දිට්ඨියා වාචායච වික්ඛිපන්තීති=අමරා වික්ඛෙපිනො; අමරාවික්ඛෙපිනො එව=අමරාවික්ඛෙපිකා** නොහොත් **අමරානාම මච්ඡජාති සා උම්මුජ්ජන නි මුජ්ජනාදිවසෙන උදකෙ සන්ධාවමානා ගහෙතුං න සක්කා, එව මෙව අයම්පිවාදො එකස්මිං සභාවෙ අනවට්ඨානතො ඉතොචිතොච සන්ධාවති ගාහං න උප ගච්ඡතීති=අමරාවික්ඛෙපො; අමරාය වික්ඛෙපො වියාති අමරාවික්ඛෙපො** යි වනු;) අධිච්චසමුප්පන්නිකා,.(නිෂ්කාරණොත්පත්තිවාද සඛ්‍යාත) අධිච්ච සමුප්පන්නවාද ඇත්තාහු, (**අධිච්ච යදිච්ඡකං යංකිඤ්චිකාරණං විනා සමුප්පන්නො අත්තාචලොකො චාති දස්සනං අධිච්චසමුප්පන්නං තං එතෙසං අත්ථීති=අධිච්චසමුප්පන්නිකා**යි විග්‍රහයි;) සඤ්ඤීවාද, සඤ්ඤීවාද ඇත්තාහු; (**සඤ්ඤීවාදො එතෙසං අත්ථීති=සඤ්ඤීවාදා**යි විග්‍රහයි;)

රාජා පඨමමෙව සමයස්ස උග්ගහිතත්තා න ඉමෙ භික්ඛු අඤ්ඤතිත්ථියා ඉමෙති ඤත්වා තෙසං සෙතකානි වත්ථානි දත්වා උප්පබ්බාජෙසි. තෙ සබ්බෙපි සට්ඨිසහස්සා අහෙසුං.

අථඤ්ඤෙ භික්ඛූ පක්කොසාපෙත්වා පුච්ඡි: කිං වාදී භන්තෙ සම්මාසම්බුද්ධොති? විභජ්ජවාදී මහාරාජාති. එවං වුත්තෙ රාජා ථෙරං පුච්ඡි: විභජ්ජවාදී භන්තෙ සම්මාසම්බුද්ධොති ආම මහාරාජාති.

---

අසඤ්ඤීවාද, අසඤ්ඤීවාද ඇත්තාහු; නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද, නෙවසඤ්ඤී නාසඤ්ඤීවාද ඇතියහු; උච්ඡේදවාද, (මාතාපෙත්තිකසම්භවයෙන් උපන් සත්ත්වයෝ කාබුන්මරණින් මත්තෙහි සිඳෙත්යි, එයින්මතු උත්පත්තියෙක් නැතැයි පැවැත්තාවූ,)උච්ඡේදවාද ඇතියහු; (**"කායස්සභෙද උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණාති එව මාදිනා නයෙන පවත්තං උච්ඡෙද දස්සනං=උච්ඡෙදො; සහචරණ නයෙන උච්ඡෙදොවාදො යෙසන්තෙ=උච්ඡෙදවාදා; උච්ඡෙදං වදන්ති තිවා උච්ඡෙදවාදායි** විග්‍රහයි.) දිට්ඨධම්මනිබ්බාණවාද, මෙම ආත්ම භාවයෙහි දුක් ව්‍යපශමනය කෙරෙත්යයි වාද ඇත්තාහු; **දිට්ඨ ධම්මෙ නිබ්බාණං= දිට්ඨධම්මනිබ්බාණං, තං වදන්තීති**= දිට්ඨධම්මනිබ්බාණවාදායි" විග්‍රහයි;) දිට්ඨධම්මනිබ්බාණවාදීති, දෘෂ්ට ධර්මනිර්වාණ වාදීහුයයි; ආහංසු, කීහු;

රාජා, රජතෙමේ; පඨමමෙව සමයස්ස උග්ගහිතත්තා, පළමු කොටම භාග්‍යවත්හුගේ ලබ්ධිය උද්ග්‍රහණයකළ බැවින්; න ඉමෙ භික්ඛූ, මොහු භික්ෂූහු නොවෙති; අඤ්ඤතිත්ථියා ඉමෙති ඤත්වා, අන්‍ය තීර්ථිකයෝ මොහුයයි දැන; තෙසං සෙතකානි වත්ථානි දත්වා, ඔවුන්ට සුදුවස්ත්‍රදී; උප්පබ්බාජෙසි, සිවුරු හැරවූයේය; තෙ සබ්බෙපි, ඒ සියල්ලෝම; සට්ඨිසහස්සා අහෙසුං, සැටදහසක් වූහු;

අථ, ඉක්බිති; අඤ්ඤෙ භික්ඛූ පක්කොසාපෙත්වා, සෙසුභික්ෂූන් කැඳවවා; භන්තෙ, වහන්ස; සම්මාසම්බුද්ධො කිං වාදීති, සම්‍යක්සම්බුද්ධ තෙමේ කුමනවාදීදැයි, පුච්ඡි, විචාළේය; මහාරාජ, මහරද; විභජ්ජවාදීති, විභජ්ජවාදීයයි; (**"විභජ්ජ වදතීති=විභජ්ජවාදී"** යි විග්‍රහයි. එහි භාග්‍යවත්තෙමේ වෙරඤ්ජකාණ්ඩයෙහි ආනයින් මම වනාහි රාගාදිය නැතිකිරීම පිණිස දහම් දෙසමි බ්‍රාහ්මණයයි යනාදිය දෙශනාකොට තෝ යමක් සඳහා යමක් කියෙහිද, ඒ එසේ නොවන්නේයයි යනාදීන් වෙරඤ්ජ බමුණාහට තමන් වහන්සේගේ **"වෙනයි"** කාදී භාවය විභාගකොට වදාළේයයිද, ශාස්වතොච්ඡේද දෘෂ්ටිවය විභාගකෙළේයයිද, ආත්මයද, ලොකයද, ශාස්වතයයි යපනීය ප්‍රශ්න යන් තබන හෙයින්ද උභයාන්තයට නොපැමිණ මධ්‍යමප්‍රතිපදාභූත ප්‍රත්‍යයසමුත්පාදධර්මය දෙසන බැවින්දැයි යනාදී මේ කාරණයන් හේතු කොටගෙණ භාග්‍යවත්තෙමේ විභජ්ජවාදීයයි දතයුත්තේය.) එවං වුත්තෙ, මෙසේ කී කල්හි; රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; සම්මාසම්බුද්ධොවිභජ්ජවාදීති, සම්‍යක්සම්බුද්ධතෙමේ විභජ්ජවාදීදැයි; ථෙරං පුච්ඡි, තෙරහු විචාළේය; ආමමහාරාජාති, එසේය මහරජැයි;

තතො රාජා "සුද්ධං'දානි භන්තෙ සාසනං, කරොතු භික්ඛුසඞ්ඝො උපොසථං"ති ආරක්ඛං දත්වා නගරං පාවිසි. සමග්ගො සඞ්ඝො සන්නිපතිත්වා උපොසථං අකාසි. තස්මිං සන්නිපාතෙ සට්ඨිභික්ඛුසතසහස්සානි අහෙසුං. තස්මිං සමාගමෙ මොග්ගලිපුත්තතිස්සත්ථෙරො පරප්පවාදං මද්දමානො කථාවත්ථුප්පකරණං අභාසි. තතො සට්ඨිසතසහස්සසඞ්ඛාසු භික්ඛූසු උච්චිනිත්වා තිපිටකපරියත්තිධරානං පභින්නපටිසම්භිදානං තෙවිජ්ජාදිභෙදානං භික්ඛූනං සහස්සමෙකං ගහෙත්වා යථා මහාකස්සපත්ථෙරො ච කාකණ්ඩකපුත්තො යසත්ථෙරො ච ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායිංසු, එවමෙව ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායන්තො සබ්බං සාසනමලං විසොධෙත්වා තතියසඞ්ගීතිං අකාසි.

---

තතො, ඉන්පසු; රාජා, රජතෙමේ භන්තෙ, වහන්ස; ඉදානි සාසනං සුද්ධං, දැන් සස්න සුද්ධය; භික්ඛුසඞ්ඝො උපොසථං කරොතූති, භික්ෂුසඞ්ඝතෙමේ උපොෂිතය කෙරේවායි; ආරක්ඛං දත්වා, ආරක්‍ෂාදී; නගරං පාවිසි, නුවරටවනී; සමග්ගො සඞ්ඝො, සමගිසඞ්ඝතෙමේ; සන්නිපතිත්වා, රැස්ව; උපොසථං අකාසි, පොහොය කෙළේයි; තස්මිං සන්නිපාතෙ, ඒ රැස්වීමෙහි; සට්ඨිසතසහස්සානි භික්ඛූ අහෙසුං, සැට ලක්‍ෂයක් භික්‍ෂුහුවූහු; තස්මිං සමාගමෙ, ඒ සමාගමයෙහි; මොග්ගලිපුත්තතිස්සත්ථෙරො, මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරතෙමේ; පරප්පවාදං මද්දමානො, තෘතීයසඞ්ගායනා කාලයෙහි උපන් පරවාදය මඩිමින්; කථාවත්ථුප්පකරණං අභාසි, (ශාස්තෘහු විසින් දෙනලද නයවශයෙන්ම තථාගතයන් විසින් තබනලද මාතෘකාව විභජනය කෙරෙමින් සකවාදයෙහි පන්සියයක් සූත්‍රද, පරවාදයෙහි පන්සියයක් සූත්‍රදැයි මෙසේ සූත්‍රදහසක් ගෙණහැරදක්වා, මතු උපදිනලද වාදයන්ගේ ප්‍රතිෂෙධවල ක්‍ෂණභාවයෙන් යුත්) "කථාවස්තුප්‍රකරණය" වදාළේය; තතො, ඉන්පසු; සට්ඨිසතසහස්සසඞ්ඛාසු භික්ඛූසු, සැටලක්‍ෂයක් පමණ භික්‍ෂූන් අතුරෙන්; උච්චිනිත්වා, තොරා; තිපිටකපරියත්තිධරාණං, ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිධරවූ; පභින්නපටිසම්භිදානං, ප්‍රභෙදවූ පිළිසිඹියා ඇති; තෙවිජ්ජාදිභෙදානං, ත්‍රිවිද්‍යාදිප්‍රභෙද ඇති; භික්ඛූනං, භික්‍ෂූන්ගේ; එකං සහස්සං ගහෙත්වා, එක්දහසක් ගෙණ; මහාකස්සපත්ථෙරොච, මහකසුප්තෙර තෙමේද; කාකණ්ඩකපුත්තො යසත්ථෙරොච, කාකණ්ඩකපුත්‍ර යසස්ථවිරතෙමේද; ධම්මඤ්ච විනයඤ්ච, ධර්මවිනය; යථා සඞ්ගායිංසු, යම්සේ සඞ්ගායනාකළාහුද; එවමෙව, එපරිද්දෙන්ම; ධම්මඤ්ච විනයඤ්ච සඞ්ගායන්තො, ධර්මවිනය දෙක සඞ්ගායනාකරණුයේ; සබ්බං සාසනමලං විසොධෙත්වා, සියලු සසුන්මලය ශුද්ධකොට තතියසඞ්ගීතිං අකාසි. තුන්වන සඞ්ගායනාව කෙළේයි;

සඞ්ගීතිපරියොසානෙ අනෙකප්පකාරං පථවී අකම්පිත්ථ. අයං සඞ්ගීති නවහි මාසෙහි නිට්ඨිතා. යා ලොකෙ:-

**කතා භික්ඛුසහස්සෙන-තස්මා සාහස්සිකාති ච,**
**පුරිමා ද්වෙ උපාදාය-තතියාති ච වුච්චතීති.**

**අයං තතියසඞ්ගීති නිට්ඨිතා.**

---

සඞ්ගීතිපරියොසානෙ, සඞ්ගීතිකෙළවර; අනෙකප්පකාරං, නොයෙක් ආකාර; පථවිං අකම්පිත්ථ, පෘථිවිය චලනයවී; අයං සඞ්ගීති, මේ සඞ්ගීතිතොමෝ; නවහි මාසෙහි, නවමසකින්; නිට්ඨිතා, නිමවනලදී; ලොකෙ, ලෙව්හි; යා, යම් සඞ්ගීතියක්තොමෝ;

භික්ඛුසහස්සෙන කතා, දහසක් භික්ෂූන් විසින් කරණලද්දීද; තස්මා, එහෙයින්; ("සා" යී ආධ්‍යාහාරයි ඕතොමෝ) සාහස්සිකාති ච, සාහස්‍රිකාවයයිද; පුරිමා ද්වෙ උපාදාය, ප්‍රථම විතීය සඞ්ගීතිවය කරණකොට ගෙණ; තතියාති ච, තෘතීයාවයයිද; වුච්චතීති කියනුලබානුයි;

**අයං තතියසඞ්ගීති, මේ තෘතීය සඞ්ගායනාව**
**නිට්ඨිතා, නිමවනලදී.**

එත්තාවතාව "කෙනාභතනති" එතසස පඤ්හසස විසජ්ජ නත්‍ථං යදවොචුමහ "ජම්බුදීපෙ තාව උපාලිත්‍ථෙරමාදිං කත්‍වා ආචරිය පරම්පරාය යාව තතියසඞ්ගීති තාව ආභතං. තත්‍රායං ආචරියපරම්පරා:-

"උපාලි දාසකො චෙව-සොණකො සිග්ගවො තථා,
තිස්සො මොග්ගලිපුත්තෙනාව-පඤ්චෙතෙ විජිතාවිනො.

පරම්පරාය විනයං-දීපෙජම්බුසිරිව්හයෙ,
අච්ඡිජ්ජමානං ආනෙසුං-තතියොයාව සඞ්ගහො"ති.

තස්සත්‍ථො එත්තාවතා පකාසිතොව හොති. තතියසඞ්ගහතො පන උද්ධං ඉමං දීපං මහින්දාදීහි ආභතං. මහින්දතො උග්ගහෙත්‍වා කඤ්චිකාලං

---

එත්තාවතාව, මෙපමණකින්ම; කෙනාභතනති, කවරෙකු විසින් ගෙනඑනලද්දේදැයි; එතසස පඤ්හසස විසජ්ජනත්‍ථං, මේ පැනය විසඳනු පිණිස; යං අවොචුමහ, යමක් කීම්ද; ජම්බුදීපෙ, ජම්බුවීපයෙහි; තාව, පළමුකොට; උපාලිත්‍ථෙරමාදිං කත්‍වා, උපාලිස්ථවිරයන් ආදිකොට; ආචරියපරම්පරාය, ආචාර්‍ය්‍ය පරම්පරාවෙන්; යාව තතියසඞ්ගීති, යම් තාක් තෘතීය සඞ්ගායනාවද; තාව, ඒතාක්; ආභතං, ගෙනඑන ලද්දේය; තත්‍ර එහි; අයං ආචරියපරම්පරා, මේ ආචාර්‍ය්‍ය පරම්පරා තොමෝයි;

උපාලි, උපාලිතෙර තෙමේද; දාසකොචෙව, දාසක ස්ථවිර තෙමේද; සොණකො, සොණකනම් තෙරතෙමේද; සිග්ගවො, සිග්ගව නම් තෙරතෙමේද; තථා, එසේ; තිස්සො මොග්ගලිපුත්තෙනාව, තිස්ස නම් මුගලන්පුත් තෙරතෙමේද යන; විජිතාවිනො, අතිශයින් ජය ගන්නාලද රාගාදි කෙලශයන් ඇති; එතෙපඤ්ච, මේ තෙරහු පස්දෙන;

පරම්පරාය, පරම්පරාවෙන්; ජම්බුසිරිව්හයෙදීපෙ, ජම්බුසිරිනම් ව්පයෙහි හෙවත් දඹදිවැ; විනයං, විනය; අච්ඡිජ්ජමානං, අභෙද්‍යකොට; යාවතතියො සඞ්ගහො, යම්තාක් තෘතීය සඞ්ගායනාවද ඒතාක් කල්; ආනෙසුනති, ගෙනාවාහුයයි;

තසස, ඒ ප්‍රශනයාගේ; අත්‍ථො, අර්‍ථයතෙමේ; එත්තාවතා, මෙපමණකින්, පකාසිතො හොති, ප්‍රකාශකරණලද්දේ වේ; (කවරෙක් විසින් ගෙණඑනලද්දේදැයි යනමේ පැනය විසඳීමෙන් දඹදිව තුන්වන සඞ්ගායනාවතෙක් පැවති ආචාර්‍ය්‍ය පරම්පරාව දක්වා ලක්දිව යනාදිය ආරබධයි;) තතියසඞ්ගහතො උද්ධං පන, තෘතීයසඞ්ගායනාවෙන් මතු වනාහි; ඉමං දීපං, මේ තාම්‍රපර්ණිවීපයට; මහින්දාදීහි, මහෙන්ද්‍රාදිස්ථවිර යන් විසින්; ආභතං, ගෙනඑනලදී; මහින්දතො උග්ගහෙත්‍වා, මිහිඳු තෙරගෙන් ඉගෙන; කඤ්චිකාලං, සවල්පකාලයක් මුළුල්ලෙහි;

අරිට්ඨත්ථෙරාදීහි ආභතං. තතො යාව අජ්ජතනා තෙසං යෙව අන්තෙවාසික පරම්පරාභතාය ආචරිය පරම්පරාය ආභතන්ති වෙදි තබ්බං.

යථාහු පොරාණා:-

**තතො මහින්දො ඉට්ටියො-උත්තියො සම්බලොපිච,**
**භද්දනාමොච පණ්ඩිතො-එතෙනාගා මහාපඤ්ඤා,**
**ජම්බුදීපා ඉධාගතා-විනයං තෙ වාචයිංසු.**
**පිටකං තම්බ පණ්ණියා-නිකායෙ පඤ්ච වාචෙසුං,**
**සත්ත චෙව පකරණෙ-තතො අරිට්ඨොමෙධාවී**
**තිස්ස දත්තොච පණ්ඩිතො-විසාරදො කාලසුමනො,**
**ථෙරො ච දීඝනාමකො-දීඝසුමනොච පණ්ඩිතො.**

---

අරිට්ඨත්ථෙරාදීහි, අරිෂ්ඨස්ථවිරාදීන් විසින්; ආභතං, ගෙනඑනලද්දීය; තතො, ඉන්පසු; යාව අජ්ජතනා, අදදක්වා; තෙසං යෙව අන්තෙවාසික පරම්පරාභතාය, ඔවුන්ගේම අතවැසි පරම්පරාභතවූ; ආචරියපරම්පරාය, ආචාර්‍ය්‍ය පරම්පරාවෙන්; ආභතන්ති වෙදිතබ්බං, ගෙනඑනලද්දේ යයි දතයුත්තේය; පොරාණා ලක්දිව සිංහලාඨ කථාකාරක පුරාතනයෝ; යථා ආහු, මෙසේ කීහු;

තතො, ඉන්පසු; මහින්දො, මිහිඳුතෙර තෙමේද; ඉට්ටියො, ඉට්ඨියනම් තෙරතෙමේද; උත්තියො, උත්තියනම් තෙරතෙමේද; සම්බලොපිච, සම්බලනම් තෙරතෙමේද; පණ්ඩිතො භද්දනාමොච, පණ්ඩිතභද්‍රසාල නම් තෙරතෙමේද යන; මහාපඤ්ඤා, මහාපැනැති; නාගා, පව්තොකරන්නාවූ; (**"ආගුං පාපං න කරොන්තීති=නාගාසි"** විග්‍රහයි.) එතෙ, මේ තෙරහු; ජම්බුදීපා, දඹදිවින්; ඉධ, මෙහි; ආගතා, ආවාහු; තෙ, ඒ මහා සථවිරයෝ; තම්බපණ්ණියා, තාම්‍රපර්ණියෙහි; විනයපිටකං, විනයපිටකය; වාචයිංසු, කියවූහු;

පඤ්චනිකායෙ, (විනයාභිධර්ම දෙපිටකයහැර දීඝනිකායාදී) **පස්** වැදෑරුම් නිකාය; වාචෙසුං, කියෙවූවාහුය; සත්තචෙවපකරණෙ, (ධම්මසඞ්ගණී විභඞ්ගාදී). සත්වැදෑරුම් අභිධර්ම ප්‍රකරණයන්ද; (කථනය කර වූවාහුය යන අර්ථයි). තතො, ඉන්පසු; මෙධාවී, නුවනැතිවූ

(**"අසනිවිය සිලුච්චයෙ කිලෙසෙ මෙධති හිංසතීති=මෙධා, ඛිප්පං ගහණධාරණංට්ඨනවා මෙධා, පඤ්ඤා, සාඑතස්ස අත්ථීති මෙධාවීසි"** විග්‍රහයි).

අරිට්ඨො, අරිට්ඨතෙරතෙමේද; පණ්ඩිතො තිස්සදත්තො ච, පණ්ඩිත තිස්ස දත්ත තෙරතෙමේද; විසාරදොකාලසුමනො, විශාරදවූ හෙවත් නිර්භිතවූ කාලසුමනතෙරතෙමේද;

දීඝනාමකොථෙරොච, එනම් තෙරතෙමේද යන; පණ්ඩිතො, පණ්ඩිතවූ; දීඝසුමනොච, දීඝසුමනනම් තෙරතෙමේද;

**පුනදෙව කාලසුමනො-නාගත්ථෙරොච බුද්ධරක්ඛිතො,**
**තිස්සත්ථෙරොච මෙධාවී-දෙවත්ථෙරොච පණ්ඩිතො.**

**පුනරෙව සුමනොමෙධාවී-විනයෙච විසාරදො,**
**බහුස්සුතො චූළනාගො-ගජොව දුප්පධංසියො.**

**ධම්මපාලිතනාමොච-රොහණෙ සාධු පූජිතො,**
**තස්සසිස්සො මහාපඤ්ඤො-ඛෙමනාමො තිපෙටකො.**

**දීපෙතාරකරාජාව-පඤ්ඤාය අතිරොචථ,**
**උපතිස්සො ච මෙධාවී-ඵුස්සදෙවො මහාකවි.**

**පුනදෙවසුමනොමෙධාවී-පුප්ඵනාමො බහුස්සුතො,**
**මහාකවි මහාසීවො-පිටකෙ සබ්බත්ථකොවිදො.**

---

පුනදෙව, නැවත; කාලසුමනොච, කාලසුමනනම් තෙරතෙමේද; නාගත්ථෙරොච, නාගනම් තෙරතෙමේද; බුද්ධරක්ඛිතො, බුද්ධරක්ඛිත නම් තෙරතෙමේද; මෙධාවීතිස්සත්ථෙරොච, නැනැතිතිස්සතෙර තෙමේද; පණ්ඩිතො දෙවත්ථෙරොච, පණ්ඩිතවූ දෙවස්ථවිරතෙමේද;

පුනරෙව, නැවත; විනයෙ විසාරදො, විනයෙහි නොපැකිල පවත්නා ඥණයක් ඇති; මෙධාවීසුමනොච, පැනවත් සුමනනම්තෙර තෙමේද; දුප්පධංසියො ගජොවිය, නොමැඩියහැකි හස්තියෙක් වැනිවූ; බහුස්සුතො, බහුශ්‍රැතවූ; චූලනාගොච, චූලනාගනම් තෙරතෙමේද;

රොහණෙ, රුහුණුජනපදයෙහි; සාධුපූජිතො, යහපතැයි පුදනලද; ධම්මපාලිතනාමොච, ධම්මපාලිතනම් තෙරතෙමේද; තස්ස, ඒ තෙරහුගේ; සිස්සො, ශිෂ්‍ය වූ; මහාපඤ්ඤො, මහාපැනවත්; තිපෙටකො, ත්‍රිපිටකපර්‍ය්‍යාප්තිධරවූ; (**"තීනිපිටකානි ඡාගතානි අස්සාති තිපෙටකො සි"** විග්‍රහයි) **"තෙපිටකො"** යි කියයුත්තෙහි ඡන්දනුරක්‍ෂණය පිණිස **තිපෙටකොයි** කියනලදී; ඛෙමනාමො, ඛෙම නම් තෙරතෙම;

දීපෙ, සිංහලද්වීපයෙහි; තාරකරාජාව, තරුරද හෙවත් සඳමෙන්; (**"තාරකානංරාජා තාරකරාජාසි"** විග්‍රහයි) පඤ්ඤාය, ප්‍රඥවෙන්; අතිරොචථ, ඉතාමබොරළිදි හෙවත් බැබලීය; මෙධාවී, පැනවත්; උපතිස්සොච, උපතිස්ස නම් තෙරතෙමේද; මහාකවි, මහාකවිවූ; ඵුස්සදෙවො, ඵුස්සදෙවනම් තෙරතෙමේද.

පුනදෙව, නැවත; මෙධාවීසුමනො, ප්‍රඥවත්වූ සුමන නම් තෙර තෙමේද; බහුස්සුතො, බහුශ්‍රැතවූ; පුප්ඵනාමො, මහාපදුමනම් තෙර තෙමේද; මහාකවි, මහාකවිවූ; පිටකෙ, තෙවළාහි; සබ්බත්ථ, සැමතන්හි; කොවිදො, දක්‍ෂවූ; මහාසීවො, මහාසීවනම් තෙරතෙමේද;

පුනදෙව උපාලි මෙධාවී-විනයෙච විසාරදෙ,
මහානාගො මහාපඤ්ඤො-සද්ධම්මවංසකොවිදෙ.

පුනරෙව අභයො මෙධාවී-පිටකෙ සබ්බත්ථ කොවිදෙ,
තිස්සත්ථෙරො ච මෙධාවී-විනයෙච විසාරදෙ.

තස්සසිස්සො මහාපඤ්ඤො-පුප්ඵනාමො බහුස්සුතො,
සාසනං අනුරක්ඛන්තො-ජම්බුදීපෙ පතිට්ඨිතො.

චූලාභයො ච මෙධාවී-විනයෙච විසාරදෙ,
තිස්සත්ථෙරො ච මෙධාවී-සද්ධම්මවංස කොවිදෙ.

චූලදෙවොච මෙධාවී-විනයෙච විසාරදෙ,
සිවත්ථෙරොච මෙධාවී-විනයෙ සබ්බත්ථ කොවිදෙ.

---

පුනදෙව, නැවත; විනයෙ, විනයපිටකයෙහි; විසාරදෙ, විශාරදවූ; මෙධාවී, ඥානවත්වූ; උපාලිච, උපාලි නම් තෙරතෙමේද; සද්ධම්මවංසකොවිදෙ, සද්ධර්මපාලියෙහි දක්ෂවූ; මහාපඤ්ඤෙ; මහත් පැනැති; මහානාගො, එනම්තෙරතෙමේද;

පුනරෙව, නැවත; පිටකෙ, තුන්පිටකයෙහි; සබ්බත්ථකොවිදෙ, සැමතන්හිදක්ෂවූ; මෙධාවී, පැනවත්; අභයො, අභයනම්තෙරතෙමේද; විනයෙච විසාරදෙ, විනයෙහිද විශාරදවූ; මෙධාවී, නුවන ඇති, තිස්සත්ථෙරොච, තිස්සනම්තෙරතෙමේද;

තස්සසිස්සො, ඒ තෙරහුගේ ශිෂ්‍යවූ; මහාපඤ්ඤො, මහත්ප්‍රඥවත්වූ; බහුස්සුතො, බොහෝ ඇසූ පිරූ තැන්ඇති; පුප්ඵනාමො, සුමන නම්තෙරතෙමේද; සාසනං අනුරක්ඛන්තො, බුදුසසුනරකිනුයේ; ජම්බුදීපෙ පතිට්ඨිතො, ජම්බුද්වීපයෙහි පිහිටියේය;

(හෙවත් සුමනනම් ස්ථවිරතෙමේ එක්කාලයෙක්හි ලක්දිව බුදුසස්න පසුබස්නා කල්හි, දඹදිව්ගොස් ධර්මවිනය ඉගෙණ ශාසනය රකිනුයේ එහිම පිහිටියේය.)

විනයෙච විසාරදෙ, විනයෙහිද විසාරදවූ; මෙධාවී, ඥානවත්වූ; චූලාභයොච, චූලාභය නම් තෙරතෙමේද; සද්ධම්මවංස කොවිදෙ, සදහම් පෙලෙහි දක්ෂවූ; මෙධාවී, නුවනැති; තිස්සත්ථෙරොච, තිස්සනම් තෙරතෙමේද;

විනයෙච විසාරදෙ, විනයෙහිද විශාරදවූ; මෙධාවී, ප්‍රඥවත්වූ; චූලදෙවොච, සුළුදෙව්තෙරතෙමේද; විනයෙ, විනයෙහි; සබ්බත්ථකොවිදෙ, සැමතන්හි දක්ෂවූ; මෙධාවී, ඥානයක් ඇති; සීවත්ථෙරොච, සීවස්ථවිරතෙමේද;

**එතෙ නාගා මහාපඤ්ඤා-විනයඤ්ඤූ මග්ගකොවිදා,**
**විනයං දීපෙ පකාසෙසුං-පිටකං තම්බපණ්ණියා-ති.**

තත්‍රායං ආනුපුබ්බිකථා: **මොග්ගලිපුත්තතිස්සත්ථෙරො** කිර ඉමං තතිය ධම්ම සඞ්ගීතිං කත්වා එවං චින්තෙසි: කත්ථ නු ඛො අනාගතෙ සාසනං සුප්පතිට්ඨිතං භවෙය්‍යාති. අථස්ස උපපරික්ඛතො එතද හොසි: **පච්චන්තිමෙසු ඛො ජනපදෙසු සාසනං සුප්පතිට්ඨිතං භවිස්සතීති.** සො තෙසං තෙසං භික්ඛූනං භාරං කත්වා තෙ තෙ භික්ඛූ තත්ථ තත්ථ පෙසෙසි.

**මජ්ඣන්තිකත්ථෙරං** කස්මීරගන්ධාර රට්ඨං පෙසෙසි: ත්වං එතං රට්ඨං ගන්ත්වා එත්ථ සාසනං පතිට්ඨාපෙහී" ති. **මහාදෙවත්ථෙරං** තථෙව වත්වා මහිංසකමණ්ඩලං පෙසෙසි. **රක්ඛිතත්ථෙරං** වනවාසිං, **යොනකධම්මරක්ඛිතත්ථෙරං** අපරන්තකං, **මහාධම්මරක්ඛිතත්ථෙරං** මහාරට්ඨං, **මහාරක්ඛිතත්ථෙරං** යොනකලොකං,

---

නාගා, පව්තෝකරන්නාවූ; මහාපඤ්ඤා, මහත්ප්‍රඥාවත්වූ; විනයඤ්ඤූ, විනයදත්; මග්ගකොවිදා, ස්වර්ගමෝක්ෂමාර්ගදෙක්හි දක්‍ෂවූ; එතෙ, මේ ස්ථවිරයෝ; තම්බපණ්ණියාදීපෙ, තාම්‍රපර්ණිද්වයිනෙහි; විනයපිටකං, විනයපිටකය; පකාසෙසුන්ති, ප්‍රකාශකලෝයයි;

තත්‍ර, එහි; අයංආනුපුබ්බිකථා, මේ පිළිවෙළ කථාවයි; මොග්ගලිපුත්තතිස්සත්ථෙරොකිර, මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරතෙමේ වනාහි; ඉමං තතිය ධම්මසඞ්ගීතිං කත්වා, මේ තුන්වන ධර්‍මසඞ්ගායනාවකොට; අනාගතෙ, අනාගතයෙහි; සාසනං, සස්න; සුප්පතිට්ඨිතං, මනාව පිහිටීම; කත්ථනුඛොභවෙය්‍යාති, කොතැන්හි වන්නේදැයි; එවං චින්තෙසි, මෙසේසිතී; අථ, ඉක්බිති; උපපරික්ඛතො අස්ස, පරීක්‍ෂාකරන්නාවූ මේ තෙරහට; පච්චන්තිමෙසු ඛො ජනපදෙසු, ප්‍රත්‍යන්තජනපදයන්හි; සාසනං, සස්න; සුප්පතිට්ඨිතං භවිස්සතීති, මනාව පිහිටීම වන්නේයයි; එතදහොසි මෙබඳුසිතෙක් වී; සො, හෙතෙම; තෙසං තෙසං භික්ඛූනං භාරං කත්වා, ඒ ඒ භික්‍ෂූන්ට (ශාසනය) භාර කොට; (ප්‍රතිබද්ධකොට යන අර්‍ථයි) තෙතෙ භික්ඛූ, ඒ ඒ භික්‍ෂූහු; තත්ථ තත්ථ පෙසෙසි, ඒ ඒ තන්හි යැවූයේය;

මජ්ඣන්තිකත්ථෙරං, මජ්ඣන්තිකනම්තෙරහු; ත්වං, තෝ; එතං රට්ඨං ගන්ත්වා, මේ රටටගොස්; එත්ථසාසනං පතිට්ඨාපෙහිති, මෙහි සස්න පිහිටුවයි කියා; කස්මීරගන්ධාරරට්ඨං පෙසෙසි, කාශ්මීර ගන්ධාර රටටයැවී; මහාදෙවත්ථෙරං, මහාදෙවනම් තෙරහු; තථෙවවත්වා, එසේම කියා; මහිංසකමණ්ඩලං පෙසෙසි, මහිංසකමණ්ඩලයට යැවී; (මහිංසක රටනම් අන්ධරටයයි කියත්.) රක්ඛිතත්ථෙරං, රක්ඛිතනම් තෙරහු; වනවාසිං වනවාසි නම් රටටද; යොනකධම්මරක්ඛිතත්ථෙරං, යොනක ධර්‍මරක්‍ෂිත ස්ථවිරහු; අපරන්තකං, අපරන්තකනම් රටටද; මහාධම්මරක්ඛිතත්ථෙරං මහාධම්මරක්ඛිත නම් තෙරහු; මහාරට්ඨං, මහරටටද; මහාරක්ඛිතත්ථෙරං, මහාරක්ඛිත නම්තෙරහු; යොනකලොකං,

**මජ්ඣිමත්ථෙරං** හිමවන්තපදෙසභාගං, **සොණකත්ථෙරඤ්ච උත්තරත්ථෙරඤ්ච** සුවණ්ණභූමිං, අත්තනො සද්ධිවිහාරිකං **මහින්දත්ථෙරං ඉට්ඨියත්ථෙරෙන උත්තියත්ථෙරෙන සම්බලත්ථෙරෙන භද්දසාලත්ථෙරෙන** ච සද්ධිං තම්බපණ්ණිදීපං පෙසෙසි: "තුම්හෙ තම්බපණ්ණිදීපං ගන්ත්වා එත්ථ සාසනං පතිට්ඨාපෙථා"ති. සබ්බෙපි තං තං දිසාභාගං ගච්ඡන්තා අත්තපඤ්චමා අගමංසු–පච්චන්තිමෙසු ජනපදෙසු පඤ්චවග්ගො ගණො අලං උපසම්පදකම්මායාති මඤ්ඤමානා. තෙන ඛො පන සමයෙන කස්මීරගන්ධාරරට්ඨෙ සස්සපාකසමයෙ **අරවාළො** නාම නාගරාජා කරකවස්සං නාම වස්සං වස්සාපෙත්වා සස්සං හරාපෙත්වා මහාසමුද්දං පාපෙති.

---

එනම් රටටද; මජ්ඣිමත්ථෙරං, මධ්‍යම නම්තෙරහු; හිමවන්තපදෙසභාගං, හිමවත්ප්‍රදෙශභාගයටද; සොණකත්ථෙරඤ්ච, සොණකනම් තෙරද; උත්තරත්ථෙරඤ්ච, උත්තර නම් තෙරද; සුවණ්ණභූමිං, සුවර්ණභූමියටද; අත්තනොසද්ධිවිහාරිකමහින්දත්ථෙරං තමාගේ සද්ධිවිහාරික මිහිඳුතෙර; ඉට්ඨියත්ථෙරෙන, ඉට්ඨියස්ථවිරයන්ද; උත්තියත්ථෙරෙන, උත්තියස්ථවිරයන්ද; සම්බලත්ථෙරෙන, සම්බලස්ථවිරයන්ද; භද්දසාලත්ථෙරෙනචසද්ධිං, භද්දසාලස්ථවිරයන්ද සමග; තුම්හෙ, තෙපි; තම්බපණ්ණිදීපං ගන්ත්වා, තාම්‍රපර්ණිදිවයිනට ගොස්; එත්ථ සාසනං පතිට්ඨාපෙථාති, මෙහි සසුනපිහිටවව්යයි කියා; තම්බපණ්ණිදීපං පෙසෙසි, තාම්‍රපාර්ණිදිවයිනට යැවී සබ්බෙපි, සියල් ලෝම; තං තං දිසාභාගං, ඒ ඒ දිශාභාගයට; ගච්ඡන්තා, යනුවෝ; පච්චන්තිමෙසු ජනපදෙසු. ප්‍රත්‍යන්ත ජනපදයන්හි; පඤ්චවග්ගො ගණො, පඤ්චවර්ගීගණයතෙමේ; උපසම්පදකම්මාය, උපසම්පන්නකර්මයට; අලන්ති. සුදුසුයයි; මඤ්ඤමානා, සිතනුවෝ; අත්ත පඤ්චමා, තමාපස්වෙනිකොට ඇතිව.(**"අත්තා පඤ්චමො එතෙසන්ති= අත්තපඤ්චමා"**යි විග්‍රහයි.) අගමංසු, ගියාහුය;

(දූත් ඒ ඒ තන්හි ගියාවූ තෙරුන්ගේ කෘත්‍යානුභාවය දක්වනු කැමතිව මජ්ඣන්තිකස්ථවිරයන් ගියතන්හි කෘත්‍යය පළමුකොට දක්වනුයේ "**තෙන ඛො පන සමයෙන කස්මීරගන්ධාරරට්ඨෙ**"යි ආදි කියේ.)

තෙනඛො පන සමයෙන, එසමයෙහි වනාහි; කස්මීරගන්ධාර රට්ඨෙ, කාශ්මීරගන්ධාර රට; සස්සපාකසමයෙ, ශස්‍යපාකසමයෙහි; අරවාළො නාම නාගරාජා අරවාළනම් නාරදතෙමේ; කරකවස්සං නාම වස්සං වස්සාපෙත්වා, හිමපාතනක නම් වැස්සක් වස්වා; සස්සං, ශස්‍යය; හරාපෙත්වා, ජලෞඝයෙන් පහකරවා; මහාසමුද්දං පාපෙති, මහමුහුදට පමුණුවයි;

**මජ්ඣන්තිකත්ථෙරො** පන පාටලිපුත්තතො වෙහාසං අබ්භුග්ගන්ත්වා හිමවති අරවාළදහස්ස උපරි ඔතරිත්වා අරවාළදහපිට්ඨියං චඞ්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති. නාගමාණවකා තං දිස්වා අරවාළස්ස නාගරාජස්ස ආරොචෙසුං: මහාරාජ එකො ඡින්නභින්නපටධරො භණ්ඩුකාසාවවසනො අම්හාකං උදකං දූසෙතීති.

නාගරාජා තාවදෙව කොධාභිභූතො නික්ඛමිත්වා ථෙරං දිස්වා මක්ඛං අසහමානො අන්තලික්ඛෙ අනෙකානි භිංසනකානි නිම්මිනි: තතො තතො භුසං වාතා වායන්ති, රුක්ඛා භිජ්ජන්ති, පබ්බතකූටානි පතන්ති, මෙඝා ගජ්ජන්ති, විජ්ජුලතා නිච්ඡරන්ති, අසනියො ඵලන්ති, භින්නං විය ගගනං උදකං පග්ඝරති, භයානකරූපා නාගකුමාරා සන්නිපතන්ති,

---

මජ්ඣන්තිකත්ථෙරොපන, මජ්ඣන්තික ස්ථවිරතෙමේ වනාහි; පාටලිපුත්තතො වෙහාසං අබ්භුග්ගන්ත්වා, පැලළුප් නුවරින් අහසට පැනනැගී; හිමවති, හිමවතෙහි; අරවාළදහස්ස උපරි ඔතරිත්වා, අරවාළ විලමත්තෙහි බැස; අරවාළදහපිට්ඨියං, අරවාළවිල ජලපිටෙහි; චඞ්කමතිපි; **සක්මන්ද** කෙරේ; තිට්ඨතිපි, ගතිනිවර්තනයද කෙරේ; නිසීදතිපි, නිෂද්‍යාදකෙරේ; සෙය්‍යම්පිකප්පෙති, ශයනයද කෙරේ; නාගමාණවකා තං දිස්වා, නාගමාණවකයෝ ඔහු දැක අරවාළස්ස නාගරාජස්ස, අරවාළනාරදහට; ආරොචෙසුං, සැලකළාහුය; මහාරාජ, මහරද; එකො, එක්; ඡින්නභින්නපටධරො, සැතින් සිඳිනලද (රඳනින්) වර්ණවිකාරයට පැමිණෙනලද පටදරන්නාවූ; (**"සත්ථකෙන ඡින්නං රජනෙන භින්නං වණ්ණවිකාරමාපන්නං පටං ධාරෙතීති=ඡින්න භින්නපටධරො** නොහොත් **සත්ථකෙන ඡින්නානං ගිහිවත්ථ විසභාගානං කාසාවානං ධාරණතො ඡින්නභින්න** පටධරො"යි විග්‍රහයි.) භණ්ඩු, හිසමුඩුවූ; කාසාවවසනො, හැඳි කාෂායවස්ත්‍ර ඇති; එකො, එකෙක්; **අම්හාකං උදකං දූසෙතීති**, අපගේ ජලය දූෂ්‍යකෙරේ යයි; ආරොචෙසුං, සැළකළෝ;

නාගරාජා, නාරජතෙමේ; තාවදෙව, පළමුකොටම; කොධාභිභූතො, ක්‍රොධයෙන් මඩනාලද්දේ; නික්ඛමිත්වා, නික්ම; ථෙරංදිස්වා, තෙරහුදැක; මක්ඛංඅසහමානො,(තෙරහු නිසා තමාසිත්හි උපන් අනුන්ගේගුණමකු ලක්ෂණ) මක්ඛය ව්‍යපශමනය කොටගත නොහැකිවනුයේ; අන්ත ලික්ඛෙ, අහස්හි; අනෙකානිභිංසනකානි නිම්මිනි, නොයෙක් භෛරවාරම්මණයන් නිර්මිත කෙළේය. තතො, (ඒ දක්වනු පිණිස **"තතොතතොභුසංවාතාවායන්ති"**යි ආදි කීයේ) තතොතතො, ඒ ඒ දිශාවෙන්; භුසංවාතාවායන්ති, (රුක්සිඳිනට පර්වතකූට නිපතනයට සමර්ථවූ) බලවත් වායුහු හමත්; රුක්ඛාභිජ්ජන්ති, රුක් බිඳෙත්; පබ්බතකූටානිපතන්ති, පර්වතකූටයෝ පතිතවෙත්; මෙඝාගජ්ජන්ති, මෙඝගර්ජනාකෙරෙත්; විජ්ජුලතා නිච්ඡරන්ති, විදුලි පැතිරෙත්; අසනියොඵලන්ති, ඝෙනගර්ජනා කෙරෙත් (යයි කියනලදී;) ගගනං භින්නංවිය උදකං පග්ඝරති, අහස බිඳුනාක්මෙන් ජලය පතනයවේ; භයානකරූපානාගකුමාරාසන්නිපතන්ති, භයානක රූඇති

සයම්පි ධූමායති පජ්ජලති පහරණවුට්ඨියො විස්සජ්ජෙති, "කො අයං මුණ්ඩකො ඡින්නභින්නපටධරො"ති ආදීහි ඵරුසවචනෙහි ථෙරං සන්තජ්ජෙසි. "එථ ගණ්හථ බන්ධථ නිද්ධමථ ඉමං සමණ"න්ති නාගබලං ආණාපෙසි

ථෙරො සබ්බන්තං විහිංසනකං අත්තනො ඉද්ධිබලෙන පටිබාහෙත්වා නාගරාජානං ආහ:-

**"සදෙවකොපි චෙ ලොකො-ආගන්ත්වා තාසයෙ මමං,**
**න මෙ පටිබලො අස්ස-ජනෙතුං භයභෙරවං.**

**සචෙපි ත්වං මහිං සබ්බං-සසමුද්දං සපබ්බතං,**
**උක්ඛිපිත්වා මහානාග-ඛිපෙය්‍යාසි මමූපරි.**

**නෙව මෙ සක්කුණෙය්‍යාසි-ජනෙතුං භයභෙරවං,**
**අඤ්ඤදත්ථු තවෙවස්ස-විඝාතො උරගාධිපා"ති.**

---

නාකුමරුවෝ රුස්වෙත්; සයම්පි, තෙමේත්; ධූමායති, දුම්දේ; පජ්ජලති, දිලිසේ; පහරණවුට්ඨියො විස්සජ්ජෙති,(අනෙකප්‍රකාර) ආයුධ වර්ෂා විහිදුවයි; මුණ්ඩකො, මුඩුවූ; ඡින්නභින්නපටධරො, සුන්බුන් පටදර; අයං, මේතෙමේ; කොති, කවරෙක්දැයි; ආදීහිඵරුසවචනෙහි, මේ ආදි කෲර වචනයෙන්; ථෙරංසන්තජ්ජෙසි, තෙරහු තැති ගැන්වී; එථ, එව්; ඉමං සමණං, මෙමහණ; ගණ්හථ, ගනිව්; බන්ධථ, බඳිව්; නිද්ධමථ ඉති, ගෙන පහකරව්යයි; නාගබලංආණාපෙසි, නාගබලයට හෙවත් නාගපිරිසට අණකොළේයි;

ථෙරො සථවිර තෙමේ; තංසබ්බංවිහිංසනකං, නාරජහුගේ කායික වාචසික ප්‍රයොගයෙන් ජනිත භය නිමිතිවූ විප්‍රකාර ඒ සියල්ල; අත්තනොඉද්ධිබලෙන, පටිබාහෙත්වා, තමාගේ ඉදු බෙලෙන් පිළිබා හෙවත් සෘද්ධිබලයෙන් වලකා; නාගරාජානං, නාරදහට;

සදෙවකොපිලොකො, දෙවියන් සහිතවූ ලෝවැසිතෙමේ; ආගන්ත්වා, අවුත්; මමං, මා; තාසයෙචෙ, ත්‍රාසකෙරේනම්ද; මෙ, මට; භයභෙරවං ජනෙතුං, භය උපදවන අරමුණක් උපදවන්ට; පටිබලොන අස්ස, ප්‍රතිබල ඇතියෙක් නොවන්නේය.

මහානාග, මහානාගය; ත්වං, තෝ; සසමුද්දං, මුහුද සහිතවූ; සපබ්බතං, පර්වත සහිතවූ; සබ්බංමහිම්පි, සියළු පෘථිවිය නමුදු; උක්ඛිපිත්වා, ඔසවා; මමූපරි, මාගේ හිස මතුයෙහි; සචෙඛිපෙය්‍යාසි, ඉදින් හෙලන්නෙහි නමුදු;

මෙ, මට; භයභෙරවං ජනෙතුං, භයාරම්මණයක් දක්වන්ට; නෙවසක්කුණෙය්‍යාසි, නොමහැකිවන්නෙහිය;උරගාධිප, නාගාධිපතිය; තවෙව, තොටම; අඤ්ඤදත්ථු, ඒකාන්තයෙන්; විඝාතො අස්සාති, වෙහෙසෙක් වන්නේයයි; ආහ, කී.

එවං වුත්තෙ නාගරාජා විගතානුභාවො නිප්ඵලවායාමො දුක්ඛී දුම්මනො අහොසි. තං ථෙරො තඞ්ඛණානුරූපාය ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා තීසුච සරණෙසු පඤ්චසුච සීලෙසු පතිට්ඨාපෙසි සද්ධිං චතුරාසීතියා නාග සහස්සෙහි.

අඤ්ඤෙපි බහූ හිමවන්ත වාසිනො යක්ඛාච ගන්ධබ්බ කුම්භණ්ඩා ච ථෙරස්ස ධම්මකථං සුත්වා සරණෙසුච සීලෙසුච පතිට්ඨහිංසු. පඤ්චකොපි යක්ඛො සද්ධිං භරියාය යක්ඛිනියා පඤ්චහිච පුත්ත සතෙහි පඨමෙ ඵලෙ පතිට්ඨිතො. අථායස්මා **මජ්ඣන්තිකත්ථෙරො** සබ්බෙපි නාගයක්ඛරක්ඛසෙ ආමන්තෙත්වා එවමාහ:-

**"මා දානි කොධං ජනයිත්ථ-ඉතො උද්ධං යථාපුරෙ,**
**සස්සඝාතඤ්ච මාකත්ථ-සුඛකාමාහි පාණිනො**
**කරොථ මෙත්තං සත්තෙසු-වසන්තු මනුජා සුඛ"න්ති,**

---

එවංවුත්තෙ, මෙසේ කී කල්හි; නාගරාජා, නාරදතෙම; විගතානුභාවො, වෙසෙසින් පහවූ අනුභාව ඇතියේ; නිප්ඵලවායාමො, නිෂ්ඵලව්‍යායාම ඇත්තේ; දුක්ඛීදුම්මනොඅහොසි, දුක්දොම්නස් ඇති වූයේය; ථෙරො, ස්ථවිරතෙමේ; තං, ඒ නාරදහට; තංඛණානුරූපාය ධම්මියා කථාය, ඒ ක්ෂණයට අනුරූපවූ ධර්මකථාවෙන්; සන්දස්සෙත්වා, (දෘෂ්ටධාර්මිකසාම්පරායික) අර්ථයන් දක්වා හෙවත් මෙලොව පරලොව) වැඩ දක්වා; සමාදපෙත්වා, කුශල ධර්මයෙහි සමාදන් කරවා; සමුත්තෙජෙත්වා, එහි සිත තියුණු කරවා; සම්පහංසෙත්වා, එහි උත්සාහයෙන්ද විද්‍යමානගුණයෙන්ද සන්තොෂකරවා; චතුරාසීතියානාගසහස්සෙහි සද්ධිං, සුවාසූ දහසක් නාගයන් සමග; තීසුසරණෙසු ච, තිසරණයෙහිද; පඤ්චසුසීලෙසු ච, පඤ්චශීලයෙහිද; පතිට්ඨාපෙසි, පිහිටවී;

අඤ්ඤෙපි බහූහිමවන්තවාසිනො, අනිකුදු බොහෝ හිමවත් වාසිවූ; යක්ඛාච, යක්ෂයෝද; ගන්ධබ්බකුම්භණ්ඩාච, ගාන්ධර්ව කුම්භාණ්ඩයෝද; ථෙරස්සධම්මකථං සුත්වා, තෙරහුගේ දහම්කථාව අසා; සරණෙසුච සීලෙසුච පතිට්ඨහිංසු, සරණයෙහිද සීලයෙහිද පිහිටියෝය; පඤ්චකොපියක්ඛො, පඤ්චකනම් යක්ෂතෙමේද; භරියායයක්ඛිනියා, භාර්‍ය්‍යාවූ යකින්නියද; පඤ්චහිච පුත්තසතෙහි සද්ධිං, පන්සියයක් පුතුන්ද සමග; පඨමෙඵලෙ පතිට්ඨිතො ප්‍රථම ඵලයෙහි පිහිටියේය; (තෙරහු විසින් කරණලද නාගානු ශාසනය දක්වනුයේ **අථායස්මාති** ආදිකී) අථ, ඉක්බිති; ආයස්මා මජ්ඣන්තිකත්ථෙරො, ආයුෂ්මත් මජ්ඣන්තික ස්ථවිරතෙමේ; සබ්බෙපිනාගයක්ඛරක්ඛසෙ, සියලු නාගයක්ෂරාක්ෂසයන්; ආමන්තෙත්වා, අභිමුඛයට කැඳවා; එවමාහ, මෙසේකී.

ඉතොඋද්ධං, මෙයින්මතු (අනාගතකාලයෙහි) යථාපුරෙ, පෙර (ධර්මශ්‍රවණොත්පත්ති විරහිතකාලයෙහි පරහට) යම්සේ (ක්‍රොධ උපද වූයේද,) එසේ; ඉදානි, දැන්; කොධං. ක්‍රොධයක්; මාජනයිත්ථ, නූපදවව්;

තෙ සබ්බෙපි "සාධු භන්තෙ"ති ථෙරස්ස පටිස්සුණිත්වා යථානුසිට්ඨං පටිපජ්ජිංසු. තංදිවසමෙව ච නාගරාජස්ස පූජා සමයො හොති. අථ නාගරාජා අත්තනො රතනමයං පල්ලඞ්කං ආහරාපෙත්වා ථෙරස්ස පඤ්ඤපෙසි. නිසීදි ථෙරො පල්ලඞ්කෙ.

නාගරාජා පි ථෙරං බීජයමානො සමීපෙ අට්ඨාසි. තස්මිං ඛණෙ කස්මීර ගන්ධාරරට්ඨ වාසිනො ආගන්ත්වා ථෙරං දිස්වා "අම්හාකං නාගරාජතොපි ථෙරො මහිද්ධිකතරො"ති ථෙරමෙව වන්දිත්වා නිසින්නා. ථෙරො තෙසං **ආසිවිසොපම සුත්තන්තං** කථෙසි. සුත්තපරියොසානෙ අසීතියා පාණසහස්සානං ධම්මාභිසමයො අහොසි. කුලසතසහස්සඤ්ච පබ්බජි. තතොපභුති ච කස්මීර ගන්ධාරා යාව අජ්ජතනා කාසාව පජ්ජොතා ඉසිවාත පටිවාතා එව.

---

හි, යම් කාරණොපදෙශයකින්; පාණිනො, ප්‍රාණීහු; සුඛකාමා, සැපකැමැත්තාහුද; ඒ කාරණොපදෙශයෙන්; සස්සඝාතඤ්ච, (වැදූමව ගේද පුත්‍රසෙනහය සිඳීන සියල්ලට විනාශමූලිකවූ) ශස්‍යඝාතනයද; මාකත්ථ, නොකරව්; සත්තෙසු, සත්ත්වයන්කෙරෙහි; මෙත්තංකරොථ, මෙත් කරව්; මනුජා, මනුෂ්‍යයෝ; සුඛං, සැපසේ; වසන්තුති, වාසය කරණසේක්වායි;

• තෙසබ්බෙපි ඒ සියල්ලෝද; සාධුභන්තෙති යහපතවහන්සැයි කියා; ථෙරස්ස පටිස්සුණිත්වා, තෙරහුගේ වචනය ශ්‍රවණයකොට; යථානු සිට්ඨං, (තෙරහු විසින් දෙනලද) අවවාදය නොඉක්මවා; පටිපජ්ජිංසු, පිළිපැද්දෝ; ("**යංයං අනුසිට්ඨං යථානුසිට්ඨං අනුසිට්ඨමනතික්කම්ම වා යථානුසිට්ඨං**"යි විග්‍රහයි.) තංදිවසමෙව, එදවස්හිමද; නාගරාජස්ස පූජාසමයොහොති, නාරදහුගේ පූජාකාලය වේ; අථ, නැවත; නාගරාජා නාරදතෙම; අත්තනො, තමාගේ; රතනමයපල්ලඞ්කං, රුවන්මුවා පලඟ; ආහරාපෙත්වා, ගෙන්වා; ථෙරස්ස, තෙරහට; පඤ්ඤපෙසි, පැනවි; ථෙරො, සථවිරතෙමේ; පල්ලඞ්කෙ, පය්‍ය්ඞ්කයෙහි; නිසීදි; හුනි;

නාගරාජාපි, නාරදතෙමේද; ථෙරං බීජයමානො, තෙරහට විජිනි සලමින්; සමීපෙ අට්ඨාසි, වෙත සිටියේය; තස්මිංඛණෙ, එකෙණෙහිම; කස්මීරගන්ධාරරට්ඨවාසිනො, කාශ්මීරගන්ධාර රටවැසියෝ; ආගන්ත්වා අවුත්;ථෙරංදිස්වා, තෙරහුදුක; අම්හාකං නාගරාජතොපි, අපගේ නාරද ටවඩා; (අපියනු සම්භාවනායෙයිය;) ථෙරො, සථවිරතෙමේ; මහිද්ධිකත රොති, අතිශයින් මහත් සෘද්ධි ඇත්තේයයි; ථෙරමෙව වන්දිත්වා, තෙරහටම වැඳ; නිසින්නා, හුන්නාහුය; ථෙරො, සථවිරතෙමේ; තෙසං, ඔවුන්ට; ආසිවිසොපම සුත්තන්තං කථෙසි, ආශිවිෂොපම සූත්‍රාන්තය වදාළේය; සුත්තමෙව සුත්තන්තංයි ගන්නේයි)සුත්තපරියො සානෙ, සූත්‍රය කෙළවර; අසීතියාපාණ සහස්සානං, අසූදහසක් ප්‍රාණී න්ට; ධම්මාභිසමයො අහොසි, ධර්මාභි සමයවූයේය; කුලසතසහස්සඤ්ච

**ගන්ත්වා කස්මීර ගන්ධාරං-ඉසිමජ්ඣන්තිකො තදා,**
**රුට්ඨං නාගං පසාදෙත්වා-මොචෙසි බන්ධනා බහූ-ති.**

**මහාදෙවත්ථෙරොපි** මහිංසකමණ්ඩලං ගන්ත්වා **දෙවදූතසුත්තං** කථෙසි. සුත්තපරියොසානෙ චත්තාළීසපාණසහස්සානි ධම්මචක්ඛුං පටිලභිංසු, චත්තාළීසංයෙව පාණසහස්සානි පබ්බජිංසු.

**ගන්ත්වාන රට්ඨං මහිංසං-මහාදෙවො මහිද්ධිකො,**
**චොදෙත්වා දෙවදූතෙහි-මොචෙසි බන්ධනා බහූ-ති.**

**රක්ඛිතත්ථෙරො** වනවාසිං ගන්ත්වා ආකාසෙ ඨත්වා අනමතග්ග පරියාය කථාය වනවාසිකෙ පසාදෙසි. කථාපරියොසානෙ ජනස්ස

---

පුරුෂයන්ගෙන් සියදහසක්ද පබ්බජි, පැවිදිවූයේය; තතොප්පභුතිච, එතැන්පටන්ද; කස්මීරගන්ධාරා, කාශ්මීරගන්ධාර රටවැසියෝ යාව අජ්ජතනා, අද දක්වා; කාසාවපජ්ජොතා, (භික්ෂූන්ගේ හඳනා පෙරොණා කසාවත්හි ආලොකයෙන්; ඉසිවාත පටිවාතාඑව, භික්ෂූන්ගේ හඳනා පොරොණා) සිවුරු පවතින්ද, (හස්ත පාදයන්ගේ) සම්මිඤ්ජන ප්‍රසාරණාදී පවතින්ද හාත්පසින් විජිනිසලන ලද්දාහුවෙත්

මජ්ඣන්තිකො ඉසි, මජ්ඣන්තික ඍෂිතෙමේ; කස්මීර ගන්ධාරං ගන්ත්වා, කාශ්මීර ගන්ධාරයටගොස්; තදා, එකල්හි; රුට්ඨං නාගං පසාදෙත්වා, කිපි නාගයා පහදවා; බහූ, බොහෝවූදෙන; බන්ධනා, භවබන්ධනයෙන්; මොචෙසීති, මිදවූයේයයි;

මහාදෙවත්ථෙරොපි, මහාදෙව ස්ථවිරතෙමේද; මහිංසකමණ්ඩලං ගන්ත්වා, මහිංසකමණ්ඩලයට ගොස්; දෙවදූතසුත්තං කථෙසි, දෙවදූත සූත්‍රය දෙශනාකොළේය; සුත්තපරියොසානෙ. සූත්‍රය කෙළවර; චත්තාළීස පාණසහස්සානි, සතළිස් දහසක් ප්‍රාණීහු; ධම්මචක්ඛුං පටිලභිංසු, යට මාර්ගත්‍රයෙහි ඥානය පිළිලැබූහු චත්තාළීසංයෙව, පාණසහස්සානි, සතළිස් දහසක්ම ප්‍රාණීහු; පබ්බජිංසු, පැවිදිවූහු.

මහිද්ධිකො මහාදෙවො, මහත් ඍද්ධිඇති; මහාදෙව ස්ථවිර තෙමෙ; මහිංසංරට්ඨං ගන්ත්වා, මහිංසකමණ්ඩලනම් රටටගොස්; දෙවදූතෙහි චොදිත්වා, දෙවදූතයන්ලවා චෝදනාකරවා; බහූ, බොහෝවූදෙන; බන්ධනා, සංසාර බන්ධනයෙන්; මොචෙසීති, මිදූයේයි;

රක්ඛිතත්ථෙරොච,රක්ෂිතස්ථවිරතෙමේද;වනවාසිං ගන්ත්වා,වනවාසීනම් රටටගොස්; ආකාසෙ ඨත්වා,අහසැසිට; අනමතග්ගපරියායකථාය, අනමතග්ග සංයුත්ත පරියාය කථාවෙන්;වනවාසිකෙ පසාදෙසි, වනවාසි රට වැසියන් පැහැදවී; අස්සඋන්වහන්සේගේ; කථාපරියොසානෙජන,

සට්ඨිසහස්සානං ධම්මාභිසමයො අහොසි. සත්තතිංසසහස්සමත්තා පබ්බජිංසු. පඤ්චවිහාරසතානි පතිට්ඨහිංසු. එවං සො තත්ථ සාසනං පතිට්ඨාපෙසි.

**ගන්ත්වාන රක්ඛිතත්ථෙරො–වනවාසිං මහිද්ධිකො,**
**අන්තලික්ඛෙ ඨිතො තත්ථ–දෙසෙසි අනමතග්ගියන්ති.**

යොනකධම්මරක්ඛිතත්ථෙරොපි අපරන්තකං ගන්ත්වා අග්ගික්ඛන්ධූපමසුත්තන්තකථාය අපරන්තකෙ පසාදෙත්වා සත්තතිංසපාණසහස්සානි ධම්මාමතං පායෙසි. ඛත්තියකුලතො යෙව පුරිසසහස්සං පබ්බජි, සමධිකානිච ඡ ඉත්ථිසහස්සානි. එවං සො තත්ථ සාසනං පතිට්ඨාපෙසි.

**අපරන්තං විගාහිත්වා–යොනකො ධම්මරක්ඛිතො,**
**අග්ගික්ඛන්ධූපමෙනෙත්ථ–පසාදෙසි ජනෙ බහූති.**

---

කථාපිරියෙනැ වනාහි; සට්ඨිසහස්සානං ධම්මාභිසමයො අහොසි, සැටදහසකට ධර්මාභිසමයවූයේය; සත්තතිංස සහස්සමත්තා, සත්තිස් දහසක් පමණ; පබ්බජිංසු, පැවිදිවූහු; පඤ්චවිහාරසතානි පතිට්ඨහිංසු, පන්සියයක් විහාර පිහිටියාහුය; එවං, මේ ප්‍රකාරයෙන්; සො, හෙතෙමේ; තත්ථ, එහි; සාසනං පතිට්ඨාපෙසි, සසුන පිහිටවී;

මහිද්ධිකො, රක්ඛිතත්ථෙරො, මහත් සෘද්ධිඇති රක්ඛිත ස්ථවිර තෙමේ; වනවාසිං ගන්ත්වා, වනවාසීනම් රටටගොස්; තත්ථ, එහි; අන්තලික්ඛෙ ඨිතො, අහසසිටියේ; අනමතග්ගියං දෙසෙසීති, අනමතග්ග සංයුත්තකය දෙසුයේයයි;

යොනකධම්මරක්ඛිතත්ථෙරොපි, යොනකධර්මරක්ෂිත ස්ථවිර තෙමේද; අපරන්තකං ගන්ත්වා, එනම් ජනපදයටගොස්; අග්ගික්ඛන්ධූපම සුත්තන්ත කථාය, අග්ගික්ඛන්ධූපම සූත්‍රාන්තකථාවෙන්; අපරන්තකෙ පසාදෙත්වා, අපරන්තක රටවාසීන් පහදවා; සත්තතිංසපාණසහස්සානි, සත්තිස් දහසක් ප්‍රාණීන් ලවා; ධම්මාමතං පායෙසි, ධර්මාමෘතය පානය කරවූයේය; (ලොකොත්තර ධර්මාමෘත පානය ප්‍රතිලාභ කරණ වශයෙන් පෙවූයේය යන අර්ථයි;) ඛත්තියකුලතොයෙව, කැත්කුලයෙන්ම; ඡ ඉත්ථි සහස්සානි සමධිකානි, ස්ත්‍රීන් හයදහසක් අධික කොට ඇති; පුරිසසහස්සංච, පුරුෂයන් දහසක්ද පබ්බජි, පැවිදිවිය; එවං, මේ ප්‍රකාරයෙන්; සො, හෙතෙමේ; තත්ථ, එහි; සාසනං පතිට්ඨාපෙසි, සසුන පිහිටවී;

යොනකධම්මරක්ඛිතො, යොනකධර්මරක්ෂිත ස්ථවිරතෙමේ; අපරන්තං විගාහිත්වා, අපරන්ත ජනපදයටගොස්; එත්ථ, මෙහි; බහූජනෙ, බොහෝ ජනයන්; අග්ගික්ඛන්ධූපමෙන, අග්ගික්ඛන්ධූපම සූත්‍රයෙන්; පසාදෙසීති, පැහැද වූයේයයි;

**මහාධම්මරක්ඛිතත්ථෙරොපන මහාරට්ඨං ගන්ත්වා මහානාරද කස්සපජාතකකථාය මහාරට්ඨකෙ පසාදෙත්වා චතුරසීතිපාණ සහස්සානි මග්ගඵලෙසු පතිට්ඨාපෙසි. තෙරස සහස්සානි පබ්බජිංසු. එවං සො තත්ථ සාසනං පතිට්ඨාපෙසි.**

**මහාරට්ඨං ඉසි ගන්ත්වා-සො මහාධම්මරක්ඛිතො,**
**ජාතකං කථයිත්වාන-පසාදෙසි මහාජනන්ති.**

**මහාරක්ඛිතත්ථෙරොපි යොනකරට්ඨං ගන්ත්වා කාලකාරාම සුත්තන්තකථාය යොනකලොකං පසාදෙත්වා සත්තතිංසසහස්සාධිකස්ස පාණසහස්සස්ස මග්ගඵලාලඞ්කාරං අදාසි. සන්තිකෙ චස්ස දසසහස්සානි පබ්බජිංසු. එවං සොපි තත්ථ සාසනං පතිට්ඨාපෙසි.**

**යොනරට්ඨං තදා ගන්ත්වා-සො මහාරක්ඛිතො ඉසි,**
**කාලකාරාම සුත්තන්ත-තෙ පසාදෙසි යොනකෙති**

---

මහාධම්මරක්ඛිතත්ථෙරොපන, මහාධර්මරක්ෂිත ස්ථවිරතෙමේ වනාහි; මහාරට්ඨං ගන්ත්වා, මහරටටගොස්; මහානාරද කස්සප ජාතකකථාය, මහානාරද කාශ්‍යපජාතක කථාවෙන්; මහාරට්ඨකෙපසාදෙත්වා, මහරටවැසියන් පහදවා; චතුරසීතිපාණසහස්සානි, සුවාසූදහසක් ප්‍රාණීන්; මග්ගඵලෙසු, මාර්ගඵලයන්හි; පතිට්ඨාපෙසි, පිහිටවූයේය; තෙරස සහස්සානි පබ්බජිංසු. තෙළෙස් දහසක් පැවිදිවූහු; එවං, මෙසේ; සො, හෙතෙමේ; තත්ථ, එහි; සාසනං පතිට්ඨාපෙසි, සස්න පිහිටවූයේය;

ඉසි, (ශීලස්කන්ධාදි ධර්මස්කන්ධයන්) ගවේෂණය කළාවූ; සො මහාධම්මරක්ඛිතො, ඒ මහාධර්මරක්ෂිත ස්ථවිරතෙමේ; මහාරට්ඨං ගන්ත්වා, මහරටට ගොස්; ජාතකං කථයිත්වාන, මහානාරද කාශ්‍යපජාතකය කියා; මහාජනං පසාදෙසීති, මහජනයා පැහැදවූයේයයි;

මහාරක්ඛිතත්ථෙරොපි, මහාරක්ෂිත ස්ථවිරතෙමේද; යොනකරට්ඨං ගන්ත්වා, යොන්රටට ගොස්; කාලකාරාමසුත්තන්තකථාය, කාලකාරාම සූත්‍රාන්තකථාවෙන්; යොනකලොකං පසාදෙත්වා, යොන්රට වැසියන් පහදවා; සත්තතිංසසහස්සාධිකස්ස පාණසතසහස්සස්ස, සත්තිස්දහසක් අධිකකොට ඇති ප්‍රාණීන් සියක්දහසකට; මග්ගඵලාලඞ්කාරං අදාසි, මාර්ගඵලාලඞ්කාරය දුනී; අස්සසන්තිකෙච, මේ තෙරනුවෙතද; දසසහස්සානිපබ්බජිංසු, දසදහසක් පැවිදිවූහු; එවං, මේ ප්‍රකාරයෙන්; සොපි, හෙතෙමේද; තත්ථ, එහි; සාසනං පතිට්ඨාපෙසි, සසුන පිහිටවූයේය;

සො මහාරක්ඛිතො ඉසි, ඒ මහාරක්ෂිත නම් ඍෂිතෙම; යොනක රට්ඨංගන්ත්වා, යොන්රටට ගොස්; තදා, එකල්හි; කාලකාරාම සුත්තන්ත, කාලකාරාම සූත්‍රයෙන්; තෙ යොනකෙ පසාදෙසීති, ඒ යොනකයන් පැහැදවීයයි;

මජ්ඣිමත්ථෙරො පන කස්සපගොත්තත්ථෙරෙන අලකදෙවත්ථෙරෙන දුන්දුභිස්සරත්ථෙරෙන මහාදෙවත්ථෙරෙන ච සද්ධිං හිමවන්තපදෙසභාගං ගන්ත්වා ධම්මචක්කප්පවත්තනසුත්තන්තකථාය තං දෙසං පසාදෙත්වා අසීතිපාණකොටියො මග්ගඵලරතනානි පටිලාභෙසි. පඤ්චපි ච තෙ ථෙරා පඤ්චරට්ඨානි පසාදෙසුං. එකමෙකස්ස සන්තිකෙ සතසහස්සමත්තා පබ්බජිංසු. එවං තෙ තත්ථ සාසනං පතිට්ඨාපෙසුං.

**ගන්ත්වාන මජ්ඣිමත්ථෙරො-හිමවන්තං පසාදයි,**
**යක්ඛසෙනං පකාසෙන්තො-ධම්මචක්කප්පවත්තනන්ති.**

සොණත්ථෙරොපි සද්ධිං උත්තරත්ථෙරෙන සුවණ්ණභූමිං අගමාසි. තෙන ච සමයෙන තත්ථ එකා රක්ඛසී සමුද්දතො නික්ඛමිත්වා රාජකුලෙ ජාතෙ ජාතෙ දාරකෙ ඛාදති. තං දිවසමෙව ච රාජකුලෙ එකො දාරකො ජාතො හොති. මනුස්සා ථෙරං දිස්වා රක්ඛසානං

---

මජ්ඣිමත්ථෙරො පන, මධ්‍යම ස්ථවිරතෙම වනාහි; කස්සපගොත්තත්ථෙරෙන, කසුප්ගොත් තෙරද; අලකදෙවත්ථෙරෙන, අලකදෙව තෙරද; දුන්දුභිස්සරත්ථෙරෙන, එනම් තෙරද; මහාදෙවත්ථෙරෙන ච සද්ධිං, මහාදෙව තෙරද යන මේ තෙරුන් සමග; හිමවන්තපදෙසභාගං ගන්ත්වා, හිමවත් ප්‍රදෙශභාගයට ගොස්; **ධම්මචක්කප්පවත්තනසුත්තන්තකථාය,** දම්සක්පැවතුම් සූත්‍රාන්ත කථාවෙන්; තං දෙසං පසාදෙත්වා, ඒ දෙශවාසීන් පහදවා; අසීතිපාණකොටියො, අසූකෙළක් ප්‍රාණීන්ලවා; මග්ගඵලරතනානි, මාර්ගඵලරත්නයන්; පටිලාභෙසි, පිළිලැබවූයේය; තෙථෙරා පඤ්චපිච, ඒ තෙරහු පස්දෙනද; පඤ්චරට්ඨානි පසාදෙසුං, රටපසක් පැහැදවූහු; එකමෙකස්ස සන්තිකෙ, **එක් එක්** තෙරකෙනෙක් වෙත; සතසහස්සමත්තා, සියදහසක් පමණ; පබ්බජිංසු, පැවිදිවූවාහුය; එවං, මෙසේ; තෙ, ඒ තෙරහු; තත්ථ, එ තැන්හි; සාසනං පතිට්ඨාපෙසුං, සස්න පිහිටවූවාහුය;

මජ්ඣිමත්ථෙරො, මධ්‍යම ස්ථවිරතෙම; හිමවන්තං ගන්ත්වා, හිමවතට ගොස්; **ධම්මචක්කප්පවත්තනං** පකාසෙන්තො, දම්සක්පැවතුම් සූතුර ප්‍රකාශකරමින්; යක්ඛසෙනං පසාදයීති, යක්සෙනඟ පැහැදවූයේයයි;

සොණකත්ථෙරොපි, සොණක ස්ථවිරතෙමේද; උත්තරත්ථෙරෙන සද්ධිං, උත්තරස්ථවිරයන් සමග; සුවණ්ණභූමිං අගමාසි, ස්වර්ණභූමියට ගියේය; තෙනච සමයෙන, (ඔවුන්ගේ ගමනට පූර්වකාලයවූ එසමයෙහි; තත්ථ, එහි; එකාරක්ඛසී, එක් රකුසියක්; සමුද්දතො නික්ඛමිත්වා, මුහුදින් නික්ම; රාජකුලෙ, රදකුලයෙහි; ජාතෙ ජාතෙ දාරකෙ, උපන් උපන් දරුවන්; ඛාදති, කන්නීය; තං දිවසමෙව, එදවස්හිම; රාජකුලෙ, රදකුලයෙහි; එකො දාරකො, එක්දරුවෙක්තෙම; ජාතොහොති, උපන්නේවේ; මනුස්සං, මනුෂ්‍යයෝ; ථෙරං දිස්වා, තෙරහුදුක; රක්ඛසානං;

සහායකො එසොති මඤ්ඤමානා ආයුධානි ගහෙත්වා ථෙරං පහරිතුකාමා ආගච්ඡන්ති. ථෙරො කිං තුම්හෙ ආයුධහත්ථා ආගච්ඡථාති ආහ.

තෙ ආහංසු: රජකුලෙ ජාතෙ ජාතෙ දාරකෙ රක්ඛසා ඛාදන්ති, තෙසං තුම්හෙ සහායකාති. ථෙරො "න මයං රක්ඛසානං සහායකා, සමණා නාම මයං විරතා පාණාතිපාතා–පෙ–විරතා මජ්ජපානා එකභත්තිකා සීලවන්තො කල්‍යාණධම්මා"ති ආහ. තස්මිං යෙව ච ඛණෙ සා රක්ඛසී සපරිවාරා සමුද්දතො නික්ඛමි: රජකුලෙ දාරකො ජාතො තං ඛාදිස්සාමීති.

මනුස්සා තං දිස්වා "එසා භන්තෙ රක්ඛසී ආගච්ඡතී"ති භීතා විරවිංසු. ථෙරො රක්ඛසෙහි ද්විගුණෙ අත්තභාවෙ නිම්මිනිත්වා තෙහි අත්තභාවෙහි තං රක්ඛසිං සපරිසං මජ්ඣෙ කත්වා උභොසු පස්සෙසු

---

රකුසන්ගේ; එසො, මේතෙම; සහායකොති, යහළුවෙක්යයි; මඤ්ඤමානා, සිතනුවෝ; ආයුධානි ගහෙත්වා, ආයුධගෙන; ථෙරං පහරිතුකාමා ගච්ඡන්ති, තෙරහු පහරනුකැමතිව යෙත්; ථෙරො, ස්ථවිර තෙම; තුම්හෙ, තෙපි; ආයුධහත්ථා, ආයුධගත් අත්ඇතිව; කිං ආගච්ඡථාති, කුමකට එව්දූයි; ආහ, විචාළේය;

තෙ, ඒ මිනිස්සු; රජකුලෙ ජාතෙ ජාතෙ දාරකෙ. රදකුලයෙහි උපන් උපන් දරුවන්; රක්ඛසා, රකුසෝ; ඛාදන්ති, කත්; තුම්හෙ, තෙපි; තෙසං සහායකාති, ඔවුන්ගේ යහලුවෝදූයි; ආහංසු, විචාළෝ; ථෙරො, ස්ථවිරතෙමේ; මයං, අපි; රක්ඛසානං, රකුසන්ගේ; න සහායකා, යහළුවෝ නොවම්හ; පාණාතිපාතා විරතා, ප්‍රාණඝාතයෙන් වෙන්වූ; –පෙ–මජ්ජපානාවිරතා, මද්‍යපානයෙන් වෙන්වූ; එකභත්තිකා එක්වේලේබත් ඇත්තාවූ; සීලවන්තො, සිල්වත්වූ; කල්‍යාණධම්මා, කල්‍යාණධර්මයෙන් යුක්තවූ; මයං සමණානාමාති ආහ, අපි ශ්‍රමණයෝ නමැයි කීහ; තස්මිං යෙව ඛණෙ, එකෙණෙහිම; රජකුලෙ දාරකො ජාතො, රදකුලයෙහි දරුවෙක් උපන; තං ඛාදිස්සාමීති, ඔහු කන්නෙමියි; සාරක්ඛසී, ඒ රාක්ෂසීතොමෝ; සපරිවාරාසමුද්දතොනික්ඛමි, පිරිවර සහිතව මුහුදින් නික්මිණී;

මනුස්සා, මනුෂ්‍යයෝ; තං දිස්වා, ඇය දැක; භන්තෙ, වහන්ස; එසාරක්ඛසී, ආගච්ඡතීති, මේ රකුසිය එන්නීයයි; භීතා, භයින්; විරවිංසු, මොරගැසුවාහුය; ථෙරො, ස්ථවිරතෙමේ; රක්ඛසෙහි, රකුසන්ට වඩා; ද්විගුණෙ අත්තභාවෙ නිම්මිනිත්වා, දෙගුණවූ ආත්මභාවයන් මවා; තෙහි අත්තභාවෙහි, ඒ ආත්මභාවයන් කාරණකොටගෙණ; තං රක්ඛසිං, ඒ රකුසිය; සපරිසං මජ්ඣෙකත්වා, පිරිස් සහිතව මද්‍යයෙහි කොට; උභොසු පස්සෙසු, දෙපාශ්වයන්හි; පරික්ඛිපි, වටකෙළේය;

පරික්ඛිපි. තස්සා සපරිසාය එතදහොසි අද්ධා ඉමෙහි ඉදං ඨානං ලද්ධං භවිස්සති, මයං පන ඉමෙසං භක්ඛා භවිස්සාමාති. සබ්බ රක්ඛසා භීතා වෙගසා පලායිංසු.

ථෙරොපි තෙ යාව අදස්සනං තාව පලාපෙත්වා දීපස්ස සමන්ත තො ආරක්ඛං ඨපෙසි. තස්මිඤ්ච සමයෙ සන්නිපතිතං මහාජනකායං බ්‍රහ්මජාලසුත්තන්තකථාය පසාදෙත්වා සරණෙසුච සීලෙසුච පතිට්ඨා පෙසි.

සට්ඨිසහස්සානං පනෙත්ථ ධම්මාභිසමයො අහොසි. කුලදාරකානං අඩ්ඪුඩ්ඪානි සහස්සානි පබ්බජිංසු කුලධීතානං දියඩ්ඪසහස්සං. එවං සො තත්ථ සාසනං පතිට්ඨාපෙසි. තතොප්පභුති රාජකුලෙ ජාතදාර කානං සොණුත්තරනාම මෙව කරොන්ති.

**සුවණ්ණභූමිං ගන්ත්වාන-සොණුත්තරා මහිද්ධිකා,**
**පිසාචෙ නිද්ධමිත්වාන-බ්‍රහ්මජාලං අදෙසයුන්ති.**

---

සපරිසාය තස්සා, පිරිස් සහිත ඇයට; එතදහොසි, මෙබඳු සිතෙක්විය; අද්ධා, ඒකාන්තයෙන්; ඉමෙහි, මොවුන් විසින්; ඉදං ඨානං ලද්ධං භවිස්සති, මෙතන ලබනලද වන්නේය; මයං පන, අපි වනාහි; ඉමෙසං මොවුනට; භක්ඛාභවිස්සාමාති, ආහාරවන්නෙමුයයි; සබ්බරක්ඛසා, සියලු රාක්ෂසයෝ; භීතා, බියවූවාහු; වෙගසා පලායිංසු, වේගයෙන් දිවුහු;

ථෙරොපි, තෙරද; තෙ, ඔවුන්; යාව අදස්සනං, යම්තාක් නොපෙනේද; තාව පලාපෙත්වා, ඒතාක් පලවා; දීපස්ස, විපයට; සමන්තතො රක්ඛං ඨපෙසි, (මෙතැන් පටන් ප්‍රවිෂ්ටනොවෙත්වායයි අධිෂ්ඨාන වශයෙන්) හාත්පසින් ආරක්ෂා තැබී; තස්මිඤ්චසමයෙ, එකල්හිද; සන්නිපතිතං මහාජනකායං, රැස්වූ මහජන සමූහයා; බ්‍රහ්මජාලසුත්තන්තකථාය, බ්‍රහ්මජාල සූත්‍රාන්තකථාවෙන්; පසාදෙත්වා, පහදවා; සරණෙසුච සීලෙසුච පතිට්ඨාපෙසි, සරණයෙහිද ශීලයෙහිද පිහිටවී; එත්ථපන, මෙහි වනාහි; සට්ඨිසහස්සානං, සැටදහසකට; ධම්මාභිසමයො අහොසි, ධර්මාභිසමය වූයේය; කුලදාරකානං, කුලදරුවන් ගෙන්; අඩ්ඪුඩ්ඪානි සහස්සානි, තුන්දහස්පන්සියයක්ද; කුලධීතානං, කුලදූහිතෘන්ගෙන්; දියඩ්ඪසහස්සං, එක්දහස්පන්සියයක්ද; පබ්බජිංසු, පැවිදිවූහු; එවං, මෙසේ; සො, හෙතෙම; තත්ථ, එහි; සාසනං පතිට්ඨා පෙසි, සසුන පිහිටවී; තතොප්පභුති, එතැන්පටන්; රාජකුලෙ ජාතදාරකානං, රදකුලෙහි උපන් දරුවන්ට; සොණුත්තරනාමමෙව කරොන්ති, සොණුත්තර නමම යොරෙත්;

මහිද්ධිකා, මහත්සෘද්ධි ඇති; සොණුත්තරා, සොණද උත්තරද යන දෙදෙන ("සොණොච උත්තරොච සොණුත්තරා" යි විග්‍රහයි.) සුවණ්ණභූමිං ගන්ත්වාන, සවර්ණභූමියට ගොස්; පිසාචෙනිද්ධමිත්වාන, පිසසුන් පලවා; බ්‍රහ්මජාලං, බ්‍රහ්මජාලසූත්‍රය; අදෙසයුන්ති, දෙසුවාහුයයි;

මහින්දත්ථෙරො පන තම්බපණ්ණිදීපං ගන්ත්වා සාසනං පතිට්ඨාපෙහීති උපජ්ඣායෙන ච භික්ඛුසඞ්ඝෙන ච අජ්ඣිට්ඨො චින්තෙසි: කාලො නු ඛො මෙ තම්බපණ්ණිදීපං ගන්තුං නොති.

අථස්ස වීමංසතො න තාව කාලොති අහොසි. කිම්පනස්ස දිස්වා එතදහොසි? මුටසීවරස්ස මහල්ලකභාවං. තතො චින්තෙසි: අයං රාජා මහල්ලකො න සක්කා ඉමං ගණ්හිත්වා සාසනං පග්ගහෙතුං. ඉදානි පනස්ස පුත්තො දෙවානම්පියතිස්සො රජ්ජං කාරෙස්සති, තං ගණ්හිත්වා සක්කා භවිස්සති සාසනං පග්ගහෙතුං, හන්ද යාව සො සමයො ආගච්ඡති තාව ඤාතකෙ ඔලොකෙම,

පුන දානි මයං ඉමං ජනපදං ආගච්ඡෙය්‍යාම වා නවාති. සො එවං චින්තෙත්වා උපජ්ඣායස්සච භික්ඛුසඞ්ඝස්සච වන්දිත්වා අසොකාරාමතො නික්ඛම්ම තෙහි ඉට්ටියාදීහි චතූහි ථෙරෙහි සඞ්ඝමිත්තාය පුත්තෙන

---

මහින්දත්ථෙරො පන, මිහිඳුතෙරතෙමේ වනාහි; තම්බපණ්ණිදීපං ගන්ත්වා, තාම්‍රපර්ණිදිවයිනට ගොස්; සාසනං පතිට්ඨාපෙහීති, සසුන පිහිටුවවයි; උපජ්ඣායෙන ච, උපාධ්‍යායයා විසින්ද; භික්ඛුසඞ්ඝෙන ච, භික්ෂුසඞ්ඝයා විසින්ද; අජ්ඣිට්ඨො, අණවනලදුයේ; චින්තෙසි, මෙසේසිතී; මෙ, මට; තම්බපණ්ණිදීපං ගන්තුං, තාම්‍රපර්ණී ද්වීපයට යන්ට; කාලො නු ඛො, කල්වේද; නොති, නොවේදැයි;

අථ, ඉක්බිති; වීමංසතො අස්ස, විමසන්නාවූ මේ තෙරහට; න තාවකාලොති අහොසි, තවමකල් නොවේයයි සිතෙක්වී; අස්සපන, මේ තෙරහුට වනාහි; කිං දිස්වා එතදහොසි, කුමක්දැක මෙබඳු සිතක් වීදයත්; මුටසීවරස්ස මහල්ලකභාවං, මුටසීවරජහුගේ මහළුබව (දැක මෙබඳුසිතෙක් වූයේවේ); තතො චින්තෙසි, ඉන්පසු මෙසේ සිතුයේය; අයං රාජා, මේ රදතෙම; මහල්ලකො, මහලුය; ඉමං ගණ්හිත්වා, මොහුගෙණ; සාසනං පග්ගහෙතුං, සස්නටබලදෙන්ටහෙවත් සඞ්ග්‍රහකරන්ට; න සක්කා නොහැකිය; ඉදානි පන, දැන් වනාහි; අස්සපුත්තො, ඔහුගේ පුත්‍රවූ; දෙවානම්පියතිස්සො, දෙවානම්පියතිස්ස තෙමෙ; රජ්ජංකාරෙස්සති, රාජ්‍යයකරවන්නේය; තං ගණ්හිත්වා, ඔහු ගෙණ; සාසනං පග්ගහෙතුං, සස්නට බලදෙන්ට හෙවත් සඞ්ග්‍රහ කරන්ට; සක්කාභවිස්සති, හැකිවන්නේය; හන්ද, එබැවින්; යාවසො සමයො ආගච්ඡති, යම්තාක් ඒ කාලය ඒද; තාව, ඒතාක්; ඤාතකෙ ඔලොකෙම, නෑයන් බලම්හ (ඉදානි යනු නිපාතමාත්‍රයකි)

මයං, අපි; ඉමං ජනපදං, මේ ජනපදයට; පුන, නැවත; ආගච්ඡෙය්‍යාම, එන්නමෝද; වා, නොහොත්; නවා ඉති, නොඑන්නමෝදැයි; සො, හෙතෙමේ; එවං චින්තෙත්වා, මෙසේ සිතා; උපජ්ඣායස්සච භික්ඛුසඞ්ඝස්සච වන්දිත්වා, උපාධ්‍යායයාද භික්සඟහුද වැඳ; අසොකාරාමතො නික්ඛම්ම, අශොකාරාමයෙන් නික්ම; තෙහි ඉට්ටියාදීහි චතූහි ථෙරෙහි, ඒ ඉට්ටියාදී සිව්තෙරුන්ද, සඞ්ඝමිත්තාය, සඞ්ඝමිත්‍රාවගේද

සුමනසාමණෙරෙන භණ්ඩුකෙන ච උපාසකෙන සද්ධිං රාජගහනගර පරිවත්තකෙන දක්ඛිණගිරිජනපදෙ චාරිකං චරමානො ඤාතකෙ ඔලොකෙන්තො ඡ මාසෙ අතික්කාමෙසි.

අථානුපුබ්බෙන මාතුනිවෙසනට්ඨානං වෙදිසනගරං නාම සම්පත්තො. අසොකො කිර කුමාරකාලෙ ජනපදං ලභිත්වා උජ්ජෙනිං ගච්ඡන්තො වෙදිසනගරං පත්වා වෙදිසසෙට්ඨිස්ස ධීතරං අග්ගහෙසි. සා තං දිවසමෙව ගබ්භං ගණ්හිත්වා උජ්ජෙනියං මහින්දකුමාරං විජායි. කුමාරස්ස චුද්දසවස්සකාලෙ රාජාභිසෙකං පාපුණි. සා තස්ස මාතා තෙන සමයෙන ඤාතිඝරෙ වසති. තෙනවුත්තං: අථානුපුබ්බෙන මාතු නිවෙසනට්ඨානං වෙදිසනගරං නාම සම්පත්තොති. සම්පත්තඤ්ච පන

---

පුනෙතන සුමනසාමණෙරෙණ, පුත්වූ සුමන නම් හෙරණද; භණ්ඩුකෙන උපාසකෙනච සද්ධිං, භණ්ඩුකනම් උපාසකයා සමගද; රාජගහනගරපරිවත්තකෙන, රජගහනුවර හැර; දක්ඛිණගිරිජනපදෙ, එනම් ජනපදයෙහි; චාරිකං චරමානො, සැරිසරනුයේ; ඤාතකෙ ඔලොකෙන්තො, නෑයන් බලමින්; ඡමාසෙ අතික්කාමෙසි, සමසක් ඉක්මවූයේය;

අථ, නැවත; අනුපුබ්බෙන, පිළිවෙළින්; මාතුනිවෙසනට්ඨානං වෙදිස නගරං, මාතෘනිවාසස්ථානවූ වෙදිසනුවරට; සම්පත්තො, පැමිණියේ වේ; (දූන් තෙරමාතෘව වෙදිසනුවර නිවාසය කරණ කරුණද, එනුවර ඒ දේවියට උත්පත්තිභූමියක් බවද, තෙරහුගේ උත්පත්තියද, දක්වනුයේ **අසොකො කිර කුමාරකාලෙ**" යී ආදි කීයේ).

අසොකො, අශොකතෙමේ; කුමාරකාලෙ කිර, කුමාරකලැ වනාහි; උජ්ජෙනිං ජනපදං ලභිත්වා, එනම් ජනපදය ලැබ; ගච්ඡන්තො, යනුයේ; වෙදිසනගරං පත්වා, වෙදිසනුවරට පැමිණ; වෙදිසසෙට්ඨිස්ස ධීතරං, වෙදිස නම් සිටුහුගේ දුහිතෘව; අග්ගහෙසි, දෙමවුපියන්ට කියා පාවාගත්තේය; සා, ඹතොමෝ; තංදිවසමෙව, එදවස්හිම; ගබ්භං ගණ්හිත්වා, ගැබ්ගෙණ හෙවත් ගර්භග්‍රහණය කොට උජ්ජෙනිය, එනම් නුවරදී; මහින්දකුමාරං විජායි, මිහිඳුකුමාරයා වැදීය; කුමාරස්ස, කුමාරයාහට; චුද්දසවස්සකාලෙ, තුදුස්වස්කල්හි; රාජා, රජතෙමේ; අභිසෙකංපාපුණි, අභිෂෙකයට පැමිණියේය;

තස්ස, ඒ මිහිඳු තෙරහුගේ; සාමාතා, ඒ මෑනියොමෝ; තෙන සමයෙන, එසමයෙහි; ඤාතිඝරෙවසතිති, නෑයන්ගේ ගෙයි වසන් නීයයි; තෙන වුත්තං, එහෙයින් කියනලදී; අථ, ඉක්බිති; අනුපුබ්බෙන, පිළිවෙළින්;මාතුනිවෙසනට්ඨානං, මෑනියන් වසනතැනවූ;වෙදිස නගරං නාම, වෙදිසනම්නුවරට; සම්පත්තොති, පැමිණියේයයි;සම්පත්තඤ්ච පන

ථෙරං දිස්වා ථෙරමාතා දෙවී පාදෙසු සිරසා වන්දිත්වා භික්ඛං දත්වා ථෙරං අත්තනා කතං වෙදිසගිරිමහාවිහාරං නාම ආරොපෙසි.

ථෙරො තස්මිං විහාරෙ නිසින්නො චින්තෙසි: අම්හාකං ඉධ කත්තබ්බ කිච්චං නිට්ඨිතං, සමයො නු ඛො ඉදානි ලඞ්කාදීපං ගන්තුන්ති. තතො චින්තෙසි: අනුභවතු තාව මෙ පිතරා පෙසිතං අභිසෙකං දෙවානම්පියතිස්සො. රතනත්තයගුණඤ්ච සුණාතු, ඡණත්ථඤ්ච නගරතො නික්ඛමිත්වා මිස්සකපබ්බතං අභිරුහතු, තදා තං තත්ථ දක්ඛිස්සාමාති. අථාපරං එකමාසං තත්ථෙව වාසං කප්පෙසි. මාසාතික්කමෙන ච ජෙට්ඨමූලමාසපුණ්ණමායං උපොසථදිවසෙ සන්නිපතිත්වා සබ්බෙපි කාලො නු ඛො අම්හාකං තම්බපණ්ණිදීපං ගමනාය උදාහු නොති මන්තයිංසු. තෙනාහු පොරාණා:-

---

ථෙරං දිස්වා, පැමිණියාදවූ තෙරහු වනාහි දැක; ථෙරමාතාදෙවී, තෙර මාතෘදෙවීතොමෝ; පාදෙසු, පාදයන්;සිරසාවන්දිත්වා, හිස කරණකොට ගෙණ වැඳ; භික්ඛං දත්වා, භික්ෂාවදී; ථෙරං, තෙරහට; අත්තනා කතං වෙදිසගිරිංනාම මහාවිහාරං, තමා විසින් කරණලද වෙදිසගිරිනම් මහාවිහාරය; ආරොපෙසි, පාවාදුනි.

ථෙරො, ස්ථවිරතෙමේ; තස්මිං විහාරෙ නිසින්නො, ඒවිහාරයෙහි හුන්නේ; අම්හාකං, අපගේ; ඉධ, මෙතන; කත්තබ්බකිච්චං නිට්ඨිතං, (මාතෘදර්ශනයෙන්) කටයුතු කෘත්‍යය නිමියේය; ඉදානි, දැන්; ලඞ්කාදීපං ගන්තුං, ලක්දිවයන්ට; සමයොනුඛො'ති, කල්දැයි; චින්තෙසි, සිතූයේය; තතො, ඉන්පසු, (තාව යනු නිපාතය) මෙ, මාගේ; පිතරා පෙසිතං, පියා විසින් එවනලද; තං අභිසෙකං, ඒ අභිෂේකය; දෙවානම්පිය තිස්සො, දෙවානම්පියතිස්ස තෙමේ; අනුභවතු, අනුභව කෙරේවා; රතනත්තයගුණං ච, රත්නත්‍රයගුණයද; සුණාතු, අසාවා; ඡණත්ථං ච, උත්සවපිණිසද; නගරතො නික්ඛමිත්වා, නුවරින්නික්ම; මිස්සකපබ්බතං, (පාංශුපාෂාණමිශ්‍රහෙයින්) එනම්ලද පර්වතයට; අභිරුහතු, නැගේවා; තදා, එකල්හි; තං, ඔහු; තත්ථ, එතනදී; දක්ඛිස්සාමාති, දක්නමෝයයි. චින්තෙසි, සිතූයේය;

අථ, ඉක්බිති; අපරං එකමාසං, තවත් එක්මසක්; තත්ථෙවවාසං කප්පෙසි, එතනම වාසය කෙළේය; මාසාතික්කමෙනච, මසඉක්මීමෙන් ද, ජෙට්ඨමූලමාසපුණ්ණමායං උපොසථදිවසෙ, පොසොන්මස පෞර්ණමී උපොෂිත දිනයෙහි; සබ්බෙපි, සියල්ලන්ම; සන්නිපතිත්වා, රැස්ව; තම්බපණ්ණිදීපං අම්හාකං ගමනාය, තාම්‍රපර්ණිදිවයිනට අපගේයාම පිණිස; කාලෝනුඛො, කල්වේද; උදාහු, නොහොත්; නොති, නොවේදැයි; මන්තයිංසු, මන්ත්‍රණයකළාහුය; පොරාණා, පුරාතනයෝ; තෙනාහු, එසේහෙයින් කීහු.

"මහින්දො නාම නාමෙන-සඞ්ඝත්ථෙරො තදා අහු,
ඉට්ටියො උත්තියො ථෙරො-භද්දසාලො ච සම්බලො.

සාමණෙරො ච සුමනො-ඡළභිඤ්ඤො මහිද්ධිකො,
භණ්ඩුකො සත්තමො තෙසං-දිට්ඨසච්චො උපාසකො,
ඉති එතෙ මහානාගා-මන්තයිංසු රහොගතා"ති.

තදා සක්කො දෙවානමින්දො මහින්දත්ථෙරං උපසඞ්කමිත්වා එතදවොච: කාලකතො භන්තෙ මුටසීවරාජා, ඉදානි දෙවානම්පියතිස්සමහාරාජා රජ්ජං කාරෙති. සම්මාසම්බුද්ධෙන ච තුම්හෙ ව්‍යාකතා-"අනාගතෙ මහින්දො නාම භික්ඛු තම්බපණ්ණිදීපං පසාදෙස්සතී"ති.

තස්මාතිහ වො භන්තෙ කාලො දීපවරං ගමනාය අහම්පි වො සහායො භවිස්සාමීති. කස්මා පන සක්කො එවමාහ?

---

නාමෙන, නමින්; මහින්දො නාම, මිහිඳු නම්තෙර; තදා, එකල්හි; සඞ්ඝත්ථෙරො අහු, සඞ්ඝස්ථවිරවූයේය; ඉට්ටියො, ඉට්ඨිය නම්තෙරද; උත්තියොථෙරො, උත්තිය නම් තෙරද; භද්දසාලොච, භද්‍රසාල නම් තෙරද, සම්බලො, සම්බල නම්තෙරද;

ඡළභිඤ්ඤො, ෂඩභිඥ ඇත්තාවූ; මහිද්ධිකො, මහත්ඍද්ධි ඇත් තාවූ; සුමනො සාමණෙරොච, සුමන නම් හෙරණද යන; තෙසං, ඔවුන් අතුරෙන්; සත්තමො, සත්වෙනිවූ; දිට්ඨසච්චො, අනාගාමි මාර්ගයෙන් ප්‍රතිවෙධ කරණලද චතුස්සත්‍යය ඇති; (අනාගාමිඵලප්‍රාප්තයයි කියන ලද්දේ වේ). භණ්ඩුකො උපාසකො ඉති,(මිහිඳුතෙරහුගේ භාගිනෙය්‍යවූ); භණ්ඩුක උපාසකයාය යන; එතෙමහානාගා, මේ මහොත්තමයෝ; රහොගතා, රහසිගතව; මන්තයිංසුති, මන්ත්‍රණය කළාහුයයි;

තදා, එකල්හි; සක්කොදෙවානමින්දො, ශක්‍රදෙවේන්ද්‍ර තෙමේ; මහින්දත්ථෙරං උපසඞ්කමිත්වා, මිහිඳුතෙරහු කරා පැමිණ; එතදවොච, මේ වචනය කීයේය; භන්තෙ, වහන්ස; මුටසීවරාජා, මුටසීව නම් රජ; කාලකතො, කලුරියකෙළේය; දෙවානම්පියතිස්සමහාරාජා, දෙවානම්පිය තිස්ස මහරද තෙමේ; ඉදානි, දැන්; රජ්ජං කාරෙති, රාජ්‍යය කරවයි; සම්මාසම්බුද්ධෙන ච, සම්‍යක් සම්බුදුරජහු විසිනුදු; අනාගතෙ, අනාගත යෙහි; මහින්දො නාම භික්ඛු, මිහිඳු නම් භික්‍ෂුව; තම්බපණ්ණිදීපං පසාදෙස්සතිති, තාම්‍රපර්ණීදීපවාසීන් පහදවන්නේයයි; තුම්හෙ, නුඹ වහන්සේ; ව්‍යාකතා, ප්‍රකාශකරණලදහ.

තස්මා, එහෙයින්; භන්තෙ, වහන්ස; වො, නුඹවහන්සේව; දීප වරං ගමනාය, උතුම්දිවයිනට යෑමට; කාලො, කල්වේ; අහම්පි, මමද; වො සහායො භවිස්සාමීති, ඔබට සහයවන්නෙමියි කියායි; කස්මා පන, කුමක් හෙයින්වනාහි; සක්කො, සක්‍රතෙමේ; එවං ආහ, මෙසේ කීසේද යත්;

භගවා කිරස්ස බොධිමූලෙයෙව බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙත්වා අනාගතෙ ඉමස්ස දීපස්ස සම්පත්තිං දිස්වා එතමත්ථං ආරොචෙසි.

තදා ත්වම්පි සහායො භවෙය්‍යාසීති ච ආණාපෙසි. තස්මා එවමාහ. ථෙරො තස්ස වචනං සම්පටිච්ඡිත්වා අත්තසත්තමො වෙදිසපබ්බතා වෙහාසං උප්පතිත්වා අනුරාධපුරස්ස පුරත්ථිමදිසායං මිස්සකපබ්බතෙ පතිට්ඨහි, යං පනෙතරහි "චෙතියපබ්බතො" තිපි සඤ්ජානන්ති තෙනාහු පොරාණා:–

**"වෙදිසගිරිම්හි රාජගහෙ–වසිත්වා තිංසරත්තියො,**
**කාලොව ගමනස්සාති–ගච්ඡාම දීපමුත්තමං.**

**පලිනා ජම්බුදීපාතො–හංසරාජාව අම්බරෙ,**
**එවමුප්පතිතා ථෙරා–නිපතිංසු නගුත්තමෙ.**

---

භගවාකිර**,** භාග්‍යවත්තෙමේ වනාහි; බොධිමූලෙයෙව, බෝමුල දීම; බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙත්වා, බුදුඇසින් ලෝබලා; එහෙයින් කිහ. (**"ඉන්ද්‍රියපරොපරියත්ති ඤාණං ආසයානුසය ඤාණඤ්ච බුද්ධචක්ඛූති වුච්චතීති"**යි.)

අනාගතෙ, අනාගතයෙහි; ඉමස්සදීපස්ස, මේ වීපයාගේ; **සම්පත්තිං දිස්වා**, සම්පත්තිය දැක; අස්ස, මේ සක්දෙව්රදට; **එතමත්ථං ආරොචෙසි**, (**අනාගතයෙහි මිහිඳු නම් භික්ෂුවක් තාම්‍රපර්ණිදිපවාසීන් පහදවන්නේය සත**) මේ කාරණය වදාළේය.

තදා, එකල්හි; ත්වම්පි සහායො භවෙය්‍යාසි ඉතිච, තෝපද සහායවෙවයි; ආණාපෙසි, අණවූයේය; තස්මා, එසේ හෙයින්; එවං **ආහ**, මෙසේ කී; ථෙරො, **ස්ථවිරතෙමේ**; තස්ස වචනං, ඔහුගේ වචනය; සම්පටිච්ඡිත්වා, පිළිගෙණ; අත්තසත්තමො, තමන් සත්වෙනිවූයේ; වෙදිසපබ්බතා, **එනම් පව්වෙන්**; වෙහාසං උප්පතිත්වා, අහසට පැන නැගී; අනුරාධපුරස්ස, අනුරාධපුරයට; පුරත්ථිමදිසායං, පූර්විදිශායෙහිවූ; මිස්සකපබ්බතෙ, මිශ්‍රක පර්වතයෙහි; පතිට්ඨහි, පිහිටියේය; අයං පන; මේ පර්වතය වනාහි; එතරහි, දැන්; **චෙතියපබ්බතොතිපි**, චෛත්‍ය පර්වතයයිද; සඤ්ජානන්ති, දනිත්; පොරාණා, පුරාණ ආචාර්‍ය්‍යවරයෝ, තෙනාහු, **එසේහෙයින්** කිහු;

**රාජගහෙ,** රජගහවෙහි; වෙදිසගිරිම්හි, වෙදිස නම් දෙවිය විසින් කරවනලද වෙහෙරෙහි; තිංසරත්තියො වසිත්වා, තිස් **රැයක්** වැස; ගමනස්ස, ගමනට; කාලොව, කල්මය; උත්තමං දීපං ගච්ඡාම, උතුම් දිවයිනට යම්හයි;

ජම්බුදීපතො, දඹදිවින්; පලිතා, අහසට පැන නැංගාහුය; අම්බරෙ, අහසෙහි; හංසරාජා ඉව, හංසරාජයන් මෙන්; එවං, මෙසේ; උප්පතිතාථෙරා, අහසට පැන නැගි තෙරහු; නගුත්තමෙ, පර්වතයන්ට උතුම්වූ සෑගිරි පව්වෙහි; නිපතිංසු, නිපතිතවූහු;

**"පුරත්‍ථො පුරසෙට්ඨස්ස පබ්බතෙ මෙඝසන්නිභෙ
පතිංසු සීලකූටම්හි-හංසාව නගමුද්ධනී"ති.**

ඒවං ඉට්ටියාදීහි සද්ධිං ආගන්ත්වා පතිට්ඨහන්තො ච ආයස්මා මහින්දත්ථෙරො සම්මා සම්බුද්ධස්ස පරිනිබ්බාණතො චිත්තං වස්සසතානං උපරි ජත්තිංසතිමෙ වස්සෙ ඉමස්මිං දීපෙ පතිට්ඨහීති වෙදිතබ්බො.

අජාතසත්තුස්ස හි අට්ඨමෙ වස්සෙ සම්මාසම්බුද්ධො පරිනිබ්බායි. තස්මිං යෙව වස්සෙ සීහකුමාරස්ස පුත්තො තම්බපණ්ණිදීපස්ස ආදිරාජා විජයකුමාරො ඉමං දීපමාගන්ත්වා මනුස්සවාසං අකාසි.

ජම්බුදීපෙ උදයභද්දස්ස චුද්දසමෙ වස්සෙ ඉධ විජයො කාලමකාසි. උදයභද්දස්ස පඤ්චදසමෙ වස්සෙ පණ්ඩුවාසුදෙවො නාම

---

(දැන් ඒ පජීතය පිහිටි තැනද තෙරුන්ගේ එහි පතිත ස්ථානයද දක්වනු පිණිස "පුරත්‍ථො පුර සෙට්ඨම්හි" යනාදි ගාථාව කී.)

පුරසෙට්ඨස්ස, අනුරාධපුර සඞ්ඛ්‍යාත පුරප්‍රවරයාගේ; පුරත්‍ථො, ප්‍රාචීන දිශාභාගයෙහි; මෙඝසන්නිභෙ, නිල් මහමෙයක් සමානවූ; සීලකූටම්හිපබ්බතෙ, සීලකූට නම් පර්වතයෙහි; නගමුද්ධනි, ශිඛරමස්තක යෙහි; හංසාව, හංසයන් මෙන්; පතිංසු ඉති, පිහිටියාහුයයි.

(ඒ පිහිටියේ කවරදිනකදැයි ඒ දක්වනු පිණිස "එවං ඉට්ඨියාදීහි සද්ධිං"යී ආදි කීයේ.)

එවං, මෙසේ; ආයස්මාමහින්දත්ථෙරො, ආයුෂ්මත් මිහිඳුතෙර; ඉට්ඨියාදීහි සද්ධිං ආගන්ත්වා, ඉට්ඨිය ස්ථවිරාදීන් සමග අවුත්; පතිට්ඨහන්තොච, පිහිටන්නේද; සම්මාසම්බුද්ධස්සපරිනිබ්බාණතො, සම්‍යක් සම්බුද්ධයන්ගේ පිරිනිවීමෙන්; චිත්තංවස්සසතානංඋපරි, දෙසිය වර්ෂයකගේ මතුයෙහි; ජත්තිංසතිමෙවස්සෙ, සතිස්වන වර්ෂයෙහි; ඉමස්මිංදීපෙ, මේ දිවයිනැ; පතිට්ඨහීතිවෙදිතබ්බො, පිහිටියේයයි දතයුත්තේය;

(කෙසේ දතයුතුදැයි ඒ දක්වනු පිණිස "අජාතසත්තුස්ස"යී ආදි කීයේ.)

අජාතසත්තුස්ස, අජාසත්හට; අට්ඨමෙවස්සෙ, අටවනවසෙහි; සම්මාසම්බුද්ධො, සම්‍යක්සම්බුද්ධතෙමේ; පරිනිබ්බායී, පිරිනිවියේ වේ; තස්මිංයෙවවස්සෙ, එම වර්ෂයෙහි; සීහ කුමාරස්සපුත්තො, (කාලිඞ්ගරාජ දුහිතෲවගේ කුසෙහි සිංහයාටදාව උපන් හෙයින්) සීහකුමාර යයි නම් ලද්දහුගේ පුත්‍රවූ; තම්බපණ්ණිදීපස්ස ආදි රාජා, තාම්‍රපර්ණී දිවයිනට ප්‍රථමරජවූ; විජයකුමාරො, විජයකුමරතෙමේ; ඉමංදීපං ආගන්ත්වා, මේ දිවයිනට අවුත්; මනුස්සවාසංඅකාසි, පෙර අමනුෂ්‍යවාසව තිබි හෙයින් මනුෂ්‍යවාස කොළේ;)

ජම්බුදීපෙ, දඹදිවැ; උදයභද්දස, උදයභද්‍රරජහුගේ; චුද්දසමෙ වස්සෙ, තුදුස්වන වර්ෂයෙහි; ඉධ, මෙහි; විජයොකාලමකාසි, විජයරද කළුරියකෙළේය; උදයභද්දස්ස, උදයභද්‍රරජහට; පඤ්චදසමෙවස්සෙ, පසළොස්වනවර්ෂයෙහි; පණ්ඩුවාසුදෙවොනාම, පඬුවස්දෙව්නම් තෙමේ;

ඉමස්මිං දීපෙ රජ්ජං පාපුණි. තත්‍ථ නාගදාසක රඤ්ඤො වීසතිමෙ වස්සෙ ඉධ පණ්ඩුවාසුදෙවො කාලමකාසි.

තස්මිං යෙව ච වස්සෙ අභයො නාම රාජකුමාරො ඉමස්මිං දීපෙ රජ්ජං පාපුණි. තත්‍ථ සුසුනාගරඤ්ඤො සත්තරසමෙ වස්සෙ ඉධ අභයරඤ්ඤො වීසති වස්සානි පරිපූරිංසු. අථ අභයස්ස වීසතිමෙ වස්සෙ පකුණ්ඩකාභයො නාම දාමරිකො රජ්ජං අග්ගහෙසි.

තත්‍ථ කාලාසොකස්ස සොළසමෙ වස්සෙ ඉධ පකුණ්ඩකස්ස සත්තරසවස්සානි පරිපූරිංසු. තානි හෙට්ඨා එකෙන වස්සෙන සහ අට්ඨාරස හොන්ති. තත්‍ථ චන්‍දගුත්තස්ස චුද්දසමෙ වස්සෙ ඉධ පකුණ්ඩකාභයො කාලමකාසි. මුටසීවරාජා රජ්ජං පාපුණි. තත්‍ථ අසොකධම්මරාජස්ස සත්තරසමෙ වස්සෙ ඉධ මුටසීවරාජා කාලමකාසි.

---

ඉමස්මිං දීපෙරජ්ජංපාපුණි, මේ දිවයිනැ රාජ්‍යයට පැමිණියේය; තත්‍ථ, ඒ දඹදිවෙහි; නාගදාසකරඤ්ඤො, නාගදාසක රජහට; වීසතිමෙවස්සෙ, විසිවන වර්ෂයෙහි; ඉධ, මේ ලක්දිවැ; පණ්ඩුවාසුදෙවො, පඬුවස්දෙව්රද; කාලමකාසි, කළුරිය කොළේය;

තස්මිංයෙව ච වස්සෙ, එම වර්ෂයෙහිද; අභයොනාම රාජකුමාරො, අභයනම් රාජකුමාර තෙමේ; ඉමස්මිංදීපෙ, මේ දිවයිනැ; රජ්ජං පාපුණි, රාජ්‍යයටපැමිණියේය; තත්‍ථ, ඒ දඹදිවෙහි; සුසුනාගරඤ්ඤො, එනම් රද හට;සත්තරසමෙවස්සෙ, සතළොස්වන වර්ෂයෙහි;ඉධ, මේ ලක්දිවැ;අභය රඤ්ඤො, අභයරදහට; වීසතිවස්සානි පරිපූරිංසු, විසිවසක් පිරුණාහුය, අථ, ඉක්බිති; අභයස්ස වීසතිමෙවස්ස, අභයරදහට විසිවන වර්ෂයෙහි; පකුණ්ඩකාභයො නාම දාමරිකො, පකුණ්ඩකාභය නම් යුද්ධකාරක චෞරතෙමේ; රජ්ජංඅග්ගහසෙි, එක දෙශයක් රාජ්‍යය ගත්තේය;

(පකුණ්ඩකාභය තෙමේ අභයරජහුගේ නැගණියගේ පුත්‍ර තෙමේය, සොරෙක් නොවේ, බලාත්කාරයෙන් රාජ්‍යගත් බැවින් දාමරිකයයි කියන ලදී.)

තත්‍ථ, ඒ දඹදිවෙහි; කාලාසොකස්ස සොළසමෙවස්සෙ, කාලාශොක නම් රදහට සොළොස්වන වර්ෂයෙහි, ඉධ, මේ ලක්දිව; පකුණ්ඩකස්ස, පකුණ්ඩකාභය රදහට; සත්තරසවස්සානි පරිපූරිංසු, අභිෂෙක නොකරණලදුවම) සතළොස් වර්ෂයක් පිරුණාහුය;' තානි, හෙට්ඨා එකෙනවස්සෙනසහ ඒ රාජසූන්‍යයවූ සතලොස් වර්ෂයද යට (විජය පණ්ඩුවාසදෙදෙනා අතුරෙන් අරාජිකවූ) එක්වර්ෂයද සමග; අට්ඨාරසහොන්ති, අටළොසෙක්වෙත්; තත්‍ථ, ඒ දඹදිවෙහි; චන්‍දගුත්තස්සචුද්දසමෙවස්සෙ, චන්‍ද්‍රගුප්තරදහට තුදුස්වන වර්ෂයෙහි; ඉධ, මෙහි; පකුණ්ඩකාභයො, පකුණ්ඩකාභයරද; කාලමකාසි, කළුරිය කොළේයි; මුටසීවරාජ, මුටසීව රද තෙමේ, රජ්ජං පාපුණි, රාජ්‍යයට පැමිණියේයි; තත්‍ථ, ඒ දඹදිවෙහි; අසොකධම්මරාජස්ස, අශොකදහම්රදහට;සත්තරසමෙවස්සෙ, සතළොස් වන වර්ෂයෙහි; ඉධ, මේ ලක්දිව්හි; මුටසීවරාජාකාලමකාසි, මුටසීවරද කළුරියකොළේයි;

දෙවානම්පියතිස්සො රජ්ජං පාපුණි. පරිනිබ්බුතෙ ච සම්බුද්ධෙ අජාතසත්තු චතුවීසතිවස්සානි රජ්ජං කාරෙසි. උදයභද්දො සොළස, අනුරුද්ධො ච මුණ්ඩො ච අට්ඨ, නාගදාසකො චතුවීසති, සුසුනාගො අට්ඨාරස, තස්සෙව පුත්තො කාලාසොකො අට්ඨවීසති, අසොකස්ස පුත්තකා දසභාතුකරාජානො ද්වෙවීසතිවස්සානි රජ්ජං කාරෙසුං.

තෙසං පච්ඡතො නවනන්දා ද්වෙවීසතිමෙව. චන්දගුත්තො චතුවීසති, බින්දුසාරො අට්ඨවීසති, තස්සාවසානෙ අසොකො රජ්ජං පාපුණි. තස්ස පුරෙ අභිසෙකා චත්තාරි, අභිසෙකතො අට්ඨාරසමෙ වස්සෙ ඉමස්මිං දීපෙ මහින්දත්ථෙරො පතිට්ඨිතො. එවමෙතෙන රාජවංසානුසාරෙන වෙදිතබ්බමෙතං "සම්මාසම්බුද්ධස්ස පරිනිබ්බානතො ද්වින්නං වස්සසතානං උපරි ඡත්තිංසතිමෙ වස්සෙ ඉමස්මිං දීපෙ පතිට්ඨහි"ති

---

දෙවානම්පියතිස්සො, දෙවානම්පියතිස්සතෙමේ; රජ්ජං පාපුණි, රාජ්‍යයට පැමිණියේය; සම්බුද්ධෙච පරිනිබ්බුතෙ, බුදුහු පිරිනිවි සාල්හි; අජාතසත්තු, අජාසත්තෙමේ; චතුවීසති වස්සානිරජ්ජං කාරෙසි, සිව්විසිවසක් මුලුල්ලෙහි රාජ්‍යයකරවිය; උදයභද්දො සොළසච, උදයභද්‍රරද සොළොස්වසක්ද; අනුරුද්ධොච, අනුරුද්ධ නම්රදද; මුණ්ඩොච, මුණ්ඩනම්රදද; අට්ඨ, අටවසක්ද; නාගදාසකො, නාගදාසකතෙමේ; චතුවීසති, සුවිසිවසක්ද; සුසුනාගො සුසුනාගතෙමේ; අට්ඨාරස, අටළොස්වසක්ද; තස්සෙවපුත්තො, ඔහුගේ මපුත්‍රවූ; අසොකො, කාලාශොකරදතෙමේ අට්ඨවීසති, අටවිසිවසක්ද; අසොකස්ස පුත්තකා කාලාශොකරජහුගේ පුත්‍රවූ; දසභාතුකරාජානො, (භද්‍රසෙනය- කොරණ්ඩවණ්ණය -මඞ්කුරය-සබ්බඤ්ජහය-ජාලිකය-උභයකය-සඤ්ජයය-කොරබ්බය- නන්දිවඩ්ඪනය-පඤ්චකය යන) දසබෑර දහු; වෙ වීසති වස්සානි, දෙවිසිවසක්ද; රජ්ජං කාරෙසුං, රජයකරවූහ;

තෙසං පච්ඡතො, ඔවුනටපසු; නවනන්දා, (උග්‍රසෙනනන්දය; පණ්ඩුකනන්දය- පණ්ඩුගතිනන්දය- භූතපාලනන්දය- රට්ඨපාලනන්දය- ගොවිසාණනන්දය-සවිඞ්ඝකනන්දය-කෙවට්ටකනන්දය- ධනනන්දය යන) නවනන්දරදහු; වෙවීසතිවෙව, දෙවිසිවසක්මද; චන්දගුත්තො, චන්ද්‍රගුප්ත තෙමේ; චතුවීසති, සුවිසිවසක්ද; බින්දුසාරො, බින්දුසාරරදතෙමේ; අට්ඨවීසති, අටවිසිවසක්ද රජය කෙළේය; තස්සාවසානෙ, ඔහුගේඅවසාන යෙහි; අසොකො, අශොකකුමාරතෙමෙ; රජ්ජංපාපුණි, රාජ්‍යයට පැමිණි යේය; තස්ස අභිසෙකා, ඔහුගේ අභිෂෙකයෙන්; පුරෙ, පෙර; චත්තාරි, සිව්වසක්ද අභිසෙකතො, අභිෂෙකයෙන්; අට්ඨාරසමෙ වස්සෙ, අටළොස්වන වර්ෂයෙහි; ඉමස්මිංදීපෙ, මේදිවයිනෙහි; මහින්දත්ථෙරො, මිහිඳුතෙර; පතිට්ඨිතො, පිහිටියේයි; එවං, මෙසේ; එතෙනරාජවංසානුසාරෙන, මේරාජවංශානුසාරයෙන්; එතං, මේ පිහිටීම; වෙදිතබ්බං එව, දතයුත්තේමය; සම්මාසම්බුද්ධස්ස පරිනිබ්බානතො, සම්‍යක්සම්බුද්ධයන්ගේ පරිනිර්වාණයෙන්; ද්වින්නං වස්සසතානං උපරි, දෙසිය වර්ෂයකගේ මතුයෙහි; ඡත්තිංසතිමෙ වස්සෙ, සතිස්වන වර්ෂයෙහි; ඉමස්මිංදීපෙ, මේදිවයිනැ; පතිට්ඨහිති, පිහිටියේයි;

තස්මිඤ්ච දිවසෙ තම්බපණ්ණිදීපෙ ජෙට්ඨමූලනක්ඛත්තං නාම හොති. රාජා නක්ඛත්තං ඝොසාපෙත්වා ඡණං කරොථාති අමච්චෙ ච ආණාපෙත්වා චත්තාළීසපුරිසසහස්සපරිවාරො නගරම්හා නික්ඛමිත්වා යෙන මිස්සකපබ්බතො තෙන පායාසි මිගවං කීළිතුකාමො. අථ තස්මිං පබ්බතෙ අධිවත්ථා එකා දෙවතා රඤ්ඤො ථෙරෙ දස්සෙස්සාමීති රොහිතමිගරූපං ගහෙත්වා අවිදූරෙ තිණපණ්ණානි ඛාදමානා විය චරති.

රාජා තං දිස්වා අයුත්තන්දානි පමත්තං විජ්ඣිතුන්ති ජියං පොඨෙසි. මිගො අම්බත්ථලමග්ගං ගහෙත්වා පලායිතුං ආරභි. රාජා පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධන්තො අම්බත්ථලමෙව අභිරුහි. මිගොපි ථෙරානං අවිදූරෙ අන්තරධායි.

---

තස්මිංචදිවසෙ, එදවස්හිද; තම්බපණ්ණිදීපෙ, තාම්‍රපර්ණීද්වීප යෙහි; ජෙට්ඨමූලනක්ඛත්තංනාම හොති, පොසොන්මස පෞණමීදිනයෙහි මූලනක්‍ෂත්‍ර සඞ්ඛ්‍යාත නැකතක්වේ; රාජා, රජතෙමේ; නක්ඛත්තංඝොසාපෙත්වා; නැකැත්ඝොෂාකරවා; ඡණංකරොථාති, උත්සවයකරව්යයි; අමච්චෙචආණාපෙත්වා, ඇමතියන්ටද අණවා; චත්තාළීසපුරිසසහස්සපරිවාරො; සතළිස්දහසක් පුරුෂයන් පිරිවර කොට ඇතියේ; මිගවං කීළිතුකාමො, මෘගහිංසාවෙන් ක්‍රීඩාකරනු කැමතිව(එහෙයින් කීහ; **මිගවන්ති මිගානං වානනතො හෙසනතො බාධනතො මිගවන්ති ලද්ධනාමස්සෙතං මිගවධංසි"**) නගරමහානික්ඛමිත්වා, නුවරින් නික්ම; යෙනමිස්සකපබ්බතො, යම්තැනෙක්හි මිශ්‍රක පර්වතයද; තෙනපායාසි, එහිගියේය; අථ, ඉක්බිති; තස්මිංපබ්බතෙ අධිවත්ථා, ඒ පර්වතයෙහි අධිගෘහීතවූ; එකාදෙවතා, එක්දෙවතාවක් තොමෝ; රඤ්ඤො, රජහට; ථෙරෙදස්සෙස්සාමීති, තෙරුන්දක්වන් නෙමියි; රොහිතමිගරූපං ගහෙත්වා, ගොකණ්මිගවේශයක් ගෙණ; අවිදූරෙතිණපණ්ණානිඛාදමානාවිය, නුදුරුතැන තණපත්කන්නාක් මෙන්; චරති, හැසිරේ;

රාජා, රදතෙමේ; තං, ඔහු; දිස්වා, දැක; ඉදානි, දැන්; පමත්තං ප්‍රමාදවූවහු; විජ්ඣිතුං අයුත්තං ඉති, විදින්ට අයුතුයයි; ජියංපොඨෙසි, දුනුදියපෙළී; මිගො, මෘගතෙමේ; අම්බත්ථල මග්ගංගහෙත්වා, අම්බස්ථල මාර්ගයට පැමිණ; පලායිතුං ආරභි, දිවන්ටපටන්ගති; රාජා, රජතෙමේ; පිට්ඨිතො පිට්ඨිතොඅනුබන්ධන්තො; පසුපස්සෙන් (පදවශයෙන්) දිවනසේක්; අම්බත්ථලමෙව අභිරුහි, අම්බස්ථලයටම නැංගේය; මිගොපි, මෘගතෙමේද; ථෙරානං, අවිදූරෙ අන්තරධායි; **තෙරුන්ගේ නුදුරුතැනදී අතුරුදන්වී;**

මහින්දත්ථෙරො රාජානං අවිදූරෙ ආගච්ඡන්තං දිස්වා මමං යෙව රාජා පස්සතු මා ඉතරෙති අධිට්ඨහිත්වා "තිස්ස තිස්ස ඉතො එහී"ති ආහ. රාජා සුත්වා චින්තෙසි: ඉමස්මිං දීපෙ ජාතො මං "තිස්සා"ති නාමං ගහෙත්වා ආලපිතුං සමත්ථො නාම නත්ථි. අයං පන ඡින්නභින්නපටධරො භණ්ඩුකාසාවවසනො මං නාමෙන ආලපති, කො නු ඛො අයං භවිස්සති මනුස්සො වා අමනුස්සො වා ති? ථෙරො ආහ:

**"සමණා මයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා,**
**තවෙව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා"ති.**

තෙන ච සමයෙන දෙවානම්පියතිස්සමහාරාජා ච අසොකධම්මරාජා ච අදිට්ඨසහායකා හොන්ති. දෙවානම්පියතිස්සමහාරාජස්ස ච පුඤ්ඤානුභාවෙන ඡාතපබ්බතපාදෙ එකම්හි වෙළු ගුම්බෙ තිස්සො

---

මහින්දත්ථෙරො, මිහිඳුතෙර; අවිදූරෙ, නුදුරු තැන්හි; ආගච්ඡන්තං අභිමුඛව එන්නාවූ; රාජානං දිස්වා, රජහු දැක; මමං යෙව, මාම; රාජා, රජතෙමේ; පස්සතු, දකිවා; මා ඉතරෙති, අන්‍යයන් නොදකිවායි; අධිට්ඨහිත්වා, ඉටා; තිස්ස! තිස්ස!, තිස්සය! තිස්සය!; ඉතොඑහි'ති ආහ, මෙහි එවයි කීහ; රාජා, රජතෙමේ; සුත්වා, අසා; තිස්සො'ති නාමං ගහෙත්වා, "තිස්ස"යයි නමගෙණ; මං, මට; ආලපිතුං, හඬගාන්ට; ඉමස්මිං දීපෙජාතො, මේ දිවයිනැ උපන්; සමත්ථො නාම නත්ථි, සම-තෙක් නම් නැත; ඡින්නභින්නපටධරො, සුන්බුන් පටධර; භණ්ඩු, භිසමුඩුවූ; කාසාවවසනො, කෂායවස්ත්‍ර හැඳි පෙරවි; අයං, මේතෙම; මං, මට; නාමෙන ආලපති, නමින් ආමන්ත්‍රණය කෙරේ; අයං, මේ තෙමේ; මනුස්සොවා, මනුෂ්‍යයෙක්ද; අමනුස්සොවා, අමනුෂ්‍යයෙක්ද; කොනුඛො භවිස්සතී'ති කවරෙක් වන්නේදැයි; චින්තෙසි, සිතූයේය; ථෙරො, ස්ථවිරතෙමේ; ආහ, මෙසේ මේ ගාථාව කීහ; (ස්ථවිරතෙමේ ඔහුගේ විතර්කය දැන තමන්ගේ ස්වභාව කථනයකොට ඔහු අස්වසනු කැමතිව **"සමණා මයං මහාරාජ"**යි ආදි කියේ;)

මහාරාජ!, මහරද!; ධම්මරාජස්ස, ධර්මරාජන්වූ භාග්‍යවත්හුගේ; සාවකා, ශ්‍රාවකවූ; මයං, අපි; සමණා, ශ්‍රමණයෝවූම්හ; (තෝ පරිවිතර්කයක් නොකරව;) තවෙව අනුකම්පාය, තටම අනුකම්පා පිණිස; (විමුඛ බැවි පිණිස නොවෙයි යනු අභිප්‍රායි;) ජම්බුදීපා, දඹදිවින්; ඉධා'ගතාති, මෙහි ආමහයි;

තෙනච සමයෙන, එසමයෙහි; දෙවානම්පියතිස්ස මහාරාජාච, දෙවානම්පියතිස්ස මහරදද; අසොකධම්මරාජාච, ධර්මාශොකරජද යන; (දෙදෙන) අදිට්ඨසහායකා හොන්ති, අදෘෂ්ට මිත්‍රයෝ වෙත්; ("අදිට්ඨසහායකා" යන්නෙන් "අඤ්ඤමඤ්ඤං අදිස්වාව සහායකභාවං උපගතාති වුත්තං"යි කී;) දෙවානම්පියතිස්ස මහාරාජස්සච, දෙවානම්පියතිස්ස මහරජහුගේ; පුඤ්ඤානුභාවෙන, පුණ්‍යානුභාවයෙන්;

වෙළුයට්ඨියො රථයට්ඨිප්පමාණා උප්පජ්ජිංසු: එකා ලතායට්ඨි නාම, එකා පුප්ඵයට්ඨි නාම, එකා සකුණයට්ඨි නාම. තාසු ලතායට්ඨි රජතවණ්ණා හොති, තං අලඞ්කරිත්වා උප්පන්නලතා කඤ්චනවණ්ණා ඛායති. පුප්ඵයට්ඨියං පන නීලපීතලොහිතොදාතකාළවණ්ණානි පුප්ඵානි සුවිභත්ත වණ්ටපත්තකිඤ්ජක්ඛානි හුත්වා ඛායන්ති. සකුණයට්ඨියං හංසකුක්කුටජීවඤ්ජීවකාදයො සකුණා නානප්පකාරානි ච චතුප්පදානි සජීවානි විය ඛායන්ති. වුත්තම්පිචෙතං දීපවංසෙ.

**''ඡාතපබ්බතපාදම්හි-වෙළුයට්ඨී තයො අහු,**
**සෙතා රජතයට්ඨි ච-ලතා කඤ්චනසන්නිභා.**

**නීලාදි යාදිසං පුප්ඵං-පුප්ඵයට්ඨිම්හි තාදිසං,**
**සකුණා සකුණයට්ඨිම්හි-සරූපෙනෙව සණ්ඨිතා''ති.**

---

ඡාතකපබ්බතපාදෙ, ඡාතකපර්වතපාදයෙහි; එහාම්හි වෙළුගුම්බෙ, එක් උණලැහැබෙක්හි; රථයට්ඨිප්පමාණා, (ආයාමයෙන්ද ආවතියෙන්ද)රිය කෙවිට් පමණ; තිස්සො වෙළුයට්ඨියො, හුණයට තුනෙක්; උප්පජ්ජිංසු, (ඔහුගේ අභිෂේකකාලයට අනතුරුව) උපන්හු; එකා, එක්යටක් තොමෝ; ලතායට්ඨිනාම, ලතායෂ්ටිනම; එකා, එක්යටක් තොමෝ; පුප්ඵයට්ඨි නාම, පුෂ්පයෂ්ටිනම; එකා, එක්යටක් තොමෝ; සකුණයට්ඨි නාම, සකුණයෂ්ටිනම; තාසු, ඒ යටයන් අතුරෙන් ලතායට්ඨි, ලතායෂ්ටි තොමෝ; රජතවණ්ණා හොති, රිදීවර්ණවූවාවෙයි; තං අලඞ්කරිත්වා ඒ රජතවර්ණය අලඞ්කාරකොට; උප්පන්නලතා, උපන්ලිය; කඤ්චනවණ්ණා ඛායති, කසුන්වන්වූවා පැණේ; පුප්ඵයට්ඨියං පන, පුෂ්පයෂ්ටියෙහි වනාහි; නීලපීතලොහිතොදාත කාළවණ්ණානි පුප්ඵානි, නීල පීත ලොහිත ඔදාත කාළවර්ණයෙන් යුත් පුෂ්පයෝ; සුවිභත්ත මනාකොට විභාගකරනලද; වණ්ටපත්තකිඤ්ජක්ඛානි හුත්වා, නටුපත් කෙසුරු ඇතිව; ඛායන්ති, පැණෙත්; සකුණයට්ඨියං, සකුණයෂ්ටියෙහි; හංසකුක්කුටජීවඤ්ජීවකාදයො, හංසකුක්කුටජීවඤ්ජීවක ආදීවූ; සකුණා, පක්ෂීහුද; නානප්පකාරානි, අනෙකප්‍රකාරවූ; චතුප්පදානි ච, සිව්පාවෝද සජීවානි විය, ජීවත්වූවන් මෙන්; ඛායන්ති, පැණෙත්; දීපවංසෙ, දීපවංසයෙහි; එතම්පි වුත්තං, මෙයද කියනලදී;

ඡාතපබ්බතපාදම්හි, ඡාතපර්වතපාදයෙහි; වෙළුයට්ඨිතයො අහු, හුණයට තුනෙක්වූහු; සෙතා රජතයට්ඨීව, රජතමය යටක්මෙන් ශුභ්‍රවූ; ලතා, එහි චිත්‍රකර්මාන්තකලාක් මෙන් දෘශ්‍යමානවූ ලතා තොමෝ; කඤ්චනසන්නිභා, කසුන් සමානවීය;

නීලාදියාදිසං පුප්ඵං, (ලෙව්හි) නීලාදී යම්බඳු වර්ණයෙන්යුත් පුෂ්පයෝ ඇද්ද; පුප්ඵයට්ඨිම්හි තාදිසං, පුෂ්පයෂ්ටියෙහි එබඳුව වැටහෙත්; සකුණයට්ඨිම්හි, සකුණයෂ්ටියෙහි සරූපෙන එව, ස්වරූපයෙන්ම; සකුණා, පක්ෂීහු; සණ්ඨිතා'ති, පිහිටියාහුයයි;

සමුද්දතොපිස්ස මුත්තාමණිවෙළුරියාදිඅනෙකවිහිතං රතනං උප්පජ්ජි. තම්බපණ්ණියං පන අට්ඨමුත්තා උප්පජ්ජිංසු: හයමුත්තා ගජමුත්තා රථමුත්තා ආමලකමුත්තා වලයමුත්තා අඞ්ගුලිවෙඨකමුත්තා කකුධඵලමුත්තා පාකතිකමුත්තාති.

සො තා ච යට්ඨියො තා ච මුත්තා අඤ්ඤඤ්ච බහුං රතනං අසොකස්ස ධම්මරඤ්ඤො පණ්ණාකාරත්ථාය පෙසෙසි. අසොකො පසීදිත්වා තස්ස පඤ්චරාජකකුධභණ්ඩානි පහිණි: ඡත්තං චාමරං ඛග්ගං

---

සමුද්දතොපි, මුහුදින්ද; අස්ස, මේ රජහට; මුත්තාමණිවෙළුරියාදි, මුතුමැණික් වෛදූර්‍ය්‍යාදීවූ; අනෙකවිහිතං රතනං, අනෙකප්‍රකාර රත්න; උප්පජ්ජි, උපන; (මුහුදෙන් තෙමේම තීරයට නැඟී වෙලාන්ත යෙහි රළවෙගයෙන් උපන් පරිච්ඡෙදකළ වැටියක්මෙන් සිටියේය යන අදහසි.) තම්බපණ්ණියං පන, තාම්‍රපර්ණියෙහි වනාහි (සමුද්‍රයෙන් තෙමේම ගොඩනැඟී); හයමුත්තා, අශ්වරූප සටහන් මුතුද; ගජමුත්තා, හස්තිරූප සටහන් මුතුද; රථමුත්තා, රථසටහන් මුතුද; ආමලකමුත්තා, ඇඹුලඵලාකාර මුතුද; වලයමුත්තා, වලයාකාර මුතුද; අඞ්ගුලිවෙඨක මුත්තා, අඞ්ගුලිවෙඨකසටහන් මුතුද; (මුද්‍රිකා සටහන්ය යන අදහසි.) කකුධඵලමුත්තා, කුඹුක්ඵලාකාර බොහෝ අංශයන් ඇති මුතුද; පාකතිකමුත්තාති, ප්‍රකෘති මුතුද; (යන) අට්ඨමුත්තා, අටවැදෑරුම් මුතුද; උප්පජ්ජිංසු, උපන්හු; හෙවත් කියනලද ක්‍රමයෙන් සිටියාහු යයි දතයුතු;

සො, ඒ දෙවානම්පියතිස්ස රජතෙමේ; තා ච යට්ඨියො, ඒ යටිද; තා ච මුත්තා, ඒ මුතුද; අඤ්ඤඤ්ච බහුං රතනං, අනිකුදු බොහෝ රත්නද; අසොකස්සධම්මරඤ්ඤො, අශොකදහම් රදහට; පණ්ණාකාර ත්ථාය පෙසෙසි, පඬුරු පිණිස යැවුයේය; අසොකො, අශොකරද තෙමේ; පසීදිත්වා, පැහැද; තස්ස, ඒ රදහට; පඤ්චරාජකකුධභණ්ඩානි, පස්වැදෑරුම් රාජාහී උත්තම භාණ්ඩයන්; පහිණි, යැවූයේය; (ඒ රාජාහී භාණ්ඩයන් ස්වරූපයෙන් දක්වනු පිණිස ඡත්තං චාමරංති ප්‍රාරම්භ කලෝ:) ඡත්තං, ඡත්‍රය; චාමරං, චාමරය; ඛග්ගං, ඛඩ්ගය; මොළිං, මෞලිය; රතනපාදුකං, රන්මිරිවැඩි සඟලය; (යන පඤ්චවිධ රාජකකුධ භාණ්ඩයන්ද) අඤ්ඤඤ්ච බහුවිධං පණ්ණාකාරං, අනිකුදු බොහෝ පඬුරුද; අභිසෙකත්ථාය, අභිෂෙකය පිණිස (එවූයේය;) සෙය්‍යථිදං, ඔව්හු කවරහුද?; සඞ්ඛං, අභිෂෙකාසිඤ්චනය කරණ සාමුද්‍රික දක්ෂිණාවෘත්ත ශඞ්ඛය; ගඞ්ගොදකං, අනවතප්ත ජලය; වඩ්ඪමානං, අලඞ්කාර චූර්ණය; වටංසකං, කණ පලඳනාවය; භිඞ්කාරං, ස්වර්ණමය මහා කෙණ්ඩිය; නන්දියාවට්ටං, මඞ්ගල පිණිස කරණලද කාක පාදසටහන් ඇති ස්වර්ණභාජන විකෘතිය; සිවිකං, එනම් යානාවය; කඤ්ඤං, ක්‍ෂත්‍රිය කුමරිය; කටච්ඡුකං, ස්වර්ණමය හැන්දය; අධොවිමං දුස්සයුගං, කිළිටිවූ කල ගින්නෙහි ප්‍රක්ෂෙපකළ මාත්‍රයෙහි පිරිසිදුබවට පැමිණෙනලද

මොළිං රතනපාදුකං, අඤ්ඤඤ්ච අභිසෙකත්ථාය බහුවිධං පණ්ණාකාරං සෙය්‍යථිදං, සඞ්ඛං ගඞ්ගොදකං වඩ්ඪමානං වටංසකං භිඞ්කාරං නන්දියාවට්ටං සිවිකං කඤ්ඤං (කටච්ඡුකං) අධොවිමං දුස්සයුගං හත්ථපුඤ්ඡනං හරිචන්දනං අරුණවණ්ණමත්තිකං අඤ්ජනං හරීටකං ආමලකන්ති.

වුත්තම්පිචෙතං දීපවංසෙ:—

**"වාලවීජනි මුණ්හිසං-ඡත්තං ඛග්ගඤ්ච පාදුකං,**
**වෙඨනං සාර පාමඞ්ගං-භිඞ්කාරං නන්දිවට්ටකං.**

**සිවිකං සඞ්ඛං වටංසඤ්ච-අධොවිමං වත්ථකොටිකං,**
**සොවණ්ණ පාතිං කටච්ඡුං-මහග්ඝං හත්ථ පුඤ්ඡනං.**

---

එනම් වස්ත්‍ර යුග්මය; හත්ථපුඤ්ඡනං, රන්වන් මාහැඟි අත්පිස්නා පටවස්ත්‍රය; හරිචන්දනං, රන්වන් සඳුන්ය; (ලෝහිතචන්දය හෝ ගොසීත චන්දනය යන අර්ථයි, ඒ ගොසීතචන්දනය උදුනෙහි තකියන ලද තෙලෙහි බහාලූ මාත්‍රයෙහිම ඒ සියලුම තෙල් සිහිල්කිරීමට සමර්ථ වේ, එහෙයින්ම ගොසීත සඳුනැයි කියනලදී. "ගොසීත චන්දනං" යනු වෙත් "ගොසද්දෙන හි ජලං වුච්චති" තං විය සීතං චන්දනං=ගොසීත චන්දනං යී සාරාර්ථදීපනී ටීකායි.) අරුණවණ්ණමත්තිකං, (නාලොවින් ගෙණෙනලද) අරුණුවන් මැටිය; අඤ්ජනං, (එසේම නාලොවින් ගෙණෙනලද) අඳුන්ය; හරීටකං, (වහාම ශරීරමල ශොධනාදියට සමර්ථවූ දිව්‍යමය) අරළුය; ආමලකන්ති, (එසේමවූ) ඇඹුල ඵලය යන මොහුයි; දීපවංසෙ, දීපවංසයෙහි; එතම්පි ච වුත්තං, මෙයද කියනලදී.

වාලවීජනිං, වල්විදුනාවද; උණ්හීසං, නලල්පටද; ඡත්තං, ඡත්‍රයද; ඛග්ගඤ්ච,· ඛඩ්ගයද; පාදුකං, රන්මිරිවැඩි සඟලද; වෙඨනං, ශ්‍රීවෙෂ්ටනයද; සාරපාමඞ්ගං, උතුම්වූ රත්නපාමඞ්ග සූත්‍රයද; භිඞ්කාරං රන්කෙණ්ඩියද; නන්දිවට්ටකං, මඞ්ගල පිණිස කරණලද සවර්ණභාජන විකෘතියද;

සිවිකං, එනම් යානාවද; සඞ්ඛං, සාමුද්‍රික දක්ෂිණාවෘත්ත ශඞ්ඛයද; වටංසඤ්ච, කණ පලඳනාවද; අධොවිමං වත්ථකොටිකං, එනම් වස්ත්‍ර යුග්මයද; සොවණ්ණපාතිං, රන්තළියද; කටච්ඡුං, සවර්ණමය හැන්දද; මහග්ඝං හත්ථපුඤ්ඡනං, මාහැඟි අත්පිස්නද; අනොතත්තොදකං, අනවතප්තවිල දියද; කඤ්ඤං, ක්ෂත්‍රිය කුමාරිකාද; උත්තමං හරිචන්දනං, උතුම්වූ ගොසීත සඳුනද; අරුණවත්තිමත්තිකඤ්ච, අරුණුවන් මැටිද; නාගමාහටං අඤ්ජනං, නයින් විසින් ගෙණ එනලද අඳුනද; හරීටකං, දිව්‍යමය අරළුද; ආමලකං, දිව්‍යමය නෙල්ලිද; මහග්ඝං, මාහැඟිවූ; අමතොසධං, එනම් ගුලිකජාතියෙක්ද;

(අමෘතසදිසි කෘත්‍යය ඇතිහෙයින් අමතොසධයයි කියනලදී. ඒ ගුලිකයවනාහි පරිපන්ථිකයන් නසා සර්වාර්ථසිද්ධියට සමර්ථවූ බෙහෙත් ඖෂධසම්භාරයන් යොදා වැටිකොට කරණලද ගුලිකයෙක් නම් වේ.

**අනෝතත්තෝදකං කාජං-උත්තමං හරිචන්දනං.**
**අරුණවතී මත්තිකඤ්ච-අඤ්ජනං නාගමාහටං,**

**හරීටකං ආමලකං-මහග්ඝං අමතෝසධං.**
**සට්ඨිවාහසතං සාලිං-සුගන්ධං සුවකාහටං,**
**පුඤ්ඤකම්මාභි නිබ්බත්තං-පාහෙසි අසොකවහයො"ති.**

න කෙවලඤ්ච ඉදං ආමිසපණ්ණාකාරං, ඉමං කිර ධම්මපණ්ණාකාරම්පි පෙසෙසි:-

**"අහං බුද්ධඤ්ච ධම්මඤ්ච-සඞ්ඝඤ්ච සරණංගතො,**
**උපාසකත්තං වෙදෙසිං-සක්‍යපුත්තස්ස සාසනෙ.**

**ඉමෙසු තීසු වත්ථූසු-උත්තමෙසු නරුත්තම,**
**තුවම්පි චිත්තං පසාදෙහි-සද්ධා සරණමුපෙහී"ති.**

---

ඒ සුටිකාව වනාහි රජුන්ගේ මුඛ ධොවන සනාන කොළවර මහත් පෙරහරින් එළවන්නාහුය. ඒ සුටිකාවෙන් රජහු අඞ්ගරුග කොරෙත් එසේ කරන්නාහුද නලළ අංසකූටය උරමැද සඞ්ඛ්‍යාත අඞ්ගය සර්ජිත කොට, අඞ්ගරුගය කරත්යයි දතයුතු. ඒසුටිකා තොමෝ අහි විච්ඡිකාදින්ගේ විෂහරණය හෙයින්ද අමෘතෞෂධ යයි කියනලදී'.

පුඤ්ඤකම්මාභිනිබ්බත්තං, පුණ්‍යකර්මයෙන් උපන් සුවකාහටං ගිරවුන් විසින් ගෙණඑනලද; සුගන්ධං සාලිං; සුවඳ හැල්; සට්ඨි වාහසතං, සැටවාහ සියයෙක්ද; අසොකවහයො, අශොක නම් රජ තෙමේ; පාහෙසීති, එවූයේය;

• න කෙවලඤ්ච ඉදං ආමිස පණ්ණාකාරං, කෙවලව මේ ආමිස පඬුර පමණක්මද නොවේ; ඉමං කිර ධම්මපණ්ණාකාරම්පි, මේ දහම් පඬුරද; පෙසෙසි, එවූයේය;

අහං, මම; බුද්ධඤ්ච,(තත්ත්වාකාරයෙන් චතුස්සත්‍යා'වබොධයකළ) බුදුන්ද; ධම්මඤ්ච, (අවවාදනුශාසන පරිද්දෙන් පිළිපදින්නවුන් සිව් අපායෙහි නොහෙළා දරන්නාවූ) නවලොවුතුරු දහම්ද; **සඞ්ඝඤ්ච,** (සුප්‍රතිපන්නතාදී ගුණයන්ගෙන් යුක්තවූ) අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝයාද; සරණංගතො, සරණයයි ගියෙමි; සක්‍යපුත්තස්ස සාසනෙ, (ශාක්‍යවූ ශුද්ධොදන රජහුගේ පුත්‍රවූ) භගවත්හුගේ සස්නෙහි; උපාසකත්තං, (**රතනත්තයං උපාසතීති=උපාසකො** යි මෙසේ දක්වනලද) උපාසක භාවය; වෙදෙසිං, (මා කෙරෙහි වසවනලද වචනයේන්) ප්‍රකාශ කොළෙමියි (යනු අර්ථයි.)

නරුත්තම, නරොත්තමය; උත්තමෙසු ඉමෙසු තීසුවත්ථූසු, උතුම්වූ මේ වස්තුත්‍රයන්හි; තුවම්පි චිත්තංපසාදෙහි, තෝද සිත පහදුව; සද්ධා **සරණමුපෙහි ඉති, ශ්‍රද්ධාවෙන් සරණ යවයි;** (මෙහි "සද්ධාය" වියයුතු තන්හි ඡන්දනුරක්ෂණය පිණිස "සයං අභිඤ්ඤා සච්ඡිකත්වා" යනාදීන්හි මෙන් යකාරලොපයයි දතයුතු;)

සචායං රාජා තං දිවසං අසොකරඤ්ඤො පෙසිතෙන අභිසෙකෙන එකමාසාභිසිත්තො හොති. විසාඛපුණ්ණමායං හිස්ස අභිසෙකං අකංසු. සො අචිරස්සුතං තං සාසනපවත්තිං අනුස්සරමානො තං ථෙරස්ස "සමණා මයං මහාරාජ ධම්මරාජස්ස සාවකා"ති වචනං සුත්වා "අය්‍යානුඛො ආගතා?"ති තාවදෙව ආවුධං නික්ඛිපිත්වා එකමන්තං නිසීදි සම්මොදනීයං කථං කථයමානො. යථාහ:-

**"අවුධං නික්ඛිපිත්වාන-එකමන්තං උපාවිසි,**
**නිසජ්ජ රාජා සම්මොදි-බහුං අත්ථූපසංහිත"න්ති.**

සම්මොදනීයං කථඤ්ච කුරුමානෙයෙව තස්මිං තාතිපි චත්තාලීස පුරිස සහස්සානි ආගන්ත්වා තං පරිවාරෙසුං. තදා ථෙරො ඉතරෙපි ඡ ජනෙ දස්සෙසි.

---

සො අයං රාජා, ඒ මේ රදතෙමේ; තං දිවසං, එදවසම; අසොකරඤ්ඤො, පෙසිතෙන අභිසෙකෙන, අශොකරජ විසින් එවනලද අභිෂේකයෙන්; එකමාසාභිසිත්තො හොති, අභිෂේක කරණලද මොහුට එක්මසෙක් වේ;("එකො මාසො අභිසිත්තස්ස අස්සාති= එකමාසාභිසිත්තො",යි විග්‍රහයි.) අස්ස, මේ රදහට; විසාඛපුණ්ණමායංහි, වෛශාඛ පෞර්ණමියෙහිම; අභිසෙකං අකංසු, අබිසෙස් කළෝ; සො, හෙතෙමේ; අචිරස්සුතං තං සාසන පවත්තිං, නොබෝ කලකින් අසන ලද ඒ ශාසනප්‍රවෘත්තිය; අනුස්සරමානො, සිහිකරණසේක්; ථෙරස්ස, තෙරහුගේ; "සමණාමයං මහාරාජ ධම්මරාජස්ස සාවකාති", සමණාමයං -පෙ- සාවකා යන; තංවචනං සුත්වා, ඒ වචනය ශ්‍රවණයකොට; අය්‍යා, ආර්‍ය්‍යයෝ; ආගතානුඛොති, ආවාහුමයයි; තාවදෙව, එකෙණෙහිම; ආවුධං නික්ඛිපිත්වා, ආයුධය නික්ෂේපකොට; සම්මොදනීයං කථං කථයමානො, ("කච්චි භන්තෙ ඛමනීයං, කච්චි යාපනීයං" යනාදින් දක්වනලද) ප්‍රීති ප්‍රමෝද්‍ය සඞ්ඛ්‍යාත සන්තොෂය උපදවන්නාවූ කථාව කරමින්; එකමන්තංනිසීදි, එකත්පසෙක හුනී; යථාහ, මෙසේ කී;

ආවුධං නික්ඛිපිත්වාන, ආයුධය නික්ෂේපකොට; එකමන්තං උපාවිසි, එකත්පසකට පැමිණියේය; (එසේ පැමිණ) රාජා, රජතෙම; නිසජ්ජ, හිඳ; බහුං, බොහෝ; අත්ථූපසංහිතං, අර්ථයෙන් යුක්තවූ කථා වෙන්; සම්මොදීති, සතුටුවූයේයයි;

සම්මොදනීයං කථඤ්ච කුරුමානෙයෙව, සතුටු වියයුතු කථාව කරණ කල්හිම; තස්මිං, එහි; තාතිපි චත්තාලීසපුරිසසහස්සානි ආගන්ත්වා, හෙද සතලිස් දහසක් පුරුෂයෝ අවුත්; තං පරිවාරෙසුං, ඔහු පිරිවැරූහු; තදා, එකල්හි; ථෙරො, සථවිරතෙමේ; ඉතරෙපි ඡ ජනෙ දස්සෙසි, අනිකුදු ෂට්ජනයන් දැක්වී;

රාජා දිස්වා "ඉමෙ කදා ආගතා?"ති ආහ. මයා සද්ධිං යෙව මහාරාජාති. ඉදානි පන ජම්බුදීපෙ අඤ්ඤෙපි එවරූපා, සමණා සන්තීති? සන්ති මහාරාජ, එතරහි ජම්බුදීපො කාසාවපජ්ජොතො ඉසිවාතපටිවාතො. තස්මිං:

**තෙවිජ්ජා ඉද්ධිපත්තා ච-චෙතොපරියාය කොවිදා,**
**ඛීණාසවා අරහන්තො-බහූ බුද්ධස්ස සාවකාති.**

භන්තෙ කෙන ආගතත්ථාති?, නෙව මහාරාජ උදකෙන න ථලෙනාති. රාජා ආකාසෙන ආගතාති අඤ්ඤාසි. ථෙරො අත්ථි නු ඛො රඤ්ඤො පඤ්ඤාවෙය්‍යත්තියන්ති වීමංසනත්ථාය ආසන්නං අම්බරුක්ඛං ආරබ්භ පඤ්හං පුච්ඡි- කිං නාමො අයං මහාරාජ රුක්ඛොති? අම්බරුක්ඛො නාම භන්තෙති.

---

රාජා, රදතෙමේ; දිස්වා, දැක; "ඉමෙ කදා ආගතා"ති ආහ, මොව්හු කවදා ආවාහුදැයි විචාළේය; මහාරාජ!, මහරද!; මයා සද්ධිං යෙවාති, මා සැටුවමයයි (කීයේය.) ඉදානි පන, දැන් වනාහි; ජම්බුදීපෙ, දඹදිවැ; අඤ්ඤෙපි, අන්‍යද්; එවරූපා සමණා, මෙබඳු ශ්‍රමණයෝ; සන්තීති, ඇත්දැයි; (විචාළේය.) සන්තිමහාරාජ, ඇත මහරද; එතරහි, දැන්; ජම්බුදීපො, දඹදිව (තෙමේ); කාසාවපජ්ජොතො, කාෂාය වස්ත්‍රයෙන් ප්‍රජ්වලිතය; ඉසිවාතපටිවාතො, භික්ෂූන්ගේ (චීවර චලන කාය චලනයෙන් සඤ්ජනිතවූ) වාතයෙන් පැතුරුණේය; තස්මිං, එහි;

බුද්ධස්ස, බුදුහුගේ; තෙවිජ්ජා, (පූර්වේනිවාස, දිව්‍යචක්ෂුස්, ආශ්‍රවක්ෂය සඞ්ඛ්‍යාත) ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූද; ඉද්ධිපත්තාච, සෘද්ධිවිධ ඥාන ප්‍රාප්තවූද; චෙතො පරියාය කොවිදා, පරහුගේ චිත්තාචාරය දැනීමෙහි දක්ෂවූ; ඛීණාසවා, ක්ෂයකරණලද ආශ්‍රවයන් ඇත්තාවූ; අරහන්තො, අර්හත්වූ; සාවකා, ශ්‍රාවකයෝ; බහූති, බොහෝවෙත්යයි (කීහ.)

භන්තෙ, වහන්ස!; කෙන ආගතත්ථාති, කොයින් ආවාහුදැයි; මහාරාජ, මහරද; නෙව උදකෙන, ජලයෙන්ද නොවේ; න ථලෙනාති, ගොඩින්ද නොවේයයි; රාජා, රදතෙමේ; ආකාසෙන ආගතාති අඤ්ඤාසි, අහසින් ආවාහුයයි දත්හ; ථෙරො, ස්ථවිරතෙමේ; රඤ්ඤො, රජහුගේ; පඤ්ඤා වෙය්‍යත්තියං, ප්‍රඥාවගේ ව්‍යක්ත බවෙක්; අත්ථි නු ඛො, ඇත්තේ දැයි; වීමංසනත්ථාය, විමසනු පිණිස; ආසන්නං අම්බරුක්ඛං ආරබ්භ, වෙත පිහිටි අඹරුකක් අරභයා; පඤ්හං පුච්ඡි, පැණයක් විචාළේ; මහාරාජ, මහරද!; අයං රුක්ඛො, මේ වෘක්ෂයතෙම හෙවත් මේ රුක; කිං නාමොති, කිනම්දැයි; භන්තෙ, වහන්ස; අම්බරුක්ඛො නාමාති, අඹරුක නමැයි;

ඉමං පන මහාරාජ අම්බං මුඤ්චිත්වා අඤ්ඤෝ අම්බෝ අත්ථි නත්ථීති? අත්ථි භන්තෙ අඤ්ඤෙපි බහූ අම්බරුක්ඛාති. ඉමඤ්ච අම්බං තෙච අම්බෙ මුඤ්චිත්වා අත්ථි නුඛො මහාරාජ අඤ්ඤෙ රුක්ඛාති?, අත්ථි භන්තෙ තෙ පන න අම්බරුක්ඛාති. අඤ්ඤෙ අම්බෙ ච අනම්බෙ ච මුඤ්චිත්වා අත්ථි පන අඤ්ඤො රුක්ඛොති?, අයමෙව භන්තෙ අම්බ රුක්ඛොති. සාධු මහාරාජ පණ්ඩිතොසි.

අත්ථි පන තෙ මහාරාජ ඤාතකාති? අත්ථි මෙ භන්තෙ බහූ ජනාති. තෙ මුඤ්චිත්වා අඤ්ඤෙ කෙචි අඤ්ඤාතකාපි අත්ථි මහාරාජාති? අඤ්ඤාතකා භන්තෙ ඤාතකෙහි බහුතරාති? තව ඤාතකෙච අඤ්ඤාතකෙච මුඤ්චිත්වා අත්ථඤ්ඤො කොචි මහාරාජාති? අහමෙව භන්තෙති.

සාධු මහාරාජ අත්තා නාම අත්තනො නෙව ඤාතකො න අඤ්ඤා තකොති. අථ ථෙරො පණ්ඩිතො රාජා සක්ඛිස්සති ධම්මං අඤ්ඤාතුන්ති

---

මහාරාජ, මහරද; ඉමං පන අම්බං මුඤ්චිත්වා, මේ අඹරුක හැර; අඤ්ඤෝ අම්බෝ අත්ථි නත්ථීති, අනික් අඹරුකෙක් ඇත්තේද නැත් තේදැයි?; භන්තෙ, වහන්ස!; අඤ්ඤෙපි බහූ අම්බරුක්ඛා අත්ථීති, අනිකුදු බොහෝ අඹරුක් ඇත්තාහුයයි; ඉමඤ්ච අම්බං, මේ අඹරුකද; තෙච අම්බෙ මුඤ්චිත්වා, ඒ අඹරුක්ද හැර; මහාරාජ, මහරද; අඤ්ඤෙ රුක්ඛා අත්ථි නුඛොති, අනික් රුක් ඇත්තාහුදැයි?; අත්ථි භන්තෙ, ඇත වහන්ස; තෙ පන න අම්බරුක්ඛාති, ඒ වනාහි නොම අඹරුක්යයි, අඤ්ඤෙ අම්බෙච අනම්බෙච මුඤ්චිත්වා, අන්‍ය අඹරුක්ද අඹනොවූ රුක්ද හැර; අඤ්ඤො රුක්ඛො පන අත්ථීති, අනික් රුකෙක් ඇත්තේ දැයි?; භන්තෙ, වහන්ස!; අයමෙව අම්බරුක්ඛොති, මේ අඹරුකමයයි; සාධු මහාරාජ, යහපත මහරද!; පණ්ඩිතොසි, පණ්ඩිතවූයෙහිය;

මහාරාජ, මහරද!; තෙ පන, තොපගේ වනාහි; ඤාතකා අත්ථීති, නෑයෝ ඇත්තාහුදැයි?; භන්තෙ, වහන්ස!; මෙ, මාගේ; (ඤාතකා) බහූ ජනා අත්ථීති, (නෑවූ) බොහෝ ජනයෝ ඇත්තාහුයයි; තෙ මුඤ්චිත්වා, ඒ බොහෝදෙන හැර; මහාරාජ, මහරද!; අඤ්ඤෙ කෙචි අඤ්ඤාතකාපි අත්ථීති, අන්කිසි නොනෑයොත් ඇත්තාහුදැයි?; භන්තෙ, වහන්ස!; ඤාතකෙහි, නෑයන්ට වඩා; අඤ්ඤාතකා බහුතරාති, නොනෑයොත් බහුතරයයි; තව ඤාතකෙච අඤ්ඤාතකෙච මුඤ්චිත්වා, තොපගේ නෑයන්ද නොනෑයන්ද හැර; මහාරාජ, මහරද!; අඤ්ඤෙ කොචි, අත්ථීති, අන් කිසිවෙක් ඇත්තේදැයි?; අහමෙව භන්තෙති, මමය වහන්සැයි;

සාධු මහාරාජ, යහපත මහරද!; අත්තා නාම, තමා නම්; අත්තනො, තමහට; නෙව ඤාතකො, නෑ නොවේ; න අඤ්ඤාතකොති, නොනෑද නොවේ; අථ, ඉක්බිති; ථෙරො, සථවිරතෙම; රාජා පණ්ඩිතො, රද පණ්ඩි තය;ධම්මංඅඤ්ඤාතුං සක්ඛිස්සතීති, ධම්යදැනගැණීමට හැකිවන්නේ යයි;

**චූළහත්ථිපදොපම සුත්තං** කථෙසි. කථාපරියොසානෙ රාජා තීසු සරණෙසු පතිට්ඨහි සද්ධිං චත්තාළීසාය පාණසහස්සෙහි.

තං ඛණඤ්ඤෙව ච රඤ්ඤො භත්තං ආහරියිත්ථ. රාජා සුත්තන්තං සුණන්තො එවං අඤ්ඤාසි: "න ඉමෙසං ඉමස්මිං කාලෙ භොජනං කප්පතී"ති. අපුච්ඡිත්වා පන භුඤ්ජිතුං අයුත්තන්ති චින්තෙත්වා "භුඤ්ජිස්සථ භන්තෙ"ති පුච්ඡි.

න මහාරාජ අම්හාකං ඉමස්මිං කාලෙ භොජනං කප්පතීති. කස්මිං කාලෙ භන්තෙ කප්පතීති? අරුණුග්ගමනතො පට්ඨාය යාව මජ්ඣන්හිකසමයා මහාරාජාති. ගච්ඡාම භන්තෙ නගරන්ති. අලං මහාරාජ ඉධෙව වසිස්සාමාති. සචෙ භන්තෙ තුම්හෙ වසථ,

අයං දාරකො ආගච්ඡතූති. මහාරාජ අයං දාරකො ආගතඵලො විඤ්ඤාතසාසනො පබ්බජ්ජාපෙක්ඛො ඉදානි පබ්බජිස්සතීති.

---

චූලහත්ථිපදොපම සුත්තං කථෙසි, චූලහත්ථිපදොපම සූත්‍රය කීයේය; කථාපරියොසානෙ, කථාවගේ කෙළවර; රාජා, රදතෙමේ; චත්තාළීසාය පාණසහස්සෙහි සද්ධිං, හතළිස් දහසක් ප්‍රාණීන් සමග; තීසු සරණෙසු, තිසරණයෙහි; පතිට්ඨහි, පිහිටියේය;

තංඛණඤ්ඤෙවච, එකෙණෙහිමද; රඤ්ඤො, රජහට; භත්තං, ආහරියිත්ථ, බත් එළවූහ; රාජා, රදතෙම; සුත්තන්තං, සුණන්තො සුතුර අසනුයේ; "ඉමෙසං, මොවුන්ට; ඉමස්මිං කාලෙ, මේ කාලයෙහි; භොජනං නකප්පතීති, බොජුන් අකැපයයි; එවං අඤ්ඤාසි, (විකල් බොජුනෙන් බුද්ධාදීහු වැළක්කාහයි එම සූත්‍රයෙහි ප්‍රකාශ බැවින්) මෙසේ දනී; අපුච්ඡිත්වා පන, නොපිළිවිස වනාහි; භුඤ්ජිතුං අයුත්තන්ති චින්තෙත්වා, බුදින්ට අයුතුයයි සිතා; "භුඤ්ජිස්සථ භන්තෙ"ති පුච්ඡි, අනුභව කරව්ද වහන්සැයි පුළුවුත්හ;

මහාරාජ!, මහරද!; අම්හාකං, අපට; ඉමස්මිංකාලෙ මෙකල; භොජනං න කප්පතීති, බොජුන අකැපයයි; භන්තෙ!, වහන්ස!, කස්මිංකාලෙකප්පතීති, කවර කලෙක කැපදූයි?; මහාරාජ!, මහරද!; අරුණුග්ගමනතොපට්ඨාය, අරුණොද්ගමනය පටන්; යාව මජ්ඣන්හික සමයාති, මධ්‍යාහ්නකාලයදක්වායි; භන්තෙ!, වහන්ස!; නගරං ගච්ඡාමාති, නුවරට යමුයයි; අලංමහාරාජ!, කම්නැත මහරද!; ඉධෙව වසිස්සාමාති, මෙහිම වසන්නෙමුයයි;; භන්තෙ!, වහන්ස! තුම්හෙ; නුඹවහන්සේලා; සචෙවසථ; ඉදින් මෙහි වසව් නම්;

අයං දාරකො ආගච්ඡතූති, මේ ලදරුතෙම එනසේක්වායි; මහාරාජ!, මහරද!, අයංදාරකො, මේ ලදරුතෙමේ; ආගතඵලො, සම්ප්‍රාප්ත අනාගාමි ඵලයඇත්තේය; විඤ්ඤාතසාසනො, අවිපරීත කොට දන්නාලද ශාස්තෘශාසනය ඇත්තේය; පබ්බජ්ජාපෙක්ඛො, ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකය; ඉදානි පබ්බජිස්සතීති, දැන් පැවිදිවන්නේයයි; (ගිහිලිඞ්ගයෙන් ආ කෘත්‍යය නිම්බැවින් දැන් පැවිදිවන්නේය) කීහ;

රාජා "තෙනහි භන්තෙ සෙව රථං පෙසෙස්සාමි, තං අභිරුහිත්වා ආගච්ඡෙය්‍යාථා"ති වත්වා වන්දිත්වා පක්කාමි.

ථෙරො අචිරපක්කන්තස්ස රඤ්ඤො සුමනසාමණෙරං ආමන්තෙසි: එහි ත්වං සුමන ධම්මසවණස්ස කාලං ඝොසෙහීති. භන්තෙ කිත්තකං ඨානං සාවෙන්තො ඝොසෙමීති? සකලං තම්බපණ්ණිදීපන්ති. සාධු භන්තෙති සාමණෙරො අභිඤ්ඤාපාදකං චතුත්ථජ්ඣානං සමාපජ්ජිත්වා වුට්ඨාය අධිට්ඨහිත්වා සමාහිතෙන චිත්තෙන සකලං තම්බපණ්ණිදීපං සාවෙන්තො තික්ඛත්තුං ධම්මසවණස්ස කාලං ඝොසෙසි.

රාජා තං සද්දං සුත්වා ථෙරානං සන්තිකං පෙසෙසි-කිං භන්තෙ අත්ථි කොචි උපද්දවොති?, නත්ථම්හාකං කොචි උපද්දවො

---

රාජා, රදතෙම; "තෙනහි භන්තෙ!, එසේනම් වහන්ස!; සෙවරථං පෙසෙස්සාමි, සෙට රථය එවන්නෙමියි; තං අභිරුහිත්වා ආගච්ඡෙය්‍යාථාති වත්වා, එයට නැගී එනුමැනවයි" කියා; වන්දිත්වා, වැඳ; පක්කාමි, ගියේය;

ථෙරො, ස්ථවිරතෙමේ; රඤ්ඤො අචිරපක්කන්තස්ස, රදගිය නොබෝකලැ; ("අචිරපක්කන්තස්ස" යනුවෙන් "රඤ්ඤෙ අචිරපක්කන්තෙ"ති අත්ථොසිවනු.) සුමන!, සුමනය!; ත්වං, තෝ; එහි, අවමැනව!; ධම්මසවණස්ස, ධර්මශ්‍රවණයට; කාලංඝොසෙහීති, කාල ඝොෂාකරවයි (කියා); සුමනසාමණෙරං, සුමනසාමණෙරයාට; ආමන්තෙසි, අඬගැවේය; භන්තෙ!, වහන්ස; කිත්තකංඨානං, කොපමණ තැනකට; සාවෙන්තො, අස්වමින්; ඝොසෙමීති, ශබ්දකෙරෙම්දැයි?; සකලං තම්බපණ්ණිදීපන්ති, සියලු තාම්‍රපර්ණී ද්වීපයටයයි; සාධු භන්තෙති, යහපත වහන්සැයි කියා; සාමණෙරො, සාමණෙරතෙමේ; අභිඤ්ඤාපාදකං චතුත්ථජ්ඣානං සමාපජ්ජිත්වා, අභිඥපාදක චතුර්ථධ්‍යානයට සමවැද; වුට්ඨාය, (එයින්) නැගිට; අධිට්ඨහිත්වා, (තාම්‍රපර්ණී ද්වීපය තුළ රැස්වූවාහු අසත්වායි) අධිෂ්ඨානකොට; සමාහිතෙන චිත්තෙන, එකඟවූ සිතින්; සකලං තම්බපණ්ණිදීපං සාවෙන්තො, සියලු තාම්‍රපර්ණී ද්වීපයට අස්වමින්; තික්ඛත්තුං, තුන් යලක්; ධම්මසවණස්ස කාලං ඝොසෙසි, ධර්මශ්‍රවණයට කාලඝොෂා කෙළේය;

රාජා, රජතෙමේ; තං සද්දං සුත්වා, ඒ ශබ්දය අසා; කිංභන්තෙ!, කිමෙක්ද වහන්ස!; කොචි උපද්දවොඅත්ථීති, කිසි උවදුරෙක් ඇති දැයි; ථෙරානං සන්තිකංපෙසෙසි, තෙරුන්ගේ වෙතට යැවී.; අම්හාකං කොචි උපද්දවො නත්ථීති, අපට කිසි උවදුරෙක් නැතැයි;

ධම්මසවණස්ස කාලං ඝොසාපයිම්හ, බුද්ධවචනං කථෙතුකාමම්හාති. තඞ්ඛපත සාමණෙරස්ස සද්දං සුත්වා භුම්මා දෙවතා සද්දමනුස්සාවෙසුං. එතෙනුපායෙන යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගඤ්ඡි.

තෙන සද්දෙන මහාදෙවතා සන්නිපාතො අහොසි. ථෙරො මහන්තං දෙවතාසන්නිපාතං දිස්වා **සමචිත්තසුත්තන්තං** කථෙසි. කථාපරියොසානෙ අසඞ්ඛෙය්‍යානං දෙවතානං ධම්මාභිසමයො අහොසි. බහූ නාගා ච සුපණ්ණා ච සරණෙසු පතිට්ඨහිංසු. යාදිසොව සාරිපුත්තත්ථෙරස්ස සුත්තන්තං කථයතො දෙවතාසන්නිපාතො අහොසි, තාදිසො මහින්දත්ථෙරස්සාපි ජාතො.

අථ තස්සා රත්තියා අච්චයෙන රාජා ථෙරානං රථං පෙසෙසි. සාරථි රථං එකමන්තෙ ඨපෙත්වා ථෙරානං ආරොචෙසි: ආභතො භන්තෙ රථො අභිරුහථ ගච්ඡිස්සාමාති. ථෙරා න මයං රථං අභිරුහාම,

---

ධම්මසවණස්ස කාලං ඝොසාපයිම්හ, ධර්මශ්‍රවණයට කාල ඝොෂාකරවූම්හ; බුද්ධවචනං කථෙතුකාමම්හාති, බුදුවචනය කියනුකැමැත්තම්හයි කී;. තඞ්ඛපත, හෙදවතාහි; සාමණෙරස්ස සද්දං සුත්වා, සාමණෙරයාගේ ශබ්දශ්‍රවණයකොට; භුම්මා දෙවතා, භුම්‍යස්ථ දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, ශබ්දශ්‍රවණය කළෝ; එතෙනුපායෙන, මෙම උපායෙන්; යාව බ්‍රහ්මලොකා, බඹලොව දක්වා; සද්දො, ශබ්දයතෙමේ; අබ්භුග්ගඤ්ඡි, ඉතා උස්ව පැන නැංගේය;.

තෙන සද්දෙන, ඒ ශබ්දය කරණකොටගෙණ; මහාදෙවතා සන්නිපාතො අහොසි, මහත්වූ දෙවතාසන්නිපාතය වූයේය;. ථෙරො, ස්ථවිරතෙමේ; මහන්තං දෙවතා සන්නිපාතං දිස්වා, මහත්වූ දෙවතා සන්නිපාතය දැක; සමචිත්තසුත්තන්තං කථෙසි, සමචිත්ත සූත්‍රාන්තය කථනය කෙළේයි; කථාපරියොසානෙ, කථා පිරියතැ; අසඞ්ඛෙය්‍යානං දෙවතානං, ගණන පථාතික්‍රාන්ත දෙවියන්ට; ධම්මාභිසමයො අහොසි, ධර්මාභිසමය වූයේය; බහූ නාගාච සුපණ්ණාච, බොහෝ නාගසුපර්ණයෝද; සරණෙසු පතිට්ඨහිංසු, සරණයන්හි පිහිටියෝ; සුත්තන්තං කථයතො, සූත්‍රාන්තය කියන්නාවූ; සාරිපුත්තත්ථෙරස්ස, සැරියුත් තෙරහට; යාදිසොව දෙවතා සන්නිපාතො අහොසි, යම් බඳුවූම දෙවතා සන්නිපාතයක්වූද; මහින්දත්ථෙරස්සාපි, මිහිඳුතෙරහටද; තාදිසො ජාතො, එබඳුවූයේය;.

අථ, ඉක්බිති; තස්සාරත්තියා අච්චයෙන, ඒ රාත්‍රියගේ ඇවෑමෙන්; රාජා, රදතෙමේ; ථෙරානං, තෙරුන්ට; රථං පෙසෙසි, රථය යැවී; සාරථි, රථාචාර්‍ය්‍යතෙමේ; රථං, රථය; එකමන්තෙ ඨපෙත්වා, එකත්පසෙකතබා; ථෙරානං, තෙරුන්ට; භන්තෙ! වහන්ස! රථො ආභතො, රථය ගෙණ එනලද්දේය; අභිරුහථ, (රථයට) නැඟෙනු මැනව; ගච්ඡිස්සාමාති, යන්නමෝයයි; ආරොචෙසි, දැන්වී; ථෙරා, තෙරහු; මයං, අපි; රථං න අභිරුහාම, රථයට නොනැඟෙම්හ;

ගච්ඡ ත්වං, පච්ඡා මයං ආගච්ඡිස්සාමාති වත්වා වෙහාසං අබ්භුග්ගන්ත්වා අනුරාධපුරස්ස පුරත්ථිමදිසායං **පඨමකචෙතියට්ඨානෙ** ඔතරිංසු. තංහි චෙතියං ථෙරෙහි පඨමං ඔතිණ්ණට්ඨානෙ කතත්තායෙව **පඨමක චෙතිය**න්ති වුච්චති.

රාජාපි සාරථිං පෙසෙත්වා "අන්තො නිවෙසනෙ මණ්ඩපං පටියාදෙථා"ති අමච්චෙ ආණාපෙසි. තාවදෙව සබ්බෙ හට්ඨතුට්ඨා අතිවිය පාසාදිකං මණ්ඩපං පටියාදෙසුං. පුන රාජා චින්තෙසි: හියො ථෙරො සීලක්ඛන්ධං කථයමානො උච්චාසයන මහාසයනං න කප්පතීති ආහ, නිසීදිස්සන්ති නු ඛො අය්‍යා ආසනෙසු න නිසීදිස්සන්තීති.

තස්සෙවං චින්තයන්තස්සෙව සො සාරථි නගරද්වාරං සම්පත්තො, තතො අද්දස ථෙරෙ පඨමතරං ආගන්ත්වා කායබන්ධනං බන්ධිත්වා චීවරං පාරුපන්තෙ. දිස්වා අතිවිය පසන්නචිත්තො හුත්වා ආගන්ත්වා රඤ්ඤො

---

ගච්ඡ ත්වං, තොප යව; මයං, අපි; පච්ඡා ආගච්ඡිස්සාමාති වත්වා, පසුව එන්නමෝයයි කියා; වෙහාසංඅබ්භුග්ගන්ත්වා, අහසට පැනනැගී; අනුරාධ පුරස්සපුරත්ථිමදිසායං, අනුරාධපුරයට පූර්වදිශාවෙහි; පඨමකචෙතියට්ඨා නෙ ප්‍රථම චෛත්‍යස්ථානයෙහි; ඔතරිංසු, බැස්සාහුය; තංහි චෙතියං, ඒ චෛත්‍යය වනාහි; ථෙරෙහි, තෙරුන් විසින්; පඨමංඔතිණ්ණට්ඨා නෙ, පළමුබටුතන්හි; කතත්තායෙව, කළබැවින්ම; පඨමකචෙතියන්ති වුච්චති, ප්‍රථමචෛත්‍යයයි කියනුලැබේ;

රාජාපි, රජතෙමේද; සාරථිං පෙසෙත්වා, රියැදුරායවා; "අන්තො නිවෙසනෙ, ඇතුළු නිවෙස්නෙහි; මණ්ඩපං පටියාදෙථා"ති, මණ්ඩපයක් ප්‍රතිපාදනය කරවියයි; අමච්චෙ ආණාපෙසි, ඇමතියන්ට අණවී; තාව දෙව, එපමණකින්ම; සබ්බෙ, සියල්ලෝ; හට්ඨතුට්ඨා, තුටුපහටුව; අති විය පාසාදිකං, ඉතාම ප්‍රසාදවහවූ; මණ්ඩපං පටියාදෙසුං, මණ්ඩපයක් ප්‍රතිපාදනය කළෝ; පුන, නැවත; රාජා, රදතෙමේ; චින්තෙසි, සිතී; හියො, ඊයේ; ථෙරො, ස්ථවිරතෙමේ; සීලක්ඛන්ධං කථයමානො, ශීල ස්කන්ධය කථනය කෙරෙමින්; උච්චාසයනමහාසයනං නකප්පතීති ආහ, උසසුන් මහසුන් අකැපයයි කීහ; ආසනෙසු, අසුන්හි; අය්‍යා, ආය්‍ර්‍යයෝ; නිසීදිස්සන්ති නු ඛො, හිඳින්නාහුද; න නිසීදිස්සන්තීති, නොහිඳින්නාහුදැයි;

තස්සෙවං චින්තයන්තස්සෙව, ඔහු මෙසේ සිතියදීම; සො සාරථි, ඒසාරථිතෙමේ; නගරද්වාරං සම්පත්තො, නුවරදොරට පැමිණියේය; තතො, ඉන්පසු; පඨමතරං, පළමුකොටම; ආගන්ත්වා, අවුත්; කාය බන්ධනං බන්ධිත්වා, කාබාන බැඳ; චීවරං පාරුපන්තෙ, සිවුරු පොරවනුවූ; ථෙරෙ, තෙරුන්; අද්දස, දිටී දිස්වා, දැක; අති වියපසන්නචිත්තො හුත්වා, ඉතා පහන්සිත් ඇතිව; ආගන්ත්වා, අවුත්; දෙව, දෙවයෙනි; ථෙරා ආගතාති, තෙරහු ආවාහුයයි;

ආරොචෙසි. ආගතා දෙව ථෙරාති. රාජා-රථං ආරූළ්හාති? පුච්ඡි. න ආරූළ්හා දෙව, අපි ච මම පච්ඡතො නික්ඛමිත්වා පඨමතරං ආගන්ත්වා පාචීනද්වාරෙ ඨිතාති. රාජා රථම්පි නාරූහිංසූති සුත්වා න'දානි අය්‍යා උච්චාසයනමහාසයනං සාදියිස්සන්තීති චින්තෙත්වා තෙනහි භණෙ ථෙරානං භුම්මත්ථරණසඞ්ඛෙපෙන ආසනානි පඤ්ඤපෙථාති වත්වා පටිපථං අගමාසි.

අමච්චා පථවියං තට්ටිකං පඤ්ඤපෙත්වා උපරි කොජවකාදීනි විචිත්‍රත්ථරණානි පඤ්ඤපෙසුං. උප්පාතපාඨකා දිස්වා "ගහිතා'දානි ඉමෙහි පථවී, ඉමෙ තම්බපණ්ණිදීපස්ස සාමිකා භවිස්සන්තී"ති ව්‍යාකරිංසු.

රාජාපි ගන්ත්වා ථෙරෙ වන්දිත්වා මහින්දත්ථෙරස්ස හත්ථතො පත්තං ගහෙත්වා මහතියා පූජාය ච සක්කාරෙන ච ථෙරෙ නගරං පවෙසෙත්වා

---

රඤ්ඤො ආරොචෙසි, රජහට දන්වූයේය; රාජා, රදතෙම; රථං ආරූළ්හාති පුච්ඡි, රථයට නැංගාහුදැයි පුළුවුත්හ; දෙව, දෙවයෙනි; න ආරූළ්හාති, නොනැගියෝයයි; අපිච, එතකුදුවුවත්; මම පච්ඡතො නික්ඛමිත්වා, මාගේ පස්සෙන් නික්මැ; පඨමතරං ආගන්ත්වා, පළමුකොටම අවුත්; පාචීනද්වාරෙඨිතාති, පැළදෙර සිටියෝයයි; රාජා, රජතෙමේ; රථම්පි නාරූහිංසූති සුත්වා, රථයටද නොනැංගාහුයයි අසා; ඉදානි, දැන්; අය්‍යා, ආර්‍ය්‍යයෝ; උච්චාසයනමහාසයනං න සාදියිස්සන්තීති චින්තෙත්වා, උසසුන් හා මහසුන් නොම ඉවසන්නාහුයයි සිතා; තෙනහි භණෙ, එහෙනම් සගයෙනි; ථෙරානං, තෙරුන්ට; භුම්මත්ථරණසඞ්ඛෙපෙන, බුමුතුරුණු ආකාරයෙන්; ආසනානි පඤ්ඤපෙථාති වත්වා, අසුන් පනවව්යයි කියා; පටිපථං අගමාසි, පෙරමඟට ගියේය;

අමච්චා, ඇමතියෝ; පථවියං, පෘථිවියෙහි; තට්ටිකං පඤ්ඤපෙත්වා, පුටුවක් පනවා; උපරි, මතුයෙහි; කොජවකාදීනි, කොඳු පලස් ආදීවූ; විචිත්‍රත්ථරණානි විසිතුරු ආස්තරණයන්; පඤ්ඤපෙසුං, පැනවූහු; උප්පාතපාඨකා, නිමිත්ත පාඨකයෝ; (නෛමිත්තිකයෝය යන අර්ථයි) දිස්වා, දැක; ඉදානි දැන්; ඉමෙහි, මොවුන් විසින්; පථවී ගහිතා පෘථිවීතොමෝ ගන්නාලදු; ඉමෙ, මොව්හු; තම්බපණ්ණිදීපස්සසාමිකා භවිස්සන්තීති, තාම්‍රපර්ණීද්වීපයට හිමියෝ වන්නාහුයයි; ව්‍යාකරිංසු, ප්‍රකාශකළෝ;

රාජාපි, රජතෙමේද; ගන්ත්වා, ගොස්; ථෙරෙවන්දිත්වා, තෙරුන් වැඳ; මහින්දත්ථෙරස්ස හත්ථතො, මිහිඳුතෙර අතින්; පත්තං ගහෙත්වා, පාත්‍රය ගෙණ; මහතියා පූජායච, මහත් පූජාවෙන්ද; සක්කාරෙනච, සත්කාරයෙන්ද; ථෙරෙ, තෙරුන්; නගරං පවෙසෙත්වා, නුවරට

අන්තො නිවෙසනං පවෙසෙසි. ථෙරො ආසනපඤ්ඤත්තිං දිස්වා අම්හාකං සාසනං සකලලඞ්කාදීපෙ පථවී විය පත්ථටං නිච්චලඤ්ච හුත්වා පතිට්ඨහිස්සතීති චින්තෙන්තො නිසීදි.

රාජා ථෙරෙ පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා අනුලාදෙවිප්පමුඛානි පඤ්චඉත්ථිසතානි ථෙරානං අභිවාදනං පූජාසක්කාරඤ්ච කරෙන්තූති පක්කොසාපෙත්වා එකමන්තං නිසීදි. ථෙරො භත්තකිච්චාවසානෙ රඤ්ඤො සපරිජනස්ස ධම්මරතනවස්සං වස්සෙන්තො පෙතවත්ථුං විමානවත්ථුං සච්චසංයුත්තඤ්ච කථෙසි.

තං ථෙරස්ස ධම්මදෙසනං සුත්වා තානි පඤ්චපි ඉත්ථිසතානි සොතාපත්තිඵලං සච්ඡිකරිංසු.

---

ප්‍රවෙශකරවා; අන්තො නිවෙසනං, ඇතුල් නිවෙස්නට; පවෙසෙසි, ප්‍රවෙශකරවී; ථෙරො, ස්ථවිරතෙමේ; ආසනපඤ්ඤත්තිං දිස්වා, අසුන් පැනවීම දැක; අම්හාකං සාසනං, අපගේ සස්න; සකලලඞ්කාදීපෙ, සියලු ලක්දිවැ; පථවිවිය, පෘථිවිය මෙන්; පත්ථටං, පැතිර; නිච්චලඤ්චහුත්වා, නිසලවම; පතිට්ඨහිස්සතීති, පිහිටන්නේයයි; චින්තෙන්තො, සිතමින්; නිසීදි, හුන්සේක;

රාජා, රජතෙමේ; ථෙරෙ, තෙරුන්; පණීතෙන, උතුම්වූ; ඛාදනීයෙන භොජනීයෙන, ඛාද්‍යභොජ්‍යයෙන්; සහත්ථා සන්තප්පෙත්වා, සිය තින් සතප්වා; සම්පවාරෙත්වා, සම්ප්‍රවාරණය කරවා; අනුලාදෙවිප්පමුඛානි, අනුලාදෙවිය ප්‍රමුඛවූ; පඤ්චඉත්ථිසතානි, පන්සියයක් ස්ත්‍රීහු; ථෙරානං, තෙරුන්ට; අභිවාදනං, අභිවාදනයද; පූජාසක්කාරඤ්ච, පූජා සත්කාරයද කරෙන්තූති, කරත්වායි;(කියා)පක්කොසාපෙත්වා, කැඳවා; එකමන්තං නිසීදි, එකත්පසෙක හුන්නේය; ථෙරො, ස්ථවිරතෙමේ; භත්තකිච්චාවසානෙ, බත්කිස අවසානයෙහි; සපරිජනස්ස රඤ්ඤො, පිරිවර ජනයා සහිත රදහට; ධම්මරතනවස්සං වස්සෙන්තො, දම්රුවන් වැසි වස්සනුයේ; පෙතවත්ථුං, (දෙශනාවිධියෙහි දක්‍ෂවූ තෙර සත්නට සංවෙග උපදවනු පිණිස පළමුකොට) ප්‍රෙතවස්තුවද; විමානවත්ථුං, (තදනන්තරව සංවෙගප්‍රාප්ත ජනයා අස්වසනු පිණිස) විමානවස්තුවද; සච්චසංයුත්තඤ්ච, (එයට අනතුරුව මෙහි ආස්වාද නොකරව, නිර්වාණය හැර අන්කිසි නිත්‍යවූවක් නැත, එහෙයින් පරමාශ්වාස නිවණට පැමිණෙන්ට ව්‍යායාම් කරව්යයි උත්සාහ උපදවමින් කෙළවර) සච්චසංයුත්තකථාවද; කථෙසි, වදාළේය;

ථෙරස්ස, තෙරහුගේ; තංධම්මදෙසනං සුත්වා, ඒ දම්දෙසුම අසා; තානිපඤ්චපිඉත්ථිසතානි, ඒ පන්සියයක් ස්ත්‍රීහුද; සොතාපත්තිඵලං සච්ඡිකරිංසු, සොතාපත්තිඵලය ප්‍රත්‍යක්‍ෂකළෝ;

යෙපි තෙ මනුස්සා පුරිමදිවසෙ මිස්සකපබ්බතෙ ථෙරෙ අද්දසංසු, තෙ තෙසු තෙසු ඨානෙසු ථෙරානං ගුණෙ කථෙන්ති. තෙසං සුත්වා මහාජනකායො රාජඞ්ගණෙ සන්නිපතිත්වා මහාසද්දං අකාසි.

රාජා "කිං එසො සද්දො"ති පුච්ඡි. නාගරා දෙව ථෙරෙ දට්ඨුං න ලභාමාති විරවන්තීති. රාජා සචෙ ඉධ පවිසිස්සන්ති ඔකාසො න භවිස්සතීති චින්තෙත්වා "ගච්ඡථ භණෙ හත්ථිසාලං පටිජග්ගිත්වා වාලුකං ආකිරිත්වා පඤ්චවණ්ණානි පුප්ඵානි විකිරිත්වා චෙලවිතානං බන්ධිත්වා මඞ්ගලහත්ථිට්ඨානෙ ථෙරානං ආසනානි පඤ්ඤපෙථා"ති ආහ.

අමච්චා තථා අකංසු. ථෙරො තත්ථ ගන්ත්වා නිසීදිත්වා **දෙවදූතසුත්තන්තං** කථෙසි. කථාපරියොසානෙ පාණසහස්සං සොතාපත්තිඵලෙ පතිට්ඨහි. තතො හත්ථිසාලා අතිසම්බාධාති දක්ඛිණවාරෙ නන්දනවනුය්‍යානෙ ආසනං පඤ්ඤපෙසුං.

---

යෙපිතෙමනුස්සා, යම් ඒ මනුෂ්‍යකෙණෙක්; පුරිමදිවසෙ, පළමු දිනයෙහි; මිස්සකපබ්බතෙ, මිශ්‍රක පර්වතයෙහිදී; ථෙරෙ අද්දසංසු, තෙරුන් දුටුවාහුද; තෙ, ඔව්හු; තෙසුතෙසුඨානෙසු, ඒ ඒ තන්හි; ථෙරානං, තෙරුන්ගේ; ගුණෙ කථෙන්ති, ගුණයන් කියත්; තෙසං සුත්වා, ඔවුන්ගේ සමීපයෙන් අසා; මහාජනකායො, මහත්ජනසමූහ තෙමේ; රාජඞ්ගණෙසන්නිපතිත්වා, රජමිදුලෙහි රැස්ව; මහාසද්දං අකාසි, මහත් ශබ්දකෙළේය;

රාජා, රජතෙමේ; "කිං එසො සද්දො" ති. කිනම් මේ ශබ්දයෙක් දැයි; පුච්ඡි, විචාළේය; දෙව, දෙවයෙනි; නාගරා, නුවරවැසියෝ; ථෙරෙ දට්ඨුං නලභාමාති, තෙරුන් දක්නට නොලබමෝයි; විරවන්තීති, විලාප කියත්යයි; රාජා, රජතෙමේ; ඉධ, මෙහි; සචෙ පවිසිස්සන්ති, ඉදින් ප්‍රවිෂ්ටවන්නාහු නම්; ඔකාසො නභවිස්සතීති චින්තෙත්වා, අවකාශ නොවන්නේයයි සිතා; භණෙ, සගයෙනි; ගච්ඡථ, යව්; හත්ථිසාලං පටිජග්ගිත්වා, ඇත්හල ප්‍රතිජග්ගනයකොට; වාලුකං ආකිරිත්වා, වැලිඅතුරා; පඤ්චවණ්ණානි පුප්ඵානි විකිරිත්වා, පඤ්චවර්ණ පුෂ්පයන් විසුරුවා; චෙලවිතානං බන්ධිත්වා, සෙල්වියන්බැඳ; මඞ්ගලහත්ථිට්ඨානෙ, මඟුලැතු සිටිතැන; ථෙරානං, තෙරුන්ට; ආසනානි පඤ්ඤපෙථාති ආහ, අසුන් පනවව් යයි කීහ;

අමච්චාතථා අකංසු, ඇමතියෝ එසේ කළෝ; ථෙරො. සථවිර තෙම; තත්ථගන්ත්වා, එහි ගොස්; නිසීදිත්වා, හිඳ; දෙවදූතසුත්තන්තං කථෙසි, දෙවදූත සූත්‍රය වදාළේය; කථාපරියොසානෙ, කථාකෙළවර; පාණසහස්සං, ප්‍රාණීන්ගෙන් දහසක්; සොතාපත්තිඵලෙ පතිට්ඨහි, සෝවාන් ඵලෙහි පිහිටියේය; තතො, ඉන්පසු; හත්ථිසාලා අති සම්බාධාති, ඇත්හල අතිසම්බාධයයි; දක්ඛිණවාරෙ, දකුණු දෙර වෙත; නන්දනවනුය්‍යානෙ, නන්දනවනොද්‍යානයෙහි; ආසනංපඤ්ඤපෙසුං, අස්නක් පැනවූහ;

ථෙරො තත්ථ නිසීදිත්වා **ආසිවිසොපමසුත්තං** කථෙසි. තම්පි සුත්වා පාණසහස්සං සොතාපත්තිඵලං පටිලභි. එවං ආගතදිවසතො දුතියදිවසෙ අඩ්ඪතෙය්‍යානං සහස්සානං ධම්මාභිසමයො අහොසි.

ථෙරස්ස නන්දනවනෙ ආගතාගතාහි කුලිත්ථීහි කුලසුණ්හාහි කුලකුමාරීහි සද්ධිං සම්මොදමානස්සෙව සායන්හසමයො ජාතො. ථෙරො කාලං සල්ලක්ඛෙත්වා ගච්ඡාමී'දානි මිස්සකපබ්බතන්ති උට්ඨහි. අමච්චා කත්ථ භන්තෙ ගච්ඡථාති? අම්හාකං නිවෙසනට්ඨානන්ති.

තෙ රඤ්ඤො සංවිදිතං කත්වා රාජානුමතෙන ආහංසු: අකාලො භන්තෙ ඉදානි තත්ථ ගන්තුං, ඉදමෙව නන්දනවනුය්‍යානං අය්‍යානං ආවාසට්ඨානං හොතූති. අලං ගච්ඡාමාති. පුන රඤ්ඤො වචනෙනාහංසු:

---

ථෙරො, ස්ථවිරතෙමේ; තත්ථ, නිසීදිත්වා, එහි හිඳ: ආසිවිසොපම සුත්තං කථෙසි, ආශීවිෂොපම සූත්‍රය වදාළේය; තම්පි සුත්වා, හෙද අසා; පාණසහස්සං, ප්‍රාණීන් දහසක්; සොතාපත්තිඵලං පටිලභි, සෝවාන් ඵලය පිළි ලැබූයේය; එවං, මෙසේ; ආගතදිවසතො, ආදින පටන්; දුතිය දිවසෙ, දෙවන දිනයෙහි; අඩ්ඪතෙය්‍යානං සහස්සානං පන්සිය යක් අධිකකොට ඇති දෙදහසකට; ධම්මාභිසමයො අහොසි, ධර්මාභි සමය වූයේය;

ආගතාගතාහි, ආආවාවූ; කුලිත්ථීහි, කුලස්ත්‍රීන් ද; කුලසුණ්හාහි, කුලයෙහෙලින්ද; කුලකුමාරීහි සද්ධිං, කුලකුමාරීන්ද සමග; සම්මොද මානස්සෙව ථෙරස්ස, සතුටුවනුවූ මහතෙරහට; නන්දනවනෙ, නඳුන් වෙනෙහිදී; සායන්හසමයො ජාතො, සවස්කාලය වූයේය; ථෙරො, ස්ථවිරතෙමේ; කාලං සල්ලක්ඛෙත්වා, කල් සළකා; ඉදානි, දැන්; මිස්සක පබ්බතං ගච්ඡාමාති, මිශ්‍රකපර්වතයට යම්හයි; උට්ඨහි, නැගිට්ටේය; අමච්චා, ඇමතියෝ; භන්තෙ, වහන්ස; කත්ථ ගච්ඡථාති, කොතැන්හි යව්දැයි; අම්හාකං නිවෙසනට්ඨානන්ති, අපගේ නිවාසස්ථාන යටයයි;

තෙ, ඒ ඇමතියෝ; රඤ්ඤො සංවිදිතං කත්වා, රදහට දැන්වීම කොට; රාජානුමතෙන, රජහුගේ අනුමතයෙන්; භන්තෙ, වහන්ස; ඉදානි, දැන්; තත්ථ ගන්තුං, එහියන්ට; අකාලො, කල්නොවේ; ඉදමෙව නන්දනවනුය්‍යානං, මේ නන්දනවනෝද්‍යානයම; අය්‍යානං ආවාසට්ඨානං හොතූති, ආර්‍යයන්ට ආවාසස්ථානයවේවායි; ආහංසු, කීහු; අලං ගච්ඡා මාති, කම්නැත යම්හයි; පුන, නැවත; රඤ්ඤොවචනෙන, රජහුගේ වචනයෙන්; ආහංසු, කීහු;

“රාජා භන්තෙ ආහ එතං මෙඝවනං නාම උය්‍යානං මම පිතු සන්තකං නගරතො නාතිදූරං නාච්චාසන්නං ගමනාගමනසම්පන්නං එත්ථ ථෙරා වාසං කප්පෙන්තු”ති. වසිංසු ථෙරා මෙඝවනෙ උය්‍යානෙ. රාජාපිඛො තස්සා රත්තියා අච්චයෙන ථෙරස්ස සමීපං ගන්ත්වා සුඛසයිත භාවං පුච්ඡිත්වා “කප්පති භන්තෙ භික්ඛුසඞ්ඝස්ස ආරාමො”ති පුච්ඡි. ථෙරො කප්පති මහාරාජාති වත්වා ඉමං සුත්තං ආහරි:

“අනුජානාමි භික්ඛවෙ ආරාම”න්ති. රාජා තුට්ඨො සුවණ්ණ භිඞ්කාරං ගහෙත්වා ථෙරස්ස හත්ථෙ උදකං පාතෙත්වා මහාමෙඝවනුය්‍යානං අදාසි. සහඋදකපාතෙන පඨවී කම්පි. අයං මහාවිහාරෙ පඨමො පඨවි කම්පො අහොසි.

රාජා භීතො ථෙරං පුච්ඡි: කස්මා භන්තෙ පඨවී කම්පතීති?මාභායි මහාරාජ,

---

භන්තෙ, වහන්ස; රාජාආහ, රජතෙමේ කීයේය; එතංමෙඝවනං නාම උය්‍යානං, (ඒ උද්‍යානයට භූමිග්‍රහණය කරණදිනයෙහි අකාලමහා මේඝයෙක් වර්ෂාකොට සියලුතටාක පුෂ්කරණීන් පුරවමින් ඝෝෂිතපත්‍ර වෘක්ෂලතාදියට සඞ්ග්‍රහ කළ බැවින් එනම්ලද) මේ මේඝවනනම් උයන; මම පිතුසන්තකං, මාගේ පියසතුය; නගරතො, නුවරින්; නාතිදූරං, ඉතාදුර නොවේ; නාච්චාසන්නං, ඉතාලඟ නොවේ; ගමනාගමන සම්පන්නං, ගමනාගමනින් යුක්තය; එත්ථ, මෙහි; ථෙරා, තෙරහු; වාසඞ්කප්පෙන්තූති, වාසය කෙරෙත්වායි;(කීවාහුය; ථෙරා, තෙරහු; මෙඝවනෙ උය්‍යානෙ, මෙඝවන උයනෙහි;වසිංසු, විසුවාහුය;රාජාපිඛො,රදතෙමේද; තස්සාරත්තියා අච්චයෙන ඒ රාත්‍රියගේ ඇවෑමෙන්; ථෙරස්සසමීපං ගන්ත්වා, තෙරවෙතට ගොස්; සුඛසයිතභාවං, සැපසේශයනයකරණලද බව; පුච්ඡිත්වා, විචාරා; භන්තෙ, වහන්ස; භික්ඛුසඞ්ඝස්ස, භික්සඟහට; ආරාමොකප්පතීති, ආරාමයකැපද්දැයි; පුච්ඡි, විචාලේය. ථෙරො, ස්ථවිර තෙමේ; කප්පතිමහාරාජාතිවත්වා, කැපයමහරජයයි කියා; භික්ඛවෙ, මහණෙනි; ආරාමං අනුජානාමීති, ආරාමය අනුදනිමියි; ඉමංසුත්තං ආහරි, (වෙළුවනාරාමය පිළිගැණීමේදී භාග්‍යවත්හු විසින් වදාරණලද) මේ සුතුර ගෙණහැර දැක්වී;

රාජා, රජ්තෙමේ; තුට්ඨො, සතුටුව; සුවණ්ණභිඞ්කාරංගහෙත්වා, රන්කෙණ්ඩිය ගෙණ; ථෙරස්සහත්ථෙ, තෙරහුගේ අතෙහි; උදකංපාතෙත්වා, දක්ෂිණොදකය වත්කොට; මහාමෙඝවනුය්‍යානං අදාසි, (ඉමං සඞ්ඝස්සදම්මිසිකියා පොසොන් කළුවරපක්ෂය දෙවනිදිනෙහි) මහ මෙවුනා උයනදුනී; සහඋදකපාතෙන, ජලපතනය සමග; පඨවීකම්පි, පෘථිවියකම්පාවිය; මහාවිහාරෙ, මහවෙහෙරෙහි; අයං පඨමො පඨවි කම්පො අහොසි, මේ ප්‍රථමපෘථිවිකම්පාවවූයේය;

රාජා, රජතෙමේ; භීතො, භීතවූයේ; භන්තෙ, වහන්ස; කස්මා, කුමක්හෙයින්; පඨවීකම්පීති, පෘථිවිය කම්පාවීදැයි; ථෙරං, පුච්ඡි, තෙරහු විචාලේය; මාභායි මහාරාජ, භයනොවෙව මහරද;

ඉමස්මිං දීපෙ දසබලස්ස සාසනං පතිට්ඨහිස්සති, ඉදං පඨමං විහාරට්ඨානං භවිස්සති, තස්සෙතං පුබ්බනිමිත්තන්ති. රාජා භීයොසොමත්තාය පසීදි. ථෙරො පුන දිවසෙපි රාජගෙහෙ යෙව භුඤ්ජිත්වා නන්දනවනෙ අනමතග්ගියානි කථෙසි. පුන දිවසෙ අග්ගික්ඛන්ධොපමසුත්තං කථෙසි එතෙනෙව උපායෙන සත්තදිවසානි කථෙසි. දෙසනා පරියොසානෙ අඩ්ඪනවමානං පාණසහස්සානං ධම්මාභිසමයො අහොසි. තතොපට්ඨාය ච නන්දනවනං සාසනස්ස ජොතිපාතුභාවට්ඨානන්ති කත්වා ජොතිවනන්ති නාමං පටිලභි.

සත්තමෙ පන දිවසෙ ථෙරා අන්තෙපුරෙ රඤ්ඤො අප්පමාදසුත්තං කථයිත්වා **චෙතියගිරිමෙව** අගමංසු.

අථඛො රාජා අමච්චෙ පුච්ඡි: ථෙරො අම්හෙ ගාළ්හෙන ඔවාදෙන ඔවදති, ගච්ඡෙය්‍යනුඛොති?

---

ඉමස්මිං දීපෙ, මේදිවයිනෙහි; දසබලස්සසාසනං පතිට්ඨහිස්සති, දශබලධාරීහුගේ සසුන පිහිටන්නේය; ඉදං පඨමං විහාරට්ඨානං භවිස්සති, මේ ප්‍රථමවිහාරස්ථානය වන්නේය; තස්සෙතං පුබ්බනිමිත්තන්ති, එයට මේ පූර්‍වනිමිත්තයයි; රාජා, රජතෙමේ; භීයොසොමත්තාය පසීදී, විශෙෂයෙන් අධිකතරව පැහැදුනේය; ථෙරො, ස්ථවිරතෙමේ; පුනදිවසෙපි, කළුවරපක්‍ෂය සම්බන්ධදෙවන දිනයෙහිත්; රාජ ගෙහෙයෙව භුඤ්ජිත්වා, රජගෙයිදීම වළඳා; නන්දනවනෙ, නඳුන් උයනෙහිදී; අනමතග්ගියානි කථෙසි, අනමතග්ගසංයුත්තය වදාළේය; පුනදිවසෙ, දෙවනදවස්හි; අග්ගික්ඛන්ධොපමසුත්තං කථෙසි, අග්ගික්ඛන්ධොපමසූත්‍රය වදාළේය; එතෙනෙව උපායෙන, මෙම උපායෙන්; සත්තදිවසානිකථෙසි, සත්දවසක්ම වදාළේය; දෙසනා පරියොසානෙ දෙශනාවගේකෙළවර; අඩ්ඪනවමානං පාණසහස්සානං, ඉඩකින් නවවනුවූ ප්‍රාණීන්ගෙන් දහසක්දෙනාට; (පන්සියයක් අධිකකොට ඇති අටදහසක්දෙනටයන අර්ථයි) ධම්මාභිසමයො අහොසි, ධර්මාභිසමයවූයේය; තතොපට්ඨාය, එතැන්පටන්; නන්දනවනං, නඳුන්වනය; සාසනස්සජොති පාතුභාවට්ඨානන්තිකත්වා, සසුනට ඥානාලොකය පහලවනතැනක්යයි කොට; ජොතිවනන්ති නාමං පටිලභී, ජොතිවනයයිනම් ලැබූය;

සත්තමෙදිවසෙ පන, සත්වනදවස්හි වනාහි; ථෙරා, තෙරහු; අන්තෙපුරෙ, ඇතුළුනුවරෙහිදී; රඤ්ඤො, රජහට; අප්පමාදසුත්තං කථයිත්වා, (අඞ්ගුත්තරනිකායෙහි මහා) අප්‍රමාද සූත්‍රය දෙශනාකොට; චෙතිය ගිරිංඑව, සෑගිරියටම; අගමංසු; ගියාහුය;

අථඛො, එකල්හි වනාහි; රාජා, රජතෙමේ; ථෙරො, තෙර තෙමේ; අම්හෙ, අපට; ගාළ්හෙන ඔවාදෙන, දැඩිඅවවාදයෙන්; ඔවදති, අවවාද කෙරේ; ගච්ඡෙය්‍යනුඛොති, යන්නේදැයි; අමච්චෙපුච්ඡි, ඇමතියන්විචාළේය;

අමච්චා තුම්හෙහි දෙව ථෙරො අයාචිතො සයමෙව ආගතො, තස්මා තස්ස අනාපුච්ඡා ගමනම්පි භවෙය්‍යා"ති ආහංසු. තතො රාජා රථං අභිරූහිත්වා ද්වෙච දෙවියො ආරොපෙත්වා චෙතියගිරිං අගමාසි මහච්ච රාජානුභාවෙන.

ගන්ත්වා දෙවියො එකමන්තං අපක්කමාපෙත්වා සයමෙව ථෙරානං සමීපං උපසඞ්කමන්තො අතිවියකිලන්තරූපො හුත්වා උපසඞ්කමි. තතො නං ථෙරො ආහ: කස්මා ත්වං මහාරාජ එවං කිලමමානො ආගතොති? තුම්හෙ මම ගාළ්හං ඔවාදං දත්වා ඉදානි ගන්තුකාමා නුඛොති ජානනත්ථං භන්තෙති. න මයං මහාරාජ ගන්තුකාමා,

අපි ච වස්සූපනායිකකාලො නාමායං මහාරාජ, තත්‍ර සමණෙන වස්සූපනායිකට්ඨානං ඤාතුං වට්ටතීති. තං දිවසමෙව

---

අමච්චා, ඇමතියෝ; දෙව, දෙවයෙනි; තුම්හෙහි, නුඹවහන්සේ විසින්; ථෙරො, ස්ථවිරතෙමේ; අයාචිතො, යාච්ඤානොකරණලද්දුයේ; සයමෙව, ආගතො තෙමේමආයේය; තස්මා, එහෙයින්; තස්ස ඔබවහන්සේ; අනාපුච්ඡා, නොවිචාරා ගමනම්පිභවෙය්‍යාති ආහංසු, ගමනද වන්නේයයිකීහු; තතො, ඉන්පසු; රාජා, රජතෙමේ; රථං අභිරූහිත්වා, රථයටනැගී; ද්වෙචදෙවියො ආරොපෙත්වා, දෙවීන් දෙදෙනද නන්වා; මහච්චරාජානුභාවෙන, මහත්වූ රාජානුභාවයෙන්; චේතියගිරිංඅගමාසි, සෑගිරියට ගියේය;

ගන්ත්වා, ගොස්; දෙවියො, දෙවීන්; එකමන්තං අපක්කමාපෙත්වා, එකත්පසකට පහකරවා; සයමෙව, තෙමේම; ථෙරානං සමීපං උපසඞ්කමන්තො, තෙරුන්ගේ සමීපයට එළඹෙනුයේ; අතිවියකිලන්තරූපො හුත්වා;ඉතාමක්ලාන්තස්වරූප ඇතිව;උපසඞ්කමි, එළඹියේය යන අර්ථයි තතො; ඉන්පසු; නං, ඔහුට; ථෙරො, ස්ථවිරතෙමේ: මහාරාජ, මහරද කස්මා කුමක්හෙයින්; ත්වං, තෝ; එවං, මෙසේ; කිලමමානො, ක්ලාන්ත වෙමින්; ආගතොති, ආයෙහිදැයි; ආහ, විචාළේය; භන්තෙ, වහන්ස, තුම්හෙ, නුඹවහන්සේලා; මමගාළ්හං ඔවාදං දත්වා, මටදැඩිකොට අවවාදදී; ඉදානි, දැන්; ගන්තුකාමානුඛොති, යනුකැමතියෝදැයි; ජානනත්ථං, දැනගන්නා පිණිසය; මහාරාජ, මහරද; න මයං ගන්තුකාමා, අපියනුනොකැමැත්තම්හ;

අපිච, එතකුදු වුවත්; මහාරාජ, මහරද; අයංවස්සූපනායික කාලොනාම, මේ වස්එළඹෙනකාලයනම්වේ; තත්‍ර එහි, සමණෙන, ශ්‍රමණහුවිසින්; වස්සූපනායිකට්ඨානං, වස්එලඹෙනතැනක්; ඤාතුං වට්ටතීති, දැනගන්ට වටනේයයි; තංදිවසමෙව, එදවස්හිම;

අරිට්ඨො නාම අමච්චො පඤ්චපණ්ණාසාය ජෙට්ඨකණිට්ඨභාතුකෙහි සද්ධිං රඤ්ඤො සමීපෙ ඨිතො ආහ: ඉච්ඡාම මයං දෙව ථෙරානං සන්තිකෙ පබ්බජිතුන්ති.

සාධු භණෙ පබ්බජස්සූති රාජා අනුජානිත්වා ථෙරං සම්පටිච්ඡාපෙසි. ථෙරො තදහෙව පබ්බාජෙසි. සබ්බෙ ඛුරග්ගෙයෙව අරහත්තං පාපුණිංසු. රාජාපි ඛො තං ඛණංයෙව කණ්ටකචෙතියඞ්ගණං පරික්ඛිපිත්වා අට්ඨසට්ඨියාලෙනෙසු කම්මං පට්ඨපෙත්වා නගරමෙව අගමාසි. තෙපි ථෙරා දසභාතිකසමාකුලං රාජකුලං පසාදෙත්වා මහාජනං ඔවදමානා චෙතියගිරිම්හි වස්සං වසිංසු. තදා චෙතියගිරිම්හි පඨමවස්සං උපගතා ද්වාසට්ඨි අරහන්තො අහෙසුං.

අථායස්මා මහාමහින්දො වුත්ථවස්සො පවාරෙත්වා කත්තිකපුණ්ණමායං උපොසථදිවසෙ රාජානං එතදවොච: මහාරාජ අම්හෙහි

---

අරිට්ඨොනාම අමච්චො, (රජහුගේ භාගිනෙය්‍යවූ) අරිට්ඨනම් අමාත්‍යතෙමේ; පඤ්චපණ්ණාසායජෙට්ඨකණිට්ඨභාතුකෙහි සද්ධිං, පස්පනස්දෙටුකණිටු බෑයන්සමග; රඤ්ඤොසමීපෙඨිතො, රජවෙතසිටියේ; දෙව, දෙවයිනි; මයං අපි; ථෙරානං, තෙරුන්ගේ; සන්තිකෙ, සමීපයෙහි; පබ්බජිතුං ඉච්ඡාමාති, පැවිදිවන්ට කැමතියම්හයි; ආහ, කීහ;

සාධුභණෙ පබ්බජස්සූති, මැනව සගයෙනි පැවිදිවම්හයි; රාජා අනුජානිත්වා, රද අනුදැන; ථෙරංසම්පටිච්ඡාපෙසි, තෙරහට භාර කෙළේය; ථෙරො, ස්ථවිරතෙමේ; තදහෙව, එදවස්හිම; පබ්බාජෙසි, පැවිදිකරවී; සබ්බෙ, සියල්ලෝ; ඛුරග්ගෙයෙව, කරකම්පිරියතැම; අරහත්තං පාපුණිංසු, රහත්බවට පැමිණියාහුය; රාජාපිඛො, රජ තෙමේද වනාහි; තංඛණංයෙව, එකෙණෙහිම; කණ්ඨකචෙතියඞ්ගණං, කණ්ටකචෛත්‍යාඞ්ගණය; පරික්ඛිපිත්වා, වටකොට; අට්ඨසට්ඨියාලෙනෙසු, අටසැටක්ලෙන්හි; කම්මංපට්ඨපෙත්වා, කර්මාන්තපටන්ගන්වා; නගරමෙව, නුවරටම; අගමාසි, ගියේය; තෙපිථෙරා, ඒ තෙරහුද; දසභාතිකසමාකුලං රාජකුලං, (මූටසීව නම් රජුගේ පුත්‍රවූ අභයය, දෙවානම්පියතිස්සය,මහානාගය, උත්තියය, මත්තාභයය, සූරතිස්සයයි යනාදි) දසබෑයන්ගෙන් සමාකීර්ණවූ රදකුලය; පසාදෙත්වා, පහදවා; මහාජනංඔවදමානා, මහජනයාට අවවාද කරණුවෝ; චෙතියගිරිම්හි, චෛත්‍යගිරියෙහි; වස්සංවසිංසු, (ආසාළ්හිපෞර්ණමී දිනයෙහි රජහු විසින් දෙනලද විහාරය පිළිගෙණ පැලවිය දිනයෙහි) වස්විසූහු; තදාපි, එකල්හිදු; චෙතියගිරිම්හි, චෛත්‍යගිරියෙහි; පඨමවස්සංඋපගතා, ප්‍රථම වස් එළඹියාවූ; ද්වාසට්ඨිඅරහන්තො අහෙසුං, දෙසැටක් රහතන් වහන්සේලා වූහු;

අථ, නැවත; ආයස්මාමහාමහින්දො, ආයුෂ්මත් මහ මිහිඳුතෙමේ; වුත්ථවස්සො, වසනලද වස් ඇතියේ; පවාරෙත්වා, මහාපවුරුණෙන් පවරා; කත්තිකපුණ්ණමායං උපොසථදිවසෙ, අපරකාර්ත්තික පෞර්ණමී උපොෂිත දිනයෙහි; රාජානං එතද වොච, රජහට මේ වක්‍ෂ්‍යමාන

චිරදිට්ඨො සම්මාසම්බුද්ධො, අනාථවාසං වසිම්හ, ඉච්ඡාම ජම්බුදීපං ගන්තුන්ති. රාජා ආහ: අහං භන්තෙ තුම්හෙ චතූහි පච්චයෙහි උපට්ඨහාමි, අයං ච මහාජනො තුම්හෙ නිස්සාය තීසු සරණෙසු පතිට්ඨිතො, කස්මා තුම්හෙ උක්කණ්ඨිතාති. චිරදිට්ඨොනො මහාරාජ සම්මාසම්බුද්ධො අභිවාදනපච්චුට්ඨානඅඤ්ජලිකම්මසාමීචිකම්ම කරණට්ඨානං නත්ථි, තෙනම්හෙ උක්කණ්ඨිතාති. නනු භන්තෙ තුම්හෙ අවොචුත්ථ "පරිනිබ්බුතො, සම්මාසම්බුද්ධො"ති. කිඤ්චාපි මහාරාජ පරිනිබ්බුතො, අථඛ්වස්ස සරීරධාතුයො තිට්ඨන්තීති. අඤ්ඤාතං භන්තෙ ථූප පතිට්ඨානං තුම්හෙ ආකඞ්ඛථාති, කරෙමි භන්තෙ ථූපං,

---

කාරණය කිම; මහාරාජ, මහරද; අම්හෙහි, අප විසින්; සම්මාසම්බුද්ධො, සම්‍යක් සම්බුඩ තෙමේ; චිරදිට්ඨො, දක්නාලද බොහෝ කල්වූයේ; (ශාස්තෘ ශරීරාවයවද සම්‍යක් සම්බුදුන්යයි කොට **"සමුද්දෙ දිට්ඨො මයා"** යනුවෙහි මෙන් අවයවයෙහි සමුදායව්‍යවහාර වශයෙන් **"චිර දිට්ඨො සම්මාසම්බුද්ධො"**යි මෙසේ කියනලදැයි දතයුතු)අනාථ වාසංව සිම්හ, අනාථ වස්විසූම්හ;ජම්බුදීපංගන්තුංඉච්ඡාමාති,දඹදිව්යන්ට කැමති යම්හයි; රාජා, රද තෙමේ; (තෙරුන් විසින් කියනලද ගමනාකාරය නවත්වා මෙහි විසීමෙහි ප්‍රයොජනයම දක්වා ගමනප්‍රතිබාහණය කරණු කැමතිව **අහං භන්තෙතුම්හෙ යි ආදි කී.**) භන්තෙ, වහන්ස; අහං, මම; තුම්හෙ, නුඹවහන්සේලාට; චතූහිපච්චයෙහි උපට්ඨහාමි, සිව්පසයෙන් උපස්ථාන කරමියි; අයඤ්චමහාජනො, මේ මහජන තෙමේද; තුම්හෙනිස්සාය, ඔබවහන්සේලා නිසා; තීසුසරණෙසුපතිට්ඨිතො, තිසරණයෙහි පිහිටියේය; කස්මා, කුමක්හෙයින්; තුම්හෙ, නුඹවහන්සේලා; උක්කණ්ඨිතාති, උකටලීවහුදැයි; ආහ, කියේය; මහාරාජ, මහරද; නො, අප විසින්; සම්මාසම්බුද්ධො, සම්‍යක් සම්බුඩතෙමේ; චිර දිට්ඨො,දක්නාලද බොහෝකල් වූයේය;අභිවාදනපච්චුට්ඨානඅඤ්ජලිකම්ම සාමීචිකම්මකරණට්ඨානං නත්ථි, (ගරු කටයුතුවූ තැනක්දැක) අභිවාදන කිරීමටද (එසේම ගරුස්ථානීයයක් දැක) හුනස්නෙන් නැගිට පෙර ගමන්යාමටද, (දෙඅත්මුදුන්දී) ඇඳිලි බැඳීමටද චීවරපිණ්ඩපාතාදි දානයෙන් කරණලද සාමීචිකර්මකරණයටද තැනක් නැත්තේය; තෙන, එහෙයින්; අම්හෙඋක්කණ්ඨිතාති, අපි උකටලීවූම්හයි; භන්තෙ, වහන්ස තුම්හෙ, නුඹවහන්සේලා; සම්මාසම්බුද්ධො, සම්‍යක් සම්බුඩතෙමේ; පරිනිබ්බුතොති, පිරිනිවියේයයි; අවොචුත්ථනනු, කිවාහු නොවෙද්ද; මහාරාජ; මහරද; කිඤ්චාපි, කිසිසේත්; පරිනිබ්බුතො, පිරිනිවියේය; අථඛො, එතකුදුවුවත්; අස්ස, ඒ භාග්‍යවත්හුගේ; සරීරෙ, ශරීරයෙහි; ධාතුයොතිට්ඨන්තීති, ධාතූහු සිටිත්යයි; අඤ්ඤාතංභන්තෙ, දන්නා ලද්දේය වහන්ස; ථූප පතිට්ඨානං, ථූපප්‍රතිෂ්ඨානය; තුම්හෙ, ආකඞ්ඛථාති, නුඹවහන්සේලා කැමතිවව්දැයි; භන්තෙ ථූපංකරෙමි, වහන්ස

භූමිභාගං'දනි විචිනාථ. අපිච භන්තෙ ධාතුයො කුතො ලච්ඡාමාති? සුමනෙන සද්ධිං මන්තෙහි මහාරාජාති. සාධු භන්තෙති රාජා සුමනං උපසඞ්කමිත්වා පුච්ඡි: කුතො'දනි භන්තෙ ධාතුයො ලච්ඡාමාති.

සුමනො ආහ: අප්පොස්සුක්කො ත්වං මහාරාජ වීථියො සොධාපෙත්වා ධජපතාක පුණ්ණඝටාදීහි අලඞ්කාරාපෙත්වා සපරිජනො උපොසථං සමාදියිත්වා සබ්බතාලාවචරෙ උපට්ඨපෙත්වා මඞ්ගල හත්ථිං සබ්බාලඞ්කාර පතිමණ්ඩිතං කාරාපෙත්වා උපරිචස්ස සෙතච්ඡත්තං උස්සාපෙත්වා සායන්හසමයෙ මහානාගවනුය්‍යානාභිමුඛො යාහි. අද්ධා තස්මිං ඨානෙ ධාතුයො ලච්ඡසීති. රාජා සාධූති සම්පටිච්ඡි.

ථෙරා චෙතියගිරිමෙව අගමංසු. තත්‍රායස්මා මහින්දත්ථෙරො සුමනසාමණෙරං ආහ: ගච්ඡ ත්වං සාමණෙර, ජම්බුදීපෙ තව අය්‍යකං

---

චෛත්‍යයකොරෙම්; ඉදනි, දැන්; භූමිභාගං, භූමිභාගයක්; විචිනාථ, සොයව්; අපිච, එතකුදුවුවත්; භන්තෙ, වහන්ස; ධාතුයො, ධාතූහු; කුතොලච්ඡාමාති, කොයින් ලබමෝදැයි; මහාරාජ, මහරද; සුමනෙන සද්ධිං, සුමනයා සමග; මන්තෙහීති, මන්ත්‍රණකරවයි; සාධුභන්තෙති, යහපත වහන්සැයි කියා; රාජා, රජතෙමේ; සුමනං උපසඞ්කමිත්වා; සුමනයා කරා එළඹ; භන්තෙ, වහන්ස; ඉදනි, දැන්; ධාතුයො, ධාතූහු, කුතොලච්ඡාමාති පුච්ඡි, කොයින් ලබමෝදැයි විචාළේය.

සුමනො, සුමනතෙම; මහාරාජ, මහරද; ත්වං, තෝ; අප්පොස්සුක්කො, එහි ව්‍යාවෘත නොවෙව; (දැන් රජහු විසින් කටයුතු කෘත්‍යය දක්වනුයේ වීථියො සොධාපෙත්වාති ආදී කියේ) වීථියො සොධාපෙත්වා, වීථි ශුද්ධකරවා; ධජපතාකපුණ්ණඝටාදීහි අලඞ්කාරපෙත්වා, ධජපතාක පූර්ණඝටාදියෙන් අලඞ්කාර කරවා; සපරිජනොඋපොසථංසමාදියිත්වා, පරිජන සහිත වූයේ උපොෂිතය සමාදන්ව; සබ්බතාලාවචරෙ උපට්ඨපෙත්වා, (ආතතවිතතාදි) සියලු තූර්‍ය්‍යභාණ්ඩවයන්නවුන් රැස් කරවා; (කංසතාලාදිතාලං අවචරන්තිඑත්ථාති= තාලාවචරං තෙයි විග්‍රහයි) මඞ්ගලහත්ථිං සබ්බාලඞ්කාරපතිමණ්ඩිතං කාරෙත්වා, මඟුලැතු සර්‍වාලඞ්කාරයෙන් ප්‍රතිමණ්ඩිත කරවා; අස්සඋපරි, ඔහු මතුයෙහි; සෙතච්ඡත්තං උස්සාපෙත්වා, සේසතනන්වා; සායන්හසමයෙ, සවස් වේලෙහි; මහානාගවනුය්‍යානාභිමුඛොයාහි, මහමෙව්නා උයනට අභිමුඛව යව; අද්ධා, ඒකාන්තයෙන්; තස්මිංඨානෙ, ඒ ස්ථානයෙහි; ධාතුයොලච්ඡසීති, ධාතුලබන්නෙහියයි; ආහ, කීය; රාජා, රදතෙමේ; සාධූතිසම්පටිච්ඡි, යහපතැයි පිළිගති;

ථෙරා, තෙරහු;චෙතියගිරිංඑවඅගමංසු,සෑගිරියටම ගියාහුය; තත්‍ර, එහිදී; ආයස්මාමහින්දත්ථෙරො, ආයුෂ්මත් මිහිඳුතෙර, සුමනසාමණෙරං, සුමනසාමණෙරයාට; ආහ, කීහ; සාමණෙර, හෙරණ; ත්වං, තෝ; ගච්ඡ, යව;ජම්බුදීපෙ, දඹදිවෙහි; තව,තොපගේ; අය්‍යකං අසොකධම්මරාජානං

අසොකං ධම්මරාජානං උපසඞ්කමිත්වා මම වචනෙන එවං වදෙහි; 'සහායො තෙ මහාරාජ දෙවානම්පියතිස්සො බුද්ධසාසනෙ පසන්නො ථූපං පතිට්ඨාපෙතුකාමො, තුම්හාකං කිර හත්ථෙ ධාතුයො අත්ථි තං මෙ දෙථා''ති. තං ගහෙත්වා සක්කං දෙවරාජානං උපසඞ්කමිත්වා එවං වදෙහි "තුම්හාකං කිර මහාරාජ හත්ථෙ වෙධාතුයො අත්ථි" -දක්ඛිණදාඨා ච දක්ඛිණක්ඛකඤ්ච,

''තතො තුම්හෙ දක්ඛිණදාඨං පූජෙථ, දක්ඛිණක්ඛකං පන මය්හං දෙථා''ති. එවඤ්ච තං වදෙහි-''කස්මා ත්වං මහාරාජ අම්හෙ තම්බපණ්ණිදීපං පහිණිත්වා පමජ්ජිත්ථා''ති. සාධු භන්තෙති ඛො සුමනො ථෙරස්ස වචනං සම්පටිච්ඡිත්වා තාවදෙව පත්තචීවරමාදාය වෙහාසං අබ්භුග්ගන්ත්වා පාටලිපුත්තද්වාරෙ ඔරුය්හ රඤ්ඤො සන්තිකං ගන්ත්වා එතමත්ථං ආරොචෙසි. රාජා තුට්ඨො සාමණෙරස්ස හත්ථතො පත්තං ගහෙත්වා ගන්ධෙහි උබ්බට්ටෙත්වා වරමුත්තසදිසානං ධාතූනං පූරෙත්වා අදාසි.

---

උපසඞ්කමිත්වා, මුනනුවන් වන අශොකදහම්රද කරා එළඹ; මම වචනෙන, මාගේ වචනයෙන්; එවං වදෙහි, මෙසේ කියව; මහාරාජ, මහරද; තෙ සහායො, තොපගේ යාළුවූ; දෙවානම්පියතිස්සො, දෙවානම්පියතිස්ස තෙමේ; බුද්ධසාසනෙ, බුදුසස්නෙහි; පසන්නො, ප්‍රසන්නව; ථූපංපතිට්ඨාපෙතුකාමො, චෛත්‍යයක් පිහිටවනු කැමතිවූයේය; තුම්හාකං හත්ථෙ කිර, තොපගේ අතෙහි වනාහි; ධාතුයොඅත්ථි, ධාතූහු ඇත්තාහුය; තංමෙදෙථ, එය මට දුන මැනවයි කියා; තංගහෙත්වා, එය ගෙණ; සක්කංදෙවරාජානං උපසඞ්කමිත්වා, සක්දෙව්රද කරා පැමිණ; එවංවදෙහි, මෙසේ කියව; මහාරාජ, මහරද; තුම්හාකං හත්ථෙකිර, තොපගේ අතෙහිවනාහි; දක්ඛිණදාඨා, දකුණුදාඨාවද; දක්ඛිණක්ඛකඤ්ච, දකුණු අකුදුවද යන; වෙ ධාතුයො අත්ථි, ධාතූහු දෙදෙනෙක් ඇත්තාහුය;

තතො, එයින්; තුම්හෙ, තෙපි; දක්ඛිණදාඨං, දකුණුදාඨාව; පූජෙථ, පුදකළ මැනව; දක්ඛිණක්ඛකංපන, දකුණු අකුදුව වනාහී; මය්හං දෙථාති, මට දුනමැනවයි කියා; තං, ඒ සක්දෙව්රදහට; මහාරාජ, මහරද; ත්වං, තෝ; අම්හෙතම්බපණ්ණිදීපං පහිණිත්වා, අප තාම්‍රපර්ණී දිවයිනට යවා; කස්මා, කුමක් හෙයින්; පමජ්ජිත්ථාති, පමාවව්දූයි; එවඤ්චවදෙහි, මෙසේද කියව; සුමනො, සුමනතෙමේ; සාධු භන්තෙතිඛො, යහපත වහන්සැයි කියා; ථෙරස්සවචනං සම්පටිච්ඡිත්වා, තෙරහුගේ වචනය පිළිගෙණ; තාවදෙව, එකෙණෙහිම; පත්තචීවරං ආදාය, පාසිවුරුගෙණ; වෙහාසං අබ්භුග්ගන්ත්වා, අහසට පැන නැගී; පාටලිපුත්තද්වාරෙඔරුය්හ, පැලළුප්නුවර දොරස පයෙහි බැස; රඤ්ඤොසන්තිකංගන්ත්වා, රජවෙතට ගොස්, එතමත්ථං ආරොචෙසි, එකරුණ සැළ කෙළේය; රාජා, රජතෙමේ; තුට්ඨො, සතුටුව; සාමණෙරස්ස හත්ථතො පත්තංගහෙත්වා, හෙරණ අතින් පාත්‍රයගෙණ; ගන්ධෙහි උබ්බට්ටෙත්වා. සුවඳඋලා; වරමුත්තසදිසානංධාතූනං, උතුම් මුතුසමාන ධාතූන්; පූරෙත්වා අදාසි, පුරවා දුනී;

සො තං ගහෙත්වා සක්කං දෙවරාජානං උපසඞ්කමි. සක්කො දෙවරාජා සාමණෙරං දිස්වා "කිං භන්තෙ සුමන ආහිණ්ඩසී"ති ආහ. ත්වං මහාරාජ අමෙහ තම්බපණ්ණිදීපං පෙසෙත්වා කස්මා පමජ්ජසීති? නප්පමජ්ජාමි භන්තෙ, වදෙහි- කිං කරොමීති?

තුම්හාකං කිර භන්තෙ ද්වෙ ධාතුයො අත්ථි-දක්ඛිණදාඨා ච දක්ඛිණක්ඛකට්ඨිච, තතො තුමෙහ දක්ඛිණ දාඨං පූජෙථ, දක්ඛිණක්ඛකං පන මය්හං දෙථාති සාධු භන්තෙති ඛො සක්කො දෙවානමින්දො යොජනප්පමාණං මණිථූපං උග්ඝාටාපෙත්වා දක්ඛිණක්ඛකධාතුං නීහරිත්වා සුමනස්ස අදාසි.

සො තං ගහෙත්වා චෙතියගිරිම්හියෙව පතිට්ඨාපෙසි. අථඛො මහින්දපමුඛා සබ්බෙපි තෙ මහානාගා අසොකධම්මරාජෙන දින්න ධාතුයො චෙතියගිරිම්හියෙව පතිට්ඨාපෙත්වා දක්ඛිණක්ඛකං ආදාය

---

සො, හෙතෙම; තංගහෙත්වා, ඒ ගෙණ; සක්කංදෙවරාජානං උපසඞ්කමි, සක්දෙව්රද කරා එළඹියේය; සක්කොදෙවරාජා, සක්දෙව්රද තෙමේ; සාමණෙරං දිස්වා, හෙරණ දැක; භන්තෙ, වහන්ස; සුමන, සුමනය; කිං ආහිණ්ඩසීති ආහ, කුමක් හෙයින් මහණදම් නොකොට ඇවිදිනෙහිදැයි කීහ; මහාරාජ, මහරද; ත්වං, තෝ; අමෙහ තම්බපණ්ණිදීපංපෙසෙත්වා, අප තාම්‍රපර්ණී ද්වීපයට යවා; කස්මා පමජ්ජසීති, කුමක් හෙයින් ප්‍රමාද වන්නෙහිදැයි විචාළේය; නප්පමජ්ජාමි භන්තෙ, පමා නොවෙමි වහන්ස; වදෙහි කිං කරොමීති, කියව කුමක් කෙරෙම්දැයි;

තුම්හාකං භන්තෙකිර, තොපගේ අතෙහි වනාහි; දක්ඛිණදාඨාච, දකුණුදළදාවද; දක්ඛිණක්ඛකට්ඨිච, දකුණු අකුදැටද යන; ද්වෙධාතුයො අත්ථි, ධාතුහු දෙදෙනෙක් ඇත්තාහුය; තතො, එයින්; තුමෙහ දක්ඛිණ දාඨං පූජෙථ, තෙපි දකුණුදළදාව පුදව්; දක්ඛිණක්ඛකං පන, දකුණු අකුදැට වනාහි; මය්හං දෙථාති, මට දුනමැනවයි; සාධුභන්තෙති ඛො, යහපත වහන්සැයි කියා; සක්කො දෙවානමින්දො, ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ; යොජනප්පමාණං මණිථූපං උග්ඝාටාපෙත්වා, යොත්නක් පමණ මැණික් චෛත්‍යය උද්ඝාටනය කරවා හෙවත් ඔසවා; දක්ඛිණක්ඛකධාතුං නීහරිත්වා දකුණු අකුදැටගෙණ; සුමනස්ස අදාසි, සුමනයාට දුන්නේය;

සො, හෙතෙමේ; තං ගහෙත්වා, එය ගෙණ; චෙතියගිරිම්හියෙව පතිට්ඨාපෙසි සෑගිරියෙහිම පිහිටවූයේය; අථඛො, ඉක්බිති; මහින්දපමුඛා සබ්බෙපි තෙ මහානාගා, මහෙන්ද්‍රස්ථවිරප්‍රමුඛ සියළුම ඒ මහොත්තමයෝ; අසොකධම්මරාජෙන දින්නධාතුයො, අශොකදහම්රජහු විසින් දෙන ලද ධාතුහු; චෙතිගිරිම්හියෙව පතිට්ඨාපෙත්වා, (පසුකටයුතු සියලු චෛත්‍යයෙහි මෙයින් ධාතුගෙණ පිහිටවියයුතුයයි යන අභිප්‍රායෙන්) සෑගිරියෙහිම (ඒ ධාතුහු) පිහිටවා; දක්ඛිණක්ඛකං ආදාය, දකුණු අකුදැට ගෙණ; වඩ්ඪමානකච්ඡායාය, වඩමන්සෙවන හෙවත් පසුබත;

වඩ්ඪමානකච්ඡායාය මහානාගවනුය්‍යානමගමංසු. රාජා පි ඛො සාමණෙරෙන වුත්තප්පකාරං පූජාසක්කාරං කත්වා හත්ථික්ඛන්ධවරගතො සයං මඞ්ගලහත්ථිමත්ථකෙ සෙතච්ඡත්තං ධාරයමානො මහානාගවනං සම්පාපුණි.

අථස්ස එතදහොසි: සචෙ අයං සම්මාසම්බුද්ධස්ස ධාතු, ඡත්තං අපනමතු, මඞ්ගලහත්ථි ජන්නුකෙහි භූමියං පතිට්ඨහතු, ධාතුචඞ්ගොටකං මය්හං මත්ථකෙ පතිට්ඨහතූති. සහ රඤ්ඤො චිත්තුප්පාදෙන ඡත්තං අපනමි, හත්ථි ජන්නුකෙහි භූමියං පතිට්ඨහි, ධාතුචඞ්ගොටකං රඤ්ඤො මත්ථකෙ පතිට්ඨහි. රාජා අමතෙනෙව අභිසිත්තගත්තො පරමෙන පීතිපාමොජ්ජෙන සමන්නාගතො හුත්වා පුච්ඡි: ධාතුං භන්තෙ කිං කරොමාති. හත්ථිකුම්භම්හියෙව තාව මහාරාජ ඨපෙථාති. රාජා ධාතුචඞ්ගොටකං ගහෙත්වා හත්ථිකුම්භෙ ඨපෙසි. පමුදිතො නාගො කුඤ්චනාදං නදි.

---

මහානාගවනුය්‍යානං අගමංසු, මහානාගවනොද්‍යානයට ගියාහුය; රාජාපි ඛො, රජතෙමේද වනාහි; සාමණෙරෙන වුත්තප්පකාරං පූජාසක්කාරං කත්වා, සුමනසාමණේරයන් විසින් කියනලද ප්‍රකාර පූජාසත්කාරකොට; හත්ථික්ඛන්ධවරගතො, උතුම් ඇතුපිටට නැඟුනේ; සයං, තෙමේ; මඞ්ගලහත්ථිමත්ථකෙ, මඟුලැතු මතුයෙහි; සෙතච්ඡත්තං ධාරයමානො, සේසත දරණුල බමින්; මහානාගවනං, මහානාගවනයට; සම්පාපුණි, පැමිණියේය;

අථ, ඉක්බිති; අස්ස, මේ රදහට; එතං අහොසි, මෙබඳු සිතෙක්වී අයං, මේ තෙමේ; සචෙසම්මා සම්බුද්ධස්සධාතු, ඉදින් සම්‍යක්සම්බුද්ධහුගේ ධාතුයෙක්වේද; ඡත්තං අපනමතු, ශ්වෙතච්ඡත්‍රය(හිසමත්තෙන්) පහව (ධාතුකරඬුවට අභිමුඛව) නැමේවා; මඞ්ගලහත්ථි, මඟුලැත් තෙමේ; ජන්නුකෙහි, දනින්; භූමියං පතිට්ඨහතු, බිමපිහිටාවා; ධාතුචඞ්ගොටකං, දාකරඬුව; මය්හං මත්ථකෙ පතිට්ඨහතූති, මාගේ මතුයෙහි පිහිටාවායි; (මේ දාකරඬුව තෙරහුගේ අතින් ධාතුහු සමග අවුත් උත්තමාඞ්ගයෙහි පිහිටාවායි යන අදහසයි) රඤ්ඤොචිත්තුප්පාදෙනසහ, රජහුගේ චිත්තොත්පාදය සමග; ඡත්තං අපනමි; ඡත්‍රය පහවූයේය; හත්ථි, ඇත්තෙමේ; භූමියං, බිමැ; ජන්නුකෙහි පතිට්ඨහි, දනින්පිහිටියේය; ධාතුචඞ්ගොටකං,දාකරඬුව; රඤ්ඤො, රජහුගේ; මත්ථකෙ, මස්තකයෙහි; පතිට්ඨහි පිහිටියේය; රාජා, රජතෙමේ; අමතෙන, අමෘතයෙන්; අභිසිත්තගත්තො ඉව, අභිෂෙකකරණලද ශරීර ඇතියෙක්මෙන්; පරමෙනපීතිපාමොජ්ජෙන සමන්නාගතො හුත්වා, පරමප්‍රීතිප්‍රමොද්‍යයෙන් යුක්තව; භන්තෙ, වහන්ස; ධාතුං, ධාතුවට; කිං කරොමාති පුච්ඡි, කුමක්කරමෝදැයි විචාළේය; මහාරාජ, මහරද; තාවහත්ථිකුම්භම්හියෙව්ඨපෙථාති, ඒතාක් ඇත්කුඹෙහිමතබවයි; රාජා,රජතෙමේ ධාතුචඞ්ගොටකං ගහෙත්වා, දාකරඬුව ගෙණ; හත්ථිකුම්භෙ, ඇත්කුඹෙහි; ඨපෙසි, තැබූයේය; පමුදිතොනාගො, ප්‍රමුදිත හස්තිතෙමේ; කුඤ්චනාදං නදී, කුඤ්චනාද කෙළේය;

මහාමෙඝො උට්ඨහිත්වා පොක්ඛරවස්සං වස්සි. උදකපරියන්තං කත්වා මහාභූමිචාලො අහොසි– පච්චන්තෙපි නාම සම්මා සම්බුද්ධස්ස ධාතු පතිට්ඨහිස්සතීති. දෙවමනුස්සා පමොදිංසු. එවං ඉද්ධානුභාවසිරියා දෙවමනුස්සානං පීතිං ජනයන්තො:–

**"පුණ්ණමායං මහාවිරො–චාතුමාසිනියා ඉධ,**
**ආගන්ත්වා දෙවලොකම්හා–හත්ථිකුම්භෙ පතිට්ඨිතොති.**

අථ සො හත්ථිනාගො අනෙකතාලාවචරපරිවාරිතො අතිවිය උළාරාය පූජාය සක්කරියමානො පච්ඡිමදිසාභිමුඛො හුත්වා අපසක්කන්තො යාව නගරස්ස පුරත්ථිම ද්වාරං තාව ගන්ත්වා

---

**මහාමෙඝො උට්ඨහිත්වා,** මහත්මේඝයක් නැඟී; **පොක්ඛරවස්සං වස්සි,** (පොකුරුපතෙහි මෙන් නොතෙමෙනු කැමැත්තන්ගේ මතුයෙහි නොතෙමී පවත්නා) පොකුරුවර්ෂාවක් වැසපීහ; (**පොක්ඛරවස්සං නාම පොක්ඛරපත්තප්පමාණං වලාහකමජ්ඣෙ උට්ඨහිත්වා කමෙන ඵරිත්වා තෙමෙතුකාමො යෙව තෙමයමානං මහන්තං හුත්වා වස්සතීති සාරත්ථදීපනී ටීකාසි.**) උදකපරියන්තං කත්වා, ජලය කෙළවර කොට; මහාභූමිචාලො අහොසි, මහත්භූමිකම්පාවෙක් වූයේය; පච්චන්තෙපි නාම, ප්‍රත්‍යන්තයෙහි නමුදු; සම්මාසම්බුද්ධස්ස ධාතුපතිට්ඨහිස්සතීති, **සම්‍යක්සම්බුදුහුගේ** ධාතුතොමෝ පිහිටන්නීයයි; දෙවමනුස්සා, දිව්‍යමනුෂ්‍යයෝ; පමොදිංසු, ප්‍රමුදිතවූහු; එවං, මෙසේ; ඉද්ධානුභාවසිරියා, ඍද්ධ්‍යනුභාව ශ්‍රීන්; දෙවමනුස්සානං, දෙවිමිනිසුන්ට; පීතිංජනයන්තො, ප්‍රීතිදනවනුයේ;

මහාවිරො, මහාවීරතෙමේ; (මහාවීරයන්ගෙන් මහත් වීර්‍ය්‍යවත්වූ භාග්‍යවත්හුගේ ශරීරාවයවයක් හෙයින් ශාස්තෘව්‍යවහාරයෙන් ධාතුතොමෝම දක්වනලදී;) ඉධ, මෙහි; දෙවලොකම්හා ආගන්ත්වා, දෙව්ලොවින් අවුත්; චාතුමාසිනියා, සිව්මසකගේ කෙළවර; (**චතුන්නං පරියොසානං භූතාති=චාතුමාසී;** මෙහි වනාහි චාතුමාසිනීයි ගන්නේ) පුණ්ණමායං, පෞර්ණමීදිනයෙහි; හත්ථිකුම්භෙ, ඇත්කුඹෙහි; පතිට්ඨිතොති, පිහිටියේයයි; (මේ ගාථාවධාතු ශරීරාගමනය සඳහා කියන ලදූයි දතයුතු.)

අථ, ඉක්බිත්තෙන්; සො හත්ථිනාගො, ඒ හස්තිනාගතෙමේ; අනෙකතාලාවචර පරිවාරිතො, අනෙකප්‍රකාර පසඟතුරු වයන්නන් විසින් පිරිවරණලදූයේ; අතිවිය උළාරාය පූජාය, ඉතාම මහත් පූජායෙන්; සක්කරියමානො, සත්කාරකරණු ලබමින්; පච්ඡිමදිසාභිමුඛො හුත්වා අපසක්කන්තො, පසුපස්සෙන්ම පශ්චිමදිශාභිමුඛව පසුබසිමින් යන්නේය යන අර්ථයි; යාව නගරස්ස පුරත්ථිමද්වාරං, යම්තාක් නුවරට පෑලදෙරද; තාවගන්ත්වා, ඒ තාක්ගොස්;

පුරත්ථිමද්වාරෙන නගරං පවිසිත්වා සකලනාගරෙන උළාරාය පූජාය කරීයමානාය දක්ඛිණද්වාරෙන නික්ඛමිත්වා ථූපාරාමස්ස පච්ඡිමදිසාභාගෙ මහෙජවත්ථු නාම කිර අත්ථි, තත්ථ ගන්ත්වා පුන ථූපාරාමාභිමුඛො එව පටිනිවත්ති.

තෙන ච සමයෙන ථූපාරාමෙ පුරිමකානං තිණ්ණං සම්මාසම්බුද්ධානං පරිභොගචෙතියට්ඨානං හොති.

අතීතෙ කිර අයං දීපො ඔජදීපො නාම අහොසි. රාජා අභයො නාම. නගරං අභයපුරං නාම. චෙතියපබ්බතො දෙවකූටපබ්බතො නාම, ථූපාරාමො පටියාරාමො නාම. තෙන ඛො පන සමයෙන කකුසන්ධො භගවා ලොකෙ උප්පන්නො හොති.

තස්ස සාවකො මහාදෙවො නාම ථෙරො භික්ඛුසහස්සෙන සද්ධිං දෙවකූටෙ පතිට්ඨාසි, මහින්දත්ථෙරො විය චෙතියපබ්බතෙ. තෙන ච

---

පුරත්ථිමද්වාරෙන, පැළදෙරින්, නගරං, පවිසිත්වා, නුවරටවැද; සකලනාගරෙන, සියළු නුවරුන් විසින්; උළාරාය පූජාය කරීයමානාය; උදාරපූජා කරණුලබන කල්හි; දක්ඛිණද්වාරෙන නික්ඛමිත්වා, දකුණුදෙරින් නික්ම; ථූපාරාමස්ස පච්ඡිමදිසාභාගෙ, ථූපාරාමයට පසුදික්භාගයෙහි; මහෙජවත්ථු නාම කිර අත්ථි, මහෙජ නම් යක්‍ෂයා විසින් පරිගෘහිත එක් දෙවස්ථානයක් ඇත්තේය; තත්ථ ගන්ත්වා, එහි ගොස්; පුන, නැවත; ථූපාරාමාභිමුඛො එව, ථූපාරාමයට අභිමුඛවම; පටිනිවත්ති, නැවතුනේය;

තෙන ච සමයෙන, එසමයෙහි වනාහි; ථූපාරාමෙ, ථූපාරාමයෙහි; පුරිමකානං තිණ්ණං සම්මාසම්බුද්ධානං, පළමු කකුසන්ධාදි තුන් සම්බුද්ධවරයන්ගේ; පරිභොගචෙතියට්ඨානං හොති, පරිභොගූපකරණයන් තබා කළ චෛත්‍යස්ථානය වේ; (කෙසේ වනාහි මෙතන ත්‍රිවිධබුද්ධවරයන්ගේ පරිභොගචෛත්‍යස්ථානය වූයේදැයි හේ දක්වනු පිණිස අතීතෙ කිර යනාදිය කී.)

අතීතෙ කිර, අතීතයෙහි වනාහි; අයං දීපො, මේ ද්වීපයතෙමේ; ඔජදීපො නාම අහොසි, ඔජදීපනම් වූයේය; රාජා පන, රජතෙමේ වනාහි; අභයො නාම, අභයනම් වූයේය; නගරං, නුවර; අභයපුරං නාම, අභයපුරංනම් වූයේය; චෙතියපබ්බතො, චෙතියපර්වතයතෙමේ; දෙවකූටපබ්බතො නාම, දෙව්කුළුපව්ව නම් වූයේය; ථූපාරාමො, ථූපාරාමයතෙමේ; පටියාරාමො නාම, පටියාරාමනම් වූයේය; තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; කකුසන්ධො භගවා, කකුසන්ධ නම් භාග්‍යවත්තෙම; ලොකෙ උප්පන්නො හොති, ලොවැ උපන්නේවේ;

තස්ස සාවකො, ඔහුගේ සව්තෙමේ; මහාදෙවො නාම ථෙරො මහාදෙව නම් තෙරතෙමේය; භික්ඛුසහස්සෙන සද්ධිං භික්‍ෂූන්දහසක් සමග; මහින්දත්ථෙරො, මිහිඳුතෙරතෙමේ; චෙතියපබ්බතෙ විය, සෑපව්වෙහිමෙන්;

සමයෙන ඔජදීපෙ සත්තා පජ්ජරකෙන අනයබ්‍යසනං ආපජ්ජන්ති. අද්දසා ඛො කකුසන්ධො භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො තෙ සත්තෙ අනයබ්‍යසනං ආපජ්ජන්තෙ. දිස්වා චත්තාලීසාය භික්ඛු සහස්සෙහි පරිවුතො අගමාසි.

තස්සානුභාවෙන තාවදෙව පජ්ජරකො වූපසන්තො, රොගෙ වූප සන්තෙ භගවා ධම්මං දෙසෙසි. චතුරාසීතියා පාණසහස්සානං ධම්මාභි සමයො අහොසි. භගවා ධම්මකරකං දත්වා පක්කාමි. තං අන්තො පක්ඛිපිත්වා පටියාරාමෙ චෙතියං අකංසු. මහාදෙවො දීපං අනුසාසන්තො විහාසි. කොණාගමනස්ස පන භගවතො කාලෙ අයං දීපො වරදීපො නාම අහොසි, රාජා සමිද්ධො නාම. නගරං වඩ්ඪමානං නාම. පබ්බතො සුවණ්ණකූටො නාම.

---

දෙවකූටෙ පතිට්ඨාසි, දෙව්කුළුපව්වෙහි පිහිටියේය; තෙනච සමයෙන, එසමයෙහි වනාහි; ඔජදීපෙසත්තා, ඔජදීපවැසි සත්හු; පජ්ජරකෙන, හුණින්; (එකල්හි වනාහි පූණ්කාලනම් යක්‍ෂතෙමේ තමන්ගේ අනුභාව යෙන් මිනිසුන්ගේ ශරීරයෙහි පජ්ජරක නම් රොගය ඉපදවූයේයයි දත යුතු.) අනයබ්‍යසනං ආපජ්ජන්ති, දුකටපැමිණෙත්; (එහෙයින් සාරත්ථ දීපනීනම් ටීකාවෙහි; **කායිකඤ්ච චෙතසිකඤ්ච සුඛං විනාසෙති විනාසි පතිවිනාසෙතීති=ව්‍යසනන්ති දුක්ඛං වුච්චතීති** කියනලදී.) කකුසන්ධො භගවා, කකුසඳ භාග්‍යවත්තෙමේ; බුද්ධචක්ඛුනා, බුදු ඇසින්; ලොකං ඔලොකෙන්තො, ලොවබලනසේක්; අනයබ්‍යසනං ආපජ්ජන්තෙ, දුකට පැමිණෙන්නාවූ; තෙ සත්තෙ, ඒ සත්ත්වයන්; අද්දසාඛො, දුටුසේමය; දිස්වා, දැක; චත්තාලීසාය භික්ඛුසහස්සෙහි පරිවුතො, සතළිස්දහසක් භික්‍ෂූන් විසින් පිරිවරණලදුයේ; අගමාසි, ආයේය;

• තස්සානුභාවෙන, ඒ බුදුහුගේ අනුභාවය කාරණකොටගෙණ; තාවදෙව, එකෙණෙහිම; පජ්ජරකො වූපසන්තො, එනම් රොගය ව්‍යපශමනය වූයේය; රොගෙ වූපසන්තෙ, රොගය ව්‍යපශමනයවූකල්හි භගවා, භාග්‍යවත්තෙමේ; ධම්මං දෙසෙසි, දහම්දෙසි; චතුරාසීතියා පාණසහස්සානං, සූවාසූදහසක් ප්‍රාණීන්ට; ධම්මාභිසමයො අහොසි, ධර්මාභිසමය වූයේය; භගවා, භාග්‍යවත්තෙමේ; ධම්මකරකං දත්වා, ඛබරුවදී; පක්කාමි, වැඩියේය; තං අන්තොපක්ඛිපිත්වා, ඒ ඛබරුව ඇතුලත ප්‍රක්‍ෂෙපකොට; පටියාරාමෙ, ප්‍රතිඅරම්හි; චෙතියං අකංසු, සෑයක්කළෝ; මහාදෙවො, මහාදෙව ස්ථවිරතෙමේ; දීපං අනුසාසන්තො දිවයින් වැසියන්ට අනුශාසනයකරමින්; විහාසි, විසී; කොණාගමනස්ස භගවතො කාලෙපන, කොණාගමන නම් භාග්‍යවත්හුගේ කාලයෙහි වනාහි; අයංදීපො, මේ ඩීපය වරදීපොනාම අහොසි, වරදීපනම්වී; රාජා, රජතෙමේ; සමිද්ධො නාම, සමූඬනම් වූයේය; නගරං, නුවර; වඩ්ඪමානං නාම, වඩ්ඪමාන නම් වූයේය; පබ්බතො, පව්ව; සුවණ්ණ කූටො නාම, රන්කුළුනම් වූයේය;

තෙන ඛො පන සමයෙන වරදීපෙ දුබ්බුට්ඨිකා හොති. දුබ්භික්ඛං දුස්සස්සං. සත්තා ජ්වරක රොගෙන අනයබ්‍යසනං ආපජ්ජන්ති. අද්දසා ඛො කොණාගමනො භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො තෙ සත්තෙ අනයබ්‍යසනං ආපජ්ජන්තෙ. දිස්වා තිංස භික්ඛුසහස්ස පරිවුතො අගමාසි. බුද්ධානුභාවෙන දෙවො සම්මාධාරං අනුප්පවෙච්ඡි. සුභික්ඛං අහොසි. භගවා ධම්මං දෙසෙසි. චතුරාසීතියා පාණ සහස්සානං ධම්මාභිසමයො අහොසි. භගවා භික්ඛුසහස්සපරිවාරං මහාසුමනං නාම ථෙරං දීපෙ ඨපෙත්වා කායබන්ධනං දත්වා පක්කාමි. තං අන්තො පක්ඛිපිත්වා චෙතියං අකංසු.

කස්සපස්ස පන භගවතො කාලෙ අයං දීපො මණ්ඩදීපො නාම අහොසි. රාජා ජයන්තො නාම. නගරං විසාලං නාම. පබ්බතො සුභකූටො නාම තෙන ඛො පන සමයෙන මණ්ඩදීපෙ මහාවිවාදො හොති.

---

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; වරදීපෙ, වරදිව යිනෙහි; දුබ්බුට්ඨිකා හොති, විෂමවර්ෂාදීන්ගේ වශයෙන්) දුෂ්ටවූ අශොභනවූ වෘෂ්ටියක් වූයේවේ(සශෙ‍්‍යාත්පත්තියට හෙත්භූතවූ මනා වර්ෂාව එහි නොවේය යන අභිප්‍රායි.) දුබ්භික්ඛං, එයින්ම දුර්භික්ෂයක් වූයේය; (**භික්ඛාය අභාවො දුල්ලභභාවො වා=දුබ්භික්ඛං** යි විග්‍රහයි.) දුස්සස්සං, එයින්ම දුඃශස්‍ය ඇතිවූයේය; (**සස්සානං අභාවො අසම්පන්නභාවො==දුස්සස්සං** යි ගන්නේ) සත්තා, සත්හු; ජ්වරකරොගෙන, ජ්වරකරොගයෙන්; අනයබ්‍යසනං ආපජ්ජන්ති, දුකට පැමිණෙත්; කොණාගමනො භගවා, කොණාගමන නම් භාග්‍යවත්තෙමේ; බුද්ධචක්ඛුනා, බුදුඇසින්; ලොකං ඔලොකෙන්තො, ලොවබලනුයේ; අනයබ්‍යසනං ආපජ්ජන්තෙ, දුකට පැමිණෙන්නාවූ; තෙ සත්තෙ අද්දසා ඛො, ඒ සත්ත්වයන් දුටුයේමය; දිස්වා, දැක; තිංසභික්ඛුසහස්සපරිවුතො, තිස්දහසක් භික්ෂූන් විසින් පිරිවරණලදුයේ; අගමාසි, ගියේය; බුද්ධානුභාවෙන, බුද්ධානුභාවයෙන්; දෙවො, මෙඝයතෙමේ; සම්මාධාරං අනුප්පවෙච්ඡි, උදකධාරාව මනාකොට මිදුයේය; සුභික්ඛං අහොසි, සුභික්ෂවී, භගවා, භාග්‍යවත්තෙමේ; ධම්මංදෙසෙසි, දහම්දෙසුයේය; චතුරාසීතිපාණසහස්සානං, සුවාසූදහසක් ප්‍රාණීන්ට; ධම්මාභිසමයො අහොසි ධර්මාභිසමය වූයේය; භගවා, භාග්‍යවත්තෙමේ; භික්ඛුසහස්සපරිවාරං, භික්ෂූන් දහසක් පිරිවර ඇති; මහාසුමනං නාම ථෙරං, මහාසුමන නම් තෙරහු; දීපෙඨපෙත්වා, දිවයිනෙහි නවතා; කායබන්ධනං දත්වා, කාබානදී; පක්කාමි, වැඩිසේක; තං අන්තොපක්ඛිපිත්වා, ඒ කාබාන ඇතුලත ප්‍රක්ෂෙපකොට; චෙතියං අකංසු, සෑයක්කළෝ;

කස්සපස්සභගවතො කාලෙ පන, කාශ්‍යප භාග්‍යවත්හුගේ කාලයෙහි වනාහි; අයං දීපො, මේ දිවයින; මණ්ඩදීපොනාම අහොසි, මණ්ඩදීපනම් වූයේය; රාජා, රජ; ජයන්තො නාම, ජයන්ත නම් වූයේය; නගරං, නුවර; විසාලං නාම, විසාලනම් වූයේය; පබ්බතො, පර්වතෙම; සුභකූටොනාම, සුභකූටනම් වූයේය; තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; මණ්ඩදීපෙ, එනම් දිවයිනෙහි; මහාවිවාදො හොති, මහත් විවාදයෙක් වූයේය; (හෙවත් ඒකාලයෙහි වනාහි ජයන්තමහරජහුගේ කණිටුබෑයාද; සමුද්ධිකුමාරයාද යුවරජද යන මොවුන් රාශිභූතව මහත් යුද්ධයකට එළඹසිටියේය; එසේහෙයින් තෙන ඛො පන සමයෙන මණ්ඩදීපෙ මහාවිවාදො හොති යි කියනලදී.)

බහූ සත්තා කලහවිග්ගහජාතා අනයබ්‍යසනං ආපජ්ජන්ති. අද්දසා ඛො කස්සපො භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො තෙ සත්තෙ අනයබ්‍යසනං ආපජ්ජන්තෙ. දිස්වා වීසති භික්ඛුසහස්සපරිවුතො ආගන්ත්වා විවාදං වූපසමෙත්වා ධම්මං දෙසෙසි. චතුරාසීතියා පාණසහස්සානං ධම්මාභිසමයො අහොසි. භගවා භික්ඛුසහස්සපරිවාරං සබ්බනන්දං නාම ථෙරං දීපෙ පතිට්ඨාපෙත්වා උදකසාටිකං දත්වා පක්කාමි. තං අන්තො පක්ඛිපිත්වා චෙතියං අකංසු.

එවං ථූපාරාමෙ පුරිමකානං තිණ්ණං බුද්ධානං චෙතියානි පතිට්ඨහිංසු. තානි සාසනන්තරධානෙන නස්සන්ති. ඨානමත්තං අවසිස්සති තස්මා

---

(විවාදය අතීත කාලික බැවින් විවාදො හොතීති යන්නෙන් යථා භාසතෙ රාඝවො තදා ති යනුවෙහිමෙන් ක්‍රියාවිපර්‍යාසයකොට අතීතකාලාම්ශීණය දතයුතුයයි සේයි.)

බහුසත්තා, බොහෝසත්හු; කලහවිග්ගහජාතා(හස්තපරාමර්ශනාදි වශයෙන් පැවති) කලහය සහිත කලහයට උපන් අන්‍යොන්‍ය විරුද්ධග්‍රහණයද උපන්නාහු;(**කලහො ච විග්ගහො ච ජාතො සඤ්ජාතො එතෙසන්ති=කලහවිග්ගහජාතාති** විග්‍රහයි උපන්කලහ විග්‍රහව ඇතියාහු යන අර්ථයි;) අනයබ්‍යසනං ආපජ්ජන්ති, දුකට පැමිණෙත්; කස්සපො භගවා, කාශ්‍යප භාග්‍යවත්තෙමේ; බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො, බුදුඇසින් ලොවබලනුයේ; අනයව්‍යසනං ආපජ්ජන්තෙ. දුකට පැමිණෙන්නාවූ; තෙසත්තෙ, ඒසත්ත්වයන්; අද්දසාඛො, දුටුයේමය; දිස්වා, දැක; වීසතිභික්ඛුසහස්සපරිවුතො ගන්ත්වා, විසිදහසක් භික්ෂූන් පිරිවරනලදුව අවුත්; විවාදං වූපසමෙත්වා, විවාදය ව්‍යපශමනයකොට; ධම්මංදෙසෙසි, දහම්දෙසුයේය; චතුරාසීතියා පාණසහස්සානං, සුවාසූදහසක් ප්‍රාණීන්ට; ධම්මාභිසමයො අහොසි, ධර්මාභිසමයවූයේය; භගවා, භාග්‍යවත්තෙමේ; භික්ඛුසහස්සපරිවාරං, භික්ෂූන්දහසක් පිරිවරකොටඇති; සබ්බනන්දංනාම ථෙරං, සර්වනන්දනම්තෙරහු; දීපෙපතිට්ඨාපෙත්වා, දිවයිනෙහි නවතා උදකසාටිකං දත්වා, ජලසාටිකාවදී; පක්කාමි, වැඩිසේක; තං අන්තො පක්ඛිපිත්වා, ඒ ජලසාටිකාව ඇතුලතබහා; චෙතියං අකංසු, සෑයක් කළෝයයි;

එවං, මෙසේ; ථූපාරාමෙ,ථූපාරාමයෙහි; පුරිමකානං තිණ්ණං බුද්ධානං (කකුසන්ධාදි) පළමුතුන්බුදුවරයන්ගේ; චෙතියානිපතිට්ඨහිංසු, චෛත්‍යයෝ පිහිටියාහුය; තානි, ඒ චෛත්‍යයෝ; සාසනන්තරධානෙන, ශාසනාන්තර්ධානයෙහිදී; නස්සන්ති, නසිත්; ඨානමත්තං, චෛත්‍යය පිහිටිතැන පමණක්; අවසිස්සති, ශෙෂවේ; තස්මා, එසේහෙයින්;

වුත්තං: "තෙන ච සමයෙන ථූපාරාමෙ පුරිමකානං තිණ්ණං සම්මා සම්බුද්ධානං පරිභොගචෙතියට්ඨානං හොති"ති තදෙතං විනට්ඨෙසු චෙතියෙසු දෙවතානුභාවෙන කණ්ටකසමාකිණ්ණසාඛෙහි නානා ගච්ඡෙහි පරිවුතං තිට්ඨති,-මා නං කොචි උච්ඡිට්ඨාසුචිමලකචවරෙහි සන්දූසෙසීති.

අථස්ස හත්ථිනො පුරතො පුරතො ගන්ත්වා රාජපුරිසා සබ්බෙ ගච්ඡෙ ඡින්දිත්වා භූමිං සොධෙත්වා තං හත්ථතලසදිසං අකංසු. හත්ථිනාගො ගන්ත්වා තං ඨානං පුරතො කත්වා තස්ස පච්ඡිම දිසාභාගෙ බොධිරුක්ඛට්ඨානෙ අට්ඨාසි. අථස්ස මත්ථකතො ධාතුං ඔරොපෙතුං ආරභිංසු. නාගො ඔරොපෙතු නදෙති. රාජා ථෙරං පුච්ඡි:-කස්මා භන්තෙ නාගො ධාතුං ඔරොපෙතුං නදෙතීති? ආරූළ්හං මහාරාජ ඔරොපෙතුං නවට්ටතීති.

---

**"තෙනචසමයෙන ථූපාරාමෙ පුරිමකානංතිණ්ණං සම්මාසම්බුද්ධානං පරිභොගචෙතියට්ඨානං හොතී"ති තෙනච සමයෙන-පෙ-හොතීතියි** වුත්තං කියනලදී; චෙතියෙසුවිනට්ඨෙසු, චෛත්‍යයන් නැසුනුකල්හි; තදෙතං, ඒමේස්ථානය; කොචි, කිසිවෙක්; උච්ඡිට්ඨාසුචිමලකචවරෙහි, ඉඳුල් අසුචි මලකසලින්; මාසන්දූසෙසීති, දූෂ්‍යනොකරාවායි; දෙවතානුභාවෙන, දෙවතානුභාවයෙන්; කණ්ටකසමාකිණ්ණසාඛෙහි, කටුයෙන් සමාකීර්ණ ශාඛා ඇත්තාවූ; නානාගච්ඡෙහි, නොයෙක් ගස්විසින්ද; තං එය පරිවුතං, පිරිවරණලදුව; තිට්ඨති සිටී;

අථ, ඉක්බිතිව; අස්සහත්ථිනො, මේ ඇතුට; පුරතො පුරතො ගන්ත්වා,පෙරටුව පෙරෙටුවගොස්;සබ්බෙ රාජපුරිසා,සියළුරාජපුරුෂයෝ; ගච්ඡෙ ඡින්දිත්වා, කුඩාපාදපයන්සිඳ; භූමියං සොධෙත්වා, බිමසුධකොට; හත්ථතල සදිසං අකංසු, අත්තලයක්සමානකළෝ; හත්ථිනාගො, හස්ති නාගතෙමේ; ගන්ත්වා, ගොස්; තං ඨානං එතන; පුරතොකත්වා, ඉදිරියෙහිකොට; තස්ස, එයට; පච්ඡිමදිසාභාගෙ, පශ්චිමදිශාභාගයෙහි; බොධිරුක්ඛට්ඨානෙ, බෝරුකසිටිතැන; අට්ඨාසි, සිටියේය; අථ,නැවත; අස්සමත්ථකතො, ඔහුගේමස්තකයෙන්; ධාතුං ඔරොපෙතුං, ධාතුබස්වන්ට; ආරභිංසු පටන්ගත්තාහුය; නාගො, හස්තිතෙමේ; ඔරොපෙතුං නදෙති,(ධාතු) බස්වන්ට නොදේ; රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; නාගො, නාගතෙමේ; ධාතුං ඔරොපෙතුං, ධාතුබාන්ට; කස්මානදෙතීති, කුමක්හෙයින්නොදේදැයි; ථෙරං පුච්ඡි, තෙරහුවිචාළේය; මහාරාජ, මහරද;ආරූළ්හං, නන්වනලද්ද; ඔරොපෙතුං න වට්ටතීති, බාන්ට නොවටනේයයි;

තස්මිඤ්ච කාලෙ අභයවාපියා උදකං ජින්නං හොති. සමන්තා භූමි ඵලිතා හොති. සුඋඞ්ඨරා මත්තිකා පිණ්ඩා. තතො මහාජනො සීස සීසං මත්තිකං ආහරිත්වා හත්ථිකුම්භප්පමාණං වත්ථුමකාසි. තාවදෙව ච ථූපකරණත්ථං ඉට්ඨකා කාතුං ආරභිංසු. යාව ඉට්ඨකා නපරිනිට්ඨන්ති, තාව හත්ථිනාගො කතිපාහං දිවා බොධිරුක්ඛට්ඨානෙ හත්ථිසාලායං තිට්ඨති, රත්තිං ථූපපතිට්ඨානභූමිං පරියායති.

අථ වත්ථුං චිනාපෙත්වා රාජා ථෙරං පුච්ඡි: කිදිසො භන්තෙ ථූපො කාතබ්බොති? වීහිරාසිසදිසො මහාරාජාති. 'සාධු භන්තෙ"ති. රාජා ජඞ්ඝප්පමාණං ථූපං චිනාපෙත්වා ධාතු ඔරොපනත්ථාය මහාසක්කාරං කාරෙසි. සකලනගරඤ්ච ජනපදෙ ච ධාතුමහ දස්සනත්ථං සන්නිපති. සන්නිපතිතෙ ච පන තස්මිං මහාජනකායෙ දසබලස්ස ධාතු

---

තස්මිඤ්චකාලෙ, ඒ කාලයෙහිද; අභයවාපියා, අභයනම් වැවෙහි; උදකං ජින්නංහොති, දියසිඳුනේවේ; සමන්තාභූමිඵලිතා හොති, හාත්පසින් බිමපැළුණේවේ; මත්තිකා පිණ්ඩා, මැටිපිඩු; සුඋඞ්ඨරා සුවසේ උදුරුගතහැක්කාහ; තතො, එයින්; මහාජනො, මහාජන තෙමේ වනාහි; සීස සීසං, වහවහා; මත්තිකං ආහරිත්වා, මැටිගෙණ; හත්ථිකුම්භප්පමාණං, ඇත්කුඹක්පමණ; වත්ථුමකාසි, වස්තුවක් කෙළේය. තාවදෙවච, එකෙණෙහිම; ථූපකරණත්ථං, සෑයකිරීමට; ඉට්ඨිකාකාතුං ආරභිංසු, ගඩොල්කරන්ට ප්‍රාරම්භකෙළෙ‍්‍ර; යාව ඉට්ඨිකා නපරිනිට්ඨන්ති, යම්තාක් ගඩොල්නොනිමෙත්ද; තාව, ඒතාක්; හත්ථිනාගො, හස්තිනාගතෙමේ; කතිපාහං, කීපදවසක්; දිවා, දහවල්හි; බොධිරුක්ඛට්ඨානෙ, බොධිවෘක්ෂස්ථානයෙහි; හත්ථිසාලායං, ඇත් හලෙහි; තිට්ඨති, සිටී; රත්තිං, රාත්‍රියෙහි; ථූපපතිට්ඨානභූමිං පරියායති, (සධාතුක චෛත්‍යප්‍රතිෂ්ඨාන බිමෙහි) වට හැසිරේ;

අථ, නැවත; වත්ථුංචිනාපෙත්වා, චෛත්‍යවස්තුව ශොධනයකරවා; රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; ථූපොකිදිසොකාතබ්බොති, සෑය කෙබඳුවකටයුතුදැයි; ථෙරංපුච්ඡි, තෙරහු විචාළේය; මහාරාජ, මහරද; වීහිරාසිසදිසොති, වීරුසක්සමානවයයි; සාධු භන්තෙති, යහපත වහන්සැයි කියා; ජඞ්ඝප්පමාණංථූපං චිනාපෙත්වා, (ථූපකුක්ෂියෙන් යට භාගයෙහි ථූපජඞ්ඝාවයයි කියනලද;)මල්ආසනයක් පමණ චෛත්‍යයක් රැස්කරවා; ධාතු ඔරොපනත්ථාය, ඇත්කුඹින් ඳකරඹුව බානපිණිස; මහාසක්කාරංකාරෙසි; මහත්සත්කාරකරවූයේය; සකල නගරඤ්චජනපදෙච, සියලුනුවරවැසි තෙමේද ජනපදවැසිතෙමේද (**නගරංචජනපදංච** යන මෙහි අභෙදෙපචාරයෙන් **සබ්බොගාමො ආගතොමඤ්චාළුකකුට්ඨිං කරොන්ති** යනාදියෙහි මෙන් එහිවාසීහු ගෘහිතව්‍යයි) ධාතුමහදස්සනත්ථං, ධාතුපූජාවදක්නා පිණිස; සන්නිපති, රැස්වූයේය; තස්මිංමහාජනකායෙච, එම මහාජනසමූහයාද; **සන්නිපතිතෙ පන, රැස්වූ කල්හිවනාහි; ,දසබලස්සධාතු, දශබලධාරීහුගේ**

හත්‍ථිකුම්භතො සත්තතාලප්පමාණං වෙහාසං අබ්භුග්ගන්ත්‍වා යමක පාටිහාරියං දස්සෙසි. තෙහි තෙහි ධාතුප්පදෙසෙහි ඡන්නං වණ්ණානං උදකධාරා ච අග්ගික්ඛන්ධා ච පවත්තන්ති, සාවත්‍ථියං ගණ්ඩම්බරුක්ඛ මූලෙ භගවතා දස්සිත පාටිහාරියසදිසමෙව පාටිහාරියං අහොසි.

තඤ්ච ඛො නෙව ථෙරානුභාවෙන, න දෙවතානුභාවෙන අපි ච ඛො බුද්ධානුභාවෙනෙව. භගවා කිර ධරමානො ච අධිට්ඨාසි:-මයි පරිනිබ්බුතෙ තම්බපණ්ණිදීපෙ අනුරාධපුරස්ස දක්ඛිණභාගෙ පුරිමකානං තිණ්ණං බුද්ධානං පරිභොගචෙතියට්ඨානෙ මම දක්ඛිණක්ඛකධාතු පතිට්ඨානදිවසෙ යමකපාටිහාරියං හොතූති.

"එවං අචින්තියා බුද්ධා-බුද්ධධම්මා අචින්තියා,
අචින්තියෙ පසන්නානං-විපාකො හොති අචින්තියො" ති

---

ධාතුතෙමෙ; හත්‍ථිකුම්භතො, ඇත්කුඹින්; සත්තතාලප්පමාණං වෙහාසං අබ්භුග්ගන්ත්‍වා, සප්තතාල ප්‍රමාණ අහසට පැණනැගී; යමකපාටිහාරියං දස්සෙසි, යමාමහපෙළහර දැක්වීය; (එකඑකධාතුප්‍රදෙශයකින් ගිනි කඳක් හා දියකඳක්ද නික්මීම් වශයෙන් යුගලයුගලව පවත්වනලද පෙළහර යමක ප්‍රාතිහාර්‍ය්‍යනම). තෙහි තෙහිධාතුප්පදෙසෙහි, ඒ ඒ ධාතු ප්‍රදෙශයකින්; ඡන්නංවණ්ණානං, ෂඩ්වර්ණයන්ගෙන් සම්බන්ධවූ රැස්ද; උදකධාරාච, ජලධාරාවෝද; අග්ගික්ඛන්ධාච, වහ්නිස්කන්ධයෝද; පවත්ත න්ති, පවත්නාහුය; සාවත්‍ථියං, සැවැත්නුවර; ගණ්ඩම්බ රුක්ඛමූලෙ, ගණ්ඩම්බවෘක්ෂමූලයෙහිදී; භගවතා, භාග්‍යවත්හු විසින්; දස්සිත පාටි හාරිය සදිසමෙව, දක්වනලද පෙළහරසමානවම; පාටිහාරියං අහොසි, පෙළහරවූයේය;

තඤ්ච ඛො, හෙදවතාහි; නෙවථෙරානුභාවෙන, ථෙරානුභාව යෙන් නොවේමය; නදෙවතානුභාවෙන, දෙවතානුභාවයෙන්ද නොවේ; අපිචඛො, කවරක්හුගේ අනුභාවයෙකින්ද යත්; බුද්ධානුභාවෙනෙව, බුද්ධානුභාවයෙන්ම වූයේය; භගවාකිර, භාග්‍යවත් තෙමේ වනාහි; ධරමානොච, ජීවත්වනුයේම; මයි පරිනිබ්බුතෙ, මාපිරිනිවිකල්හි; තම්බ පණ්ණිදීපෙ, තාම්‍රපර්ණිවිපයෙහි; අනුරාධපුරස්ස, අනුරාධපුරයට; දක්ඛිණදිසාභාගෙ, දකුණුදික්භාගයෙහි; පුරිමකානං තිණ්ණං බුද්ධානං, පළමු තුන්බුදුවරයන්ගේ; පරිභොගචෙතියට්ඨානෙ, පරිභොගචෛත්‍ය ස්ථානයෙහි; මමදක්ඛිණක්ඛකධාතු, මගේ දකුණුඅකුධාතුව; පතිට්ඨාන දිවසෙ, පිහිටන දිනයෙහි; යමකපාටිහාරියං හොතූති, යමකප්‍රාති හාර්‍ය්‍යයවේවායි; අධිට්ඨාසි, අධිෂ්ඨාන කෙළේයි; (භාග්‍යවත්හු පිරිනිවි කල්හි ද ඔහුගේ අනුභාවයෙන් මෙබඳු පෙළහරවූයේමයයි දක්වනු පිණිස එවං අචින්තියාසී ආදි මේ ගාථාව කී;)

එවං, මෙසේ; බුද්ධා, බුදුවරයෝ; අචින්තියා, අචින්ත්‍යයහ; හෙවත් සිතිය නොහැක; බුද්ධධම්මා, බුද්ධගුණයෝ; අචින්තියා, අචින්ත්‍යයහ; අචින්තියෙ, අචින්ත්‍යවූවන් විෂයෙහි; පසන්නානං, ප්‍රසන්නවූවන්ගේ; විපාකො, විපාකයතෙම; අචින්තියාහොතීති, අචින්ත්‍යවෙයි;

සම්මා සම්බුද්ධො කිර ඉමං දීපං ධරමානකාලෙපි තික්ඛත්තුං අගමාසි. පඨමං යක්ඛදමනත්ථං එකකොව ආගන්ත්වා යක්ඛෙ දමෙත්වා “මයි පරිනිබ්බුතෙ ඉමස්මිං දීපෙ සාසනං පතිට්ඨහිස්සතී”ති තම්බපණ්ණිදීපෙ රක්ඛං කරොන්තො තික්ඛත්තුං දීපං ආවිජ්ඣි.

දුතියං මාතුලභාගිනෙය්‍යානං නාගරාජූනං දමනත්ථාය එකකොව ආගන්ත්වා තෙ දමෙත්වා අගමාසි. තතියං පඤ්චසතභික්ඛුපරිවාරො ආගන්ත්වා මහාචෙතියට්ඨානෙච ථූපාරාමචෙතියට්ඨානෙ ච මහාබොධිපතිට්ඨිතට්ඨානෙ ච මුතියඞ්ගනචෙතියට්ඨානෙ ච දීඝවාපිචෙතියට්ඨානෙ ච කල්‍යාණියචෙතියට්ඨානෙ ච නිරොධසමාපත්තිං සමාපජ්ජිත්වා නිසීදි.

---

සම්මා සම්බුද්ධො කිර, සම්‍යක් සම්බුද්ධතෙම වනාහි; ධරමානකාලෙපි, ජීවමානකාලයෙහිද; ඉමං දීපං, මේ දිවයිනට; තික්ඛත්තුං අගමාසි, තුන් වරක් වැඩියේය; (දැන් ඒ භාග්‍යවත්හු තුන්වරක් ලක්දිව් වැඩිබව සැකෙවින් ප්‍රකාශ කරණුයේ පඨමං යක්ඛදමනත්ථං යී ආදි කීයේ;) පඨමං, පළමුකොට (අභිසම්බොධියෙන් නවවන දුරුතුමස පෞණ්මි දිනයෙහි; යක්ඛදමනත්ථං, යක්ෂදමනය පිණිස; එකකොව ආගන්ත්වා, හුදකලාවම අවුත්; යක්ඛෙ දමෙත්වා, යකුන් දමා; මයිපරිනිබ්බුතෙ, මාපිරිනිවිකලැ; ඉමස්මිං දීපෙ, මේ ද්වීපයෙහි; සාසනං පතිට්ඨහිස්සතීති, සසුනපිහිටන්නේයසි; තම්බපණ්ණිදීපෙ, තාම්‍රපර්ණිද්වීපයෙහි; ආරක්ඛංකරොන්තො, යක්ෂයන්ගේ නැවත අප්‍රවෙශය පිණිස ආරක්ෂාව තබමින්; තික්ඛත්තුං, තුන්වරක්; දීපං, දිවයිනැ; ආවිජ්ඣි, හාත්පසින් හැසුරුනේය;

දුතියං, දෙවනවර; (අභිසම්බොධියෙන් පස්වන වර්ෂයෙහි චිත්‍රමස්හි කළුවර පක්ෂය සම්බන්ධ උපොෂිත දිනයෙහි පෙරවරුව සමිද්ධිසුමනදිව්‍යපුත්‍රයා සමග)මාතුලභාගිනෙය්‍යානං නාගරාජූනං දමනත්ථාය, (චූලොදර මහෝදර) මයිල් බෑණයන නාරදුන්ගේ දමනය පිණිස; එකකොව, හුදකලාවම; ආගන්ත්වා, අවුත්; (මෙහි වනාහි භාග්‍යවත් තෙමේ සමිඬි සුමන දෙව්පුත් සමග ආයේය; එසේම පසු ශ්‍රමණවූ එක් භික්ෂුවක් සමග ආබැවින් හුදකලාව අවුත්යයි කියනලදී;) තෙදමෙත්වා, ඒ නයින් දමා; අගමාසි, වැඩියේය; තතියං, තුන්වනවර; (අභිසම්බොධියෙන් අටවන වසෙහිමහොදර මාතුල මණිඅක්ඛික නම් නාරදහුවිසින් අයදිනලදුව වෛශාඛපෞණ්මිදිනයෙහි) පඤ්චසත භික්ඛුපරිවාරො, පන්සියයක් භික්ෂූන් පිරිවරන ලදුයේ;ආගන්ත්වා, අවුත්; මහාචෙතියට්ඨානෙව, මහාචෛත්‍යස්ථානයෙහිද; ථූපාරාමචෙතියට්ඨානෙව, ථූපාරාමචෛත්‍යස්ථානයෙහිද; මහාබොධිපතිට්ඨිතට්ඨානෙව, මහාබොධිය පිහිටන තැනද; මුතියඞ්ගනචෙතියට්ඨානෙව, මුතියඞ්ගන චෛත්‍යස්ථානයෙහිද; දීඝවාපිචෙතියට්ඨානෙව, දිගාවැව චෛත්‍යස්ථානයෙහිද; කාල්‍යාණිචෙතියට්ඨානෙව, කැලණිචෛත්‍යස්ථානයෙහිද; නිරොධසමාපත්තිං සමාපජ්ජිත්වා, නිරොධසමාපත්තියට සමවැද; නිසීදි, වැඩහුන් සේක.

ඉදමස්ස චතුත්ථං ධාතුසරීරේන ආගමනං ධාතුසරීරතො ච පනස්ස නික්ඛන්තඋදකඵුසිතෙහි සකලතම්බපණ්ණිතලෙ න කොචි අඵුට්ඨොකාසො නාම අහොසි.

එවමස්ස තං ධාතුසරීරං උදකඵුසිතෙහි තම්බපණ්ණිතලස්ස පරිළාහං. වූපසමෙත්වා මහාජනස්ස පාටිහාරියං දස්සෙත්වා ඔතරිත්වා රඤ්ඤො මත්ථකෙ පතිට්ඨාසි. රාජා සඵලං මනුස්සපටිලාභං මඤ්ඤමානො මහන්තං සක්කාරං කරිත්වා ධාතුං පතිට්ඨාපෙසි. සහධාතුපතිට්ඨාපනෙන මහාභූමිචාලො අහොසි.

තස්මිඤ්ච පන ධාතුපාටිහාරියෙ චිත්තං පසාදෙත්වා රඤ්ඤො භාතා අභයො නාම රාජකුමාරො පුරිසසහස්සෙන සද්ධිං පබ්බජි.

චෙතාලිගාමතො පඤ්චදාරකසතානි පබ්බජිංසු, තථා චාර මණ්ඩලාදීහි ගාමකෙහි නික්ඛමිත්වා පඤ්ච පඤ්ච දාරකසතානි. සබ්බානිපි අන්තො නගරතො ච බහිනගරතො ච පබ්බජිතානි තිංස

---

අස්ස, මේ භාග්‍යවත්හුගේ; ධාතුසරීරෙන, ධාතුශරීරයෙන්; ඉදංචතුත්ථං ආගමනං, මේ සතරවන ඒමයි; අස්සපන, ඒ භාග්‍යවත් හුගේ වනාහි; ධාතුසරීරතොච, ධාතුශරීරයෙන්ද; නික්ඛන්තඋදකඵුසි තෙහි, නික්මුනුදියපොදින්; සකලතම්බපණ්ණිතලෙ, සියලුතාම්‍රපර්ණි තෙලෙහි; නකොචිඅඵුට්ඨොකාසොනාම, කිසිත්සපර්ශනොකරණලද අව කාශයෙක්නම්; නඅහොසි, නුවූයේය;

එවං, මෙසේ; අස්ස, ඒභාග්‍යවත්හුගේ; තංධාතුසරීරං, ඒධාතුශරීරය; උදකඵුසිතෙහි, දියපොදින්; තම්බපණ්ණිතලස්ස, තාම්‍රපර්ණිතල වැසියන්ගේ; පරිළාහංවූපසමෙත්වා, පරිදාහය ව්‍යපශමනය කොට; මහා ජනස්සපාටිහාරියං දස්සෙත්වා, මහදනහට පෙළහරදක්වා; ඔතරිත්වා, බැස; රඤ්ඤො, රජහුගේ; මත්ථකෙ, මස්තකයෙහි; පතිට්ඨාසි, පිහිටියේය; රාජා, රජතෙමේ; මනුස්සපටිලාභංසඵලන්ති මඤ්ඤමානො, මනු ෂ්‍යාත්මප්‍රතිලාභය සඵලයයි සිතමින්; මහන්තං සක්කාරං කත්වා, මහත් සත්කාරකොට; ධාතුංපතිට්ඨාපෙසි, ධාතු පිහිටවූයේය; සහධාතු පති ට්ඨාපනෙන, ධාතුපිහිටවීම සමගම; මහාභූමිචාලො අහොසි, මහත්භූමි කම්පාවක්වූයේය;

තස්මිඤ්ච ධාතුපාටිහාරියෙ පන, ඒ ධාතුපෙළහරෙහිද වනාහි; චිත්තංපසාදෙත්වා; සිතපහදවා; රඤ්ඤොභාතා, රජහුගේ භ්‍රාතෘවූ; අභ යොනාමරාජකුමාරො, අභයනම් රදකුමර තෙමේ; පුරිසසහස්සෙ නසද්ධිං, පුරුෂයන් දහසක් සමග; පබ්බජි පැවිදිවූයේය;

චෙතාලිගාමතො; චෛතාලිනම් ගමින්; පඤ්චදාරකසතානි, පන් සියයක් ළදරුවෝ; පබ්බජිංසු; පැවිදිවූහ; තථා, එසේ; චාරමණ්ඩලාදීහි ගාමකෙහි නික්ඛමිත්වා, චාරමණ්ඩලාදි ගම් වලින් නික්ම; පඤ්චපඤ්චදාර කසතානි, පන්සියපන්සිය ළදරුවෝ (පැවිදිවූහු;) අන්තො නගරතො ච,

භික්ඛුසහස්සානි අහෙසුං. නිට්ඨිතෙ පන ථූපස්මිං රාජා ච රාජභාතිකා ච දෙවියො ච දෙවනාගයක්ඛානම්පි විම්හයකාරං පච්චෙකං පච්චෙකං පූජං අකංසු. නිට්ඨිතාය පන ධාතුපූජාය පතිට්ඨිතෙ ධාතුවරෙ මහින්දත්ථෙරො මෙඝවනුය්‍යානමෙව ගන්ත්වා වාසං කප්පෙසි.

තස්මිං ඛො පන සමයෙ අනුලාදෙවී පබ්බජිතුකාමා හුත්වා රඤ්ඤො ආරොචෙසි. රාජා තස්සා වචනං සුත්වා ථෙරං එතදවොච:- අනුලා භන්තෙ දෙවී පබ්බජිතුකාමා, පබ්බාජෙථ නන්ති. න මහාරාජ අම්හාකං මාතුගාමං පබ්බාජෙතුං කප්පති පාටලිපුත්තෙ පන මය්හං භගිනී සඞ්ඝමිත්තත්ථෙරී නාම අත්ථි.

තං පක්කොසාපෙහි. ඉමස්මිඤ්ච පන මහාරාජ දීපෙ පුරිමකානං තිණ්ණං සම්මාසම්බුද්ධානං බොධි පතිට්ඨාසි. අම්හාකම්පි භගවතො සරසරංසිජාලවිස්සජ්ජනකෙන බොධිනා ඉධ පතිට්ඨාතබ්බං, තස්මා තථා සාසනං පහිණෙය්‍යාසි, යථා සඞ්ඝමිත්තා බොධිංගහෙත්වා ආගච්ඡෙය්‍යාති.

---

ඇතුළු නුවරින්ද; බහිනගරතොච, පිටනුවරින්ද; පබ්බජිතානි සබ්බානිපි, පැවිදිවූසියල්ලෝද; තිංසභික්ඛුසහස්සානි අහෙසුං, තිස්දහසක් භික්ෂුහුවූවාහු; ථූපස්මිංනිට්ඨිතෙපන, සෑය නිමිකල්හි වනාහි; රාජා ච, රජතෙමේද; රාජභාතිකාච, රදබෑයෝද; දෙවියොච, දෙවීහුද; දෙවනාගයක්ඛානම්පි, දෙවනාගයක්‍ෂයන්ද; විම්හයකාරං, විස්මයකරවූ; පච්චෙකං පච්චෙකං පූජමකංසු, වෙන් වෙන් පූජාකළෝ; ධාතුපූජායනිට්ඨිතායපන, ධාතුපූජාව නිමිකල්හි වනාහි; පතිට්ඨිතෙධාතුවරෙ, උතුම ධාතු පිහිටි කල්හි; මහින්දත්ථෙරො, මිහිඳුතෙර තෙමේ; මෙඝවනුය්‍යානමෙවගන්ත්වා, මහමෙවුනා උයනටම ගොස්; වාසංකප්පෙසි, වාසයකෙළේය;

තස්මිංඛොපන සමයෙ, එසමයෙහි වනාහි; අනුලාදෙවී, රජහුගේ දෙටුබෑදෑතිවූ අනුලාදෙවීතොමෝ; පබ්බජිතුකාමාහුත්වා, පැවිදිවනු කැමතිව; රඤ්ඤො ආරොචෙසි, රදහට දැන්වී; රාජා, රදතෙමේ තස්සා වචනං සුත්වා, ඒ දෙවියගේ වචනය අසා; භන්තෙ, වහන්ස; අනුලා දෙවිපබ්බජිතුකාමා, අනුලාදෙවී පැවිදිවනු කැමතිය; නං, ඒ දෙවිය; පබ්බාජෙථ ඉති, පැවිදිකර මැනවයි; ථෙරං, තෙරහට; එවං අවොච, මේ වචනය කියේය; මහාරාජ, මහරද; මාතුගාමංපබ්බාජෙතුං, මාගමුන් පැවිදිකරන්ට; අම්හාකංනකප්පති, අපට කැප නොවේ; පාටලිපුත්තෙ පන, පැලළුප්නුවරෙහි වනාහි; මය්හංභගිනී, මාගේ බුහුනතිවූ; සඞ්ඝමිත්තත්ථෙරීනාම අත්ථි, සඞ්ඝමිත්‍රා නම් ස්ථවිරාවක් ඇත්තීය;

තං පක්කොසාපෙහිති, ඒ ස්ථවිරිය කැඳවවයි; මහාරාජ, මහරද; ඉමස්මිංච දීපෙ පන, මේ දිවයිනෙහිද වනාහි; පුරිමකානං තිණ්ණං සම්මාසම්බුද්ධානං, පළමු තුන් සම්බුදුවරයන්ගේ; බොධිපතිට්ඨාසි, බොධිය පිහිටියේය; අම්හාකං භගවතොපි, අප භාග්‍යවත්හුගේද; සරසරංසිජාලවිස්සජ්ජනකෙන, සිතිඳු බැවින් රසවත් ඔජොවත් අභිනව රශ්මිකදම්බයන් විසුරුවන නොහොත් එසේ මෙසේ හැසිරෙන බැවින් ජීවමාන වූවාක් මෙන් රශ්මිජ්වාලාව විහිදුවන; බොධිනා, බොධිය; ඉධ, මෙහි; පතිට්ඨාතබ්බං, පිහිටිය යුත්තේය; තස්මා, එහෙයින්; සඞ්ඝමිත්තාපි, සංඝමිත්‍රාවද බොධිංගහෙත්වා, බොධියගෙණ; යථාආගච්ඡෙය්‍ය, යම්සේ එන්නීද; තථාසාසනං පහිණෙය්‍යාසි, එසේ හස්නක් යවන්නෙහිය;

සාධු භන්තෙති රාජා ථෙරස්ස වචනං සම්පටිච්ඡිත්වා අමච්චෙහි සද්ධිං මන්තෙත්වා අරිට්ඨං නාම අත්තනො භාගිනෙය්‍යං ආහ:- සක්ඛිස්සසි ත්වං තාත පාටලිපුත්තං ගන්ත්වා මහාබොධිනා සද්ධිං අය්‍යං සඞ්ඝමිත්තත්ථෙරිං ආනෙතුන්ති සක්ඛිස්සාමි දෙව සචෙ මෙ පබ්බජ්ජං අනුජානිස්සතීති ගච්ඡ තාත ථෙරිං ආනෙත්වා පබ්බජාහීති.

සො රඤ්ඤො ච ථෙරස්ස ච සාසනං ගහෙත්වා ථෙරස්ස අධිට්ඨාන වසෙන එකදිවසෙන ජම්බුකොලපට්ටනං ගන්ත්වා නාවං අභිරුහිත්වා සමුද්දං අතික්කමිත්වා පාටලිපුත්තමෙව අගමාසි අනුලා පිඛො දෙවී පඤ්චහි ච කඤ්ඤාසතෙහි පඤ්චහිච අන්තෙපුරිකාසතෙහි සද්ධිං දස සීලානි සමාදියිත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා නගරස්ස එකදෙසෙ උපස්සයං කාරාපෙත්වා නිවාසං කප්පෙසි.

අරිට්ඨොපි තං දිවසමෙව ගන්ත්වා රඤ්ඤො සාසනං අප්පෙසි. එවඤ්ච අවොච: පුත්තො තෙ දෙව මහින්දත්ථෙරො එවමාහ: "සහායස්ස

---

සාධුභන්තෙති; යහපත වහන්සැයි කියා; රාජා, රජතෙමේ; ථෙරස්සවචනං සම්පටිච්ඡිත්වා, තෙරහුගේ වචනය පිළිගෙණ; අමච්චෙහි සද්ධිං, ඇමතියන් සමග; මන්තෙත්වා, මන්ත්‍රණය කොට; අරිට්ඨං නාම අත්තනො භාගිනෙය්‍යං, අරිටු නම් තමාගේ බෑනාහට; ආහ, කීහ; තාත, දරුව; ත්වං, තෝ; පාටලිපුත්තං ගන්ත්වා, පැලළුප්නුවරට ගොස්; මහාබොධිනාසද්ධිං, මහාබොධිය සමග; අය්‍යං සඞ්ඝමිත්තත්ථෙරිං ආනෙතුං, ආය්‍යීසඞ්ඝමිත්‍රාසථවිරාව ගෙනෙන්ට; සක්ඛිස්සසීති, හැකි වන්නෙහිදැයි?; මෙ, මට; පබ්බජ්ජං, ප්‍රව්‍රජ්‍යාව; සචෙ අනුජානිස්සති, ඉදින් අනුදන්නේ නම්; සක්ඛිස්සාමිදෙවාති, හැකිවන්නෙමි දෙවයිනියි කීය්යයි; ගච්ඡතාත, යවදරුව; ථෙරිං ආනෙත්වා පබ්බජාහිති, ථෙරිය ගෙනවුත් පැවිදිවෙවයි;

සො, හෙතෙමේ; රඤ්ඤොච, රජහුගේද; ථෙරස්සච, තෙරහුගේද; සාසනංගහෙත්වා, හස්න ගෙණ; ථෙරස්ස, තෙරහුගේ; අධිට්ඨානවසෙන, ඉටන් විසින්; එකදිවසෙන, එක්දවසින්; ජම්බුකොලපට්ටනං ගන්ත්වා, දඹකොල පටුනට ගොස්; නාවං අභිරුහිත්වා, නැවට නැගී; සමුද්දං අතික්කමිත්වා, මුහුද ඉක්මවා; පාටලිපුත්තමෙව, පැළළුප්නුවරටම; අගමාසි, එක් දවසකින්ම ගියේය; අනුලාපිඛොදෙවී, අනුලා නම් දෙවියද; පඤ්චහිකඤ්ඤාසතෙහිච, තමන් පිරිවර පන්සියයක් කන්‍යාවන්ද; පඤ්චහිච අන්තෙපුරිකාසතෙහිච සද්ධිං, අන්තෙපුරිකාස්ත්‍රීන් පන්සියයක්ද සමග; දසසීලානිසමාදියිත්වා, දසසිල් සමාදන්ව; කාසායානි වත්ථානිඅච්ඡාදෙත්වා, කෂාය වස්ත්‍ර හැඳ; නගරස්ස, නුවරට; එකදෙසෙ, එක්දෙසක; උපස්සයං කාරාපෙත්වා, භික්ෂුණී වෙහෙරක් කරවා; නිවාසං කප්පෙසි, නිවාසය කළා;

අරිට්ඨොච, අරිටු තෙමේද; තංදිවසමෙව, එදවස්හිම; ගන්ත්වා ගොස්; රඤ්ඤො, රජහුගේ; සාසනංඅප්පෙසි, ලෙඛන හස්න පිහිටවී; එවංච අවොච, (රජසන්දෙශය පිහිටවා තෙරහුගේ මුඛහස්න විඥපනය කරණුයේ) මෙසේද කීය; දෙව, දෙවයිනි; තෙපුත්තො මහින්දත්ථෙරො,

කිර තෙ දෙවානම්පියතිස්සස්ස රඤ්ඤො භාතුජායා අනුලානාමදෙවී පබ්බජිතුකාමා, තං පබ්බාජෙතුං අය්‍යං සඞ්ඝමිත්තත්ථෙරිං පහිණාථ අය්‍යායෙව ච සද්ධිං මහාබොධිං"ති ථෙරස්ස සාසනං ආරොචෙත්වා සඞ්ඝ මිත්තත්ථෙරිං උපසඞ්කමිත්වා එවමාහ:-

අය්‍යෙ තුම්හාකං භාතා මහින්දත්ථෙරො මං තුම්හාකං සන්තිකං පෙසෙසි, දෙවානම්පියතිස්සරඤ්ඤො භාතුජායා අනුලානාමදෙවී පඤ්චහිච කඤ්ඤාසතෙහි පඤ්චහිච අන්තෙපුරිකාසතෙහි සද්ධිං පබ්බජිතුකාමා තං කිර ආගන්ත්වා පබ්බාජෙථාති. සා තාවදෙව තුරිතතුරිතා රඤ්ඤො සන්තිකං ගන්ත්වා එවමාහ:- මහාරාජ මය්හං භාතා මහින්දත්ථෙරො එවං පහිණි.

රඤ්ඤො කිර භාතුජායා අනුලානාමදෙවී පඤ්චහිච කඤ්ඤාසතෙහි පඤ්චහිච අන්තෙපුරිකාසතෙහි සද්ධිං පබ්බජිතුකාමා, මය්හං ආගමනං උදික්ඛති, ගච්ඡාමහං මහාරාජ තම්බපණ්ණිදීපන්ති. රඤ්ඤා

---

තොපගේ පුත් මිහිඳුතෙර තෙමේ; එවං ආහ, මෙසේ කීය; තෙ, තොපගේ; සහායස්ස, යහළුවූ; දෙවානම්පියතිස්සස්ස රඤ්ඤො, දෙවානම් පියතිස්ස රජහුගේ; භාතුජායා අනුලානාමදෙවී භ්‍රාතෘභාර්‍ය්‍යා අනුලා නම් දෙවී තොමෝ; පබ්බජිතුකාමා, පැවිදිවනුකැමතිය; තං පබ්බාජෙතුං, ඒ දෙවිය පැවිදිකරන්ට; අය්‍යං සඞ්ඝමිත්තත්ථෙරිං, ආර්‍ය්‍යසඞ්ඝමිත්‍රා ස්ථවිරාව; පහිණාථ, එව්වමැනව; අය්‍යායෙවචසද්ධිං, ආර්‍ය්‍යාවද කැටුව; මහාබොධින්ති, මහාබොධිය දූසි; ථෙරස්සසාසනං ආරොචෙත්වා, තෙරහුගේ අස්න ආරෙචනයකොට; සඞ්ඝමිත්තත්ථෙරිං, ආර්‍ය්‍යා සඞ්ඝ මිත්‍රාස්ථවිරාව කරා; උපසඞ්කමිත්වා, එළඹ; එවං ආහ, මෙසේකීහ;

කෙසේද? අය්‍යෙ, ආර්‍ය්‍යාව; තුම්හාකං, තොපගේ; භාතාමහින්දත්ථෙරො, භ්‍රාතෘමහෙන්ද්‍රස්ථවිරතෙමේ; මං, මා; තුම්හාකං සන්තිකං, ඔබවෙතට; පෙසෙසි, එවූයේය; දෙවානම්පියතිස්සරඤ්ඤො, දෙවානම්පිය තිස්ස රජහුගේ; භාතු ජායා අනුලානාමදෙවී, භ්‍රාතෘජායා අනුලා නම් දෙවිය; පඤ්චහිකඤ්ඤාසතෙහිච, පන්සියයක් කන්‍යාවන්ද; පඤ්චහිච, අන්තෙපුරිකාසතෙහි සද්ධිං, පන්සියයක් අන්තඃපුරස්ත්‍රීන් සමගද; පබ්බජිතුකාමා, පැවිදිවනු කැමැත්තී; ආගන්ත්වා, අවුත්; තංකිර, ඒ දෙවිය වනාහි; පබ්බාජෙථාති, පැවිදිකරව්යයි; සා, ඕතොමෝ; තාවදෙව, එකෙණෙහිම; තුරිතතුරිතා, වහවහා; රඤ්ඤොසන්තිකං ගන්ත්වා, රජවෙතට ගොස්; මහාරාජ, මහරද; මය්හංභාතාමහින්දත්ථෙරො, මාගේ භ්‍රාතෘ මිහිඳුතෙර තෙම; එවං පහිණි, මෙසේ හස්න එවූයේය;

රඤ්ඤොකිර, රජහුගේ වනාහි; භාතුජායා අනුලානාමදෙවී; භ්‍රාතෘජායා අනුලානම් දෙවිය; පඤ්චහිචකඤ්ඤාසතෙහි, තමා පිරිවර පන්සියයක් කන්‍යාවන්ද; පඤ්චහිච අන්තෙපුරිකාසතෙහි සද්ධිං, පන් සියයක් අන්තඃපුරස්ත්‍රීන් සමගද; පබ්බජිතුකාමා, පැවිදිවනු කැමැත්තී; මය්හං ආගමනං, මාගේ ඊම; උදික්ඛති, ප්‍රාර්ථනාකරන්නීය කියායි,

ආහ: අම්ම පුත්තො පි මෙ මහින්දත්ථෙරො නත්තා ච සුමන සාමණෙරො මං ඡින්නහත්ථං විය කරොන්තා තම්බපණ්ණිදීපං ගතා, තස්ස මය්හං තෙපි අපස්සන්තස්ස උප්පන්නො සොකො තවමුඛං පස්සන්තස්ස වූපසම්මති, අලං අම්ම මා අගමාසීති.

භාරියං මෙම මහාරාජ භාතුනො වචනං, අනුලාපිඛත්තියා ඉත්ථිසහස්ස පරිවුතා පබ්බජ්ජාපුරෙක්ඛාරා මං පතිමානෙති, ගච්ඡාමහං මහාරාජාති. තෙන හි අම්ම මහාබොධිං ගහෙත්වා යාහීති. කුතො රඤ්ඤො මහාබොධි? රාජා කිර තතො පුබ්බෙඑව ධාතුගහණත්ථාය අනාගතෙ සුමනෙ ලඞ්කාදීපං මහබොධිං පෙසෙතුකාමො කථංනුඛො අසත්ථඝාතාරහං මහාබොධිං පෙසෙස්සාමීති උපායං අපස්සන්තො මහාදෙවං නාම අමච්චං පුච්ඡි:-

---

මහාරාජ, මහරද; අහං මම; තම්බපණ්ණිදීපංගච්ඡාමීති, තාම්‍රපර්ණී දිවයිනට යමැයි; එවං ආහ, මෙසේ කී; රාජා, රජතෙමේ; අම්ම, දියනියෙනි; මෙපුත්තොමහින්දත්ථෙරොපි, මාගේ පුත්‍ර මිහිඳුතෙරද; නත්තා සුමන සාමණෙරොච, මුනුබුරු සුමන නම් හෙරණද; මං, මා; ඡින්නහත්ථංවිය කරොන්තා, සුන් අත් ඇතියක්හු මෙන් කෙරෙමින්; (**ඡින්නා හත්ථා එතස්සාති= ඡින්නහත්ථකංසි** යනු මෙහි අන්‍යපදාර්ථ සමාසයයිද දතයුතු) තම්බපණ්ණිදීපංගතා, තාම්‍රපර්ණී දිවයිනට ගියාවූ; තෙපි, එව්හුද; අපස්සන්තස්ස, නොදක්නාවූ; තස්සමය්හං, ඒමට; උප්පන්නොසොකො, උපන් ශොකය; තවමුඛං, ඔබගේ මුහුණ; පස්සන්තස්ස, බැලීම නිමිතිකොටගෙණ; වූපසම්මති, ව්‍යපශමනයවේ; අම්ම, මෑනියෙනි; අලං, කම්නැත; මාඅගමාසීති, නොයවයි; ආහ, කී;

මහාරජ, මහරද; අනුලාපිඛත්තියා, අනුලා නම් ක්‍ෂත්‍රියාව; ඉත්ථිසහස්සපරිවුතා, ස්ත්‍රීන් දහසක් විසින් පිරිවරණලද්දී; පබ්බජ්ජාපුරෙක්ඛාරං, ප්‍රව්‍රජ්‍යාව පිණිස උපදිනලද අභිලාෂ ඇත්ති; මං, මා; පතිමානෙති, බලාසිටින්නීය; මෙභාතුනොවචනං, මාගේ භ්‍රාතෘහුගේ වචනය; භාරියං, ගරුවන්නේය; (නොයික්මවියයුතුය යන අර්ථයි) මහාරජ, මහරද; අහංගච්ඡාමීති, මමයමැයි කී; අම්ම, මෑනියෙනි; තෙනහි, එසේවීනම්; මහාබොධිංගහෙත්වා, මහාබොධියගෙණ; ගච්ඡාහීති, යවයි; රඤ්ඤො, රදහට; මහාබොධිං, මහාබොධිය; කුතො, කොයින්ද; රාජාකිර, රජතෙමේ වනාහි; තතොපුබ්බෙඑව, එයට පූර්වයෙහිම; ධාතුගහණත්ථාය, ධාතුග්‍රහණය පිණිස; සුමනෙ ආගතෙ, සුමන නම් හෙරණ ආ කල්හි; ලඞ්කාදීපං, ලක්දිවට; මහාබොධිං පෙසෙතුකාමො, මහාබොධිය යවනු කැමතිවූයේ; අසත්ථඝාතාරහං, ශස්ත්‍රයෙන් ඝාතනයට නුසුදුසුවූ; (**සත්ථෙන ඝාතං න අරහතීති= අසත්ථඝාතාරහංසි** ගන්නේ) මහාබොධිං, මහාබොධිය; කථංනුඛො පෙසෙස්සාමීති, කෙසේයවන්නෙම්දැයි; උපායංඅපස්සන්තො, උපායක් නොදකිමින්; මහාදෙවංනාමඅමච්චංපුච්ඡි, මහාදෙව නම් ඇමතියා විචාළේය;

සො ආහ:- සන්ති දෙව බහූ පණ්ඩිතා භික්ඛූති. තං සුත්වා රාජා භික්ඛුසඞ්ඝස්ස භත්තං පටියාදෙත්වා භත්තකිච්චාවසානෙ සඞ්ඝං පුච්ඡි:- ගන්තබ්බං නු ඛො භන්තෙ භගවතො බොධිනා ලඞ්කාදීපං නොති. සඞ්ඝො මොග්ගලිපුත්තතිස්සත්ථෙරස්ස භාරං අකාසි.

ථෙරො ගන්තබ්බං මහාරාජ මහාබොධිනා ලඞ්කාදීපන්ති වත්වා භගවතො පඤ්චමහාඅධිට්ඨානානි කථෙසි. කතමානි පඤ්ච? භගවා කිර මහාපරිනිබ්බාණමඤ්චෙ නිපන්නො ලඞ්කාදීපෙ මහාබොධි පතිට්ඨාපනත්ථාය අසොකමහාරාජා මහාබොධිගහණත්ථං ගමිස්සති, තදා මහාබොධිස්ස දක්ඛිණසාඛා සයමෙව ඡිජ්ජිත්වා සුවණ්ණකටාහෙ පතිට්ඨාතූති අධිට්ඨාසි. ඉද මෙකමධිට්ඨානං.

තත්ථ පතිට්ඨානකාලෙ ච මහාබොධි හිමවලාහකගබ්භං පවිසිත්වා තිට්ඨතූති අධිට්ඨාසි. ඉදං දුතියමධිට්ඨානං.

---

සො, හෙතම; දෙව, දෙවයිනි; පණ්ඩිතා භික්ඛූ, පණ්ඩිත භික්ෂූහු; බහූසන්තීති ආහ, බොහෝ ඇත්තාහුයයි කීහ; තංසුත්වා, ඒ අසා; රාජා, රජතෙමේ; භික්ඛුසඞ්ඝස්සභත්තං පටියා දෙත්වා, භික්සඟනට බත් පිළියෙළකොට; භත්තකිච්චාවසානෙ, බත්කිස අවසනැ; භන්තෙ, වහන්ස; භගවතොබොධිනා, භාග්‍යවත්හුගේ බෝධිය; ලඞ්කාදීපං, ලක්දිවට; ගන්තබ්බංනුඛො, යායුතුද; නොති, නොයායුතුදැයි; සඞ්ඝංපුච්ඡි, සඞ්ඝයාවිචාළේය; සඞ්ඝො, සඞ්ඝතෙමේ; මොග්ගලිපුත්තතිස්සත්ථෙරස්ස, මුගලන්පුත් තිස්තෙරහට; භාරං අකාසි, භාරකෙළේය;

ථෙරො, තෙරනුවෝ; මහාරාජ, මහරද; ලඞ්කාදීපං මහාබොධිනා ගන්තබ්බන්තිවත්වා ලක්දිවට මහාබොධියයායුතුයයිකියා භගවතො, භාග්‍යවත්හුගේ; පඤ්චමහාඅධිට්ඨානානි කථෙසි, පඤ්චමහාඅධිෂ්ඨාන යන්කීහ; කතමානිපඤ්ච, කවරනම්පසෙක්ද? භගවාකිර, භාග්‍යවත් තෙමේ වනාහි; මහාපරිනිබ්බාණමඤ්චෙනිපන්නො, මහපරිනිවාණ මඤ්චකයෙහි හොත්තේ; ලඞ්කාදීපෙමහාබොධිපතිට්ඨාපනත්ථාය, ලක්දිවැ මහාබොධිය පිහිටවනුපිණිස; අසොකමහාධම්මරාජා, අශොක මහදහම්රදතෙමේ; මහාබොධිගහණත්ථං, මහාබොධියගන්නා පිණිස ගමිස්සති, යන්නේය; තදා, එකල්හි; මහාබොධිස්ස දක්ඛිණසාඛා, මහාබොධියගේ දක්ෂිණශාඛාතොමෝ; සයමෙව ඡිජ්ජිත්වා, තොමේම සිඳී; සුවණ්ණකටාහෙ පතිට්ඨාතූති, සවණ්කටාහයෙහි පිහිටාවායි; අධිට්ඨාසි, ඉටුයේය; ඉදමෙකං අධිට්ඨානං, මේ එක්අධිෂ්ඨානයකි;

තත්ථ පතිට්ඨානකාලෙච, එතන පිහිටන කල්හිම; මහාබොධි, මහාබොධිය; හිමවලාහකගබ්භංපවිසිත්වා තිට්ඨතූති, හිමයෙන් පිරුණු පෙළහරවශයෙන් උපන් හිමවලාගැබට වැදසිටීවායී; අධිට්ඨාසි, ඉටුයේය; ඉදං දුතියං අධිට්ඨානං, මේ දෙවන අධිෂ්ඨානයයි;

සත්තමෙ දිවසෙ හිමවලාහකගබ්භතො ඔරුය්හ සුවණ්ණකටාහෙ පතිට්ඨහන්තො පත්තෙහි ච ඵලෙහි ච ඡබ්බණ්ණරංසියො මුඤ්චන්තූති අධිට්ඨාසි; ඉදං තතියමධිට්ඨානං.

ථූපාරාමෙ දක්ඛිණක්ඛකධාතු චෙතියම්හි පතිට්ඨානදිවසෙ යමකපාටිහාරියං කරොතූති අධිට්ඨාසි; ඉදං චතුත්ථංඅධිට්ඨානං.

ලඞ්කාදීපම්හි යෙව මෙ දොණමත්තා ධාතුයො මහාචෙතියම්හි පතිට්ඨානකාලෙ බුද්ධවෙසං ගහෙත්වා වෙහාසං අබ්භුග්ගන්ත්වා යමක පාටිහාරියං කරොන්තූති. අධිට්ඨාසි. ඉදං පඤ්චමං අධිට්ඨානං

රාජා ඉමානි පඤ්ච මහාඅධිට්ඨානානි සුත්වා පසන්නචිත්තො පාටලිපුත්තතො යාව මහාබොධි තාව මග්ගං පටිජග්ගාපෙත්වා සුවණ්ණකටාහත්ථාය බහුං සුවණ්ණං නීහරාපෙසි. තාවදෙවච රඤ්ඤො චිත්තං ඤත්වා විස්සකම්මදෙවපුත්තො කම්මාරවණ්ණං නිම්මිණිත්වා පුරතො අට්ඨාසි.

---

සත්තමෙදිවසෙ, සත්වනදිනෙහි; හිමවලාහකගබ්භතො ඔරුය්හ, හිමවලාගැබින් බැස; සුවණ්ණකටාහෙ පතිට්ඨහන්තො, රන්කටාහයෙහිපිහිටමින්; පත්තෙහිච ඵලෙහිච, පත්පිලියෙන් හෙවත් පත්‍රයන් ගෙන්ද ඵලයන්ගෙන්ද; ඡබ්බණ්ණරංසියොමුඤ්චන්තූති, සවණක් රැස්විහිදුවත්වායි; අධිට්ඨාසි, ඉටුයේය; ඉදං තතියං අධිට්ඨානං, මේ තුන්වන අධිෂ්ඨානයයි;

දක්ඛිණක්ඛකධාතු, දකුණුඅකුධාතුව; ථූපාරාමෙ, ථූපාරාමයෙහි; චෛතියම්හිපතිට්ඨාන දිවසෙ; සෑයෙහිපිහිටන දිනයෙහි; යමකපාටිහාරියංකරොතූති අධිට්ඨාසි, යමාමහපෙළහර කරාවායි ඉටුයේය; ඉදං චතුත්ථං අධිට්ඨානං, මේ සතරවන අධිෂ්ඨානයයි;

ලඞ්කාදීපම්හියෙව, ලක්දිවම; මෙ, මාගේ; දොණමත්තාධාතුයෝ, ද්‍රෝණයක් පමණ හෙවත් මගධ නැළියෙන් සොළොස් නැළියක් පමණ ධාතූහු; මහාචෙතියම්හි පතිට්ඨානකාලෙ මහසෑයෙහි පිහිටන කලැ; බුද්ධවෙසංගහෙත්වා, බුදුවෙස්ගෙණ; වෙහාසං අබ්භුග්ගන්ත්වා, අහසටපැනනැගී; යමකපාටිහාරියං කරොන්තූති, යමාමහපෙළහර කරත්වායි; අධිට්ඨාසි, ඉටුයේය; ඉදං පඤ්චමං අධිට්ඨානං මේපස්වන අධිෂ්ඨානයයි;

රාජා, රජතෙමේ; ඉමානිපඤ්ච මහාඅධිට්ඨානානිසුත්වා, මේපඤ්ච මහාඅධිෂ්ඨානයන් අසා පසන්නචිත්තො, පහන්සිත් ඇතියේ; පාටලිපුත්තතො, පැළළුප්නුවරපටන්; යාවමහාබොධි,යම්තාක්මහාබොධියද; තාවමග්ගං පටිජග්ගාපෙත්වා, ඒතාක් සත්යොදුන්මගශුද්ධකරවා; (කනු කටුආදිය ශුද්ධකරවා එහි සුදුවැලි අතුරවායි කියනලදි;) සුවණ්ණකටාහත්ථාය; රන්කටාහයපිණිස; බහුං සුවණ්ණංනීහරාපෙසි, බොහෝ රන්ගෙන්වූයේය; තාවදෙවච, එකෙණෙහිම; රඤ්ඤොචිත්තං ඤත්වා, රදහුගේ සිතදැන; විස්සකම්මදෙවපුත්තො, විස්කම් දෙව්පුත්තෙමේ; කම්මාරවණ්ණං නිම්මිනිත්වා, රජහුගේ ප්‍රසෘතිසවණ්කාර සවරූපයෙන් නිර්මිතකොට; පුරතො අට්ඨාසි, ඉදිරියෙහි සිටියේය;

රාජා තං දිස්වා "තාත ඉමං සුවණ්ණං ගහෙත්වා කටාහං කරොහී"ති ආහ. පමාණං දෙව ජානාථාති. ත්වමෙව තාත ඤත්වා කරොහීති. සාධු දෙව කරිස්සාමීති සුවණ්ණං ගහෙත්වා අත්තනො ආනුභාවෙන හත්ථෙන පරිමද්දිත්වා සුවණ්ණකටාහං නිම්මිණි. නවහත්ථපරික්ඛෙපං පඤ්චහත්ථුබ්බෙධං තිහත්ථවික්ඛම්භං අට්ඨඞ්ගුලබහලං හත්ථිසොණ්ඩප්පමාණ මුඛවට්ටිං. අථ රාජා සත්තයොජනායාමාය තියොජනවිත්ථාරාය මහතියා සෙනාය පාටලිපුත්තතො නික්ඛමිත්වා අරියසඞ්ඝං ආදාය මහාබොධිසමීපං අගමාසි. සෙනාසමුස්සිතධජපටාකං නානාරතනවිචිත්තං අනෙකාලඞ්කාරපතිමණ්ඩිතං නානාවිධකුසුමසමාකිණ්ණං අනෙකතුරියසඞ්ඝුට්ඨං මහාබොධිං පරික්ඛිපි.

---

රාජා, රජතෙමේ; තං දිස්වා, ඔහු දැක; තාත, පුත; ඉමං සුවණ්ණං ගහෙත්වා, මේ රන්ගෙණ කටාහං කරොහීති ආහ, කටාහය කරවයි කීහ; දෙව, දෙවයිනි; පමාණං ජානාථාති, පමණ දනිව්යයි; තාත, පුත; ත්වමෙව ඤත්වා කරොහීති, තොපම දැන කරවයි; සාධුදෙව කරිස්සාමීති, මැනව දෙවයෙනි; කරන්නෙමියි; සුවණ්ණං ගහෙත්වා, රන්ගෙණ; අත්තනො ආනුභාවෙන, තමාගේ අනුභාවයෙන්; හත්ථෙන පරිමද්දිත්වා, අතින් පිරිමැද; නවහත්ථපරික්ඛෙපං, නවරියනක් වට ඇති; (**නවහත්ථපමාණො පරික්ඛෙපො අස්සාති=නවහත්ථපරික්ඛෙපො තං සි ගන්නේ**) පඤ්චහත්ථුබ්බෙධං, පස්රියනක් උස ඇති; **පඤ්චහත්ථපමාණං උබ්බෙධං අස්සාති=පඤ්චහත්ථුබ්බෙධො තං සී.**) තිහත්ථවික්ඛම්භං, තුන්රියනක් පමණ පුළුල ඇති; **තිහත්ථපමාණං වික්ඛම්භං විත්ථාරං අස්සාති= තිහත්ථවික්ඛම්භං තං** සී ගන්නේ.) අට්ඨඞ්ගුලබහලං, අටඟුල් පමණ ඝනවූ; හත්ථිසොණ්ඩප්පමාණං මුඛවට්ටිං, ඇත්සොඬක් පමණ මුවවිට ඇති; සුවණ්ණකටාහං නිම්මිණි. රන්කටාහයක් මැවූයේය; අථ, එකල්හි; රාජා, රජතෙමේ; සත්ත යොජනායාමායා, සත්යොදුන් අයම ඇති; තියොජනවිත්ථාරාය, තුන් යොදුන්විතර ඇති; මහතියාසෙනාය, මහත් සෙනාව සමග; පාටලිපුත්තතො නික්ඛමිත්වා, පැළළුප්නුවරින් නික්ම; අරියසඞ්ඝං ආදාය, ආර්‍ය්‍යසඞ්ඝයා ගෙණ; මහාබොධිසමීපං අගමාසි, මහාබොධිය සමීපයට ගියේය; සෙනා, සෙනාතොමෝ; සමුස්සිත ධජපටාකං, නන්වනලද (නීලපීතාදි අනෙකාකාර) ධවජපටාකයන් ඇති; නානාරතනවිචිත්තං, නොයෙක් රත්නයෙන් විචිත්‍රවූඅනෙකාලඞ්කාර; පතිමණ්ඩිතං, (ප්‍රසන්න ජනයා විසින් පුදනලද හසතුපගාදි) නානාලඞ්කාරයෙන් සර්ජිත කරණලද්දවූ; නානාවිධ කුසුමසමාකිණ්ණං, (පුදනලද නොයෙක්ජල ථල පුෂ්පයෙන් ආකීර්ණවූ; අනෙකතුරිය සඞ්ඝුට්ඨං, (ආතත විතතාදී නොයෙක් පඤ්චාඞ්ගික තූර්‍ය්‍යයෙන් ඝොෂාකරණලද; මහාබොධිං පරික්ඛිපි, මහාබොධිය පිරිවැරූයේය;

රාජාසහස්සමත්තෙන ගණපාමොක්ඛ මහාථෙරෙ ගහෙත්වා සකල ජම්බුදීපෙ පත්තාභිසෙකානං රාජූනං සහස්සෙන අත්තානං ච මහාබොධිං ච පරිවාරාපෙත්වා මහාබොධිමූලෙ ඨත්වා මහාබොධිං උල්ලොකෙසි. මහාබොධිස්ස ඛන්ධඤ්ච දක්ඛිණමහාසාඛාය චතුහත්ථප්පමාණං පදෙසං ච ඨපෙත්වා අවසෙසං අදස්සනං අගමාසි.

රාජා තං පාටිහාරියං දිස්වා උප්පන්නපීතිපාමොජ්ජො "අහං භන්තෙ ඉමං පාටිහාරියං දිස්වා තුට්ඨො මහාබොධිං සකලජම්බුදීප රජ්ජෙන පූජෙමී"ති භික්ඛුසඞ්ඝස්ස වත්වා අභිසෙකං අදාසි.

තතො පුප්ඵගන්ධාදීහි පූජෙත්වා තික්ඛත්තුං පදක්ඛිණං කත්වා අට්ඨසු ඨානෙසු වන්දිත්වා උට්ඨාය අඤ්ජලිං පග්ගය්හ ඨත්වා සච්චවචනකිරියාය බොධිං ගණ්හිතුකාමො භූමිතො යාව මහාබොධිස්ස දක්ඛිණසාඛා

---

රාජා, රජතෙමේ සහස්සමත්තෙන ගණපාමොක්ඛ මහාථෙරෙ ගහෙත්වා, දහසක් පමණ ගණපාමොක් මහතෙරුන්ගෙණ; සකල ජම්බුදීපෙ, සියළු දඹදිවැ; පත්තාභිසෙකානං රාජූනං, ප්‍රාප්තාභිෂේක ඇති රජුන්ගෙන්; සහස්සෙන, දහසක්ලවා; මහාබොධිං පරිවාරාපෙත්වා, මහාබොධිය පිරිවරවා; අත්තානඤ්ච, තමාද; මහාබොධිමූලෙ ඨත්වා, මහබෝමුලසිට; මහාබොධිං උල්ලොකෙසි, මහාබොධිය උඩබැලූයේය; මහාබොධිස්ස, මහාබොධියගේ; ඛන්ධඤ්ච, කඳද; දක්ඛිණමහාසාඛාය, දක්ෂිණමහාශාඛාවෙහි; චතුහත්ථප්පමාණං පදෙසඤ්චඨපෙත්වා සිව්රියණක් පමණ පෙදෙසද තබා; අවසෙසං අදස්සනං අගමාසි, සෙස්ස අදශීනයට ගියේය; (මෙහි එබැවින් මහරද නාවිසින් ගත යුතුයේ ශාඛාවය ඒ ශාඛාවට උපනිශ්‍රයවූ මේ ස්කන්ධය නා විසින් නොගතයුතුයයි කියන්නාක්මෙන් සෙස්ස අදශීනයට ගියේය.)

රාජා තං පාටිහාරියං දිස්වා, රජතෙමේ ඒ පෙළහර දැක; උප්පන්නපීතිපාමොජ්ජො, උපන් ප්‍රීතිප්‍රමොද්‍ය ඇතියේ; භන්තෙ, වහන්ස; අහං, මම; ඉමං පාටිහාරියං දිස්වා, මේ පෙළහර දැක; තුට්ඨො සතුටුවූයෙමි; මහාබොධිං, මහාබොධියට; සකලජම්බුදීපරජ්ජෙන පූජෙමීති, සියලු දඹදිව් රාජ්‍යයෙන් පුදමියි; (මෙහි රඤ්ඤො ඉදනාති රජ්ජං සි ගන්නේ) (සියලු දඹදිවින් උපන් අයෙන්ද රජඅණින්ද පුදමියි යන අර්ථයි. සත්දවසකට දෙමියි කල්පිරිසිඳ දෙන්ට අයුතු හෙයින් මෙසේ දෙනුයේ තාවකාලිකකොටයයි දතයුතු) භික්ඛුසඞ්ඝස්සවත්වා, භික්සඟහට කියා; අභිසෙකං අදාසි, අබිසෙස් දුනී;

තතො, ඉන්පසු; පුප්ඵගන්ධාදීහි පූජෙත්වා, පුෂ්පගන්ධාදියෙන් පුදා; තික්ඛත්තුං පදක්ඛිණං කත්වා, තුන්වරක් පැදකුණුකොට; අට්ඨසු ඨානෙසු වන්දිත්වා, අටතැනකවැඳ; උට්ඨාය, නැගිට; අඤ්ජලිං පග්ගය්හ ඨත්වා, ඇඳිලිබැඳගෙණ සිට; සච්චවචනකිරියාය, සත්වදන් කිරියෙන්; බොධිං ගණ්හිතුකාමො, බොධියගනු කැමතිවූයේ; භූමිතො, බිමපටන්;

තාව උච්චං කත්වා ඨපිතස්ස සබ්බරතනමයපීඨස්ස උපරි සුවණ්ණ කටාහං ඨපාපෙත්වා රතනපීඨං ආරුය්හ සුවණ්ණතුලිකං ගහෙත්වා මනොසිලාය ලෙඛං කත්වා යදි මහාබොධිනා ලඞ්කාදීපෙ පතිට්ඨාතබ්බං, යදි චාහං බුද්ධසාසනෙ නිබ්බෙමතිකො භවෙය්‍යං මහාබොධි සයමෙව ඉමස්මිං සුවණ්ණකටාහෙ පතිට්ඨාතූති සච්චවචනකිරිය මකාසි

සහ සච්චකිරියාය බොධිසාඛා මනොසිලාය පරිච්ඡින්නට්ඨානෙ ඡිජ්ජිත්වා ගන්ධකලල පූරස්ස සුවණ්ණකටාහස්ස උපරි අට්ඨාසි. තස්සා උබ්බෙධෙන දසහත්ථො ඛන්ධො හොති. චතුහත්ථා චතුහත්ථා පඤ්ච මහාසාඛා පඤ්චහි යෙව ඵලෙහි පතිමණ්ඩිතා. ඛුද්දකසාඛානං පන සහස්සං. අථ රාජා මූලලෙඛාය උපරි තිවඞ්ගුලෙ පදෙසෙ අඤ්ඤං ලෙඛං පරිච්ඡින්දි. තතො තාවදෙව බුබ්බුලකා හුත්වා දසමහාමූලානි නික්ඛමිංසු.

---

යාව මහාබොධිස්ස දක්ඛිණසාඛා, යම්තාක් මහාබොධියගේ දකුණු ශාඛාවද; තාව, එතාක්; උච්චං කත්වාඨපිතස්ස, උස්කොටතැබූ; සබ්බ රතනමය පීඨස්ස උපරි, සර්වරත්නමය පයඞ්කයමත්තෙහි; සුවණ්ණ කටාහං ඨපාපෙත්වා, රන්කටාහය තබ්වා; රතනපීඨං ආරුය්හ, රුවන් පුටුවටනැගී; සුවණ්ණතුලිකං ගහෙත්වා, රන්තෙල්ලගෙණ; මනො සිලාය, රත්සිරියලින්; ලෙඛං කත්වා, රෙඛාවක්කොට; මහාබොධිනා, මහාබොධිය; ලඞ්කාදීපෙ, ලක්දිවෙහි; යදි පතිට්ඨාතබ්බං, ඉදින්පිහිටිය යුතුද; අහං, මම; බුද්ධසාසනෙ, බුදුසස්නෙහි; යදිනිබ්බෙමතිකො, භවෙය්‍යං, ඉදින් විමතිනැත්තෙක්වීම් නම්; මහාබොධි, මහාබොධිය; සයමෙව, තෙමේම; ඉමස්මිං සුවණ්ණකටාහෙ පතිට්ඨාතූති, මේ රන්කටාහයෙහි පිහිටාවායි; සච්චවචනකිරියං අකාසි, සත්වදන්කිරිය කොළේයි; සහ සච්චකිරියාය, සත්‍යක්‍රියාවසමග; බොධිසාඛා, බොධිශාඛා තොමෝ; මනො සිලාය පරිච්ඡින්නට්ඨානෙ, රත් සිරියලින් පිරිසිඳි තන්හි; ඡිජ්ජිත්වා, සිඳී; ගන්ධකලලපූරස්ස සුවණ්ණ කටාහස්ස උපරි, සුගන්ධ කදීමයෙන් පුරවනලද රන්කටාහය මතුයෙහි;අට්ඨාසි, සිටියා; තස්සා, ඒ ශාඛාවගේ; උබ්බෙධෙන, උසින්; දසහත්ථොඛන්ධොහොති, දසරිය නක් කඳ ඇත්තේවේ; චතුහත්ථචතුහත්ථා, සිව්සිව්රියන්; පඤ්චමහා සාඛා, පස්මහා ශාඛාවෝවෙත්; පඤ්චහිඵලෙහි එව, පස්ඵලයකින්ම; පතිමණ්ඩිතා, සැරසෙනලද; ඛුද්දකසාඛානං, ක්‍ෂුද්‍රකශාඛාවන්ගෙන්; සහස්සංපන, දහසෙක; අථ, ඉක්බිති; රාජා, රජතෙමේ, මූලලෙඛාය උපරි, මූලරෙඛාමතු; තිවඞ්ගුලෙපදෙසෙ, තුන්අඟුල් පෙදෙසෙහි; අඤ්ඤංලෙඛං පරිච්ඡින්දි, අන්‍ය රෙඛාවක් පිරිසිඳී; තතො, එතනින්; තාවදෙව, එකෙණෙහිම; බුබ්බුලකා හුත්වා, (වැටකෙ පාරොහාඞකුර මෙන් දියබුබුලු ආකාර) බුබුලුව; දසමහාමූලානි නික්ඛමිංසු, දශමහා මූලයන් නික්මුනාහ;

පුන උපරූපරි තිවඞ්ගුලෙ තිවඞ්ගුලෙ අඤ්ඤා නවලෙඛා පරිවජ්ජිංසු. තාහිපි දසදස බුබ්බුලකා හුත්වා නවුති මූලානි නික්ඛමිංසු. පඨමකා දසමහාමූලා චතුරඞ්ගුලමත්තං නික්ඛන්තා ඉතරෙපි ගවක්ඛජාලසදිසං අනුසිබ්බන්තා නික්ඛන්තා. එත්තකං පාටිහීරං රාජා රතනපීඨමත්ථකෙ ඨිතො යෙව දිස්වා අඤ්ජලිං පග්ගය්හ මහානාදං නදි. අනෙකානි භික්ඛුසහස්සානි සාධුකාරමකංසු. සකලරාජසෙනා උන්නාදිනී අහොසි. චෙලුක්ඛෙප සතසහස්සානි පවත්තිංසු. භුම්මට්ඨක දෙවෙ ආදිං කත්වා යාව බ්‍රහ්මකායිකා දෙවතාව සාධුකාරං පවත්තයිංසු. රඤ්ඤො ඉමං පාටිහාරියං පස්සන්තස්ස පීතියා නිරන්තරං ඵුටසරීරස්ස අඤ්ජලිම්පග්ගහෙත්වා ඨිතස්සෙව මහාබොධි මූලසතෙන සුවණ්ණකටාහෙ පතිට්ඨාසි.

---

පුන, නැවත උපරි උපරි, මතුමත්තෙහි; තිවඞ්ගුලතිවඞ්ගුලෙ, තුන්තුන් අඟලක් පාසා; අඤ්ඤා නවලෙඛා, අන්‍යරෙඛා නවයෙක්; පරිවජ්ජිංසු, පිරිසිඳී; තාහිපි, එයින්ද; දසදස බුබ්බුලකා හුත්වා, දශයක් දශයක් බුබුලුව; නවුතිමූලානි නික්ඛමිංසු, මුල්අනූවක් නික්මුනාහුය; පඨමකාදසමහාමූලා, පළමු දසමහමුල්; චතුරඞ්ගුලමත්තං, සතරඟුල් පමණ; නික්ඛන්තා, නික්මුනාහුය; ඉතරෙපි; අන්‍යයෝද; ගවක්ඛජාලසදිසං, ජාලකවුළුවක් සදෘශකොට; අනුසිබ්බන්තා, අනුවතිවමින්; නික්ඛන්තා, නික්මුණාහුය; රාජා, රජතෙමේ; රතනපීඨමත්ථකෙඨිතො යේව, රුවන්පුටුව මතුයෙහි සිටියේම; එත්තකං පාටිහීරං දිස්වා, මෙපමණ පෙළහර දැක; අඤ්ජලිං පග්ගය්හ, ඇඳිලිගෙණ; මහානාදං නදී, මහත් ශබ්දකෙළේය; අනෙකානි භික්ඛුසහස්සානි, නොයෙක් දහස්ගනන් භික්ෂූහු; සාධුකාරමකංසු, සාධුකාරකළෝ; සකලරාජසෙනා සියලු රජසෙනග; උන්නාදිනී අහොසි, උස්ශබ්ද ඇත්තීවී; චෙලුක්ඛෙප සතසහස්සානි පවත්තිංසු, චෙලුක්ඛෙප සියදහස්ගණන් පැවැත්වූහු; (ඒ ඒ ජනයන්ගේ හිසමතුයෙහි පරිභ්‍රමණය කරණ උතුරුසළු වස්ත්‍රයන්ගේ නැගුම් ලක්ෂගණන් පැවැත්වූහුය යන අර්ථයි.) භුම්මට්ඨක දෙවෙ ආදිං කත්වා, භූම්‍යස්ථදෙවියන් ආදිකොට; යාව බ්‍රහ්මකායිකාදෙවතා, යම්තාක් බ්‍රහ්මකායිකදෙවතාවෝ; තාව, ඒතාක්; සාධුකාරං පවත්තයිංසු සාධුකාර පැවැත්වූහු; පීතියා නිරන්තරං ඵුටසරීරස්ස, ප්‍රීතියෙන් නිරතුරුව ඵුසනයවනලද ශරීරය ඇත්තාවූ; අඤ්ජලිං පග්ගහෙත්වා ඨිතස්සෙව, ඇඳිලිගෙණ සිටියාමවූ; රඤ්ඤො, රජහු; ඉමං පාටිහාරියං පස්සන්තස්ස, මේ පෙළහර බලාසිටියදීම; මහාබොධි, මහාබොධිය තෙමේ; මූලසතෙන, (දශරෙඛාවන්හි එකෙක දශයක් දශයක්ව; නිකුත් මුල් සියයකින් යුක්තව) සුවණ්ණකටාහෙ පතිට්ඨාසි, රන් කටාහයෙහි පිහිටියේය;

දසමහාමූලා සුවණ්ණකටාහතලං ආහච්ච අට්ඨංසු. අවසෙසා නවුතිඛුද්දකමූලා අනුපුබ්බෙන වඩ්ඪනකා හුත්වා ගන්ධකලලෙ ඔරුය්හ ඨිතා. එවං සුවණ්ණකටාහෙ පතිට්ඨිතමත්තෙ මහාබොධිම්හි මහාපථවී චලි. ආකාසෙ දෙවදුන්දුභියො ඵලිංසු. පබ්බතානං නච්චෙහි දෙවතානං සාධුකාරෙහි යක්ඛානං හිඞ්කාරෙහි අසුරානං ථුතිජප්පෙහි බ්‍රහ්මානං අප්ඵොටනෙහි මෙඝානං ගජ්ජිතෙහි චතුප්පදානං රවෙහි පක්ඛීනං විරුතෙහි සබ්බතාලාවචරානං සකසකපටිභානෙහි පුථුවීතලතො යාව බ්‍රහ්මලොකා තාව එකකොලාහල මෙකනින්නාදං අහොසි.

පඤ්චසු සාඛාසු ඵලතොඵලතො ඡබ්බණ්ණරංසියො නික්ඛමිත්වා සකලචක්කවාළං රතනගොපානසිවිනද්ධං විය කුරුමානා යාව බ්‍රහ්ම

---

දසමහාමූලා,(ප්‍රථම රේඛාවෙන් නිෂ්ක්‍රාන්ත)දසමහමුල්; සුවණ්ණකටාහතලං ආහච්ච, රන්කටාහතලය ඵුසනයකොට ගෙණ; අට්ඨංසු, සිටියෝ; අවසෙසා නවුති, සෙසු අනූවවූ; ඛුද්දකමූලා, කුඩාමුල්; අනුපුබ්බෙන,පිළිවෙළින්; වඩ්ඪනකාහුත්වා,වැඩෙන්නෝව;ගන්ධකලලෙ,සුවඳමඩෙහි; ඔරුය්හ, බැස; ඨිතා, සිටියාහු; එවං, මෙසේ; මහාබොධිම්හි, මහාබෝධිය; සුවණ්ණකටාහෙ පතිට්ඨිතමත්තෙ, සවණ්කටාහයෙහි පිහිටි මාත්‍රයෙහි; මහාපථවිචලී, මහපොළව සැලුණීය; ආකාසෙ, අහස්හි; දෙවදුන්දුභියො, ඵලිංසු, (ප්‍රසන්නභාවයෙන්) මෙඝගර්ජනා කළෝ; පබ්බතානං නච්චෙහි, (පෘථිවිචලනයෙන් එසේ මෙසේ භ්‍රමණය වනලද) පර්වතයන්ගේ නෘත්‍යයෙන්ද; දෙවතානං සාධුකාරෙහි, දෙවියන්ගේ සාධුකාරනාදයෙන්ද; යක්ඛානං හිඞ්කාරෙහි, යක්ෂයන්ගේ හිඞ්කාරශබ්දයෙන්ද; (විස්මයපත් යක්ෂයෝ හිං හිං යි ශබ්ද පතුරුවත්) අසුරානං ථුතිජප්පෙහි, අසුරයන්ගේ ප්‍රශංසාවචනයෙන්ද; බ්‍රහ්මානං අප්ඵොටනෙහි, ප්‍රීතිසොම්නසින් යුත් බඹුන්ගේ අත්පොළසින්ද(උපදිනලද ප්‍රීතිසොම්නස් ඇති බඹහු වම්අත අකුළුවා දකුණතින් හස්තප්‍රාහාර දෙත්) මෙඝානං ගජ්ජිතෙහි, මෙඝයන්ගේ ගර්ජනාවෙන්ද; චතුප්පදානං රවෙහි, සිව්පාවුන්ගේ රුවයෙන්ද; පක්ඛීනං විරුතෙහි, පක්ෂීන්ගේ ශබ්දයෙන්ද; සබ්බතාලාවචරානං, සියලු පසඟතුරුභාණ්ඩයන්ගේ; සකසකපටිභාණෙහි, තමතමන්ගේ ශිල්පකෞශල්‍යයෙන්ද; පුථුවිතලතො, පෘථිවිතලය පටන්; යාව බ්‍රහ්මලොකා, යම්තාක් බඹලොවද; තාව, ඒතාක් තැන් දක්වා; එකකෝලාහලං, එකට පවත්වනලද කොළාහලයද; එකනින්නාදං, එකට පවත්වනලද ඝෝෂාවද; අහොසි, වූයේය;

පඤ්චසු සාඛාසු, පඤ්චශාඛාවන්හි; ඵලතොඵලතො; පිළින් පිළින්; ඡබ්බණ්ණරංසියොනික්ඛමිත්වා, සවණක් රැස්නික්ම; (ඵලයෙන් නිකුත් සවණක්රැස් සෘජුව උද්ගතව තැමී සක්වලගල මුවවිට වැදී සිටින්යයි **(සකල චක්කවාළං රතන ගොපානසි විනද්ධං විය කුරුමානායි යි.)** සකල චක්කවාළං, සියලු සක්වල; රතනගොපානසි විනද්ධං විය, රුවන් ගොනැස්සෙන් ගැවසුනාක් මෙන්;

ලොකා අබ්භුග්ගච්ඡිංසු. තංඛණඤ්ඤෙව පන පභුති සත්තදිවසානි මහාබොධි හිමවලාහකගබ්භං පවිසිත්වා අට්ඨාසි: න කොචි මහාබොධිං පස්සති. රාජා රතනපීඨතො ඔරුය්හ සත්තදිවසානි මහාබොධිපූජං කාරෙසි. සත්තමෙ දිවසෙ සබ්බදිසාහි හිමඤ්ච රංසියො ච ආවත්තිත්වා මහාබොධිමෙව පවිසිංසු.

විගතහිමවලාහකෙ විප්පසන්නෙ චක්කවාළගබ්භෙ මහාබොධි පරිපුණ්ණඛන්ධසාඛාපසාඛො පඤ්චඵලපතිමණ්ඩිතො සුවණ්ණකටාහෙ පතිට්ඨිතො ව පඤ්ඤායිත්ථ. රාජා මහාබොධිං දිස්වා තෙහි පාටිහාරියෙහි සඤ්ජාතපීතිපාමොජ්ජො සකලජම්බුදීපරජ්ජෙන තරුණමහාබොධිං පූජෙස්සාමීති අභිසෙකං දත්වා, සත්තදිවසානි මහාබොධිට්ඨානෙයෙව අට්ඨාසි. මහාබොධි පුබ්බකත්තිකපවාරණදිවසෙ සායන්හ

---

කුරුමනා, සොරෙමින්; යාවබ්‍රහ්මලොකා, බඹලොවදක්වා අබ්භුග්ගච්ඡිංසු, උස්වපැතනැංගාහුය; තංඛණඤ්ඤෙව පන පභුති, කියනලද ක්‍රමයෙන් සවර්ණකටාහයෙහි පිහිටිමහාබොධියගේ) සවණක්රැස් විහිදුනු කල්හි පටන්; සත්තදිවසානි, සත්දවසක් මුලුල්ලෙහි; මහාබොධි, මහාබොධියතෙමේ; හිමවලාහකගබ්භං පවිසිත්වා අට්ඨාසි, (රන් කටාහය සමගම නැගී) හිමජලයෙන් පිරුණු වලාගැබට පිවිසසිටියේය; කොචි, කිසිවෙක්; මහාබොධිං, මහාබොධිය; නපස්සති, නොදකී; රාජා, රජතෙමේ; රතනපීඨතොඔරුය්හ, රුවන් පුටුවෙන් බැස; සත්තදිවසානි, සත්දවසක් මුලුල්ලෙහි; මහාබොධිපූජංකාරෙසි, මහාබොධිපූජාව කාරිවූයේය; සත්තමෙදිවසෙ, සත්වනදිනයෙහි; සබ්බදිසාහි, සියලු දිගින්; හිමඤ්චරංසියොච ආවත්තිත්වා, (මහාබොධිය වසාතුබූ) හිම ජලයද සවණක් රැස්ද ආවර්තනව හෙවත් පැදකුණුකොට (බොධියට ප්‍රවිෂ්ටවූවාක්මෙන් අතුරුදන්වූයේයයි කියනලදී). මහාබොධිං එව, මහාබොධියටම; පවිසිංසු, ප්‍රවිෂ්ටවූවාහුය;

විගතහිමවලාහකෙ, පහවූහිමවලා ඇති කල්හි; විප්පසන්නෙචක්කවාළගබ්භෙ, පහන්වූ සක්වලගැබ ඇති කල්හි; මහාබොධි, මහාබොධියතෙමේ; පරිපුණ්ණඛන්ධසාඛාපසාඛො පඤ්චඵලපතිමණ්ඩිතො, පරිපූර්ණවූ ස්කන්ධ ශාඛාප්‍රශාඛාවන්ගෙන්ද පස්පලයෙන්ද හාත්පසින් සැරසෙමින්; සුවණ්ණකටාහෙ, රන්කටාහයෙහි; පතිට්ඨිතොව, පිහිටියේම; පඤ්ඤායිත්ථ, පෙනුනේයි; රාජා, රජතෙම; මහාබොධිංදිස්වා, මහාබොධිය දැක; තෙහි පාටිහාරියෙහි, ඒ පෙළහරින්; සඤ්ජාත පීතිපාමොජ්ජො, උපන්ප්‍රීතිප්‍රමොද්‍ය ඇතියේ; සකලජම්බුදීප, සියලුදඹදිවැ; රජ්ජෙන, රාජ්‍යයෙන්; තරුණ මහාබොධිංපූජෙස්සාමීති, තරුණ මහාබොධිය පුදන්නෙමියි; අභිසෙකංදත්වා, අනවතප්තජලයෙන් අභිෂෙකදී; සත්තදිවසානි, සත්දවසක් මුලුල්ලෙහි; මහාබොධිට්ඨානෙයෙව, මහාබොධිය සමීපයෙහිම; අට්ඨාසි, සිටියේය; මහාබොධි, මහාබොධිතෙමේ; පුබ්බකත්තික පවාරණදිවසෙ, වප්මස ශුක්ලපක්ෂපෞර්ණමීදිනැ; සායන්හ

සමයෙ පඨමං සුවණ්ණකටාහෙ පතිට්ඨහි. තතො හිමගබ්භසත්තාහඤ්ච අභිසෙකසත්තාහඤ්ච වීතිනාමෙත්වා කාලපක්ඛස්ස උපොසථදිවසෙ රාජා එකදිවසෙනෙව පාටලිපුත්තං පවිසිත්වා කත්තිකජුණ්හපක්ඛස්ස පාටිපද දිවසෙ මහාබොධිං පාචීනමහාසාලමූලෙ ඨපෙසි. සුවණ්ණකටාහෙ පතිට්ඨිතදිවසතො සත්තරසමෙ දිවසෙ මහාබොධිස්ස අභිනවඞ්කුරා පාතුරහෙසුං.

තෙ දිස්වා පි පසන්නො රාජා පුන මහාබොධිං රජ්ජෙන පූජෙන්තො සකලජම්බුදීපාභිසෙකමදාසි. තදා සුමනසාමණෙරො කත්තික පුණ්ණමදිවසෙ ධාතුගහණත්ථං ගතො මහාබොධිස්ස කත්තිකඡණපූජං අද්දස. එවං මහාබොධිමණ්ඩතො ආනෙත්වා පාටලිපුත්තෙ ඨපිතං මහාබොධිං සන්ධාය ආහ: තෙනහි අම්ම මහාබොධිං ගහෙත්වා යාහීති. සා සාධූති

---

සමයෙ, සවස්වේලෙහි; පඨමං, පළමුකොට; සුවණ්ණකටාහෙ, රන්කටාහයෙහි; පතිට්ඨහි, පිහිටියේය; තතො, ඉන්පසු; හිමගබ්භසත්තාහංච, හිමගැබ්සත්දවසද; අභිසෙකසත්තාහඤ්ච, අභිෂේකසත්තාහයද, වීතිනාමෙත්වා, ඉක්මවා; (තුදුස්වක් උපොෂිතය හෙයින් දෙසතියක් වූ කල්හි; උපොෂිතය පැමිණියේයයි කාලපක්ඛස්ස උපොසථදිවසෙ සීතිය;) කාලපක්ඛස්සව උපොසථ දිවසෙ, කලුවර පක්ෂය සම්බන්ධවූම උපොෂිතදිනයෙහි (යන අර්ථයි); රාජා, රජතෙම; එකාදිවසෙ නෙව, එක්දවසින්ම; පාටලිපුත්තං පවිසිත්වා, පැලලුප්නුවරට ප්‍රවිෂ්ටව; කත්තිකජුණ්හපක්ඛස්සපාටිපදදිවසෙ, වප්මස ජුණ්හපක්ෂය සම්බන්ධ පැළවිය දිනයෙහි; මහාබොධිං, මහාබොධිය; පාචීනමහාසාලමූලෙ ඨපෙසි, (නුවරට ප්‍රාචීනදිශාභාගයෙහි උපන් මහසල්රුකක් යට මණ්ඩපයක් කරවා එහි තැබුයේය; සුවණ්ණකටාහෙ පතිට්ඨිතදිවසතො, රන්කටාහයෙහි පිහිටි දිනපටන්; සත්තරසමෙ දිවසෙ, සතළොස්වනදිනයෙහි හෙවත් පැළවියපටන් දෙවනදිනෙහි; මහාබොධිස්ස, මහාබොධියගේ; අභිනවඞ්කුරා පාතුරහෙසුං, අභිනව අඞ්කුරයෝ පහළවූහු;

තෙදිස්වාපි, එවුන්දුටුකද; පසන්නොරාජා, ප්‍රසන්නවූරජතෙමේ; පුන, නැවත; මහාබොධිං, මහාබොධියට; රජ්ජෙනපූජෙන්තො, රාජ්‍යයෙන් පුදනුයේ; සකලජම්බුදීපාභිසෙකං අදාසි, (තව්කැලිකොට) සියලු දඹදිව් අභිෂේකය දුන්නේය; තදා, එකල්හි; සුමනසාමණෙරො, සුමන සාමණෙර තෙමේ; කත්තිකපුණ්ණමදිවසෙ, කාත්තික පෞර්ණමී දිනයෙහි; ධාතුගහණත්ථංගතො, ධාතුගන්නා පිණිසගියේ; මහාබොධිස්ස, මහාබොධියගේ; කත්තිකඡණපූජංඅද්දස, කාත්තිකඋත්සවයෙන් කරණලද පූජාව දුටුයේය; එවං, මෙසේ; මහාබොධිමණ්ඩතො, ආනෙත්වා, මහබෝමැඩින් ගෙනවුත්; පාටලිපුත්තෙඨපිතං, පැළලුප්නුවරෙහි තබනලද; මහාබොධි සන්ධාය, මහාබොධිය සඳහා; තෙනහි අම්ම මහබොධිංගහෙත්වා යාහීතිආහ, එසේනම් මෑනියෙනි මහාබෝධිය

සම්පටිච්ඡි. රාජා මහාබොධිරක්ඛණත්ථාය අට්ඨාරස දෙවතාකුලානි අට්ඨ අමච්චකුලානි අට්ඨ බ්‍රාහ්මණකුලානි අට්ඨ කුටුම්බිකකුලානි අට්ඨ ගොපකකුලානි අට්ඨ තරච්ඡකුලානි අට්ඨ ච කාලිඞ්ගකුලානි දත්වා උදකාසිඤ්චනත්ථාය ච අට්ඨ සුවණ්ණඝටෙ අට්ඨ ච රජතඝටෙ දත්වා ඉමිනා පරිවාරෙන මහාබොධිං ගඞ්ගාය නාවං ආරොපෙත්වා සයම්පි නගරතො නික්ඛමිත්වා විඤ්ඣාටවිං සමතික්කම්ම අනුපුබ්බෙන සත්තහිදිවසෙහි තාමලිත්තිං අනුප්පත්තො. අන්තරාමග්ගෙ දෙව නාග මනුස්සා උළාරං මහාබොධිපූජං අකංසු.

රාජාපි සමුද්දතීරෙ සත්තදිවසානි මහාබොධිං ඨපෙත්වා සකල ජම්බුදීපෙ මහාරජ්ජං අදාසි. ඉදමස්ස තතියං ජම්බුදීපරජ්ජසම්ප

---

ගෙනයවයි කී; සා, ඒසඞ්ඝමිත්‍රා ස්ථවිරාතොමෝ; සාධූති සම්පටිච්ඡි, යහපතැයි පිළිගති; රාජා, රජතෙමේ; මහාබොධිං රක්ඛණත්ථාය, මහාබොධියරක්නාපිණිස; අට්ඨාරසදෙවතාකුලානි, (මහාබොධිය පිරිවරා සිටි නාගයක්ෂාදී) අටළොස් දෙවතාකුලයන්ද; අට්ඨඅමච්චකුලානි, (බොධියගේ කටයුතු විචාරීම පිණිස) අෂ්ටඅමාත්‍යකුලකෙනෙක්ද; අට්ඨබ්‍රාහ්මණකුලානි, (ලොක සම්මත බැවින් බොධියටදිය ඉසීමට) අෂ්ටබ්‍රාහ්මණකුලකෙණෙක්ද අට්ඨකුටුම්බිකකුලානි, (බොධියගේ කට යුතු පූජොපකරණ ගොපනය පිණිස) අටකෙලඹි කුලකෙනෙක්ද; අට්ඨගොපකකුලානි, ගොපක රාජකාම්මික අටකුලකෙනෙක්ද; අට්ඨතරච්ඡකුලානි, (කිරිදෙනුන් පාලනය පිණිස) අටතරස්කුලකෙනෙක්ද; අට්ඨකාලිඞ්ගකුලානිච, විශ්වාසික ප්‍රධාන මනුෂ්‍ය අටකුල කෙනෙක්ද; දත්වා, දී; (කාලිඞ්ගකුලය යනු පැන්ආදිය ගෙන එන්නෝයයි මහාගණ්ඨිපදයෙහි කියනලදී;) උදකාසිඤ්චනත්ථාය, දියඉස්නා පිණිස; අට්ඨසුවණ්ණඝටෙ රන්කලඅටක්ද; අට්ඨරජතඝටෙදත්වා, රිදීකල අටක්දදී; ඉමිනාපරිවාරෙන, මේ පිරිවර සහිතව; මහාබොධිං, මහාබොධිය; ගඞ්ගාය නාවං ආරොපෙත්වා, ගඟෙහි නැවට නන්වා; සයම්පි, තෙමේද; නගරතො නික්ඛමිත්වා, නුවරින් නික්ම; විඤ්ඣාටවිං සමතික්කම්ම, (බොධියට පසුගමන් පිණිස සෙනග විසින් පිරිවරණලදුව ගොඩමාර්ගයෙන් යනුයේ) විඤ්ඣාටවිනම් වනය ඉක්මවා; අනුපුබ්බෙන, පිළිවෙළින් සත්තහිදිවසෙහි සත්දවසින්; තාමලිත්තිං අනුප්පත්තො, (මුහුදුතෙරං;) තාමලිත්තිනම් පටුණුගම එනම් තොටට පැමිණියේය; අන්තරාමග්ගෙ, අතරමගදී; දෙවනාගමනුස්සා, දිව්‍යනාග මනුෂ්‍යයෝ; උළාරං මහාබොධිපූජං අකංසු, විපුලවූ මහාබොධි පූජාවක් කළෝ.

රාජාපි, රජතෙමේද; මහාබොධිං, මහාබොධිය; සත්තදිවසානි, සත්දවසක්; සමුද්දතීරෙ ඨපෙත්වා, මුහුදුතෙරතබා; සකලජම්බුදීපමහාරජ්ජං අදාසි, (පෙරපරිද්දෙන්) සියලුදඹදිව මහත් රාජ්‍යයදුන්නේය;

දනං හොති. එවං මහාරජ්ජෙන පූජෙත්වා මාගසිරස්ස පඨමපාටිපද දිවසෙ අසොකො ධම්මරාජා මහාබොධිං උක්ඛිපිත්වා ගලප්පමාණං උදකං ඔරුය්හ නාවායං පතිට්ඨාපෙත්වා සඞ්ඝමිත්තත්ථෙරිම්පි සපරිවාරං නාවං ආරොපෙත්වා අරිට්ඨං අමච්චං එතදවොච:-

අහං තාත මහාබොධිං තික්ඛත්තුං සකලජම්බුදීපරජ්ජෙන පූජෙත්වා ගලප්පමාණං උදකං ඔරුය්හ මම සහායස්ස පෙසෙසිං, සොපි එවමෙව මහාබොධිං පූජෙතූති. එවං සහායස්ස සාසනං දත්වා "ගච්ඡති වතරෙ දසබලස්ස සරසරංසිජාලං විමුඤ්චමානො මහාබොධිරුක්ඛො"ති වන්දිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා අස්සූනි පවත්තයමානො අට්ඨාසි. සාපිඛො මහාබොධි සමාරූළ්හා නාවා පස්සතො පස්සතො මහාරාජස්ස

---

අස්ස, ඔහුගේ; ඉදං, මේ ජම්බුදීපෙ, දඹදිවැ; තතියරජ්ජසම්පදනං හොති, තුන්වනරාජ්‍යයදීමවේ; (මෙයට පූජීයෙහිද එකවරක් සියලුදඹදිව රාජ්‍යයෙන්ම මහාබොධියට පිදූයේය එහෙයින් ඒහා-සමග මේසතරවන රාජ්‍යදානයනම, යම් යම් දිනයක මහා බොධියට රාජ්‍යයෙන් පිදූයේද; ඒ ඒ දවස්හි සියලුදඹදිවින් උපන් උපන් අයගෙන මහාබොධිය පූජාකෙළේයයි දතයුතු)

එවං, මෙසේ; මහාරජ්ජෙන පූජෙත්වා, මහත්රාජ්‍යයෙන් පුදා; අසොකොධම්මරාජා, අශොකදහම් රජතෙමේ, මාඝසිරස්ස පඨමපාටිපදදිවසෙ, ඉල්මසසම්බන්ධ ශුක්ලපක්ෂ පෑලවිය දිනෙහි මහාබොධිං උක්ඛිපිත්වා, (මහාසාලමූලයෙහිදී දුන් සොළසජාති සම්පන්නකුලයන්සමග) මහාබොධියඔසවා; ගලප්පමාණං උදකං ඔරුය්හ, ගෙලපමණ ජලයටබැස; නාවායං පතිට්ඨාපෙත්වා, නැවෙහි පිහිටවා; සංඝමිත්තත්ථෙරිම්පි, සඞ්ඝමිත්‍රාසථ්විරාවද; සපරිවාරං නාවං ආරොපෙත්වා, පිරිවරසහිතව නැවටනන්වා; අරිට්ඨං අමච්චං එතදවොච අරිට්ඨනම් ඇමතිට මේ වක්ෂ්‍යමාන වචනය කීයේය;

තාත, පුත; අහං, මම; මහාබොධිං, මහාබොධියට; සකල ජම්බුදීපරජ්ජෙන, සියලුදඹදිව රාජ්‍යයෙන්; තික්ඛත්තුං පූජෙත්වා, තුන් වරක් පූජාකොට; ගලප්පමාණං උදකංඔරුය්හ, ගෙලපමණ ජලයට බැස; මමසහායස්ස, මාගේයාලුවාහට; පෙසෙසි, යැවූයෙමි; සොපි, හෙතෙමේද; එවමෙව, එපරිද්දෙන්ම; මහාබොධිං පූජෙතූති, මහා බොධිය පුදාවායිකියා; සහායස්ස, යහලුවාහට; එවං සාසනං දත්වා, මෙසේ හස්නක්දී; වත, එකාන්තයෙන්; දසබලස්ස, දශබල ධාරීහුගේ; සරසරංසිජාලං විමුඤ්චමානො, සිතිඳුහෙයින් රසවත් ඔජොවත් රුස්කදම්බය විහිදුවන්නාවූ; මහාබොධිරුක්ඛො, මහාබෝ රුක; ගච්ඡතීති, යන්නේයයි; (අරෙයනු බෙදයෙහි නිපාතය) වන්දිත්වා, වැද; අඤ්ජලිපග්ගහෙත්වා, ඇදලිගෙණ; අස්සූනි පවත්තයමා නො, අට්ඨාසි, කඳුලුහෙළමින් සිටියේය; සාපිඛො මහාබොධි,

මහාසමුද්දතලං පක්ඛන්තා මහාසමුද්දෙපි සමන්තා යොජනං වීචියො වූපසන්තා, පඤ්චවණ්ණානි පදුමානි පුප්ඵිතානි, අන්තලික්ඛෙ දිබ්බානි තුරියානි පවජ්ජිංසු. ආකාසෙ ජලථලරුක්ඛාදිසන්නිස්සිතාහි දෙවතාහි පවත්තිතා අතිවිය උලාරපූජා අහොසි.

සඞ්ඝමිත්තත්ථෙරීපි සුපණ්ණරූපෙන මහාසමුද්දෙ නාගකුලානි සන්තාසෙසි. තෙ සමුත්‍රස්තරූපා නාගා ආගන්ත්වා තං විභූතිං පස්සිත්වා ථෙරිං යාචිත්වා මහාබොධිං නාගභවනං අතිහරිත්වා සත්තදිවසානි නාගරජ්ජෙන පූජෙත්වා පුන නාවායං පතිට්ඨාපෙසුං. තං දිවසමෙව

---

ඒ මහාබොධිතොමොද; සමාරූළ්හානාවා, නැගුනුනැව; පස්සතොපස්සතො මහාරාජස්ස, බලා බලා සිටි මහරදහට අනදරකොට; මහාසමුද්දතලං පක්ඛන්තා, මහමුහුදුතෙලට පැමුනුණී; මහාසමුද්දෙපි, මහමුහුදෙහිද; සමන්තායොජනං, හාත්පස එක එක පසෙක්හි යොත්නක්; පමණ පෙදෙස වීචියොවූපසන්තා, රැළනොනැංගහ; පඤ්චවණ්ණානි පදුමානි පුප්ඵිතානි, පස්පැවන්පියුම් පිපුණාහ; අන්තලික්ඛෙ, අහස්හි; දිබ්බානි තුරියානි පවජ්ජිංසු, දිව්‍යතූර්‍ය්‍යනාද පැවැත්වූහු; ආකාසෙ අහසෙහි; ජලථලරුක්ඛාදිසන්නිස්සිතාහි දෙවතාහි, ජලථල වෘක්ෂාදියෙහි සන්නිශ්‍රිත දෙවතාවන් විසින්;(මෙහි ආදි සදින් පර්‍වතාදියෙහි සන්නිශ්‍රිත දෙවතාවෝ ගෘහීතයහ; පවත්තිතා, පවත්වනලද; අතිවියඋලාරාපූජාඅහොසි; ඉතාමහත් පූජාවෙක්වීය;

සඞ්ඝමිත්තත්ථෙරීපි, සඞ්ඝමිත්‍රස්ථවිරාතොමෝද; සුපණ්ණරූපෙන, ගුරුළුන් සමාන රූපයකින්; මහාසමුද්දෙ, මහමුහුදෙහි; නාගකුලානිසන්තාසෙසි, (මහාබොධියගන්නා පිණිස ආවාවූ) නාගකුලයන් තැතිගැන්වී; (ඔවුන්ට භයඋපදවා පැලවියයන අර්ථයි.) තෙසමුත්‍රස්තරූපානාගා ආගන්ත්වා, (කියනලද ක්‍රමයෙන්) තැතිගත් හෙදනාගයෝ නැවත අවුත්; තං විභූතිං පස්සිත්වා, ඒ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යසඞ්ඛ්‍යාත ආශ්චර්‍ය්‍යද්ධිය; ථෙරිං යාචිත්වා;

(ආර්‍ය්‍යාව! අපභාග්‍යවත්තෙමේ මුචලින්දනාරදහුගේ භොගාවලිය තමන්වහන්සේට ගඳකිලියක්කොට සත්දවසක් මුලුල්ලෙහි ඔහට සඞ්ග්‍රහකොළේය; බුදුවනදිනයෙහි නෙරඤ්ජරා නදීතීරයෙහි තමන් වහන්සේගේ ඉදුල්තලිය මහාකාල නාරදහට යැවූයේයයි මේ ආදිය දක්වා තුඹවහන්සේද බොධිය නාලොවට යවා මොහොතක් එහි නවත්වා නාගයින්ට සගමොක් සිදුකරදෙවයි) කියා,

සථ්විරාවට යාචඤ්ඤකොට; මහාබොධිං නාගභවනං අතිහරිත්වා, මහාබොධිය නාගභවනයට ගෙනගොස්; සත්තදිවසානි, සත්දවසක්; නාගරජ්ජෙන, නාගරාජ්‍යයෙන්; පූජෙත්වා, පුදා; පුන, නැවත; නාවායං, නැවෙහි; පතිට්ඨාපෙසුං, පිහිටවූහු; තංදිවසමෙව, එදවස්හිම;

නාවා ජම්බුකොලපට්ටනං අගමාසි. අසොකමහාරාජාපි මහාබොධි වියොගදුක්ඛිතො කන්දිත්වා රොදිත්වා යාව දස්සනවිසයං ඔලොකෙත්වා පටිනිවත්ති. දෙවානම්පියතිස්සො මහාරාජාපි ඛො සුමනසාමණෙරස්ස වචනෙන මාගසිරස්ස පඨමපාටිපදදිවසතොප්පභුති උත්තරද්වාරතො පට්ඨාය යාව ජම්බුකොලපට්ටනං තාව මග්ගං සොධාපෙත්වා අලඞ්කාරාපෙත්වා නගරතො නික්ඛමනදිවසෙ උත්තරද්වාරසමීපෙ සමුද්දසාලාවත්ථුස්මිං ඨිතො යෙව තාය විභූතියා මහාසමුද්දෙ ආගච්ඡන්තං යෙව මහාබොධිං ථෙරස්ස ආනුභාවෙන දිස්වා තුට්ඨමානසො නික්ඛමිත්වා සබ්බං මග්ගං පඤ්චවණ්ණෙහි පුප්ඵෙහි ඔකිරාපෙන්තො අන්තරන්තරා පුප්ඵඅග්ඝියානි ඨපෙන්තො එකාහෙනෙව ජම්බුකොලපට්ටනං ගන්ත්වා සබ්බතාලාවචරපරිවුතො පුප්ඵධූපගන්ධාදීහි පූජයමානො ගලප්පමාණං

---

නාවා, නැව; ජම්බුකොලපට්ටනං අගමාසි, දඹකොල පටුනටගියා; අසොකමහාධම්මරාජාපි, අශොක මහදහම්රදද; මහාබොධි වියොගදුක්ඛිතො, මහාබොධි වියොගය කාරණකොටගෙන උපන්දුක්ඇතියේ; (කන්දිත්වායනු රොදිත්වායනමෙයට පරියායවචන මාත්‍රයකි) රොදිත්වා, (ගුණකථනවශයෙන් නැවත නැවත) අඬා (විලාපකොටය යන අර්ථයි;) යාවදස්සනවිසයං, දර්ශනවිෂය යම්තාක්ද (ඒතාක්)ඔලොකෙත්වා, බලා; පටිනිවත්ති, හැරුනේය; දෙවානම්පියතිස්සොමහාරාජාපි ඛො, දෙවානම්පියතිස්ස මහරදතෙමේද වනාහි; සුමනසාමණෙරස්ස වචනෙන, සුමනනම් හෙරණහුගේ වචනයෙන්; මාඝසිරස්ස පඨම පාටිපදදිවස තො පපහුති, ඉල්මස ප්‍රථම පෑලවියදින පටන්; උත්තර ද්වාරතො පට්ඨාය,අනුරාධපුරයගේ උතුරුදෙරසිට;යාවජම්බුකොලපට්ට නං, දඹකොලපටුනදක්වා; තාව,ඒතාක්, මග්ගංසොධාපෙත්වා, (කාණුකටු ඉදිරීම් වශයෙන්)මාර්ගයවිශොධනයකරවා;අලඞ්කාරාපෙත්වා, වැලිආදිය විසිරිම්වශයෙන් අලඞ්කාරකරවා; නගරතො නික්ඛමනදිවසෙ, නුවරින් නිකුත්වනදිනෙහි; උත්තරද්වාරසමීපෙ. උතුරුදෙර සමීපයෙහි; සමුද්දසාලවත්ථුස්මිං ඨිතොයෙව, (මුහුදදක්නාපිණිස කරවනලද) එනම් ශාලා ප්‍රදෙශයෙහි සිටියේම; තායවිභූතියා, උක්තප්‍රකාරපූජා සත්කාරාදි ඒ සම්පත්තියෙන්; මහා සමුද්දෙ ආගච්ඡන්තංයෙව, මහමුහු දෙහි එන්නාවූම; මහාබොධිං, මහාබොධිය; ථෙරස්සානුභාවෙන දිස්වා, මහාමහින්දස්ථවිරහුගේ අනුභාවයෙන් දැක; තුට්ඨමානසො, සතුටු සිත් ඇතියේ; නික්ඛමිත්වා, නික්ම; සබ්බංමග්ගං, සියලුමග; පඤ්ච වණ්ණෙහි පුප්ඵෙහි, ඔකිරාපෙන්තො, පඤ්චවර්ණපුෂ්පයෙන් අතුරු වමින්; අන්තරන්තරා, මගදෙපස අතරින්තර; පුප්ඵඅග්ඝියානි ඨ පෙන්තො, මලින්කුළුගෙවල් සමාන චෛත්‍යයන් කරවමින්; එකා හෙනෙව, එකදවසින්ම; ජම්බුකොලපට්ටනං ගන්ත්වා, දඹකොල පටුනටගොස්; සබ්බතාලාවචරපරිවුතො, සියලුතූර්‍යභාණ්ඩයන් විසින් පිරිවරණලදුයේ; පුප්ඵධූපගන්ධාදීහි පූජයමානො; පුෂ්පධූප

උදකං ඔරුය්හ-ආගතො වත‘රෙ දසබලස්ස සරසරංසිජාලවිස්සජ්ජනකො මහාබොධිරුක්ඛොති පසන්නචිත්තො මහාබොධිං උක්ඛිපිත්වා උත්තමඞ්ග සිරස්මිං පතිට්ඨපෙත්වා මහාබොධිං පරිවාරෙත්වා ආගතෙහි සොළසහි ජාතිසම්පන්නකුලෙහි සද්ධිං සමුද්දතො පච්චුත්තරිත්වා සමුද්දතීරෙ මහාබොධිං ඨපෙත්වා තීනිදිවසානි සකලතම්බපණ්ණිදීපෙ රජ්ජෙන පූජෙසි. සොළසන්නං ජාතිසම්පන්න කුලානං රජ්ජං විචාරෙසි.

අථ චතුත්ථෙ දිවසෙ මහාබොධිං ආදාය උළාරං පූජං කුරුමානො අනුපුබ්බෙන අනුරාධපුරං සම්පත්තො. අනුරාධපුරෙපි මහාසක්කාරං කත්වා

---

සුගන්ධාදියෙන් පුදමින්; ගලප්පමාණං උදකං ඔරුය්හ, ගලප්‍රමාණ දියටබැස; දසබලස්ස, දශබලධාරීහුගේ; සරසරංසිජාල විස්සජ්ජනකො, (ජීවත්වූවාක්මෙන් එසේ මෙසේ) සැරිසරණ රැස්කදම්බයවිහිදුවන්නාවූ; බොධිරුක්ඛො ආගතො, බෝරුකආයේය; වත, ඒකාන්තයෙන්; අරෙති, මැනවයි; (මෙහිඅරෙයනු ප්‍රශංසායෙහි නිපාතය;) පසන්නචිත්තො, පහන්සිත්ඇතියේ; මහාබොධිං උක්ඛිපිත්වා, මහාබොධිය ඔසවා; උත්තමඞ්ගසිරස්මිං. පතිට්ඨාපෙත්වා, උත්තමාඞ්ගයයි කියනලද හිසෙහි පිහිටුවා; මහාබොධිං පරිවාරෙත්වා ආගතෙහි, මහාබොධිය පිරිවරාආවාවූ; සොළසහිජාතිසම්පන්නකුලෙහි සද්ධිං, යථොක්ත අෂ්ටඅමාත්‍ය කුලාදි සොළසක් ජාතිමත් කුලයන්සමග; සමුද්දතො පච්චුත්තරිත්වා, මුහුදින්ගොඩනැඟී; සමුද්දතීරෙ, මුහුදුතෙර; (අලඞ්කාර කොට පිළියෙලකරණලද සිත්කලුවූ මණ්ඩපයෙහි;) මහාබොධිං ඨපෙත්වා, මහාබොධිය තබා;

(මෙසේකොට වනාහි සියලු ලක්දිවරාජ්‍යයෙන්ම මහාබොධියට පුද සොළොස්කුලයන්ට රාජ්‍යපාවාදී තමන් දෞවාරික ස්ථානයෙහි සිට තුන්දවසක් මුළුල්ලෙහි නොයෙක් පූජාසත්කාරකොළේසි; ඒ දක්වනුපිණිස තීනිදිවසානි ආදිකීයේ;)

තීනිදිවසානි, තුන්දිනයක්; සකලතම්බපණ්ණිදීපෙ, සියලු තාම්‍රපර්ණීවීපයෙහි; රජ්ජෙනපූජෙසි, රාජ්‍යයෙන් පිදූයේය; සොළසන්නංජාතිසම්පන්නකුලානං, (ඇමතිය බමුණුය යනමේ) ජාතිමත් සොළොස්කුලය විසින්; රජ්ජං විචාරෙසි, රාජ්‍යයවිචාරන්ට හැරියේය;

අථ, ඉක්බිති; චතුත්ථෙදිවසෙ, සතරවන දිනෙහි; (හෙවත් ඉල් මස සම්බන්ධ ශුක්ලපක්ෂයෙහි දශවන තිථියලත් දිනයෙහි) මහාබොධිං ආදාය, මහාබොධිය ගෙණ; උළාරංපූජංකුරුමානො, මහත් පූජා කෙරෙමින්; අනුපුබ්බෙන, පිළිවෙළින්; අනුරාධපුරංසම්පත්තො, (දසවක්ලත් දිනයෙහි සරහනලද රථයෙහි බොධිය තබා) අනුරාධපුරයට පැමිණියේය; අනුරාධපුරෙපි, අනුරාධපුරයෙහිදීද; මහාසක්කාරංකත්වා,

චාතුද්දසීදිවසෙ යෙව වඩ්ඪමානකච්ඡායාය මහාබොධිං උත්තරද්වාරෙන පවෙසෙත්වා නගරමජ්ඣෙන අතිහරන්තො දක්ඛිණද්වාරෙන නික්ඛමිත්වා දක්ඛිණද්වාරතො පඤ්චධනුසතිකට්ඨානෙ යත්ථ අම්හාකං සම්මාසම්බුද්ධො නිරොධසමාපත්තිං සමාපජ්ජිත්වා නිසීදි,

පුරිමකාච තයො සම්මාසම්බුද්ධා සමාපත්තිං අප්පෙත්වා නිසීදිංසු, යත්ථ කකුසන්ධස්ස භගවතො මහාසිරීසබොධි කොනාගමනස්ස භගවතො පන උදුම්බරබොධි කස්සපසම්මාසම්බුද්ධස්ස ච නිග්‍රොධබොධි පතිට්ඨාසි, තස්මිං මහාමෙඝවනුය්‍යානස්ස තිලකභූතෙ සුමනසාමණෙරස්ස වචනෙන පඨමමෙව කතභූමිපරිකම්මෙ රාජවත්ථුද්වාරකොට්ඨකට්ඨානෙ මහාබොධිං පතිට්ඨාපෙසි.

කථං? තානි කිර බොධිං පරිවාරෙත්වා ආගතානි සොළස ජාතිසම්පන්නකුලානි රාජවෙසං ගණ්හිංසු. රාජා දොවාරිකවෙසං ගණ්හි.

---

මහත් සත්කාරකොට; චාතුද්දසීදිවසෙයෙව, (ඉල්මස ශුක්ලපක්ෂ) චාතුර්දශීදිනයෙහිම; වඩ්ඪමානකච්ඡායාය, සවස්වේලෙහි; මහාබොධිං, මහාබොධිය; උත්තරද්වාරෙනපවෙසෙත්වා, උතුරුදෙරින් ඇතුළුනුවරට ප්‍රවෙශකරවා; නගරමජ්ඣෙන, නුවරමැදින්; අතිහරන්තො, ගෙණයනුයේ; දක්ඛිණද්වාරෙනනික්ඛමිත්වා, දකුණුදෙරින් නික්ම; දක්ඛිණද්වාරතො, දකුණුදෙර පටන්; පඤ්චධනුසතිකට්ඨානෙ, දුනුපන්සියයක් පමණ තන්හි; යත්ථ, යම්තැනෙක්හි; අම්හාකංසම්මාසම්බුද්ධො, අප සම්‍යක් සම්බුද්ධතෙමේ; නිරොධසමාපත්තිංසමාපජ්ජිත්වා, නිරොධසමාපත්තියට සමවැද; නිසීදි, වැඩහිඳවදාළසේක්ද;

පුරිමකාච තයො සම්මාසම්බුද්ධා, පළමුවූද තුන් සම්‍යක්සම්බුදුවරයෝ; සමාපත්තිං අප්පෙත්වා, සමාධියට පැමිණ; නිසීදිංසු, හුන්නාහුද; කකුසන්ධස්සභගවතො මහාසිරීසබොධි, කකුසඳ නම් භාග්‍යවත්හුගේ; මහරිබොධියද; කොනාගමනස්ස භගවතො උදුම්බරබොධි, කොනාගමන භාග්‍යවත්හුගේ උදුම්බරබොධියද; කස්සපසම්මාසම්බුද්ධස්ස නිග්‍රොධබොධි, කාශ්‍යප සම්‍යක් සම්බුදුහුගේ නිග්‍රොධබොධියද; යත්ථපතිට්ඨාසි, යම්තැනෙක පිහිටියේද; තස්මිං, එතැන්හි; සුමනසාමණෙරස්සවචනෙන, සුමන නම් හෙරණහුගේ වචනයෙන්; පඨමමෙව කතභූමිපරිකම්මෙ, පළමුකොටම කරණලද බිමපිරියම් ඇති; මහාමෙඝවනුය්‍යානස්ස තිලකභූතෙ, මහමෙවුනා උයනට ආභරණවූ; රාජවත්ථුද්වාරකොට්ඨකට්ඨානෙ, රජ උයනට දෙර කොටු තැන්හි; මහාබොධිංපතිට්ඨාපෙසි, මහාබොධිය පිහිටවූයේය;

කථං, කෙසේද? තානිකිර, ඒ වනාහී; බොධිංපරිවාරෙත්වා බොධිය; පිරිවරා, ආගතානි සොළසජාතිසම්පන්නකුලානි, ආවාවූ සොළසජාති සම්පන්නකුලයෝ; රාජවෙසං ගණ්හිංසු, රාජවෙශය ගත්තාහුය; රාජා,

සොළස කුලානි මහාබොධිං ගහෙත්වා ඔරොපයිංසු. මහාබොධි තෙසං හත්ථතො මුත්තසමනන්තරමෙව අසීති හත්ථප්පමාණං වෙහාසං අබ්භුග්ගන්ත්වා ඡබ්බණ්ණරංසියො මුඤ්චි.

රංසියො සකලදීපං පත්ථරිත්වා උපරිබ්‍රහ්මලොකං ආහච්ච අට්ඨංසු. මහාබොධිපාටිහාරියං දිස්වා සඤ්ජාතප්පසාදානි දසපුරිස සහස්සානි අනුපුබ්බවිපස්සනං පට්ඨපෙත්වා අරහත්තං පත්වා පබ්බජිංසු. යාව සුරියස්සත්ථඞ්ගමා මහාබොධි අන්තලික්ඛෙ අට්ඨාසි.

අත්ථමිතෙ පන සුරියෙ රොහිණීනක්ඛත්තෙන පඨවියං පතිට්ඨහි. සහ බොධිපතිට්ඨානා උදකපරියන්තං කත්වා මහාපඨවී අකම්පි. පතිට්ඨහිත්වා ච පන මහාබොධි සත්තදිවසානි හිමගබ්භෙ සන්නිසීදි. ලොකස්ස අදස්සනං අගමාසි.

---

රජතෙමේ; දෙවාරිකවෙසං ගණ්හි, දෙවාරිකවෙශය ගත්තේය; සොළස කුලානි, සොළොස්කුලයෝ; මහාබොධිංගහෙත්වා, මහාබොධිය ගෙණ; ඔරොපයිංසු, බැස්වූහු; මහාබොධි, මහාබොධියතෙමේ; තෙසං හත්ථතො මුත්තසමනන්තරං එව, ඔවුන්ගේ අතින් මිදිම්මාත්‍රයට අනතුරුවම; අසීතිහත්ථප්පමාණං වෙහාසං අබ්භුග්ගන්ත්වා, අසූරියනක් පමණ අහසට පැනනැගී; ඡබ්බණ්ණරංසියො, සවණක් රැස්; මුඤ්චි, විසර්ජනය කොළේය.

රංසියො, (ජීවමාන කාලයෙහි බුදුන් විසින් මෙන්) විහිදුවනලද රස්මීහු; සකලදීපංපත්ථරිත්වා, සියළු දිවයින පැතිරී; උපරිබ්‍රහ්මලොකංආහච්චඅට්ඨංසු, මතුබඹලොවඝට්ටනයකොට සිටියාහුය; මහාබොධිපාටිහාරියංදිස්වා, මහබෝ පෙළහැර දැක; සඤ්ජාතප්පසාදානි, උපන් ප්‍රසාදය ඇති; දසපුරිසසහස්සානි, දසදහසක් පුරුෂයෝ; අනුපුබ්බවිපස්සනංපට්ඨපෙත්වා, උදය ව්‍යයාදී අනුපූර්වදර්ශිතාව ඇරඹ; අරහත්තංපත්වා, රහත්බවට පැමිණ; පබ්බජිංසු, පැවිදිවූහු; යාවසුරියස්සත්ථඞ්ගමා, සූය්‍ර්‍යයාගේ අස්තඞ්ගමය දක්වා, මහාබොධි, මහබොධී තෙමේ; අන්තලික්ඛෙඅට්ඨාසි, අහස සිටියේය.

සුරියෙ අත්ථමිතෙපන, හිරු අස්තයට ගිය කල්හි වනාහි; රොහිණී නක්ඛත්තෙන, රෙහෙණ නැකතින්; පඨවියංපතිට්ඨහි, පෘථිවියෙහි පිහිටියේය; සහබොධිපතිට්ඨානා, බොධියපිහිටීම සමගම; (මෙහි සහබොධිපතිට්ඨානෙනාති කියයුත්තෙහි විභක්තිවිපර්‍ය්‍යාසකොට සහබොධිපතිට්ඨානායි නිඃසක්ක වචනය කොළේයයි දතයුතු.) උදකපරියන්තං කත්වා, ජලය කෙළවරකොට; මහාපඨවිඅකම්පි, මහ පොළොව කම්පාවී; (මහපොළොව කම්පාවූයේයයි මේ මුඛමාත්‍රදර්ශන යක අතිකුදු නොයෙක් ආශ්චර්‍ය්‍යවූවාහුය; එහෙයින් සාරත්ථදීපනී නම් ටීකාවෙහි **"සහබොධිපතිට්ඨානෙන උදකපරියන්තං කත්වා මහාපඨවී අකම්පිත්‍යාති මූලානි ඛටාහමුඛවටපිණ්ඩිකාලඞ්ගනාඩා තං කටාහං විනා ඛන්තා පඨවිතලමො කරිංසු, සමන්තතො දිබ්බකුසුමානි**

සත්තමෙ දිවසෙ විගතවලාහකං නභං අහොසි. ඡබ්බණ්ණරංසියො ජලන්තා විප්ඵුරන්තා නිච්ඡරිංසු. මහාබොධිස්ස ඛන්ධොච සාඛායොච තානිච පඤ්චඵලානි දස්සිංසු. මහින්දත්ථෙරොච සඞ්ඝමිත්තත්ථෙරීච රාජාච සපරිවාරා මහාබොධිට්ඨානමෙව අගමිංසු. යෙභුය්‍යෙනච සබ්බදීපවාසිනො සන්නිපතිංසු තෙසං පස්සන්තානංයෙව උත්තරසාඛතො එකං ඵලං පච්චිත්වා සාඛතො මුච්චි. ථෙරො හත්ථං උපනාමෙසි. ඵලං ථෙරස්ස හත්ථෙ පතිට්ඨාසි. තං ථෙරො "රොපය මහාරාජා"ති රඤ්ඤො අදාසි. රාජා ගහෙත්වා සුවණ්ණකටාහෙ මධුරපංසුං ආකිරිත්වා ගන්ධකලලං පූරෙත්වා රොපෙත්වා මහාබොධි ආසන්නට්ඨානෙ ඨපෙසි.

---

**වස්සිංසු, ආකාසෙ දිබ්බතූරියානි වජ්ජිංසු, මහාමෙඝා උට්ඨහිත්වා වුට්ඨිපාතමකංසු, ආකාසපදෙසා විරවිංසු, විජ්ජුලතානි නිච්ඡරිංසු, දෙවතා සාධුකාරමකංසු, සමාගත සකලදීපවාසිනො ගන්ධමාලාදීහි පූජයිංසු, ගහිතමකරන්දමන්දමාරුතා වායිංසු, සමන්තතො ඝනසීතල හිමවලාහකා මහාබොධිං ඡාදයිංසු, එවං බොධිං පඨවියං පතිට්ඨහිත්වා හිමගබ්භෙ සන්නිසීදිත්වා සත්තාහං ලොකස්ස අදස්සනං අගමාසි කිය.)**

පතිට්ඨහිත්වාච, පිහිටාද; මහාබොධිපත මහාබොධිය වනාහි; සත්තදිවසානි, සත් දවසක්; හිමගබ්භෙසන්නිසීදි. හිම ගැබතුලසිටියේය; ලොකස්සඅදස්සනං අගමාසි, ලෝකයාගේ ආදර්ශනයට ගියේය;

සත්තමෙදිවසෙ, සත්වනදිනයෙහි; නභං, අහස; විගතවලාහකං අහොසි, පහවූවලා ඇතිවූයේය; ඡබ්බණ්ණරංසියො, සවණක් රැස්; ජලන්තා, දිලිසෙමින්;විප්ඵුරන්තා, එසේ මෙසේ සැරිසරමින්; නිච්ඡරිංසු, විසුරුණාහුය; මහාබොධිස්ස, මහාබොධියගේ; ඛන්ධො ච, කඳද; සාඛායොච, අතුද; තානිපඤ්චඵලානිච, ඒ පස්පලද; දස්සිංසු, පෙනුනාහුය; මහින්දත්ථෙරොච, මිහිඳුතෙර තෙමේද; සඞ්ඝමිත්තත්ථෙරීච, සඞ්ඝමිත්‍රාස්ථවිරාද; රාජාච, රජතෙමේද; සපරිවාරා, පිරිවර සහිතවූවාහු; මහාබොධිට්ඨානමෙව, මහාබොධිස්ථානයටම; අගමිංසු, ගියෝ; යෙභුය්‍යෙනච, බොහෝ සෙයින්ම; සබ්බදීපවාසිනො සන්නිපතිංසු, සියලු ලක්දිව් වැස්සෝ රැස්වූහු; තෙසංපස්සන්තානංයෙව, ඔවුන් බලා සිටියදීම; උත්තරසාඛතො, උතුරු ශාඛාවෙහි සිටි; එකංඵලං පච්චිත්වා, එක් ඵලයක් පැසී; සාඛතොමුච්චි, ශාඛාවෙන් මුක්තවූයේය; ථෙරො, තෙරතෙමේ; හත්ථංඋපනාමෙසි, අතපෑයේය; ඵලං, ඵලය; ථෙරස්සහත්ථෙ, තෙරහුගේ අතෙහි; පතිට්ඨාසි, පිහිටියේය; තං, ඒ ඵලය; ථෙරො, තෙරතෙමේ; රොපය මහාරාජාති, රොපණය කරව මහරජැයි කියා; රඤ්ඤො අදාසි, රජහට දුන්නේය; රාජා රජතෙමේ; ගහෙත්වා, ගෙණ; සුවණ්ණකටාහෙ, රන්කටාහයෙහි; මධුරපංසුං ආකිරිත්වා, මිහිරි පස්වගුරුවා; ගන්ධකලලං, පූරෙත්වා, සුවඳ කලල්පුරවා; රොපෙත්වා, රොපණයකොට; මහාබොධිආසන්නට්ඨානෙඨපෙසි, මහා බොධියට පූජිපාශ්වයෙහි මහා ශෛලාසනය පිහිටි තැන තැබූයේය;

සබ්බසං පස්සන්තානංයෙව චතුහත්ථප්පමාණා අට්ඨතරුණබොධිරුක්ඛා උට්ඨහිංසු. රාජා තං අච්ඡරියං දිස්වා අට්ඨතරුණබොධිරුක්ඛෙ සෙතච්ඡත්තෙන පූජෙත්වා අභිසෙකං අදාසි. තතො එකං බොධිරුක්ඛං ආගමනකාලෙ මහාබොධිනා පඨමපතිට්ඨිතොකාසෙ ජම්බුකොලපට්ටනෙ රොපයිංසු,

එකං තවක්කබ්‍රාහ්මණස්ස ගාමද්වාරෙ, එකං ථූපාරාමෙ, එකං ඉස්සරනිම්මාණවිහාරෙ, එකං පඨමචෙතියට්ඨානෙ, එකං චෙතියපබ්බතෙ, එකං රොහණජනපදම්හි කාජරගාමෙ, එකං රොහණජනපදම්හියෙව චන්දනගාමෙ, ඉතරෙසං චතුන්නං ඵලානං බීජෙහි ජාතෙ ද්වත්තිංසබොධිතරුණෙ යොජනීය යොජනීයෙසු ආරාමෙසු පතිට්ඨාපෙසුං.

---

සබ්බසං පස්සන්තානං යෙව, සියල්ලන් බලාසිටියදීම; චතුහත්ථප්පමාණා, සිව්රියන් පමණ; අට්ඨතරුණබොධිරුක්ඛා, අටක් තරුණ බෝරුක්; උට්ඨහිංසු, පැනනැංගාහුය; රාජා, රජතෙම තංඅච්ඡරියං දිස්වා, ඒ ආශ්චර්‍ය්‍යය දැක; අට්ඨතරුණබොධිරුක්ඛෙ, අටතරුණ බෝරුක්; සෙතච්ඡත්තෙන පූජෙත්වා, සේසතින්පුදා; අභිසෙකං අදාසි, අබිසෙස්දුන්නේය; තතො, එයින්; එකං බොධිරුක්ඛං, එක්බෝරුකක්; ආගමනකාලෙ, බොධියආකල; පඨමංපතිට්ඨිතොකාසෙ, පළමු පිහිටි අවකාශයෙහි; ජම්බුකොලපට්ටනෙ, දඹකොලපටුනෙහිද; එකං, එක් රුකක්; තවක්කබ්‍රාහ්මණස්සගාමද්වාරෙ, තවක්කබ්‍රාහ්මණයාගේ ගම් දොරෙහිද; එකං, එක්රුකක්; ථූපාරාමෙ, ථූපාරාමයෙහිද; එකං, එක් රුකක්; ඉස්සර නිම්මාණවිහාරෙ, ඊශ්වරනිර්‍මාණ (සඞ්ඛ්‍යාත කසුප් ගිරි) වෙහෙරෙහිද; ඊශ්වරනිර්‍මාණවිහාරයයි පූර්‍වසඞ්කෙතවශයෙන් කියනලද්දී; (දැන්වනාහි ඒ විහාරය කසුප්ගිරියයි පතලවී). එකං, එක්රුකක්; පඨම චෙතියට්ඨානෙ, ප්‍රථමකචෛත්‍යස්ථානයෙහිද; එකං, එක්රුකක්; චෙතියපබ්බතෙ, සෑපව්වෙහිද; එකං, එක්රුකක්; රොහණජනපදම්හි කාජරගාමෙ, රුහුණු ජනපදයෙහි කතරගමද; එකං එක්රුකක්; රොහණජනපදම්හියෙව චන්දනගාමෙ, රුහුණු ජනපදයෙහිම සඳුන් ගමෙහිද; රොපයිංසු, රොපනය කළෝ;

ඉතරෙසංචතුණ්ණංඵලානං, අනික්සිව්ඵලයන්ගේ; බීජෙහි ජාතෙ, බිජුවටින් උපන්; ද්වත්තිංසබොධිතරුණෙ, දෙතිස් තරුණ බොධීන්; යොජනීයයොජනීයෙසු ආරාමෙසු, අනුරධපුරයට හාත්පසින් යොත්නෙක්හි යොත්නෙක්හි ඇතුලත කරණලද අරම්හි; පතිට්ඨාපෙසුං, පිහිටවූහු;

එවං පුත්තනත්තුපරම්පරාය සමන්තාදීපවාසීනං හිතාය සුඛාය පතිට්ඨිතෙ මහාබොධිම්හි අනුලාදෙවී පඤ්චහි කඤ්ඤාසතෙහි පඤ්චහිච අන්තෙපුරිකාසතෙහිති මාතුගාමසහස්සෙන සද්ධිං සඞ්ඝමිත්තාත්ථෙරියා සන්තිකෙ පබ්බජිත්වා නචිරස්සෙව සපරිවාරා අරහත්තෙ පතිට්ඨාසි. අරිට්ඨොපිඛො රඤ්ඤො භාගිනෙය්‍යො පඤ්චහි පුරිසසතෙහි සද්ධිං ථෙරස්ස සන්තිකෙ පබ්බජිත්වා නචිරස්සෙව සපරිවාරො අරහත්තෙ පතිට්ඨාසි.

අථෙකදිවසං රාජා මහාබොධිං වන්දිත්වා ථෙරෙන සද්ධිං ථූපාරාමං ගච්ඡති. තස්ස ලොහපාසාදට්ඨානං සම්පත්තස්ස පුරිසා පුප්ඵානි අභිහරිංසු. රාජා ථෙරස්ස පුප්ඵානි අදාසි. ථෙරො පුප්ඵෙහි ලොහපාසාදට්ඨානං පූජෙසි. පුප්ඵෙසු භූමියං පතිතමත්තෙසු මහාභූමිචාලො අහොසි.

---

එවං, මෙසේ: සමන්තා, අනුරාධපුරයට හාත්පසින්; දීපවාසීනං, ලක්දිව්වැසියන්ගේ; පුත්තනත්තුපරම්පරාය, දරුමුණුබුරු පරම්පරාව දක්වා; හිතාය සුඛාය, හිතසැප පිණිස; දසබලස්ස දශබල ධාරීහුගේ; මහාබොධිම්හිපතිට්ඨිතෙ, මහාබොධිය පිහිටි කල්හි; අනුලාදෙවී, අනුලාදෙවිතොමෝ; පඤ්චහිකඤ්ඤාසතෙහි, පන්සියයක් කන්‍යාවන්ද; පඤ්චහිච අන්තෙපුරිකාසතෙහි, පන්සියයක් අන්තඃ පුරස්ත්‍රීන්දූයි; මාතුගාමසහස්සෙන සද්ධිං, මාගම්හු දහසක් සමග; සඞ්ඝමිත්තාත්ථෙරියාසන්තිකෙ පබ්බජිත්වා, සඞ්ඝමිත්‍රාස්ථවිරාව වෙත පැවිදිව; නචිරස්සෙව, නොබෝකලකින්ම; සපරිවාරා; පිරිවරසහිතව; අර හත්තෙ පතිට්ඨාසි, රහත්බැවෙහි පිහිටියේය; රඤ්ඤො. රජහුගේ; භාගිනෙය්‍යො අරිට්ඨොපි ඛො, භාගිනෙය්‍යවූ අරිට්ඨතෙමේද; පඤ්චහි පුරිසසතෙහි සද්ධිං, පන්සියයක් පුරුෂයන්සමග; ථෙරස්සසන්තිකෙ පබ්බජිත්වා, තෙරවෙත පැවිදිව; නචිරස්සෙව, නොබෝකලකින්ම; සපරිවාරො, පිරිවරසහිතව; අරහත්තෙපතිට්ඨාසි, රහත්බැවෙහි පිහිටියේය;

අථ, ඉක්බිති; එකදිවසං, එක්දිනයක්; රාජා, රජතෙමේ; මහා බොධිං වන්දිත්වා, මහාබොධියවැඳ; ථෙරෙන සද්ධිං, තෙරහු සමග; ථූපා රාමං ගච්ඡති, ථූපාරාමයට ගියේය; ලොහපාසාදට්ඨානං, ලොවාමහාප්‍රා සාදස්ථානයට; සම්පත්තස්ස තස්ස, පැමිණි ඒරජහට;පුරිසා, පුරුෂයෝ; පුප්ඵානි අභිහරිංසු, මල්ගෙනාවාහුය; රාජා, රජතෙමේ; ථෙරස්ස, තෙර හට; පුප්ඵානි අදාසි, මල්දුන්නේය; ථෙරො, ස්ථවිරතෙමේ; පුප්ඵෙහි; මලින්; ලොහපාසාදට්ඨානං පූජෙසි, ලොවාමහපාය කටයුතු තැනට පිදූයේය; පුප්ඵෙසු, මල්; භූමියං පතිතමත්තෙසු, බිමවැටිමාත්‍රයෙක්හි; මහාභූමිචාලො අහොසි, මහත් පෘථිවීකම්පාවක්විය;

රාජා–"කස්මා භන්තෙ භූමි චලිතා"ති පුච්ඡි. ඉමස්මිං මහාරාජ ඔකාසෙ සඞ්ඝස්ස අනාගතෙ උපොසථාගාරං භවිස්සති, තස්සෙතං පුබ්බනිමිත්තන්ති. රාජා පුන ථෙරෙන සද්ධිං ගච්ඡන්තො අම්බඞ්ගණට්ඨානං පත්තො, තත්ථස්ස වණ්ණගන්ධසම්පන්නං අතිමධුරරසං එකං අම්බපක්කං ආහරියිත්ථ. රාජා තං ථෙරස්ස පරිභොගත්ථාය අදාසි. ථෙරො තත්ථෙව පරිභුඤ්ජිත්වා "ඉදං එත්ථෙව රොපාපෙහි" ති ආහ. රාජා තං අම්බට්ඨිං ගහෙත්වා තත්ථෙව රොපාපෙත්වා උදකං ආසිඤ්චි. සහ අම්බබීජරොපණෙන පථවී සඞ්කම්පි. රාජා–කස්මා භන්තෙ පථවී කම්පිත්ථාති පුච්ඡි. ඉමස්මිං මහාරාජ ඔකාසෙ සඞ්ඝස්ස අනාගතෙ අම්බඞ්ගණං නාම සන්නිපාතට්ඨානං භවිස්සති, තස්සෙතං පුබ්බනිමිත්තන්ති. රාජා තත්ථ අට්ඨ පුප්ඵමුට්ඨියො ඔකිරිත්වා වන්දිත්වා පුන ථෙරෙන සද්ධිං ගච්ඡන්තො මහාචෙතියට්ඨානං පත්තො. තත්ථස්ස චම්පකපුප්ඵානි අභිහරිංසු.

---

රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; කස්මා භූමි චලිතාති, කුමක් හෙයින් බිම සැලුණේදැයි; පුච්ඡි, විචාළේය; මහාරාජ, මහරද; ඉමස්මිං ඔකාසෙ, මේ අවකාශයෙහි; අනාගතෙ, අනාගතයෙහි; සඞ්ඝස්ස උපොසථාගාරං භවිස්සති, සඟහට පොහොගෙයක් වන්නේය; තස්ස, එයට; එතං පුබ්බනිමිත්තන්ති, මේ පූර්වනිමිත්තයයි කී; රාජා, රජතෙමේ; පුන, නැවත; ථෙරෙන සද්ධිං ගච්ඡන්තො, තෙරහු සමග යනුයේ; අම්බඞ්ගණට්ඨානං, අම්බඞ්ගණස්ථානයට; පත්තො, පැමිණියේය; තත්ථ, එතනැදී; අස්ස, මේ තෙරහට; වණ්ණගන්ධසම්පන්නං, වර්ණගන්ධයෙන් යුක්තවූ; අතිමධුරරසං, ඉතාමිහිරිරස ඇති; එකං අම්බපක්කං ආහරියිත්ථ, එක් අඹපකක්ගෙණ ආයේය; රාජා, රජතෙමේ; තං ඒ අඹපක; ථෙරස්ස පරිභොගත්ථාය අදාසි, තෙරහුගේ පරිභොගය පිණිස දුන්නේය; ථෙරො, ස්ථවිරතෙමේ; තත්ථෙවපරිභුඤ්ජිත්වා, එතනදීම පරිභොගකොට; ඉදං, මේ අඹබිජුවට; එත්ථෙවරොපෙථාති ආහ, මෙතනමරොපණය කරවයි කී; රාජා, රජතෙමේ; තංඅම්බට්ඨිං ගහෙත්වා; ඒ අඹඇටයගෙන; තත්ථෙව රොපාපෙත්වා, එහිමරොපණය කරවා; උදකං ආසිඤ්චි, පැන්වත් කෙළේය; සහඅම්බබීජරොපණෙන, අඹබිජුවටය රොපණය සමග; පථවීසංකම්පි, පෘථිවිය කම්පාවී; රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; කස්මා, කුමක්හෙයින්; පථවී කම්පිත්ථාති පුච්ඡි, පෘථිවිය කම්පාවීදැයි විචාළේය; මහාරාජ, මහරද; ඉමස්මිංඔකාසෙ, මේ අවකාශයෙහි; අනාගතෙ, අනාගතයෙහි; සඞ්ඝස්ස, සඟහට; අම්බඞ්ගණං නාම සන්නිපාතට්ඨානං භවිස්සති, අම්බඞ්ගණ නම්වූ රැස්වන ඉඩමක්වන්නේය; තස්සෙතං පුබ්බනිමිත්තන්ති, එයට මේපූර්වනිමිත්තයයි කීයේය; රාජා, රජතෙමේ; තත්ථ අට්ඨපුප්ඵමුට්ඨියො ඔකිරිත්වා, එහි මල්අටමිටක් වගුරුවා; වන්දිත්වා, වැඳ; පුන, නැවත; ථෙරෙනසද්ධිං ගච්ඡන්තො, තෙරහු සමග යනුයේ; මහාචෙතියට්ඨානංපත්තො, මහාචෛත්‍යස්ථානයට පැමිණියේය; තත්ථ, එතනැදී; අස්ස, ඔහුට; චම්පකපුප්ඵානි අභිහරිංසු, සපුමල්ගෙනාවාහුය;

තානි රාජා ථෙරස්ස අදාසි. ථෙරො මහාචෙතියට්ඨානං පුප්ඵෙහි පූජෙත්වා වන්දි. තාවදෙව මහාපථවී සඞ්කම්පි. රාජා- කස්මා භන්තෙ පථවී සඞ්කම්පිත්ථාති පුච්ඡි.

ඉමස්මිං මහාරාජ ඔකාසෙ අනාගතෙ බුද්ධස්ස භගවතො අසදිසො මහාථූපො භවිස්සති, තස්සෙතං පුබ්බ නිමිත්තන්ති. අහමෙව කාරෙමි භන්තෙති. අලං මහාරාජ, තුම්හාකං අඤ්ඤං බහුකම්මං අත්ථි, තුම්හාකං පන නත්තා දුට්ඨගාමණී අභයො නාම කාරෙස්සතීති. අථ රාජා සචෙ භන්තෙ මය්හං නත්තා කරිස්සති, කතං යෙව මයාති ද්වාදස හත්ථං පාසාණත්ථම්භං ආහරාපෙත්වා "දෙවානම්පියතිස්ස රඤ්ඤො නත්තා දුට්ඨගාමණී අභයො නාම ඉමස්මිං පදෙසෙ ථූපං කාරෙතූ"ති අක්ඛරානි ලිඛාපෙත්වා පතිට්ඨාපෙත්වා වන්දිත්වා ථෙරං පුච්ඡි: පතිට්ඨිතං නුඛො භන්තෙ තම්බපණ්ණිදීපෙ සාසනන්ති,?

---

තානි, ඒ පුෂ්පයන්; රාජා, රජතෙමේ; ථෙරස්ස අදාසි, තෙරහට දුන්නේය; ථෙරො, ස්ථවිරතෙමේ; මහාචෙතියට්ඨානං පුප්ඵෙහි පූජෙත්වා, මහාචෛත්‍යස්ථානය මලින්පුදා; වන්දි, වැන්දේය; තාවදෙව, එකෙණෙහිම; මහාපථවීසඞ්කම්පි, මහපොළව කම්පාවිය; රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; කස්මා, කුමක්හෙයින්; පථවීසඞ්කම්පිත්ථාති පුච්ඡි, පොළවකම්පාවීදැයි විචාළේය;

මහාරාජ, මහරද; අනාගතෙ, අනාගතයෙහි; ඉමස්මිං ඔකාසෙ, මේ ප්‍රදෙශයෙහි; බුද්ධස්ස භගවතො, චතුස්සත්‍යඥාන භාග්‍යවත්හුගේ; අසදිසො මහාථූපො භවිස්සති, අසදෘශ මහසෑයක් වන්නේය; තස්සෙතං පුබ්බනිමිත්තං ති, එයට මේ පූර්වනිමිත්තයයි කීය; භන්තෙ, වහන්ස; අහං එව, මම ම; කාරෙමීති, කරමියි; අලං මහාරාජ, සම්නැත මහරද තුම්හාකං අඤ්ඤං බහුකම්මං අත්ථි, තොපට අනික් බොහෝ කර්මාන්ත ඇත්තේය; තුම්හාකං නත්තා පන, තොපගේ මුණුබුරුවූ; දුට්ඨගාමණී අභයො නාම දුටුගැමුණු අභයනම් (රද)තෙමේ; කාරෙස්සතීති, කරවන්නේයයි කී; අථ, නැවත; රාජා, රජතෙමේ; භන්තෙ, වහන්ස; මය්හං නත්තා සචෙකාරෙස්සති, මාගේ මුණුබුරුතෝම ඉදින් කරවන්නේනම්; මයාකතං යෙවාති, මාවිසින්ම කරණලදමැයි; ද්වාදසහත්ථං පාසාණත්ථම්භං ආහරාපෙත්වා, දොළොස්රියන් පහන්ටැඹක් ගෙන්වා; දෙවානම්පියතිස්ස රඤ්ඤො, දෙවානම්පියතිස්ස රදහුගේ; නත්තා, මුණුබුරුවූ; දුට්ඨගාමණී අභයොනාම, දුටුගැමුණු අභයතෙමේ; ඉමස්මිං පදෙසෙ, මේ ප්‍රදෙශයෙහි; ථූපං කාරෙතූතිඅක්ඛරානිලිඛාපෙත්වා, චෛත්‍යයක් කරාවායයි අකුරුලියවා; පතිට්ඨාපෙත්වා, පිහිටවා; භන්තෙ, පින්වත; තම්බපණ්ණිදීපෙ, තාම්‍රපර්ණී දිවයිනෙහි; සාසනං පතිට්ඨිතං නුඛොති සසුන පිහිටියේදැයි; වන්දිත්වා, වැඳ; ථෙරං පුච්ඡි, තෙරහු විචාළේය;

පතිට්ඨිතං මහාරාජ සාසනං, මූලානි පනස්ස න තාව ඔතරන්තීති. කදා පන භන්තෙ මූලානි ඔතිණ්ණානි නාම භවිස්සන්තීති? යදා මහාරාජ තම්බපණ්ණිදීපකානං මාතාපිතූනං තම්බපණ්ණිදීපෙ ජාතො දාරකො තම්බපණ්ණිදීපෙ පබ්බජිත්වා තම්බපණ්ණිදීපම්හි යෙව විනයං උග්ගහෙත්වා තම්බපණ්ණිදීපෙ වාචෙස්සති, තදා සාසනස්ස මූලානි ඔතිණ්ණානි නාම භවිස්සන්තීති. අත්ථි පන භන්තෙ එදිසො භික්ඛූති? අත්ථි මහාරාජ මහාඅරිට්ඨො භික්ඛු පටිබලො එතස්මිං කම්මෙති. මයා එත්ථ භන්තෙ කිං කාතබ්බන්ති? මණ්ඩපං මහාරාජ කාතුං වට්ටතීති. සාධු භන්තෙති රාජා මෙඝවණ්ණාභයස්ස අමච්චස්ස පරිවෙණට්ඨානෙ මහාසඞ්ගීති කාලෙ අජාතසත්තු මහාරාජෙන කත මණ්ඩපප්පකාරං රාජානුභාවෙන මණ්ඩපං කාරෙත්වා සබ්බ තාලාවචරෙ

---

මහාරාජ, මහරද; සාසනං පතිට්ඨිතං, සසුන පිහිටියේය; අස්ස පන, මේ සස්නගේ වනාහි; මූලානි, මුල්; න තාවඔතරන්තීති, එතාක් අවතරණයනුවාහුය; හෙවත් නොබැස්සාහයි; භන්තෙ, පින්වත; කදා පන, කවරකලෙක වනාහි; මූලානි ඔතිණ්ණානි නාම භවිස්සන්තීති, මුල්බැස්සාහුනම් වන්නාහුද්දැයි; මහාරාජ, මහරද; යදා, යම්කලෙක; තම්බපණ්ණිදීපකානං මාතාපිතූනං, තාම්‍රපර්ණි දිවයින් වැසි මවුපියන්ගේ; තම්බපණ්ණිදීපෙ ජාතො දාරකො, තාම්‍රපර්ණිදිවයිනැ උපන් දරුවෙක්තෙමේ; තම්බපණ්ණිදීපෙ පබ්බජිත්වා, තාම්‍රපර්ණි දිවූයිනෙහිදී පැවිදිව; තම්බපණ්ණිදීපම්හියෙව, තාම්‍රපර්ණිවීපයෙහිදීම; විනයං උග්ගහෙත්වා, විනයඉගෙණ තම්බපණ්ණිවිපෙවාචෙස්සති, තාම්‍රපර්ණිදිවයින් වැසියන්ට කියවන්නේද; තදා, එකල්හි; සාසනස්ස, සසුනගේ; මූලානිඔතිණ්ණානි නාම භවිස්සන්තීති, මුල් අවතීර්ණවූවාහු නම් වන්නාහයි; භන්තෙ, වහන්ස; එදිසො භික්ඛු අත්ථිපනාති, එබඳු භික්ෂුවක් තෙමේ ඇත්තේද; මහාරාජ, මහරජ; මහාඅරිට්ඨොභික්ඛු, මහාඅරිට්ඨ භික්ෂුතෙමේ; එතස්මිං කම්මෙ, මේ ක්‍රියායෙහි; පටිබලො අත්ථිති, ප්‍රතිබල ඇත්තේයයි; භන්තෙ, වහන්ස; එත්ථ, මෙහි; මයා, මාවිසින්; කිංකාතබ්බන්ති, කුමක් කටයුතුද්දැයි;? මහාරාජ, මහරද; මණ්ඩපං කාතුං වට්ටතීති, මණ්ඩපයක් කරන්ටවටනේයයි; සාධු භන්තෙති, යහපත වහන්සැයි කියා; රාජා, රජතෙමේ; මෙඝවණ්ණාභයස්ස, මෙඝවර්ණාභය නම් රදහුගේ; අමච්චස්ස) ඇමතියා විසින් (කරවියයුතුවූ;) පරිවෙණට්ඨානෙ, පිරිවෙනට වස්තුවූ ස්ථානයෙහි; මහාසඞ්ගීතිකාලෙ, ප්‍රථම මහා සඞ්ගායනාකාලයෙහි; අජාතසත්තු මහාරාජෙන කතමණ්ඩපප්පකාරං, අජාසත් මහරදහු විසින් කරණලද මණ්ඩපය ආකාරවූ; මණ්ඩපං, මණ්ඩපයක්; රාජානුභාවෙන, රාජානුභාවයෙන්; කාරෙත්වා, කරවා; සබ්බ

සක සක සිප්පෙ පයොජෙත්වා සාසනස්ස මූලානි ඔතරන්තානි පස්සිස්සාමීති අනෙක පුරිසසහස්ස පරිවුතො ථූපාරාමං අනුප්පත්තො.

තෙන ඛො පන සමයෙන ථූපාරාමෙ අට්ඨසට්ඨි භික්ඛුසහස්සානි සන්නිපතිංසු. මහාමහින්දත්ථෙරස්ස ආසනං දක්ඛිණාභිමුඛං පඤ්ඤත්තං හොති. මහාඅරිට්ඨත්ථෙරස්ස ධම්මාසනං උත්තරාභිමුඛං පඤ්ඤත්තං හොති. අථ ඛො මහාඅරිට්ඨත්ථෙරො මහින්දත්ථෙරෙන අජ්ඣිට්ඨො අත්තනො අනුරූපෙන පත්තානුක්කමෙන ධම්මාසනෙ නිසීදි. මහින්දත්ථෙරප්පමුඛා අට්ඨසට්ඨිමහාථෙරා ධම්මාසනං පරිවාරෙත්වා නිසීදිංසු. රඤ්ඤොපි කණිට්ඨභාතා මත්තාභයත්ථෙරො නාම ධුරග්ගාහො හුත්වා විනයං ගණ්හිස්සාමීති පඤ්ච භික්ඛුසතෙහි සද්ධිං මහාඅරිට්ඨත්ථෙරස්ස ධම්මාසනමෙව පරිවාරෙත්වා නිසීදි. අවසෙසාපි භික්ඛූ සරාජිකා ච පරිසා අත්තනො අත්තනො පත්තාසනෙ නිසීදිංසු.

---

තාලාවචරෙ, සියලු පසඟතුරුවයන්නන්; සකසක සිප්පෙ පයොජෙත්වා, ස්වකීය ස්වකීශිල්පයෙහි යොදවා; සාසනස්ස සසුනගේ; මූලානි ඔතරන්තානි, මුල්බස්නවුන්; පස්සිස්සාමීති දක්නෙමියි; අනෙකපුරිසසහස්ස පරිවුතො, නොයෙක් දහස්ගණන් පුරුෂයන් විසින්; පිරිවරණලදුයේ; ථූපාරාමං අනුප්පත්තො, ථූපාරාමයට පැමිණියේය;

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; ථූපාරාමෙ, ථූපාරාමයෙහි; අට්ඨසට්ඨි භික්ඛුසහස්සානි සන්නිපතිංසු, අටසැටදහස් භික්ෂූහු රැස්වූහු; මහාමහින්දත්ථෙරස්ස, මහාමහින්ද ස්ථවිරයහුගේ; ආසනං, අසුන; දක්ඛිණාභිමුඛං, දක්ෂිණාභිමුඛ කොට; පඤ්ඤත්තං හොති, පනවනලද්දේවේ; මහා අරිට්ඨත්ථෙරස්ස ධම්මාසනං, මහාඅරිට්ඨ ස්ථවිරයහුගේ ධර්මාසනය; උත්තරාභිමුඛං පඤ්ඤත්තං හොති, උත්තරාභිමුඛකොට පනවනලදුයේවේ; අථ ඛො, එකල්හි වනාහි; මහාඅරිට්ඨත්ථෙරො, මහාඅරිෂ්ට ස්ථවිරතෙමේ; මහින්දත්ථෙරෙන අජ්ඣිට්ඨො, මිහිඳුතෙර විසින් අණවනලදුයේ; අත්තනො අනුරූපෙන, තමහට සුදුසුවූ; පත්තානුක්කමෙන, පැමිණි පිළිවෙළින්; ධම්මාසනෙ නිසීදි, ධර්මාසනයෙහි උන්නේය; මහින්දත්ථෙරප්පමුඛා, මිහිඳුතෙර ප්‍රමුඛවූ; අට්ඨසට්ඨි මහාථෙරා, අටසැටනමක් මහතෙරහු; ධම්මාසනං පරිවාරෙත්වා, ධර්මාසනය පිරිවරා; නිසීදිංසු, වැඩහුන්නාහුය; රඤ්ඤොපි කණිට්ඨභාතා, රජහුගේද කණිටුභ්‍රාතෘවූ; මත්තාභයත්ථෙරො නාම, මත්තාභය නම් ස්ථවිරතෙමේ; ධුරග්ගාහො හුත්වා, ධුරග්‍රාහියෙක්ව හෙවත් ගණධුරය උසුලන්නෙක්ව; විනයං ගණ්හිස්සාමීති, විනයගන්නෙමියි; පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං, පන්සියයක් භික්ෂූන් සමග මහා අරිට්ඨත්ථෙරස්ස, මහාඅරිෂ්ටස්ථවිරයන්ගේ; ධම්මාසනං එව පරිවාරෙත්වා, ධර්මාසනයම පිරිවරා; නිසීදි, හුන්නේය; අවසෙසාපි භික්ඛූ, සෙසු භික්ෂූහුද; සරාජිකාවපරිසා, රජසහිත පිරිසද; අත්තනො අත්තනො පත්තාසනෙ, තම තමන්ට පැමිණි අස්නෙහි; නිසීදිංසු, හුන්නාහුය;

අථායස්මා මහාඅරිට්ඨත්ථෙරො “තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති නළෙරුපුචිමන්දමූලෙ”ති විනයනිදානං අභාසි. භාසිතෙ ච පනායස්මතා අරිට්ඨත්ථෙරෙන විනයනිදානෙ ආකාසං මහාවිරවං විරවි. අකාලවිජ්ජුලතා නිච්ඡරිංසු. දෙවතා සාධුකාරං අදංසු. මහාපථවී උදකපරියන්තං කත්වා සඞ්කම්පි. එවං අනෙකෙසු පාටිහාරියෙසු වත්තමානෙසු ආයස්මා අරිට්ඨත්ථෙරො මහාමහින්දප්පමුඛෙහි අට්ඨසට්ඨියා පච්චෙකගණීහි ඛීණාසවමහාථෙරෙහි තදඤ්ඤෙහි ච අට්ඨසට්ඨිසහස්සෙහි භික්ඛූහි පරිවුතො පඨමකත්තිකපවාරණදිවසෙ ථූපාරාමවිහාරමජ්ඣෙ

---

අථ, ඉක්බිති; ආයස්මා මහාඅරිට්ඨත්ථෙරො, ආයුෂ්මත් මහා අරිෂ්ඨ ස්ථවිරතෙමේ; තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති නළෙරු පුචිමන්දමූලෙති, තෙන සමයෙන-පෙ- නළෙරු පුචිමන්ද මූලෙයි කියා; විනයනිදානං අභාසි, විනයනිදානය වදාළේය; ආයස්මතා අරිට්ඨත්ථෙරෙන, ආයුෂ්මත් අරිට්ඨතෙරහු විසින්; විනයනිදානෙ භාසිතෙච පන, විනයනිදානය දෙසූකල්හිද වනාහි; ආකාසං, (මෙඝයන් ගෙන් වෙන්ව තිබිලවූ) අහස; මහාවිරවං, අහස්ගත පෘථිවි විශෙෂය කින් සමුත්පාපනයවනලද) මහත් රාවයෙ විරවි, විසිතුරු රාවයෙන් කෙළේය; අකාලවිජ්ජුලතා නිච්ඡරිංසු, අකාල විදුලිය පැතුරුණාහුය; දෙවතාසාධුකාරං අදංසු, දෙවතාවෝ සාධුකාර දුන්නාහුය; මහාපථවී, මහාපෘථිවිතොමෝ; උදකපරියන්තං කත්වා, ජලය කෙළවරකොට; සංකම්පි, අතිශයින් කම්පාවීය; එවං, මෙසේ; අනෙකෙසු පාටිහාරියෙසු, වත්තමානෙසු, නොයෙක් පෙළහර පවත්වනලදකල්හි; ආයස්මා අරිට්ඨත්ථෙරො, ආයුෂ්මත් අරිෂ්ඨස්ථවිරතෙමේ; මහාමහින්දත්ථෙර පමුඛෙහි, මහාමහින්ද්‍රස්ථවිර ප්‍රමුඛවූ; පච්චෙකගණීහි, වෙන්වෙන් ගණාචාර්‍ය්‍යවූ; (**“පච්චෙකං ගණං එතෙසමත්ථීති= පච්චෙකගණිනො තෙහි”** යි ගන්නේ) අට්ඨසට්ඨියා ඛීණාසවමහාථෙරෙහි, අටසැටක් ක්ෂීණාශ්‍රව මහාස්ථවිරයන්ද; තදඤ්ඤෙහි ච, එයින් අන්‍යවූද; අට්ඨසට්ඨිසහස්සෙහි භික්ඛූහි පරිවුතො, අටසැටදහසක් භික්ෂූන් විසින් පිරිවරණලදුයේ; පඨමකත්තිකපවාරණදිවසෙ, ප්‍රථම කාර්ත්තිකපවාරුණු දිනයෙහි; (හෙවත් වප්මස පසළොස්වක් පොහෝදිනයෙහි;) ථූපාරාමවිහාර මජ්ඣෙ, ථූපාරාම විහාරමධ්‍යයෙහිදී;

(යම්සේ වෛද්‍යාචාර්‍ය්‍යතෙමේ ගිලනුන් කෙරෙහි කාරුණාවෙන් පිළියම්කිරීමට පෙරටුකොට පහවූ ආලය හා ප්‍රතිඝය ඇතියේ ජිගුප්සා කටයුතුවූ ව්‍රණයන්හිද ගුහ්‍යස්ථානයන්හිද භෛෂජ්‍යලෙපාදියෙන් ප්‍රතිකාරයම කරන්නේය, එසේම මහාභාග්‍යවත්තෙමේ කෙලශව්‍යාධි

සත්ථු කාරුණ්ණගුණ පරිදීපකං භගවතො අනුසිට්ඨිකාරානං කායකම්මවචීකම්මවිප්ඵන්දිත විනයනං විනයපිටකං පකාසෙසි. පකාසෙත්වා ච යාවතායුකං තිට්ඨමානො බහූනං වාචෙත්වා බහූනං හදයෙ පතිට්ඨාපෙත්වා අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා පරිනිබ්බායි, තෙපි ඛො මහාමහින්දප්පමුඛා තස්මිං සමාගමෙ–

**අට්ඨ සට්ඨි මහාථෙරා-ධුරග්ගාහා සමාගතා,**
**පච්චෙක ගණිනො සබ්බෙ-ධම්ම රාජස්ස සාවකා.**
**ඛීණාසවා වසිප්පත්තා-තෙවිජ්ජා ඉද්ධි කොවිදා,**
**උත්තමත්ථමභිඤ්ඤාය-අනුසාසිංසු රාජිනො.**

---

යෙන් පීඩිතවූ සත්ත්වයන් කෙරෙහි කාරුණ්‍යාවෙන් ඒ සත්ත්වයන් ක්ලෙශව්‍යාධි දුකින් මුදවනු කැමතිව නොකියයුතු ගුහ්‍යස්ථාන නිශ්‍රිත යන්ද අසභ්‍යවචනය කියන්නාක් මෙන් විනයප්‍රඥප්තියෙන් සත්ත්වයන් ක්ලෙශව්‍යාධියට පිළියම්කරන්නේය, එසේ හෙයින් සත්ථුකාරුණ්ණ ගුණපරිදීපකං යි කියනලදි.)

සත්ථුකාරුණ්ණගුණපරිදීපකං, ශාස්තෘකාරුණ්‍ය ගුණය ප්‍රකාශකවූ; භගවතො අනුසිට්ඨිකාරානං, භාග්‍යවත්හුගේ අනුශාසනය කරන්න වුන්ගේ; කායකම්මවචීකම්මවිප්ඵන්දිතවිනයං, කායවාග්ද්වාරයෙහි ප්‍රවෘත්තවූ ක්ලෙශවිස්පන්දනයගේ විනයනය කරන්නාවූ; විනයපිටකං, විනයපිටකය; පකාසෙසි, ප්‍රකාශ කොළේය; පකාසෙත්වාච, ප්‍රකාශ කොටද; යාවතායුකං, යම්තාක් ආයුෂද; (ඒ තාක් කල්); තිට්ඨමානො, සිටිමින්; බහූනං වාචෙත්වා, බොහෝදෙනාට කියවා; බහූනං හදයෙ පතිට්ඨාපෙත්වා, බොහෝදෙනාගේ ළයෙහි පිහිටවා; අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා, අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන්; පරිනිබ්බායි, පිරිනිවියේය; තස්මිංසමාගමෙ, ඒ සමාගමෙහි; මහාමහින්දත්ථෙරපමුඛා, මහාමහීන්ද්‍රස්ථවිර ප්‍රමුඛවූ; තෙපිඛො, ඒ ස්ථවිරයෝද;

සමාගතා, රැස්වූ; ධුරග්ගාහා, ධුරග්‍රහණය කරන්නාවූ; පච්චෙක ගණිනො, වෙන් වෙන්වූ ගණයා ඇති; ධම්මරාජස්සසාවකා, ධර්මරාජයන්හුගේ ශ්‍රාවකවූ; ඛීණාසවා, ක්ෂයකරණලද ආශ්‍රවයන් ඇත්තාවූ; වසිප්පත්තා, ආවර්ජනාදි පඤ්චවිධ වසියෙන් යුක්තවූ; තෙවිජ්ජා, ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූ; ඉද්ධිකොවිදා, ඍද්ධියෙහි දක්ෂවූ; සබ්බෙ, සියලු; අට්ඨසට්ඨිමහාථෙරා, අටසැට නමක් මහතෙරහු; උත්තමත්ථංඅභිඤ්ඤාය, උත්තමාර්ථය දැන; රාජිනො, රජහු; අනුසාසිංසු, අනුශාසනයකළෝ (රාජිනො යන මෙහි උපයොගාර්ථයෙහි සාමිවචනය හෙයින් රාජානංයි ගන්නේ;)

**ආලොකං දස්සයිත්වාන-ඔභාසෙත්වා මහිං ඉමං,**
**ජලිත්වා අග්ගික්ඛන්ධාව-පරිනිබ්බිංසු මහෙසයො.**

තෙසං පරිනිබ්බාණතො අපරභාගෙ අඤ්ඤෙපි තෙසං ථෙරානං අන්තෙවාසිකා තිස්සදත්ත කාලසුමන දීඝසුමනාදයො ච මහාඅරිට්ඨත්ථෙරස්ස අන්තෙවාසිකා අන්තෙවාසිකානං අන්තෙවාසිකාචාති එවං පුබ්බෙ වුත්තප්පකාරා ආචරියපරම්පරා ඉමං විනයපිටකං යාව අජ්ජතනා ආනෙසුං. තෙන වුත්තං: “තතියසඞ්ගහතො පන උද්ධං ඉමං දීපං මහින්දාදීහි ආභතං, මහින්දතො උග්ගහෙත්වා කඤ්චි කාලං අරිට්ඨත්ථෙරාදීහි ආභතං, තතො යාව අජ්ජතනා තෙසංයෙව අන්තෙවාසිකපරම්පරාභූතාය ආචරියපරම්පරාය ආභත”න්ති.

කත්ථප්පතිට්ඨිතන්ති? යෙසං පාළිතො ච අත්ථතො ච අනූනං වත්තති මණිඝටෙ පක්ඛිත්තතෙලමිව ඊසකම්පි නපග්ඝරති,

---

මහෙසයො, ඒ මහර්ෂිහු; ආලොකංදස්සයිත්වාන, ඥානාලොකය දක්වා; ඉමංමහිං, මේ පෘථිවිය; ඔභාසෙත්වා, බබුළුවා; අග්ගික්ඛන්ධාව, ගිනිකඳු මෙන්; ජලිත්වා, දිලිහී; පරිනිබ්බිංසු, පරිනිර්වියාහුය;

තෙසං පරිනිබ්බාණතො අපරභාගෙ, ඔවුන්ගේ පරිනිර්වාණයෙන් මෑතභාගයෙහි; තෙසංථෙරානං, (මහෙන්ද්‍රස්ථවිර ප්‍රමුඛ) ඒ තෙරුන්ගේ; අඤ්ඤෙපි අන්තෙවාසිකා, අනික් අතවැසියෝද; මහාඅරිට්ඨත්ථෙරස්ස, මහාඅරිෂ්ටස්ථවිරයන්ගේ; තිස්සදත්තකාලසුමනදීඝසුමනාදයො, තිස්ස දත්ත කාලසුමන දීඝසුමනාදීවූ; අන්තෙවාසිකාච, අතවැසියෝද; අන්තෙවාසිකානං අන්තෙවාසිකාචාති, අතවැසියන්ගේ අතවැසියෝද යි; එවං, මෙසේ; පුබ්බෙවුත්තප්පකාරා, (මහින්දො ඉට්ටියො, යනාදීන්) පෙර දක්වනලද ප්‍රකාරවූ; ආචරියපරම්පරා, ආචාර්‍ය්‍යපරම්පරාවෝ; ඉමං විනයපිටකං, මේ විනයපිටකය; යාවඅජ්ජතනා, අද දක්වා; ආනෙසුං, ගෙනාවාහුය;

තතිය සඞ්ගහතොපන උද්ධං ඉමං දීපං මහින්දාදීහි ආභතං මහින්දතො උග්ගහෙත්වා කඤ්චිකාලං අරිට්ඨත්ථෙරාදීහි ආභතං තතො යාව අජ්ජතනා තෙසංයෙව අන්තෙවාසික පරම්පර භූතාය ආචරිය පරම්පරාය ආභතන්ති තතිය සඞ්ගහතො පන උද්ධං -පෙ- ආභතංයි තෙනවුත්තං, එසේහෙයින් කියනලදී;

(මෙපමණකින් කවරෙකු විසින් ගෙණ එන ලද්දේදැයි යන මේ ප්‍රශ්නය විස්තර වශයෙන් විභජනය කොට දක්වා, දැන් කොතැන්හි පිහිටියේදැයි මේ පැනය විසඳනුයේ කත්ථප්පතිට්ඨිතංයි ආදි කී.)

කත්ථප්පතිට්ඨිතංති, කොතැන්හිපිහිටියේදැයි; යෙසං, යමෙකුන් කෙරෙහි; පාළිතොච, පෙළවිසින්ද; අත්ථතොච, අරුත්විසින්ද; අනූනංවත්තති, උනුනොවපවතීද; මණිඝටෙ පක්ඛිත්තතෙලං ඉව,

එවරූපෙසු අධිමත්තසතිගතිධිතිමන්තෙසු ලජ්ජීසු කුක්කුච්චකෙසු සික්ඛාකාමෙසු පුග්ගලෙසු පතිට්ඨිතා’ති වෙදිතබ්බං. තස්මා විනය පතිට්ඨාපනත්ථං විනයපරියත්තියා ආනිසංසං සල්ලක්ඛෙත්වා සික්ඛා කාමෙන භික්ඛුනා විනයො පරියාපුණිතබ්බො. තත්‍රායං විනය පරියත්තියා ආනිසංසො: විනය පරියත්තිකුසලො හි පුග්ගලො සාසනෙ පටිලද්ධ සද්ධානං කුලපුත්තානං මාතාපිතුට්ඨානියො හොති, තදායත්තා හි තෙසං පබ්බජ්ජා උපසම්පදා වත්තානුවත්ත පටිපත්තිආචාරගොචරකුසලතා. අපිචස්ස විනයපරියත්තිං නිස්සාය

---

මැණික් කලයෙක්හි වත්කරණලද සිංහතෙලක්මෙන්; ඊසකම්පි, නපග්ඝරති, මදකුදු නොගිලිද; (මූලානොවන්නේය යන අර්ථයි;) එවරූපෙසු, මෙබඳුවූ; අධිමත්තා, අධිකමාත්‍රවූ; සති, බුද්ධවචනය උද්ග්‍රහණයකරණ) සිහියද; ගති (ශබ්දාර්ථ විභාගග්‍රහණය කරණ ප්‍රඥා) ගතියද; ධිතිමන්තෙසු, (බුද්ධවචනයෝද්ග්‍රහණ සජ්ඣායන ධාරණ) වීර්‍ය්‍යද ඇත්තාවූ; ලජ්ජීසු, (පාපයෙහි ජිගුප්සාකිරීම්ලක්ෂණ ඇති) ලජ්ජා වෙන්යුක්තවූ; කුක්කුච්චකෙසු, ඌණමාත්‍රවූ හෙවත් සුලුවරදෙහි දෙස්දක්නා සුලුවූ කැපද අකැපදැයි විමසීමෙන්) කෞකෘත්‍යකාරීවූ හෙවත් කුකුස්කරන්නාවූ; සික්ඛාකාමෙසු පුග්ගලෙසු, (අධිශීල අධිචිත්ත අධිප්‍රඥා සංඛ්‍යාත ත්‍රිවිධ ශික්ෂාව කැමතිවෙමින් හික්මෙන්නාවූ පුහුලන්කෙරෙහි; පතිට්ඨිතා’ති වෙදිතබ්බං, පිහිටියේයි දතයුත්තේය; තස්මා, එහෙයින්; විනයපතිට්ඨාපනත්ථං, විනයපිහිටවීම පිණිස; විනය පරිත්තියා ආනිසංසංසල්ලක්ඛෙත්වා, විනය පර්‍ය්‍යාප්තියෙහි අනුසස් සලකා; සික්ඛාකාමෙනභික්ඛුනා, හික්මෙනුකැමති භික්ෂුහු විසින්; විනයො පරියාපුණිතබ්බො, විනය පුහුණුකටයුත්තේය; තත්‍රවිනය පරියත්තියා, ඒ විනය පර්‍ය්‍යාප්තියෙහි; අයං ආනිසංසො, මේ ආනෘශංස යයි; විනය පරියත්තිකුසලොහි, පුග්ගලො, විනය පර්‍ය්‍යාප්තියෙහි දක්ෂ පුද්ගලතෙමේම; සාසනෙ, සස්නෙහි; පටිලද්ධ සද්ධානං ප්‍රතිලබ්ධශ්‍රද්ධාඇති; කුලපුත්තානං, කුලපුත්‍රයන්ට; මාතාපිතුට්ඨානීයො හොති, මාතෘස්ථාන පිතෘස්ථානයට සුදුස්සෙක්වේ; කස්මාහි, කුමක් හෙයින්දයත්; තෙසං, (ශ්‍රද්ධාප්‍රතිලාභය ඇති) ඒ කුලපුත්‍රයන්ගේ; පබ්බජ්ජා, ප්‍රව්‍රජ්‍යාවෙහිද; උපසම්පදා, උපසම්පත්තියේහිද; වත්තානුවත්තපටිපත්ති, වෘත්තානුවෘත්තප්‍රතිපත්තියෙහිද; ආචාරගොචර,

(වෙළුදානාදි මිථ්‍යාජීවයගේද කායප්‍රගල්භාදීන්ගේද නොකිරීමෙන් සර්වප්‍රකාරයෙන් අනාචාරයහැර කායිකවාචසික අව්‍යතික්‍රමදැයි මෙසේ කියනලද භික්ෂූන්ට සරුප් ආචාරසම්පත්තියෙන්ද; වෙශ්‍යාදි අගොචරයහැර පිඬුපිණිස එළඹීම යුක්තස්ථාන සඞ්ඛ්‍යාත ගොචරයෙන්ද; යුක්තබැවින්) ශ්‍රමණ ආචාර ගොචර යෙහිද;

කුසලතා, කෞශල්‍යභාවය; තදායත්තා, ඔවුනට අයිතිබැවීනි; (අපියනු සම්භාවනායෙහිය) අස්සවිනය පරියත්තිං නිස්සාය, ඔහුගේ

අත්තනො සීලක්ඛන්ධො සුගුත්තො හොති සුරක්ඛිතො, කුක්කුච්ච පකතානං පටිසරණං හොති. විසාරදො සඞ්ඝමජ්ඣෙ වොහරති. පච්චත්ථිකෙ සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගණ්හාති. සද්ධම්මට්ඨිතියා පටිපන්නො හොති. තෙනාහ භගවා:-"පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා විනයධරෙ පුග්ගලෙ; අත්තනො සීලක්ඛන්ධො සුගුත්තො හොති සුරක්ඛිතො -පෙ-සද්ධම්මට්ඨිතියා පටිපන්නො හොති"ති යෙ චාපි සංවරමූලකා කුසලා ධම්මා වුත්තා භගවතා, විනයධරො පුග්ගලො තෙසං දායාදො විනයමූලකත්තා තෙසං ධම්මානං. වුත්තම්පි හෙතං භගවතා:- "විනයො සංවරත්ථාය සංවරො අවිප්පටිසාරත්ථාය අවිප්පටිසාරො පාමුජ්ජත්ථාය පාමුජ්ජං පීතත්ථාය පීති පස්සද්ධත්ථාය පස්සද්ධි සුඛත්ථාය සුඛං

---

විනය පුහුණුකිරීම නිසා; අත්තනොසීලක්ඛන්ධො සුගුත්තොහොති, තමාගේ ශීලස්කන්ධය මනාකොට ගොපනයකරණලද්දේවේ; සුරක්ඛිතොහොති, මනාකොට රක්නාලද්දේවේ; කුක්කුච්චපකතානං, (කැප අකැපනිසා උපන් කුකුසින් මඩනාලද හෙයින්) කෞකෘත්‍ය ප්‍රකෘතික වූවන්ට; පටිසරණංහොති පිළිසරණවේ; සඞ්ඝමජ්ඣෙ විසාරදො වොහරති, සඟමැද නිර්භීතවබෙනේ; (**විගතො සාරදො භයං එතස්මාති විසාරදොසි ගන්නේ**) පච්චත්ථිකෙ ආත්මප්‍රත්‍යර්ථික ශාසන ප්‍රත්‍යර්ථිකයන්; සහධම්මෙන, සකාරණ වචනයෙන්; සුනිග්ගහීතං නිග්ගණ්හාති, අතිශයින් නිග්‍රහකරණලද්දක්කොට නිග්‍රහකෙරේ; සද්ධම්මට්ඨිතියා පටිපන්නොහොති, ත්‍රිවිධවූ සද්ධර්මස්ථිතිය පිණිස පිළිපන්නේවේ; භගවා, භාග්‍යවත්තෙමේ; තෙනාහ, එසේහෙයින් වදාළහ; භික්ඛවෙ, සසරබියදක්නෙනි; විනයධරෙ පුග්ගලෙ, විනයධර පුඟුලහු කෙරෙහි; ඉමෙපඤ්ච ආනිසංසා, මේ පසක් අනුසස්වෙත්; (කෙබඳුවූ අනුසස්පසෙක්දයත්;)අත්තනොසීලක්ඛන්ධො සුගුත්තොහොති, තමාගේ ශීලස්කන්ධයතෙම මනාව ගොපනය කරණලද්දේවේ; සුරක්ඛිතො, මනාවරකිනලද්දේ වේ; -පෙ-සද්ධම්මට්ඨිතියා පටිපන්නො හොතීති, සද්ධර්මස්ථිතිය පිණිස පිළිපන්නේ වෙයයි; භගවතා, භාග්‍යවත්හු විසින්; සංවරමූලකායෙවාපි කුසලාධම්මා, සංවරය මුල්කොට ඇති යම් කුසලධර්මකෙනෙක්; වුත්තා, වදාරණලද්දාහුද; විනයධරො පුග්ගලො, විනයදර පුඟුල් තෙමේ; තෙසංදායාදො, ඒධර්මයන්ටදායාදවේ; (කුමක්හෙයින්දයත්?) තෙසංධම්මානං විනයමූලකත්තා, ඒ ධර්මයන්ට විනයමුල්කොට ඇති බැවිනි; භගවතා, භාග්‍යවත්හු විසින්; එතම්පි, මේ කරුණද; වුත්තංහි, වදාරණලදමය; විනයො, විනය පුහුණු කිරීම හෝ විනය පර්‍ය්‍යාප්තිය හෝ; සංවරත්ථාය, කාවිසිසංවරය පිණිස පවත් නේය; සංවරො, ඒ කායවාචා සංවරයතෙමේ; අවිප්පටි සාරත්ථාය, චිත්තයාගේ අවිප්‍රතිසාරය පිණිස; පවත්නේය; අවිප්පටිසාරො, අවිප්‍රති සාරයතෙම; පාමුජ්ජත්ථාය, දුර්වල ප්‍රීතිය පිණිස පවත්නේය; පාමුජ්ජං, දුර්වලප්‍රීතිය; පීතත්ථාය, බලවත් ප්‍රීතිය පිණිස පවත්නේය;

සමාධත්ථාය සමාධි යථාභූතඤාණදස්සනත්ථාය යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය නිබ්බිදා විරාගත්ථාය විරාගො විමුත්තත්ථාය විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය විමුත්තිඤාණදස්සනං අනුපාදාපරිනිබ්බානත්ථාය, එතදත්ථා කථා එතදත්ථා මන්තනා එතදත්ථා උපනිසා එතදත්ථං සොතාවධානං, යදිදං අනුපාදා චිත්තස්ස විමොක්ඛො"ති. තස්මා විනය පරියත්තියා ආයොගො කරණීයොති. එත්තාවතා ච යා සා විනය සංවණ්ණනත්ථං මාතිකා ඨපිතා, තත්ථ–

---

පීති, බලවත්පීති තොමෝ; පස්සද්ධත්ථාය, කායචිත්තදරථ ප්‍රශ්‍රබ්ධිය පිණිස පවත්නීය; පස්සද්ධි, ප්‍රශ්‍රබ්ධිතොමෝ; සුඛත්ථාය, (කායිකචෛතසික) සැපය පිණිස පවත්නීය; සුඛං, සැපය; සමාධත්ථාය, චිත්තෛකාග්‍රතාවය පිණිස පවත්නේය; සමාධි, සමාධියතෙම; යථාභූතඤාණදස්සනත්ථාය, සප්‍රත්‍යය නාමරූපපරිග්‍රහය පිණිස පවත්නේය; යථාභූතඤාණදස්සනං, යථාස්වභාවවූ ඥානදර්ශනය; නිබ්බිදත්ථාය, විදර්ශනාව පිණිස පවත්නේය; නිබ්බිදා, විදර්ශනා තොමෝ, විරාගත්ථාය, ආර්‍යමාර්ගය පිණිස පවත්නීය; විරාගො, ආර්‍යමාර්ගයතෙමේ; විමුත්තත්ථාය, අර්හත් ඵලය පිණිස පවත්නේය; විමුත්ති, අර්හත්ඵලය තෙමේ; විමුත්තිඤාණදස්සනත්ථාය, ප්‍රත්‍යවේක්ෂා ඥානයපිණිස පවත්නේය; විමුත්තිඤාණදස්සනං, ප්‍රත්‍යවේක්ෂා ඥානය; අනුපාදාපරිනිබ්බානත්ථාය, කිසිත් ධර්මයක් ග්‍රහණය නොකොට අනවශේෂව පිරිනිවීම පිණිස පවත්නේය; කථා, මේ විනය කථාතොමෝ; එතදත්ථා, අනුත්පාද පරිනිර්වාණය පිණිස පවත්නීය; මන්තනා, (මෙසේ කරන්නෙම්ද නොකරන්නම්දැයි විනය ප්‍රතිබද්ධ) මන්ත්‍රණය; එතදත්ථා, මේ පිණිස පවත්නීය; උපනිසා, කාරණය හෙවත් ප්‍රත්‍යය; එතදත්ථා, (විනයො සංවරත්ථායයී යනාදීන් දක්වනලද) මේ කරුණු පිණිස පවත්නීය සොතාවධානං, ශ්‍රොත්‍රාවධානය හෙවත් (මේ පරම්පරාප්‍රත්‍යය කථාව ශ්‍රවණය කොට යම් ඥානයක් උපදීද?) ඒ ඥානය, එතදත්ථං, මේ පිණිස පවත්නේය; අනුපාදා, (චතුර්විධ උපාදානයන් කාරණාභූතව) දළ්හග්‍රහණය නොකොට; චිත්තස්ස, චිත්තයාගේ; යදිදංවිමොක්ඛොති, (අර්හත් ඵලසංඛ්‍යාත) යම් මේ විමොක්ෂයෙක් ඇත්තේද ඒ විමොක්ෂයද මේ පිණිසය (දළ්හග්‍රහණ විරහිත පරිනිර්වාණය පිණිසයයි;) තස්මා, යම්හෙයකින් වදාළේද එහෙයින්; විනයපරියත්තියා, විනයපර්‍යාප්තියෙහි; ආයොගොකරණීයොති, (උද්ග්‍රහණචින්තනාදි වශයෙන්) නැවත නැවත අධිකාවූ යෙදීම කටයුතුයයි; එත්තාවතාච, මෙපමණකින්ම; විනයසංවණ්ණනත්ථං, විනයපිටකයෙහි සංවර්ණනාව පිණිස; යාසාමාතිකාඨපිතා, යම් ඒ මාතෘකාවක් තොමෝ තබනලද්දීද; තත්ථ, ඒ මාතෘකාපදයෙහි;

"වුත්තං යෙන යදා යස්මා - ධාරිතං යෙන චාභතං,
යත්ථප්පතිට්ඨිතං චෙතං - මෙතං වත්වා විධිං තතො"ති.

ඉමිස්සා තාව ගාථාය අත්ථො පකාසිතො. විනයස්ස ච බාහිර නිදාන වණ්ණනා යථාධිප්පායං සංවණ්ණිතා හොතීති.

**බාහිරනිදාන වණ්ණනා නිට්ඨිතා.**

---

යදා, යම්කලෙක්හි; යෙන, යමෙකු විසින්; යස්මා, යම්හෙයකින්; ධාරිතං, දරණලද්දේද; යෙන, යමෙකු විසින්; ආභතඤ්ච, ගෙනඑන ලද්දේද; යත්ථ, යමෙකුකෙරෙහි; පතිට්ඨිතඤ්ච, පිහිටියේද; තතො, එහෙයින්; එතං එතං විධිං වත්වා, මේමේ විධිය ප්‍රකාශකොට; වුත්තන්ති, කියනලදයයි;

ඉමිස්සාගාථාය අත්ථො, මේ ගාථාව ප්‍රතිබද්ධ අර්ථයතෙමේ; තාව, පළමුකොට; පකාසිතො, ප්‍රකාශකරණලදී; විනයස්ස, විනයපිට කය සම්බන්ධ; බාහිරනිදානවණ්ණනා, බාහිරනිදාන වණ්ණනා තොමෝ, යථාධිප්පායඤ්ච, අභිප්‍රායවූ පරිද්දෙන්ම; වණ්ණිතාහොතීති, වණ්නා කරණලදුවන්නියයි;

**බාහිරනිදානවණ්ණනා, බාහිරනිදාන වර්ණනාතොමෝ නිට්ඨිතා, නිමවනලද්දීය.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු